පටුන

මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ
භාවිතයට පහසු යුනිකෝඩ් අකුරු ක්‍රමයට සකසා
http://pitaka.lk වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# සංයුත්ත නිකාය

# 7

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

# අනුශාසක මණ්ඩලය

පෑලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනේ B.A., Ph.D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ

පින්වත්තේ සද්ධර්මාකර පරිවෙණාධිපති ශ්‍රී විසුද්ධාචාර්ය ධර්මකීර්ති ශ්‍රී පෝහද්දරමුල්ලේ ඤාණානන්දාභිධාන අමරපුර සිරි සද්ධම්මවංස නිකායේ මහා නායක ස්ථවිරයන්වහන්සේ

අම්බලම්ගොඩ මහා විහාරස්ථ විද්‍යාලෝක විද්‍යාලයාධිපති ශ්‍රී සද්ධර්මභාරතීශ්වර පණ්ඩිතාචාර්ය විලේගොඩ ශ්‍රී ධර්මානන්ද මහාස්ථවිරපාදයානන් වහන්සේ

වැලිතර මහාකප්පිණ මුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රන්දොම්බේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඤාණවිමල ස්ථවිරයන්වහන්සේ

රන්දොම්බේ මහාචෛත්‍ය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සෝමාලෝක නායක ස්ථවිරයන්වහන්සේ

අඹගහපිටියේ සුගත ශාසනෝදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ

මාදම්පේ සුනන්දෝදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

රන්දොම්බේ සංඝරාජ විහාරස්ථ ශික්ෂාලංකාර පරිවෙණාධිපති බලපිටියේ පණ්ඩිත විසුද්ධාලෝක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාර්ය ආර්යරත්න රේරුකාන මහතා

පටුන



# සංයුත්ත නිකාය

# 7

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**
**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ප්‍රථම මුද්‍රණය - 1956
දෙවැනි මුද්‍රණය - 2013

**ත්‍රිපිටකය**

**සංයුත්ත නිකාය 7**

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
පාලිත සේනානායක

අක්ෂර සංයෝජනය:
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක 'පාළි' නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැගීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත්

යොමු කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඤාණවිමල මහානායක ස්ථවිර**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය

කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මග පෙන්වූ මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඥාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මඟ පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තූතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තූතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2013 ජූනි

# සංඥාපනය

සිංහල ත්‍රිපිටක ධර්ම පොත් පෙළේ පසළොස් වෙනිවූ මේ පොතට සංයුත්ත නිකායේ මහා වර්ගයේ අවසානය දක්වා අන්තර්ගත කළෙමි.

මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට නොයෙක් පළාත්වල සංඝයා වහන්සේලා දුන් ආධාරය මහත් උපකාරයක් විය.

මේ පොත් පෙළ කියවීමට නොයෙක් තරාතිරම්වල පින්වතුන් දක්වන උනන්දුව ප්‍රීතියට කරුණක් වේ. සමහර පාඨශාලා ශිෂ්‍යයන් විසින්ද මේ පොත් පිළිවෙළට කියවීමට පටන් ගෙන තිබේ.

බොහෝ වැඩ කටයුතුවල යෙදී සිටින කාලයක, ශාසන ආලයෙන් ආචාර්ය ආයසිරත්න රේරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව නැවතත් දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආයසිරත්න රේරුකාන මහත්මයාගෙන් ආධාර ලැබුණා පමණක් නොව පින්වත්තේ සද්ධර්මාකර පිරිවෙනේ ආචාර්ය මණ්ඩලයද, රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන් වහන්සේද, තල්පාවිල රත්නසිරි ස්ථවිරයන් වහන්සේද, ඇල්. ජී. පෙරේරා මහතාද ආධාර කළෝය.

මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත් බෞද්ධ උපාසක පින්වතුන්ටත් සාමාජිකයින් වශයෙන් පොත් ගැනීමට බැඳී සිටින පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

16 - 6 - 55

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.  http://pitaka.lk

*x*

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත **click** කරන්න, නැතිනම් වම් පස **bookmarks** තීරුව භාවිතා කරන්න.

# පටුන

පිට

මහා වර්ගය


3. සතිපට්ඨාන සංයුත්තය 2801
    1. අම්බපාලි වර්ගය 2801
    2. නාලන්දා වර්ගය 2827
    3. සීලට්ඨිති වර්ගය 2847
    4. අනනුස්සුත වර්ගය 2860
    5. අමත වර්ගය 2869
4. ඉන්ද්‍රිය සංයුත්තය 2880
    1. සුද්ධින්ද්‍රිය වර්ගය 2880
    2. මුදුතර වර්ගය 2889
    3. ඡළින්ද්‍රිය වර්ගය 2895
    4. සුඛින්ද්‍රිය වර්ගය 2902
    5. ජරා වර්ගය 2913
    6. ඡට්ඨ වර්ගය 2931
    7. බොධිපක්ඛිය වර්ගය 2942
    8. ගංගා පෙයයාල වර්ගය 2947
    9. අප්පමාද වර්ගය 2947
    10. බලකරණීය වර්ගය 2947
    11. ඒසනා වර්ගය 2947
    12. ඕඝ වර්ගය 2948
5. සම්මප්පධාන සංයුත්තය 2949
    1. ගංගා පෙයයාල වර්ගය 2949
    2. අප්පමාද වර්ගය 2951
    3. බලකරණීය වර්ගය 2951
    4. ඒසනා වර්ගය 2952
    5. ඕඝ වර්ගය 2953

6. බල සංයුත්තය 2954
1. ගංගා පෙය්‍යාල වර්ගය 2954
2. අප්පමාද වර්ගය 2955
3. බලකරණීය වර්ගය 2956
4. ඒසනා වර්ගය 2956
5. ඕඝ වර්ගය 2956
6. ගංගා පෙය්‍යාල වර්ගය 2 2956
7. අප්පමාද වර්ගය 2 2956
8. බලකරණීය වර්ගය 2 2957
9. ඒසනා වර්ගය 2 2957
10. ඕඝ වර්ගය 2 2957
11. ගංගා පෙය්‍යාල වර්ගය 3 2958
12. අප්පමාද වර්ගය 3 2958
13. බලකරණීය වර්ගය 3 2958
14. ඒසනා වර්ගය 3 2959
15. ඕඝ වර්ගය 3 2959
7. ඉද්ධිපාද සංයුත්තය 2960
1. චාපාල වර්ගය 2960
2. පාසාද කම්පන වර්ගය 2976
3. අයෝගුළ වර්ගය 3007
4. ගංගා පෙය්‍යාල වර්ගය 3022
5. අප්පමාද වර්ගය 3022
6. බලකරණීය වර්ගය 3023
7. ඒසනා වර්ගය 3023
8. ඕඝ වර්ගය 3023
8. අනුරුද්ධ සංයුත්තය 3024
1. රහොගත වර්ගය 3024
2. දුතිය වර්ගය 3046
9. ඣාන සංයුත්තය 3052
1. ඣාන ගංගා පෙය්‍යාලය 3052
2. ධ්‍යාන අප්පමාද වර්ගය 3053
3. ධ්‍යාන බලකරණීය වර්ගය 3053
4. ධ්‍යාන ඒසනා වර්ගය 3053
5. ධ්‍යාන ඕඝ වර්ගය 3053

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**10. ආනාපාන සංයුත්තය** 3055
1. ඒකධම්ම වර්ගය 3055
2. දුතිය ඒකධම්ම වර්ගය 3082
**11. සොතාපත්ති සංයුත්තය** 3102
1. වෙළුද්වාර වර්ගය 3102
2. රාජකාරාම වර්ගය 3130
3. සරකානි වර්ගය 3146
4. පුඤ්ඤාභිසන්ද වර්ගය 3179
5. සගාථක පුඤ්ඤාභිසන්ද වර්ගය 3195
6. සප්පඤ්ඤ වර්ගය 3201
7. මහා ප්‍රඥ වර්ගය 3211
**12. සච්ච සංයුත්තය** 3215
1. සමාධි වර්ගය 3215
2. ධම්මචක්කප්පවත්තන වර්ගය 3223
3. කොටිගාම වර්ගය 3239
4. සිංසපා වර්ගය 3246
5. පපාත වර්ගය 3256
6. අභිසමය වර්ගය 3271
7. පඨම ආමකධඤ්ඤ වර්ගය 3276
8. දුතිය ආමකධඤ්ඤ වර්ගය 3280
9. තතිය ආමකධඤ්ඤ වර්ගය 3283
10. චතුර්ථ ආමකධඤ්ඤ වර්ගය 3287
11. පඤ්චම ආමකධඤ්ඤ වර්ගය 3290

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# සංයුත්ත නිකාය

# 5. මහා වර්ගය.

# 3. සතිපට්ඨාන සංයුත්තය.

## 1 අම්බපාලි වර්ගය.

### 1. අම්බපාලි සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයක භාග්‍යවතුන් වහන්සේ විශාලාමහනුවර අම්බපාලි වනයෙහි වාසය කරන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූන් භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය වදාළහ.

2. "මහණෙනි, සත්වයන්ගේ පිරිසිදුවීම පිණිස ශොකය, වැළපීම යන මොවුන්ගේ දුරුකිරීම පිණිස, දුක්-දොම්නස් දෙදෙනාගේ බැහැරලීම පිණිස, ආර්යඅෂ්ටාංගික මාර්ගය ලැබීම පිණිස, නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස යම් යම් සතර සතිපට්ඨාන කෙනෙක් වෙත්ද, මේ එකම මාර්ගය වෙයි.

3. "කවර සතරෙක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ කයෙහි කය අනුව ලබන්නේ කෙලෙස් තවන වීය්‍ය්‍යීය ඇත්තේ මනා නුවණැත්තේ සිහි ඇත්තේ ලෝකයෙහි ලොභ ද්වෙෂයන් දුරුකොට වාසය කරයිද? වේදනාවන්හි වේදනාව අනුව බලන්නේ කෙලෙස් තවන වීය්‍ය්‍යීය ඇත්තේ මනා නුවණැත්තේ සිහි ඇත්තේ ලෝකයෙහි ලොභ ද්වෙෂයන් දුරුකොට වාසය කරයිද, සිතෙහි සිත අනුව බලන්නේ කෙලෙස්

තවන වීර්‍ය්‍යය ඇත්තේ මනා නුවණ ඇත්තේ සිහි ඇත්තේ ලෝකයෙහි ලෝභ ද්වේෂයන් දුරුකොට වාසය කෙරේද, ධර්මයන්හි ධර්මය අනුව බලන්නේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ මනා නුවණැත්තේ සිහි ඇත්තේ ලෝකයෙහි ලෝභ ද්වේෂයන් දුරුකොට වාසය කෙරේද?

4. "මහණෙනි, සත්වයන්ගේ පිරිසිදුවීම් පිණිස, ශොකය-වැළපීම දුරුකිරීම පිණිස, දුක් දොම්නස් බැහැරලීම පිණිස, ආර්යඅෂ්ටාංගික මාර්ගය ලැබීම පිණිස, නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස. යම් මේ සතර සතිපට්ඨාන කෙතෙක් වෙත්ද, මේ එකම මාර්ගය වෙයි. මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණලදී. සතුටුවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දේශනාවට සතුටු වූහ.

---

## 2. සතො භික්ඛු සූත්‍රය.

1. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡේදය මෙනි)

2. "මහණෙනි, මහණතෙමේ සිහි ඇතිව නුවණැතිව වාසය කරන්නේය. මේ තොපට අපගේ අනුශාසනාවයි. මහණෙනි, කෙසේ මහණතෙම සිහි ඇත්තේවේද, මහණෙනි, මේ සස්නෙහි මහණතෙම කයෙහි කය අනුව බලන්නේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ මනා නුවණැත්තේ ලෝකයෙහි ලෝභ ද්වේෂයන් දුරුකොට වාසය කරන්නේය. වේදනාවන්හි වේදනාව අනුව බලන්නේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ මනා නුවණැත්තේ සිහි ඇත්තේ ලෝකයෙහි ලෝභ ද්වේෂයන් දුරුකොට වාසයකරයිද සිතෙහි සිත අනුව බලන්නේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ මනා නුවණැත්තේ සිහි ඇත්තේ ලෝකයෙහි ලෝභ ද්වේෂයන් දුරුකොට වාසය කෙරේද, ධර්මයන්හි ධර්මය අනුව බලන්නේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ මනා නුවණැත්තේ සිහි ඇත්තේ ලෝකයෙහි ලෝභ ද්වේෂයන්

දුරුකොට වාසය කරයි. මහණෙනි, මෙසේ වනාහි මහණතෙමේ සිහි ඇත්තේ වෙයි.

3. "මහණෙනි, කෙසේ නම් මහණතෙමේ මනා නුවණැත්තේ වේද? මහණෙනි, මේ සස්නෙහි මහණතෙමේ ඉදිරියට යෑමෙහි හා පෙරළා යෑමෙහි මනා නුවණින් දැන කරන්නේ වේද, ඉදිරි බැලීමෙහි හා දෙපස බැලීමෙහි මනා නුවණින් දැන කරන්නේ වේද, අත් පා දිග හැරීමෙහි හා හැකිළීමෙහි මනා නුවණින් දැන කරන්නේ වේද දෙපට සිවුර පාත්‍ර සිවුරු දැරීමෙහි මනා නුවණින් දැන කරන්නේ වේද, අනුභව කිරීමෙහිද, බීමෙහිද, කඩා කෑමෙහිද, රස විඳීමෙහිද, මනා නුවණින් දැන කරන්නේ වේද, මළ මූත්‍ර පහ කිරීමෙහිද මනා නුවණින් දැන කරන්නේවේද, යෑමෙහිද සිටීමෙහිද, හිඳීමෙහිද, නිදාගැනීමෙහිද, නිදිවැරීමෙහිද, කීමෙහිද, නිශ්ශබ්ද වීමෙහිද, මනා නුවණින් දැන කරන්නේ වේද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙමේ මනා නුවණැත්තේ වෙයි. මහණෙනි, මහණතෙම සිහි ඇතිව, මනා නුවණැතිව වාසය කරන්නේය. මේ තොපට අපගේ අනුශාසනාවයි.

---

## 3. අඤ්ඤතර භික්ඛු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විසාලා මහනුවර අම්බපාලි වනයෙහි වාසය කරන සේක.

2. "එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණියේය පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසක හුන්නේය. එක්පසක හුන්නාවූ ඒ මහණතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය

"ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගේ යම් ධර්මයක් අසා හුදකලාව, විවේකීව අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යය

ඇතිව සංසිඳුවන ලද සිත් ඇතිව වාසය කරන්නෙම්ද, (එබඳුවූ) ධර්මයක් භාග්‍යවතුන් වහන්සේ මට සැකෙවින් දේශනා කරන්නේ නම් මැනවි" යනුයි.

"මෙපරිද්දෙන් වනාහි ඇතැම් හිස් පුරුෂයෝ මට ආරාධනා කරත්. ධර්මයද දෙශනාකළ කල්හි මාම ලුහුබැඳිය යුතුයයි හඟිත්" යයි (වදාළහ.)

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට කොටින් දහම් දෙසන සේක්වා. සුගතයන් වහන්සේ කොටින් දහම් දෙසන සේක්වා. භාග්‍යවතුන් වහන්සේගේ දේශනාවේ අර්ථය මම ඒකාන්තයෙන් දැනගන්නෙමි. භාග්‍යවතුන් වහන්සේගේ දේශනාවට මම ඒකාන්තයෙන් හිමි කාරයෙක් වන්නෙමියි" කීය.

3. "මහණ, එසේනම් මේ සස්නෙහි නුඹ කුසල ධර්මයන්හි මුලම පිරිසිදු කරව. කුසල ධර්මයන්ගේ මුල කවරේද? පිරිසිදු සීලයද, ඍජුවූ දෘෂ්ටියද වෙයි.

"මහණ, යම් විටෙක තාගේ ශීලය පිරිසිදු වන්නේද දෘෂ්ටිය ඍජු වන්නේද. මහණ, එකල නුඹ ශීලය නිසා සීලයෙහි පිහිටා සතර සතිපට්ඨානයන් තුන් ආකාරයකින් වඩන්නෙහිය.

4. 'කවර සතරක්ද යත්? මහණ, නුඹ මෙහිලා තමාගේ කයෙහි කය අනුව බලන්නේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ මනා නුවණැත්තේ සිහි ඇත්තේ ලෝකයෙහි ලෝභය හා ද්වෙෂය දුරුකොට වාසය කරව. අනුන්ගේ කයෙහි කය අනුව බලන්නේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ මනා නුවණැත්තේ සිහි ඇත්තේ ලෝකයෙහි ලෝභ ද්වෙෂයන් දුරුකොට වාසය කරව තමාගේද අනුන්ගේද කයෙහි කය අනුව බලන්නේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ මනා නුවණැත්තේ සිහි ඇත්තේ ලොකයෙහි ලොභ ද්වෙෂයන් දුරුකොට වාසය කරව. තමාගේ වේදනාවන්හි වේදනාව අනුව බලන්නේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ මනා නුවණැත්තේ සිහි ඇත්තේ ලෝකයෙහි ලෝභ ද්වෙෂයන් දුරුකොට වාසය කරව. අනුන්ගේ වේදනාවන්හි වේදනාව අනුව බලන්නේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ

මනා නුවණැත්තේ සිහි ඇත්තේ ලෝකයෙහි ලෝභ ද්වෙෂයන් දුරුකොට වාසය කරව. තමාගේද අනුන්ගේද වේදනාවන්හි වේදනාව අනුව බලමින් කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ මනා නුවණැත්තේ සිහි ඇත්තේ ලොකයෙහි ලොභ ද්වෙෂයන් දුරුකොට වාසය කරව තමාගේ සිතෙහි සිත අනුව බලන්නේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ මනා නුවණැත්තේ සිහි ඇත්තේ ලෝකයෙහි ලොභය හා ද්වෙෂය දුරුකොට වාසය කරව. අනුන්ගේ සිතෙහි සිත අනුව බලන්නේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ මනා නුවණැත්තේ සිහි ඇත්තේ ලෝකයෙහි ලෝභය හා ද්වෙෂය දුරුකොට වාසය කරව. තමාගේද අනුන්ගේද සිතෙහි සිත අනුව බලන්නේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ මනා නුවණැත්තේ සිහි ඇත්තේ ලෝකයෙහි ලෝභය ද්වෙෂය දුරුකොට වාසය කරව.

"මහණ, නුඹ මෙහිලා තමාගේ ධර්මයන් ධර්මය අනුව බලන්නේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ මනා නුවණැත්තේ සිහි ඇත්තේ ලෝකයෙහි ලෝභ ද්වෙෂයන් දුරුකොට වාසය කරව. අනුන්ගේ ධර්මයන්හි ධර්මය අනුව බලන්නේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ මනා නුවණැත්තේ සිහි ඇත්තේ ලෝකයෙහි ලොභ ද්වෙෂයන් දුරුකොට වාසය කරව. තමාගේද අනුන්ගේද ධර්මයන්හි ධර්මය අනුව බලමින් කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ මනානුවණැත්තේ සිහි ඇත්තේ ලෝකයෙහි ලෝභ ද්වෙෂයන් දුරුකොට වාසය කරව.

**5.** "මහණ, යම් කලෙක නුඹ ශීලය නිසා ශීලයෙහි පිහිටා සතර සතිපට්ඨානයන් මෙසේ තුන් ආකාරයකින් වඩන්නෙහිද, මහණ, එකල්හි නුඹට යම් රැයක් හෝ දහවලක් හෝ පැමිණෙන්නේද (ඒ රාත්‍රියෙහි හෝ දවාලෙහි) කුසල ධර්මයන්හි දියුණුවම කැමතිවිය යුතුයි. පිරිහීමක් කැමති නොවිය යුතුයයි" වදාළේය.

**6.** ඉක්බිති ඒ මහණතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාවට සතුටුවී අනුමෝදන්ව අස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ ගරුකොට ගියේය. එකල්හි ඒ මහණ තෙමේ

හුදකලාව, විවේකීව, අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව, සංසිඳුවන ලද සිත් ඇතිව, වාසය කරන්නේ නොබෝ කලකින්ම යමක් පිණිස කුල දරුවෝ මනාකොට ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදි වෙත්ද, මාර්ග බ්‍රහ්මචර්යාව කෙළවරකොට ඇති ඒ උතුම් අර්ථය මේ ආත්මයෙහිදීම තෙමේ මනා නුවණින් දැන ප්‍රත්‍යක්ෂකොට එයට පැමිණ වාසය කෙළේය. ඉපදීම නැතිකරන ලදී. බඹසර වැස නිමවන ලදී. කටයුතු දෙය කරණ ලදී. මින්පසු ආත්ම භාවයක් නැත්තේයයි දැනගත්තේය. ඒ මහණතෙමේද රහතුන් වහන්සේලා අතරෙන් කෙනෙක් වූහ.

---

## 4. සාලාගාම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ කොසොල් රට සාලා නම් බ්‍රාහ්මණ ගමෙහි වාසය කරන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කොට මෙසේ වදාළහ. "මහණෙනි, අලුත පැවිදිවූ අලුත මේ ශාසනයට ඇතුළත්වූ යම් ඒ නවක භික්ෂූහු වෙත්ද, මහණෙනි, තෙපි ඔවුන් සතර සතිපට්ඨානයන් වඩනු පිණිස සමාදන් කරවිය යුතුය. එහි ඇතුළත් කරවිය යුතුය. පිහිටුවිය යුතුය.

2. "කවර සතරක්ද යත්? ඇවැත්නි, තෙපි එව් කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිතේ එකඟකමින් යුක්තව පැහැදුණු සිත් ඇතිව සමාහිතව එකඟ සිත් ඇතිව ඇති සැටියෙන් කය අවබොධ කරනු පිණිස කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරව්.

"කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිතේ එකඟකමින් යුක්තව පැහැදුනු සිත් ඇතිව සමාහිතව එකඟ සිත් ඇතිව වේදනාවන් ඇති සැටියෙන් අවබෝධ කරනු පිණිස වේදනාවන්හි වේදනා නැවත නැවත බලමින් වාසය කරව්.

"කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිතේ එකඟකමින් යුක්තව පැහැදුණු සිත් ඇතිව සමාහිතව එකඟ සිත් ඇතිව චිත්තයන් ඇති සැටියෙන් අවබොධ කරනු පිණිස චිත්තයන්හි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කරව්.

"කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිතේ එකඟකමින් යුක්තව පැහැදුනු සිත් ඇතිව සමාහිතව එකඟ සිත් ඇතිව ධර්මයන් ඇති සැටියෙන් අවබොධ කරනු පිණිස ධර්මයන්හි ධර්මය නැවත නැවත බලමින් වාසය කරව්.

3. "මහණෙනි, රහත් බවට නොපැමිණියාවූ නිරුත්තර නිර්වාණය බලාපොරොත්තු වන්නාවූ යම් ඒ ශෛක්ෂ භික්ෂූහු වෙත්ද ඔව්හුද වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිතේ එකඟකමින් යුක්තව පැහැදුනු සිත් ඇතිව සමාහිතව එකඟ සිත් ඇතිව කය පිරිසිඳ දැනගැනීම පිණිස කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරත්.

"වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිතේ එකඟකමින් යුක්තව පැහැදුනු සිත් ඇතිව සමාහිතව එකඟ සිත් ඇතිව වේදනාව පිරිසිඳ දැනගැනීම පිණිස වේදනාවන්හි වේදනාවන් නැවත නැවත බලමින් වාසය කරත්.

"වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිතේ එකඟකමින් යුක්තව පැහැදුනු සිත් ඇතිව සමාහිතව එකඟ සිත් ඇතිව චිත්තයන් පිරිසිඳ දැනීම සඳහා චිත්තයන්හි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කරත්.

"වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිතේ එකඟකමින් යුක්තව පැහැදුනු සිත් ඇතිව සමාහිතව එකඟ සිත් ඇතිව ධර්මයන් පිරිසිඳ දැනීම පිණිස ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරත්.

4. "මහණෙනි, ආශ්‍රවයන් ක්ෂය කළාවූ වැස නිමවන ලද බ්‍රහ්මචර්‍ය්‍යා ඇත්තාවූ අවසාන කළ කටයුතු ඇත්තාවූ බහා තැබූ ස්කන්ධ බර ඇත්තාවූ තමාගේ අර්ථයට පැමිණියාවූ ක්ෂය කළ

භව බැඳුම් ඇත්තාවූ මනාව දැනගත්තාවූ කෙලෙසුන් කෙරෙන් මිදුණාවූ රහත් භික්ෂූහු වෙත්ද, ඔව්හුද වීයර්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිතේ එකඟකමින් යුක්තව පැහැදුනු සිත් ඇතිව සමාහිතව එකඟ සිත් ඇතිව කය හා බැඳීමෙන් වෙන්ව කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරත්.

"වීයර්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිතේ එකඟකමින් යුක්තව පැහැදුනු සිත් ඇතිව සමාහිතව එකඟ සිත් ඇතිව වේදනාවන්හි බැඳීමෙන් වෙන්ව වේදනාවන්හි වේදනාවන් නැවත නැවත බලමින් වාසය කරත්.

"වීයර්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිතේ එකඟකමින් යුක්තව පැහැදුනු සිත් ඇතිව සමාහිතව එකඟ සිත් ඇතිව චිත්තයන්හි බැඳීමෙන් වෙන්ව චිත්තයන්හි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කරත්.

"වීයර්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිතේ එකඟකමින් යුක්තව පැහැදුනු සිත් ඇතිව සමාහිතව එකඟ සිත් ඇතිව ධර්මයන්හි බැඳීමෙන් වෙන්ව ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරත්.

5. "මහණෙනි, අලුත පැවිදිවූ අලුත මේ ශාසනයට ඇතුළත්වූ යම් ඒ නවක භික්ෂූහු වෙත්ද, මහණෙනි, තෙපි ඔවුන් මේ සතර සතිපට්ඨානයන් වැඩීම පිණිස සමාදන් කර විය යුතුය. එහි ඇතුළත් කරවිය යුතුය. පිහිටුවිය යුතුය"

---

## 5. අකුසලරාසි සූත්‍රය.

1. (5-8 දක්වා මේ වර්ගයේ සූත්‍රවල 1වෙනි ඡේදය මේ වර්ගයේ 4 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡේදය මෙනි)

2. "මහණෙනි, අකුශල රාශියයි මනාව කියතහොත් එය පඤ්ච නීවරණයන්ටම කියයුතු වන්නේය. මහණෙනි, මේ නීවරණ පස මුළුමනින්ම අකුසල් රැසක්මය.

3. "කවර පසක්ද යත්? 'කාමච්ඡන්ද නීවරණය. ව්‍යාපාද නීවරණය. ථීනමිද්ධ නීවරණය, උද්ධච්චකුක්කුච්ච නීවරණය, විචිකිච්ඡා නීවරණය යන මොහුයි. මහණෙනි, අකුසල රැසයයි මනාව කියත්හොත් මේ පඤ්ච නීවරණයන්ටම කිය යුතු වන්නේය. මහණෙනි, මේ නීවරණ පස මුළුමනින් අකුසල් රැසක්මය.

4. "මහණෙනි, කුසල රාශියයි මනාව කියත්හොත් මේ සතර සතිපට්ඨානයන්ටම කියයුතු වන්නේය. මහණෙනි, මේ සතර සතිපට්ඨානයෝ මුළුමනින් කුසල් රැසක්මය.

"කවර සතරක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිතේ එකඟකමින් යුක්තව පැහැදුනු සිත් ඇතිව සමාහිතව එකඟ සිත් ඇතිව ලෝකයෙහි ලෝභ ද්වෙෂයන් දුරුකොට කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරන්නේද,

"වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිතේ එකඟකමින් යුක්තව පැහැදුනු සිත් ඇතිව සමාහිතව එකඟ සිත් ඇතිව ලෝකයෙහි ලෝභ ද්වෙෂයන් දුරුකොට වේදනාවන්හි වේදනා නැවත නැවත බලමින් වාසය කරන්නේද,

"වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිතේ එකඟකමින් යුක්තව පැහැදුනු සිත් ඇතිව සමාහිතව එකඟ සිත් ඇතිව ලෝකයෙහි ලෝභ ද්වෙෂයන් දුරුකොට චිත්තයන්හි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කරන්නේද,

"වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිතේ එකඟකමින් යුක්තව පැහැදුනු සිත් ඇතිව සමාහිතව එකඟ සිත් ඇතිව ලෝකයෙහි ලෝභ ද්වෙෂයන් දුරුකොට ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරන්නේද, මහණෙනි, කුසල රාසියයි මැනවින් කියතහොත් මේ සතර සතිපට්ඨානයන්ටම කියයුතු වන්නේය. මහණෙනි, මේ සතර සතිපට්ඨානයෝ මුළුමනින් කුසල් රැසක්මය."

---

## 6. සකුණග්ඝි සූත්‍රය.

2. "මහණෙනි, පෙර වූ දෙයක් කියමි. උකුස්සෙක් වේගයෙන් බැස කැටකුරුල්ලෙකු හදිසියෙන් අල්වාගත්තේය. මහණෙනි, ඉක්බිති උකුස්සා විසින් ඩැහැගෙන යනු ලබන්නාවූ කැට කුරුල්ලා මෙසේ කියමින් හැඬීය. කෙසේද? 'අපිම කාලකණ්ණි වෙමු. අපිම අඩු පින් ඇත්තෝ වෙමු. ඒ අපි විසීමට නුසුදුසුවූ අනුන්ට අයත්වූ ස්ථානයක විසුවෙමු. ඉදින් අපි සිය පරපුරෙන් ආ තමහට අයත් වාසස්ථානයෙහි විසුවෙමු නම් මේ උකුසුතෙම (මා සමග කරන) යුද්ධයට සමර්ථ නොවේ' යනුය.

(මෙසේ කී කල්හි) උකුසුතෙම 'කැටකුරුල්ලා, තගේ පිය පරපුරෙන් ආ තට අයත් වාසස්ථානය නම් කවරේදැයි' ඇසීය.

'නගුලෙන් සාන ලද කැට ස්ථානයයි!' හේ කීය.

3. "මහණෙනි, ඉක්බිති උකුස්සා ස්වකීය බලයෙහි දැඩිව සිට ස්වකීය බලය ප්‍රකාශ කරමින් 'කැට කුරුල්ල එසේ නම් පල එහිදීද තෝ (මගෙන්) නොගැලවෙන්නෙහියයි' කියා කැටකුරුල්ලා අතහැරියේය.

"ඉක්බිති කැට කුරුල්ලා නගුලෙන් සාන ලද කැට ඇති තැනකට ගොස් ලොකු කැටයක් උඩට නැඟී උකුස්සාට 'දැන් ඉතින් වර'යයි කියමින් සිටියේය.

"ඉක්බිති උකුස්සා ස්වකීය බලයෙහි පිහිටා ස්වකීය බලය ප්‍රකාශ කරමින් යුද්ධයට ඊතලය මෙන් අත්තටු හදා ක්ෂණයකින් කැට කුරුල්ලා වෙත පාත්විය. කැට කුරුල්ලා උකුස්සා තමහට ඉතාම ළංවන අවස්ථාව යම් විටෙක දැන ගත්තේද එකෙණෙහිම එම සී කැටයේ ඇතුල් පැත්තට රිංගා ගත්තේය. මහණෙනි, ඉක්බිති උකුස්සා එහිම ළය පැළී මළේය. මහණෙනි, යමෙක් තමහට නුසුදුසු ස්ථානයෙහි හැසිරේනම් මෙසේ වන්නේය.

4. "මහණෙනි, එහෙයින් අනුන්ට අයත්වූ නුසුදුසු ස්ථානයන්හි නොවසව්. අනුන්ට අයත් තන්හි වසන්නහු පිළිබඳව

මාරයා ඉඩ ලබන්නේය. මාරයා කරුණු ලබන්නේය. මහණෙනි, භික්ෂුවට නුසුදුසු ස්ථානය නම් කුමක්ද? මේ කාමගුණ පස වෙති.

**5.** "කවර පසක්ද? ඇසින් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාවය ඇත්තාවූ ඇලීම පිණිස පවත්නාවූ ඇලිය යුතුවූ යම් රූපයෝ වෙත්ද,

"කනින් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාවය ඇත්තාවූ ඇලීම පිණිස පවත්නාවූ ඇලිය යුතුවූ යම් ශබ්දයෝ වෙත්ද,

"නැහැයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාවය ඇත්තාවූ ඇලීම පිණිස පවත්නාවූ ඇලිය යුතුවූ යම් ගන්ධයෝ වෙත්ද,

"දිවෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාවය ඇත්තාවූ ඇලීම පිණිස පවත්නාවූ ඇලිය යුතුවූ යම් රසයෝ වෙත්ද,

"කයින් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාවය ඇත්තාවූ ඇලීම පිණිස පවත්නාවූ ඇලිය යුතුවූ යම් ස්පර්ශයෝ වෙත්ද, මහණෙනි, මේ වනාහි භික්ෂුවට නුසුදුසුවූ අනුන්ට අයත් වාසස්ථානය වෙයි.

**6.** "මහණෙනි, තම පිය පරපුරෙන් එන ස්වකීය වාසස්ථානයෙහි වාසය කරව. මහණෙනි, තම පිය පරපුරෙන් එන ස්වකීය වාසස්ථානයෙහි වසන්නහු පිළිබඳව මාරයා ඉඩක් නොලබන්නේය. මාරයා කරුණක් නොලබන්නේය.

**7.** "මහණෙනි, සිය පිය පරපුරෙන් එන ස්වකීය වාසස්ථානය නම් කවරේද? මේ සතර සතිපට්ඨානයෝයි. කවර සතරක්ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිතේ එකඟකමින් යුක්තව පැහැදුනු සිත් ඇතිව සමාහිතව එකඟ සිත් ඇතිව කයෙහි කය පිරිසිඳ දැනගැනීම පිණිස කයෙහි කය නැවත බලමින් වාසය කරන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"වීර්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිතේ එකඟකමින් යුක්තව පැහැදුනු සිත් ඇතිව සමාහිතව එකඟ සිත් ඇතිව වෙදනාවන්හි වේදනා නැවත නැවත බලමින් වාසය කරන්නේය.

"වීර්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිතේ එකඟකමින් යුක්තව පැහැදුනු සිත් ඇතිව සමාහිතව එකඟ සිත් ඇතිව චිත්තයන්හි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කරන්නේය.

"වීර්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිතේ එකඟකමින් යුක්තව පැහැදුනු සිත් ඇතිව සමාහිතව එකඟ සිත් ඇතිව ධර්මයන්හි ධර්මයන් අනුව නැවත නැවත බලමින් වාසය කරන්නේය. මහණෙනි, මේ භික්ෂුවගේ සිය පරපුරෙන් එය ස්වකීය වාසස්ථානය වෙයි."

---

## 7. මක්කටාලෙප සූත්‍රය.

**2.** "මහණෙනි, හිමාලය පර්වතයෙහි වඳුරන්ට හෝ මිනිසුන්ට හෝ යා නොහැකි විසමවූ ප්‍රදේශයෝද ඇත්තාහ. මහණෙනි, හිමාලය පර්වතයෙහි වඳුරන්ට යා හැකි මිනිසුන්ට යා නොහැකි විසමවූ ප්‍රදේශයෝද ඇත්තාහ.

"මහණෙනි, හිමාලය පර්වතයෙහි වඳුරන්ටද යා හැකිවූ මිනිසුන්ටද යා හැකිවූ සිත්කළුවූ සමවූ භූමිභාගයෝද ඇත්තාහ. මහණෙනි, එහි වැද්දෝ වඳුරන් යන මාර්ගයන්හි වඳුරන් ඇල්ලීම පිණිස ලාටු එළවන්නාහ. මහණෙනි, එහි මෝඩ නොවූ ලොල් නොවූ වඳුරෝ වෙත්ද, ඔව්හු ඒ ලාටු දැක ඈත්ව යත්. යම් ඒ වඳුරෙක් මෝඩ වෙයිද, ලොල්වූ ස්වභාවය ඇත්තේද හෙතෙමේ ඒ ලාටුව කරා පැමිණ එය අතින් අල්වන්නේය. අත එහි ඇලෙන්නේය. අත මුදාගන්නෙමියි දෙවැනි අතින් අල්වන්නේය. ඒ අතද එහි ඇලෙන්නේය. දෙ අත් මුදාගන්නෙමියි පය තබන්නේය. පයද එහි ඇලෙන්නේය. දෙ අත්ද පයද මුදාගනිමියි දෙවෙනි පාදයද තබන්නේය. එයද එහි ඇලෙන්නේය. දෙ අත්ද දෙපාද මුදා ගනිමියි හොට තබන්නේය. එයද එහි ඇලෙන්නේය.

"මහණෙනි, ඒ වඳුරුතෙමේ පස් තැනෙකින් එල්ලී විනාශයට පැමිණ කෙඳිරිගාමින් වැටී සිටින්නේය. වැද්දාට කැමැත්තක් කළ හැකි වන්නේය. මහණෙනි, වැදිතෙමේ ඔහු විද එහිම පෙරළා දමා කැමති තැනකට යන්නේය. මහණෙනි, යමෙක් අනුන්ට අයත්වූ නුසුදුසු ස්ථානයෙහි වාසය කෙරේනම් මෙසේ වන්නේය.

3. "මහණෙනි, එසේ හෙයින් අනුන්ට අයත් නුසුදුසු ස්ථානයෙහි වාසය නොකරව්. මහණෙනි, අනුන්ට අයත් නුසුදුසු ස්ථානයෙහි වාසය කරන්නහු පිළිබඳ මාරයා ඉඩ ලබන්නේය. මාරයා කරුණක් ලබන්නේය.

"මහණෙනි, මහණහුගේ අනුන්ට අයත් නුසුදුසු ස්ථානය කවරේද?

4. "මේ පස්කම් ගුණ පසය. කවර පසක්ද? ඇසින් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාවය ඇත්තාවූ ඇලීම පිණිස පවත්නාවූ ඇලිය යුතුවූ රූපයෝ වෙත්ද,

"කනින් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාවය ඇත්තාවූ ඇලීම පිණිස පවත්නාවූ ඇලිය යුතුවූ ශබ්දයෝ වෙත්ද?

" නැහැයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාවය ඇත්තාවූ ඇලීම පිණිස පවත්නාවූ ඇලිය යුතුවූ ගන්ධයෝ වෙත්ද,

"දිවෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාවය ඇත්තාවූ ඇලීම පිණිස පවත්නාවූ ඇලිය යුතුවූ රසයෝ වෙත්ද,

'කයින් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාවය ඇත්තාවූ ඇලීම පිණිස පවත්නාවූ ඇලිය යුතුවූ ස්පර්ශයෝ වෙත්ද, මහණෙනි, මේ වනාහි භික්ෂුවගේ අනුන්ට අයත් නුසුදුසු වාසස්ථානය වෙයි

"මහණෙනි, සිය පරපුරෙහි එන ස්වකීය වාසස්ථානයෙහි වාසය කරව්. මහණෙනි, සිය පරපුරෙන් එන ස්වකීය

වාසස්ථානයෙහි වාසය කරන භික්ෂුව පිළිබඳව මාරයා ඉඩ නොලබන්නේය. කරුණක් නොලබන්නේය. මහණෙනි, භික්ෂුවගේ සිය පරපුරෙන් එන ස්වකීය වාසස්ථානය කවරේද? මේ සතර සතිපට්ඨානයෝයි.

**5.** "කවර සතරක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිතේ එකඟකමින් යුක්තව පැහැදුනු සිත් ඇතිව සමාහිතව එකඟ සිත් ඇතිව කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරයි.

"වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිතේ එකඟකමින් යුක්තව පැහැදුනු සිත් ඇතිව සමාහිතව එකඟ සිත් ඇතිව වේදනාවන්හි වේදනා නැවත නැවත බලමින් වාසය කරයි.

"වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිතේ එකඟකමින් යුක්තව පැහැදුනු සිත් ඇතිව සමාහිතව එකඟ සිත් ඇතිව චිත්තයන්හි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කරයි.

"වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිතේ එකඟකමින් යුක්තව පැහැදුනු සිත් ඇතිව සමාහිතව එකඟ සිත් ඇතිව ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරයි. මහණෙනි, මේ වනාහි භික්ෂුවගේ සිය පරපුරෙහි එන ස්වකීය වාසස්ථානය වෙයි."

## 8. සූදොපම සූත්‍රය.

**2.** "මහණෙනි, බාලවූ අව්‍යක්තවූ අදක්ෂ අරක්කැමියෙක් රජුන්ට හෝ රජමහ ඇමතියන්ට හෝ ඇඹුල් රස ඇත්තාවූද තිත්ත රස ඇත්තාවූද කටුක රස ඇත්තාවූද මිහිරි රස ඇත්තාවූද කර රස ඇත්තාවූද කර රස නැත්තාවූද ලුණු රස ඇත්තාවූද කිවුල් රස ඇත්තාවූද නොයෙක් ව්‍යඤ්ජන වර්ග එළවන්නේය. ඒ බාලවූ අව්‍යක්තවූ අදක්ෂවූ අරක්කැමියා ස්වකීය ස්වාමියාගේ ලකුණු නො ම ඉගෙන ගන්නේය. අද මාගේ ස්වාමියා මෙනම්

ව්‍යඤ්ජනය කැමති වෙයි. මෙයට අත දිගු කරයි. මෙය බොහෝ කොට වළඳයි මෙහි ගුණ කියයි. අද මාගේ ස්වාමියා ඇඹුල් රස ඇති ව්‍යඤ්ජනය කැමති වෙයි. ඇඹුල් රස ව්‍යඤ්ජනයට අත දිගු කරයි. ඇඹුල්රස ව්‍යඤ්ජනය බොහෝකොට වළඳයි. ඇඹුල්රස ව්‍යඤ්ජනයෙහි ගුණ කියයි. අද මාගේ ස්වාමියා තිත්ත රස ව්‍යඤ්ජනය කැමතිවෙයි. අද කටුක රස ඇති ව්‍යඤ්ජනය අද මිහිරි රස ඇති ව්‍යඤ්ජනය අද කර රස ඇති ව්‍යඤ්ජනය අද කර රස නැති ව්‍යඤ්ජනය අද ලුණු රස ඇති ව්‍යඤ්ජනය අද කිවුල් රස ඇති ව්‍යඤ්ජනය කැමතිවෙයි. කිවුල් රස ඇති ව්‍යඤ්ජනය බොහෝකොට වළඳයි. කිවුල් රස ඇති ව්‍යඤ්ජනයෙහි ගුණ කියයි. යන අන්දමින් ලකුණු කර නොගනියි.

3. "මහණෙනි, මේ අඥානවූ අව්‍යක්තවූ අදක්ෂවූ අරක්කැමියා වස්ත්‍රද නොලබන්නේ වෙයි. වැටුප්ද නොලබන්නේ වෙයි. තෑගි බෝගද නොලබන්නේ වෙයි. ඊට හේතු කවරේද? ඒ බාලවූ අව්‍යක්තවූ අදක්ෂවූ අරක්කැමි තෙම ස්වකීය ස්වාමියාගේ ලකුණු ඉගෙන නොගන්නේ නම් එය එසේ වන්නේය.

4. "මහණෙනි, එපරිද්දෙන්ම මෙහි ඇතැම් බාලවූ අව්‍යක්තවූ අදක්ෂවූ භික්ෂුවක් වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිහියෙන් යුක්තව ලොකයෙහි ලොභ ද්වෙෂයන් දුරුකොට කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරයිද, කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරන්නාවූ ඔහුගේ සිත සමාධියට නොපැමිණෙයි. ක්ලේශයෝ පහ නොවෙත්. හෙතෙම ඒ නිමිත්ත නොම ඉගෙන ගනියිද,

වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිහියෙන් යුක්තව ලොකයෙහි ලොභ ද්වෙෂයන් දුරුකොට වේදනාවන්හි වේදනාවන් නැවත නැවත බලමින් වාසය කරයිද, වේදනාවන්හි වේදනා නැවත නැවත බලමින් වාසය කරන්නාවූ ඔහුගේ සිත සමාධියට නොපැමිණෙයි. ක්ලේශයෝ පහ නොවෙත්. හෙතෙම ඒ නිමිත්ත නොම ඉගෙන ගනියිද,

වීයර්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිහියෙන් යුක්තව ලොකයෙහි ලොභ ද්වෙෂයන් දුරුකොට චිත්තයන්හි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කරන්නාවූ ඔහුගේ සිත සමාධියට නොපැමිණෙයි. ක්ලේශයෝ පහ නොවෙත්. හෙතෙම ඒ නිමිත්ත නොම ඉගෙන ගනියිද,

වීයර්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිහියෙන් යුක්තව ලොකයෙහි ලොභ ද්වෙෂයන් දුරුකොට ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරයිද, ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරන්නාවූ ඔහුගේ සිත සමාධියට නොපැමිණෙයි. ක්ලෙශයෝ පහනොවෙත්. හෙතෙම ඒ නිමිත්ත නොම ඉගෙන ගනියිද,

**5.** "මහණෙනි, ඒ බාලවූ අව්‍යක්තවූ අදක්ෂවූ මහණ තෙම මේ ආත්මයෙහි සැප විහරණ නොලබන්නේ වෙයි. ලොකොත්තර සිහිය හා නුවණ නොලබන්නේ වෙයි. ඊට හෙතු කවරේද? මහණෙනි, ඒ බාලවූ අව්‍යක්තවූ අදක්ෂවූ භික්ෂුව ස්වකීය චිත්තයාගේ නිමිත්ත නොදනී නම් එය එසේ වන්නේය.

**6.** "මහණෙනි, පණ්ඩිතවූ ව්‍යක්තවූ දක්ෂවූ අරක්කැමියෙක් රජුන්ට හෝ රජමහ ඇමතියන්ට හෝ ඇඹුල් රස ඇත්තාවූද තිත්ත රස ඇත්තාවූද කටුක රස ඇත්තාවූද මිහිරි රස ඇත්තාවූද කර රස ඇත්තාවූද කර රස නැත්තාවූද ලුණු රස ඇත්තාවූද කිවුල් රස ඇත්තාවූද නොයෙක් ව්‍යඤ්ජන වර්ග එළවන්නේය.

ඒ පණ්ඩිතවූ ව්‍යක්තවූ දක්ෂවූ අරක්කැමියා ස්වකීය ස්වාමියාගේ ලකුණු ඉගෙන ගන්නේය. අද මාගේ ස්වාමියා මේ ව්‍යඤ්ජනය කැමතිවෙයි. මෙයට අත දිගු කරයි. මෙය බොහෝකොට වළඳයි. මෙහි ගුණ කියයි. අද මාගේ ස්වාමියා ඇඹුල්රස ඇති ව්‍යඤ්ජනය කැමතිවෙයි. ඇඹුල්රස ව්‍යඤ්ජනයට අත දිගු කරයි. ඇඹුල් රස ව්‍යඤ්ජනය බොහෝකොට වළඳයි. ඇඹුල් රස ව්‍යඤ්ජනයෙහි ගුණ කියයි. අද මාගේ ස්වාමියා තිත්ත රස ව්‍යඤ්ජනය කැමතිවෙයි. අද කටුක රස ඇති ව්‍යඤ්ජනය අද මිහිරි රස ඇති ව්‍යඤ්ජනය අද කර රස ඇති ව්‍යඤ්ජනය අද කර රස නැති ව්‍යංජනය අද ලුණු රස ඇති

ව්‍යඤ්ජනය අද කිවුල්රස ඇති ව්‍යඤ්ජනය කැමති වෙයි. කිවුල් රස ඇති ව්‍යඤ්ජනයට අත දිගු කරයි. කිවුල් රස ඇති ව්‍යඤ්ජනය බොහෝකොට වළඳයි. කිවුල් රස ඇති ව්‍යඤ්ජනයෙහි ගුණ කියයි යනුවෙනි.

7. "මහණෙනි, ඒ පණ්ඩිතවූ ව්‍යක්තවූ දක්ෂවූ අරක්කැමියා වස්ත්‍රද ලබන්නේය. වැටුප්ද ලබන්නේය. තෑගි බෝගද ලබන්නේය. ඊට හෙතු කවරේද? එසේ ඒ පණ්ඩිතවූ ව්‍යක්තවූ දක්ෂවූ අරක්කැමියා ස්වාමියාගේ ලකුණු ඉගෙන ගන්නේය.

8. "මහණෙනි, එසේම මේ ශාසනයෙහි පණ්ඩිතවූ ව්‍යක්තවූ දක්ෂවූ මහණතෙමේ වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිහියෙන් යුක්තව ලොකයෙහි ලොභ ද්වෙෂයන් දුරුකොට කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරයිද, කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරන්නාවූ ඔහුගේ සිත සමාධියට පැමිණෙයි. ක්ලෙශයෝ පහවෙත්. හෙතෙමේ ඒ නිමිත්ත උගනියි.

"වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිහියෙන් යුක්තව ලොකයෙහි ලොභ ද්වෙෂයන් දුරුකොට වේදනාවන්හි වේදනාවන් නැවත නැවත බලමින් වාසය කරයිද, වේදනාවන්හි වේදනා නැවත නැවත බලමින් වාසය කරන්නාවූ ඔහුගේ සිත සමාධියට පැමිණෙයි. ක්ලෙශයෝ පහවෙත්. හෙතෙම ඒ නිමිත්ත උගනියි.

'වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිහියෙන් යුක්තව ලොකයෙහි ලොභ ද්වේෂයන් දුරුකොට චිත්තයන්හි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කරයිද, චිත්තයෙහි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කරන්නාවූ ඔහුගේ සිත සමාධියට පැමිණෙයි. ක්ලෙශයෝ පහවෙත්. හෙතෙම ඒ නිමිත්ත උගනියි.

"වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිහියෙන් යුක්තව ලොකයෙහි ලොභ ද්වෙෂයන් දුරුකොට ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරයිද, ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරන්නාවූ ඔහුගේ සිත සමාධියට පැමිණෙයි. ක්ලෙශයෝ පහවෙත්. හෙතෙමේ ඒ නිමිත්ත උගනියි.

9. "මහණෙනි, පණ්ඩිතවූ ව්‍යක්තවූ දක්ෂවූ ඒ මහණතෙමේ මේ ආත්මයෙහි සැපවිහරණද ලබන්නේ වෙයි. ලොකොත්තර සිහිය හා නුවණද ලබන්නේ වෙයි. ඊට හෙතු කවරේද? මහණෙනි, එසේ ඒ පණ්ඩිතවූ ව්‍යක්තවූ දක්ෂවූ මහණතෙමේ ස්වකීය චිත්තයාගේ නිමිත්ත උගනියි" (එහෙයිනි.)

---

## 9. බෙලුවගාමක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විශාලා නුවර බෙලුව නම් ගමෙහි වාසය කරති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කළසේක. "මහණෙනි, එව තෙපි විශාලා නුවර අවට මිත්‍රයන් යහළුවන් එකට වළඳා පුරුදු ඇතියන් ඇති ඇති සැටියෙන් වස් වසව. මම මෙහිම බෙලුව ගමෙහි වස් වසන්නෙමියි" වදාළේය.

"ස්වාමීනි, එසේයයි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දී විශාලා නුවර හාත්පස මිත්‍රයන් යහළුවන් එකට වළඳා පුරුදු වූවන් ඇති පරිදි වස් වැසූහ. භාග්‍යවතුන් වහන්සේ වනාහි බෙලුව ගමෙහි වස් වැසූහ.

2. එහි වස්වැසූ භාග්‍යවතුන් වහන්සේට කෘෘර ආබාධයක් උපන්නේය. මාරණාන්තිකවූ බලවත් වෙදනා පවතිත්. ඒ වෙදනා භාග්‍යවතුන් වහන්සේ පීඩා නොවෙමින් සිහි නුවණින් යුක්තව ඉවසූසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේට මෙසේ අදහස් විය. 'උපස්ථායකයන්ට නොදන්වා භික්ෂු සංඝයාට අවවාද නොකොට පිරිනිවන්පාන්නෙම් නම් එය මට සුදුසු නොවේ. එහෙයින් මම මේ ආබාධය වීය්‍ය්‍යීයෙන් දුරුකොට ජීවිත සංස්කාරය ආරක්ෂා කරන්නාවූ ඵල සමාපත්තිය ඉටා වාසය කරන්නෙම් නම් මැනවි කියායි.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වීය්‍ය්‍යීයෙන් ආබාධය දුරුකොට ජීවිතය රක්නාවූ ඵලසමාපත්තිය ඉටා වාසය කළසේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ගිලන්කමින් නැගිට

ගිලන්කමින් නැගිටි නොබෝකල් ඇත්තේ සවස් කාලයෙහි වැටෙන විහාර ඡායාවෙහි පණවන ලද ආසනයෙහි වැඩ හුන්හ.

3. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසෙක හිඳ ගත්තේය. එක් පසෙක හිඳගත් ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැල කෙළේය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේට ඉවසිය හැකි බව දක්නා ලදී. භාග්‍යවතුන් වහන්සේට යැපිය හැකි බව දක්නාලදී. භාග්‍යවතුන් වහන්සේගේ ගිලන්කම නිසා මගේ කය ගල් ගැසුනාක් මෙන් විය. මට දිශාද නොවැටහෙත්. මට සතිපට්ඨාන ධර්මයන්ද නොවැටහෙත්. එහෙත්, ස්වාමීනි, මට දැන් භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසංඝයා අරබයා කිසියම් පශ්චිම අවවාදයක් නොදී පිරිනිවන් නොපාන්නේ යයි ස්වල්ප මාත්‍ර ආශ්වාදයක් ලැබිණැයි" කීය.

4. "ආනන්දය දැන් භික්ෂු සංඝයා මා කෙරෙහි කුමක් හෙයින් බලාපොරොත්තු වන්නෙහිද? ආනන්දය මාවිසින් ඇතුළත් පිරිස, පිට පිරිස වශයෙන් වෙනසක් නොකොට ධර්මය දෙශනා කරන ලදී. ආනන්දය, තථාගතයන්ගේ ධර්මයෙහි ගුරුමුෂ්ටියක් නැත්තේය.

5. "ආනන්දය, යමෙකුට වනාහි මමම භික්ෂු සංඝයා පරිහරණය කරන්නෙමියි හෝ භික්ෂුසංඝයා මා බලාපොරොත්තුවෙන්ම සිටීවායි හෝ හෙතෙමේම භික්ෂු සංඝයා අරබයා කිසි අවසාන අවවාදයක් කරන්නේයයි හෝ අදහස් වේද, ආනන්දය, තථාගතයන් වහන්සේට එවැනී වූ 'මමම භික්ෂු සංඝයා පරිහරණය කරන්නෙමි. භික්ෂු සංඝයා මාම බලාපොරොත්තු වේවා' යන අදහසක් නැත. ආනන්දය, ඒ තථාගතයන් වහන්සේ භික්ෂු සංඝයා අරබයා කිනම් අවසාන අවවාදයක් කරන්නේද? ආනන්දය, දැන් වනාහි මම දිරා ගියේ වෙමි. මහළු වූයේ වෙමි. කල් ගත වූයේ වෙමි. වයසට පැමිණියේ වෙමි. අසූ වයස් වෙමි. ආනන්දය, යම්සේ දිරාගිය ගැලක් උණ පතුරු බැඳ ප්‍රයෝජනයට ගනියිද, ආනන්දය, එසේම තථාගතයන්

වහන්සේගේ කය උණ පතුරු තබා බඳින ලද්දාක් මෙන් හඟිමියි වදාළේය

**6.** "ආනන්දය, යම්විටෙක තථාගත තෙමේ සියලු රූපාදී අරමුණු මෙනෙහි නොකිරීමෙන් ඇතැම් වේදනා (ලෞකික වෙදනා) නිරුද්ධ කිරීමෙන් අනිමිත්ත චෙතො විමුක්ති සංඛ්‍යාත අර්හත්ඵල සමාපත්තියට පැමිණ වාසය කරන්නේද, ආනන්දය, එකල්හි තථාගතයන් වහන්සේට අතිශයින් පහසු වෙයි. එහෙයින් ආනන්දය, තමා ආලෝකයක් කොට ගෙන තමා පිහිට කොට ගෙන අනිකක් පිහිට කොට නොගෙන ධර්මය ආලෝකයක් කොට ගෙන ධර්මය පිහිට කොට ගෙන අනිකක් පිහිට කොට නොගෙන වාසය කරව්.

**7.** "ආනන්දය, කෙසේ නම් මහණතෙම තමා ආලෝකයක් කොට ගෙන තමා පිහිට කොට ගෙන අනිකක් පිහිට කොට නොගෙන ආලෝකයක් කොට ගෙන ධර්මය පිහිට කොට ගෙන අනිකක් පිහිට කොට නොගෙන වාසය කරන්නේද?

**8.** "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම වීර්‍ය්‍යයෙන් යුත්තව නුවණින් යුක්තව සිහියෙන් යුක්තව ලෝකයෙහි ලොභ ද්වෙෂයන් දුරුකොට කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරයිද,

"වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිහියෙන් යුක්තව ලොකයෙහි ලෝභ ද්වෙෂයන් දුරුකොට වේදනාවන්හි වෙදනාවන් නැවත නැවත බලමින් වාසය කරයිද,

"වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිහියෙන් යුක්තව ලෝකයෙහි ලෝභ ද්වෙෂයන් දුරුකොට චිත්තයන්හි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කරයිද,

'වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිහියෙන් යුක්තව ලෝකයෙහි ලෝභ ද්වෙෂයන් දුරු කොට ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරයිද,

"ආනන්දය, මෙසේ වනාහි මහණතෙමේ තමා ආලෝකයක් කොට ගෙන තමා පිහිට කොට ගෙන අනිකක් පිහිට කොට

නොගෙන ධර්මය ආලෝකයක් කොට ගෙන ධර්මය පිහිට කොට ගෙන අනිකක් පිහිට කොට නොගෙන වාසය කරන්නේ වෙයි.

9. "ආනන්දය, දැන් හෝ මගෙන් පසුව හෝ යම්කිසිවෙක් තමා ආලෝකයක් කොට ගෙන තමා පිළිසරණ කොට ගෙන අනිකක් පිහිට කොට නොගෙන ධර්මය ආලෝකයක් කොට ගෙන ධර්මය පිළිසරණ කොට අනිකක් පිහිට කොට නොගෙන වාසය කරන්නාහුද ආනන්දය, ඔව්හුම අග්‍ර භික්ෂූහු වෙත්. ඔව්හුම ශික්ෂාකාමීහු වෙත්යයි" වදාළේය.

---

## 10. භික්ඛුනූපස්සය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි වූ අනේපිඬු සිටුහු විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩ වසනසේක. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ උදය කාලයෙහි හැඳ පාත්‍ර සිව්රු ගෙන එක්තරා භික්ෂුණී ආශ්‍රමයක් යම් තැනෙක්හිද එතැනට ගියේය. ගොස් පනවන ලද ආසනයෙහි හිඳ ගත්තේය.

2. එකල්හි බොහෝ භික්ෂුණීහු ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ යම් තැනෙක්හිද එතැනට පැමිණියහ. පැමිණ, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වැඳ, එක්පසෙක හිඳගත්හ. එක්පසෙක හිඳගත් ඒ භික්ෂුණීහු ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට මෙසේ කීහ. ස්වාමීනි, ආනන්ද ස්ථවිරයන් වහන්ස, මෙහි බොහෝ භික්ෂුණීහු සතර සතිපට්ඨානයන්හි මනාකොට පිහිටුවන ලද සිත් ඇතිව වාසය කරමින් වඩ වඩා උසස් විශෙෂයන් අවබොධ කරත්."

3. 'නැගනිවරුනි, එය එසේමය. නැගනිවරුනි, එය එසේමය. නැගනිවරුනි, යම්කිසි භික්ෂුවක් හෝ භික්ෂුණියක් හෝ සතර සතිපට්ඨානයන්හි මනාකොට පිහිටුවන ලද සිත් ඇතිව වාසය කෙරේද, ඔහු වඩ වඩා උසස් විශෙෂ අවබොධ කරන්නේය යන මෙය කැමතිවිය යුතුයයි" කීය.

**4.** ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ ඒ භික්ෂුණීන්හට දැහැමි කථාවකින් කරුණු දක්වා සමාදන් කරවා සිත් තියුණු කරවා සිත් පහදවා ආසනයෙන් නැගිට ගියේය.

**5.** ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ සැවැත් නුවර පිඩු පිණිස හැසිර පසු බත් කාලයෙහි පිණ්ඩපාතයෙන් ආපසු පැමිණියේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක් හිඳ එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "ස්වාමීනි, මම උදය කාලයෙහි හැඳ පාත්‍ර සිවුරු ගෙන එක්තරා භික්ෂුණී ආශ්‍රමයක් යම් තැනෙකද එහි ගියෙමි. ගොස් පනවන ලද ආසනයෙහි හිඳ ගත්තෙමි. ස්වාමීනි, එකල්හි බොහෝ භික්ෂුණීහු මම යම් තැනෙක්හිද එහි පැමිණියහ. පැමිණ මාහට වැඳ එක්පසෙක හිඳගත්හ. එක්පසෙක හිඳගත් ඒ භික්ෂුණීහු මට මෙසේ කීහ. 'ස්වාමීනි, ආනන්ද ස්ථවිරයෙනි, බොහෝ භික්ෂුණීහු සතර සතිපට්ඨානයන්හි පිහිටුවන ලද සිත් ඇතිව වාසය කිරීමෙන් වඩ වඩා උසස් විශෙෂයන් අවබොධ කරත්'යි.

**6.** "ස්වාමීනි, මෙසේ කියන ලද්දාවූ මම ඒ භික්ෂුණීන්හට මෙසේ කීයෙමි. 'නැගනිවරුනි, ඒ එසේමය. නැගනිවරුනි එසේමය. නැගනිවරුනි, යම් භික්ෂුවක් හෝ යම් භික්ෂුණියක් හෝ සතර සතිපට්ඨානයන්හි පිහිටුවන ලද සිත් ඇතිව වාසය කෙරේද ඔහු වඩ වඩා උසස් විශෙෂයන් අවබොධකරන්නේය යන මෙය කැමැතිවිය යුතුය"යි.

**7.** "ආනන්දය, ඒ එසේමය. ආනන්දය, ඒ එසේමය. ආනන්දය, යම්කිසි භික්ෂුවක් හෝ භික්ෂුණියක් හෝ සතර සතිපට්ඨානයන්හි මනාව පිහිටුවන ලද සිත් ඇතිව වාසය කරයිද ඔහු වඩ වඩා උසස් විශෙෂයන් අවබොධ කරන්නේය යන මෙය කැමතිවිය යුතුයි.

**8.** "කවර සතරෙක්හිද යත්? ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙමේ වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිහියෙන් යුක්තව ලොකයෙහි ලොභ ද්වෙෂයන් දුරු කොට කයෙහි කය

නැවත නැවත බලමින් වාසය කරයිද, ඒ කයෙහි කය නැවත බලමින් වාසය කරන්නාවූ ඔහුට කය අරමුණු කොට කයෙහි ක්ලෙශ දාහයක් උපදින්නේ හෝ වෙයිද, සිතෙහි හැකිලීමක් උපදින්නේ හෝ වෙයිද, පිටත් අරමුණුවල සිත විසිර යන්නේ හෝ වෙයිද, ආනන්දය, ඒ භික්ෂුව විසින් යම්කිසි ප්‍රසාදය උපදින අරමුණක සිත පිහිටු විය යුතුයි. කිසියම් ප්‍රසාදය උපදින අරමුණක සිත පිහිටවූ ඔහුට තරුණ ප්‍රීතිය උපදියි, තරුණ ප්‍රීතිය උපන් ඔහුට බලවත් ප්‍රීතිය උපදියි, බලවත් ප්‍රීතියෙන් යුත් ඔහුගේ නාම කය සංසිඳෙයි. සන්සිඳුනු කය ඇත්තේ සැපය ලබයි. සැපවත් වූවහුගේ සිත සමාධියට පැමිණෙයි. හෙතෙම මෙසේ සිතයි. මම වනාහි යම් අර්ථයක් පිණිස සිත පැහැදිය යුතු අරමුණෙක්හි තැබුයෙම්ද ඒ මාගේ අර්ථය මුදුන් පැමිණියේය. දැන් එය ඉවත් කරමි'යි හෙතෙම එම අරමුණෙන් සිත ඉවත් කරන්නේද වෙයි. ක්ලෙශ විතර්කයක් නොසිතන්නේද වෙයි. ක්ලෙශ විචාරයක් නූපදන්නේද වෙයි. 'ක්ලෙශ විතර්ක විචාර රහිත වූයෙමි. භාවනාරම්මණයෙහි සිහියෙන් යුක්ත වෙමි. සැපයෙන් යුක්ත වෙමියි' දැනගනියි.

**9.** "නැවත අනිකක්ද කියමි. ආනන්දය, මහණතෙම වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිහියෙන් යුක්තව ලොකයෙහි ලෝභ ද්වෙෂයන් දුරුකොට වේදනාවන්හි වේදනාවන් නැවත නැවත බලමින් වාසය කරයිද, වේදනාවන්හි වේදනා නැවත නැවත බලමින් වාසය කරන්නාවූ ඔහුට වේදනාව අරමුණු කොට කයෙහි ක්ලෙශ දාහයක් උපදින්නේ හෝ වෙයිද, සිතෙහි හැකිලීමක් උපදින්නේ හෝ වෙයිද, පිටත් අරමුණුවල සිත විසිර යන්නේ හෝ වෙයිද. ආනන්දය, ඒ භික්ෂුව විසින් යම්කිසි ප්‍රසාදයක් උපදින අරමුණක සිත පිහිට විය යුතුයි. කිසියම් ප්‍රසාදය උපදින අරමුණක සිත පිහිටවූ ඔහුට තරුණ ප්‍රීතිය උපදියි. තරුණ ප්‍රීතිය උපන් ඔහුට බලවත් ප්‍රීතිය උපදියි. බලවත් ප්‍රීතියෙන් යුත් ඔහුගේ නාම කය සංසිඳෙයි. සංසිඳුණු කය ඇත්තේ සැපය ලබයි. සැපවත් වූවහුගේ සිත සමාධියට පැමිණෙයි. හෙතෙම මෙසේ සිතයි. 'මම වනාහි යම් අර්ථයක් පිණිස සිත පැහැදිය යුතු අරමුණෙක්හි තැබූයෙම්ද, ඒ

මාගේ අර්ථය මුදුන් පැමිණියේය, දැන් එය ඉවත් කරමි'යි හෙතෙම එම අරමුණෙන් සිත ඉවත් කරන්නේද වෙයි. ක්ලෙශ විතර්කයක් නොසිතන්නේද වෙයි. ක්ලෙශ විචාරයක් නූපදින්නේද වෙයි 'ක්ලෙශ විතර්ක විචාර රහිත වූයෙමි. භාවනාරම්මණයෙහි සිහියෙන් යුක්ත වෙමි. සැපයෙන් යුක්ත වෙමියි' දැන ගනියි.

**10.** "නැවත අනිකක්ද කියමි. ආනන්දය, මහණතෙමේ වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිහියෙන් යුක්තව ලොකයෙහි ලොභ ද්වෙෂයන් දුරුකොට චිත්තයන්හි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කරයිද චිත්තයන්හි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කරන්නාවූ ඔහුට සිත අරමුණු කොට කයෙහි ක්ලෙශ දාහයක් උපදින්නේ හෝ වෙයිද, සිතෙහි හැකිලීමක් උපදින්නේ හෝ වෙයිද පිටත් අරමුණුවල සිත විසිරයන්නේ හෝ වෙයිද ආනන්දය, ඒ භික්ෂුව විසින් යම්කිසි ප්‍රසාදය උපදින අරමුණක සිත පිහිට විය යුතුයි. කිසියම් ප්‍රසාදය උපදින අරමුණක සිත පිහිටවූ ඔහුට තරුණ ප්‍රීතිය උපදියි. තරුණ ප්‍රීතිය උපන් ඔහුට බලවත් ප්‍රීතිය උපදියි. බලවත් ප්‍රීතියෙන් යුත් ඔහුගේ නාම කය සංසිඳෙයි. සංසිඳුණු කය ඇත්තේ සැපය ලබයි. සැපවත් වූවහුගේ සිත සමාධියට පැමිණෙයි. හෙතෙම මෙසේ සිතයි. 'මම වනාහි යම් අර්ථයක් පිණිස සිත පැහැදිය යුතු අරමුණෙක්හි තැබූයෙම්ද ඒ මාගේ අර්ථය මුදුන්පැමිණියේය දැන් එය ඉවත් කරමියි' හෙතෙම එම අරමුණෙන් සිත ඉවත් කරන්නේද වෙයි. ක්ලෙශ විතර්කයක් නොසිතන්නේද වෙයි. ක්ලෙශ විචාරයක් නූපදවන්නේද වෙයි. ක්ලෙශ විතර්ක විචාර රහිත වූයෙමි. භාවනාරම්මණයෙහි සිහියෙන් යුක්ත වෙමි. සැපයෙන් යුක්ත වෙමියි' දැනගනියි.

**11.** "නැවත අනිකක්ද කියමි. ආනන්දය මහණතෙම වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිහියෙන් යුක්තව ස්කන්ධලොකයෙහි ලොභ ද්වෙෂයන් දුරුකොට ධර්මයන්හි ධර්මයන් නැවත නැවත ලබමින් වාසය කරයිද, ධර්මයන්හි ධර්මයන් නැවත නැවත ලබමින් වාසය කරන්නාවූ ඔහුට

ධර්මයන් අරමුණු කොට කයෙහි ක්ලෙශ දාහයක් උපදින්නේ හෝ වෙයිද සිතේ හැකුළුණු බවක් උපදින්නේ හෝ වෙයිද පිටත් අරමුණක සිත දුවන්නේ හෝ වෙයිද ආනන්දය, ඒ භික්ෂුව විසින් යම්කිසි පැහැදියයුතු අරමුණක සිත පිහිට විය යුතුයි. සිත පැහැදිය යුතු අරමුණක පිහිටවූ ඔහුට තරුණ ප්‍රීතිය උපදියි. තරුණ ප්‍රීතිය උපන්නහුට බලවත් ප්‍රීතිය උපදියි. බලවත් ප්‍රීතිය උපන්නහුගේ නාම කය සංසිඳෙයි. සංසිඳුණු නාම කය ඇත්තේ සැප වේදනා ඇත්තේ වෙයි. සැප වේදනා ඇත්තහුගේ සිත සමාධියට පැමිණෙයි. හෙතෙම මෙසේ සිතයි. 'මම යම් අර්ථයක් සඳහා සිත පැහැදිය යුතු අරමුණෙක්හි තැබුයෙම්ද මාගේ ඒ අර්ථය මුදුන් පැමිණියේය. දැන් සිත එයින් ඉවත් කරමියි' හෙතෙම ඒ අරමුණෙන් සිත ඉවත් කරන්නේද වෙයි. ක්ලෙශ විතර්කයන් නොසිතන්නේද වෙයි. ක්ලෙශ විචාරයන් නූපදවන්නේද වෙයි. ක්ලෙශ විතර්ක නැත්තේ වෙමි. අකුසල විචාර නැත්තේවෙමි. භාවනාරම්මණයෙහි උපන් සිහියෙන් යුක්තවූයෙම් සැප ඇත්තෙමියි දනියි. ආනන්දය, මෙසේ වනාහි පණිධාය (කමටහන් අරමුණෙන් අන් අරමුණක සිත ටික වේලාවක් තබා) කරන භාවනාව වෙයි.

12. "ආනන්දය, කෙසේ නම් සිත පිටත් අරමුණක නොතබා කරන භාවනාව වෙයිද? ආනන්දය, මහණතෙම සිත පිටත් අරමුණක නොතබා 'මා විසින් පිටත් අරමුණක සිත නොතබන ලදැයි' දැනගනියි. ඉක්බිති පූර්වය යයි කියන ලද මුල් කර්මස්ථානයෙහිද පසුයයි කියනලද අර්හත්වයෙහිද සිත නොහැකුළුණේය. කෙලෙසුන්ගෙන් මිදුණේය. සිත පිටත් අරමුණක නොතබන ලදැයි දැනගනියි. නැවතද වීර්‍ය්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිහියෙන් යුක්තව කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරමි. සැපයෙන් යුක්ත වෙමියි' දැනගනියි.

13. "ආනන්දය, මහණතෙම සිත පිටත් අරමුණක නොතබා 'මා විසින් පිටත් අරමුණක සිත නොතබන ලදැයි' දැනගනියි. ඉක්බිති පළමුව හා පසුව සිත නොහැකුළුණේය. කෙලෙසුන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

කෙරෙන් මිදුණේය. පිටත් අරමුණක සිත නොතබන ලදැයි' දැනගනියි. නැවතද වීර්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිහියෙන් යුක්තව වෙදනාවන්හි වෙදනාවන් නැවත නැවත බලමින් වාසය කරමි. සැපයෙන් යුක්ත වෙමියි දැනගනියි.

**14.** "ආනන්දය, මහණ තෙමේ පිටත් අරමුණෙක්හි සිත නොපිහිටුවා 'මා විසින් පිටත් අරමුණක සිත නොතබනලදැයි' දැනගනියි. ඉක්බිති පළමුව හා පසුව සිත නොහැකුළුණේය. කෙලෙසුන් කෙරෙන් මිදුණේය. පිටත් අරමුණක නොපිහිටුවන ලදැයි' දැනගනියි. තවද වීර්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිහියෙන් යුක්තව සිතෙහි සිත නැවත නැවත බලමින් වාසය කරමි. සැප ඇත්තෙමියි' දැනගනියි.

**15.** "ආනන්දය, මහණතෙම සිත පිටත් අරමුණක නොතබා 'මා විසින් සිත පිටත් අරමුණක නොතබන ලදැයි දැනගනියි. නැවත පළමුව හා පසුව සිත නොහැකුළුණේය. කෙලෙසුන් කෙරෙන් මිදුණේය. පිටත් අරමුණක නොතබන ලදැයි' දැනගනියි. නැවත වීර්‍යයෙන් යුක්තව නුවණින් යුක්තව සිහියෙන් යුක්තව ධර්මයන්හි ධර්මයන් අනුව නැවත නැවත බලමින් වාසය කරමි. සැපයෙන් යුක්තවෙමියි දැන ගනියි.

**16.** "ආනන්දය, මෙසේ වනාහි සිත අන් අරමුණක නොතබා කරන භාවනාව වේ. ආනන්දය, මෙසේ 'මා විසින් සිත අන් අරමුණක තබා කරන භාවනාවත් අන් අරමුණක නොතබා කරන භාවනාවත් දෙශනා කරන ලදහ. ආනන්දය, හිතෛෂීවූ ශාස්තෘවරයෙකු විසින් ශ්‍රාවකයන්හට යමක් කටයුතු නම් එය මා විසින් තොපට අනුකම්පා උපදවා කරනලදී. ආනන්දය, මේ වෘක්ෂ මූලයෝය. මේ සූන්‍යාගාරයෝය. ආනන්දය, ධ්‍යාන කරව්. ප්‍රමාද නොවව්. පසුව පසුතැවිලි වූවෝ නොවව්. මේ වනාහි අපගේ අනුශාසනාවයි."

---

# 2. නාලන්දා වර්ගය

## 1. මහා පුරිස සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "ස්වාමීනි, මහා පුරුෂයා මහා පුරුෂයායයි කියනු ලැබේ. ස්වාමිනි, කරුණු කීයකින් මහා පුරුෂයෙක් වන්නේද?"

"ශාරිපුත්‍රය, මම මිදුනු සිත් ඇති බැවින් මහා පුරුෂයෙකැ"යි කියමි. නොමිදුනු සිත් ඇති බැවින් මහාපුරුෂයෙකැ"යි නොකියමි ශාරිපුත්‍රය, කෙසේ මිදුනු සිත් ඇත්තෙක් වෙයිද?

3. "ශාරිපුත්‍රය, මේ සස්නෙහි මහණතෙම කෙලෙස් තවන වීය්‍ය්‍යීය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ශරීරයෙහි ලෝභයද, ක්‍රොධයද, සංසිඳවාගෙන ශරීරයෙහි ශරීරය අනුව දක්නා ස්වභාව ඇතිව වාසය කෙරේද? ශරීරයෙහි ශරීරය අනුව බලමින් වාසය කරන්නාවූ ඔහුගේ සිත තෘෂ්ණාවෙන් දැඩිකොට අල්වා නොගෙන ආශ්‍රවයන් කෙරෙන් මිදෙයි. නොඇලෙයි.

4. 'ශාරිපුත්‍රය, මේ සස්නෙහි මහණතෙම කෙලෙස් තවන වීය්‍ය්‍යීය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ වේදනාවන්හි ලෝභයද ක්‍රොධයද, සංසිඳවාගෙන වේදනාවෙහි වේදනාව අනුව දක්නා ස්වභාව ඇතිව වාසය කෙරේද? වේදනාවෙහි වේදනාව අනුව බලමින් වාසය කරන්නාවූ ඔහුගේ සිත තෘෂ්ණාවෙන් දැඩිකොට අල්වා නොගෙන ආශ්‍රවයන් කෙරෙන් මිදෙයි. නොඇලෙයි.

**5.** "ශාරිපුත්‍රය, මේ සස්නෙහි මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ චිත්තයන්හි ලෝභයද ක්‍රොධයද සංසිඳවාගෙන සිත් කෙරෙහි සිත් අනුව දක්නා ස්වභාව ඇතිව වාසය කෙරේද, සිත් කෙරෙහි සිත් අනුව බලමින් වාසය කරන්නාවූ ඔහුගේ සිත තෘෂ්ණාවෙන් දැඩිකොට අල්වා නොගෙන ආශ්‍රවයන් කෙරෙන් මිදෙයි. නොඇලෙයි.

**6.** "ශාරිපුත්‍රය, මේ සස්නෙහි මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව නීවරණාදි ධර්ම රාසියෙහි ලෝභයද ක්‍රොධයද සංසිඳවාගෙන නීවරණාදි ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව සිහි කරමින් වාසය කෙරේද,

"ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව බලමින් වාසය කරන්නාවූ ඔහුගේ සිත තෘෂ්ණාවෙන් දැඩිව අල්වා නොගෙන ආශ්‍රවයන් කෙරෙන් මිදෙයි. නො ඇලෙයි. ශාරිපුත්‍රය, මෙසේ වනාහි මිදුනු සිත් ඇත්තෙක්වේ. සාරිපුත්‍රය, මම මිදුනු සිත් ඇති බැවින් මහා පුරුෂයා යයි කියමි. නොමිදුනු සිත් ඇති බැවින් මහා පුරුෂයායයි නොකියමි.

---

## 2. නාලන්දා සූත්‍රය

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ නාලන්දා නුවර සමීපයෙහිවූ පාවාරිකා නම් අඹවනෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ ශාරිපුත්‍ර ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය කීය.

**2.** "අර්හත් මාර්ගඥානයෙන් භාග්‍යවතුන් වහන්සේට වඩා උසස් අන් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් අතීතයෙහිද නොවීය. අනාගතයෙහිද නොවන්නේය. දැනුදු නැතැයි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මේ කාරණයෙන් මම පැහැදුනෙමි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ශාරිපුත්‍රය, 'අර්හත් මාර්ග ඥානයෙන් භාග්‍යවතුන් වහන්සේට වඩා උසස් අන් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් අතීතයෙහි නොවීය. අනාගතයෙහි නොවන්නේය. දැනුදු නැතැයි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මේ කාරණයෙන් මම පැහැදුනෙමි' යන නුඹේ මේ වචනය (කීම) උසස්ය. ශ්‍රේෂ්ඨ වචනයකි. නිශ්චය වශයෙන් ගන්නා ලද්දකි. අභීත නාදයක් කරන ලදී.

3. "ශාරිපුත්‍රය, කිමෙක්ද තොප විසින් අතීතයෙහි යම් ඒ අර්හත් සම්‍යක් සම්බුදුවරයෝ වූවාහුද, ඒ බුදුවරු මෙබඳු සිල් ඇත්තෝ වූහ කියා හෝ ඒ බුදුවරු මෙබඳු සමාධි ඇත්තෝ වූහ කියා හෝ, මෙබඳු නුවණ ඇත්තෝ වූහ කියා හෝ, ඒ බුදුවරු මෙබඳු සම්පත්ති ඇත්තෝ වූහ කියා හෝ, ඒ බුදුවරු මෙබඳු මිදීම් ඇත්තෝ වූහ කියා හෝ, ඒ සියලු බුදුවරුන්ගේ සිත තොපගේ සිතින් පිරිසිඳ දැනගන්නා ලද්දාහුද?"-"ස්වාමීනි, එය නොවේමය."

4. "ශාරිපුත්‍රය, කිමෙක්ද? තොප විසින් අනාගතයෙහි යම් ඒ අර්හත් සම්‍යක් සම්බුදුවරයෝ වන්නාහුද, ඒ බුදුවරු මෙබඳු සිල් ඇත්තෝ වන්නාහුය කියා හෝ, ඒ බුදුවරු මෙබඳු සමාධි ඇත්තෝ වන්නාහ කියා හෝ ඒ බුදුවරු මෙබඳු නුවණ ඇත්තෝ වන්නාහ කියා හෝ, ඒ බුදුවරු මෙබඳු විහරණ ඇත්තෝ වන්නාහ කියා හෝ, ඒ බුදුවරු මෙබඳු විමුක්ති ඇත්තෝ වන්නාහ කියා හෝ, ඒ සියලු බුදුවරයන්ගේ සිත තමන්ගේ සිතින් පිරිසිඳ දැනගන්නා ලද්දාහුද?"-"ස්වාමීනි, එය එසේ නොවේමය."

5. "කිමෙක්ද? ශාරිපුත්‍රය, තොප විසින් භාග්‍යවත් තෙමේ මෙබඳු සිල් ඇත්තේය කියා හෝ, භාග්‍යවත් තෙමේ මෙබඳු සමාධි ඇත්තේය කියා හෝ, භාග්‍යවත් තෙමේ මෙබඳු නුවණ ඇත්තේය කියා හෝ, භාග්‍යවත් තෙමේ මෙබඳු විහරණ ඇත්තේය කියා හෝ, භාග්‍යවත් තෙමේ මෙබඳු මිදීමක් ඇත්තේය කියා හෝ නුඹ විසින් මෙකල අර්හත් සම්‍යක් සම්බුද්ධයන්ගේ සිත තොපගේ සිතින් පිරිසිඳ දැන ගන්නා ලද්දේද?"-"ස්වාමීනි, එය එසේ නොවේමය."

**6.** "ශාරිපුත්‍රය, මෙහිලා නුඹට අතීත, අනාගත, වර්තමාන අර්හත් සම්‍යක් සම්බුදුවරයන්ගේ සිත් දැනීමේ නුවණක් නැත්නම්, ශාරිපුත්‍රය, එසේ ඇති කල්හි කුමක් නිසා නුඹ විසින් යම් ඒ නිර්වාණාවබොධයක් වේද එයින් භාග්‍යවතුන් වහන්සේට වඩා උසස් අන් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් නොවීය. නොවන්නේය. දැනුදු නැත කීයෙහිද?"-"ස්වාමීනි, එසේ හෙයින් මම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදුනෙමි යන උසස් වචනයක් කියන ලද්දේද, ඒකාන්තකොට ගන්නා ලද්දේද, ශ්‍රෙෂ්ඨ නාදයක් නාද කරන ලද්දේද, ස්වාමීනි, අතීත, අනාගත, වර්තමාන අර්හත් සම්බුදුවරයන්ගේ සිත් දැනගැනීමේ නුවණක් මට නොමැත. එසේ වුවද (නය ග්‍රාහ වශයෙන්) ප්‍රත්‍යක්ෂ කරන ලද ධර්මයට අනුව ලබන ලද අනුමාන ඥානයෙන් දැනගන්නා ලදී.

"ස්වාමීනි, යම්සේ දැඩි පවුරක්ද ශක්තිමත් පවුරු තොරන් ඇති එකම දොරටුවක් රජෙකුගේ පිටිසර නගරයක් වේද, එහි නොහඳුනන්නන් වළක්වන හඳුනනවුන් ඇතුල් කරන පණ්ඩිත ව්‍යක්ත නුවණැති දොරටු පාලකයෙක් වන්නේය. හෙතෙම ඒ නගරයාගේ හාත්පසින් වැටී ඇති මග ඇවිදින්නේ පවුරේ ගඩොල් දෙකක් පහවූ තැනක් හෝ යටත් පිරිසෙයින් බළලකුට යාහැකි සිදුරක් පමණවත් නොදකියි. ඔහුට මෙබඳු සිතක් වන්නේය. 'මහත් ශරීර ඇති යම්කිසි සත්ව කෙනෙක් නගරයට ඇතුල්වෙත්ද, නික්මෙත්ද, ඒ සියලුම සත්වයෝ මේ දොරින්ම ඇතුල්වන්නාහුද වෙත්. නික්මෙන්නාහුද වෙත්' යනුයි

**7.** "ස්වාමීනි, එපරිද්දෙන් මා විසින් ප්‍රත්‍යක්ෂකරන ලද ධර්මයට අනුව ලබන ලද අනුමාන ඥානයෙන් දන්නා ලදී. කෙසේද? ස්වාමිනි, අතීත කාලයෙහි යම් ඒ අර්හත් සම්‍යක් සම්බුදුවරු වූවාහුද ඒ සියලු භාග්‍යවතුන් වහන්සේලා සිත කිලුටු කරන නුවණ දුබල කරන පස්වැදෑරුම් නීවරණයන් දුරුකොට සතර සතිපට්ඨානයන්හි මනාකොට පිහිටුවන ලද සිත් ඇත්තාහු සප්ත බොධ්‍යඞගයන් තත්වූ පරිද්දෙන් වඩා උතුම් සම්‍යක් සම්බොධිය අවබෝධ කළාහුය. ස්වාමීනි, අනාගතයෙහි අර්හත්වූ

සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේලා ඇත්තාහුද, ඒ සියලු භාග්‍යවතුන් වහන්සේලාද සිත කිලුටුකරන්නාවූ නුවණ දුර්වල කරන්නාවූ පඤ්ච නීවරණයන් දුරුකොට සතර සතිපට්ඨානයන්හි පිහිටුවන ලද සිත් ඇත්තාහු සප්ත බොධ්‍යඞගයන් තත්වූ පරිදි වඩා අනුත්තර සම්‍යක් සම්බොධිය අවබොධ කරන්නාහ. මෙකල අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේද සිත කිලිටු කරන නුවණ දුබල කරන පස් වැදෑරුම් නීවරණය දුරුකොට සතර සතිපට්ඨානයන්හි මනාකොට සිත පිහිටුවා සප්තබොධ්‍යංගයන් තත්වූපරිද්දෙන් වඩා සම්‍යක් සම්බොධිය අවබොධ කළසේක" යනුවෙනි.

8. "ශාරිපුත්‍රය, යහපත, යහපත ශාරිපුත්‍රය, එසේ හෙයින් නුඹ මේ ධර්ම මාර්ගය භික්ෂූන්ටද භික්ෂුණීන්ටද උපාසකයන්ටද, උපාසිකාවන්ටද නැවත නැවත කියව. ශාරිපුත්‍රය, යම් හිස් පුරුෂයන්හට බුදුන් කෙරෙහි සැකයක් හෝ විමතියක් වන්නේද, මේ ධර්ම මාර්ගය අසා ඔවුන්ගේද තථාගතයන් වහන්සේ කෙරෙහි යම් සැකයක් හෝ විමතියක් වේද? එය දුරුවන්නේයයි" වදාළේය.

---

## 3. චුන්ද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් ශාරිපුත්ත ස්ථවිරයන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කළහ. එසමයෙහි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මගධරට නාලන්දක නම් ගමෙහි රෝගීව දුකට පත්ව දැඩි ගිලන්ව වාසය කළහ. චුන්ද සාමණේර තෙමේද ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්වහන්සේට උපස්ථාන කෙරෙයි. ඉක්බිති ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආබාධයෙන්ම පිරිනිවන් පෑහ.

2. "එකල්හි චුන්ද සාමණේර තෙමේ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ පාත්‍ර සිවුරු ගෙන සැවැත්නුවර

අනේපිඬු සිටුහුගේ ආරාමය යම් තැනෙකද, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ යම් තැනකද එතැන්හි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ චුන්ද සාමණේර තෙමේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට මේ කාරණය කීවේය. "ස්වාමීනි ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ පිරිනිවන් පෑ සේක. මේ උන්වහන්සේගේ පාත්‍ර සිවුරුය."

"ආයුෂ්මත් චුන්දයෙනි, භාග්‍යවතුන් වහන්සේ දැකීම පිණිස කථා පඬුරක් ඇත්තේය. ආයුෂ්මත් චුන්දයෙනි, එව්. භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි යමු. ගොස් මේ කාරණය භාග්‍යවතුන් වහන්සේට කියමු" යනුයි.

3. ආයුෂ්මත් චුන්ද සාමණේර තෙමේ "එසේය. ස්වාමීනියි" ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්හට පිළිතුරු දුන්හ. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේද ආයුෂ්මත් චුන්ද සාමණේර තෙමේද භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නාහුය. එක්පසෙක හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය කීහ.

"ස්වාමීනි, මේ චුන්ද සාමණේර තෙමේ මෙසේ කීයේය. 'ස්වාමීනි, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ පිරිනිවන් පෑහ. මේ උන්වහන්සේගේ පාත්‍ර සිවුරුය' යනුයි. තවද, ස්වාමීනි, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ පිරිනිවන් පෑහයි අසා මගේ ශරීරය උලහිඳුවන ලද්දක් මෙන් හටගත් තද බව ඇත්තේ විය. මට දිසාවන්ද පැහැදිලි නොවෙත්. මට ධර්මයෝද නොවැටහෙත්යයි" කීය.

4. "කිමෙක්ද ආනන්දය, ශාරිපුත්‍ර තෙමේ නුඹගේ ශීල රාශිය හෝ ගෙන පිරිනිවන් පෑවේද? සමාධි රාශිය හෝ ගෙන පිරිනිවන් පෑවේද, නුවණ රාශිය හෝ ගෙන පිරිනිවන් පෑවේද, විමුක්ති රාශිය හෝ ගෙන පිරිනිවන් පෑවේද, විමුක්ති ඥාණදස්සන (ප්‍රත්‍යවෙක්ෂා ඥාණ) රාශිය හෝ ගෙන පිරිනිවන් පෑවේද?"

"ස්වාමීනි, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරතෙමේ මගේ ශීල රාශිය හෝ ගෙන පිරිනිවන් පෑවේ නොවෙයි. සාමාධි රාශිය හෝ ගෙන පිරිනිවන් පෑවේ නොවෙයි. නුවණ රාශිය හෝ ගෙන පිරිනිවන් පෑවේ නොවෙයි විමුක්ති රාශිය හෝ ගෙන පිරිනිවන් පෑවේ නොවෙයි. විමුක්ති ඥාණ දස්සන රාශිය හෝ ගෙන පිරිනිවන් පෑවේ නොවෙයි. එහෙත් ස්වාමීනි, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරතෙමේ අවවාද දෙන්නෙක් විය. අවබොධ කරන්නෙක් විය. කරුණු දක්වන්නෙක් විය සමාදන් කර වන්නෙක් උනන්දු කර වන්නෙක් සතුටුකර වන්නෙක් සමාන බඹසර ඇත්තවුන්ට අනලස්ව බණ කීමෙන් උදව් කරන්නෙක් විය. අපි ඒ ශාරීපුත්‍ර ස්ථවිරයන්ගේ ධර්මසාරය, ධර්ම සම්පත්තිය ධර්මයෙන් කළ උදව්ව සිහි කරන්නෙමුයි" කීය.

**5.** "ආනන්දය, මා විසින් තොපට පළමුකොටම සියළු ප්‍රිය මනාප දෙයින් වෙන්වන බව වෙනස්වන බව අන් අයුරකින් වන බව කියන ලද්දේ නොවේද? ආනන්දය, යම් ඒ හටගත්තාවූ, උපන්නාවූ ප්‍රත්‍යයෙන් නිපන්නාවූ විනාශවන සුළු දෙයක් වේද, එය ඒකාන්තයෙන් වෙනස් නොවේවා යන මෙය කොයින් ලැබේද? ඊට කරුණු නැත්තේය. ආනන්දය, සාරවත් මහ ගසක ගස ඉතිරිව තිබියදී මහ අත්ත විනාශ වෙයිද, ආනන්දය, එසේම මහත්වූ භික්ෂු සමුහයා ශෙෂව සිටියදී හරයවූ ශාරිපුත්‍ර පිරිනිවන් පෑය. ආනන්දය, හටගත්තාවූ හේතු ප්‍රත්‍යයෙන් නිපන්නාවූ විනාශවන සුළු දෙයක්වේද, එය ඒකාන්තයෙන් විනාශ නොවේවායි යන මෙය කොයින් ලැබේද? මීට හේතු නැත්තේය. එබැවින් ආනන්දය, තමා ආලෝකයක් කොට වාසය කරව්. තමා පිහිට කොට ගෙන වාසය කරව්. අනික් සරණක් නැත. ආලෝකයක් කොට වාසය කරව්. ධර්මය සරණ කොට වාසය කරව්. අනෙක් සරණක් නැත.

**6.** "ආනන්දය, කෙසේ නම් මහණතෙමේ තමා ආලෝකයක් කොට ගෙන තමා පිහිට කොට ගෙන අන් පිහිටක් නොමැතිව ධර්මය ආලෝකයක් කොට ගෙන ධර්මය පිහිට කොට ගෙන අන් පිහිටක් නොමැතිව වෙසේද? ආනන්දය, මේ ශාසනයේ

මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලෝභයද, ක්‍රොධයද සංසිඳවාගෙන කයෙහි කය අනුව දකිමින් වාසය කෙරේද

"ආනන්දය, මේ ශාසනයේ මහණතෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලෝභයද, ක්‍රොධයද සංසිඳවාගෙන වේදනාවෙහි වේදනාව අනුව දකිමින් වාසය කෙරේද,

"ආනන්දය, මේ ශාසනයේ මහණතෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලෝභයද, ක්‍රොධයද සංසිඳවාගෙන සිත් කෙරෙහි සිත් අනුව දකිමින් වාසය කෙරේද,

"ආනන්දය, මේ ශාසනයේ මහණතෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලෝභයද ක්‍රොධයද සංසිඳවාගෙන නීවරණාදි ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව දකිමින් වාසය කෙරේද?

"ආනන්දය, මේ වනාහි මහණතෙම තමා ආලොකයක් කොට තමා පිහිටකොට අනුන් පිහිටක් නැතිව ධර්මය ආලොකයක් කොට ධර්මය පිහිට කොට අන් පිහිටක් නැතිව වෙසේ. ආනන්දය, යම් කිසිවෙක් දැන් හෝ මගේ ඇවෑමෙන් හෝ තමා ආලෝකයක් කොට තමා පිහිට කොට අන් පිහිටක් නැතිව ධර්මය ආලෝකයක් කොට ධර්මය පිහිටකොට අන් පිහිටක් නැතිව වාසය කරන්නාහුද, ආනන්දය, යම්කිසි ශික්ෂාකාමී භික්ෂූහු වෙත්ද, ඒ භික්ෂූහු ඒ අග්‍ර අමෘතයෙහි වන්නාහුයයි' වදාළේය.

---

## 4. උක්කවෙලා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සාරිපුත්ත මොග්ගල්ලාන තෙරුන් දෙනම පිරිනිවන් පෑ නොබෝ දිනකින් මහත් භික්ෂු සංඝයා සමග වැදෑරට

උක්කවෙලා නුවර සමීපයෙහිවූ ගඞ්ගා නදී තීරයෙහි වැඩ වාසය කරන සේක. එකල භික්ෂු සංඝයා විසින් පිරිවරණ ලද්දාවූ භාග්‍යවතුන් වහන්සේ එලිමහනෙහි වැඩ සිටි සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්ද වූ භික්ෂු සංඝයා බලා භික්ෂූන් ඇමතු සේක.

2. "මහණෙනි, සාරිපුත්ත මොග්ගල්ලාන දෙනම පිරිනිවන්පෑ කල්හි පිරිස හිස්වූවක් මෙන් හැගේ. යම් දිසාවක සාරිපුත්ත මොග්ගල්ලාන දෙනම වසත්නම් ඒ දිශාව නොසිස්ය. මා විසින් ඒ දිසාව බැලිය යුතු නොවේ. "මහණෙනි, අතීත කාලයෙහි යම් ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේලා වූවාහුද, මට සාරිපුත්ත මොග්ගල්ලාන දෙනම යම්සේද, එවැනිම ශ්‍රාවක යුගලයක් ඒ භාග්‍යවතුන් වහන්සේලාටද වූහ. මහණෙනි, අනාගත කාලයෙහි යම් ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේලා වන්නාහුද මට සාරිපුත්ත මොග්ගල්ලාන දෙනම යම්සේද, එවැනිම ශ්‍රාවක යුගලයක් ඒ භාග්‍යවතුන් වහන්සේලාටත් වන්නාහ. මහණෙනි යම් ශ්‍රාවක කෙනෙක් ශාස්තෲන් වහන්සේට සමානවම ත්‍රිවිධ සාසනය සම්පූර්ණ කරන්නාහුද අවවාදයට අනුව පිළිපදින්නාහුද, සිව් පිරිසට ප්‍රිය මනාප වන්නාහුද, ගරු කටයුතු බවට පැමිණෙන්නාහුද එය ශ්‍රාවකයන්ගේ ආශ්චර්යයක් වෙයි. ශ්‍රාවකයන්ගේ අද්භූතයෙක් වෙයි. මෙවැනි ශ්‍රාවක දෙනමක් පිරිනිවන් පෑ කල්හි පවා තථාගතයන් වහන්සේට සෝකයක් හෝ වැළපීමක් හෝ නැත. එය තථාගතයන් වහන්සේගේ ආශ්චර්යය කාරණය අද්භූත කාරණය වෙයි.

3. යම් ඒ උපන්නාවූ පහළවූ හේතු ප්‍රත්‍යයෙන් නිපන්නාවූ විනාශවන සුළු දෙයක් වේද, එය ඒකාන්තයෙන් නැති නොවේවා යන මෙය කොයින් ලැබේද ඊට කරුණු නැත. මහණෙනි, යම්සේ සාරවත් මහත් ගස තිබියදී එහි අතිශයින් මහත් අතු විනාශ වන්නාහුද, මහණෙනි, එපරිද්දෙන්ම සාරවත් මහත් භික්ෂු සංඝයා සිටියදී සාරිපුත්ත මොග්ගල්ලාන දෙනම පිරිනිවන් පෑහ. මහණෙනි, යම් ඒ උපන් හටගත් හෙතු ප්‍රත්‍යයෙන් නිපන්

විනාශවනසුළු යමක් වේද, එය ඒකාන්තයෙන් විනාශ නොවේවා යන මෙය කොයින් ලබන්නේද ඊට හේතු නැත. එබැවින් තමා ආලෝකයක් කොට තමා පිහිට කොට අනිකක් පිහිට නොකොට වාසය කරව්. ධර්මය ආලෝකයක් කොට ධර්මය සරණකොට අනිකක් පිහිට නොකොට වාසය කරව්.

මහණෙනි, මහණ තෙමේ කෙසේනම් තමා ආලෝකයක් කොටගෙන තමා පිහිට කොට ගෙන අනිකක් පිහිට කොට නොගෙන ධර්මය පිහිට කොටගෙන අනිකක් පිහිට කොට නොගෙන වාසය කරන්නේද,

4. "මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ක්‍රොධයද සංසිඳවාගෙන කයෙහි කය අනුව දකිමින් වාසය කෙරේද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ක්‍රොධයද සංසිඳවාගෙන වෙදනාවෙහි වෙදනාව දකිමින් වාසය කෙරේද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ක්‍රොධයද සංසිඳවාගෙන සිත් කෙරෙහි සිත් අනුව දකිමින් වාසය කෙරේද,

"මහණෙනි, මේ ශාසනයේ මහණ තෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ක්‍රොධයද සංසිඳවාගෙන නීවරණාදී ධර්මයන් කෙරෙහි ධර්මයන් අනුව දකිමින් වාසය කෙරේද,

5. "මහණෙනි, මෙසේ වනාහි මහණතෙම තමා ආලෝකයක් කොටගෙන තමා පිහිට කොට ගෙන අනිකක් පිහිට කොට නොගෙන ධර්මය ආලෝකයක් කොට ගෙන ධර්මය පිහිට කොට ගෙන අනිකක් පිහිට කොට නොගෙන වාසය කරන්නේ වෙයි.

මහණෙනි යම් කිසිවෙක් දැන් හෝ මගේ ඇවෑමෙන් හෝ තමා ආලෝකයක් කොටගෙන තමා පිහිට කොට ගෙන අනිකක් පිහිට කොට නොගෙන ධර්මය ආලොකයක් කොට ගෙන ධර්මය පිහිට කොට ගෙන අනිකක් පිහිට කොට නොගෙන වාසය කරන්නාහුද ඔව්හුම අතිශයින් අග්‍ර වූවාහුද වෙත්. ඔව්හුම ශික්ෂාකාමී වූවාහුද වෙත්.

---

## 5. බාහිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් බාහිය ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැනට පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ආයුෂ්මත් බාහිය ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය.

2. 'ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගේ යම් ධර්මයක් අසා හුදෙකලාව විවේකීව අප්‍රමාදීව කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව සංසිඳවන ලද සිත් ඇතිව වාසය කරන්නෙම්ද එබඳු ධර්මයක් මට භාග්‍යවතුන් වහන්සේ සැකෙවින් දේශනා කරනසේක් නම් මැනවි"

"එසේනම් බාහියෙනි, නුඹ කුසල ධර්මයන්හි මුලම පිරිසිදු කරව. කුසල ධර්මයන්ගේ මුල කවරේද? පිරිසුදුවූ සීලයද ඍජුවූ දෘෂ්ටියද වෙයි. බාහිය යම් කලක පටන් නුඹගේ සීලය පිරිසිදු වන්නේද, දිට්ඨිය ඍජු වන්නේද, බාහිය එතැන් පටන් නුඹ සීලය නිසා සීලයෙහි පිහිටා සතර සතිපට්ඨානයන් වඩන්නෙහිය.

3. "කවර සතරෙක්ද? බාහිය, නුඹ මේ ශාසනයෙහි කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද ක්‍රොධයද සංසිඳවාගෙන කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරව.

"බාහිය, නුඹ මේ ශාසනයෙහි කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද ක්‍රොධයද සංසිඳවාගෙන වේදනාවෙහි වේදනාව නැවත නැවත බලමින් වාසය කරව.

"බාහිය, නුඹ මේ ශාසනයෙහි කෙළෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ක්‍රොධයද සංසිඳවාගෙන චිත්තයන්හි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කරව.

"බාහිය, නුඹ මේ සාසනයෙහි කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ක්‍රොධයද සංසිඳවා නීවරණාදී ධර්මයන් කෙරෙහි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරව.

**5.** "බාහිය, නුඹ යම් කලක පටන් සීලය නිසා සීලයෙහි පිහිටා මේ සතර සතිපට්ඨානයන් මෙසේ වඩන්නෙහිද ඒනිසා බාහිය, නුඹට යම් රාත්‍රියක් හෝ දාවලක් පැමිණෙන්නේද (ඒ දවාලෙහිද රාත්‍රියෙහිද) දියුණුවක්ම කැමතිවිය යුතුයි පිරිහීමක් නොවේ.

**6.** ඉක්බිති ආයුෂ්මත් බාහිය ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුව අනුමෝදන්ව ආසනයෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ ගරුකොට ගියේය. ඉක්බිති ආයුෂ්මත් බාහිය ස්ථවිරතෙමේ තනිව විවේකීව අප්‍රමාදීව කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව සංසිඳවනලද සිත් ඇතිව වාසය කරන්නේ නොබෝ කලකින්ම යමක් සඳහා කුලපුත්‍රයෝ මනාකොට ගිහිගෙයින් නික්ම සසුනෙහි පැවිදි වෙත්ද? මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව කෙළවර කොට ඇති ඒ උතුම් වූ නිවන මේ ආත්මභාවයෙහිම තෙමේ මනා නුවණින් දැන ප්‍රත්‍යක්ෂකොට එයට පැමිණ වාසය කෙළේය.

**7.** ඉපදීම ක්ෂයවිය. බඹසර වැස නිමවනලදී. කළ යුත්ත කරනලදී. මින්පසු ආත්මභාවයක් නැතැයි දැන ගත්තේය.

ආයුෂ්මත් බාහිය ස්ථවිරතෙමේද රහතුන් අතරින් එක්තරා රහත් කෙනෙක් විය.

---

## 6. උත්තිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් උත්තිය ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය එක්පසෙක හුන්නාවූ ආයුෂ්මත් උත්තිය ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය කීහ.

2. "ස්වාමීනි, මම භාග්‍යවතුන්වහන්සේගේ යම් ධර්මයක් අසා හුදෙකලාව විවේකිව අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව සංසිඳවන ලද සිත් ඇතිව වාසය කරන්නෙම්ද එබඳු ධර්මයක් මට භාග්‍යවතුන් වහන්සේ සැකෙවින් දේශනා කරන සේක්නම් මැනවි."

3. "උත්තිය එසේ නම් නුඹ කුසල ධර්මයන්හි මුල පිරිසිදු කරව. කුසල ධර්මයන්ගේ මුල කවරේද? සීලය පිරිසිදු කිරීමද, දෘෂ්ටිය ඍජු කිරීමද වෙයි. උත්තිය, යම් කලක පටන් නුඹගේ සීලය පිරිසිදු වන්නේද, දිට්ඨිය ඍජු වන්නේද, උත්තිය, එතැන් පටන් නුඹ සීලය නිසා සීලයෙහි පිහිටා සතර සතිපට්ඨානයන් වඩන්නෙහිය.

4. "කවර සතරෙක්ද? උත්තිය, නුඹ මේ ශාසනයෙහි කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ කයෙහි ලොභයද, ක්‍රොධයද, සංසිඳවා කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරව.

"උත්තිය නුඹ මේ ශාසනයෙහි කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ කයෙහි

ලොභයද, ක්‍රොධයද සංසිඳුවා වේදනාවෙහි වේදනාව නැවත නැවත බලමින් වාසය කරව.

"උත්තිය, නුඹ මේ ශාසනයෙහි කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ශරීරයෙහි ලොභයද ක්‍රොධයද සංසිඳුවා චිත්තයන්හි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කරව.

"උත්තිය, නුඹ මේ ශාසනයෙහි කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ක්‍රොධයද සංසිඳුවා නීවරණාදී ධර්මයන් කෙරෙහි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරව.

**5.** "උත්තිය, නුඹ යම් කලක පටන් සීලය නිසා සීලයෙහි පිහිටා මේ සතර සතිපට්ඨානයන් වඩන්නෙහිද එතැන් පටන් නුඹ මාරයාට අයත් ලෝකයෙන් එතරට යන්නෙහිය."

**6.** ඉක්බිති ආයුෂ්මත් උත්තිය ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුව අනුමෝදන්ව ආසනයෙන් නැගිට භාග්‍යවතුන්වහන්සේට වැඳ ගරුකොට ගියේය. ඉක්බිති ආයුෂ්මත් උත්තිය ස්ථවිරතෙමේ හුදෙකලාව විවේකීව අප්‍රමාදිව කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව සංසිඳවන ලද සිත් ඇතිව වාසය කරන්නේ නොබෝ කලකින්ම යමක් සඳහා කුලපුත්‍රයෝ මනාකොට ගිහිගෙයින් නික්ම සසුනෙහි පැවිදි වෙද්ද? මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාව කෙළවර කොට ඇති ඒ උතුම්වූ නිවන මේ ආත්මභාවයෙහිම තෙමේ මනා නුවණින් දැන ප්‍රත්‍යක්ෂකොට එයට පැමිණ වාසය කළේය.

**7.** ඉපදීම ක්ෂයවිය. බඹසර වැස නිමවන ලදී. කළ යුත්ත කරන ලදී. මෙයින් අනික් ආත්ම භාවයක් නැතැයි මනාකොට දැනගත්තේය. ආයුෂ්මත් උත්තිය ස්ථවිරතෙමේද රහතුන්ගෙන් එක්තරා කෙනෙක් විය.

## 7. අරිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනියි’ කියා භික්ෂූන් ඇමතූසේක. ‘ස්වාමීනියි’ කියා ඒ භික්ෂූන් භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. “මහණෙනි, වඩන ලද්දාවූ බහුල වශයෙන් පුරුදු කරන ලද්දාවූ උතුම්වූ නිවන් පිණිස පවත්නාවූද මේ සතර සතිපට්ඨානයෝ එය කරන්නාහු මනාකොට දුක් නැති කිරීමට පමුණුවත්.

3. “ඒ සතර සතිපට්ඨානයෝ කවරහුද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ක්‍රොධයද සංසිඳවා කයෙහි කය නැවත නැවත බලමින් වාසය කෙරේද,

“මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ක්‍රොධයද සංසිඳවා වේදනාවෙහි වේදනා නැවත නැවත බලමින් වාසය කෙරේද,

“මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ක්‍රොධයද සංසිඳවා චිත්තයන් කෙරෙහි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කෙරේද,

“මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ක්‍රොධයද සංසිඳවා නීවරණාදී ධර්මයන් කෙරෙහි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කෙරේද?

4. “මහණෙනි, වඩන ලද්දාවූ බහුල වශයෙන් පුරුදු කරන ලද්දාවූ උතුම්වූ නිවන් පිණිස පවත්නාවූ මේ සතර

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සතිපට්ඨානයෝ එය කරන්නාහු මනාකොට දුක් නැති කිරීමට පමුණුවත්.”

---

## 8. බ්‍රහ්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බුද්ධත්වය ලැබූ අළුත උරුවේලාවෙහි නෙරඤ්ජා නදී තෙර අජපාල නුගරුක මුල වැඩ සිටි සේක. එකල්හි රහසිගතව විවේක සැපයෙන් සිටියාවූ භාග්‍යවතුන් වහන්සේට මෙබඳු අදහසක් පහළවීය. ‘සත්වයන්ගේ පිරිසිදු වීම පිණිසද ශෝක කිරීම වැළපීම යන මොවුන්ගේ ඉක්මවීම පිණිසද දුක් දොම්නස් පහකිරීම පිණිසද ආර්‍ය්‍යඅෂ්ටාංගික මාර්ගයට පැමිණීම පිණිසද නිර්වාණය ප්‍රත්‍යක්ෂකර ගැනීම පිණිසද පවත්නාවූ මේ සතර සතිපට්ඨාන කෙනෙක් වෙත්ද, මෙය එකම මාර්ගය වන්නේය’ යනුයි.

2. “සතර සතිපට්ඨානයෝ කවරහුද? මහණතෙම කෙලෙස්තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ක්‍රොධයද සංසිඳවා හෝ කයෙහි කය නැවත නැවත බලමින් වාසය කෙරේද,

“මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ කයෙහි ලොභයද ක්‍රොධයද සංසිඳවා වේදනාවෙහි වේදනාව නැවත නැවත බලමින් වාසය කෙරේද,

“මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද ක්‍රොධයද සංසිඳවා චිත්තයන්හි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කෙරේද,

“මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව වීර්‍ය්‍යයෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ක්‍රොධයද සංසිඳවා නීවරණාදී ධර්මයන් කෙරෙහි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කෙරේද,

3. 'සත්වයන්ගේ පිරිසිදු බව පිණිසද ශෝකකිරීම වැළපීම යන මොවුන්ගේ ඉක්මවීම පිණිසද දුක් දොම්නස් පහකිරීම පිණිසද ආර්‍ය්‍යඅෂ්ටාංගික මාර්ගයට පැමිණීම පිණිසද නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිසද යම් ඒ සතිපට්ඨාන කෙනෙක් වෙත්ද මෙය එකම මාර්ගයවෙයි.

4. එකල්හි සහම්පතී මහා බ්‍රහ්මතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ අදහස තමාගේ සිතින් යම්සේ බලවත් පුරුෂයෙක් හැකුලූ අතක් දිග හරින්නේද, දික්කළ අතක් හකුලන්නේද, එපරිද්දෙන් බඹලොවෙහි අතුරුදහන්වූයේ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි පහළවිය. ඉක්බිති සහම්පතී මහාබ්‍රහ්මතෙමේ උතුරු සළුව එක් අංශයක කොට භාග්‍යවතුන් වහන්සේට ඇඳිලි බැඳ මෙසේ කීය.

5. "භාග්‍යවතුන් වහන්ස, එය එසේය. සුගතයන් වහන්ස, එය එසේය සත්වයන්ගේ පිරිසිදුවීම පිණිස ශෝක කිරීම වැළපීම යන මොවුන්ගේ ඉක්මවීම පිණිස දුක් දොම්නස් පහකිරීම පිණිස ආර්‍ය්‍යඅෂ්ටාංගික මාර්ගයට පැමිණීම පිණිස නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස යම් ඒ සතර සතිපට්ඨාන කෙනෙක් වෙත්ද, මෙය එකම මාර්ගය වන්නේය.

6. "ඒ සතර සතිපට්ඨානයෝ කවරහුද? ස්වාමීනි, මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ක්‍රොධයද සංසිඳවා කයෙහි කය නැවත නැවත බලමින් වාසය කෙරේද,

"ස්වාමීනි, මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ක්‍රොධයද සංසිඳවා වේදනාවෙහි වේදනාව නැවත නැවත බලමින් වාසය කෙරේද,

"ස්වාමීනි, මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ක්‍රොධයද සංසිඳවා චිත්තයන්හි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කෙරේද,

"ස්වාමීනි, මහණතෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ක්‍රොධයද සංසිඳුවා නීවරණාදී ධර්මයන් කෙරෙහි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කෙරේද,

6. "ස්වාමීනි, සත්වයන්ගේ පිරිසිදු බව පිණිස ශෝක කිරීම වැළපීම යන මොවුන්ගේ ඉක්මවීම පිණිස දුක් දොම්නස් පහකිරීම පිණිස ආර්‍ය්‍යඅෂ්ටාංගික මාර්ගයට පැමිණීම පිණිස නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස යම් ඒ සතර සතිපට්ඨාන කෙනෙක් වෙත්ද? මෙය එකම මාර්ගය වන්නේය යනුයි." සහම්පතී බ්‍රහ්මතෙම මෙසේ කීය. මෙසේ කියා නැවත මෙසේ කීය.

> "හිතානුකම්පීවූ ඉපදීම ක්ෂය කිරීමයයි කියන ලද නිර්වාණය දන්නාවූ බුදුරජාණන් වහන්සේ නිවනට යා යුතු එකම මාර්ගය වන්නාවූ මාර්ගය දක්නා සේක. අතීතයෙහි යම් කෙනෙක් සතර ඔඝයන් එතර කළාහු නම් ඔව්හුද මේ මාර්ගයෙන්ම එතරවූහ. අනාගතයෙහි යම් කෙනෙක් එතර වන්නාහු නම් ඔව්හුද මේ මාර්ගයෙන්ම එතර වන්නාහ. මේ කාලයෙහි යම් කෙනෙක් එතර වෙත්නම් ඔව්හුද මේ මාර්ගයෙන්ම එතර වෙත්."

---

## 9. සේදක සූත්‍රය. (1)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සුම්භ ජනපදයෙහි සුම්භයන්ගේ සේදක නම්වූ නියම් ගමක්වේද එහි වැඩ වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ඇමතූසේක.

2. "මහණෙනි, පෙර වූ දෙයක් කියමි. උණගසින් ක්‍රීඩා දක්වන්නෙක් උණගස ඔසවා මේදක ථාලිකා නම් අතවැසියා ඇමතුවේය. යහලු මේදක ථාලිකය, නුඹ මෙහි එව, හුණගසට නැගී මගේ කරපිට සිටුවයි කීය. මහණෙනි, මේදක ථාලිකා

නම් අතවැසියා එසේය, ආචාර්‍ය්‍යයෙනි,යි උණගසින් ක්‍රීඩා දක්වන්නාට උත්තර දී උණගසට නැගී ආචාර්‍ය්‍යයාගේ කරපිට සිටියේය. මහණෙනි, එකල්හි ක්‍රීඩා දක්වන්නා මේදක ථාලිකා නම් අතවැසියාට මෙය කීවේය. 'යහළු මේදක ථාලිකය, නුඹ මා ආරක්ෂා කරව, මම නුඹ ආරක්ෂා කරන්නෙමි. මෙසේ අපි ඔවුනොවුන් ප්‍රවේශම් කරන්නාහු ඔවුනොවුන් රකින්නාවූ ශිල්පද දක්වන්නෙමු. ලාභද ලබන්නෙමු, සැපසේ උණගසින් බසින්නෙමු' යනුයි.

3. "මහණෙනි, මෙසේ කීකල්හි මේදක ථාලිකා අතවැසි තෙම ආචාර්‍ය්‍යවරයාට මෙසේ කීය. 'ආචාර්‍ය්‍යයෙනි, මෙය එසේ නොවන්නේය. ආචාර්‍ය්‍යයෙනි, ඔබ තමා රකින්න, මම තමා රකින්නෙමි. මෙසේ අපි තම තමාම ප්‍රවෙශම් වූවාහු තම තමාම රැකුනාහු ශිල්පද දක්වන්නෙමු. ලාභද ලබන්නෙමු. සැපසේ උණගසින්ද බසින්නෙමු. එය එහි උපායයි' (සුදුසු පිළිවෙලයි.) භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

4. "මහණෙනි, යම්සේ මේදක ථාලිකා අතවැසිතෙමේ ආචාර්‍ය්‍යයාට කීවේද එමෙන් තමා රකින්නෙමියිද සතිපට්ඨානය සේවනය කළ යුතුයි. අනුන් රකින්නෙමියිද සතිපට්ඨානය සේවනය කළ යුතුයි. මහණෙනි, තමා රකින්නේ අනුන්ද රකියි අනුන් රකින්නේ තමාද රකියි. මහණෙනි, තමා රකින්නේ කෙසේ නම් අනුන් රකියිද? මහණෙනි පුරුදු කිරීමෙන්, වැඩීමෙන් බහුල වසයෙන් කිරීමෙන්ය.

5. "මහණෙනි, මෙසේ වනාහි තමා රක්නේ අනුන්ද රකියි. මහණෙනි, කෙසේ නම් අනුන් රකින්නේ තමා රකියිද? ඉවසීමෙන් හිංසා නොකිරීමෙන් මෛත්‍රී සිතින් කරුණාවෙන්ද වේ. මහණෙනි, මෙසේ වනාහි අනුන් රකින්නේ තෙමේ රැකෙයි. මහණෙනි, තමා රකින්නෙමියිද සතිපට්ඨානය සේවනය කළයුතුයි. අනුන් රකින්නෙමියිද සතිපට්ඨානය සේවනය කළයුතුයි. මහණෙනි තමා රකින්නේ අනුන්ද රකියි. අනුන් රකින්නේ තමාද රකියි" යනුයි.

## 10. සේදක සූත්‍රය. (2)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සුම්භ ජනපදයෙහි සුම්භයන්ගේ සේදක නම් නියම්ගමක් වේද, එහි වාසය කළසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූසේක. "මහණෙනි, යම්සේ ජනපද කල්‍යාණිය, ජනපදකල්‍යාණියයයි කීකල්හි මහජනයා රැස්වන්නේද, ඒ ජනපද කළ්‍යාණිය වනාහි නැටුමෙහි දක්ෂය. ගී කීමෙහි දක්ෂය.

2. "මහණෙනි, ජනපද කල්‍යාණිය නටන්නීය. ගායනා කරන්නීයයි කීකල්හි වැඩියත් මහජන සමූහයා රැස්වන්නේය. එකල්හි ජීවත්වෙනු කැමති, නොමැරෙනු කැමති, සැප කැමති, දුක් පිළිකුල් කරන පුරුෂයෙක් එන්නේය. ඔහුට මෙසේ කියන්නාහුය. 'පින්වත් පුරුෂය, නුඹ විසින් මුවවිට දක්වා පිරුණු මේ තෙල් පාත්‍රය මහාජන සමූහයාටත් ජනපද කළ්‍යාණියටත් අතරින් ගෙනයා යුතුයි. යම් තැනකදී එයින් ස්වල්පයක්වත් හලන්නේ නම් එතැනදීම තාගේ හිස ගසන්නේයයි' ඔහු පසු පසින් ඔසවන ලද කඩු ඇති එක් පරුෂ යෙක්ද ලුහුබඳින්නේය.

"මහණෙනි, ඒ කුමකැයි හඟින්නාහුද? ඒ පුරුෂතෙම තෙල් පාත්‍රය සිහි නොකොට පිටත ප්‍රමාදයකට පැමිණෙන්නේද?"

'ස්වාමීනි, එය එසේ නොවේ"

3. "මහණෙනි, අර්ථය හැඟවීම පිණිස මා විසින් උපමාවක් කරණලදී. මෙය එහි අර්ථයයි. මහණෙනි, මුවවිට දක්වා පිරුණු තෙල් පාත්‍රය යන මෙය කායගතා සතියට නමෙකි. මහණෙනි, එසේ හෙයින් මෙහිලා මෙසේ හික්මිය යුතුයි. අප විසින් කායගතාසතිය වඩන ලද්දී බහුලවශයෙන් කරන ලද්දී, යානාවක් මෙන් කරන ලද්දී, අනුව සිටින ලද්දී පුරුදු කරනලද්දී, මනාකොට පටන්ගන්නා ලද්දී' වන්නේයයි මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුයි."

---

# 3. සීලට්ඨිති වර්ගය.

## 1. කුසල සීල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේද, ආයුෂ්මත් භද්‍ර ස්ථවිරතෙමේද පැළලුප් නුවර කුක්කුටාරාමයෙහි වාසය කරති. එකල්හි ආයුෂ්මත් භද්‍ර ස්ථවිරතෙමේ සවස් වේලෙහි විවේකයෙන් නැගී ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් යම්තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් සමග සතුටුවිය. සතුටු වියයුතු, සිහිකටයුතු කථාවකොට නිමවා ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට මෙසේ කීය.

2. "ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් ඒ යහපත්වූ චතුපාරිශුද්ධි සීලයක් දෙශනාකරන ලද්දාහුද? මේ යහපත්වූ චතුපාරිශුද්ධි සීලයෝ කුමක් නිසා දෙශනා කරන ලද්දාහුද?"

"ආයුෂ්මත් භද්‍රකය, යහපති, යහපති ආයුෂ්මත් භද්‍රකය, ඔබගේ ප්‍රඥා මාර්ගය යහපත්ය, වැටහීම යහපත්ය, පිළිවිසීම යහපත්ය. ආයුෂ්මත් භද්‍රකය ඔබ මෙසේ විචාරන්නේ ආයුෂ්මත් ආනන්දයෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් ඒ යහපත් චතුපාරිශුද්ධි සීලයක් දෙශනා කරන ලදද භාග්‍යවතුන් වහන්සේ විසින් මේ, චතුපාරිසුද්ධි සීලය කුමක් සඳහා දෙශනා කරන ලද්දේද කියායි. ඇවැත්නි, එසේය"

3. "ආයුෂ්මත් භද්‍රක, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් යහපත්වූ චතුපාරිශුද්ධි සීලයක් දෙශනා කරන ලද්දේද භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ යහපත් චතුපාරිශුද්ධි සීලයෝ සතර සතිපට්ඨානයන්ගේ වැඩීම පිණිසම දෙසනා කරන ලදහ.

4. "ඒ සතර සතිපට්ඨානයෝ කවරහුද? ඇවැත්නි, මේ සාසනයෙහි මහණතෙම කෙලෙස් තවන වියර්‍ය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද, ක්‍රොධයද, සංසිඳවා කයෙහි කය නැවත නැවත බලමින් වාසය කෙරේද,

"ඇවැත්නි, මේ සාසනයෙහි මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද, ක්‍රොධයද සංසිඳුවා වේදනාවෙහි වෙදනාව නැවත නැවත බලමින් වාසය කෙරේද?

"ඇවැත්නි, මේ සාසනයෙහි මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද, ක්‍රොධයද සංසිඳුවා චිත්තයන්හි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කෙරේද,

"ඇවැත්නි, මේ සාසනයෙහි මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද, ක්‍රොධයද සංසිඳුවා නීවරණාදී ධර්මයන් කෙරෙහි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කෙරේද,

5. "ආයුෂ්මත් භද්‍ර, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් ඒ යහපත් චතුපාරිශුද්ධි සීලයක් දෙශනා කරන ලද්දේද, භාග්‍යවතුන් වහන්සේ මේ යහපත් චතුපාරිශුද්ධි සීලයෝ මේ සතර සතිපට්ඨානයන්ගේ වැඩීම පිණිසම දෙශනා කරන ලදහ."

---

## 2. සද්ධම්ම චිරට්ඨිති සූත්‍රය

1. (මේ ඡෙදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡෙදය මෙනි.)

2. "ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයෙනි, තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි යම් කාරණයකින් සද්ධර්මය බොහෝ කල් නොපවත්නේද එයට හේතු කවරේද ප්‍රත්‍යය කවරේද?

"ආයුෂ්මත් ආනන්දයෙනි, තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි සද්ධර්මය බොහෝ කල් පවත්නේද ආයුෂ්මත් ආනන්දය ඊට හේතු කවරේද ප්‍රත්‍ය කවරේද?

"ආයුෂ්මත් භද්‍රය, යහපති, යහපති. ආයුෂ්මත් භද්‍රය ඔබගේ ප්‍රඥාමාර්ගය යහපත්ය. වැටහීම යහපත්ය. පිළිවිසීම යහපත්ය. අයුෂ්මත් භද්‍රය නුඹ මෙසේ විචාරන්නෙහිද?

'ආයුෂ්මත් ආනන්දයෙනි, තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි යම් කාරණයකින් සද්ධර්මය බොහෝ කල් නොපවත්නේද ඊට හේතු කවරේද ප්‍රත්‍යය කවරේද? තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි යම් කරුණකින් සද්ධර්මය බොහෝ කල් පවත්නේ වේද ඊට හේතු කවරේද? ප්‍රත්‍යය කවරේද, කියාද?" "ඇවැත්නි, එසේය."

3. "ආයුෂ්මත්නි, සතර සතිපට්ඨානය පුරුදු නොකළ බැවින් බහුල වශයෙන් පුරුදු නොකළ බැවින් තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි සද්ධර්මය බොහෝ කල් පවත්නේ නොවේ. ආයුෂ්මත්නි, සතර සතිපට්ඨානයන් පුරුදු කළ බැවින් බහුල වශයෙන් පුරුදු කළ බැවින් තථාගතයන් වහන්සේ පිරිනිවන් පෑ කල්හි සද්ධර්මය බොහෝ කල් පවත්නේවේ.

4. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 4 වෙනි ඡේදය මෙනි.)

5. "ආයුෂ්මත්නි, මේ සතර සතිපට්ඨානයන්ගේ වැඩීම නොකළ බැවින් බහුල වශයෙන් වැඩීම නොකළ බැවින් තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි සද්ධර්මය බොහෝ කල් පවත්නේ නොවේ. ආයුෂ්මතුනි, මේ සතර සතිපට්ඨානයන්ගේ වැඩීම කළ බැවින් බහුල වශයෙන් වැඩීම කළ බැවින් තථාගතයන් වහන්සේ පිරිනිවන් පෑ කල්හි සද්ධර්මය බොහෝ කල් පවත්නේ වෙයි"

---

## 3. සද්ධම්ම පරිහානි සූත්‍රය.

1. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡේදය මෙනි.)

2. "ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයෙනි, යම් හෙතුවකින් සද්ධර්මයාගේ පිරිහීම වේද? ඊට හේතු කවරේද ප්‍රත්‍යය කවරේද, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයිනි, යම් හෙයකින් සද්ධර්මයාගේ නොපිරිහීම වේද, එයට හේතු කවරේද ප්‍රත්‍යය කවරේද?"

"ආයුෂ්මත් භද්‍රය, යහපති, යහපති. ආයුෂ්මත් භද්‍රය, ඔබගේ ප්‍රඥා මාර්ගය යහපත්ය. වැටහීම යහපත්ය. පිළිවිසීම යහපත්ය. ආයුෂ්මත් භද්‍රය, නුඹ මෙසේ විචාරන්නෙහිද? 'ආයුෂ්මත් ආනන්දයෙනි, යම් හෙයකින් සද්ධර්මයාගේ පිරිහීම වේද, එයට හේතු කවරේද ප්‍රත්‍යය කවරේද? ආයුෂ්මත් ආනන්දයෙනි, යම් හේතුවකින් සද්ධර්මයාගේ පිරිහීම නොවේද එයට හේතු කවරේද ප්‍රත්‍යය කවරේද, කියාද?"-"ආයුෂ්මතුනි එසේය."

3. "ආයුෂ්මතුනි, සතර සතිපට්ඨානය පුරුදු නොකළ බැවින් බහුල වශයෙන් පුරුදු නොකළ බැවින් සද්ධර්මයාගේ පරිහානිය වේ. ආයුෂ්මතුනි, සතර සතිපට්ඨානය පුරුදු කළ බැවින් බහුල වශයෙන් පුරුදු කළ බැවින් සද්ධර්මයාගේ පරිහානිය නොවේ.

4. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 4 වෙනි ඡේදය මෙනි)

5. "ආයුෂ්මතුනි, මේ සතර සතිපට්ඨානයන්ගේ වැඩීම නොකළ බැවින් බහුල වශයෙන් වැඩීම නොකළ බැවින් සද්ධර්මයාගේ පරිහානියවේ. ආයුෂ්මතුනි මේ සතර සතිපට්ඨානයන්ගේ වැඩීම කළ බැවින් බහුල වශයෙන් වැඩීම කළ බැවින් සද්ධර්මයාගේ නොපිරිහීම වන්නේයි."

---

## 4. සුද්ධික සතිපට්ඨාන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. "ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, මේ සතිපට්ඨාන සතරකි.

3. "කවර සතරෙක්ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව

සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳවා කයෙහි කය නැවත නැවත බලමින් වාසය කෙරේද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳවා වේදනාවෙහි වේදනාව නැවත නැවත බලමින් වාසය කෙරේද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද ද්වේෂයද සංසිඳවා චිත්තයන්හි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කෙරේද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳවා නීවරණාදි ධර්මයන් කෙරෙහි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කෙරේද?

4. "මහණෙනි, මොවුහු වනාහි සතර සතිපට්ඨාන ධර්මයෝ වෙත්."

---

## 5. බ්‍රාහ්මණ ධම්මට්ඨිති සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි අනේපිඬුසිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එකල්හි එක්තරා බ්‍රාහ්මණයෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය. සතුටු වියයුතුවූ, සිහි කටයුතුවූ, කථාවකොට නිමවා එක් පසෙක හිඳගත්තේය. එක් පසෙක හිඳගත් ඒ බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේට මෙය කීය.

2. "භවත් ගෞතමයන් වහන්ස, තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි යම් හෙයකින් සද්ධර්මය බොහෝ කල් නොපවත්නේද, එයට හේතු කවරේද, ප්‍රත්‍යය කවරේද? භවත්

ගෞතමයන් වහන්ස, තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි යම් හෙයකින් සද්ධර්මය බොහෝ කල් පවත්නේද එයට හේතු කවරේද? ප්‍රත්‍යය කවරේද?”

3. “බ්‍රාහ්මණය, සතර සතිපට්ඨානය පුරුදු නොකළ බැවින් බහුල වසයෙන් පුරුදු නොකළ බැවින් තථාගතයන් පිරිනිවි කල්හි සද්ධර්මය බොහෝකල් පවත්නේ නොවේ. බ්‍රාහ්මණය සතර සතිපට්ඨානය පුරුදු කළ බැවින් බහුල වසයෙන් පුරුදු කළ බැවින් තථාගතයන් පිරිනිවි කල්හි සද්ධර්මය බොහෝ කල් පවත්නේ වේ.

4. “කවර සතරක්හුගේද යත්? බ්‍රාහ්මණය, මේ ශාසනයෙහි මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද, ද්වෙෂයද, සංසිඳවා කයෙහි කය නැවත නැවත බලමින් වාසය කෙරේද,

“බ්‍රාහ්මණය, මේ ශාසනයෙහි මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳවා වේදනාවෙහි වෙදනාව නැවත නැවත බලමින් වාසය කෙරේද,

“බ්‍රාහ්මණය, මේ ශාසනයෙහි මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද, ද්වෙෂයද සංසිඳවා චිත්තයන්හි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කෙරේද, බ්‍රාහ්මණය මේ ශාසනයෙහි මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද, ද්වෙෂයද සංසිඳවා නීවරණාදී ධර්මයන් කෙරෙහි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කෙරේද,

5. “බ්‍රාහ්මණය, මේ සතර සතිපට්ඨානයන් පුරුදු නොකළ බැවින් තථාගතයන් පිරිනිවි කල්හි සද්ධර්මය බොහෝ කල් පවත්නේ නොවේ. බ්‍රාහ්මණය, මේ සතර සතිපට්ඨානයන් වැඩූ බැවින් බහුල වසයෙන් වැඩූ බැවින් තථාගතයන් පිරිනිවි කල්හි සද්ධර්මය බොහෝ කල් පවත්නේ වෙයි යනුයි.

**6.** මෙසේ වදාළකල්හි ඒ බ්‍රාහ්මණතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය කීය.

"භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපති. භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපති. යම්සේ යටිකුරුකර තැබූ භාජනයක් උඩුකුරු කරන්නේද, වැසුනු දෙයක් විවෘත කරන්නේද, මංමුළා වූවෙකුට මඟ කියන්නේද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි තෙල් පහනක් දරන්නේද එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය දේශනා කරනලදී. ඒමම භාග්‍යවතුන්වහන්සේද ධර්මයද භික්ෂු සංඝයාද සරණයමි. අද පටන් මා දිවිහිමියෙන් සරණගිය උපාසකයකු කොට දරණසේක්වායි කීය."

---

## 6. කණ්ටකී වන සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේද සාකෙත නුවර කණ්ටකී වනයෙහි වාසය කරත්. ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේද ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේද සවස් කාලයෙහි විවේකයෙන් නැගී සිටියාහු ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් යම් තැනෙක්හිද එතැනට ගියාහුය. ගොස්, ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් සමග සතුටු වූවාහුය. සතුටු වියයුතු සිහි කටයුතු කථාවකොට නිමවා එක් පසෙක හුන්නාහුය.

**2.** එක් පසෙක හුන් ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්ට මෙසේ කීහ. "ආයුෂ්මත් අනුරුද්ධයෙනි, සෙඛ සෙඛයයි කියනු ලැබේ. ආයුෂ්මත් අනුරුද්ධයෙනි, කොපමණකින් සෙඛ නම් වේද?"

"ඇවැත්නි, සතර සතිපට්ඨානයන්ගේ කොටසක් වඩන ලද හෙයින් සෙඛ නම් වේ.

3. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 4 වෙනි ඡේදය මෙනි.)

5. "ඇවැත්නි, මේ සතර සතිපට්ඨානයන්ගේ කොටසක් වඩනලද හෙයින් සෙඛ නම් වන්නේ යයි කීය.

---

## 7. සෙඛාසෙඛ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේද ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේද ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේද සාකෙත නුවර කණ්ටකී වනයෙහි වාසය කරති. ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේද ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේද සවස් කාලයෙහි විවේක සුවයෙන් නැඟී සිටියාහු ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් යම් තැනකද එතැනට ගියාහුය. ගොස් ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් සමග සතුටු වූවාහුය. සතුටු වියයුතු සිහිකටයුතු කථාවකොට නිමාව එක්පසෙක සිටියාහුය. එක් පසෙක සිටි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්ට මෙය කීය.

2. "ඇවැත් අනුරුද්ධයෙනි, අසෙඛ අසෙඛයයි කියනු ලැබේ. ඇවැත්නි, කොපමණකින් අසෙඛ නම් වේද?"

"ඇවැත්නි, සතර සතිපට්ඨානයන් සම්පූර්ණකොට වඩන ලද හෙයින් අසෙඛ නම් වේ.

3. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 4 වෙනි ඡේදය මෙනි.)

4. "ඇවැත්නි, මේ සතර සතිපට්ඨානයන් සම්පූර්ණ කොට වඩනලද බැවින් අසෙඛ නම් වන්නේයයි" කීය.

---

## 8. මහාභිඤ්ඤ සූත්‍රය.

1. (මේ ඡේදය මේ වර්ගයේ 7 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡේදය මෙනි.)

2. "ආයුෂ්මත් අනුරුද්ධතෙමේ කවර නම් ධර්මයන් පුරුදු කළ බැවින් බහුල වශයෙන් පුරුදු කළ බැවින් මහත්වූ විශෙෂ ඥානයට (ෂඩ්අභිඥාවන්ට) පැමිණියේද?" "ඇවැත්නි, සතර සතිපට්ඨානයන් වඩනලද බැවින් බහුල වශයෙන් පුරුදු කරනලද බැවින් මහත් විශෙෂ ඥානයට (ෂඩ් අභිඥාවන්ට) පැමිණියේ වෙමි.

"ඇවැත්නි, මම මේ ශාසනයෙහි කෙලෙස් තවන වීය්‍ය්‍ය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද, ද්වෙෂයද සංසිඳවා කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරමි.

"ඇවැත්නි, මම මේ ශාසනයෙහි කෙලෙස් තවන වීය්‍ය්‍ය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද, ද්වෙෂයද සංසිඳවා වේදනාවන්හි වේදනාවන් නැවත නැවත බලමින් වාසය කරමි.

"ඇවැත්නි, මම මේ ශාසනයෙහි කෙලෙස් තවන වීය්‍ය්‍ය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද, ද්වෙෂයද සංසිඳවා චිත්තයන්හි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කරමි.

"ඇවැත්නි, මම මේ ශාසනයෙහි කෙලෙස් තවන වීය්‍ය්‍ය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද, ද්වෙෂයද සංසිඳවා ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරමි.

4. ඇවැත්නි, මේ සතර සතිපට්ඨානයන් වඩනලද බැවින් බහුල වශයෙන් පුරුදුකළ බැවින් මහත් විශෙෂ ඥානයට (ෂඩ් අභිඥාවන්ට) පැමිණියේ වෙමි. මම මේ සතර සතිපට්ඨානයන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

පුරුදුකළ බැවින් බහුල වසයෙන් පුරුදුකළ බැවින් දහසක් සක්වල විශෙෂයෙන් දන්නේ වෙමියි කීය."

---

## 9. සිරිවඩ්ඪ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී එක් සමයෙක්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම කලන්දක නිවාප නම්වූ වෙළුවනයෙහි වාසයකරයි. එකල්හි වනාහි සිරිවඩ්ඪ ගෘහපති තෙමේ රෝගාතුර වූයේ, දුක් වූයේ, දැඩිසේ ගිලන් වූයේ වෙයි.

ඉක්බිති සිරිවඩ්ඪන ගෘහපතිතෙමේ එක්තරා පුරුෂයෙකුට කථාකළේය. "පින්වත් පුරුෂය, නුඹ එව. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එතැනට යව, ගොස්, 'ස්වාමීනි, සිරිවඩ්ඪන ගෘහපතිතෙමේ රෝගාතුරවූයේ දැඩි ගිලන් වූයේ වෙයි. හෙතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ගේ පා හිසින් වඳීයයි' මගේ වචනයෙන් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ පාද හිසින් වඳුව, මෙසේද කියව.

"ස්වාමීනි, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, සිරිවඩ්ඪ ගෘහපතියාගේ ගෘහය යම් තැනෙක්හිද අනුකම්පා උපදවා එතැනට වඩිනු මැනව, කියායි"

2. ඒ පුරුෂතෙමේද "ස්වාමීනි, එසේ"යයි, ගෘහපතියාට පිළිතුරු දී ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් යම් තැනකද එතැනට ගියේය. ගොස්, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ඒ පුරුෂතෙමේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙසේ කීය. "ස්වාමීනි, සිරිවඩ්ඪ ගෘහපතිතෙමේ රෝගාතුර වූයේ, දුක්වූයේ, දැඩිසේ ගිලන් වූයේ වෙයි. හෙතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ පා හිසින් වඳියි මෙසේද කීවේය. 'ස්වාමීනි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ අනුකම්පා උපදවා සිරිවඩ්ඪ ගෘහපතියාගේ නිවෙස යම් තැනකද එතැනට වඩිනු මැනවයි." ආයුෂ්මත් ආනන්ද ස්තවිරයන් වහන්සේද ආරාධනය නිශ්ශබ්දව ඉවසූහ.

3. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ පෙරවරු කාලයෙහි හැඳ පෙරවා පාත්‍ර සිවුරු ගෙන සිරිවඩ්ඪ ගෘහපතියාගේ නිවෙස යම් තැනකද එතැනට වැඩියේය. වැඩමවා පැනවූ අසුනෙහි වැඩහුන්නේය. වැඩහුන් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ සිරිපඩ්ඪ ගෘහපතියාගෙන් මෙසේ ඇසීය. "කිම, ගෘහපතිය, නුඹට ඉවසිය හැකිද? කිම, යැපියහැකිද?

"කිම, දුක් වේදනාවෝ අඩුවෙත්ද? කිම, දියුණුවෙත්ද? දුක් වේදනාවන්ගේ අඩුවීමක් පෙනේද? වැඩීමක් නොපෙනේද?"

"ස්වාමීනි, මට ඉවසිය හැකි බවක් නැත. යැපිය හැකි බවක් නැත. මගේ දැඩි දුක් වේදනාවෝ දියුණු වෙත්. අඩු නොවෙත්. වැඩිවන බව පෙනේ. අඩුවන බවක් නොපෙනේ යයි" කීය.

4. "එසේ නම්, ගෘහපතිය, නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි. 'කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව, යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳුවා කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරමි'

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව, යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳුවා වේදනාවන්හි වේදනාවන් නැවත නැවත බලමින් වාසය කරමි.'

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව, යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද ද්වේෂයද සංසිඳුවා චිත්තයන්හි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කරමි.'

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව, යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳුවා ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරමි.'

"එසේ නම් ගෘහපතිය, නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි."

5. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් ඒ සතර සතිපට්ඨාන කෙනෙක් දෙශනා කරන ලද්දාහුද, ඒ රත්න ධර්මයෝ මා කෙරෙහි විද්‍යමාන වෙත්. මමද ඒ ධර්මයන්

දකින්නෙමි. ස්වාමීනි, මම කෙලෙස් තවන වීය්‍ය්‍යීය ඇතිව යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳුවා කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරමි.

"ස්වාමීනි, මම කෙලෙස් තවන වීය්‍ය්‍යීය ඇතිව, යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳුවා වේදනාවන්හි වේදනාවන් නැවත නැවත බලමින් වාසය කරමි.

"ස්වාමීනි, මම කෙලෙස් තවන වීය්‍ය්‍යීය ඇතිව, යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳුවා චිත්තයන්හි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කරමි.

"ස්වාමීනි මම කෙලෙස් තවන වීය්‍ය්‍යීය ඇතිව, යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳුවා ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරමි.

**6.** "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් ඔරම්භාගීය සංයෝජන පසක් දෙශනා කරන ලද්දාහුද, මම ඔවුන්ගෙන් කිසිවක් තමා කෙරෙහි ප්‍රහීණ නොවූයේයයි නොදකිමි." ගෘහපතිය, නුඹට ලාභයකි. ගෘහපතිය, නුඹ විසින් අනාගාමී ඵලය ප්‍රකාශ කරන ලදැයි" කීය.

---

## 10. මානදින්න සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ කලන්දකනිවාප නම්වූ වේළුවනයෙහි වාසය කරයි. එසමයෙහි මානදින්න ගෘහපති තෙමේ රෝගාතුර වූයේ දුක් වූයේ දැඩි ගිලන් වූයේ වෙයි. ඉක්බිති මානදින්න ගෘහපති තෙමේ එක්තරා පුරුෂයෙකුට කථා කෙළේය.

"පින්වත් පුරුෂය නුඹ එව. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එහි යව. ගොස් 'ස්වාමීනි, මානදින්න ගෘහපති තෙමේ රෝගාතුර වූයේ දුක්වූයේ දැඩි ගිලන් වූයේ වෙයි. හෙතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ පාද හිසින් වඳීයයි' මගේ වචනයෙන් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ පාද හිසින් වඳුව. මෙසේද කියව. 'ස්වාමීනි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, මානදින්න ගෘහපතියාගේ ගෙදර යම් තැනකද අනුකම්පා උපදවා එතැනට වඩිනු මැනව' කියායි.

2. ඒ පුරුෂ තෙමේද ස්වාමීනි එසේයයි ගෘහපතියාට පිළිතුරු දී ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම යම් තැනකද එහි ගියේය. ගොස්, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ඒ පුරුෂ තෙමේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙය කීවේය. "ස්වාමීනි, මානදින්න ගෘහපති තෙමේ රෝගාතුර වූයේ දුක්වූයේ දැඩි ගිලන්වූයේ වෙයි. හෙතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ පාද හිසින් වඳියි.' වැඳ මෙසේද කීවේය. 'ස්වාමීනි, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ අනුකම්පා උපදවා මානදින්න ගෘහපතියාගේ නිවෙස යම් තැනකද එතැනට වඩිනු මැනවයි" ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේද ආරාධනය නිශ්ශබ්දව ඉවසූහ.

3. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පා සිවුරු ගෙන මානදින්න ගෘහපතියාගේ ගෘහය යම් තැනකද එතැනට වැඩියේය. වැඩමවා පැනවූ අසුනෙහි වැඩ හුන්නේය. වැඩහුන් ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ මානදින්න ගෘහපතියාට මෙසේ කීය. "කිම, ගෘහපතිය, නුඹට ඉවසිය හැකිද? කිම, යැපිය හැකිද? කිම, දුක් වේදනාවෝ අඩුවෙත්ද? කිම දියුණු වෙත්ද? දුක් වේදනාවන්ගේ අඩුවීමක් පෙනේද? වැඩීමක් නොපෙනේද?"

"ස්වාමීනි, මට ඉවසියහැකි නොවේ. යැපියහැකි නොවේ. මගේ දැඩි දුක් වේදනාවෝ දියුණු වෙත්. අඩු නොවෙත්. වැඩිවන බව පෙනේ. අඩුවන බවක් නොපෙනෙයි."

4, 5, 6, (මේ ඡේද තුන මේ වර්ගයේ 9 වෙනි සූත්‍රයේ. 4, 5, 6 වෙනි ඡේද මෙන් වේ.)

---

## 4. අනනුස්සුත වර්ගය.

### 1. අනනුස්සුත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනියි’ කියා භික්ෂූන් ඇමතූසේක. ‘ස්වාමීනියි’ කියා ඒ භික්ෂූන් භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. “මහණෙනි, මේ කයෙහි කායානුපස්සනාවයයි මම පෙර නොඇසූ විරූ ධර්මයන්හි නුවණැස පහළවිය. ඥානය ඇතිවිය, විද්‍යාව ඇතිවිය, ආලොකය පහළවිය. මහණෙනි, මේ කයෙහි කායානුපස්සනාව වැඩිය යුතුයයිද පෙර නොඇසූවිරූ ධර්මයන්හි නුවණැස පහළවිය, ඥානය පහළවිය, විද්‍යාව පහළවිය, ආලොකය පහළවිය. මහණෙනි, මේ කයෙහි කායානුපස්සනාව වඩන ලද්දේයයිද මට පෙර නොඇසූවිරූ ධර්මයන් කෙරෙහි නුවණැස පහළ විය, ඥානය ඇතිවිය, විද්‍යාව පහළවිය, ආලොකය පහළවිය.

3. “මහණෙනි, මේ වේදනාවෙහි වේදනානුපස්සනාව යයි මට පෙර නොඇසූ විරූ ධර්මයන්හි නුවණැස පහළ විය, ඥානය පහළ විය, විද්‍යාව පහළවිය, ආලොකය පහළ විය, මහණෙනි මේ වේදනාවෙහි වේදනානුපස්සනාව වැඩිය යුතු යයි මට පෙර නොඇසූ විරූ ධර්මයන්හි නුවණැස පහළ විය, ඥානය පහළවිය, විද්‍යාව පහළ විය, ආලොකය පහළ විය, මහණෙනි, මේ වේදනාවෙහි වේදනානුපස්සනාව වඩන ලදැයි මට පෙර

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නොඇසූවිරූ ධර්මයන්හි නුවණැස පහළ විය, ඥානය පහළ විය, විද්‍යාව පහළ විය, ආලොකය පහළ විය.

4. "මහණෙනි, මේ චිත්තයන්හි චිත්තානුපස්සනාව යයි මට පෙර නොඇසූ විරූ ධර්මයන්හි නුවණැස පහළවිය, ඥානය පහළ විය, විද්‍යාව පහළවිය, ආලොකය පහළ විය. මහණෙනි, මේ චිත්තයන්හි චිත්තානු පස්සනාව වැඩිය යුතුයයි මට නුවණැස පහළවිය, ඥානය පහළ විය විද්‍යාව පහළ විය, අලොකය පහළ විය. මහණෙනි, චිත්තයන්හි චිත්තානුපස්සනාව වඩන ලද්දේයයි මට පෙර නොඇසූවිරූ ධර්මයන් කෙරෙහි නුවණැස පහළ විය, ඥානය පහළ විය, විද්‍යාව පහළවිය, අලොකය පහළ විය.

5. මහණෙනි, මේ ධර්මයන්හි ධම්මානුපස්සනාව යයි මට පෙර නොඇසූවිරූ ධර්මයන්හි නුවණැස පහළවිය, ඥානය පහළවිය, විද්‍යාව පහළ විය, ආලොකය පහළවිය. මහණෙනි, මේ ධර්මයන්හි ධම්මානුපස්සනාව වැඩිය යුතුයයි මට නුවණැස පහළවිය, ඥානය පහළ විය, විද්‍යාව පහළ විය, ආලොකය පහළ විය. මහණෙනි, මේ ධර්මයන්හි ධම්මානුපස්සනාව වඩන ලදැයි මට පෙර නොඇසූවිරූ ධර්මයන්හි නුවණැස පහළ විය, ඥානය පහළ විය, විද්‍යාව පහළ විය, ආලොකය පහළ විය."

---

## 2. විරාග සංවත්තනික සූත්‍රය

(මෙතැන් සිට මේ වර්ගයේ සියලු සූත්‍රවල 1 ඡේද මේ වර්ගයේ මුල් සූත්‍රයේ මෙනි)

2. "මහණෙනි, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ මේ සතර සතිපට්ඨානයෝ ඒකාන්තයෙන් කලකිරීම පිණිස නොඇලීම පිණිස, නිරොධය පිණිස, සංසිඳීම පිණිස විශෙෂයෙන් දැනගැනීම පිණිස, චතුස්සත්‍යාවබොධය පිණිස, නිර්වාණය පිණිස පවතිත්.

3. "කවර සතරක්දයත්? මේ ශාසනයෙහි මහණතෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇති, යහපත් නුවණ ඇතිව සිහියෙන්

යුක්තව මේ ලොකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳවා කයෙහි කය නැවත නැවත බලමින් වාසය කෙරේද,

"මහණ තෙමේ කෙලෙස් තවන වීය්‍ය්‍ය ඇතිව, යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳුවා වේදනාවන්හි වේදනාවන් නැවත නැවත බලමින් වාසය කෙරේද,

"මහණ තෙමේ කෙලෙස් තවන වීය්‍ය්‍ය ඇති, යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳුවා සිතෙහි සිත නැවත නැවත බලමින් වාසය කෙරේද,

"මහණ තෙමේ කෙලෙස් තවන වීය්‍ය්‍ය ඇති, යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද ද්වේෂයද සංසිඳුවා ධර්මයෙහි ධර්මය නැවත නැවත බලමින් වාසය කෙරේද,

4. "මහණෙනි, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ මේ සතර සතිපට්ඨානයෝ ඒකාන්තයෙන් කලකිරීම පිණිස නොඇලීම පිණිස, නිරොධය පිණිස, සංසිඳීම පිණිස විශෙෂ ඥානය පිණිස චතුස්සත්‍ය අවබොධය පිණිස, නිර්වාණය පිණිස පවතිත්."

---

## 3. සතිපට්ඨාන විරද්ධ සූත්‍රය

2. "මහණෙනි, යම්කිසි කෙනෙකුන් විසින් සතර සතිපට්ඨානයෝ පටන් නොගන්නා ලද්දාහුද ඔවුන් විසින් මනාකොට දුක් නැතිකිරීම පිණිස පවත්නාවූ ආය්‍ය්‍යමාර්ගය පටන් නොගන්නා ලදී. මහණෙනි, යම්කිසි කෙනෙකුන් විසින් සතර සතිපට්ඨානයෝ පටන්ගන්නා ලද්දාහුද, ඔවුන් විසින් මනාකොට දුක් නැතිකිරීම පිණිස පවත්නාවූ ආය්‍ය්‍යමාර්ගය පටන්ගන්නා ලදී.

3. (මේ ඡෙදය මේ වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි.)

4. "මහණෙනි, යම්කිසි කෙනෙකුන් විසින් මේ සතර සතිපට්ඨානයෝ පටන් නොගන්නා ලද්දාහුද? ඔවුන් විසින් මනාකොට දුක් නැතිකිරීම පිණිස පවත්නාවූ ආර්‍ය්‍ය මාර්ගය පටන්නොගන්නා ලදී මහණෙනි, යම්කිසි කෙනෙකුන් විසින් මේ සතර සතිපට්ඨානයෝ පටන් ගන්නා ලද්දාහුද ඔවුන් විසින් මනාකොට දුක් නැති කිරීම පිණිස පවත්නාවූ ආර්‍ය්‍ය මාර්ගය පටන්ගන්නා ලදී."

---

## 4. අපාරාපාරඞ්ගමන සූත්‍රය

2. "මහණෙනි, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ මේ සතර සතිපට්ඨානයෝ (සංසාර සාගරයෙන්) මෙතරින් එතරට යෑම පිණිස පවතිත්.

3. (මේ ඡේදය මේ වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි)

මහණෙනි, පුරුදු කරන ලද්දාවූ බහුල කරන ලද්දාවූ මේ සතර සතිපට්ඨානයෝ (සංසාර සාගරයෙන්) මෙතෙරින් එතරට යෑම පිණිස පවතිත්.

---

## 5. සතොභික්ඛු සූත්‍රය

2. "මහණෙනි, මහණ තෙමේ සිහියෙන් යුක්තව නුවණින් යුක්තව වාසය කරන්නේය. මේ වනාහි තොපට අපගේ අනුශාසනාවයි. මහණෙනි, මහණතෙමේ කෙසේනම් සිහි ඇත්තේ වෙයිද?

3. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව, යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ කයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳුවා කයෙහි කය නැවත නැවත බලමින් වාසය කෙරේද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ කයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳුවා වේදනාවෙහි වේදනාව නැවත නැවත බලමින් වාසය කෙරේද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ කයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳුවා සිතෙහි සිත නැවත නැවත බලමින් වාසය කෙරේද,

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ කයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳුවා ධර්මයෙහි ධර්මය නැවත නැවත බලමින් වාසය කෙරේද,

4. "මහණෙනි, මෙසේ වනාහි මහණතෙමේ සිහි ඇත්තේ වේ. මහණෙනි, මහණතෙම කෙසේ නම් නුවණඇත්තේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණහට ප්‍රකටව වේදනාවෝ උපදිත්ද, ප්‍රකටව වේදනාවෝ එළඹ සිටිත්ද, ප්‍රකටව වේදනාවෝ විනාශයට යෙත්ද ප්‍රකටව විතර්කයෝ උපදිත්ද ප්‍රකටව විතර්කයෝ එළඹ සිටිත්ද, ප්‍රකටව විතර්කයෝ විනාශයට යත්ද,

"ප්‍රකටව සඤ්ඤාවෝ උපදිත්ද, ප්‍රකටව සඤ්ඤාවෝ එළඹ සිටිත්ද, ප්‍රකටව සඤ්ඤාවෝ විනාශයට යත්ද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙමේ නුවණ ඇත්තේ වේ. මහණෙනි, මහණතෙම සිහි ඇතිව නුවණ ඇතිව වාසය කරන්නේය. මේ වනාහි තොපට අපගේ අනුශාසනාවයි."

---

## 6. අඤ්ඤාතර ඵල සූත්‍රය.

2. "මහණෙනි, මේ සතර සතිපට්ඨානයෝ වෙත්.

3. (මේ ඡේදය මේ වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. "මහණෙනි, මේසතර සතිපට්ඨානයන් පුරුදු කළ බැවින් බහුල වසයෙන් කරනලද බැවින් මේ ආත්මයෙහි රහත්වීම හෝ ස්කන්ධශෙෂය ඇතිකල්හි අනාගාමි බව හෝ යන මේ ඵල දෙක අතරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුයි."

---

## 7. ඡන්දපහාණ සූත්‍රය.

2. "මහණෙනි, මේ සතර සතිපට්ඨානයෝ වෙත්. කවර සතරක්ද යත්.

3. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කෙළෙස් තවන වීය්‍ර්‍ය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද, ද්වෙෂයද සංසිඳවා කයෙහි කය නැවත නැවත බලමින් වාසය කෙරේද, කයෙහි කය නැවත නැවත බලමින් වාසයකරන්නාවූ ඔහුගේ කයෙහි යම් ආශාවක් වේද ඒ ආශාව ප්‍රහීණවේ. ආශාව ප්‍රහීණකිරීමෙන් (අමෘතය) නිර්වාණය ප්‍රත්‍යක්ෂ කරන ලද්දේ වේ.

"කෙලෙස් තවන වීය්‍ර්‍ය ඇතිව, යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද, ද්වෙෂයද සංසිඳවා වේදනාවෙහි වේදනාවන් නැවත නැවත බලමින් වාසය කෙරේද, වේදනාවෙහි වේදනාව නැවත නැවත බලමින් වාසයකරන්නාවූ ඔහුගේ කයෙහි යම් ආශාවක් වේද, ඒ ආශාව ප්‍රහීණ වේ. ආශාව ප්‍රහීණකිරීමෙන් (අමෘතය) නිර්වාණය ප්‍රත්‍යක්ෂ කරන ලද්දේවේ.

"කෙළෙස් තවන වීය්‍ර්‍ය ඇතිව, යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද, ද්වෙෂයද සංසිඳවා සිතෙහි සිත නැවත නැවත බලමින් වාසය කෙරේද, සිතෙහි සිත නැවත නැවත බලමින් වාසයකරන්නාවූ ඔහුගේ සිතෙහි යම් ආශාවක් වේද, ඒ ආශාව ප්‍රහීණවේ. ආශාව ප්‍රහීණ කිරීමෙන් (අමෘතය) නිර්වාණය ප්‍රත්‍යක්ෂ කරන ලද්දේ වේ.

"කෙළෙස් තවන වීර්‍ය්‍යය ඇතිව, යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද, ද්වෙෂයද සංසිඳවා නීවරණාදී ධර්මයන් කෙරෙහි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කෙරේද, සිතෙහි සිත නැවත නැවත බලමින් වාසයකරන්නාවූ ඔහුගේ සිතෙහි යම් ආශාවක් වේද, ඒ ආශාව ප්‍රහීණ වේ. ආශාව ප්‍රහීණ කිරීමෙන් (අමෘතය) නිර්වාණය ප්‍රත්‍යක්ෂ කරන ලද්දේ වේ.

"නීවරණාදී ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරන්නාවූ ඔහුගේ ධර්මයන් කෙරෙහි යම් ආශාවක් වේද ඒ ආශාව ප්‍රහීණවේ. ඒ ආශාව ප්‍රහීණ කිරීමෙන් නිර්වාණය ප්‍රත්‍යක්ෂ කරනලද්දේ වෙයි"

---

## 8. පරිඤ්ඤාතා මත සූත්‍රය

2. "මහණෙනි, මේ සතර සතිපට්ඨානයෝ වෙත්.

3. "කවර සතරක්දයත්, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේලොකයෙහි ලොභයද, ද්වෙෂයද සංසිඳවා කයෙහි කය නැවත නැවත බලමින් වාසය කෙරේද, කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරන්නාහු විසින් කය මනාකොට දැනගන්නා ලද්දේවේ. කය මනාකොට දැන ගත් බැවින් නිවන ප්‍රත්‍යක්ෂ කරන ලද්දේවේ.

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද, ද්වෙෂයද සංසිඳා වේදනාවෙහි වේදනා නැවත නැවත බලමින් වාසය කෙරේද, වේදනාවෙහි වේදනාව නැවත නැවත බලමින් වාසය කරන්නහු විසින් වේදනාව මනාකොට දැන ගන්නා ලද්දේවේ. වේදනාව මනාකොට දැනගත් බැවින් නිවන ප්‍රත්‍යක්ෂ කරන ලද්දේවේ.

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව, යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද, ද්වෙෂයද සංසිඳවා

සිතෙහි සිත නැවත නැවත බලමින් වාසය කෙරේද, සිතෙහි සිත නැවත නැවත බලමින් වාසය කරන්නාහු විසින් සිත මනාකොට දැනගන්නා ලද්දේ වේ. සිත මනාකොට දැනගත් බැවින් නිවන ප්‍රත්‍යක්ෂකරන ලද්දේවේ.

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද, ද්වෙෂයද සංසිඳවා නීවරණාදී ධර්මයන් කෙරෙහි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කෙරේද, ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරන්නාහු විසින් ධර්මයෝ මනාකොට දැන ගන්නා ලද්දේවේ. ධර්මයන් මනාකොට දත් බැවින් නිවන ප්‍රත්‍යක්ෂ කරන ලද්දේ වන්නේය."

---

## 9. සතිපට්ඨාන භාවනා සූත්‍රය.

**2.** "මහණෙනි, සතර සතිපට්ඨානයන්ගේ වැඩීම දෙශනාකරන්නෙමි. එය අසව්. මහණෙනි, සතර සතිපට්ඨානයන්ගේ වැඩීම කවරේද?

**3.** (මේ ඡෙදය මේ වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි.)

**4.** "මහණෙනි, මේ සතර සතිපට්ඨානයන්ගේ වැඩීමයි

---

## 10. සතිපට්ඨාන විභඞ්ග සූත්‍රය.

**2.** "මහණෙනි, මම නුඹලාට සතිපට්ඨානයද සතිපට්ඨාන භාවනාද, සතිපට්ඨාන භාවනා ගාමිණී ප්‍රතිපදාවද දෙශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, සතිපට්ඨානය නම් කවරේද?

**3.** (මේ ඡෙදය මේ වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි.)

**4.** "මහණෙනි, මේ සතිපට්ඨානයයි කියනු ලැබේ.

"මහණෙනි, සතිපට්ඨාන භාවනාව නම් කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව, යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ක්‍රොධයද, සංසිඳවාගෙන කයෙහි ඉපදීම ස්වභාව බලමින් වාසය කෙරේද,

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද, ද්වෙෂයද සංසිඳවා කයෙහි නැතිවීම් ස්වභාව බලමින් වාසය කෙරේද,

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද, ද්වෙෂයද සංසිඳවා කයෙහි ඇතිවීම් ස්වභාවයද නැතිවීම් ස්වභාවයද බලමින් වාසය කෙරේද,

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව, යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද, ක්‍රොධයද සංසිඳවාගෙන වේදනාවෙහි ඉපදීම් ස්වභාව බලමින් වාසය කෙරේද,

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව, යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද, ද්වෙෂයද සංසිඳවා වේදනාවෙහි නැතිවීම් ස්වභාව බලමින් වාසය කෙරේද,

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද, ද්වෙෂයද සංසිඳවා වේදනාවෙහි ඇතිවීම් ස්වභාවයද නැතිවීම් ස්වභාවයද, බලමින් වාසය කෙරේද,

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව, යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ කයෙහි ලොභයද, ක්‍රොධයද සංසිඳවා ගෙන සිතෙහි ඉපදීම් ස්වභාව බලමින් වාසය කෙරේද,

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව, යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳවා සිතෙහි නැතිවීම් ස්වභාව බලමින් වාසය කෙරේද,

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳවා සිතෙහි ඇතිවීම් ස්වභාවයද නැතිවීම් ස්වභාවයද බලමින් වාසය කෙරේද,

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මෙ ධර්මයන්හි ලොභයද, ක්‍රොධයද සංසිඳවා ගෙන ධර්මයෙහි ඉපදීම් ස්වභාව බලමින් වාසය කෙරේද,

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද, ද්වෙෂයද සංසිඳවා ධර්මයෙහි නැතිවීම් ස්වභාව බලමින් වාසය කෙරේද,

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව, යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද, ද්වේෂයද සංසිඳවා ධර්මයෙහි ඇතිවීම් ස්වභාවයද නැතිවීම් ස්වභාවයද බලමින් වාසය කෙරේද,

මහණෙනි, මේ සතිපට්ඨාන භාවනාවයයි කියනුලැබේ.

5. මහණෙනි, සතිපට්ඨාන භාවනාවට පැමිණෙන ප්‍රතිපදාව කවරීද? මේ ආර්‍ය අෂ්ටාංගික මාර්ගයමය. ඒ කවරේද?

සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යන මොහුයි.

"මහණෙනි, මේ සතිපට්ඨාන භාවනාවට පැමිණෙන ප්‍රතිපදාවයයි කියනු ලැබේ."

---

## 5. අමත වර්ගය.

### 1. අමත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටුහු විසින්

කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූන් භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, සතර සතිපට්ඨානයන්හි මනාකොට පිහිටු වන ලද සිත් ඇත්තෝව වාසය කරව්. නැතහොත් නුඹලාට නිවනක් නොවන්නේය. කවර සතරෙක්හිද?

3. (මේ ඡේදය 4 වෙනි අනනුස්සුත වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

4. "මහණෙනි, මේ සතර සතිපට්ඨානයන්හි මනාකොට පිහිටුවන ලද සිත් ඇත්තෙක්ව වාසය කරව්. (නැතහොත්) නුඹලාට නිවනක් නොවන්නේය."

---

## 2. සතිපට්ඨාන සමුදය සූත්‍රය.

2. "මහණෙනි, සතර සතිපට්ඨානයන්ගේ ඇතිවීමට හෙතුවද නැතිවීමද දෙශනා කරන්නෙමි. එය අසව්. මහණෙනි, කයේ ඇතිවීමට හේතුව කවරේද? ආහාරය හේතු කොටගෙන කයේ හටගැනීම වේ. ආහාරය නැතිවීමෙන් කයේ නැතිවීම වේ. ස්පර්ශය හේතුකොටගෙන වේදනාවේ හට ගැනීමවේ ස්පර්ශය නැතිවීමෙන් වේදනාවේ නැතිවීම වෙයි. නාම රූපයන් හෙතුකොටගෙන චිත්තයාගේ හටගැනීම වේ. නාම රූපයන් නැතිවීමෙන් චිත්තයාගේ නැතිවීම වෙයි. මනසිකාරය හේතුකොටගෙන ධර්මයන්ගේ හටගැනීම වේ. මනසිකාරය නැතිවීමෙන් ධර්මයන්ගේ නැතිවීම වේ."

---

## 3. ඒකායන මග්ග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටුහුගේ ජේතවන

නම්වූ ආරාමයෙහි වැඩ වාසය කළසේක. එහිදී වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ඇමතූසේක. මහණෙනි, එක්කලෙක මම බුදුවූ මුල් කාලයෙහි උරුවෙලාවෙහි නෙරඤ්ජරා නදී තීරයෙහි අජපාල නුගරුක මුල වැඩසිටියෙමි.

"මහණෙනි, රහසිගතව විවේක සුවයෙන් වැඩ සිටි ඒ මට මෙබඳු අදහසක් පහළවිය. 'යම් මේ සතර සතිපට්ඨාන කෙනෙක් ඇද්ද ඒ සතර සතිපට්ඨාන ධර්මයෝ සත්වයන්ගේ පිරිසිදුවීම පිණිසද, සෝක කිරීම වැළපීම යන මොවුන්ගේ ඉක්මවීම පිණිසද, දුක් දොම්නස් ඉක්මවීම පිණිසද, ආර්ය මාර්ගයට පැමිණීම පිණිසද, නිර්වාණය අවබොධ කරගැනීම පිණිසද එකම මාර්ගය වන්නේය කියායි ඒ සතර කවරේද?

**3.** (මේ ඡෙදය 4 වෙනි අනනුස්සුත වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි.)

**4.** "යම් මේ සතර සතිපට්ඨාන කෙනෙක් ඇද්ද, ඒ සතිපට්ඨාන ධර්මයෝ සත්වයන්ගේ පිරිසිදුවීම පිණිසද, ශෝක කිරීම වැළපීම යන මොවුන්ගේ ඉක්මවීම පිණිසද දුක් දොම්නස් ඉක්මවීම පිණිසද, ආර්ය මාර්ගයට පැමිණීම පිණිසද නිර්වාණය අවබෝධ කිරීම පිණිසද එකම මාර්ගය වන්නේය කියායි.

**5.** "මහණෙනි, ඉක්බිති සහම්පතී බ්‍රහ්මතෙමේ ඔහුගේ සිතින් මගේ සිත දැන යම්සේ බලවත් පුරුෂයෙක් වක්කරන ලද අතක් දිගු කරන්නේද දිගුකළ අතක් වක් කරන්නේද, එපරිද්දෙන් බඹලොවින් අතුරුදහන්ව මගේ ඉදිරියෙහි පහළවිය.

**6.** "ඉක්බිති සහම්පතී බ්‍රහ්මතෙමේ උතුරු සළුව ඒකාංශ කොට පෙරවා මම යම්තැනෙක්හිද එතැන්හි ඇඳිලි බැඳ මට මෙසේ කීවේය. 'භාග්‍යවතුන් වහන්ස, එය එසේය. සුගතයන් වහන්ස, එය එසේය. යම් මේ සතර සතිපට්ඨාන කෙනෙක් ඇද්ද, ඒ සතිපට්ඨාන ධර්මයෝ සත්වයන්ගේ පිරිසිදුවීම පිණිසද, ශෝක කිරීම වැළපීම යන මොවුන්ගේ ඉක්මවීම පිණිසද, දුක් දොම්නස් ඉක්මවීම පිණිසද ආර්ය මාර්ගයට පැමිණීම පිණිසද නිර්වාණය අවබොධ කරගැනීම පිණිසද එකම මාර්ගය වන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**7.** (මේ ඡේදය 4 වෙනි අනනුස්සුත වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි. ආමන්ත්‍රණ වචනය 'ස්වාමීනි' විය යුතුයි.)

**8.** "ස්වාමීනි, යම් මේ සතර සතිපට්ඨාන කෙනෙක් ඇද්ද, ඒ සතර සතිපට්ඨාන ධර්මයෝ සත්වයන්ගේ පිරිසිදුවීම පිණිසද, ශෝක කිරීම වැළපීම යන මොවුන්ගේ ඉක්මවීම පිණිසද, දුක් දොම්නස් ඉක්මවීම පිණිසද, ආර්ය මාර්ගයට පැමිණීම පිණිසද නිර්වාණය අවබොධ කර ගැනීම පිණිසද එකම මාර්ගය වන්නේය.

**9.** මහණෙනි, සහම්පතී බ්‍රහ්මතෙමේ මෙසේ කීවේය. මෙසේ කියා නැවත මෙසේද කීය.

> "ජාතිය ක්ෂයකිරීම් සංඛ්‍යාත නිර්වාණය දක්නාවූ හිතානුකම්පීවූ තථාගතයන් වහන්සේ ඒකායන මාර්ගය දන්නා සේක. යම් කෙනෙක් සසරින් එතරවූවාහු නම් ඔව්හුද මේ මාර්ගයෙන්ම එතෙරවූහ. අනාගතයෙහි යම් කෙනෙක් සසරින් එතෙර වන්නාහු නම් ඔව්හුද, මේ මාර්ගයෙන්ම එතෙර වන්නාහ. දැන් (මේ කාලයෙහි) යම් කෙනෙක් එතරවෙත් නම් ඔව්හුද මේ මාර්ගයෙන්ම එතර වෙත්" යනුයි.

---

## 4. සතොවිහාර සූත්‍රය.

**2.** "මහණෙනි, භික්ෂුතෙම සිහියෙන් යුක්තව වාසය කරන්නේය. මේ නුඹලාට අපගේ අනුශාසනයයි.

**3.** "මහණෙනි, මහණතෙම කෙසේනම් සිහියෙන් යුක්තව වාසය කරන්නේද?

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳුවා කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද, ද්වෙෂයද සංසිඳවා වේදනාවෙහි වේදනාව නැවත නැවත බලමින් වාසය කරන්නේය.

"කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳවා සිතෙහි සිත නැවත නැවත බලමින් වාසය කරන්නේය.

"කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳවා නීවරණාදි ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරන්නේය.

**4.** "මහණෙනි, මහණතෙමේ මෙසේ වනාහි සිහියෙන් යුක්තවූයේවෙයි. මහණෙනි, මහණතෙමේ සිහියෙන් යුක්තව වාසය කරන්නේය. මේ නුඹලාට අපගේ අනුශාසනය වන්නේය."

---

## 5. කෙවල කුසල රාසි සූත්‍රය.

**2.** "මහණෙනි, කුසල රාසිය යයි කියන්නේ නම් සතර සතිපට්ඨානයන්ට කීම ම යහපත්කොට කීම වන්නේය. මහණෙනි, යම් මේ සතර සතිපට්ඨාන ධර්ම කෙනෙක් වෙත්ද, ඔව්හු සම්පූර්ණයෙන්ම කුසල රාශියකි. ඒ සතර කවරේද?

**3.** (මේ ඡෙදය 4 වෙනි අනනුස්සුත වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි.)

**4.** "මහණෙනි, කුසල රාශිය යයි කියන්නේ නම් මේ සතර සතිපට්ඨානයට කීම ම යහපත් කීම වන්නේය. යම් ඒ සතර සතිපට්ඨාන ධර්ම කෙනෙක් වෙත්ද, ඔව්හු සම්පූර්ණයෙන්ම කුසල රාශියකි."

---

## 6. පාතිමොක්ඛ සංවර සූත්‍රය.

2. "එකල්හි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසක හුන්නේය. එක්පසක හුන්නාවූ ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට සැකෙවින් ධර්මය දෙශනා කරන සේක්වා. මම භාග්‍යවතුන් වහන්සේගේ යම් ධර්මයක් අසා හුදකලාව තනිව අප්‍රමාදව කෙලෙස්තවන වීර්‍ය්‍ය ඇතිව සංසිඳුවන ලද සිත් ඇතිව වාසය කරන්නෙමි" කියායි.

3. "මහණ, එසේනම් නුඹ කුසල ධර්මයන්හි මුලම පිරිසිදු කරව. කුසල ධර්මයන්හි මුල කුමක්ද? මහණ, එසේනම් නුඹ මෙහිදී ප්‍රාතිමොක්ෂ සංවර ශීලයෙන් යුක්තව වාසය කරව. ආචාර ගොචර දෙකින් සමන්විතව සුළු වරදෙහි පවා භය දක්නා සුළුව ශික්ෂාපදයන් දැඩිකොට සමාදන්ව හික්මෙව. මහණ, නුඹ යම් කලෙක පටන් ප්‍රාතිමොක්ෂ සංවර ශීලයෙන් යුක්තව වාසය කරන්නේ, ආචාර ගොචර දෙකින් යුක්තව සුළු වරදෙහි පවා භය දක්නාසුළුව ශික්ෂා පදයන් දැඩිකොට සමාදන්ව හික්මෙන්නෙහිද,

4. "මහණ, නුඹ මෙතැන් පටන් සීලය නිසා සීලයෙහි පිහිටා සතර සතිපට්ඨානයන් වඩන්නෙහිය.

"කවර සතරක්ද යත්? මහණ, නුඹ මේ ශාසනයෙහි කෙලෙස්තවන වීර්‍ය්‍ය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳවා කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරව.

"කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳවා වේදනාවෙහි වේදනාව නැවත නැවත බලමින් වාසය කරව.

"කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳවා සිතෙහි සිත නැවත නැවත බලමින් වාසය කරව.

"කෙලෙස් තවන වීර්‍යය ඇතිව, යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳුවා ධර්මයෙහි ධර්මය නැවත නැවත බලමින් වාසය කරව.

**5.** "මහණ, නුඹ යම්කලෙක පටන් ශීලය නිසා ශීලයෙහි පිහිටා මේ සතර සතිපට්ඨානයන් මෙසේ වඩන්නෙහිද, මහණ, එතැන් පටන් නුඹට යම් රාත්‍රියක් හෝ දවාලක් පැමිණෙන්නේද, එය කුසල් ධර්මයන්ගේ දියුණුවක්ම කැමති විය යුත්තේය. කුසල ධර්මයන්හි පිරිහීමක් නොවන්නේය.

**6.** ඉක්බිති ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුවී අනුමෝදන්ව ආසනයෙන් නැගිට වැඳ ගරුකොට ගියේය.

ඉක්බිති ඒ භික්ෂුතෙම හුදෙකලාව විවේකීව අප්‍රමාදීව කෙලෙස් තවන වීර්‍යය ඇතිව සංසිඳවන ලද සිත් ඇතිව වාසය කරන්නේ නොබෝ කලකින්ම යමක් සඳහා කුල පුත්‍රයෝ මනාකොට ගිහි ගෙයින් නික්ම සසුනෙහි පැවිදි වෙත්ද, බඹසර කෙළවරකොට ඇති ඒ උතුම්වූ නිවන මේ ආත්මභාවයෙහිම දැන එයට පැමිණ වාසය කළේය. ඉපදීම ක්ෂයවීය. බඹසර වැස නිමවන ලදී. කළයුත්ත කරන ලදී. මෙයින් අනික් ආත්මභාවයක් නැතැයි මනාකොට දැනගත්තේය. ඒ භික්ෂූන් වහන්සේද රහතුන් වහන්සේලා අතරින් එක්තරා කෙනෙක් වූහ.

---

## 7. ආදි විසොධන සූත්‍රය.

**2.** එකල්හි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට සැකෙවින් ධර්මය දෙශනා කරන සේක්වා. මම භාග්‍යවතුන් වහන්සේගේ යම්

ධර්මයක් අසා හුදෙකලාව තනිව අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව සංසිඳවන ලද සිත් ඇතිව වාසය කරන්නෙමි” යනුයි.

**3.** “මහණ, එසේ නම් නුඹ කුසල ධර්මයන්හි මුලම පිරිසිදු කරව. කුසල ධර්මයන්හි මුල කවරේද? මහණ, නුඹ මෙහි කාය දුශ්චරිතය දුරුකොට කාය සුචරිතය වඩන්නෙහිය. වාක් දුශ්චරිතය දුරුකොට වාක් සුචරිතය වඩන්නෙහිය. මනො දුශ්චරිතය දුරුකොට මනොසුචරිතය වඩන්නෙහිය. මහණ නුඹ යම් කලෙක පටන් කාය දුශ්චරිතය දුරුකොට කාය සුචරිතය වඩන්නෙහිද වාක් දුශ්චරිතය දුරුකොට වාක් සුචරිතය වඩන්නෙහිද මනොදුශ්චරිතය දුරුකොට මනො සුචරිතය වඩන්නෙහිද, මහණ, නුඹ එතැන් පටන් සීලය නිසා සීලයෙහි පිහිටා සතර සතිපට්ඨානයන් වඩන්නෙහිය.

**4.** (මේ ඡෙදය මේ වර්ගයේ 6 වෙනි සූත්‍රයේ 4 වෙනි ඡෙදය මෙනි.)

**5.** මහණ, නුඹ යම් කලෙක පටන් සීලය නිසා සීලයෙහි පිහිටා මේ සතර සතිපට්ඨානයන් මෙසේ වඩන්නෙහිද එතැන්පටන් මහණ නුඹට යම් රාත්‍රියක් හෝ දාවලක් පැමිණෙන්නේද කුසල ධර්මයන්හි වෘද්ධියම කැමති විය යුතුයි. පිරිහීමක් කැමති නොවිය යුතුයි.”

**6.** “ඉක්බිති ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුව අනුමෝදන්ව ආසනයෙන් නැගිට වැඳ ගරු කොට ගියේය. ඉක්බිති ඒ භික්ෂුතෙම හුදෙකලාව විවේකීව කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව සංසිඳවන ලද සිත් ඇතිව වාසය කරන්නේ නොබෝකලකින්ම යමක් සඳහා කුල පුත්‍රයෝ මනාකොට ගිහිගෙයින් නික්ම සසුනෙහි පැවිදි වෙත්ද, බඹසර කෙළවර කොට ඇති ඒ උතුම්වූ නිවන මේ අත්බැව්හිම දැන එයට පැමිණ වාසය කළේය.

ඉපදීම ක්ෂය විය. බඹසර වැස නිමවන ලදි. කළයුත්ත කරන ලදී. මෙයින් අනික් ආත්ම භාවයක් නැතැයි දැන ගත්තේය.

ඒ භික්ෂූන් වහන්සේද රහතන් වහන්සේලා අතරින් එක්තරා කෙනෙක් වූහ.

---

## 8. මිත්තාමච්ච සූත්‍රය

**2.** "මහණෙනි, යම් කෙනෙකුන්ට අනුකම්පා කරව්ද, මිත්‍රවූ හෝ හිතවත්වූ හෝ සහලේ නෑවූ හෝ යම් කිසිවකු ඇසියයුත්තකු කොට සිතන්නහුද, මහණෙනි, ඒ තොප විසින් ඔවුහු සතර සතිපට්ඨානයන්ගේ වැඩීම පිණිස සමාදන් කරවිය යුත්තාහ. වැස්විය යුත්තාහ. පිහිටවිය යුත්තාහ.

**3.** (මේ ඡේදය 4 වෙනි අනනුස්සුත වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

**4.** "මහණෙනි, යම් කෙනෙකුන්ට අනුකම්පා කරව්ද, මිත්‍රවූ හෝ හිතවත්වූ හෝ සහලේ නෑවූ හෝ යම්කිසිවකු ඇසියයුත්තක් කොට සිතන්නහුද, මහණෙනි, තොප විසින් ඔවුහු සතර සතිපට්ඨානයන්ගේ වැඩීම පිණිස සමාදන් කර විය යුත්තාහ. වැස්විය යුත්තාහ. පිහිටවිය යුත්තාහ.

---

## 9. වෙදනා පරිඤ්ඤා සූත්‍රය

**2.** "මහණෙනි, වේදනාවෝ තිදෙනෙකි. කවර තිදෙනෙක්ද යත්? සුඛ වේදනාවය, දුක්ඛ වේදනාවය, උපෙක්ෂා වේදනාවය. මහණෙනි, මොව්හු වේදනාවෝ තිදෙනය. මහණෙනි, මේ වේදනා තිදෙනාගේ මනාකොට දැනගැනීම පිණිස සතර සතිපට්ඨානයෝ වැඩිය යුත්තාහ.

**3.** (මේ ඡේදය 4 වෙනි අනනුස්සුත වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

**4.** "මහණෙනි, මේ වේදනාවන් තිදෙනාගේ මනාකොට දැනගැනීම පිණිස මේ සතර සතිපට්ඨානයෝ වැඩිය යුත්තාහ."

---

## 10. ආසව පහාණ සූත්‍රය.

2. "මහණෙනි, මේ ආශ්‍රවයෝ තිදෙනෙකි. කවර තිදෙනෙක්ද? කාමාශ්‍රවය, භවාශ්‍රවය, අවිද්‍යාශ්‍රවය යනුයි. මහණෙනි මේ ආශ්‍රවයන් තිදෙනාය. මේ ආශ්‍රවයන් තිදෙනාගේ ප්‍රහාණය පිණිස සතර සතිපට්ඨානයෝ වැඩිය යුත්තාහ.

3. (මේ ඡේදය 4 වෙනි අනනුස්සුත වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි )

4. "මහණෙනි, මේ ආශ්‍රවයන් තිදෙනාගේ ප්‍රහාණය කිරීම පිණිස මේ සතර සතිපට්ඨානයෝ වැඩිය යුත්තාහ."

(මෙතැන් සිට "මග්ග සංයුත්තයේ මෙන් ගංගා පෙය්යාල වර්ගයේ සිට ඕඝ වර්ගය තෙක් ඇති වර්ග පස මෙහිදී සතර සතිපට්ඨාන වශයෙන් වෙනස්කොට මෙහි ඕඝ වර්ගයේ අන්තිම සූත්‍රය මෙන් යොදාගත යුතුයි)

---

## 6. ගංගා පෙය්යාල වර්ගය

(මග්ගසංයුත්තයේ ගංගා පෙයයාල වර්ගයට සතර සතිපට්ඨානය යොදාගැනීමෙන් මෙහි සූත්‍ර දොළස සම්පූර්ණවේ.)

---

## 7. අප්පමාද වර්ගය

(මග්ගසංයුත්තයේ අප්පමාද වර්ගයට සතර සතිපට්ඨානය යොදා ගැනීමෙන් මෙහි සූත්‍ර දහය සම්පූර්ණවේ.)

---

## 8. බලකරණීය වර්ගය

(මග්ගසංයුත්තයේ බලකරණීය වර්ගයට සතර සතිපට්ඨානය යොදාගැනීමෙන් මෙහි සූත්‍ර දොළස සම්පූර්ණවේ.)

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 9. ඒසනා වර්ගය

(මග්ගසංයුත්තයේ ඒසනා වර්ගයට සතර සතිපට්ඨානය යොදාගැනීමෙන් මෙහි සූත්‍ර දොළස සම්පූර්ණවේ.)

---

## 10. ඔඝ වර්ගය

(මේ වර්ගයේ දහවෙනි සූත්‍රයට මෙන් සූත්‍ර නවයටත් සතර සතිපට්ඨානය යොදාගැනීමෙන් මග්ග සංයුත්තයේ ඕඝ වර්ගයේ මෙන් මෙහිද සූත්‍ර දහය සම්පූර්ණවේ )

**2.** "මහණෙනි, මේ උද්ධම්භාගිය සංයෝජන පසකි. කවර පසක්දයත්, රූප රාගය, අරූප රාගය, මානය, උද්ධච්චය, අවිද්‍යාව යනුයි. මහණෙනි, මේ පස්දෙන උද්ධම්භාගිය සංයෝජනයෝයි.

"මහණෙනි, මේ උද්ධම්භාගීය සංයෝජන ධර්මයන්ගේ මනා දැනුම පිණිස, සම්පූර්ණයෙන් දැනගැනීම පිණිස, විනාශය පිණිස, සම්පූර්ණයෙන් පහකිරීම පිණිස සතර සතිපට්ඨානයෝ වැඩිය යුත්තාහ.

**3.** (මේ ඡෙදය 4 වෙනි අනනුස්සුත වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි.)

"මහණෙනි, මේ උද්ධම්භාගීය සංයෝජන ධර්මයන්ගේ මනා දැනුම පිණිස, සම්පූර්ණයෙන් දැනගැනීම පිණිස, විනාශය පිණිස, සම්පූර්ණයෙන් පහකිරීම පිණිස මේ සතර සති පට්ඨානයෝ වැඩිය යුත්තාහ."

(තුන් වැනි සතිපට්ඨාන සංයුත්තය නිමි.)

---

# 4 ඉන්ද්‍රිය සංයුත්තය.

## 1 සුද්ධින්ද්‍රිය වර්ගය.

### 1. සුද්ධික ඉන්ද්‍රිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූන් භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙක් වෙති. කවර පසෙක්ද? සද්ධිඉන්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රියයි මහණෙනි, මොහු ඉන්ද්‍රිය පස වෙති."

---

### 2. සොතාපන්න සූත්‍රය.

(මේ වර්ගයේ සූත්‍ර සියල්ලේ 1 වෙනි ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡේදය මෙනි.

2. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක්ද? සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය, යනුයි.

3. "මහණෙනි, යම් කලෙක පටන් ආය්‍ය්‍යශ්‍රාවකතෙමේ මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිද්දෙන් දනීද,

4. "මහණෙනි, මේ ආය්‍ය්‍යශ්‍රාවකතෙමේ එතැන්පටන් සෝවාන් වූයේ අපායෙහි නොවැටෙන ස්වභාව ඇත්තේ රහත් බවට නියතවූයේ රහත්බවට පරායනකොට ඇත්තේයයි කියනු ලැබේ."

---

## 3. දුතියසොතපන්න සූත්‍රය.

2. "මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙක් වෙති. කවර පසෙක්ද? සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය, යනුයි

3. "මහණෙනි, යම්සේ වනාහි ආයර්‍ය්‍යශ්‍රාවකතෙමේ යම් කලෙක මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ ඉපදීමද, බිඳීමද ආශ්වාදයද ආදීනවයද නිශ්ශරණය තත්වූ පරිද්දෙන් දනීද,

4. "මහණෙනි, එතැන්පටන් මේ ආයර්‍ය්‍යශ්‍රාවකතෙමේ සෝවාන්වූයේ අපායෙහි නොවැටෙන ස්වභාව ඇත්තේ රහත් බවට නියතවූයේ රහත්බව පරායනකොට ඇත්තේයයි කියනු ලැබේ.

---

## 4. අරහන්ත සූත්‍රය

2. "මහණෙනි, මේඉන්ද්‍රිය පසෙක්වෙති. කවර පසෙක්ද? සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය, යනුයි.

3. "මහණෙනි, යම් කලෙක පටන් මහණතෙමේ මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිද්දෙන් දැන තණ්හාදිට්ඨි මානයන්ගෙන් අල්වා ගැනීමෙන් මිදුනේවේද,

4. "මහණෙනි, මේ මහණතෙමේ ක්ෂය කරනලද ආශ්‍රව ඇත්තාවූ බඹසර වැස නිමවන ලද්දාවූ කරනලද කටයුතු ඇත්තාවූ, බහා තැබූ කෙලෙස් බර ඇත්තාවූ, පැමිණෙන ලද තමාගේ අර්ථය ඇත්තාවූ නැතිකළ භව බැඳුම් ඇත්තාවූ මනා කොට දැනගැනීමෙන් කෙලෙසුන්ගෙන් මිදුණාවූ අර්හත් පුද්ගලයායයි කියනු ලැබේ"

---

## 5. දුතිය අරහන්ත සූත්‍රය.

2. "මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙක්වෙති. කවර පසෙක්ද? සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යනුයි

3. මහණෙනි යම් කලෙක පටන් වනාහි මහණතෙමේ මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ ඉපදීමද බිඳීමද ආශ්වාදයද ආදීනවයද නිස්සරණයද තත්වූ පරිද්දෙන් දැන තණ්හාදිට්ඨි මානයන්ගෙන් අල්වා ගැනීමෙන් මිදුනේවේද?

4. "මහණෙනි, මේ මහණතෙම ක්ෂය කරනලද ආශ්‍රව ඇත්තාවූ බඹසර වැස නිමවන ලද්දාවූ කරනලද කටයුතු ඇත්තාවූ බහා තැබූ කෙලෙස් බර ඇත්තාවූ පැමිණෙන ලද තමාගේ අර්ථය ඇත්තාවූ නැතිකල භව බැඳුම් ඇත්තාවූ මනාකොට දැනගැනීමෙන් කෙලෙසුන්ගෙන් මිදුණාවූ අර්හත් පුද්ගලයායි කියනු ලැබේ.

---

## 6. සමණ බ්‍රාහ්මණ සූත්‍රය.

2 "මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙක්වෙති. කවර පසෙක්ද? සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය පඤ්ඤින්ද්‍රිය යනුයි.

3 "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ මේ පඤ්චෙන්ද්‍රිය යන්ගේ ඉපදීමද, විනාශයද ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිද්දෙන් නොදනිත්ද, මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් අතරෙහි ශ්‍රමණයයි සම්මතවූවාහුද බ්‍රාහ්මණයන් අතරෙහිබ්‍රාහ්මණයයි, සම්මත වූවාහුද නොවෙත්. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණ භාවයේ අර්ථය හෝ බ්‍රාහ්මණභාවයේ අර්ථය හෝ මේ ආත්මයෙහිම තෙමේ විශෙෂඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය නොකෙරෙත්.

4. "මහණෙනි, ඇතැම් ශ්‍රමණෙයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ ඉපදීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිද්දෙන් දනිත්ද, මහණෙනි,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ ශ්‍රමණයන් අතරෙහි ශ්‍රමණයයි සම්මතවූවාහුද බ්‍රාහ්මණයන් අතරෙහි බ්‍රාහ්මණයයි සම්මතවූවාහුද වෙත්. ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණභාවයේ අර්ථයද, බ්‍රාහ්මණභාවයේ අර්ථයද මේ අත්මයෙහිම තෙමේ විශෙෂඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරත්.

---

## 7. දුතිය සමණ බ්‍රාහ්මණ සූත්‍රය.

2. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ සද්ධින්ද්‍රිය නොදනිත්ද, සද්ධින්ද්‍රියයාගේ ඉපදීම නොදනිත්ද, සද්ධින්ද්‍රියයාගේ නිරෝධය නොදනිත්ද, සද්ධින්ද්‍රියයාගේ නිරෝධයට පැමිණෙන ප්‍රතිපදාව නොදනිත්ද,

"විරියින්ද්‍රිය නොදනිත්ද විරියින්ද්‍රියයාගේ ඉපදීම නොදනිත්ද, විරියින්ද්‍රියයාගේ නිරොධය නොදනිත්ද, විරියින්ද්‍රියයාගේ නිරොධයට පැමිණෙන ප්‍රතිපදාව නොදනිත්ද,

"සතින්ද්‍රිය නොදනිත්ද, සතින්ද්‍රියයාගේ ඉපදීම නොදනිත්ද, සතින්ද්‍රියයාගේ නිරොධය නොදනිත්ද, සතින්ද්‍රියයාගේ නිරෝධයට පැමිණෙන ප්‍රතිපදාව නොදනිත්ද,

"සමාධින්ද්‍රිය නොදනිත්ද, සමාධින්ද්‍රියයාගේ ඉපදීම නොදනිත්ද, සමාධින්ද්‍රියයාගේ නිරෝධය නොදනිත්ද, සමාධින්ද්‍රියයාගේ නිරෝධයට පැමිණෙන ප්‍රතිපදාව නොදනිත්ද,

"පඤ්ඤින්ද්‍රිය නොදනිත්ද, පඤ්ඤින්ද්‍රියයාගේ ඉපදීම නොදත්ද, පඤ්ඤින්ද්‍රියයාගේ නිරොධය නොදනිත්ද, පඤ්ඤින්ද්‍රියයාගේ නිරෝධයට පැමිණෙන ප්‍රතිපදාව නොදනිත්ද,

"මහණෙනි, මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් අතරෙහි ශ්‍රමණයයි සම්මත වූවාහුද, බ්‍රාහ්මණයන් අතරෙහි බ්‍රාහ්මණයයි සම්මත වූවාහුද නොවෙත්. ඒ ආයුෂ්මත්හු ශ්‍රමණභාවයාගේ අර්ථයද, බ්‍රාහ්මණභාවයාගේ අර්ථයද මේ

ආත්මයෙහි තෙමේ විශෙෂඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ නොවසත්.

3. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රහ්මණයෝ හෝ සද්ධින්ද්‍රිය දනිත්ද, සද්ධින්ද්‍රියයාගේ ඉපදීම දනිත්ද, සද්ධින්ද්‍රියයාගේ නිරොධය දනිත්ද, සද්ධින්ද්‍රියයාගේ නිරොධයට පැමිණෙන ප්‍රතිපදාව දනිත්ද,

"විරියින්ද්‍රිය දනිත්ද, විරියින්ද්‍රියයාගේ ඉපදීම දනිත්ද, විරියින්ද්‍රියයාගේ නිරොධය දනිත්ද, විරියින්ද්‍රියාගේ නිරෝධයට පැමිණෙන ප්‍රතිපදාව දනිත්ද,

සතින්ද්‍රිය දනිත්ද, සතින්ද්‍රියයාගේ ඉපදීම දනිත්ද, සතින්ද්‍රියයාගේ නිරොධය දනිත්ද, සතින්ද්‍රියයාගේ නිරෝධයට පැමිණෙන ප්‍රතිපදාව දනිත්ද,

සමාධින්ද්‍රිය දනිත්ද, සමාධින්ද්‍රියයාගේ ඉපදීම දනිත්ද, සමාධින්ද්‍රියයාගේ නිරොධය දනිත්ද, සමාධින්ද්‍රියයාගේ නිරොධයට පැමිණෙන ප්‍රතිපදාව දනිත්ද,

"පඤ්ඤින්ද්‍රිය දනිත්ද, පඤ්ඤින්ද්‍රියයාගේ ඉපදීම දනිත්ද, පඤ්ඤින්ද්‍රියයාගේ නිරොධය දනිත්ද, පඤ්ඤින්ද්‍රියයාගේ නිරොධයට පැමිණෙන ප්‍රතිපදාව දනිත්ද,

"මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් අතරෙහි ශ්‍රමණයයි සම්මතවූවාහුද, බ්‍රාහ්මණයන් අතරෙහි හෝ බ්‍රාහ්මණයයි සම්මතවූවාහුද වෙත් ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණභාවයාගේ අර්ථයද, බ්‍රාහ්මණ භාවයාගේ අර්ථයද මේ අත්බැව්හිම තෙමේ විශෙෂඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට දැන ඊට පැමිණ වාසය කරත්."

---

## 8. දට්ඨබ්බින්ද්‍රිය සූත්‍රය.

2. "මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙක් වෙති. කවර පසෙක්ද, සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යනුයි.

3. මහණෙනි, සද්ධින්ද්‍රිය කොතැන්හි දතයුතුද? මේ සතර සොතාපත්ති අඞ්ගයන්හි සද්ධින්ද්‍රියන් දතයුතුයි. මහණෙනි, විරින්ද්‍රිය කොතැන්හි දතයුතුද? මේ සතර සම්‍යක් ප්‍රධානයන්හි විරියින්ද්‍රිය දතයුතුයි. මහණෙනි, සතින්ද්‍රිය කොතැන්හි දත යුතුද? මේ සතර සතිපට්ඨානයන්හි සතින්ද්‍රිය දතයුතුයි. මහණෙනි, සමාධින්ද්‍රිය කොතැන්හි දත යුතුද? මේ සතර සතර ධ්‍යානයන්හි සමාධින්ද්‍රිය දතයුතුයි. මහණෙනි, පඤ්ඤින්ද්‍රිය කොතැන්හි දතයුතුද? මේ ආර්ය සත්‍ය සතරෙහි පඤ්ඤින්ද්‍රිය දතයුතුයි. මහණෙනි, මොව්හු වනාහි පඤ්චෙන්ද්‍රියයෝයි."

---

## 9. ඉන්ද්‍රිය විභඞ්ග සූත්‍රය.

2. "මහණෙනි, මේ ඉන්ද්‍රිය පස්දෙනෙක් වෙති කවර පසෙක්ද? සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යනුයි.

3. " මහණෙනි, සද්ධින්ද්‍රිය යනු කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ ශ්‍රද්ධා ඇත්තේ වේද, ඒ භාග්‍යවතුන් වහන්සේ මේ නිසා අර්හත්යහ සම්‍යක් ම්බුද්ධයහ. අෂ්ටවිද්‍යා පසළොස් චරණ ධර්මයෙන් යුක්තයහ. සුගතයහ. සියලු ලෝකයන් දන්නාහ. නිරුත්තර පුරුසදම්ම සාරථිය. දෙව් මිනිසුන්ට ශාස්තෘයහ. බුද්ධයහ භාග්‍යවත්යයි තථාගතයන් වහන්සේ බුද්ධත්වය අදහන්නේ වෙයිද, මහණෙනි, මෙය සද්ධින්ද්‍රියයයි කියනු ලැබේ.

4. "මහණෙනි, විරියින්ද්‍රිය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ අකුසල ධර්මයන් පහකරනු පිණිස කුසල ධර්මයන් වැඩීම පිණිස දැඩි වීර්‍ය්‍ය ඇතිව පටන් ගන්නාලද වීර්‍ය්‍යය ඇතිව කුසල ධර්මයන්හි බහාතබන ලද බර ඇතිව වාසය කරයිද, මහණෙනි, මේ විරින්ද්‍රියයයි කියනු ලැබේ.

5. "මහණෙනි, සතින්ද්‍රිය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ සිහියෙන් යුක්තවේද

මනාකොට සිහි නුවණින් යුක්ත වූයේවේද, පෙර කරනලද පෙර කියනලද දේ සිහි කරන්නේ විශෙෂයෙන් සිහි කරන්නේ වෙයිද, මහණෙනි, මෙය සතින්ද්‍රිය යයි කියනු ලැබේ.

6. "මහණෙනි, සමාධින්ද්‍රිය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ නිවන් අරමුණු කොට සමාධිය ලබයිද, සිතේ එකඟකම ලබයිද, මහණෙනි, මෙය සමාධින්ද්‍රිය යයි කියනු ලැබේ.

7. "මහණෙනි, පඤ්ඤින්ද්‍රිය කවරේද, මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ උතුම්වූ කලකිරීම් පිණිස පවත්නාවූ මනාකොට දුක් නැතිකිරීම පිණිස පවත්නාවූ ඇතිවීම හා නැතිවීම දක්නාවූ නුවණින් යුක්තවූයේ ප්‍රඥාවත් වූයේ වේද, මහණෙනි, මෙ පඤ්ඤින්ද්‍රිය යයි කියනු ලැබේ. මහණෙනි, මොව්හු වනාහි පඤ්චෙන්ද්‍රියයෝ යයි කියනු ලැබෙත්.

---

## 10. දුතිය ඉන්ද්‍රිය විභඞ්ග සූත්‍රය

2. "මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙක් වෙති. කවර පසෙක්ද? සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය පඤ්ඤින්ද්‍රිය යනුයි.

3. "මහණෙනි, සද්ධින්ද්‍රිය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ ශ්‍රද්ධාවත් වේද, ඒ භාග්‍යවතුන් වහන්සේ මේ නිසා අර්හත්යහ, සම්‍යක් සම්බුද්ධයහ, අෂ්ටවිද්‍යා පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්තයහ, සුගතයහ, සියලු ලෝකයන් දන්නාහ. නිරුත්තර පුරිසදම්ම සාරථීයහ, දෙව් මිනිසුන්ට ශාස්තෘයහ. බුද්ධයහ, භාග්‍යවත්හයි තථාගතයන් වහන්සේගේ බුද්ධත්වය අදහන්නේද, මහණෙනි, මෙය සද්ධින්ද්‍රිය යයි කියනු ලැබේ.

4. "මහණෙනි, විරියින්ද්‍රිය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ අකුසල ධර්මයන් පහකිරීම පිණිස කුසල ධර්මයන් වැඩීම පිණිස දැඩි වීර්‍ය්‍යයෙන් යුක්ත

වූයේ පටන් ගන්නා ලද වීය්‍ය්‍ය ඇත්තේ කුසල ධර්මයන්හි බහා තබන ලද බර ඇත්තේ වාසය කරයිද, හෙතෙම නූපන් ලාමක අකුසල ධර්මයන්ගේ නොඉපදීම පිණිස කැමැත්ත උපදවයි. වෑයම් කරයි, වීය්‍ය්‍ය පටන්ගනියි, සිතින් දැඩි උත්සාහ කරයි, ස්ථිර ලෙස පිහිටුවයි, උපන් ලාමක අකුසල ධර්මයන් පහකිරීම පිණිස කැමැත්ත උපදවයි, වෑයම් කරයි, වීය්‍ය්‍ය පටන් ගනියි, සිතින් දැඩි උත්සාහ කරයි, ස්ථිර ලෙස පිහිටුවයි, නූපන් කුසල් ධර්මයන් ඉපදවීම පිණිස කැමැත්ත උපදවයි, වෑයම් කරයි, වීය්‍ය්‍ය පටන් ගනියි, සිතින් දැඩි උත්සාහ කරයි, ස්ථිර ලෙස පිහිටුවයි, උපන් කුසල ධර්මයන්ගේ පැවැත්ම පිණිස නොමුළා බව පිණිස බොහෝ බව පිණිස මහත් බව පිණිස වැඩීම පිණිස සම්පූර්ණවීම පිණිස කැමැත්ත උපදවයි. වෑයම් කරයි, වීය්‍ය්‍ය පටන්ගනියි, සිතින් දැඩි උත්සාහ කරයි, ස්ථිර ලෙස පිහිටුවයි. මහණෙනි, මෙය විරියින්ද්‍රිය යයි කියනු ලැබේ.

**5.** "මහණෙනි, සතින්ද්‍රිය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආය්‍ය්‍යශ්‍රාවක තෙමේ සිහි ඇතිව මනා සිහි නුවණින් යුක්තව පෙර කරන ලද පෙර කියන ලද දේ සිහි කරන්නේ විශෙෂයෙන් සිහි කරන්නේ වෙයිද හෙතෙම කෙලෙස් තවන වීය්‍ය්‍ය ඇතිව, යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳවා කයෙහි කය නැවත බලමින් වාසය කෙරේද,

"හෙතෙම කෙලෙස් තවන වීය්‍ය්‍ය ඇතිව, යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳවා වේදනාවෙහි වේදනාව නැවත නැවත බලමින් වාසය කෙරේද,

"හෙතෙම කෙලෙස් තවන වීය්‍ය්‍ය ඇතිව, යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව, මේ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද සංසිඳවා සිතෙහි සිත නැවත නැවත බලමින් වාසය කෙරේද,

"හෙතෙම කෙලෙස් තවන විය්‍ය්‍ය ඇතිව, යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ලොකයෙහි ලොභයද ද්වෙෂයද

සංසිඳවා ධර්මයන්හි ධර්මය නැවත නැවත බලමින් වාසය කෙරේද, මහණෙනි, මේ සතින්ද්‍රිය කියනු ලැබේ.

**6.** "මහණෙනි, සමාධින්ද්‍රිය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ නිවන් අරමුණු කොට පවත්නා සමාධියක් ලබයිද, සිතේ එකඟකම ලබයිද, ඒ මහණතෙම කාමයන්ගෙන් වෙන්ව අකුසල ධර්මයන්ගෙන් වෙන්ව විතක්ක සහිත විචාර සහිත විවේකයෙන් උපන් ප්‍රීති සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයිද, විතක්ක විචාරයන්ගේ සංසිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම් ඇත්තාවූ එකඟ බැව් ඇති අවිතර්කවූ විචාර රහිතවූ සමාධියෙන් උපන් ප්‍රීතිය හා සැපය ඇති ද්‍රුතියධ්‍යානයට පැමිණ වාසය කරයිද,

"ප්‍රීතියද දුරුකිරීමෙන් උපෙක්ෂාවෙන් යුක්තවූයේ තෘතීයධ්‍යානයට පැමිණ වාසය කරයිද, කායික සැපයාගේද දුක්ඛයාගේද නැතිකිරීමෙන් පූර්වයෙහිම සොම්නස් දොම්නස් දෙක දුරලීමෙන් දුකද නැති සැපද නැති උපෙක්ෂාවෙන් හටගත් පිරිසිදු සිහිය ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරයිද, මහණෙනි, මෙය සමාධින්ද්‍රියයයි කියනු ලැබේ.

**7.** "මහණෙනි, පඤ්ඤින්ද්‍රිය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ උතුම්වූ කලකිරීම පිණිස පවත්නාවූද මනාකොට දුක් නැතිකිරීම පිණිස පවත්නාවූ ඇතිවීම හා නැතිවීම දක්නාවූ නුවණින් යුක්තවූයේ ප්‍රඥාවත් වූයේ වෙයිද, හෙතෙම මෙය දුක යයි තත්වූ පරිද්දෙන් දැන ගනියි. මේ දුකට හෙතුව තත්වූ පරිද්දෙන් දැන ගනියි. මේ දුක් නැතිකිරීම යයි තත්වූ පරිද්දෙන් දැනගනියි. මේ දුක් නැතිකිරීම පිණිස පවත්නාවූ ප්‍රතිපදාව යයි තත්වූ පරිද්දෙන් දැනගනියි. මහණෙනි, මේ පඤ්ඤින්ද්‍රියයයි කියනු ලැබේ. මහණෙනි, මොව්හු වනාහි පඤ්චඉන්ද්‍රියයෝයි."

---

# 2. මුදුතර වර්ගය.

## 1. පඤ්චෙන්ද්‍රිය පටිලාභ සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ පසෙක් වෙති. කවර පසෙක්ද? සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ධිය, පඤ්ඤින්ද්‍රිය යනුයි.

3. "මහණෙනි, සද්ධින්ද්‍රිය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආයර්‍යශ්‍රාවක තෙමේ ශ්‍රද්ධා ඇත්තේ වේද, ඒ භාග්‍යවතුන් වහන්සේ මේ නිසා අර්හත්ය. සම්‍යක් සම්බුද්ධයහ අෂ්ට විද්‍යාපසළොස් චරණ ධර්මයෙන් යුක්තයහ. සුගතයහ. සියලු ලෝකයන් දන්නාහ. නිරුත්තර පුරුසදම්මසාරථියහ. දෙව් මිනිසුන්ට ශාස්තෲයහ. බුද්ධයහ. භාග්‍යවත් හයි තථාගතයන් වහන්සේගේ බුද්ධත්වය අදහන්නේ වෙයිද, මහණෙනි, මේ සද්ධින්ද්‍රියයයි කියනු ලැබේ.

4. "මහණෙනි, විරියින්ද්‍රිය කවරේද? මහණෙනි, සතර සම්‍යක් ප්‍රධානයන් අරභයා යම් වීර්‍යයක් ලබයිද, මහණෙනි, මෙය විරියින්ද්‍රියයයි කියනු ලැබේ.

5. "මහණෙනි, සතින්ද්‍රිය කවරේද? මහණෙනි, සතර සතිපට්ඨානයන් අරභයා යම් සිහියක් ලබයිද? මහණෙනි, මෙය සතින්ද්‍රියයයි කියනු ලැබේ.

6. "මහණෙනි, සමාධින්ද්‍රිය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආයර්‍යශ්‍රාවක තෙමේ අරමුණුකොට ඇති සමාධියක් ලබයිද, චිත්තයාගේ එකඟ බවක් ලබයිද මහණෙනි, මෙය සමාධින්ද්‍රිය යයි කියනු ලැබේ.

7. "මහණෙනි, පඤ්ඤින්ද්‍රිය කවරේද? මහණෙනි, මේ ශාසනයේ ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ ඇතිවීම හා නැතිවීම දක්නාවූ නුවණින් යුක්තවූයේ උතුම්වූ විනිවිද දක්නාවූ මනාකොට දුක් නැතිකිරීම පිණිස පවත්නාවූ ප්‍රඥාවෙන් යුක්ත වූයේ නුවණැත්තේ වේද, මහණෙනි, මෙය පඤ්ඤින්ද්‍රියයයි කියනු ලැබේ. මහණෙනි, මොව්හු වනාහි පඤ්චේන්ද්‍රියයෝයි."

---

## 2. මුදුතන්ද්‍රිය සූත්‍රය

1-2. (මේ ඡෙද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1, 2 වෙනි ඡෙද මෙනි )

3. "මහණෙනි, මේ පඤ්චේන්ද්‍රියයන් සම්පූර්ණ කිරීමෙන් පිරීමෙන් රහත් වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් අනාගාමි වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සකෘදාගාමි වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් අනාගාමි වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සෝවාන් වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් ධම්මානුසාරී නම් සෝවාන් මාර්ගස්ථයා (ප්‍රඥාව පෙරටු කොට සෝවාන් මාර්ගයට පැමිණෙන පුද්ගලයා) වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සද්ධානුසාරී නම් සොවාන් මාර්ගස්ථයා (ශ්‍රද්ධාව පෙරටුකොට සොවාන් මාර්ගයට පැමිණෙන පුද්ගලයා) වෙයි.

---

## 3. ඉන්ද්‍රිය වෙමත්ත සූත්‍රය

1-2. (මේ ඡෙද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1, 2 වෙනි ඡෙද මෙනි.)

3. "මහණෙනි, මේ පඤ්චේන්ද්‍රියයන් සම්පූර්ණ කිරීමෙන් පිරීමෙන් රහත් වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් අනාගාමි වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සකෘදාගාමි වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සෝවාන් වෙයි. ඊට වඩා මෘදුවූ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඉන්ද්‍රියයන්ගෙන් ධම්මානුසාරී නම් මාර්ගස්ථයා ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සද්ධානුසාරී නම් මාර්ගස්ථයා වෙයි. මහණෙනි, මෙසේ වනාහි ඉන්ද්‍රියයන්ගෙන් වෙනස් කමින් ඵලයන්ගේ වෙනස් බව වෙයි. ඵලයන්ගේ වෙනස් කමින් පුද්ගලයන්ගේ වෙනස් බව ඇතිවේ."

---

## 4 පරිපූරකාරී සූත්‍රය.

1-2. (මේ ඡේද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1, 2 වෙනි ඡේද මෙනි.)

3. "මහණෙනි, මේ පංචෙන්ද්‍රියයන් සම්පූර්ණ කිරීමෙන් පිරීමෙන් රහත් වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් අනාගාමි වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සකෘදාගාමි වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සෝවාන් වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් ධම්මානු සාරී නම් සෝවාන් මාර්ගස්ථයා වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සද්ධානුසාරී නම් මාර්ගස්ථයා වෙයි.

4. "මහණෙනි, මෙසේ වනාහි සම්පූර්ණවූ ඉන්ද්‍රිය ඇති අර්හත් මාර්ගය සම්පූර්ණ කිරීමෙන් අර්හත් ඵලයට පැමිණෙයි. කොටසක්වූ ඉන්ද්‍රියයන් ඇති ඉතිරි මාර්ග තුන සම්පූර්ණ කිරීමෙන් ඉතිරි ඵල තුනට පැමිණෙයි. මහණෙනි, මම මෙසේ පංචෙන්ද්‍රියයෝ වඳ නොවෙත්යයි" කියමි.

---

## 5. සද්ධානුසාරී සූත්‍රය.

1-2. (මේ ඡේද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1, 2 වෙනි ඡේද මෙනි.)

3. "මහණෙනි, මේ පංචෙන්ද්‍රියයන් සම්පූර්ණ කිරීමෙන් පිරීමෙන් රහත් වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන්

අන්තරාපරිනිබ්බායී (පංච සුද්ධාවාසයෙහි ආයු අඩකට අතරතුර රහත් වන) අනාගාමී පුද්ගලයා වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් උපහච්ච පරිනිබ්බායී (පංචසුද්ධාවාසයෙහි ආයු අඩක් ඉක්මවා රහත් බවට පැමිණෙන) අනාගාමී පුද්ගලයා වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් අසඞ්ඛාර පරිනිබ්බායී (නොහොත් පංච සුද්ධාවාසයේ ඉපිද පහසුවෙන් වෙහෙස නොවී රහත්වෙන අනාගාමී පුද්ගලයා වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සසංඛාර පරිනිබ්බායී (පංච සුද්ධාවාසයේ ඉපිද වෙහෙසවී උත්සාහයෙන් රහත්වන) අනාගාමී පුද්ගලයා වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් උද්ධංසොත අකනිට්ඨගාමි (ක්‍රමයෙන් අකනිටා බඹලොව දක්වා රහත්වන) අනාගාමී පුද්ගලයා වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සකෘදාගාමී වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් ධම්මානුසාරි නම් සෝවාන් මාර්ගස්ථයා වෙයි ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සද්ධානුසාරී නම් සෝවාන් මාර්ගස්ථයා වෙයි.”

---

## 6. අන්තරාපරිනිබ්බායි සූත්‍රය

1-2. (මේ ඡෙද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1, 2 වෙනි ඡෙද මෙනි.)

3. “මහණෙනි, මේ පංචෙන්ද්‍රියයන් සම්පූර්ණ කිරීමෙන් පිරීමෙන් රහත් වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් අන්තරාපරිනිබ්බායී අනාගාමි පුද්ගලයා වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් උපහච්ච පරිනිබ්බායී අනාගාමි පුද්ගලයා වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් අසංඛාර පරිනිබ්බායි අනාගාමි පුද්ගලයා වෙයි. ඊටවඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සසංඛාර පරිනිබ්බායි අනාගාමි පුද්ගලයා වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් උද්ධංසොත අකනිට්ඨගාමි අනාගාමි පුද්ගලයා වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සකෘදාගාමි වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සෝවාන් වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් ධම්මානුසාරී සෝවාන් මර්ගස්ථයා වෙයි. ඊට

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සද්ධානුසාරී සෝවාන් මාර්ගස්ථයා වෙයි.”

4. “මහණෙනි, මෙසේ වනාහි ඉන්ද්‍රියයන්ගේ වෙනස් බව හෙතුකොට ගෙන ඵලයන්ගේ වෙනස් බව වෙයි. ඵලයන්ගේ වෙනස් බව හෙතුකොට ගෙන පුද්ගලයන්ගේ වෙනස් බව වේ.”

---

## 7. අවක්ඛෙද සූත්‍රය

1-2. (මේ ඡෙද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1, 2 වෙනි ඡෙද මෙනි.)

3. “මහණෙනි, මේ පඤ්චෙන්ද්‍රියයන් සම්පූර්ණ කිරීමෙන් පිරීමෙන් රහත්වෙයි. ඊට වඩා මෘදු වූ ඉන්ද්‍රියයන්ගෙන් අන්තරා පරිනිබ්බායී අනාගාමී වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් උපහච්ච පරිනිබ්බායී අනාගාමී වෙයි.

ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් අසංඛර පරිනිබ්බායි අනාගාමී වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සංඛාර පරිනිබ්බායී අනාගාමී වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් උද්ධංසොත අකනිට්ඨගාමී අනාගාමී වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සකෘදාගාමී වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සෝවාන් වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් ධම්මානුසාරී සෝවාන් මාර්ගස්ථයා වෙයි. ඊටවඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සද්ධානුසාරී සෝවාන් මාර්ගස්ථයා වෙයි.

4. “මහණෙනි, මෙසේ වනාහි ඉන්ද්‍රිය සම්පූර්ණවූ අර්හත් මාර්ගය සම්පූර්ණ කරන්නේ අර්හත් ඵලයට පැමිණෙයි. ඉන්ද්‍රිය කොටසක් සම්පූර්ණවූ ඉතිරි මාර්ග තුන සම්පූර්ණ කරන්නේ ඉතිරි ඵල තුනට පැමිණෙයි. මහණෙනි මම මෙසේ පඤ්චෙන්ද්‍රියයෝ වඳ නොවෙත්යයි කියමි.”

---

## 8. පටිපන්න සූත්‍රය.

1-2. (මේ ඡේද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1, 2 වෙනි ඡේද මෙනි.)

3. "මහණෙනි, මේ පඤ්චෙන්ද්‍රියයන් සම්පූර්ණ කිරීමෙන් පිරීමෙන් රහත් වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් අර්හත් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පිළිපන්නේ වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් අනාගාමී වෙයි. ඊටවඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් අනාගාමී ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පිළිපන්නේ වෙයි.

ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සකෘදාගාමීවෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සකෘදාගාමී ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පිළිපන්නේ වෙයි. ඊටවඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සෝවාන් වෙයි. ඊටවඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සෝවාන් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පිළිපන්නේ වෙයි."

4. "මහණෙනි, යමෙකුට වනාහි මේ පඤ්චෙන්ද්‍රියයෝ සියල්ලම සර්වප්‍රකාරයෙන්ම නැද්ද, මම ඔහු (මෙම අෂ්ටාර්ය පුද්ගලයන්ගෙන්) බාහිරවූ පෘථග්ජන කොටසෙහි සිටියේයයි කියමි.

---

## 9. ඉන්ද්‍රිය සම්පන්න සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍ය වතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසෙක හුන්නේය එක් පසෙක හුන් ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "ස්වාමීනි, ඉන්ද්‍රිය සම්පන්න පුද්ගලයාය, ඉන්ද්‍රිය සම්පන්න පුද්ගලයායයි කියනුලැබේ. ස්වාමීනි, කොපමණකින් වනාහි ඉන්ද්‍රිය සම්පන්න පුද්ගලයෙක් වන්නේද?" යනුයි.

3. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සංසිඳීමට පමුණුවන්නාවූ මනා අවබොධයට පමුණුවන්නාවූ සද්ධින්ද්‍රිය වඩන්නේද සංසිඳීමට පමුණුවන්නාවූ මනා අවබොධයට පමුණුවන්නාවූ විරියින්ද්‍රිය වඩන්නේද සංසිඳීමට පමුණුවන මනා අවබොධයට පමුණුවන සතින්ද්‍රිය වඩන්නේද, සංසිඳීමට පමුණුවන මනා අවබොධයට පමුණුවන සමාධින්ද්‍රිය වඩන්නේද, සංසිඳීමට මනා අවබොධයට පමුණුවන පඤ්ඤින්ද්‍රිය වඩන්නේද, මෙපමණකින් වනාහි මහණතෙම ඉන්ද්‍රිය සම්පන්නයෙක් වේ."

---

## 10. ආසවක්ඛය සූත්‍රය,

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි වූ අනේපිඬු සිටුහු විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩ වසනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

3. "මහණෙනි, මේ ඉන්ද්‍රිය පසවෙති. මහණෙනි, මේ ඉන්ද්‍රිය පස වැඩීමෙන් බොහෝකොට කිරීමෙන් මහණතෙමේ ආශ්‍රවයන් ක්ෂයකිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධියත් අර්හත්ඵල ප්‍රඥාවත් මේ ආත්මයෙහිම තමන්ම විශේෂඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට ඊට ඥානයෙන් පැමිණ වාසය කරන්නේය."

---

# 3. ජළින්ද්‍රිය වර්ගය

## 1. න අබ්භඤ්ඤාසි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක.

'ස්වාමීනියි' කියා ඒ භික්ෂූන් භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ පසෙකි කවර පසෙක්ද? සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රියයි. මහණෙනි, මම යම්තාක් මේ පඤ්ඤින්ද්‍රියයන්ගේ ඉපදීමද, නැතිවීමද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිද්දෙන් අවබොධ නොකෙළෙම්ද, මහණෙනි, මම ඒතාක් දෙවියන් සහිත බ්‍රහ්මයන් සහිත ලෝකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත දෙව් මිනිසුන් සහිත සත්වප්‍රජාවට නිරුත්තරවූ සම්‍යක් සම්බොධිය අවබොධකෙළෙම්යයි ප්‍රතිඥා නොකෙළෙමි.

3. "මහණෙනි, යම්කලෙක වනාහි මම මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ ඉපදීම, නැතිවීමද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිද්දෙන් අවබොධ කෙළෙම්ද, මහණෙනි, එකල්හි මම දෙවියන් සහිත මාරයන් සහිත බ්‍රහ්මයන් සහිත ලෝකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයන් දෙව් මිනිසුන් සහිත ප්‍රජාවට නිරුත්තරවූ සම්‍යක් සම්බොධිය අවබොධ කළෙම්යයි ප්‍රතිඥා කෙළෙමි

4. "මාගේ අර්හත්ඵල සමාධිය නැතිකළ නොහැක. මාගේ මේ අන්තිම ජාතියවේ. දැන් නැවත ඉපදීමක් නැත්තේය. ඥාන දර්ශනයද මට පහළවිය.

---

## 2. ජීවිතින්ද්‍රිය සූත්‍රය.

1. (මේ වර්ගයේ සියලු සූත්‍රයන්හි මුල් ඡෙද මෙහි මුල් සූත්‍රයේ මෙනි.)

2. "මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ තිදෙනෙක් වෙත්. කවර තිදෙනෙක්ද, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, ජීවිතින්ද්‍රිය යනුයි. මහණෙනි, මොව්හු වනාහි තුන් ඉන්ද්‍රියයෝයි."

---

## 3. අඤ්ඤාතාවින්ද්‍රිය සූත්‍රය.

2. "මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ තිදෙනෙක් වෙත්. කවර තිදෙනෙක්ද, අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රිය (සෝවාන් මාර්ග ඥානය) අඤ්ඤින්ද්‍රිය (සෝවාන්ඵලයේ පටන් අර්හත් මාර්ගය දක්වා ආයෘී මාර්ගඵල ඥානය) අඤ්ඤාතාවින්ද්‍රිය (අර්හත් ඵල ඥානය) යනුයි. මහණෙනි, මේ තුන් ඉන්ද්‍රියයෝ වෙත්.

---

## 4. එකබීජ සූත්‍රය

2. "මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ පසෙක් වෙත්. කවර පසෙක්ද? සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යනුයි. මහණෙනි, මොව්හු පඤ්චෙන්ද්‍රියයෝයි.

3. "මහණෙනි, මේ පඤ්චෙන්ද්‍රියයන් සම්පූර්ණ කිරීමෙන් පිරීමෙන් රහත් වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් අන්තරා පරිනිබ්බායී අනාගාමී වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් උපහච්ච පරිනිබ්බායි අනාගාමී වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් අසංඛාර පරිනිබ්බායි අනාගාමී වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සසංඛාර පරිනිබ්බායි අනාගාමී වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් උද්ධංසොත අකනිට්ඨගාමී අනාගාමීවෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සකෘදාගාමී වෙයි. ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් ඒකබීජී නම් සෝවාන් පුද්ගලයා වෙයි. සෝවාන්වී එකම ආත්මභාවයක ඉපිද රහත්වන පුද්ගලයා කෝලංකොල නම් සෝවාන් පුද්ගලයා වෙයි දෙතුන් භවයක සැරිසරා රහත්වන පුද්ගලයා ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සත්තක්ඛත්තු පරම නම් සෝවාන් පුද්ගලයා වෙයි. සත්වරක් දෙව් මිනිස් ලෝකයන්හි සැරිසරා රහත්වන පුද්ගලයා ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් ධම්මානුසාරී නම් සෝවාන් පුද්ගලයා වෙයි, ඊට වඩා මෘදුවූ ඉන්ද්‍රියයන්ගෙන් සද්ධානුසාරී නම් සෝවාන් පුද්ගලයා වෙයි"

---

## 5. ඡළින්ද්‍රිය සූත්‍රය.

2. "මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ සයක් වෙත්. කවර සයෙක්ද? චක්ඛුන්ද්‍රිය, සොතින්ද්‍රිය, ඝානින්ද්‍රිය, ජිව්හින්ද්‍රිය, කායින්ද්‍රිය, මනින්ද්‍රිය යනුයි මහණෙනි, මොව්හු වනාහි ඉන්ද්‍රිය සයවෙති."

---

## 6. ඡළින්ද්‍රිය සොතාපන්න සූත්‍රය.

2. "මහණෙනි මේ ඉන්ද්‍රියයෝ සයක් වෙත්. කවර සයෙක්ද, චක්ඛුන්ද්‍රිය, සොතින්ද්‍රිය, ඝානින්ද්‍රිය, ජිව්හින්ද්‍රිය, කායින්ද්‍රිය, මනින්ද්‍රිය යනුයි මහණෙනි, යම් කලෙක වනාහි ආර්‍ය්‍ය ශ්‍රාවකතෙමේ මේ ෂඩින්ද්‍රියයන්ගේ ඉපදීමද නැතිවීමද ආශ්වාදයද ආදීනවයද, නිස්සරණදය තත්වූ පරිද්දෙන් දනියිද, මහණෙනි, ඒ ආර්‍ය්‍යශ්‍රාවකතෙමේ සෝවාන්වූයේ අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තේ අර්හත් මාර්ගයට නියතවූයේ නිර්වාණය පරායන කොට ඇත්තේයයි කියනු ලැබේ"

---

## 7. ඡළින්ද්‍රිය අරහන්ත සූත්‍රය.

2. "මහණෙනි, මේ ඉන්ද්‍රියෝ සයක් වෙත්. කවර සයෙක්ද, චක්ඛුන්ද්‍රිය, සොතින්ද්‍රිය, ඝානින්ද්‍රිය, ජිව්හින්ද්‍රිය, කායින්ද්‍රිය, මනින්ද්‍රිය යනුයි.

"මහණෙනි, යම්සේ වනාහි මහණතෙමේ මේ ෂඩිඉන්ද්‍රියයන්ගේ ඉපදීමද, නැතිවීමද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිද්දෙන් දැන තණ්හා දිට්ඨි මානයන්ගෙන් අල්වා ගැනීමෙන් මිදුනේ වෙයිද,

3. "මහණෙනි, ඒ භික්ෂූතෙම ක්ෂය කරන ලද ආශ්‍රවයන් ඇත්තාවූ මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවූ කරන ලද කටයුතු ඇත්තාවූ බහාතැබූ කෙලෙස් බර ඇත්තාවූ තමාගේ අර්ථයට

පැමිණියාවූ ක්ෂය කරනලද භව බැඳුම් ඇත්තාවූ මනාකොට දැන මිදුණාවූ අර්හත් පුද්ගලයායයි කියනු ලැබේ."

---

## 8. ඡළින්ද්‍රිය අභිසම්බුද්ධ සූත්‍රය.

**2.** "මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ සයක් වෙත්. කවර සයක්ද, චක්ඛුන්ද්‍රිය, සොතින්ද්‍රිය, ඝානින්ද්‍රිය, ජිව්හින්ද්‍රිය කායින්ද්‍රිය, මනින්ද්‍රිය යනුයි.

**3.** "මහණෙනි, මම යම්තාක් මේ ෂඩ්ඉන්ද්‍රියයන්ගේ ඉපදීමද, නැතිවීමද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිද්දෙන් අවබොධ නොකෙළෙම්ද,

"මහණෙනි, ඒතාක් මම දෙවියන් සහිත මාරයන් සහිත බ්‍රහ්මයන් සහිත ලෝකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජාවට නිරුත්තරවූ සම්‍යක් සමාධිය අවබොධ කෙළෙම්යයි ප්‍රතිඥා නොකෙළෙමි.

**4.** "මහණෙනි, මම යම් කලෙක වනාහි මේ ෂඩ්ඉන්ද්‍රියයන්ගේ ඉපදීමද, නැතිවීමද, ආශ්වාදය, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිද්දෙන් අවබොධ කෙළෙම්ද, මහණෙනි, එකල්හි මම දෙවියන් සහිත මාරයන් සහිත බ්‍රහ්මයන් සහිත ලෝකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජාවට නිරුත්තරවූ සම්‍යක් සම්බොධිය අවබොධ කෙළෙම්යයි ප්‍රතිඥා කෙළෙමි. මාගේ අර්හත්ඵල සමාධිය විනාශ නොවේ. මාගේ මේ අන්තිම ජාතියයි. දැන් මගේ නැවත ඉපදීමක් නැත්තේය යන ඥාන දර්ශනය මට පහළවිය."

---

## 9. ඡළින්ද්‍රිය සමණ බ්‍රාහ්මණ සූත්‍රය.

**2.** "මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ සයක් වෙත්. කවර සයක්ද? චක්ඛුන්ද්‍රිය, සොතින්ද්‍රිය, ඝානින්ද්‍රිය, ජිව්හින්ද්‍රිය, කායින්ද්‍රිය, මනින්ද්‍රිය යනුයි.

"මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මේ ෂඩ්ඉන්ද්‍රියයන්ගේ ඉපදීමද, නැතිවීමද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද, තත්වූ පරිද්දෙන් නොදනිත්ද, මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ආශ්‍රවයන්ගේ නැතිකිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධිය හා අර්හත්ඵල ප්‍රඥාව මේ ආත්මයෙහිම තෙමේ විශෙෂඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය නොකරත්.

3. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මේ ෂඩ්ඉන්ද්‍රියයන්ගේ ඉපදීමද, නැතිවීමද, ආශ්වාදයද ආදීනවයද නිස්සරණයද තත්වූ පරිද්දෙන් දනිත්ද, මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ආශ්‍රවයන් නැති කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධිය හා අර්හත්ඵල ප්‍රඥාව මේ ආත්මයෙහිම තෙමේ විශෙෂඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරත් "

---

## 10. දුතිය ඡළින්ද්‍රිය සූත්‍රය.

2. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ චක්ඛුන්ද්‍රිය නොදනිත්ද, චක්ඛුන්ද්‍රිය ඇතිවීමේ හේතුව නොදනිත්ද, චක්ඛුන්ද්‍රිය නිරොධය නොදනිත්ද, චක්ඛුන්ද්‍රිය නිරොධගාමිනී ප්‍රතිපදාව නොදනිත්ද,

"මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ සොතින්ද්‍රිය නොදනිත්ද, සොතින්ද්‍රිය ඇතිවීමේ හේතුව නොදනිත්ද, සොතින්ද්‍රිය නිරොධය නොදනිත්ද, සොතින්ද්‍රිය නිරොධගාමිනී ප්‍රතිපදාව නොදනිත්ද,

"මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝඝානින්ද්‍රිය නොදනිත්ද, ඝානින්ද්‍රිය ඇතිවීමේ හේතුව නොදනිත්ද, ඝානින්ද්‍රිය නිරොධය නොදනිත්ද, ඝානින්ද්‍රිය නිරොධ ගාමිනී ප්‍රතිපදාව නොදනිත්ද,

"මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ජිව්හින්ද්‍රිය නොදනිත්ද, ජිව්හින්ද්‍රිය ඇතිවීමේ හේතුව නොදනිත්ද,

ජිව්හින්ද්‍රිය නිරොධය නොදනිත්ද, ජිව්හින්ද්‍රිය නිරොධගාමිනී ප්‍රතිපදාව නොදනිත්ද,

"මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ කායින්ද්‍රිය නොදනිත්ද, කායින්ද්‍රිය ඇතිවීමේ හේතුව නොදනිත්ද, කායින්ද්‍රිය, කායින්ද්‍රිය ඇතිවීමේ හේතුව නොදනිත්ද, කායින්ද්‍රිය නිරොධය නොදනිත්ද, කායින්ද්‍රිය නිරොධගාමිනී ප්‍රතිපදාව නොදනිත්ද,

"මහණෙනි, යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මනින්ද්‍රිය නොදනිත්ද, මනින්ද්‍රිය ඇතිවීමේ හේතුව නොදනිත්ද, මනින්ද්‍රිය නිරෝධය නොදනිත්ද, මනින්ද්‍රිය නිරොධගාමිනීප්‍රතිපදාව නොදනිත්ද, මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ආශ්‍රවයන්ගේ නැතිකිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධිය හා අර්හත්ඵල ප්‍රඥාව මේ ආත්මයෙහිම තෙමේ විශෙෂඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය නොකෙරත්.

3. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ චක්ඛුන්ද්‍රිය දනිත්ද චක්ඛුන්ද්‍රිය ඇතිවීමේ හේතුව දනිත්ද, චක්ඛුන්ද්‍රිය නිරොධය දනිත්ද, චක්ඛුන්ද්‍රිය නිරොධගාමිනී ප්‍රතිපදාව දනිත්ද, සොතින්ද්‍රිය දනිත්ද, සොතින්ද්‍රිය ඇතිවීමේ හේතුව දනිත්ද, සොතින්ද්‍රිය නිරොධය දනිත්ද, සොතින්ද්‍රිය නිරොධගාමිනී ප්‍රතිපදාව දනිත්ද, ඝානින්ද්‍රිය දනිත්ද, ඝානින්ද්‍රිය ඇතිවීමේ හේතුව දනිත්ද, ඝානින්ද්‍රිය නිරොධය දනිත්ද, ඝානින්ද්‍රිය නිරොධගාමිනී ප්‍රතිපදාව දනිත්ද, ජිව්හින්ද්‍රිය දනිත්ද, ජිව්හින්ද්‍රිය ඇතිවීමේ හේතුව හේතුව දනිත්ද, ජිව්හින්ද්‍රිය නිරොධය දනිත්ද, ජිව්හින්ද්‍රිය නිරොධ ගාමිනී ප්‍රතිපදාව දනිත්ද, මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ කායින්ද්‍රිය නිරොධය දනිත්ද, කායින්ද්‍රිය ඇතිවීමේ හේතුව දනිත්ද, කායින්ද්‍රිය නිරොධය දනිත්ද, කායින්ද්‍රිය නිරොධගාමිනී ප්‍රතිපදාව දනිත්ද, මනින්ද්‍රිය දනිත්ද, මනින්ද්‍රිය ඇතිවීමේ හේතුව දනිත්ද, මනින්ද්‍රිය නිරොධය දනිත්ද, මනින්ද්‍රිය නිරොධගාමිනී ප්‍රතිපදාව දනිත්ද,

"මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ආශ්‍රවයන්ගේ නැතිකිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධිය අර්හත්ඵල ප්‍රඥාව මේ ආත්මයෙහිම තෙමේ විශෙෂඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරත්.

---

## 4. සුඛින්ද්‍රිය වර්ගය.

### 1. වෙදනින්ද්‍රිය සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි වූ අනේපිඬු සිටුහු විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩ වසනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ පසක් වෙත්. කවර පසක්ද? සුඛින්ද්‍රිය, දුක්ඛින්ද්‍රිය, සොමනස්සින්ද්‍රියය, දොමනස්සින්ද්‍රිය, උපෙක්ඛින්ද්‍රිය යනුයි. මහණෙනි, මොව්හු වනාහි ඉන්ද්‍රිය පස වෙත්"

---

### 2. වෙදනින්ද්‍රිය සොතාපන්න සූත්‍රය.

1. (මෙතැන් සිට මේ වර්ගයේ සියලු සූත්‍රයන්හි මුල් ඡෙද මෙහි මුල් සූත්‍රයේ මෙනි.)

2. "මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ පසක් වෙත්. කවර පසක්ද? සුඛින්ද්‍රිය, දුක්ඛින්ද්‍රිය, සොමනස්සින්ද්‍රිය, දොමනස්සින්ද්‍රිය උපෙක්ඛින්ද්‍රිය යනුයි. මහණෙනි, යම් කලෙක පටන් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙමේ මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ ඇතිවීමද නැතිවීමද, ආශ්වාදයද, ආදීනවයද නිස්සරණයද තත්වූ පරිද්දෙන් දැනගනියිද? මහණෙනි, ඒ ආර්‍ය්‍යශ්‍රාවකතෙමේ අපායෙහි

නොවැටෙන ස්වභාවය ඇත්තාවූ අර්හත් මාර්ගයට නියතවූ නිර්වාණය පිහිටකොට ඇති සෝවාන් පුද්ගලයායයි කියනු ලැබේ."

## 3. වෙදනින්ද්‍රිය අරහන්ත සූත්‍රය.

2. "මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ පසෙක් වෙත්. කවර පසෙක්ද? සුඛින්ද්‍රිය, දුක්ඛින්ද්‍රිය, සොමනස්සින්ද්‍රිය, දොමනස්සින්ද්‍රිය, උපෙක්ඛින්ද්‍රිය යනුයි.

"මහණෙනි, යම් කලෙක මහණතෙමේ මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ ඇතිවීමද, නැතිවීමද, ආශ්වාදයද, ආදීනවයද නිස්සරණයද තත්වූ පරිද්දෙන් දැන තෘෂ්ණා දෘෂ්ටීන්ගෙන් අල්වා නොගෙන මිදුනේවේද, මහණෙනි, මේ මහණතෙමේ ක්ෂය කරනලද ආශ්‍රවයන් ඇති වැස නිමවන මාර්ගබ්‍රහ්මචර්‍යයාව ඇති කරනලද කටයුතු ඇති, බහා තැබූ කෙලෙස් බර ඇති, තමාගේ අර්ථයට පැමිණියාවූ, මනාකොට දැන මිදුනාවූ අර්හත් පුද්ගලයා යයි කියනු ලැබේ.

## 4. වෙදනින්ද්‍රිය සමණ බ්‍රාහ්මණ සූත්‍රය.

2. "මහණෙනි මේ ඉන්ද්‍රියයෝ පසෙක් වෙත්. කවර පසෙක්ද? සුඛින්ද්‍රිය, දුක්ඛින්ද්‍රිය, සොමනස්සින්ද්‍රිය, දොමනස්සින්ද්‍රිය, උපෙක්ඛින්ද්‍රිය යනුයි.

"මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ ඇතිවීමද, නැතිවීමද, ආශ්වාදයද ආදීනවයද නිස්සරණයද තත්වූ පරිද්දෙන් නොදනිත්ද, මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ආශ්‍රවයන්ගේ නැතිකිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධිය හා අර්හත්ඵල ප්‍රඥාව මේ ආත්මයෙහිම තෙමේ විශෙෂඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය නොකෙරෙත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ ඇතිවීමද, නැතිවීමද, ආශ්වාදයද, ආදීනවයද, නිස්සරණයද තත්වූ පරිද්දෙන් දනිත්ද, මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ආශ්‍රවයන්ගේ නැති කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධිය හා අර්හත්ඵල ප්‍රඥාව මේ ආත්මයෙහිම තෙමේ විශෙෂඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කෙරෙත්.

"ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ආශ්‍රවයන්ගේ නැතිකිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධිය හා අර්හත්ඵල ප්‍රඥාව මේ ආත්මයෙහිම තෙමේ විශෙෂඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරත්.

---

## 5. දුතිය වෙදනින්ද්‍රිය සූත්‍රය.

2. "මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ පසක් වෙත්. කවර පසෙක්ද? සුඛින්ද්‍රිය, දුක්ඛින්ද්‍රිය, සොමනස්සින්ද්‍රිය දොමනස්සින්ද්‍රිය, උපෙක්ඛින්ද්‍රිය යනුයි.

"මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ සුඛින්ද්‍රිය නොදනිත්ද, සුඛින්ද්‍රිය හේතුව නොදනිත්ද, සුඛින්ද්‍රිය නිරෝධය නොදනිත්ද, සුඛින්ද්‍රිය නිරොධගාමිනී ප්‍රතිපදාව නොදනිත්ද, දුක්ඛින්ද්‍රිය නොදනිත්ද, දුක්ඛින්ද්‍රිය හෙතුව නොදනිත්ද, දුක්ඛින්ද්‍රිය නිරොධය නොදනිත්ද, දුක්ඛින්ද්‍රිය නිරොධගාමිනී ප්‍රතිපදාව නොදනිත්ද, සොමනස්සින්ද්‍රිය නොදනිත්ද, සොමනස්සින්ද්‍රිය හෙතුව නොදනිත්ද, සොමනස්සින්ද්‍රිය නිරොධය නොදනිත්ද, සොමනස්සින්ද්‍රිය නිරොධගාමිනී ප්‍රතිපදාව නොදනිත්ද, දොම්නස්සින්ද්‍රිය නොදනිත්ද, දොම්නස්සින්ද්‍රිය හෙතුව නොදනිත්ද, දොම්නස්සින්ද්‍රිය නිරොධය නොදනිත්ද, දොම්නස්සින්ද්‍රිය නිරොධගාමිනී ප්‍රතිපදාව නොදනිත්ද, උපෙක්ඛින්ද්‍රිය නොදනිත්ද, උපෙක්ඛින්ද්‍රිය හෙතුව නොදනිත්ද, උපෙක්ඛින්ද්‍රිය නිරෝධය නොදනිත්ද, උපෙක්ඛින්ද්‍රිය නිරොධගාමිනී ප්‍රතිපදාව නොදනිත්ද,

"මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ආශ්‍රවයන්ගේ නැති කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධියද, අර්හත්ඵල ප්‍රඥාවත් මේ ආත්මයෙහිම තෙමේ විශෙෂඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය නොකරත්

3. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ සුඛින්ද්‍රිය දනිත්ද, සුඛින්ද්‍රිය හෙතුව දනිත්ද, සුඛින්ද්‍රිය නිරොධය දනිත්ද, සුඛින්ද්‍රිය නිරොධගාමිනී ප්‍රතිපදාව දනිත්ද, දුක්ඛින්ද්‍රිය දනිත්ද, දුක්ඛින්ද්‍රිය හෙතුව දනිත්ද, දුක්ඛින්ද්‍රිය නිරොධය දනිත්ද, දුක්ඛින්ද්‍රිය නිරොධගාමිනී ප්‍රතිපදාව දනිත්ද, සොමනස්සින්ද්‍රිය නිරොධය දනිත්ද, සොමනස්සින්ද්‍රිය නිරොධගාමිනී ප්‍රතිපදාව දනිත්ද, දොමනස්සින්ද්‍රිය දනිත්ද, දොම්නස්සින්ද්‍රිය හෙතුව දනිත්ද, දොමනස්සින්ද්‍රිය නිරොධය දනිත්ද දොමනස්සින්ද්‍රිය නිරොධගාමිනි ප්‍රතිපදාව දනිත්ද, උපෙක්ඛින්ද්‍රිය දනිත්ද උපෙක්ඛින්ද්‍රිය හෙතුව දනිත්ද, උපෙක්ඛින්ද්‍රිය නිරොධය දනිත්ද, උපෙක්ඛින්ද්‍රිය නිරොධගාමිනි ප්‍රතිපදාව දනිත්ද,

"මහණෙනි, ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ ආශ්‍රවයන්ගේ නැති කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත් ඵල සමාධියත් අර්හත් ඵල ප්‍රඥාවත් මේ ආත්මයෙහිම තෙමේ විශේෂඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරත්."

---

## 6. පඨම වෙදනින්ද්‍රිය විභඞ්ග සූත්‍රය.

2. "මහණෙනි, මේ පඤ්චෙන්ද්‍රියයෝ පසක් වෙත්. කවර පසෙක්ද? සුඛින්ද්‍රිය, දුක්ඛින්ද්‍රිය, සොමනස්සින්ද්‍රිය, දොමනස්සින්ද්‍රිය, උපෙක්ඛින්ද්‍රිය යනුයි.

3. "මහණෙනි, සුඛින්ද්‍රිය කවරේද? මහණෙනි, යම් ඒ කායික සැපයක් වේද, කායික මිහිරක් වේද, කාය ස්පර්ශයෙන් උපන් සැපවූ මිහිරිවූ විඳීමක්වේද, මහණෙනි, මේ සුඛින්ද්‍රියයයි කියනු ලැබේ.

4. මහණෙනි, දුක්ඛින්ද්‍රිය කවරේද? මහණෙනි, යම් ඒ කායික දුකක් වේද, කායික අවහිරයක් වේද, කාය ස්පර්ශයෙන්

උපන් දුක්වූ අමිහිරිවූ විඳීමක් වේද, මහණෙනි, මෙය දුක්ඛින්ද්‍රියයයි කියනු ලැබේ.

5. “මහණෙනි, සොම්නස්සින්ද්‍රිය කවරේද? මහණෙනි, යම් ඒ මානසික සැපයක් වේද, මානසික මිහිරක් වේද, මනො ස්පර්ශයෙන් උපන් සැපවූ මිහිරිවූ විඳීමක් වේද, මහණෙනි, මේ සොමනස්සින්ද්‍රියයයි කියනු ලැබේ.

6. “මහණෙනි, දොමනස්සින්ද්‍රිය කවරේද? මහණෙනි, යම් ඒ මානසික දුකක්වේද? මානසික අමිහිරක් වේද? මනො ස්පර්ශයෙන් උපන් දුක්වූ අමිහිරිවූ විඳීමක්වේද? මහණෙනි, මේ දොමනස්සින්ද්‍රියයයි කියනු ලැබේ.

7. “මහණෙනි, උපෙක්ඛින්ද්‍රිය කවරේද? යම් ඒ කායිකවූද, චෛතසිකවූද, මිහිරිද නොවූ අමිහිරිද නොවූ විඳීමක්වේද, මහණෙනි මේ උපෙක්ඛින්ද්‍රියයයි කියනුලැබේ මහණෙනි, මොව්හු වනාහි පඤ්චෙන්ද්‍රියයෝයි.”

---

## 7. දුතිය වෙදනින්ද්‍රිය විභංග සූත්‍රය.

2. “මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ පසෙක් වෙත්. කවර පසෙක්ද? සුඛින්ද්‍රිය, දුක්ඛින්ද්‍රිය, සොමනස්සින්ද්‍රිය, දොමනස්සින්ද්‍රිය, උපෙක්ඛින්ද්‍රිය යනුයි.

3-7. (මේ ඡෙද මේ වර්ගයේ 6 වෙනි සූත්‍රයේ 3-7 ඡෙද මෙනි.)

8. “මහණෙනි, එහි යම් සුඛින්ද්‍රියක් වේද, යම් සොමනස්සින්ද්‍රියක් වේද, ඒ සැප වේදනාව යයි දත යුතුයි. මහණෙනි, එහි යම් දුක්ඛින්ද්‍රියයක් වේද යම් දොමනස්සින්ද්‍රියක් වේද ඒ දුක් වෙදනාව යයි දත යුතුයි මහණෙනි, එහි යම් ඒ උපෙක්ඛින්ද්‍රියයක් වේද? ඒ වේදනාව දුක්ද නොවූ සැපද නොවූ වේදනාවයයි දතයුතුයි. මහණෙනි, මොව්හු වනාහි පංචෙන්ද්‍රියයෝය.”

---

## 8. තතිය වෙදනින්ද්‍රිය විභංග සූත්‍රය.

2. "මහණෙනි, ඉන්ද්‍රියයෝ පසෙක් වෙත්. කවර පසෙක්ද සුඛින්ද්‍රිය, දුක්ඛින්ද්‍රිය, සොමනස්සින්ද්‍රිය, දොමනස්සින්ද්‍රිය උපෙක්ඛින්ද්‍රිය යනුයි.

3-7. (මේ ඡෙද මේ වර්ගයේ 6 වෙනි සූත්‍රයේ 3-7 ඡෙද මෙනි.)

8. "මහණෙනි, එහි යම් සුඛීන්ද්‍රියක් වේද, යම් සොමනස්සින්ද්‍රියක් වේද ඒ සුඛ වේදනාව යයි දත යුතුයි මහණෙනි, එහි යම් දුක්ඛින්ද්‍රියක් වේද යම් දොමනස්සින්ද්‍රියක් වේද ඒ දුක්ඛ වේදනාවයයි දත යුතුයි. මහණෙනි, එහි යම් මේ උපෙක්ඛින්ද්‍රියයක් වේද? ඒ වේදනාව දුක්ද නොවූ සැපද නොවූ වේදනාවයයි දත යුතුයි. මහණෙනි, මෙසේ වනාහි මේ පංචෙන්ද්‍රියයෝ පිළිවෙලින් පසක්ව තුනක් වෙත්. තුනක්ව පසෙක් වෙත්."

---

## 9. තෙජොපම සූත්‍රය.

2. "මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ පසක් වෙත්. කවර පසක්ද සුඛින්ද්‍රිය, දුක්ඛින්ද්‍රිය, සොමනස්සින්ද්‍රිය, දොමනස්සින්ද්‍රිය උපෙක්ඛින්ද්‍රිය යනුයි.

"මහණෙනි, විඳියයුතු සැප වේදනාව ඉපදීමට සුදුසු ස්පර්ශය නිසා සුඛින්ද්‍රිය උපදී. හෙතෙම සැපවත් වූයේ සැපවත්වූවෙමි' යි දැනගනියි. ඒ සුඛවේදනාවට සුදුසුවූ ස්පර්ශයාගේ නිරොධයෙන් ඊට අනුරූප වේදනාවවූ සුඛ වේදනාව උපදින ස්පර්ශය සැප වේදනාවක් නිසා උපන් යම් සුඛින්ද්‍රියක් වේද ඒ සුඛින්ද්‍රියය නිරුද්ධ වේ. එය සංසිඳේයයි දැනගනියි.

4. 'මහණෙනි, දුක් වේදනාව ඇතිවීමට සුදුසුවූ ස්පර්ශය නිසා දුක්ඛින්ද්‍රියක් උපදීද, හෙතෙම දුක්වූයේ දුක් වූයෙමි' යි

දැනගනියි. ඒ දුක් වේදනාව ඇතිවීමට හේතුවූ ස්පර්ශයාගේ නිරොධයෙන් ඊට අනුරූප වේදනාවවූ දුක් වේදනාව උපදවන ස්පර්ශය නිසා උපන් යම් දුක්ඛින්ද්‍රියක් වේද ඒ දුක්ඛින්ද්‍රිය නිරුද්ධ වෙයි. එය සංසිඳේයයි දැනගනියි.

5. 'මහණෙනි, සොම්නස් වේදනාව ඉපදීමට සුදුසුවූ ස්පර්ශය සොමනස්සින්ද්‍රිය නිසා උපදී. හෙතෙම සොම්නස් වූයේ සොම්නස් වූයෙමි'යි දැනගනියි. ඒ සොම්නස් වේදනාව ඇතිවීමට සුදුසුවූ ස්පර්ශයාගේ නිරොධයෙන් ඊට අනුරූප වේදනාවවූ සොමනස්ස වේදනාව ඇතිවීමට සුදුසු ස්පර්ශය නිසා යම් සොමනස්සින්ද්‍රියක් උපන්නේද ඒ සොමනස්සින්ද්‍රිය නිරුද්ධවේ. එය සංසිඳේයයි දැනගනියි.

6. "මහණෙනි, දොම්නස් වේදනාව ඇතිවීමට සුදුසුවූ ස්පර්ශය නිසා දොමනස්සින්ද්‍රිය උපදී. හෙතෙම දොම්නස් වූයේ දොම්නස් වූවෙමි'යි දැනගනියි. ඒ දොමනස්සය ඇතිවීමට සුදුසුවූ ස්පර්ශයාගේ නිරොධයෙන් ඊට අනුරූප වේදනාවවූ දොම්නස් ඇතිවීමට සුදුසු ස්පර්ශය නිසා යම් දොමනස්සින්ද්‍රියක් උපදීද ඒ දොමනස්සින්ද්‍රිය නිරුද්ධවේ එය සංසිඳේයයි දැන ගනියි.

7. "මහණෙනි, උපෙක්ඛා වේදනාව ඇතිවීමට සුදුසුවූ ස්පර්ශය නිසා උපෙක්ඛින්ද්‍රිය උපදී. හෙතෙම උපෙක්ෂා වූයේ උපෙක්ෂා වූවෙමි'යි දැනගනියි. ඒ උපෙක්ෂා වේදනාව ඇතිවීමට සුදුසුවූ ස්පර්ශයාගේ නිරොධයෙන් ඊට අනුරූප උපෙක්ෂා වේදනාව ඇතිවීමට සුදුසු ස්පර්ශය යම් උපෙක්ඛින්ද්‍රියක් උපදීද ඒ උපෙක්ඛින්ද්‍රිය නිරුද්ධවේ. එය සංසිඳේයයි දැනගනියි.

8. "මහණෙනි, යම්සේ දඬු දෙකක්හුගේ ගැටීම නිසා එක්වීම නිසා උණුසුම උපදී. ගිනි උපදියි. ඒ දඬු වෙන්වීමෙන් වෙන්ව තැබීමෙන් එයින් උපන් යම් උණුසුමක් වේද ඒ උණුසුම නිරුද්ධවේ. ඒ සංසිඳේ. මහණෙනි, එපරිද්දෙන්ම සුඛ වේදනාව සුදුසුවූ ස්පර්ශය සුඛින්ද්‍රිය නිසා උපදී. හෙතෙම සුවපත් වූයේම සැපවත් වූයෙමියි දැනගනියි. ඒ සැප වේදනාව ඇතිවීමට සුදුසුවූ ස්පර්ශයාගේ නිරොධයෙන් ඊට අනුරූපවූ සුඛ වේදනාව

උපදවන ස්පර්ශය නිසා යම් සුඛින්ද්‍රියක් උපදීද ඒ සුඛින්ද්‍රියය නිරුද්ධවෙයි. එය සංසිඳුනේයයි දැන ගනියි.

**9.** "මහණෙනි, එපරිද්දෙන්ම දුක්ඛ වේදනාව ඇති වීමට සුදුසුවූ ස්පර්ශය නිසා දුක්ඛින්ද්‍රිය උපදී. හෙතෙම දුක් වූයේම දුකට පත්වූ යෙමියි දැනගනියි. ඒ දුක් වේදනාවට සුදුසුවූ ස්පර්ශයාගේ නිරොධයෙන් ඊට අනුරූපවූ දුක්වේදනාව උපදවන්නාවූ ස්පර්ශය නිසා යම් දුක්ඛින්ද්‍රියක් උපදීද ඒ දුක්ඛින්ද්‍රිය නිරුද්ධවෙයි. එය සංසිඳුනේයයි දැනගනියි.

**10.** "මහණෙනි, එපරිද්දෙන්ම සොම්නස් වේදනාව ඇතිවීමට සුදුසුවූ ස්පර්ශය නිසා සොමනස්සින්ද්‍රිය උපදියි. හෙතෙම සොම්නස් වූයේ සොම්නස් වූයෙමියි දැනගනියි. ඒ සොම්නස් වේදනාව සුදුසුවූ ස්පර්ශයාගේ නිරොධයෙන් ඊට අනුරූපවූ සොමනස්ස වේදනාව උපදවන ස්පර්ශය නිසා යම් සොමනස්සින්ද්‍රියක් වේද ඒ සොමනස්සින්ද්‍රිය නිරුද්ධ වෙයි. එය සංසිඳුනේ යයි දැනගනියි.

**11.** "මහණෙනි, එපරිද්දෙන්ම දොම්නස් වේදනාව ඇතිවීමට සුදුසුවූ ස්පර්ශය නිසා දොමනස්සින්ද්‍රිය උපදියි. හෙතෙම දොම්නස් වූයේම දොම්නස් වූයෙමියි දැනගනියි. ඒ දොමනස්ස වේදනාව ඇතිවීමට සුදුවූ ස්පර්ශයාගේ නිරොධයෙන් ඊට අනුරූපවූ යම් දොම්නස්සින්ද්‍රියක් උපදීද ඒ දොමනස්සින්ද්‍රිය නිරුද්ධ වෙයි. එය සංසිඳුනේයයි දැනගනියි.

**12.** "මහණෙනි, උපෙක්ඛා වේදනාවට සුදුසුවූ ස්පර්ශය නිසා උපෙක්ඛින්ද්‍රිය උපදියි. හෙතෙම උපෙක්ෂාවූයේ උපෙක්ෂා වූයෙමියි දැනගනියි. ඒ උපෙක්ඛා වේදනාව ඇතිවීමට සුදුසුවූ ස්පර්ශයාගේ නිරෝධයෙන් ඊට අනුරූපවූ උපෙක්ඛා වේදනා උපදවන ස්පර්ශය නිසා යම් උපෙක්ඛින්ද්‍රියක් උපදීද, ඒ උපෙක්ඛින්ද්‍රිය නිරුද්ධවෙයි. එය සංසිඳුනේ යයි දැනගනියි.

---

## 10. උප්පටි පාටික සූත්‍රය.

2. "මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ පසක් වෙත්. කවර පසෙක්ද? දුක්ඛින්ද්‍රිය, දොමනස්සින්ද්‍රිය, සුඛින්ද්‍රිය, සොමනස්සින්ද්‍රිය, උපෙක්ඛින්ද්‍රිය යනුයි.

3. 'මහණෙනි මේ ශාසනයෙහි අප්‍රමාදීවූ කෙලෙස් තවන වීය්‍ය්‍යීය ඇතිව සංසිඳුවන ලද සිත් ඇතිව වාසය කරන්නාවූ භික්ෂුවට දුක්ඛින්ද්‍රිය උපදියි. හෙතෙම මෙසේ දැනගනියි මේ දුක්ඛින්ද්‍රිය මට උපන්නේය. එය වනාහි නිමිති සහිතය. නිදාන සහිතය. හෙතු සහිතය ප්‍රත්‍යසහිතය.

"ඒ කාන්තයෙන් ඒ දුක්ඛින්ද්‍රිය නිමිති රහිතව නිදාන රහිතව හේතු රහිතව ප්‍රත්‍ය රහිතව උපදින්නේය යන මේ කාරණය විද්‍යමාන (සිද්ධ) නොවේ. හෙතෙම දුක්ඛින්ද්‍රියද දැනගනියි. දුක්ඛින්ද්‍රියට හෙතුවද දැනගනියි. දුක්ඛින්ද්‍රිය නිරෝධයද දැනගනියි. යම් තැනක උපන් දුක්ඛින්ද්‍රිය ඉතිරි නොවී නිරුද්ධ වෙයිද, එයද දැනගනියි. කොතැන්හි උපන් දුක්ඛින්ද්‍රිය ඉතිරි නොවී නිරුද්ධ වේද?

4. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කාමයන්ගෙන් වෙන්ව විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් උපන් ප්‍රීති සුඛය ඇති ප්‍රථමධ්‍යානයට එළඹ වාසය කරයිද, මෙහි උපන් දුක්ඛින්ද්‍රිය ඉතිරි නැතිව නිරුද්ධ වෙයි. මහණෙනි, මේ මහණතෙම දුක්ඛින්ද්‍රිය නැතිකිරීම දැනගත්තේයයි ඒ සඳහාම සිත එළවන්නේයයි කියනු ලැබේ

5. "මහණෙනි, මේ ශාසනයෙහි අප්‍රමාදීව කෙලෙස් තවන වීය්‍ය්‍යීය ඇතිව සංසිඳුවන ලද සිත් ඇතිව වාසය කරන්නාවූ භික්ෂුවට දොමනස්සින්ද්‍රිය උපදියි. හෙතෙම මෙසේ දැන ගනියි. මට මේ දොමනස්සින්ද්‍රිය උපන්නේය. එය වනාහි නිමිති සහිතය. නිදාන සහිතය. හේතු සහිතය. ප්‍රත්‍යය සහිතය. එය දොමනස්සින්ද්‍රිය වනාහි නිමිති රහිතව නිදාන රහිතව හේතු රහිතව ප්‍රත්‍ය රහිතව උපදින්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"හෙතෙම දොමනස්සින්ද්‍රිය දැනගනියි. දොමනස්සින්ද්‍රියට හෙතුවද දැනගනියි. දොමනස්සින්ද්‍රිය නිරෝධයද දැන ගනියි. යම්තැනෙක උපන් දොමනස්සින්ද්‍රිය ඉතිරි නොවී නිරුද්ධ වේද එයද දැන ගනියි කොතැන්හි උපන් දොමනස්සින්ද්‍රිය ඉතිරි නැතිව නිරුද්ධ වේද?

**6.** "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම සහිතවූ සිතෙහි ඒකීභාවයෙන් යුත් එහෙයින් අවිතර්කවූ අවිචාරවූ සමාධියෙන් උපන් ප්‍රීති සුඛයෙන් යුත් ද්විතීය ධ්‍යානයට එළඹ වාසයකරයි. මෙහි උපන් දොමනස්සින්ද්‍රිය ඉතිරි නොවී නිරුද්ධවේ. මහණෙනි, මේ මහණතෙම දොමනස්සින්ද්‍රියයාගේ නිරොධය දැන ගත්තේයයි ඒ සිත එළවන්නේයයි කියනු ලැබේ.

**7.** "මහණෙනි, මේ ශාසනයෙහි අප්‍රමාදීව කෙළෙස් තවන වීර්‍ය්‍ය ඇතිව සංසිඳුවනලද සිත් ඇතිව වාසයකරන්නාවූ භික්ෂුවට සුඛින්ද්‍රිය උපදියි. හෙතෙම මෙසේ දැනගනියි. මට මේ සුඛින්ද්‍රියය උපන්නේය. එය වනාහි නිමිති සහිතය. නිදාන සහිතය. හෙතු සහිතය ප්‍රත්‍යය සහිතය. ඒ සුඛින්ද්‍රිය වනාහි නිමිති රහිතව නිදාන රහිතව හේතු රහිතව ප්‍රත්‍යය රහිතව උපදින්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ.' හෙතෙම සුඛින්ද්‍රියද දැන ගනියි. සුඛින්ද්‍රියට හෙතුවද දැන ගනියි. සුඛින්ද්‍රිය නිරොධයද දැන ගනියි. යම්තැනක උපන් සුඛින්ද්‍රිය ඉතිරි නොවී නිරුද්ධවෙයිද එයද දැනගනියි.

**8.** 'කොහි උපන් සුඛින්ද්‍රියය ඉතිරි නොවී නිරුද්ධවේද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ ප්‍රීතියගේද දුරුකිරීමෙන් සිහියෙන් යුක්තව යහපත් නුවණ ඇතිව උපෙක්ෂකව වාසය කරයිද, කයින් සුවයද මනාකොට විඳියි. උපෙක්ෂාවෙන් යුක්තවූයේ සිහියෙන් යුක්තවූයේ යම් ධ්‍යානයක් පිළිබඳව ආර්‍ය්‍යයෝ සැපසේ වාසය කරන්නේයයි කියත්ද, ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. මෙහි උපන් සුඛින්ද්‍රිය ඉතිරි නැතිව නිරුද්ධවේ. මහණෙනි, මේ මහණතෙම

සුඛින්ද්‍රියයාගේ නිරොධය දැන ගත්තේයයි ඒ සඳහා සිත එළවන්නේයයි කියනුලැබේ.

9. "මහණෙනි, මේ සාසනයෙහි අප්‍රමාදීව කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව සංසිඳවනලද සිත් ඇතිව වාසය කරන්නාවූ භික්ෂුවට සොමනස්සින්ද්‍රිය උපදියි. හෙතෙම මෙසේ දැන ගනියි. 'මට මේ සොමනස්සින්ද්‍රිය උපන්නේය. එය නිමිති සහිතය. නිදාන සහිතය. හෙතු සහිතය ප්‍රත්‍යයසහිතය. ඒ සොමනස්සින්ද්‍රිය ඒකාන්තයෙන් නිමිති රහිතව නිදාන රහිතව හෙතු රහිතව ප්‍රත්‍යය රහිතව උපදින්නේය' යන මේ කරුණ විද්‍යමාන නොවේ. හෙතෙම සොමනස්සින්ද්‍රියද දැන ගනියි. සොමනස්සින්ද්‍රියට හෙතුවද දැනගනියි. සොමනස්සින්ද්‍රිය නිරොධයද දැනගනියි. යම්තැනක උපන් සොමනස්සින්ද්‍රිය ඉතිරි නොවී නිරුද්ධවේද, එයද දැනගනියි. කොතැන්හි උපන් සොමනස්සින්ද්‍රියය ඉතිරි නොවී නිරුද්ධවේද,

10. "මහණෙනි මේ ශාසනයෙහි මහණතෙම සැපයාගේ හා දුක්ඛයාගේ ප්‍රහාණයෙන් පළමුව සොම්නස් දොම්නසුන්ගේ නැතිකිරීමෙන් දුක්ද නොවූ සැපද නොවූ උපෙක්ඛා සහිත පාරිසුද්ධියෙන් යුත් චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරයි. සොමනස්සින්ද්‍රිය ඉතිරි නොවී නිරුද්ධවේ. මහණෙනි, මේ මහණ තෙමේ සොමනස්සින්ද්‍රියයාගේ නිරොධය දැනගත්තේය. ඒ සඳහා සිත එළවන්නෙයයි කියනු ලැබේ.

11. "මහණෙනි, මේ ශාසනයෙහි අප්‍රමාදීවූ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇති සංසිඳවන ලද සිත් ඇතිව වාසය කරන්නාවූ භික්ෂුවට උපෙක්ඛින්ද්‍රිය උපදියි. හෙතෙම මෙසේ දැන ගනියි. මට මේ උපෙක්ඛින්ද්‍රිය උපන්නේය. ඒ උපෙක්ඛින්ද්‍රිය නිමිති සහිතය. නිදාන සහිතය. හෙතු සහිතය. ප්‍රත්‍යය සහිතය.

"ඒ උපෙක්ඛින්ද්‍රිය වනාහි නිමිති රහිතව නිදාන රහිතව, හෙතු රහිතව උපදින්නේය යන මේ කරුණ විද්‍යමාන නොවේ.

"හෙතෙම උපෙක්ඛින්ද්‍රියද දැනගනියි. උපෙක්ඛින්ද්‍රියට හෙතුවද දැනගනියි. උපෙක්ඛින්ද්‍රිය නිරොධයද දැනගනියි.

යම්තැනක උපන් උපෙක්ඛින්ද්‍රිය ඉතිරි නොවී නිරුද්ධවේද, එයද දැනගනියි. කොතැන්හි උපන් උපෙක්ඛින්ද්‍රියය ඉතිරි නොවී නිරුද්ධවේද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ සියලු ආකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරොධයට පැමිණ වාසය කරයි. මෙහි උපන් උපෙක්ඛින්ද්‍රියය ඉතිරි නොවී නිරුද්ධවේ.

"මහණෙනි, මේ භික්ෂුව උපෙක්ඛින්ද්‍රියයාගේ නිරොධය දැනගත්තේයයි ඒ සඳහා සිත එළවන්නේයයි කියනුලැබේ."

---

# 5. ජරා වර්ගය.

## 1. ජරාභිමද්දන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ පූර්වරාමයෙහි මිගාරමාතු ප්‍රාසාදයෙහි වැඩ සිටි සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි විවේකයෙන් නැඟී සිටියේ හිරු රැසින් පිට තවමින් බැස යන අව්වෙහි වැඩ සිටියේ වෙයි.

එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ භාග්‍යවතුන් වහන්සේගේ අත් පා අතින් පිරිමදිමින් භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. ස්වාමීනි, ආශ්චර්‍ය්‍යය. ස්වාමීනි, අද්භූතය.

3. "ස්වාමීනි, දැන් භාග්‍යවතුන් වහන්සේගේ ඡවිවර්ණය. පෙරමෙන් දැන් පිරිසිදුනැත. පැහැපත්නැත. සියලු ශරීර අවයව ලිහිල්ව රැලි නැඟී ඇත්තේය. සිරුර ඉදිරියට නැමී ගියේය, චක්ඛුන්ද්‍රිය, සොතින්ද්‍රිය, ඝානින්ද්‍රිය, ජිව්හින්ද්‍රිය, කායින්ද්‍රිය යන ඉන්ද්‍රියයන්ගේ වෙනස් බවක් දක්නා ලැබේ.

4. "ආනන්දය, යෞවන භාවයෙහි ජරා ස්වභාවයද නිරොගි බැව්හි ලෙඩවන ස්වභාවයද ජීවත්වීමෙහි මරණ ස්වභාවයද

මෙසේවෙයි. දැන් එපමණ ඡවිවර්ණය පිරිසිදු නැත. පැහැපත් නැත. සියලු ශරීර අවයව ලිහිල්ව රැලි නැඟී ඇත්තේය. කය ඉදිරියට නැමුණේය. චක්ඛුන්ද්‍රිය. සොතින්ද්‍රිය, ඝානින්ද්‍රිය, ජිව්හින්ද්‍රිය, කායින්ද්‍රිය යන ඉන්ද්‍රියයන්ගේ වෙනස් බවද දක්නා ලැබේ" භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. මෙය වදාරා නැවත මෙසේද වදාළහ.

"එපමණ සිත් අලවන ශරීරය ජරාව විසින් මඩන ලදී දුර්වර්ණ කරන ලාමක ජරාවට නින්දාවේවා.

"යමෙක් අවුරුදු සියයක් ජීවත්වේද, හෙතෙමේද මරණය කෙළවරකොට ඇත්තේය. මාරයා කිසිවකු අත් නොහරින්නේය. සියල්ලම මැඩ පවත්වන්නේය."

---

## 2. උණ්ණාභ සූත්‍රය.

1. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡේදය මෙනි.)

2. එකල්හි උණ්ණාභ බ්‍රාහ්මණතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය. සතුටුවිය යුතු සිහිකටයුතු කථාකොට නිමවා එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන් උණ්ණාභ බ්‍රාහ්මණතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය කීය.

3. "භවත් ගෞතමයන් වහන්ස, වෙන් වෙන් විෂය ඇත්තාවූ වෙන් වෙන් අරමුණු ඇත්තාවූ මේ පඤ්චෙන්ද්‍රියයෝ ඔවුනොවුන්ගේ විෂය අරමුණු අනුභව නොකෙරෙත්. කවර පසෙක්ද චක්ඛුන්ද්‍රිය, සොතින්ද්‍රිය, ඝානින්ද්‍රිය, ජිව්හාන්ද්‍රිය, කායින්ද්‍රිය යනුයි.

"භවත් ගෞතමයන්වහන්ස, නොයෙක් විෂය ඇත්තාවූ නොයෙක් අරමුණු ඇත්තාවූ ඔවුනොවුන්ගේ විෂය අරමුණු අනුභව නොකරන්නාවූ මේ පඤ්චෙන්ද්‍රියයන්ගේ පිහිට කුමක්ද? කවරෙක් ඔවුන්ගේ අරමුණු අනුභව කරයිද?

4. "බ්‍රාහ්මණය, නොයෙක් විෂය ඇත්තාවූ නොයෙක් අරමුණු ඇත්තාවූ ඔවුනොවුන්ගේ අරමුණු අනුභව නොකරන්නාවූ ඉන්ද්‍රියයෝ පසක් වෙත්. කවර පසෙක්ද? චක්ඛුන්ද්‍රිය සොතින්ද්‍රිය, ඝානින්ද්‍රිය, ජිව්හාන්ද්‍රිය, කායින්ද්‍රිය යනුයි. බ්‍රාහ්මණය, නොයෙක් විෂය ඇත්තාවූ නොයෙක් අරමුණු ඇත්තාවූ ඔවුනොවුන්ගේ අරමුණු අනුභව නොකරන්නාවූ පඤ්චෙන්ද්‍රියයන්ට සිත පිහිටය. සිතම ඔවුන්ගේ අරමුණු අනුභව කරයි.

5. "භවත් ගෞතමයන් වහන්ස, සිතට පිහිට කුමක්ද?"

"බ්‍රාහ්මණය, සිතට වනාහි සිහිය පිහිට වෙයි."

"භවත් ගෞතමයන් වහන්ස, මාර්ග සිහියට කුමක් පිහිට වෙයිද?"

"බ්‍රාහ්මණය, මාර්ග සිහියට අර්හත් ඵලය පිහිට වෙයි."

"භවත් ගෞතමයන් වහන්ස අර්හත් ඵලයට කුමක් පිහිටද?"

"බ්‍රාහ්මණය, අර්හත් ඵලයට නිර්වානය පිහිටයි."

"භවත් ගෞතමයන්වහන්ස, නිර්වාණයට පිහිට කුමක්ද?"

"බ්‍රාහ්මණය, ප්‍රශ්නය ඉක්මවා ගියේය. ප්‍රශ්නයාගේ කෙළවරට පැමිණීමට නොහැකිය."

"බ්‍රාහ්මණය, නිර්වාණයට ඇතුල්වන්නාවූ නිර්වාණය පිහිට කොට ඇත්තාවූ නිර්වාණය කෙළවර කොට ඇත්තාවූ මාර්ග බ්‍රාහ්මචය්‍ය්‍යාවෙහි වසන්නේය."

6. එකල්හි උණ්ණාභ බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුව අනුමෝදන්ව ආසනයෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ ගරුකොට ගියේය

7. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උණ්ණාභ බ්‍රාහ්මණයා ගිය නොබෝ වේලාවකින් භික්ෂූන් ඇමතූසේක.

"මහණෙනි, යම්සේ කුටාගාරයක හෝ කුටාගාර ශාලාවක හෝ උතුරු පෙරදිග (නිරිත) වා කවුලුවෙන් සූය්‍ය්‍යා නැගි

කල්හි වා කවුලුවෙන් රශ්මිය ඇතුල්ව කොහි පිහිටන්නේද?” “ස්වාමීනි බටහිර බිත්තියෙහිය.”

“මහණෙනි, එපරිද්දෙන්ම උණ්ණාභ බ්‍රාහ්මණයාගේ තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව බැසගත්තේය. මුල් හටගත්තේය. පිහිටියේය. දැඩිවිය. ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයෙහි කිසිවෙකු විසින් වෙනස් කළ නොහැකිය මහණෙනි, මේ කාලයෙහිම උණ්ණාභ බ්‍රාහ්මණයා කළුරිය කරන්නේ නම් යම් සංයෝජනයකින් යුක්තවූ උණ්ණාභ බ්‍රාහ්මණයා නැවත මේ ලෝකයට එන්නේද, ඔහුට ඒ සංයෝජන නැත.”

## 3. සාකේත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සාකෙත නුවර මිගදාය නම්වූ අඳුන්වනයෙහි වාසය කළසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක “මහණෙනි, යම් ක්‍රමයකින් පංච ඉන්ද්‍රියයෝ පංච බලයෝ වෙත්ද, පංච බලයෝ පංච ඉන්ද්‍රියයෝ වෙත්ද, එබඳු ක්‍රමයක් ඇත්තේද?”

“ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන්වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගෙන් අසා දරන්නාහුය.”

2. ‘මහණෙනි, යම් ක්‍රමයකින් පංච ඉන්ද්‍රියයෝ පංච බලයෝ වෙත්ද පංච බලයෝ පංච ඉන්ද්‍රියයෝ වෙත්ද, මහණෙනි, එබඳු ක්‍රමයක් ඇත. මහණෙනි, යම් ක්‍රමයකින් පංච ඉන්ද්‍රියයෝ පංච බලයෝ වෙත්ද පංච බලයෝ පංච ඉන්ද්‍රියයෝ වෙත්ද, මහණෙනි, ඒ ක්‍රමය කවරේද?

**3.** "මහණෙනි යමක් සද්ධින්ද්‍රිය වෙයිද, එය සද්ධා බලය වෙයි. යමක් සද්ධා බලයද වෙයිද, එය සද්ධා ඉන්ද්‍රිය වෙයි යමක් විරිය ඉන්ද්‍රිය වෙයිද, එය විරිය බලය වෙයි. යමක් විරිය බලය වෙයිද එය විරියින්ද්‍රිය වෙයි. යමක් සතින්ද්‍රිය වෙයිද, එය සති බලය වෙයි. යමක් සති බලය වෙයිද, එය සතින්ද්‍රිය වෙයි. යමක් සමාධින්ද්‍රිවේද එය සමාධි බලය වෙයි. යමක් සමාධි බලය වෙයිද, එය සමාධින්ද්‍රිය වෙයි. යමක් පඤ්ඤින්ද්‍රිය වෙයිද, එය පඤ්ඤා බලය වෙයි. යමක් පඤ්ඤා බලය වෙයිද, එය පඤ්ඤින්ද්‍රිය වෙයි.

**4.** "මහණෙනි, යම්සේ පෙරදිගට නැමුණාවූ පෙරදිගට බස්නාවූ පෙරදිගට ගලන්නාවූ ගඟක් වෙයිද ඒ ගඟ මැද දිවයිනක් වෙයිද මහණෙනි, යම් ක්‍රමයකින් ඒ ගඟ එකම ජල පහරක්යයි ව්‍යවහාරයටයයිද, මහණෙනි, එවැනි ක්‍රමයක්ද ඇත. යම් ක්‍රමයකින් ඒ ජල පහර දෙකකැයි ව්‍යවහාරයටයේද, මහණෙනි, එවැනි ක්‍රමයක්ද ඇත්තේය

**5.** "යම් ක්‍රමයකින් ඒ ගංගාවෙහි එකම ජල පහරකැයි ව්‍යවහාරයට යෙයිද මහණෙනි ඒ ක්‍රමය කවරේද? මහණෙනි, ඒ දිවයිනේ පෙර කෙළවර යම් ජලයක් වෙයිද පසු කෙළවරෙහි යම් ජලයක් වෙයිද, යම් ක්‍රමයක් නිසා මේ ජලය එකම ජල පහරකැයි ව්‍යවහාරයට යෙත්ද, මහණෙනි, මේ වනාහි එකම ජලපාරකියි ව්‍යවහාරයට යන ක්‍රමය වෙයි.

යම් ක්‍රමයකින් ඒ ගංගාවගේ ජලපහර දෙකකැයි ව්‍යවහාරයට යේද, මහණෙනි, ඒ ක්‍රමය කවරේද, මහණෙනි, ඒ ද්වීපයාගේ උතුරු පැත්තෙන් යම් ජලයක් වෙයිද, දකුණු පැත්තෙන් යම් ජලයක් වෙයිද, ඒ දිය පාරවල් දෙකකැයි යන ව්‍යවහාරයට පැමිණෙයි. මේ වනාහි ඒ දියපාරවල් දෙකකැයි ව්‍යවහාරවන ක්‍රමය වෙයි.

**6.** "මහණෙනි, යමක් සද්ධින්ද්‍රිය වෙයිද එය සද්ධා බලය වෙයි. යමක් සද්ධා බලය වෙයිද එය සද්ධින්ද්‍රිය වෙයි. යමක් විරියින්ද්‍රිය වෙයිද එය විරිය බලය වෙයි. යමක් විරිය බලය

වෙයිද එය විරින්ද්‍රිය වෙයි. යමක් සතින්ද්‍රිය වෙයිද එය සතිබලය වෙයි. යමක් සතිබලය වෙයිද එය සතින්ද්‍රිය වෙයි. යමක් සමාධින්ද්‍රිය වේද එය සමාධිබලය වෙයි. යමක් සමාධිබලය වෙයිද එය සමාධින්ද්‍රිය වෙයි. යමක් පඤ්ඤින්ද්‍රිය වෙයිද එය පඤ්ඤා බලය වෙයි. යමක් පඤ්ඤා බලය වෙයිද එය පඤ්ඤින්ද්‍රියයි.

7. "මහණෙනි, පංචෙන්ද්‍රියයන් වැඩීම හෙතුකාටගෙන බහුල කිරීම හෙතුකොටගෙන භික්ෂුව ආශ්‍රවයන්ගේ නැති කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත් ඵල සමාධියත් අර්හත් ඵල ප්‍රඥාවත් මේ අත්බැව්හිම තෙමේ විශෙෂඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරයි."

---

## 4. පුබ්බකොට්ඨක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර පුබ්බ කොට්ඨක නම් ස්ථානයෙහි වාසය කළ සේක. එකල්හි වනාහි භාග්‍යවතුන්වහන්සේ ආයුෂ්මත් සාරිපුත්ත ස්ථවිරයන් ඇමතූසේක.

2. "සාරිපුත්තය, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ සද්ධින්ද්‍රිය නිර්වාණයට ඇතුළත් කරන්නාවූ නිර්වාණය පහළ කරන්නාවූ නිර්වාණය නිෂ්ටාව කොට ඇත්තාවූ ධර්මයෙකැයි නුඹ අදහන්නෙහිද?

"සාරිපුත්තය, වඩනලද්දාවූ බහුලකරන ලද්දාවූ විරියින්ද්‍රිය නිර්වාණයට ඇතුළත් කරන්නාවූ නිර්වාණය පහළ කරන්නාවූ නිර්වාණය නිෂ්ටාව කොට ඇත්තාවූ ධර්මයෙකැයි නුඹ අදහන්නෙහිද?

"සාරිපුත්තය, වඩනලද්දාවූ බහුල කරන ලද්දාවූ සතින්ද්‍රිය නිර්වාණයට ඇතුළත් කරන්නාවූ නිර්වාණය පහළ කරන්නාවූ

නිර්වාණය නිෂ්ටාව කොට ඇත්තාවූ ධර්මයෙකැයි නුඹ අදහන්නෙහිද?

"සාරිපුත්තය, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ සමාධිඉන්ද්‍රිය නිර්වාණයට ඇතුළත් කරන්නාවූ නිර්වාණය පහළ කරන්නාවූ නිර්වාණය නිෂ්ටාව කොට ඇත්තාවූ ධර්මයෙකැයි නුඹ අදහන්නෙහිද?

"සාරිපුත්තය, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ පඤ්ඤින්ද්‍රිය නිර්වාණයට ඇතුළත් කරන්නාවූ නිර්වාණය පහළ කරන්නාවූ නිර්වාණය නිෂ්ටාව කොට ඇත්තාවූ ධර්මයෙකැයි නුඹ අදහන්නෙහිද?"

3. "ස්වාමීනි, වඩනලද්දාවූ බහුල කරන ලද්දාවූ සද්ධින්ද්‍රිය නිර්වාණයට ඇතුළත් කරන්නාවූ නිර්වාණය පහළ කරන්නාවූ නිර්වාණය නිෂ්ටාව කොට ඇත්තාවූ ධර්මයෙකැයි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් මම නොඅදහමි.

"වඩනලද්දාවූ බහුල කරන ලද්දාවූ විරියින්ද්‍රිය නිර්වාණයට ඇතුළත් කරන්නාවූ නිර්වාණය පහළ කරන්නාවූ නිර්වාණය නිෂ්ටාව කොට ඇත්තාවූ ධර්මයෙකැයි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් මම නොඅදහමි.

"වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ සතින්ද්‍රිය නිර්වාණයට ඇතුළත් කරන්නාවූ නිර්වාණය පහළ කරන්නාවූ නිර්වාණය නිෂ්ටාව කොට ඇත්තාවූ ධර්මයෙකැයි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් මම නොඅදහමි.

'වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ සමාධින්ද්‍රිය නිර්වාණයට ඇතුළත් කරන්නාවූ නිර්වාණය පහළ කරන්නාවූ නිර්වාණය නිෂ්ටාව කොට ඇත්තාවූ ධර්මයෙකැයි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් මම නොඅදහමි.

"වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ පඤ්ඤින්ද්‍රිය නිර්වාණයට ඇතුළත් කරන්නාවූ නිර්වාණය පහළ කරන්නාවූ නිර්වාණය නිෂ්ටාව කොට ඇත්තාවූ ධර්මයෙකැයි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් මම නොඅදහමි.

4. 'ස්වාමීනි, යමෙකු විසින් එය නොදන්නා ලද්දේද නොදක්නා ලද්දේද ප්‍රකට නොකරන ලද්දේද නුවණින් ප්‍රත්‍යක්ෂ නොකරන ලද්දේද ඔව්හු එහි අනුන් කෙරෙහි විශ්වාසයෙන් වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ සද්ධින්ද්‍රිය නිවනට ඇතුල් කරන්නාවූ නිවන පහළ කරන්නාවූ නිවන නිෂ්ටාව කොට ඇත්තාවූ ධර්මයෙකැයි අදහන්නාහුය.

"වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ විරියින්ද්‍රිය නිවනට ඇතුල් කරන්නාවූ නිවන පහළ කරන්නාවූ නිවන නිෂ්ටාව කොට ඇත්තාවූ ධර්මයෙකැයි අදහන්නාහුය.

"වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ සතින්ද්‍රිය නිවනට ඇතුල් කරන්නාවූ නිවන පහළ කරන්නාවූ නිවන නිෂ්ටාව කොට ඇත්තාවූ ධර්මයෙකැයි අදහන්නාහුය.

"වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ සමාධින්ද්‍රිය නිවනට ඇතුල් කරන්නාවූ නිවන පහළ කරන්නාවූ නිවන නිෂ්ටාව කොට ඇත්තාවූ ධර්මයෙකැයි අදහන්නාහුය.

"වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ පඤ්ඤින්ද්‍රිය නිවනට ඇතුල් කරන්නාවූ නිවන පහළ කරන්නාවූ නිවන නිෂ්ටාව කොට ඇත්තාවූ ධර්මයෙකැයි අදහන්නාහුය.

5. "ස්වාමීනි, යමෙකු විසින් එය දන්නා ලද්දේද, දක්නා ලද්දේද, ප්‍රකට කරන ලද්දේද, ප්‍රත්‍යක්ෂ කරන ලද්දේද, ඔව්හු එහි සැක නැත්තාහු, පහවූ විචිකිච්ඡා ඇත්තාහු, වඩන ලද්දාවූ බහුල වසයෙන් වඩන ලද්දාවූ සද්ධින්ද්‍රිය නිර්වාණයට ඇතුළත් වන්නාවූ, නිර්වාණය පහළ කරන්නාවූ නිර්වාණය නිෂ්ටාවකොට ඇත්තේ වෙයි.

"වඩනලද්දාවූ බහුල වසයෙන් වඩන ලද්දාවූ විරියින්ද්‍රිය නිර්වාණයට ඇතුළත් වන්නාවූ නිර්වාණය පහළ කරන්නාවූ නිර්වාණය නිෂ්ටාවකොට ඇත්තේ වෙයි.

"වඩන ලද්දාවූ බහුල වසයෙන් වඩන ලද්දාවූ සතින්ද්‍රිය නිර්වාණයට ඇතුළත් වන්නාවූ නිර්වාණය පහළ වන්නාවූ නිර්වාණය නිෂ්ටාවකොට ඇත්තේ වෙයි.

"වඩනලද්දාවූ බහුල වසයෙන් වඩන ලද්දාවූ සමාධින්ද්‍රිය නිර්වාණයට ඇතුළත් වන්නාවූ නිර්වාණය පහළ කරන්නාවූ නිර්වාණය නිෂ්ටාවකොට ඇත්තේ වෙයි

"වඩනලද්දාවූ බහුලවසයෙන් වඩන ලද්දාවූ පඤ්ඤින්ද්‍රිය නිර්වාණයට ඇතුළත් වන්නාවූ නිර්වාණය පහළකරන්නාවූ නිර්වාණය නිෂ්ටාවකොට ඇත්තේ වෙයි.

**6** 'ස්වාමීනි, මෙය මා විසින් ප්‍රඥාවෙන් දැනගන්නා ලද්දේය. දක්නාලද්දේය. ප්‍රකටකරන ලද්දේය ප්‍රත්‍යක්ෂකරන ලද්දේය. වඩනලද්දාවූ බහුලකොට වඩනලද්දාවූ සද්ධින්ද්‍රිය නිර්වාණයට ඇතුළත් කරන්නාවූ නිර්වාණය පහළකරන්නාවූ නිර්වාණය නිෂ්ටාවකොට ඇත්තේ වෙයි. මම සැක නැත්තේ විචිකිච්ඡා නැත්තේ වෙමි.

"වඩන ලද්දාවූ බහුලකොට වඩන ලද්දාවූ විරියින්ද්‍රිය නිර්වාණයට ඇතුළත් කරන්නාවූ නිර්වාණය පහළ කරන්නාවූ නිර්වාණය නිෂ්ටාවකොට ඇත්තේ වෙයි. එහි මම සැක නැත්තේ විචිකිච්ඡා නැත්තේ වෙමි.

"වඩනලද්දාවූ බහුලකොට වඩනලද්දාවූ සතින්ද්‍රිය නිර්වාණයට ඇතුළත් කරන්නාවූ නිර්වාණය පහළකරන්නාවූ නිර්වාණය නිෂ්ටාවකොට ඇත්තේ වෙයි. එහි මම සැක නැත්තේ විචිකිච්ඡා නැත්තේ වෙමි.

"වඩන ලද්දාවූ බහුලකොට වඩනලද්දාවූ සමාධින්ද්‍රිය නිර්වාණයට ඇතුළත් කරන්නාවූ නිර්වාණය පහළකරන්නාවූ නිර්වාණය නිෂ්ටාවකොට ඇත්තේ වෙයි. එහි මම සැක නැත්තේ විචිකිච්ඡා නැත්තේ වෙමි.

"වඩනලද්දාවූ බහුල වශයෙන් වඩන ලද්දාවූ පඤ්ඤින්ද්‍රිය නිර්වාණයට ඇතුළත්කරන්නාවූ නිර්වාණය පහළකරන්නාවූ නිර්වාණය නිෂ්ටාවකොට ඇත්තේයයි මම සැක නොකරමි. විචිකිච්ඡා රහිතවෙමියි" කීය.

"සාරිපුත්තය, යහපත' යහපත' සාරිපුත්තය, වඩන ලද්දාවූ බහුලවසයෙන් වඩනලද්දාවූ සද්ධින්ද්‍රිය නිර්වාණයට ඇතුළත්

කරන්නේ වෙයි. නිර්වාණය පහළ කරන්නේ වෙයි. නිර්වාණය නිෂ්ටාවකොට ඇත්තේවේයයි යමෙකුන් විසින් ප්‍රඥාවෙන් නොදැනගන්නා ලද්දේද,

'වඩන ලද්දාවූ බහුලවශයෙන් වඩනලද්දාවූ විරියින්ද්‍රිය නිර්වාණයට ඇතුළත් කරන්නේ වෙයි. නිර්වාණය පහළ කරන්නේ වෙයි. නිර්වාණය නිෂ්ටාවකොට ඇත්තේ වේයයි යමෙකු විසින් ප්‍රඥාවෙන් නොදැනගන්නා ලද්දේද,

"වඩනලද්දාවූ බහුලවශයෙන් වඩනලද්දාවූ සතින්ද්‍රිය නිර්වාණයට ඇතුළත්කරන්නේ වෙයි. නිර්වාණය පහළකරන්නේ වෙයි නිර්වාණය නිෂ්ටාවකොට ඇත්තේ වේයයි යමෙකුන් විසින් ප්‍රඥාවෙන් නොදැනගන්නා ලද්දේද,

'වඩනලද්දාවූ බහුලවශයෙන් වඩනලද්දාවූ සමාධින්ද්‍රිය නිර්වාණයට ඇතුළත්කරන්නේ වෙයි. නිර්වාණය පහළකරන්නේ වෙයි නිර්වාණය නිෂ්ටාවකොට ඇත්තේවේයයි යමෙකු විසින් ප්‍රඥාවෙන් නොදැනගන්නා ලද්දේද,

'වඩනලද්දාවූ බහුලවශයෙන් වඩනලද්දාවූ පඤ්ඤින්ද්‍රිය ඇතුළත්කරන්නේවෙයි. නිර්වාණය පහළකරන්නේ වෙයි. නිර්වාණය නිෂ්ටාවකොට ඇත්තේවේයයි නුවණින් නොදන්නා ලද්දේද නොදක්නාලද්දේද ප්‍රකට නොකරනලද්දේද ප්‍රත්‍යක්ෂ නොකරනලද්දේද ඔව්හු එහි අනුන් කෙරෙහි ඇදහීමට යන්නාහුය.

8. "සාරිපුත්තය, වඩන ලද්දාවූ බහුල වශයෙන් වඩන ලද්දාවූ සද්ධින්ද්‍රිය නිර්වාණයට ඇතුළත් කරන්නේ වෙයි. නිර්වාණය පහළ කරන්නේ වෙයි. නිර්වාණය නිෂ්ටාවකොට ඇත්තේ වෙයි.

"වඩනලද්දාවූ බහුල වශයෙන් වඩන ලද්දාවූ විරියින්ද්‍රිය නිර්වාණයට ඇතුළත් කරන්නේ වෙයි. නිර්වාණය පහළ කරන්නේ වෙයි නිර්වාණය නිෂ්ටාවකොට ඇත්තේ වෙයි.

"වඩනලද්දාවූ බහුලවශයෙන් වඩනලද්දාවූ සතින්ද්‍රිය නිර්වාණයට ඇතුළත් කරන්නේවෙයි. නිර්වාණය පහළ කරන්නේවෙයි. නිර්වාණය නිෂ්ටාවකොට ඇත්තේවෙයි.

"වඩන ලද්දාවූ බහුල වශයෙන් කරන ලද්දාවූ සමාධින්ද්‍රිය නිර්වාණයට ඇතුළත් කරන්නේ වෙයි. නිර්වාණය පහළ කරන්නේ වෙයි. නිර්වාණය නිෂ්ටාව කොට ඇත්තේ වෙයි.

"වඩනලද්දාවූ බහුල වශයෙන් වඩනලද්දාවූ පඤ්ඤින්ද්‍රිය නිර්වාණයට ඇතුල්කරන්නේ වෙයි. නිර්වාණය පහළ කරන්නේ වෙයි. නිර්වාණය නිෂ්ටාවකොට ඇත්තේවෙයි යමෙකුන් විසින් නුවණින් දැනගන්නාලද්දේද දක්නාලද්දේද ප්‍රත්‍යක්ෂ කරනලද්දේද ඔව්හු එහි සැක නොකරන්නාහුය. විචිකිච්ඡා රහිත වන්නාහුය"

---

## 5. පුබ්බාරාම එකින්ද්‍රිය සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර පූර්වාරාමයෙහි මිගාරමාතු ප්‍රාසාදයෙහි වැඩ සිටිසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට 'මහණෙනියි' කියා ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. 'මහණෙනි, කෙතෙක් ඉන්ද්‍රියයන් වැඩීමෙන් බහුල කිරීමෙන් ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම 'ජාතියක්ෂය විය. බඹසරවැස නිමවනලදී. කළයුත්ත කරනලදී. මෙයින් අනික් භවයක් නැතැයි දන්නෙමියි' රහත්බව ප්‍රකාශකරයිද?"

'ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහුය භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන්වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගෙන් අසා දරන්නාහුය"

3. "මහණෙනි, එක් ඉන්ද්‍රියක් වැඩීමෙන් බහුල කිරීමෙන් ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම 'ජාතිය ක්ෂයවිය, බඹසර වැස නිමවනලදී.

කළයුත්ත කරනලදී මෙයින් පසු අනික් භවයක් නැතැයි දන්නෙමියි' රහත්බව ප්‍රකාශකරයි. කවර එක් ඉන්ද්‍රියයද? පඤ්ඤින්ද්‍රියයාගේ (ඉන්ද්‍රිය) මහණෙනි, ප්‍රඥාවත් ආර්‍ය්‍ය ශ්‍රාවකයාට ඊට අනුව ශ්‍රද්ධාව පිහිටයි. ඊට අනුව වීර්‍ය්‍යය පිහිටයි. ඊට අනුව සිහිය පිහිටයි. ඊට අනුව සමාධිය පිහිටයි.

4. "මහණෙනි, මේ එක ඉන්ද්‍රියයක්හුගේ වැඩීමෙන් බහුල වසයෙන් වැඩීමෙන් ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම 'ජාතිය ක්ෂයවිය බඹසර වැස නිමවනලදි. කළයුත්ත කරණලදී. මෙයින් පසු අනික් භවයක් නැතැයි දන්නෙමියි' රහත්බව ප්‍රකාශ කරයි.

---

## 6. පුබ්බාරාම ද්වින්ද්‍රිය සූත්‍රය.

1. (මේ ඡෙදය මේ වර්ගයෙ 5 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡෙදය මෙනි.)

2. "මහණෙනි, කොපමණ ඉන්ද්‍රියයන්ගේ වැඩීමෙන් බහුල කිරීමෙන් භික්ෂුතෙම 'ජාතිය ක්ෂයවිය. බඹසර වැස නිමවන ලදී. කළයුත්ත කරන ලදී. මෙයින් අනිත් ආත්මභාවයක්නැතැයි දන්නෙමියි' රහත්බව ප්‍රකාශ කරයිද?"

ස්වාමීනි, ධර්මය භාග්‍යවතුන් වහන්සේ මුල්කොටමැයි. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගෙන් අසා දරන්නාහුය.

3. "මහණෙනි, ඉන්ද්‍රියයන් දෙදෙනෙකුන්ගේ වැඩීමෙන් බහුල කිරීමෙන් ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම 'ජාතිය ක්ෂයවිය. බඹසර වැස නිමවන ලදී. කළයුත්ත කරන ලදී, මෙයින් අනික් භවයක් නැතැයි දන්නෙමියි' රහත්බව ප්‍රකාශ කරයි. කවර දෙදෙනෙකුන්ගේද යත්. අර්හත් මාර්ග ප්‍රඥාවගේ හා අර්හත් මාර්ග සමාධියේය.

4. "මහණෙනි, යම් මාර්ග ප්‍රඥාවක් ඇත්ද? එය ඔහුගේ පඤ්ඤින්ද්‍රියයි. මහණෙනි, යම් මාර්ග සමාධියක් ඇත්ද? එය ඔහුගේ සමාධින්ද්‍රිය වෙයි. මහණෙනි, මේ ඉන්ද්‍රියයන් දෙදෙන වැඩීමෙන් බහුල කිරීමෙන් ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම 'ජාතිය ක්ෂයවිය. බඹසර වැස නිමවන ලදී. කළයුත්ත කරන ලදී, මෙයින් අනික් භවයක් නැතැයි දන්නෙමියි' රහත්බව ප්‍රකාශ කරයි.

---

## 7. පුබ්බාරාම චතුරින්ද්‍රිය සූත්‍රය.

1. (මේ ඡේදය මේ වර්ගයෙ 5 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡේදය මෙනි.)

2. "මහණෙනි, කොපමණ ඉන්ද්‍රියයන්ගේ වැඩීමෙන් ක්ෂීණාශ්‍රව තෙමේ 'ජාතිය ක්ෂයවිය. බඹසර වැස නිමවන ලදී. කළයුත්ත කරන ලදී. මෙයින් අනිත් භවයක් නැතැයි දන්නෙමියි' රහත්බව ප්‍රකාශ කරයිද?"

ස්වාමීනි, ධර්මය භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගෙන් අසා දන්නාහුය.

3. "මහණෙනි, ඉන්ද්‍රියයන් සතර දෙනෙකුන්ගේ වැඩීමෙන් බහුල කිරීමෙන් ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම 'ජාතිය ක්ෂයවිය. බඹසර වැස නිමවන ලදී. කළයුත්ත කරන ලදී, මෙයින් අනික් භවයක් නැතැයි දන්නෙමියි' රහත්බව ප්‍රකාශ කරයි.

"කවර සතරක්හුගේද යත්. විරියින්ද්‍රියයගේද, සතින්ද්‍රියයගේද, සමාධින්ද්‍රියයගේද, පඤ්ඤින්ද්‍රියයගේද වෙයි.

4. "මහණෙනි, මේ සතර ඉන්ද්‍රියයන්ගේ වැඩීමෙන් බහුල කිරීමෙන් ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම 'ජාතිය ක්ෂයවිය. බඹසර වැස

නිමවන ලදී. කළයුත්ත කරන ලදී. මෙයින් අනිත් භවයක් නැතැයි දන්නෙමියි' රහත්බව ප්‍රකාශ කරයි."

---

## 8. පුබ්බාරාම පඤ්චින්ද්‍රිය සූත්‍රය.

1. (මේ ඡේදය මේ වර්ගයේ 5 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡේදය මෙනි)

2 "මහණෙනි, කොපමණ ඉන්ද්‍රියයන්ගේ වැඩීමෙන් බහුල කිරීමෙන් ක්ෂීණාශ්‍රව තෙම 'ජාතිය ක්ෂයවිය. බඹසර වැස නිමවන ලදී. කළයුත්ත කරන ලදී. මෙයින් අනිත් භවයක් නැතැයි දන්නෙමියි' රහත්බව ප්‍රකාශ කරයිද,

"ස්වාමීනි, ධර්මය භාග්‍යවතුන්වහන්සේ මුල්කොටම පවතී. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නාකොට ඇත්තාහුය. භාග්‍යවතුන්වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගෙන් අසා දරන්නාහුය.

3 "මහණෙනි, ඉන්ද්‍රියයන් පස් දෙනෙකුන්ගේ වැඩීමෙන් බහුල කිරීමෙන් ක්ෂිණාශ්‍රව භික්ෂුතෙම 'ජාතිය ක්ෂය විය. බඹසර වැස නිමවන ලදී. කළයුත්ත කරන ලදී. මෙයින් අනිත් භවයක් නැතැයි දන්නෙමියි' රහත්බව ප්‍රකාශ කරයි කවර පසක්හුගේද යත්. සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යන ඉන්ද්‍රියයන්ගේය.

4. "මහණෙනි, මේ පඤ්චෙන්ද්‍රියන්ගේ වැඩීමෙන් බහුල කිරීමෙන් ක්ෂීණාශ්‍රව තෙමේ 'ජාතිය ක්ෂයවිය. බඹසර වැස නිමවන ලදී. කළයුත්ත කරන ලදී. මෙයින් අනිත් භවයක් නැතැයි දනිමියි' රහත්බව ප්‍රකාශ කරයි."

---

## 9. පිණ්ඩොල භාරද්වාජ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවර ඝොසිතාරාමයෙහි වැඩ සිටසේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් පිණ්ඩොලභාරද්වාජ තෙරුන් විසින් 'ජාතිය ක්ෂයවිය. බඹසර වැස නිම වන ලදී. මෙයින් අනිත් භවයක් නැතැයි දනිමියි' රහත්බව ප්‍රකාශ කරන ලද්දේ වෙයි.

2. එකල්හි භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය කීවාහුය. "ස්වාමීනි, ආයුෂ්මත් පිණ්ඩොල භාරද්වාජ තෙරුන් විසින් 'ජාතිය ක්ෂයවිය. බඹසර වැස නිමවන ලදී. කළයුත්ත කරන ලදී. මෙයින් අනිත් භවයක් නැතැයි දනිමියි' රහත්බව ප්‍රකාශ කරන ලදී.

"කිමෙක්ද ස්වාමීනි, කිනම් අර්ථයක් දක්නාවූ ආයුෂ්මත් පිණ්ඩොල භාරද්වාජ තෙරුන් විසින් 'ජාතිය ක්ෂයවිය. බඹසර වැස නිමවනලදී. කළයුත්ත කරන ලදී. මෙයින් අනිත් භවයක් නැතැයි දනිමියි' රහත්බව ප්‍රකාශ කරන ලද්දේද?"

3. "මහණෙනි, ඉන්ද්‍රියන් තුනක් වැඩීමෙන් බහුල කිරීමෙන් පිණ්ඩොල භාරද්වාජයන් විසින් 'ජාතිය ක්ෂයවිය බඹසර වැස නිමවන ලදී. කළයුත්ත කරන ලදී. මෙයින් අනිත් භවයක් නැතැයි දන්නෙමියි' රහත්බව ප්‍රකාශ කරන ලදී. කවර තිදෙනෙකුන්ගේද යත්. සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යන තිදෙනාගේය.

4. "මහණෙනි, පිණ්ඩොල භාරද්වාජ භික්ෂුව විසින් මේ ඉන්ද්‍රියයන් තිදෙන වැඩීමෙන් බහුල කිරීමෙන් 'ජාතිය ක්ෂය විය, බඹසර වැස නිමවන ලදී. කලයුත්ත කරන ලදී. මෙයින් අනිත් භවයක් නැතැයි දන්නෙමියි' රහත්බව ප්‍රකාශ කරන ලදී.

5. "මහණෙනි, මේ තුන් ඉන්ද්‍රියයෝ කුමක් කෙළවර කොට ඇත්තාහුද? ක්ෂය කිරීම කෙළවර කොට ඇත්තාහුය. කවරක්හුගේ ක්ෂය කිරීම කෙළවරකොට ඇත්තාහුද? ජාති ජරා, මරණයන්ගේය.

"මහණෙනි, ජාති, ජරා, මරණ ක්ෂයවීයයි දක්නාවූ පිණ්ඩොල භාරද්වාජ භික්ෂුව විසින් 'ජාතිය ක්ෂයවිය. බඹසර වැස නිමවන ලදී. කළයුත්ත කරන ලදී. මෙයින් අනිත් භවයක් නැතැයි දන්නෙමියි' රහත්බව ප්‍රකාශ කරන ලදැයි" වදාළේය.

---

## 10. ආපණ නිගම (හෝ සද්ධ) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ අංග ජනපදයෙහි ආපන නම්වූ අංග වාසීන්ගේ නියම්ගම වාසය කළසේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ශාරිපුත්ත ස්ථවිරයන්ට ඇමතූ සේක. 'ශාරිපුත්තය, තථාගතයන් වහන්සේ කෙරෙහි ඒකාන්තයෙන් පැමිණියාවූ විශෙෂයෙන් පැහැදුණාවූ යම් ආය්‍ය්‍ය ශ්‍රාවකයෙක්වේද, හෙතෙමේ තථාගතයන් වහන්සේ කෙරෙහි හෝ තථාගත ශාසනය කෙරෙහි හෝ සැක කරයිද විචිකිච්ඡා කරයිද?"

2. "ස්වාමීනි, තථාගතයන් වහන්සේ කෙරෙහි එකාන්තයෙන් පැමිණියාවූ විශෙෂයෙන් පැහැදුණාවූ යම් ආය්‍ය්‍යශ්‍රාවකයෙක් වෙයිද, හෙතෙම තථාගතයන් වහන්සේ කෙරෙහි හෝ තථාගත ශාසනය කෙරෙහි හෝ සැක නොකරන්නේය. විචිකිච්ඡා නොකරන්නේය.

3. "ස්වාමීනි, ශ්‍රද්ධාවෙන් යුත් ආය්‍ය්‍යශ්‍රාවකයා හට අකුසල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුසල ධර්මයන්ගේ වැඩීම පිණිස වීය්‍ය්‍යය ඇතිව දැඩි උත්සාහ ඇතිව කුසල ධර්මයන්හි බහා නොතැබූ බර ඇතිව පටන් ගන්නා ලද වීය්‍ය්‍ය ඇතිව වාසය කරන්නේය යන මෙය කැමති විය යුතුයි. ස්වාමීනි, ඔහුගේ යම් වීය්‍ය්‍යයක් වීද, ඔහුගේ විරින්ද්‍රියය වෙයි.

4. "ස්වාමීනි, ශ්‍රාද්ධාවත් ආය්‍ය්‍යශ්‍රාවකයා හට සිහි ඇත්තෙක් වන්නේය. උතුම්වූ සිහි නුවණින් යුක්තවූයේ බොහෝ පෙර කරන ලද බොහෝ පෙර කියන ලද දේ සිහිකරන්නෙක් වන්නේය යන මෙය කැමති විය යුතුයි ස්වාමීනි, ඔහුගේ යම්

සිහියක් වේද, එය ඔහුගේ සතින්ද්‍රියයි. ස්වාමීනි, ශ්‍රද්ධාවෙන් යුත් පටන්ගත් වීර්‍ය්‍ය ඇති එළඹ සිටි සිහියෙන් යුත් ආර්‍ය්‍යශ්‍රාවකයා හට නිවන් අරමුණුකොට පවත්නා සමාධිය ලබන්නේය. සිතේ එකඟකම ලබන්නේය යන මෙය කැමැති වියයුතුයි. ස්වාමීනි, ඔහුගේ යම් සමාධියක් වීද එය ඔහුගේ සමාධින්ද්‍රියයි

5. "ස්වාමීනි, ශ්‍රද්ධාවෙන් යුත් පටන් ගන්නා ලද වීර්‍ය්‍ය ඇති එළඹ සිටි සමාධිය ඇති ආර්‍ය්‍යශ්‍රාවකයා හට සංසාරය නොදතහැකි කෙළවර ඇත්තේය. පූර්ව කෙළවරක් නොපෙනේ. අවිද්‍යාවෙන් වැසී තණ්හාවෙන් බැඳී සැරිසරන්නාවූ සත්වයන්ගේ අවිද්‍යාවයයි කියන ලද අන්ධකාර සමූහයාගේ යම් ඉතිරිනොකොට නිරුද්ධ කිරීමක් වෙද මෙය ශාන්තපදය වෙයි. ප්‍රණීත පදය වෙයි. සියලු සංස්කාරයන්ගේ සංසිඳීම වෙයි. සියලු උපධීන්ගේ දුරුකිරීම වෙයි තෘෂ්ණාව ක්ෂය කළ නොඇලීමවූ නිරොධයවූ නිර්වාණයයි, දැනගන්නේය යන මෙය කැමති විය යුතුයි. ස්වාමීනි, ඔහුගේ යම් ප්‍රඥාවක් වේද එය ඔහුගේ පඤ්ඤින්ද්‍රිය වෙයි. ස්වාමීනි, ඒ ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ මෙසේ වීර්‍ය්‍ය කොට වීර්‍ය්‍ය කොට සිහිකොට සිහිකොට සමාධියට පැමිණ සමාධියට පැමිණ නුවණින් දැන දැන මා විසින් මේ ධර්මයෝ පෙර අසන ලද්දාහුමය. ඒ ධර්මයෝ දැන් වර්තමාන කයින් ස්පර්ශකොට වාසය කරමි. ප්‍රඥාවෙන්ද අවබොධ කොට දකිමියි මෙසේ අදහන්නේය. ස්වාමීනි, ඔහුගේ යම් ශ්‍රද්ධාවක් වීද එයම ඔහුගේ සද්ධින්ද්‍රියයි'

6. "සාරිපුත්තය, යහපති, යහපති, සාරිපුත්තය, තථාගතයන් වහන්සේ වෙත එකාන්තයෙන් පැමිණියාවූ විශෙෂයෙන් පැහැදුණාවූ යම් මේ ආර්‍ය්‍යශ්‍රාවකයෙක් වේද, හෙතෙම තථාගතයන් වහන්සේ කෙරෙහි හෝ තථාගත ශාසනය කෙරෙහි හෝ සැකයක් හෝ විචිකිච්ඡාවක් නොකරයි.

7. "සාරිපුත්තය, ශ්‍රද්ධාවෙන් යුත් ආර්‍ය්‍යශ්‍රාවකයා හට අකුසල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කුසල ධර්මයන්ගේ වැඩීම පිණිස වීර්‍ය්‍යය ඇතිව දැඩි උත්සාහ ඇතිව කුසල ධර්මයන්හි බහානොතැබූ බර ඇතිව පටන් ගන්නා ලද වීර්‍ය්‍ය ඇතිව වාසය

කරන්නේය යන මෙය කැමති විය යුතුයි. සාරිපුත්තය, ඔහුගේ යම් වීර්‍ය්‍යයක් වීද, ඔහුගේ විරින්ද්‍රියය වෙයි.

8. 'සාරිපුත්තය, ශ්‍රද්ධාවත් ආර්‍ය්‍යශ්‍රාවකයා හට සිහි ඇත්තෙක් වන්නේය. උතුම්වූ සිහි නුවණින් යුක්තවූයේ බොහෝ පෙර කරන ලද බොහෝ පෙර කියන ලද දේ සිහිකරන්නෙක් වන්නේය යන මෙය කැමති විය යුතුයි. සාරිපුත්තය, ඔහුගේ යම් සිහියක් වේද, එය ඔහුගේ සතින්ද්‍රියයි. සාරිපුත්තය, ශ්‍රද්ධාවෙන් යුත් පටන් ගත් වීර්‍ය්‍ය ඇති එළඹ සිටි සිහියෙන් යුත් ආර්‍ය්‍යශ්‍රාවකයා හට නිවන් අරමුණු කොට පවත්නා සමාධිය ලබන්නේය. සිතේ එකඟකම ලබන්නේය යන මෙය කැමති විය යුතුයි. සාරිපුත්තය, ඔහුගේ යම් සමාධියක් වීද එය ඔහුගේ සමාධින්ද්‍රියයි.

9. "සාරිපුත්තය, ශ්‍රද්ධාවෙන් යුත් පටන් ගන්නා ලද වීර්‍ය්‍ය ඇත එළඹ සිටි සමාධිය ඇති ආර්‍ය්‍යශ්‍රාවකයා හට සංසාරය නොදතහැකි කෙළවර ඇත්තේය. පූර්ව කෙළවරක් නොපෙනේ. අවිද්‍යාවෙන් වැසී තණ්හාවෙන් බැඳී සැරිසරන්නාවූ සත්වයන්ගේ අවිද්‍යාව යයි කියන ලද අන්ධකාර සමූහයාගේ යම් ඉතිරි නොකොට නිරුද්ධ කිරීමක් වේද, මෙය ශාන්ත පදය වෙයි. ප්‍රණීත පදය වෙයි. සියලු සංස්කාරයන්ගේ සංසිඳීම වෙයි. සියලු උපධින්ගේ දුරුකිරීම වෙයි. තෘෂ්ණාව ක්ෂය කළ නොඇලීමවූ නිරොධයවූ නිර්වාණයයි, දැනගන්නේය යන මෙය කැමති වියයුතුයි. සාරිපුත්තය, ඔහුගේ යම් ප්‍රඥාවක් වේද එය ඔහුගේ පඤ්ඤින්ද්‍රියවෙයි. සාරිපුත්තය, ඒ ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ මෙසේ වීර්‍ය්‍යකොට වීර්‍ය්‍යකොට, සිහිකොට සිහිකොට, සමාධියට පැමිණ, සමාධියට පැමිණ, නුවණින් දැන දැන 'ඒ මේ ධර්මයෝ මා විසින් දැන් වර්තමාන කයින් ස්පර්ශකොට වාසය කරමි. ප්‍රඥාවෙන්ද අවබොධකොට දකිමියි' අදහයි. සාරිපුත්තය, ඔහුගේ යම් ශ්‍රද්ධාවක් වීද, එයම ඔහුගේ සද්ධින්ද්‍රිය වන්නේයයි" වදාළේය.

---

# 6. ජටිඨ වර්ගය.

## 1. සාලාගාම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසොල් රට සාලානම් බමුණු ගම වාසය කළසේක එහිදී වනාහි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි, කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. 'මහණෙනි, යම්සේ යම් ඒ තිරිසන්ගත සත්වයෝ වෙත්ද, ඔවුන්ගෙන් සිංහ මෘග රාජතෙමේ යම් බලයෙන් වේගයෙන් සූරකමින් අග්‍රවේද, මහණෙනි, එපරිද්දෙන් යම් බොධිපාක්ෂික ධර්මයෝ වෙත්ද, ඔවුන්ගෙන් අවබෝධයෙන් පඤ්ඤින්ද්‍රිය අග්‍රවේ.

3. "මහණෙනි. බොධිපාක්ෂික ධර්මයෝ කවරේද? මහණෙනි, සද්ධින්ද්‍රිය, බොධිපාක්ෂික ධර්මයකි එය අවබොධය පිණිස පවතී. විරියින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයකි එය අවබොධය පිණිස පවතී. සතින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයකි. එය අවබොධ පිණිස පවතී. සමාධින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයකි. එය අවබොධය පිණිස පවතී. පඤ්ඤින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයකි. එය අවබොධය පිණිස පවති.

4. "මහණෙනි, යම්සේ තිරිසන් ගත සත්වයෝ වෙත්ද, ඔවුන්ගෙන් සිංහරාජ තෙමේ බලයෙන් වේගයෙන් සූරකමින් අග්‍රවෙයි. මහණෙනි, එපරිද්දෙන් යම් ඒ බොධිපාක්ෂික ධර්මයෝ වෙත්ද, යම් ඒ අවබොධයෙන් පඤ්ඤින්ද්‍රියය ඔවුන්ගෙන් අග්‍රවේ."

---

## 2. මල්ලක නිගම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ උරුවෙල කප්පනම්වූ මල්ලයන්ගේ නියම් ගම වාසය

කළ සේක. එහිදී වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ඇමතූසේක. 'මහණෙනි, යම්තාක් ආයසීශ්‍රාවකයාගේ ආයසීඥානය නූපන්නේ වේද, ඒතාක් සතර ඉන්ද්‍රියයන්ගේ මනා පිහිටීමක් නොවෙයි. ඒතාක් සතර ඉන්ද්‍රියයන්ගේ පැවැත්මක් නොවෙන්නේයි

2 "මහණෙනි, යම් කලෙක වනාහි ආයසීශ්‍රාවකයාගේ ආයසීඥානය උපන්නේ වෙයිද, එකල්හි සතර ඉන්ද්‍රියයන්ගේ මනා පිහිටීම වෙයි. එකල්හි සතර ඉන්ද්‍රියයන්ගේ පැවැත්ම වෙයි. මහණෙනි, යම්සේ කුළුගෙයක කොත (වහල් මුදුන) ඔසවන ලද්දේ නොවෙයිද? ඒතාක් ගොනැසුන්ගේ මනා පිහිටීම නොවෙයි. එතෙක් ගොනැසුන්ගේ පැවැත්ම නොවෙයි. මහණෙනි, යම් කලෙක වනාහි කුළුගෙයි කොත ඔසවන ලද්දේ වෙයිද, එකල්හි ගොනැසුන්ගේ මනා පිහිටීම වෙයි. එකල්හි ගොනැසුන්ගේ පැවැත්ම වෙයි.

"මහණෙනි එපරිද්දෙන් ආයසීශ්‍රාවකයාගේ ආයසීඥානය නොඋපන්නේ වෙයිද, ඒ තාක් සතර ඉන්ද්‍රියයන්ගේ මනා පිහිටීම නොවෙයි. ඒ තාක් සතර ඉන්ද්‍රියයන්ගේ පැවැත්ම නොවෙයි.

"ආයසීශ්‍රාවකයාගේ ආයසීඥානය උපන්නේ වෙයිද, එකල්හි සතර ඉන්ද්‍රියයන්ගේ මනා පිහිටීම වෙයි. එකල්හි සතර ඉන්ද්‍රියයන්ගේ පැවැත්ම වෙයි. මහණෙනි යම්සේ කුළුගෙයක කොත (වහල් මුදුන) ඔසවන ලද්දේ නොවෙයිද, ඒ තාක් ගොනැසුන්ගේ මනා පිහිටීම නොවෙයි. එතෙක් ගොනැසුන්ගේ පැවැත්ම නොවෙයි. මහණෙනි, යම් කලෙක වනාහි කුළුගෙයි කොත ඔසවන ලද්දේ වෙයිද, එකල්හි ගොනැසුන්ගේ මනා පිහිටීම වෙයි. එකල්හි ගොනැසුන්ගේ පැවැත්ම වෙයි.

3. "කවර සතරක්හුගේද යත් සද්ධින්ද්‍රිය විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, යන ඉන්ද්‍රියන්ගේය. මහණෙනි, ප්‍රඥාවත් ආයසීශ්‍රාවකයාගේ ඒ ප්‍රඥාවට අනුව සද්ධින්ද්‍රිය පිහිටයි. ඊට අනුව විරියින්ද්‍රිය පිහිටයි. ඊට අනුව සතින්ද්‍රිය පිහිටයි. ඊට අනුව සමාධින්ද්‍රිය පිහිටයි."

---

## 3 සෙඛපරියාය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසඹෑනුවර ඝොෂිතාරාමයෙහි වැඩ සිටි සේක. එහිදී වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ඇමතූ සේක.

2. "යම් ක්‍රමයකින් ශෛක්ෂ භික්ෂුව ශෛක්ෂභූමියේ සිටියේ මම ශෛක්ෂවෙමියි දන්නේද? අශෛක්ෂව භික්ෂුව අශෛක්ෂභූමියේ සිටියේ මම අශෛක්ෂ වෙමියි දන්නේද, මහණෙනි, එවැනි ක්‍රමයක් ඇත්තේද?

3. "ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන්වහන්සේ මුල් කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගෙන් අසා දරන්නාහුය."

4. "මහණෙනි, යම් ක්‍රමයකින් ශෛක්ෂ භික්ෂුව ශෛක්ෂ භූමියෙහි සිටියේ මම ශෛක්ෂ වෙමියි දන්නේද, අශෛක්ෂ භික්ෂුව අශෛක්ෂ භූමියෙහි සිටියේ මම අශෛක්ෂ වෙමියි දන්නේද, එවැනි ක්‍රමයක් ඇත

"මහණෙනි, යම් ක්‍රමයකින් ශෛක්ෂ භික්ෂුව ශෛක්ෂ භූමියේ සිටියේ මම ශෛක්ෂ වෙමියි දැනගනියිද, ඒ ක්‍රමය කවරේද? ශෛක්ෂ භික්ෂුතෙම මේ දුකයයි තත්වූ පරිද්දෙන් දනියිද, මේ දුකට හේතුවයයි තත්වූ පරිද්දෙන් දනියිද, මේ දුක්ඛ නිරොධයයයි තත්වූ පරිද්දෙන් දනියිද, මේ දුක නැති කිරීමේ මගයයි තත්වූ පරිද්දෙන් දනියිද,

5. "මහණෙනි, යම් ක්‍රමයකින් ශෛක්ෂ භික්ෂුව ශෛක්ෂව භූමියේ සිටියේ මම ශෛක්ෂ වෙමියි දැනගනියිද, ඊට මෙයද ක්‍රමයක් වන්නේය.

"මහණෙනි, අනික් ක්‍රමයක්ද කියමි 'යම්සේ භාග්‍යවතුන් වහන්සේ මෙසේ විද්‍යමානවූ සත්‍යවූ ධර්මයක් දෙශනා කරයිද.

මෙයින් පිටත්හි එසේ දෙශනා කරන අන්‍ය ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ ඇත්තේදැයි' මෙසේ කල්පනා කරයි.

'යම්සේ භාග්‍යවතුන් වහන්සේ මෙසේ විද්‍යමානවූ සත්‍යවූ ධර්මයක් දෙශනා කරන සේක්ද මෙයින් පිටත්හි එසේ දෙශනා කරන අන්‍ය ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ නැතැයි' හෙතෙම දැනගනියි. යම් ක්‍රමයකින් ශෛක්ෂ භික්ෂු තෙම ශෛක්ෂ භූමියෙහි සිටියේ 'මම ශෛක්ෂ වෙමියි' දැන ගනියිද, මහණෙනි, ඊට මෙයද ක්‍රමයකි.

**6.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. ශෛක්ෂ භික්ෂු තෙම පඤ්චෙන්ද්‍රියයන් දැනගනියි. සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යනුයි.

යම් ස්වභාවයක් ඇත්තාවූ යමක් පරමකොට ඇත්තාවූ යම් බලයක් ඇත්තාවූ යම් පරියොසානයක් ඇත්තාවූ ඒ ඉන්ද්‍රියයන් කයින් ස්පර්ශ නොකොට වාසය කරයි. ප්‍රඥාවෙන් විනිවිද නොදකියි. ශෛක්ෂ භික්ෂුව යම් ක්‍රමයකින් ශෛක්ෂ භූමියේ සිටියේ ශෛක්ෂ වෙමියි දැනගනියිද, මහණෙනි, මෙයද ඊට ක්‍රමයකි.

**7.** "මහණෙනි, අශෛක්ෂ භික්ෂුතෙම යම් ක්‍රමයකින් අශෛක්ෂ භූමියෙහි සිටියේ මම අශෛක්ෂ වෙමියි දැනගනියිද, මහණෙනි, ඒ ක්‍රමය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුතෙම පඤ්චෙන්ද්‍රියයන් දැනගනියි. සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යනුයි.

යම් ස්වභාවයක් ඇත්තාවූ යමක් පරමකොට ඇත්තාවූ, යම් බලයක් ඇත්තාවූ, යම් අවසානයක් ඇත්තාවූ පඤ්ච ඉන්ද්‍රියයන් කයින්ද ස්පර්ශකොට වාසය කරයි. ප්‍රඥාවෙන්ද විනිවිද දකියි. අශෛක්ෂ භික්ෂූතෙම යම් ක්‍රමයකින් අශෛක්ෂ භූමියෙහි සිටියේ මම අශෛක්ෂ භූමියෙහි සිටියේ මම අශෛක්ෂ වෙමියි දැනගනියිද? මහණෙනි, මෙයද ඊට ක්‍රමයකි.

**8** "මහණෙනි, නැවත අනිකක් කියමි. අශෛක්ෂ භික්ෂු තෙම ෂඩ්ඉන්ද්‍රියයන් දැනගනියි. චක්ඛුන්ද්‍රිය, සොතින්ද්‍රිය,

ඝානින්ද්‍රිය, ජිව්හින්ද්‍රිය, කායින්ද්‍රිය, මනින්ද්‍රිය යනුයි මේ ෂඩෙන්ද්‍රියයන් සියලු ආකාරයෙන් ඉතිරිනොවී නිරුද්ධවෙත්ද, අනික් ෂඩෙන්ද්‍රිය කෙනෙක් කිසි තැනක නූපදිතියි දැනගනියි. අශෛක්ෂ භික්ෂුතෙම යම් ක්‍රමයකින් අශෛක්ෂ භූමියෙහි සිටියේ මම අශෛක්ෂ වෙමියි දැනගනියිද මහණෙනි, මෙයද ඊට ක්‍රමයක් වෙයි."

---

## 4. හත්ථිපදොපම සූත්‍රය.

2. "මහණෙනි, යම්සේ හැවිදින්නාවූ සත්වයන්ගේ පියවර වෙත්ද, ඒ සියලු පියවර ඇත් පියවරෙහි ඇතුළත් බවට යෙත්. ඔවුන් අතුරෙන් මහත් බැවින් ඇත් පියවර අග්‍රවෙයි.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම්කිසි පද කෙනෙක් අවබොධය පිණිස පවතිත්ද, අවබොධ කිරීම අතින් ඔවුන් අතුරෙන් පඤ්ඤා පදය අග්‍රවේ. මහණෙනි, කවර පද කෙනෙක් අවබොධය පිණිස පවතීද, මහණෙනි, සද්ධින්ද්‍රිය පදයද එය අවබොධය පිණිස පවතී. විරියින්ද්‍රිය පදයද එය අවබොධය පිණිස පවතී. සතින්ද්‍රිය පදයද එය අවබොධය පිණිස පවතී. සමාධින්ද්‍රිය පදයද එය අවබොධය පිණිස පවතී. පඤ්ඤින්ද්‍රිය පදයද එය අවබොධය පිණිස පවතී.

4. "මහණෙනි, යම්සේ ඇවිදින සත්වයන්ගේ පියවර වෙත්ද, ඒ සියළු පියවර ඇත් පාදයෙහි ඇතුළත් වෙත්ද, යම්සේ මහත් බැවින් ඇත් පාදය ඔවුන්ගේ අග්‍ර බවට යේද, මහණෙනි, එපරිද්දෙන්ම යම්කිසි පද කෙනෙක් අවබොධය පිණිස පවතිත්ද, අවබොධය අතින් පඤ්ඤින්ද්‍රිය ඔවුන්ගෙන් අග්‍රවේ."

---

## 5. සාරගන්ධොපම සූත්‍රය.

2. "මහණෙනි, යම්කිසි සාරගන්ධයෝ වෙත්ද, ඔවුන් ගෙන් රත්සඳුන් අග්‍රවේ. මහණෙනි, එපරිද්දෙන් යම්කිසි බොධිපාක්ෂික

ධර්මයෝ වෙත්ද, ඔවුන්ගෙන් අවබොධ කිරීම වශයෙන් පඤ්ඤින්ද්‍රිය අග්‍රවේ.

3. "මහණෙනි, බොධිපාක්ෂික ධර්මයෝ කවරේද? මහණෙනි, සද්ධින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයකි. එය අවබොධය පිණිස පවතී. විරියින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයකි. එය අවබොධය පිණිස පවතී. සතින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයකි. එය අවබොධය පිණිස පවතී. සමාධින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයකි එය අවබොධය පිණිස පවතී. පඤ්ඤින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයකි. එය අවබොධය පිණිස පවතී.

4. "මහණෙනි, යම්සේ යම්කිසි සාරගන්ධයෝ වෙත්ද, ඔවුන්ගෙන් රත්සඳුන් අග්‍රවේ. මහණෙනි, එපරිද්දෙන් යම්කිසි බොධිපාක්ෂික ධර්මයෝ වෙත්ද, ඔවුන් අතුරෙන් අවබොධය වශයෙන් පඤ්ඤින්ද්‍රිය අග්‍රවේ.

---

## 6. එකධම්ම පතිට්ඨිත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසයකරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට 'මහණෙනියි' කියා ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, එක් ධර්මයෙක්හි පිහිටියාවූ භික්ෂුවගේ පඤ්ච ඉන්ද්‍රියයෝ වඩන ලද්දාහු වෙත්. මනාකොට වඩන ලද්දාහු වෙත්.

3. "කවර එක් ධර්මයෙක්හිද? අප්‍රමාදයෙහිය. මහණෙනි, අප්‍රමාදය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ආශ්‍රව ධර්මයන්හිද ආශ්‍රව සහිත ධර්මයන්හිද සිත රකියිද ඒ ආශ්‍රව ධර්මයන්හිද සාශ්‍රව ධර්මයන්හිද සිත රක්නා භික්ෂුවට සද්ධින්ද්‍රියද වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි. විරියින්ද්‍රියද

වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි. සතින්ද්‍රියද වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි. සමාධින්ද්‍රියද වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි. පඤ්ඤින්ද්‍රියද වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි”

4. “මහණෙනි, මෙසේ වනාහි එක් ධර්මයෙක් පිහිටියාවූ භික්ෂුවගේ පඤ්ච ඉන්ද්‍රියයෝ වඩනලද්දාහුද වෙත්. මනාකොට වඩන ලද්දාහුද වෙත්.

---

## 7. සහම්පති බ්‍රහ්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බුදුවූ අළුත උරුවේලාවෙහි නෙරඤ්ජරා නදී තීරයෙහි අජපාල නිග්‍රොධ මූලයෙහි වැඩ සිටි සේක. ඉක්බිති රහසිගතව විවේක සුවයෙන් වැඩසිටි භාග්‍යවතුන් වහන්සේට මෙසේ සිතෙහි අදහසක් පහළ විය.

‘වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ පඤ්ච ඉන්ද්‍රියයෝ නිවනට ඇතුල් කරන්නාහු නිවන උපදවන්නාහු නිවන අවසාන කොට ඇත්තාහුය යනුයි.

2. “කවර පසක්ද? වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ සද්ධින්ද්‍රිය නිවනට ඇතුල් කරන්නේ නිවන උපදවන්නේ නිවන අවසාන කොට ඇත්තේ වෙයි.

‘වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ විරියින්ද්‍රිය නිවනට ඇතුල් කරන්නේ නිවන උපදවන්නේ නිවන අවසාන කොට ඇත්තේ වෙයි.

“වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ සතින්ද්‍රිය නිවනට ඇතුල් කරන්නේ නිවන උපදවන්නේ නිවන අවසාන කොට ඇත්තේ වෙයි.

“වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ සමාධින්ද්‍රිය නිවනට ඇතුල් කරන්නේ නිවන උපදවන්නේ නිවන අවසාන කොට ඇත්තේ වෙයි.

"වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ පඤ්ඤින්ද්‍රිය නිවනට ඇතුල් කරන්නේ නිවන උපදවන්නේ නිවන කෙළවරකොට ඇත්තේ වෙයි.

"වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ මේ පඤ්චෙන්ද්‍රියයෝ නිවනට ඇතුල් කරන්නාහු නිවන උපදවන්නාහු නිවන කෙළවරකොට ඇත්තාහු වෙත්.

3. ඉක්බිති සහම්පති බ්‍රහ්ම තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ අදහස ඔහුගේ සිතින් දැන යම්සේ බලවත් පුරුෂයෙක් වක්කළ අතක් දික්කරන්නේද දික්කළ අතක් වක් කරන්නේද එපරිද්දෙන් බඹලොවින් අතුරුදන් වූයේ භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි පහළ විය. ඉක්බිති සහම්පති බ්‍රහ්ම තෙමේ උතුරු සළුව එකාංශකොට භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැන්හි ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට මෙය කීය.

4. "භාග්‍යවතුන් වහන්ස, එය එසේය. සුගතයන් වහන්ස, එය එසේය. වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ පඤ්චෙන්ද්‍රියයෝ නිර්වාණයට ඇතුල්කරන්නාහු නිර්වාණය උපදවන්නාහු නිර්වාණය කෙළවර කොට ඇත්තාහු වෙත්.

5. "කවර පසක්ද, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ සද්ධින්ද්‍රිය නිර්වාණයට ඇතුල් කරන්නේ නිර්වාණය උපද වන්නේ නිර්වාණය කෙළවර කොට ඇත්තේ වෙයි.

"වඩනලද්දාවූ බහුල කරන ලද්දාවූ විරියින්ද්‍රිය නිර්වාණයට ඇතුල් කරන්නේ නිර්වාණය උපදවන්නේ නිර්වාණය කෙළවර කොට ඇත්තේ වෙයි.

"වඩනලද්දාවූ බහුල කරන ලද්දාවූ සතින්ද්‍රිය නිර්වාණයට ඇතුල් කරන්නේ නිර්වාණය උපදවන්නේ නිර්වාණය කෙළවර කොට ඇත්තේ වෙයි.

"වඩනලද්දාවූ බහුලකරන ලද්දාවූ සමාධින්ද්‍රිය නිර්වාණයට ඇතුල් කරන්නේ නිර්වාණය උපදවන්නේ නිර්වාණය කෙළවර කොට ඇත්තේ වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ පඤ්ඤින්ද්‍රිය නිර්වාණයට ඇතුල් කරන්නේ නිර්වාණය උපදවන්නේ නිර්වාණය කෙළවරකොට ඇත්තේ වෙයි. වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ මේ පඤ්චෙන්ද්‍රියයෝ නිර්වාණයට ඇතුල් කරන්නාහු නිර්වාණය උපදවන්නාහු නිර්වාණය කෙළවර කොට ඇත්තාහු වෙත්.

**6.** "ස්වාමීනි, පෙර වූ දෙයක් කියමි. මම කාශ්‍යප සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ කෙරෙහි බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසුරුණෙමි එහිදී මා සහක භික්ෂුවය, සහකභික්ෂුවයයි හඳුන්වත්. ස්වාමීනි, ඒ මම මේ පඤ්චෙන්ද්‍රියයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් කාමයන්හි කාමච්ඡන්දය (කැමැත්ත) අතහැර කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති බඹලොව උපන්නෙමි. එහිදී මා සහම්පති බ්‍රහ්මයා, සහම්පති බ්‍රහ්මයායයි හඳුන්වත්ත. භාග්‍යවතුන් වහන්ස, එය එසේය. සුගතයන් වහන්ස එය එසේය.

**7.** "යම්සේ මේ පඤ්චෙන්ද්‍රියයෝ වඩන ලද්දාහුද බහුල කරන ලද්දාහුද පඤ්චනීවරණයෝ නිර්වාණයට ඇතුල් කරන්නාහු නිර්වාණය උපදවන්නාහු නිර්වාණය කෙළවර කොට ඇත්තාහු වෙත්ද මම එසේ මෙය දනිමි, මම එසේ මෙය දකිමියි" කීය.

---

## 8. සූකරඛත සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර ගිජුකුළුපව්වෙහි සූකරඛත ලෙණෙහි වාසය කළ සේක. එහිදී වනාහි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් ඇමතූසේක.

**2.** "කිමෙක්ද, ශාරිපුත්‍රය, ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම කිනම් කරුණක් දකිමින් තථාගතයන් වහන්සේ කෙරෙහිද තථාගත ශාසනය කෙරෙහිද ඉතා ගෞරවයක් දක්වන්නේද?

"ස්වාමීනි, ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම නිරුත්තරවූ රහත් බව දකිමින් තථාගතයන් වහන්සේ කෙරෙහිද තථාගත ශාසනයද කෙරෙහි අතිශයින් ගෞරව දක්වන්නේයයි කීය.

3. "යහපති, යහපති, ශාරිපුත්‍රය, ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම නිරුත්තරවූ රහත් බව දකිමින් තථාගතයන් වහන්සේ කෙරෙහිද තථාගත ශාසනය කෙරෙහිද අතිශයින් ගෞරව දක්වයි. යමක් දකිමින් ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම තථාගතයන් වහන්සේ කෙරෙහිද, තථාගත ශාසනය කෙරෙහිද අතිශයින් ගෞරව දක්වන්නේද, ඒ උතුම්වූ රහත් බව කවරේද?

4. "ස්වාමීනි, මේ ශාසනයෙහි ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම සංසිඳීමට පැමිණෙන්නාවූ අවබොධයට පැමිණෙන්නාවූ සද්ධින්ද්‍රිය වඩයිද, සංසිඳීමට පැමිණෙන්නාවූ අවබොධයට පැමිණෙන්නාවූ විරියින්ද්‍රිය වඩයිද, සංසිඳීමට පැමිණෙන්නාවූ අවබොධයට පැමිණෙන්නාවූ සතින්ද්‍රිය වඩයිද, සංසිඳීමට පැමිණෙන්නාවූ අවබොධයට පැමිණෙන්නාවූ සමාධින්ද්‍රිය වඩයිද, සංසිඳීමට පැමිණෙන්නාවූ අවබොධයට පැමිණෙන්නාවූ පඤ්ඤින්ද්‍රිය වඩයිද, ස්වාමීනි, ඒ උතුම්වූ රහත්බව දකිමින් ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම තථාගතයන් වහන්සේ කෙරෙහිද, තථාගත ශාසනය කෙරෙහිද අතිශයින් ගෞරව දක්වන්නේය.

5. "යහපති, යහපති, ශාරිපුත්‍රය, උතුම්වූ රහත්බව දකිමින් මේ ක්ෂීණාශ්‍රව භික්ෂුතෙමේ තථාගතයන් වහන්සේ කෙරෙහිද තථාගත ශාසනය කෙරෙහිද අතිශයින් ගෞරව දක්වන්නේය. ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම තථාගතයන් වහන්සේ කෙරෙහිද තථාගත ශ්‍රාවකයන් කෙරෙහිද යම්හෙයකින් අතිශයින් ගෞරව දක්වන්නේද,

සාරිපුත්තය, මේ අතිශයින් ගෞරව දැක්වීම යනු කවරේද?

6. "ස්වාමීනි, මේ ශාසනයෙහි ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව සහිතව උසස්කොට සලකමින් වාසය කරයිද, ධර්මය කෙරෙහි ගෞරව සහිතව උසස්කොට සලකමින් වාසයකරයිද, සංඝයා කෙරෙහි ගෞරව

සහිතව උසස්කොට සලකමින් වාසය කරයිද, ශික්ෂාවන් කෙරෙහි ගෞරව සහිතව උසස්කොට සලකමින් වාසය කරයිද, සමාධිය කෙරෙහි ගෞරව සහිතව උසස්කොට සලකමින් වාසය කරයිද, (ස්වාමීනි) ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම තථාගතයන් වහන්සේ කෙරෙහි හෝ යම් හෙතුවකින් ගෞරව දක්වන්නේද ස්වාමීනි, මෙය වනාහි ඒ ගෞරවයයි.

7. "යහපති, යහපති, සාරිපුත්තය, මේ ක්ෂීණාශ්‍රව භික්ෂු තෙම තථාගතයන් වහන්සේ කෙරෙහිද තථාගත ශාසනය කෙරෙහිද අතිශයින් ගෞරව පවත්වයිද, මේ වනාහි ඒ ගෞරවයයි."

---

## 9. පඨම ඉන්ද්‍රිය උප්පාද සූත්‍රය.

1. (මේ ඡේදය මේ වර්ගයේ 6 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. "මහණෙනි, වඩනලද්දාවූ, බහුල කරන ලද්දාවූ නූපන් පඤ්චෙන්ද්‍රියයෝ අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ පහළවීමෙන් හැර නූපදිත්.

3. 'කවර පසක්ද? සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය පඤ්ඤින්ද්‍රිය යනුයි. මහණෙනි, වඩනලද්දාවූ, බහුල කරනලද්දාවූ නූපන් පඤ්ච ඉන්ද්‍රියයෝ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේගේ පහළවීමෙන් හැර නූපදිත්.

---

## 10. දුතිය ඉන්ද්‍රිය උප්පාද සූත්‍රය.

1. (මේ ඡේදය මේ වර්ගයේ 6 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. "මහණෙනි, සුගත විනයෙහි අන්තැනෙක වඩනා ලද්දාවූ බහුල කරන ලද්දාවූ නූපන්නාවූ මේ පඤ්ච ඉන්ද්‍රියයෝ නූපදිත්.

3. කවර පසක්ද, සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය, යනුයි. මහණෙනි, සුගත විනය හැර

අන්තැනෙක වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ නූපන් පඤ්ච ඉන්ද්‍රියයෝ නූපදිත්.

---

# 7. බොධිපක්ඛිය වර්ගය.

## 1. සංයොජන පහාණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, මේ වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ පඤ්චෙන්ද්‍රියයෝ සංයොජනයන් පහකිරීම පිණිස පවතිත්.

3. "කවර පසක්ද යත්? සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යනුයි.

'මහණෙනි, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ, මේ පඤ්චෙන්ද්‍රියයෝ සංයෝජනයන් පහකිරීම පිණිස පවතිත්."

---

## 2. අනුස්සයමුග්ඝාත සූත්‍රය.

1. (මේ වර්ගයේ 1 ඡෙද සියල්ලම මෙහි 1 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡෙදය මෙනි.)

2. "මහණෙනි, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ මේ පඤ්ච ඉන්ද්‍රියයෝ අනුසය නැසීම පිණිස පවතිත්.

3. "කවර පසක්ද යත්? සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යනුයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි, වඩන ලද්දාවූ, බහුල කරන ලද්දාවූ, මේ පඤ්චෙන්ද්‍රියයෝ සංයෝජනයන් පහකිරීම පිණිස පවතිත්."

---

## 3. අද්ධානපරිඤ්ඤා සූත්‍රය

2. "මහණෙනි, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ මේ පඤ්ච ඉන්ද්‍රියයෝ සංසාරය පිරිසිඳ දැනීම පිණිස පවතිත්.

3. "කවර පසක්ද යත්? සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යනුයි.

"මහණෙනි, වඩන ලද්දාවූ, බහුල කරන ලද්දාවූ, මේ පඤ්චෙන්ද්‍රියයෝ සංයෝජනයන් පහකිරීම පිණිස පවතිත්."

---

## 4. ආසවක්ඛය සූත්‍රය.

2. "මහණෙනි, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ මේ පංචඉන්ද්‍රියයෝ ආශ්‍රවයන් ක්ෂයකිරීම පිණිස පවතිත්.

3. කවර පසෙක්ද යත්? සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යනුයි. මහණෙනි, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ මේ පඤ්චෙන්ද්‍රියයෝ ආශ්‍රවයන්ගේ ක්ෂයකිරීම පිණිස පවතිත්."

---

## 5. ද්විඵල සූත්‍රය.

2 'මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ පසෙක් වෙත්. කවර පසෙක්ද? සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය පඤ්ඤින්ද්‍රිය යනුයි.

3. "මහණෙනි, මේ පඤ්චෙන්ද්‍රියයන් වැඩීමෙන් බහුල කිරීමෙන් මේ ආත්මයෙහි රහත් බව හෝ ස්කන්ධ ශෙෂය ඇති කල්හි අනාගාමි බව හෝ යන ඵලදෙක අතරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතුයි."

---

## 6. සත්තානිසංස සූත්‍රය

2. "මහණෙනි, මේ ඉන්ද්‍රියයෝ පසෙක් වෙත්. කවර පසෙක්ද? සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යනුයි.

3. "මහණෙනි, මේ පඤ්ච ඉන්ද්‍රියයෝයි මහණෙනි, මේ පඤ්චෙන්ද්‍රියයන් වැඩීමෙන් බහුල කිරීමෙන් ඵල සතක් ආනිසංස සතක් කැමති විය යුතුයි.

4. "කවර ඵල සතක් ආනිසංස සතක්ද? මේ ආත්මයෙහි කෙලෙසුන් නසා රහත් බව අවබොධ කරයි. ඉදින් මේ ආත්මයෙහිම කෙලෙසුන් නසා රහත් බව අවබොධ නොකෙළේද, ඉක්බිති මරණ කාලයෙහි රහත් බව අවබොධ කරයි. ඉදින් මේ ආත්මයෙහිම කෙලෙසුන් නසා රහත් බව අවබොධ නොකරයිද මරණ කාලයෙහිත් රහත් බව අවබොධ නොකරයිද?

5. ඉක්බිති පංච ඔරම්භාගිය සංයෝජනයන් නැති කිරීමෙන් අන්තරා පරිනිබ්බායි නම් අනාගාමි වෙයි. උපහච්ච පරිනිබ්බායී නම් අනාගාමි වෙයි. අසංඛාර පරිනිබ්බායී නම් අනාගාමි වෙයි. සසංඛාර පරිනිබ්බායි නම් අනාගාමි වෙමි. උද්ධංසොත අකනිට්ඨගාමි නම් අනාගාමි වෙයි. මහණෙනි මේ පඤ්චෙන්ද්‍රියයන් වැඩීමෙන් බහුල කිරීමෙන් මේ ඵල සත ආනිසංස සත කැමති විය යුත්තේය.

---

## 7. ජම්බුරුක්ඛොපම සූත්‍රය.

2. "මහණෙනි, යම්සේ දඹදිව යම්කිසි ගස් වර්ග ඇත්තාහුද දඹගස ඔවුන්ගෙන් අග්‍රවේ. මහණෙනි, එපරිද්දෙන්ම යම්කිසි බොධි පාක්ෂික ධර්මයෝ වෙත්ද අවබොධය පිණිස ඔවුන්ගේ පඤ්ඤින්ද්‍රිය අග්‍රවේ. මහණෙනි බොධිපාක්ෂික ධර්මයෝ කවරහුද?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

3. "මහණෙනි, සද්ධින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයෙකි. එය අවබොධය පිණිස පවතී. විරියින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයෙකි. එය අවබොධය පිණිස පවතී. සතින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයෙකි. එය අවබොධය පිණිස පවතී. සමාධින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයෙකි. එය අවබොධය පිණිස පවතී. පඤ්ඤින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයෙකි. එය අවබොධය පිණිස පවතී.

4. "මහණෙනි, යම්සේ දඹදිව යම්කිසි ගස් වර්ග ඇත්තාහුද දඹගස ඔවුන්ගෙන් අග්‍රවේ. මහණෙනි, එපරිද්දෙන්ම යම්කිසි බොධි පාක්ෂික ධර්මයෝ වෙත්ද? ඔවුන්ගෙන් අවබොධය පිණිස පඤ්ඤින්ද්‍රිය අග්‍රවේ."

---

## 8 පාරිච්ඡත්තක සූත්‍රය.

2. "මහණෙනි, යම්සේ තාවතිංස දෙවියන්ගේ වෘක්ෂයෝ වෙත්ද, පරසතු රුක ඔවුන්ගෙන් අග්‍රවේ. මහණෙනි එපරිද්දෙන්ම යම්කිසි බොධිපාක්ෂික ධර්මයෝ වෙත්ද, ඔවුන්ගෙන් අවබොධය පිණිස පඤ්ඤින්ද්‍රිය අග්‍රවේ.

3. "මහණෙනි, බොධිපාක්ෂික ධර්මයෝ කවරේද? මහණෙනි, සද්ධින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයකි. එය අවබොධය පිණිස පවතී. විරින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයකි එය අවබොධය පිණිස පවතී. සතින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයකි. එයඅවබොධය පිණිස පවතී. සමාධින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයකි. එය අවබොධය පිණිස පවතී පඤ්ඤින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයකි. එය අවබොධය පිණිස පවතී.

4. "මහණෙනි, යම්සේ තාවතිංස දෙවියන්ගේ වෘක්ෂයෝ වෙත්ද, ඔවුන්ගෙන් පරසතු රුක අග්‍රවේ. මහණෙනි, එපරිද්දෙන්ම යම් කිසි බොධිපාක්ෂික ධර්මයෝ වෙත්ද, ඔවුන් අතුරෙන් අවබොධය පිණිස පඤ්චෙන්ද්‍රිය අග්‍රවේ.

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 9. චිත්තපාටලී සූත්‍රය.

2. "මහණෙනි, යම් සේ අසුරයන්ගේ යම්කිසි වෘක්ෂයෝ වෙත්ද, ඔවුන්ගෙන් චිත්තපාටලී රුක අග්‍රවේ. මහණෙනි, එපරිද්දෙන් යම්කිසි බොධිපාක්ෂික ධර්මයෝ වෙත්ද, ඔවුන්ගෙන් අවබොධය පිණිස පඤ්චෙන්ද්‍රිය අග්‍රවේ.

3. "මහණෙනි, බොධිපාක්ෂික ධර්මයෝ කවරහුද? සද්ධින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයකි. එය අවබොධය පිණිස පවතී.

"විරින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයකි. එය අවබොධය පිණිස පවතී. සතින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයකි. එය අවබොධය පිණිස පවතී. සමාධින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයකි. එය අවබොධය පිණිස පවතී. පඤ්ඤින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයකි. එය අවබොධය පිණිස පවතී

4. යම්සේ අසුරයන්ගේ යම්කිසි වෘක්ෂයෝ වෙත්ද ඔවුන්ගෙන් චිත්තපාටලී රුකම අග්‍රවේ. මහණෙනි, එපරිද්දෙන්ම යම්කිසි බොධිපාක්ෂික ධර්මයෝ වෙත්ද ඔවුන්ගෙන් අවබොධය පිණිස පඤ්ඤින්ද්‍රිය අග්‍රවේ."

---

## 10 කූටසිම්බලී සූත්‍රය.

2. "මහණෙනි, යම්සේ නාගයන්ගේ යම් වෘක්ෂයෝ වෙත්ද, කූටසිම්බලී වෘක්ෂය ඔවුන්ගෙන් අග්‍රවේ. මහණෙනි, එපරිද්දෙන්ම යම් බොධිපාක්ෂික ධර්මයෝ වෙත්ද ඔවුන්ගෙන් අවබොධය පිණිස පඤ්ඤින්ද්‍රිය අග්‍රවේ.

3. "මහණෙනි, බොධිපාක්ෂික ධර්මයෝ කවරහුද? මහණෙනි, සද්ධින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයකි. එය අවබොධය පිණිස පවතී.

"විරියින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයකි. එය අවබොධය පිණිස පවතී. සද්ධින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයකි. එය අවබොධය පිණිස පවතී. සමාධින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයකි එය අවබොධය

පිණිස පවතී. පඤ්ඤින්ද්‍රිය බොධිපාක්ෂික ධර්මයකි. එය අවබොධය පිණිස පවතී.

4. 'මහණෙනි, යම්සේ නාගයන්ගේ යම් වෘක්ෂයෝ වෙත්ද ඔවුන්ගෙන් කූටසිම්බලී වෘක්ෂය අග්‍රවේ. එපරිද්දෙන්ම යම් බොධිපාක්ෂික ධර්මයෝ වෙත්ද ඔවුන්ගෙන් අවබොධය පිණිස පඤ්ඤින්ද්‍රිය අග්‍රවේ" යනුයි.

(මෙතැන් සිට "මග්ග සංයුත්තයේ මෙන් ගංගා පෙය්‍යාල වර්ගයේ සිට ඕඝ වර්ගය තෙක් ඇති වර්ග පස මෙහිදී පඤ්චෙන්ද්‍රිය වර්ගයෙන් වෙනස්කොට මෙහි ඕඝ වර්ගයේ අන්තිම සූත්‍රය' මෙන් යොදාගත යුතුයි.)

---

## 8. ගංගා පෙයසාල වර්ගය

(මග්ගසංයුත්තයේ ගංගා පෙය්‍යාල වර්ගයට පංචෙන්ද්‍රිය යොදා ගැනීමෙන් මෙහි සූත්‍ර දොළස සම්පූර්ණවේ.)

---

## 9. අප්පමාද වර්ගය.

(මග්ගසංයුත්තයේ අප්පමාද වර්ගයට පංචෙන්ද්‍රිය යොදා ගැනීමෙන් මෙහි සූත්‍ර දහය සම්පූර්ණවේ.)

---

## 10. බලකරණීය වර්ගය.

(මග්ගසංයුත්තයේ බලකරණීය වර්ගයට පංචෙන්ද්‍රියය යොදා ගැනීමෙන් මෙහි සූත්‍ර දොළස සම්පූර්ණවේ.)

---

## 11. ඒසනා වර්ගය.

(මග්ගසංයුත්තයේ ඒසනා වර්ගයට පංචෙන්ද්‍රියය යොදා ගැනීමෙන් මෙහි සූත්‍ර දොළස සම්පූර්ණවේ.)

---

# 12. ඕඝ වර්ගය.

(මේ වර්ගයේ දහවෙනි සූත්‍රයට මෙන් මුල් සූත්‍ර නවයටත් පංචෙන්ද්‍රිය යෙදාගැනීමෙන් මග්ගසංයුත්තයේ ඕඝ වර්ගයේ මෙන් මෙහිද සූත්‍ර දහය සම්පූර්ණවේ)

"මහණෙනි, මේ උද්ධම්භාගිය සංයෝජන පසක් වෙත්. කවර පසෙක්ද? රූපරාගය, අරූප රාගය, මානය, උද්ධච්චය, අවිද්‍යාව යනුයි. මහණෙනි, මේ පස උද්ධම්භාගිය සංයෝජනයෝයි. මහණෙනි, මේ උද්ධම්භාගිය සංයෝජන පස විශෙෂයෙන් දැනගැනීම පිණිස පිරිසිඳ දැනගැනීම පිණිස නැති කිරීම පිණිස ප්‍රහාණය පිණිස පඤ්චෙන්ද්‍රියයෝ වැඩිය යුත්තාහ. කවර පසෙක්ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම රාගය දුරුකිරීම කෙළවර කොට දොසය දුරුකිරීම කෙළවර කොට මොහය දුරුකිරීම කෙළවර කොට ඇති අමෘතයට බැසගන්නාවූ අමෘතය උපදවන්නාවූ අමෘතය කෙළවර කොට ඇත්තාවූ නිවනට බැසගන්නාවූ නිවන පහළ කරන්නාවූ නිවන කෙළවර කොට ඇත්තාවූ නිවනට නැමුණාවූ නිවනට හැරුණාවූ සද්ධින්ද්‍රිය වඩයි.

"රාගය දුරුකිරීම කෙළවරකොට දොසය දුරුකිරීම කෙළවර කොට මෝහය දුරුකිරීම කෙළවර කොට ඇති අමෘතයට බැසගන්නාවූ අමෘතය උපදවන්නාවූ අමෘතය කෙළවර කොට ඇත්තාවූ නිවනට බැසගන්නාවූ නිවන පහළ කරන්නාවූ නිවන කෙළවර කොට ඇත්තාවූ නිවනට නැමුණාවූ නිවනට හැරුණාවූ විරියින්ද්‍රිය වඩයි.

'රාගය දුරුකිරීම කෙළවරකොට ද්වෙෂය දුරුකිරීම කෙළවර කොට මොහය දුරුකිරීම කෙළවර කොට ඇති අමෘතයට බැසගන්නාවූ අමෘතය උපදවන්නාවූ අමෘතය කෙළවර කොට ඇත්තාවූ නිවනට බැසගන්නාවූ නිවන පහළ කරන්නාවූ නිවන කෙළවර කොට ඇත්තාවූ නිවනට නැමුණාවූ නිවනට හැරුණාවූ සතින්ද්‍රිය වඩයි

"රාගය දුරුකිරීම කෙළවරකොට ද්වෙෂය දුරුකිරීම කෙළවර කොට මොහය දුරුකිරීම කෙළවර කොට ඇති

අමෘතයට බැසගන්නාවූ අමෘතය උපදවන්නාවූ අමෘතය කෙළවර කොට ඇත්තාවූ නිවනට බැසගන්නාවූ නිවන පහළ කරන්නාවූ නිවන කෙළවර කොට ඇත්තාවූ නිවනට නැමුණාවූ නිවනට හැරුණාවූ සමාධින්ද්‍රිය වඩයි.

'රාගය දුරුකිරීම කෙළවරකොට ද්වෙෂය දුරුකිරීම කෙළවර කොට මොහය දුරුකිරීම කෙළවරකොට ඇති අමෘතයට බැසගන්නාවූ අමෘතය උපදවන්නාවූ අමෘතය කෙළවර කොට ඇත්තාවූ නිවනට බැසගන්නාවූ නිවන පහළ කරන්නාවූ නිවන කෙළවර කොට ඇත්තාවූ නිවනට නැමුණාවූ නිවනට හැරුණාවූ පඤ්ඤින්ද්‍රිය වඩයි.

මහණෙනි, මේ පසක්වූ උද්ධම්භාගිය සංයෝජනයන් විශෙෂයෙන් දැනගැනීම පිණිස පිරිසිඳ දැනගැනීම පිණිස ක්ෂය කිරීම පිණිස පහකිරීම පිණිස මේ පඤ්ච ඉන්ද්‍රියයෝ වැඩිය යුත්තාහ.

(සතර වැනි ඉන්ද්‍රිය සංයුත්තය නිමි.)

---

# 5. සම්මප්පධාන සංයුත්තය.

## 1. ගංගාපෙය්‍යාල වර්ගය.

### 1. පාචීනනින්න සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරනසේක. එහිදී භාග්‍යවතුන්වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක

2. "මහණෙනි, මේ සම්මප්‍රධානයෝ සතරක් වෙත්. ඒ සතර කවරහුද? මහණෙනි මේ ශාසනයෙහි මහණ තෙම නූපන් ලාමක

අකුසල ධර්මයන්ගේ නූපදීම පිණිස කැමැත්ත උපදවයි. වෑයම් කරයි. වීර්‍ය්‍යී පටන්ගනියි. සිත ඔසවයි. උත්සාහ කරයි. උපන් ලාමක අකුසල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කැමැත්ත උපදවයි. වෑයම් කරයි. වීර්‍ය්‍යී පටන් ගනියි. සිත ඔසවයි. උත්සාහ කරයි.

3. "නූපන් කුසල ධර්මයන්ගේ උපදීම පිණිස කැමැත්ත උපදවයි. වෑයම් කරයි. වීර්‍ය්‍යී පටන් ගනියි. සිත ඔසවයි. උත්සාහ කරයි. උපන් කුසල ධර්මයන්ගේ පැවැත්ම පිණිස නුමුළා බව පිණිස, බොහෝ බව පිණිස මහත් බව පිණිස වැඩීම පිණිස සම්පූර්ණවීම පිණිස කැමැත්ත දක්වයි. වෑයම් කරයි වීර්‍ය්‍යය පටන් ගනියි සිත ඔසවයි. උත්සාහ කරයි. මහණෙනි, මේ සතර සම්‍යක් ප්‍රධානයෝ යි.

4. "මහණෙනි, යම්සේ ගංගා නදිය පෙරදිගට නැඹුරුද, පෙරදිගට නැමී පවතීද, පෙරදිගට හැරී පවතීද, මහණෙනි, එපරිද්දෙන්ම මහණතෙමේ සතර සම්‍යක් ප්‍රධානයන් වඩන්නේ සතර සම්‍යක් ප්‍රධානයන් බහුල කරන්නේ නිර්වාණයට නැමුණේද නිර්වාණයට හැරුණේද නිර්වාණයට බරවූයේද වෙයි

5. "මහණෙනි, සතර සම්මප්පධානයන් වඩන්නාවූ බහුල කරන්නාවූ මහණතෙමේ කෙසේ නම් නිවනට නැමුණේ නිවනට හැරුණේ නිවනට බරවූයේ වෙයිද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම නූපන් ලාමක අකුසල ධර්මයන්ගේ නූපදීම පිණිස කැමැත්ත දක්වයි. වෑයම් කරයි. වීර්‍ය්‍යය පටන් ගනියි. සිත ඔසවයි. උත්සාහ කරයි. උපන් ලාමක අකුසල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කැමැත්ත දක්වයි. වෑයම් කරයි. වීර්‍ය්‍යී පටන් ගනියි. සිත ඔසවයි. උත්සාහ කරයි.

6. නූපන් කුසල ධර්මයන්ගේ උපදවීම පිණිස කැමැත්ත උපදවයි. වෑයම් කරයි. වීර්‍ය්‍යී පටන් ගනියි. සිත ඔසවයි. උත්සාහ කරයි. උපන් කුසල ධර්මයන්ගේ පැවැත්ම පිණිස නුමුළා බව පිණිස බොහෝ බව පිණිස මහත් බව පිණිස වැඩීම පිණිස සම්පූර්ණවීම පිණිස කැමැත්ත දක්වයි. වෑයම් කරයි. වීර්‍ය්‍යී පටන් ගනියි. සිත ඔසවයි. උත්සාහ කරයි.

7. 'මහණෙනි, මෙසේ වනාහි මහණතෙමේ සතර සම්‍යක් ප්‍රධානයන් වඩන්නාවූ සතර සම්‍යක් ප්‍රධානයන් බහුල කරන්නාවූ මහණතෙමේ නිවනට නැමුණේ නිවනට හැරුණේ නිවනට බරවූයේ වෙයි.

2-12. (ගංගා පෙයයාලයේ ඉතිරි සූත්‍ර එකොළොසද සම්මප්පදාන වශයෙන් මෙසේ වෙනස්කොට ගත්කළ සම්පූර්ණ වේ.

---

## 2. අප්පමාද වර්ගය.

(මග්ගසංයුත්තයේ අප්පමාද වර්ගයට සතර සම්මප්පධානයන් යොදාගැනීමෙන් මෙහි සූත්‍ර දහය සම්පූර්ණ වේ.)

---

## 3. බලකරණීය වර්ගය.

### 1. බල සූත්‍රය.

1. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ මෙනි)

2. "මහණෙනි, යම්කිසි වීර්‍ය්‍යයෙන් කළයුතු කර්මාන්තයෝ කරනු ලැබෙත්ද, වීර්‍ය්‍යයෙන් කළයුතු ඒ සියලු කර්මාන්ත පොළොව නිසා පොළොවෙහි පිහිටා කරනු ලැබෙත්.

"මහණෙනි, එපරිද්දෙන්ම මහණතෙම සීලය නිසා සීලයෙහි පිහිටා සතර සම්‍යක් ප්‍රධානයන් වඩයි. සතර සම්‍යක් ප්‍රධානයන් බහුල කරයි. මහණෙනි, මහණතෙම කෙසේ නම් සීලය නිසා සීලයෙහි පිහිටා සතර සම්‍යක් ප්‍රධානයන් වඩයිද, සතර සම්‍යක් ප්‍රධානයන් බහුල කරයිද?

3. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම නූපන් ලාමක අකුසල ධර්මයන්ගේ නූපදීම පිණිස කැමැත්ත උපදවයි. වෑයම් කරයි. වීර්‍ය්‍ය පටන් ගනියි. සිත ඔසවයි. උත්සාහ කරයි. උපන්

ලාමක අකුසල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කැමැත්ත දක්වයි. වෑයම් කරයි. වීර්‍ය්‍ය පටන්ගනියි. සිත ඔසවයි. උත්සාහ කරයි.

4. "නූපන් කුසල ධර්මයන්ගේ ඉපදවීම පිණිස කැමැත්ත උපදවයි. වෑයම් කරයි. වීර්‍ය්‍ය උපදවයි. සිත ඔසවයි. උත්සාහ කරයි. උපන් කුසල ධර්මයන්ගේ පැවැත්ම පිණිස නුමුළා වීම පිණිස බොහෝ බව පිණිස මහත් බව පිණිස වැඩීම පිණිස සම්පූර්ණවීම පිණිස කැමැත්ත උපදවයි. වෑයම් කරයි. වීර්‍ය්‍ය උපදවයි. සිත ඔසවයි. උත්සාහ කරයි.

5 "මහණෙනි, මෙසේ වනාහි මහණ තෙම සීලය නිසා සීලයෙහි පිහිටා සතර සම්‍යක් ප්‍රධානයන් වඩයි. සතර සම්‍යක් ප්‍රධානයන් බහුල කරයි.

2-12. (සම්මප්පධානයන්ගේ වශයෙන් බලකරණීය වර්ගයෙහි ඉතිරි සූත්‍ර එකොළොසද මෙසේ යොදාගැනීමෙන් මේ වර්ගය සම්පූර්ණ වේ.)

---

## 4. එසනා වර්ගය.

### 1. එසනා සූත්‍රය.

(මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 1 ඡේදය මෙනි)

2. "මහණෙනි, මේ සෙවීම් තුනෙකි. කවර තුනෙක්ද? කාම වස්තු සෙවීමය, භවය සෙවීමය, සැපයට මාර්ගය සෙවීමය යනුයි.

"මහණෙනි, මේ සෙවීම් තුනය, මහණෙනි, මේ සෙවීම් තුන විශෙෂයෙන් දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස පහකිරීම පිණිස සතරසම්‍යක් ප්‍රධානයන් වැඩියයුතුයි.

3 "කවර සතරක්ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම නූපන් ලාමක අකුසල ධර්මයන්ගේ නූපදීම පිණිස කැමැත්ත උපදවයි. වෑයම් කරයි. විර්‍ය්‍ය පටන්ගනියි. උත්සාහ කරයි. උපන් ලාමක අකුසල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කැමැත්ත දක්වයි. වෑයම් කරයි. වීර්‍ය්‍ය පටන්ගනියි. සිත ඔසවයි. උත්සාහ කරයි.

4. "නූපන් කුසලධර්මයන්ගේ ඉපදවීම පිණිස කැමැත්ත උපදවයි. වෑයම් කරයි. වීර්‍ය්‍ය උපදවයි. සිත ඔසවයි උත්සාහ කරයි. උපන් කුසල ධර්මයන්ගේ පැවැත්ම පිණිස නුමුළාවීම පිණිස බොහෝබව පිණිස වැඩීම පිණිස සම්පූර්ණවීම පිණිස කැමැත්ත උපදවයි. වෑයම් කරයි. වීර්‍ය්‍ය පටන්ගනියි. සිත ඔසවයි, උත්සාහ කරයි.

"මහණෙනි, මේ සෙවීම් තුන විශෙෂයෙන් දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස, පහකිරීම පිණිස, මේ සතර සම්‍යක් ප්‍රධානයන් වැඩිය යුතුයි"

(2-12 එසනා වර්ගයේ සම්මප්පධාන වශයෙන් ඉතිරි සූත්‍ර එකොළස මෙසේ සම්පූර්ණ කර ගැනීමෙන් මේ වර්ගය සම්පූර්ණ වේ)

---

## 5. ඕඝ වර්ගය.

### 1. ඕඝ සූත්‍රය.

1. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2 මහණෙනි, මේ උද්ධම්භාගිය සංයෝජන පසක් වෙත්. කවර පසක්ද? රූපරාගය, අරූපරාගය, මානය, උද්ධච්චය, අවිජ්ජාවය යනුයි.

"මහණෙනි, මේ පස උද්ධම්භාගිය සංයෝජනයෝයි. මහණෙනි, මේ පඤ්ච උද්ධම්භාගීය සංයෝජනයන්ගේ විශෙෂයෙන් දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂයකිරීම පිණිස පහකිරීම පිණිස සතර සම්‍යක් ප්‍රධානයන් වැඩිය යුතුය.

3. "කවර සතරක්දයත්, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම නූපන් ලාමක අකුසල ධර්මයන්ගේ නූපදීම පිණිස කැමැත්ත උපදවයි. වෑයම් කරයි, වීර්‍ය්‍ය පටන්ගනියි, උත්සාහ කරයි. උපන් ලාමක අකුසල ධර්මයන්ගේ පහකිරීම පිණිස කැමැත්ත උපදවයි, වෑයම් කරයි, වීර්‍ය්‍ය පටන්ගනියි.

4. "නූපන් කුසලධර්මයන්ගේ ඉපදවීම පිණිස කැමැත්ත උපදවයි, වෑයම් කරයි, වීර්‍ය්‍යය පටන්ගනියි, සිත ඔසවයි, උත්සාහ කරයි. උපන් කුසලධර්මයන්ගේ පැවැත්ම පිණිස නොමුළාවීම පිණිස, බොහෝ බව පිණිස, මහත් බව පිණිස, වැඩීම පිණිස, සම්පූර්ණවීම පිණිස කැමැත්ත උපදවයි, වෑයම් කරයි, වීර්‍ය්‍ය පටන්ගනියි. සිත ඔසවයි, උත්සාහ කරයි.

5. "මහණෙනි, මේ පඤ්ච උද්ධම්භාගිය සංයෝජනයන්ගේ විශෙෂයෙන් දැනුම පිණිස, පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස පහකිරීම පිණිස මේ සතර සම්‍යක්ප්‍රධානයන් වැඩිය යුතුය."

(2-10. ඔඝ වර්ගයේ සම්මප්පධාන වශයෙන් ඉතිරි සූත්‍ර නවයද මෙසේ යොදාගැනීමෙන් මේ වර්ගය සම්පූර්ණ වේ.)

(පස්වැනි සම්මප්පධාන සංයුත්ත නිමි.)

---

# 6. බල සංයුත්තය.

## 1. ගංගාපෙයයාල වර්ගය.

### 1. පාචීනනින්න සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූන් භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි බල පසක් වෙත්. කවර පසක්ද යත්, සද්ධාබලය, විරිය බලය, සති බලය, සමාධි බලය, පඤ්ඤා බලය, යනුයි. මහණෙනි, මොව්හු වනාහි පඤ්ච බලයෝයි"

3. "මහණෙනි, යම්සේ ගංගානදිය පෙරදිගට නැඹුරුද, පෙරදිගට නැමී පවතීද, පෙරදිගට හැරී පවතීද, මහණෙනි එපරිද්දෙන් පඤ්ච බලයන් වඩන්නාවූ පඤ්ච බලයන් බහුල කරන්නාවූ මහණතෙම නිවනට නැමුණේ නිවනට හැරුණේ නිවනට බරවූයේ වෙයි.

4. "මහණෙනි, පඤ්ච බලයන් වඩන්නාවූ පඤ්ච බලයන් බහුල කරන්නාවූ මහණතෙමේ කෙසේ නිවනට නැමුණේ නිවනට හැරුණේ නිවනට බරවූයේ වෙයිද? මේ ශාසනයෙහි මහණතෙම නිවන් ඇසුරුකළ, විරාගය ඇසුරු කළ, නිරොධය ඇසුරුකළ නිවනට නැමුණු සද්ධාබලය වඩයි.

"නිවන් ඇසුරුකළ විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ නිවනට නැමුණු විරිය බලය වඩයි.

"නිවන් ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණු සතිබලය වඩයි.

"නිවන් ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණු සමාධි බලය වඩයි.

නිවන් ඇසුරුකළ, විරාගය ඇසුරුකළ නිරොධය ඇසුරුකළ නිවනට නැමුණු පඤ්ඤා බලය වඩයි.

4. "මහණෙනි මෙසේ වනාහි පඤ්චබලයන් වඩන්නාවූ පඤ්ච බලයන් බහුල කරන්නාවූ මහණතෙමේ නිවනට නැමුණේ නිවනට බරවූයේ වෙයි."

(2-12 ගංගාපෙයයාල වර්ගයේ බල වශයෙන් ඉතිරි සූත්‍ර එකොළසද යොදාගැනීමෙන් මේ වර්ගය සම්පූර්ණවේ)

---

## 2. අප්පමාද වර්ගය.

(1-10. මේ සංයුත්තයේ ගංගාපෙයයාල වර්ගයේ 1 සූත්‍රය මෙන් බල වශයෙන් යොදාගැනීමෙන් මේ වර්ගයේ සූත්‍ර දහය සම්පූර්ණ වේ.)

---

## 3. බලකරණීය වර්ගය.

(1-12. මේ සංයුත්තයේ ගංගාපෙය්‍යාලයේ 1 සූත්‍රය මෙන් බලවශයෙන් යොදාගැනීමෙන් මේ වර්ගයේ සූත්‍ර 12 සම්පූර්ණ වේ.)

---

## 4. එසනා වර්ගය.

(1-12. මේ සංයුත්තයේ ගංගාපෙය්‍යාලයේ 1 සූත්‍රය මෙන් බලවශයෙන් යොදාගැනීමෙන් මේ වර්ගයේ සූත්‍ර 12 සම්පූර්ණවේ.)

---

## 5. ඔඝ වර්ගය.

(1-10. මේ වර්ගයේ ගංගාපෙය්‍යාලයේ 1 සූත්‍රය මෙන් බලවශයෙන් යොදාගැනීමෙන් මේ වර්ගයේ සූත්‍ර 10 සම්පූර්ණවේ.)

---

## 6. ගංගාපෙය්‍යාල වර්ගය (2)

(1-12. බල සංයුත්තයේ ගංගාපෙය්‍යාලය (2) මග්ග සංයුත්තයේදී මෙන් රාග විනය වශයෙන් වෙනස්කොට ගැනීමෙන් මෙහි සූත්‍ර දොළස සම්පූර්ණවේ.)

---

## 7. අප්පමාද වර්ගය. (2)

(1-10. මේ බල සංයුත්තයේ අප්පමාද වර්ගය (2) මග්ග සංයුත්තයේදී මෙන් රාග විනය වශයෙන් වෙනස්කොට ගැනීමෙන් මෙහි සූත්‍ර දහය සම්පූර්ණවේ.)

---

## 8. බලකරණීය වර්ගය. (2)

(1-12. බල වර්ගයේ බලකරණීය වර්ගය (2) මග්ග සංයුත්තයේදී මෙන් රාග විනය වශයෙන් වෙනස්කොට ගැනීමෙන් මෙහි සූත්‍ර දොළස සම්පූර්ණ වේ.)

---

## 9. එසනා වර්ගය. (2)

(1-12. මෙය මග්ගසංයුත්තයේ එසනා වර්ගය මෙහිදී බල වශයෙන් වෙනස්කොට ගත් කල මේ වර්ගයේ සූත්‍ර දොළස සම්පූර්ණ වේ.)

---

## 10. ඔඝ වර්ගය. (2)

(1-9. මේ වර්ගයේ මුල් සූත්‍ර නවය මෙහි දහවෙනි සූත්‍රය මෙන් බල වශයෙන් වෙනස්කොට ගැනීමෙන් මේ වර්ගයේ සූත්‍ර දහය සම්පූර්ණ වේ.)

---

### 10. උද්ධම්භාගිය සූත්‍රය.

1. (මේ ඡේදය මේ සංයුත්තයේ මුල් සූත්‍රයේ 1 ඡේදය මෙනි)

2. "මහණෙනි, මේ උද්ධම්භාගිය සංයොජන පසකි. කවර පසෙක්ද? රූප රාගය, අරූප රාගය, මානය, උද්ධච්චය, අවිජ්ජාවය යනුයි මහණෙනි, මේ පඤ්ච උද්ධම්භාගිය සංයෝජනයෝය. මේ පඤ්ච උද්ධම්භාගීය සංයොජනයන්ගේ විශෙෂයෙන් දැනගැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස පහ කිරීම පිණිස පඤ්ච බලයන් වැඩිය යුතුයි.

3. "කවර පසක්ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම නිවන් ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරු කළ නිවනට නැමුණු සද්ධාබලය වඩයි.

"නිවන් ඇසුරුකළ, විරාගය ඇසුරුකළ නිරොධය ඇසුරු කළ, නිවනට නැමුණු විරිය බලය වඩයි.

"නිවන් ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරු කළ නිවනට නැමුණු සතිබලය වඩයි.

"නිවන් ඇසුරුකළ, විරාගය ඇසුරුකළ, නිරොධය ඇසුරුකළ නිවනට නැමුණු සමාධි බලය වඩයි.

"නිවන් ඇසුරුකළ, විරාගය ඇසුරුකළ නිරොධය ඇසුරුකළ, නිවනට නැමුණු පඤ්ඤා බලය වඩයි.

4. "මහණෙනි, මේ පඤ්ච උද්ධම්භාගිය සංයොජනයන්ගේ දැනගැනීම පිණිස පිරිසිඳ දැනගැනීම පිණිස ක්ෂයකිරීම පිණිස පහකිරීම පිණිස මේ පඤ්ච බලයන් වැඩිය යුතුය."

---

## 11. ගංගාපෙය්‍යාල වර්ගය. (3)

(1-12. 15 ඔඝ වර්ගයේ අන්තිම සූත්‍රය මෙන් අමතොගධ කොට ගැනීමෙන් මෙහි සූත්‍ර 12 සම්පූර්ණ වේ.)

---

## 12. අප්පමාද වර්ගය. (3)

(1-12. 15 ඔඝ වර්ගයේ අන්තිම සූත්‍රය මෙන් අමතොගධ කොට ගැනීමෙන් මෙහි සූත්‍ර 10 සම්පූර්ණ වේ.)

---

## 13. බලකරණීය වර්ගය. (3)

(1-12. 15 ඔඝ වර්ගයේ අන්තිම සූත්‍රය මෙන් අමතොගධ කොට ගැනීමෙන් මෙහි සූත්‍ර 12 සම්පූර්ණ වේ.)

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 14. එසනා වර්ගය.

(1-12. 15 ඔඝ වර්ගයේ අන්තිම සූත්‍රය මෙන් අමතොගධ කොට ගැනීමෙන් මෙහි සූත්‍ර 12 සම්පූර්ණ වේ.)

---

## 15. ඕඝ වර්ගය. (3)

(1-9 මේ වර්ගයේ අන්තිම සූත්‍රය මෙන් මුල් සූත්‍ර නවයත් අමතොගධ කොට ගැනීමෙන් මෙහි සූත්‍ර 10 සම්පූර්ණ වේ.)

---

### 10. උද්ධම්භාගිය සූත්‍රය.

1. (මේ ඡේදය මේ සංයුත්තයේ මුල් සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. "මහණෙනි, මේ උද්ධම්භාගිය සංයොජන පසක්වෙත්. කවර පසක්ද? රූප රාගය, අරූප රාගය, මානය, උද්ධච්චය, අවිජ්ජාව යනුයි මහණෙනි, මොව්හු වනාහි පඤ්ච උද්ධම්භාගිය සංයොජනයෝයි. මහණෙනි, මේ පඤ්ච උද්ධම්භාගිය සංයෝජනයන් විශෙෂයෙන් දැනීම පිණිස, පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස, පහකිරීම පිණිස පඤ්චබලයන් වැඩිය යුතුය.

3. "කවර පසක්ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ රාගය දුරුකිරීම කෙළවරකොට ඇති දොෂය දුරුකිරීම කෙළවරකොට ඇති මොහය දුරුකිරීම කෙළවරකොට ඇති අමෘතයට බැස ගන්නාවූ අමෘතය පහළ කරන්නාවූ අමෘතය කෙළවරකොට ඇත්තාවූ නිවනට නැමුණාවූ නිවනට හැරුණාවූ නිවනට බරවූ සද්ධාබලය වඩයි.

'රාගය දුරුකිරීම කෙළවරකොට ඇති දොෂය දුරුකිරීම කෙළවරකොට ඇති මොහය දුරුකිරීම කෙළවරකොට ඇති අමෘතයට බැස ගන්නාවූ අමෘතය පහළ කරන්නාවූ අමෘතය

කෙළවර කොට ඇත්තාවූ නිවනට නැමුණාවූ නිවනට හැරුණාවූ නිවනට බරවූ විරිය බලය වඩයි.

"රාගය දුරුකිරීම කෙළවරකොට ඇති දොෂය දුරුකිරීම කෙළවර කොට ඇති මොහය දුරුකිරීම කෙළවරකොට ඇති අමෘතයට බැස ගන්නාවූ අමෘතය පහළ කරන්නාවූ අමෘතය කෙළවරකොට ඇත්තාවූ නිවනට නැමුණාවූ නිවනට හැරුණාවූ නිවනට බරවූ සති බලය වඩයි.

"රාගය දුරුකිරීම කෙළවරකොට ඇති දොෂය දුරුකිරීම කෙළවර කොට ඇති මොහය දුරුකිරීම කෙළවරකොට ඇති අමෘතයට බැස ගන්නාවූ අමෘතය පහළ කරන්නාවූ අමෘතය කෙළවර කොට ඇත්තාවූ නිවනට නැමුණාවූ නිවනට හැරුණාවූ නිවනට බරවූ සමාධි බලය වඩයි.

"රාගය දුරුකිරීම කෙළවරකොට ඇති දොෂය දුරුකිරීම කෙළවරකොට ඇති මොහය දුරුකිරීම කෙළවරකොට ඇති අමෘතයට බැස ගන්නාවූ අමෘතය පහළ කරන්නාවූ අමෘතය කෙළවරකොට ඇත්තාවූ නිවනට නැමුණාවූ නිවනට හැරුණාවූ නිවනට බරවූ පඤ්ඤා බලය වඩයි.

4. "මහණෙනි, මේ පඤ්ච උද්ධම්භාගිය සංයොජනයන් දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂයකිරීම පිණිස පහකිරීම පිණිස මේ පඤ්ච බලයෝ වැඩිය යුත්තාහ.

(සයවෙනි බල සංයුත්තය නිමි.)

---

# 7. ඉද්ධිපාද සංයුත්තය.

## 1. චාපාල වර්ගය.

### 1. අපාරාපාර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු

සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී වනාහි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි, කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, මේ වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ සතර ඉද්ධිපාදයෝ සසරින් එතෙරට යෑම පිණිස පවතිත්.

3. "කවර සතරක්ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. වීර්‍ය්‍ය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. සිත අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. විමංසනය (ප්‍රඥාව) අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි.

4 "මහණෙනි, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ මේ සතර ඉද්ධිපාදය සසරින් එතෙරට යාම පිණිස පවතිත්.

---

## 2. ආරද්ධ විරද්ධ සූත්‍රය.

1. (මේ ඡේද මෙතැන් සිට 8 සූත්‍රය තෙක් 1 සූත්‍රයේ මෙනි.)

2. 'මහණෙනි, යම්කිසිවෙකුන් විසින් සතරඉද්ධිපාද වැඩීමට ආරම්භ නොකරන ලද්දාහුද, ඔවුන් විසින් මනාකොට දුක් නැතිකරන්නාවූ ආර්‍ය්‍ය මාර්ගය වැඩීමට ආරම්භ නොකරනලදී. මහණෙනි, යම්කිසිවකුන් විසින් සතර ඉද්ධිපාදයෝ වැඩීමට ආරම්භ කරන ලද්දාහුද ඔවුන් විසින් මනාකොට දුක් නැති කරන්නාවූ ආර්‍ය්‍ය මාර්ගය පටන්ගන්නා ලදහ.

3. "කවර සතරක්ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ඡන්දය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි.

"වීර්‍ය්‍ය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධි පාදය වඩයි.

"සිත අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධි පාදය වඩයි.

"විමසීම අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි.

4. "මහණෙනි, යම්කිසිවකු විසින් සතර ඉද්ධිපාදයෝ වැඩීමට පටන්ගන්නා ලද්දාහුද, ඔවුන් විසින් මනාකොට දුක් නැතිකරන්නාවූ ආර්‍ය්‍ය මාර්ගය වැඩීමට පටන්ගන්නා ලද්දේය.

"මහණෙනි, යම්කිසිවකුන් විසින් සතර ඉද්ධිපාදයෝ වැඩීමට පටන්ගන්නා ලද්දාහුද ඔවුන් විසින් මනාකොට දුක් නැති කරන්නාවූ ආර්‍ය්‍යමාර්ගය වැඩීමට පටන්ගන්නා ලද්දේය."

---

## 3. අරියනිය්‍යානික සූත්‍රය.

2. "මහණෙනි, වඩනලද්දාවූ බහුලකරනලද්දාවූ ආර්‍ය්‍යවූ නෛර්‍ය්‍යාණිකවූ මේ සතරපාදයෝ එය සම්පූර්ණ කරන්නහු මනාකොට දුක් ක්ෂය කිරීමට පමුණුවත්.

"කවර සතරක්ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙමේ ඡන්දය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුතු ඉද්ධිපාදය වඩයි.

"විරිය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි.

"සිත අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි.

"විමංසය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි.

4. "මහණෙනි, වඩනලද්දාවූ බහුලකරන ලද්දාවූ ආයර්‍ය්‍යවූ නෛර්‍ය්‍යාණිකවූ මේ සතර ඉද්ධිපාදයෝ එය සම්පූර්ණ කරන්නහු මනාකොට දුක් ක්ෂය කිරීමට පමුණුවත්"

---

## 4. නිබ්බිදා ඉද්ධි සූත්‍රය.

2. "මහණෙනි, වඩනලද්දාවූ බහුලකරනලද්දාවූ මේ සතර ඉද්ධිපාදයෝ ඒකාන්තයෙන් කලකිරීම පිණිස නො ඇලීම පිණිස දුක් නිරුද්ධ කිරීම පිණිස සංසිඳීම පිණිස විශෙෂයෙන් දැනීම පිණිස මනාකොට අවබොධය පිණිස නිවීම පිණිස පවතිත්.

3. "කවර සතරක්ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම ඡන්දය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක්ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි.

"වීර්‍ය්‍යය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි.

"සිත අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි.

"විමංසය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ මේ සතර ඉද්ධිපාදයෝ ඒකාන්තයෙන් කලකිරීම පිණිස නොඇලීම පිණිස දුක් නිරෝධ කිරීම පිණිස සංසිඳීම පිණිස විශෙෂයෙන් දැනීම පිණිස මනා අවබොධය පිණිස නිවීම පිණිස පවතිත්."

---

## 5. ඉද්ධිප්පදෙස සූත්‍රය.

2. "මහණෙනි, අතීතයෙහි ඇතැම් ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ ඉද්ධිපදෙස (මාර්ග තුන හා ඵලතුන) ඉපදවූවාහුද ඒ සියල්ලෝ සතර ඉද්ධිපාදයන් වැඩීමෙන් බහුල කිරීමෙන්

ඉපදවූහ. මහණෙනි, ඇතැම් ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ අනාගත කාලයෙහි ඉද්ධිප්පදෙස (මාර්ගතුන හා ඵල තුන) උපදවන්නාහුද ඒ සියල්ලෝ සතර ඉද්ධිපාදයන් වැඩීමෙන් බහුල කිරීමෙන් උපදවන්නාහ.

"මහණෙනි, ඇතැම් ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ යම් කාලයෙහි ඉද්ධිප්පදේසයන් උපදවත්ද ඒ සියල්ලෝ සතර ඉද්ධිපාදයන් වැඩීමෙන් බහුල කිරීමෙන් උපදවති.

3. "කවර සතරක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. වීර්‍ය්‍යය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. සිත අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. විමංසය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඍද්ධිපාදය වඩයි.

4. "මහණෙනි, ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ අතීත කාලයෙහි ඉද්ධිපාදයන් ඉපදවූහුද ඒ සියල්ලෝ සතර ඉද්ධිපාදයන් වැඩීමෙන් බහුල කිරීමෙන් ඉපදවූහ"

---

## 6. සමත්ත ඉද්ධි සූත්‍රය

2 "මහණෙනි, අතීත කාලයෙහි ඇතැම් ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ සමත්ත ඉද්ධිය (අර්හත් ඵලය) ඉපදවූවාහුද ඒ සියල්ලෝ සතර ඉද්ධිපාදයන් වැඩීමෙන් බහුල කිරීමෙන් ඉපදවූහ. මහණෙනි, අනාගත කාලයෙහි ඇතැම් ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ සමත්ත ඉද්ධිය උපදවන්නාහුද ඒ සියල්ලෝ සතර ඉද්ධිපාදයන් වැඩීමෙන් බහුල කිරීමෙන් උපදවන්නාහ. මහණෙනි, දැන් ඇතැම් ශ්‍රමණයෝ හෝ බ්‍රහ්මණයෝ සමත්ත ඉද්ධිය උපදවත්ද ඒ සියල්ලෝ මේ සතර ඍද්ධිපාදයන් වැඩීමෙන් බහුල කිරීමෙන් උපදවත්.

3. "කවර සතරක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක්

ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. වීර්‍ය්‍යය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. සිත අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. විමංසය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි.

4. "මහණෙනි, අතීත කාලයෙහි ඇතැම් ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ සමත්ත ඉද්ධි (අර්හත් ඵලය) ඉපදවූවාහුද ඒ සියල්ලෝ සතර ඉද්ධිපාදයන් වැඩීමෙන් බහුල කිරීමෙන් ඉපදවූහ. මහණෙනි, අනාගත කාලයෙහි ඇතැම් ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ සමත්ත ඉද්ධිය උපදවන්නාහුද ඒ සියල්ලෝ සතර ඉද්ධිපාදයන් වැඩීමෙන් බහුල කිරීමෙන් උපදවන්නාහ. මහණෙනි, දැන් ඇතැම් ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ සමත්ත ඉද්ධිය උපදවත්ද, ඒ සියල්ලෝ මේ සතර ඍද්ධිපාදයන් වැඩීමෙන් බහුල කිරීමෙන් උපදවත්."

---

## 7. ආසවක්ඛය ඉද්ධි සූත්‍රය

2. "මහණෙනි, අතීත කාලයෙහි ඇතැම් භික්ෂූහු ආශ්‍රවයන්ගේ නැතිකිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත් ඵල සමාධිය අර්හත් ඵල ප්‍රඥාව මේ ආත්මයෙහි තෙමේ විශෙෂ ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කළාහුද ඒ සියල්ලෝ සතර ඍද්ධිපාදයන් වැඩීමෙන් බහුල කිරීමෙන් ඊට පැමිණ වාසය කළාහුය. මහණෙනි, අනාගත කාලයෙහි ඇතැම් භික්ෂූහු ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත් ඵල සමාධිය හා අර්හත් ඵල ප්‍රඥාව ඒ ආත්මයෙහිම තෙමේ විශෙෂ ඥානයෙන් ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරන්නාහුද, ඒ සියල්ලෝ සතර ඍද්ධිපාදයන් වැඩීමෙන් බහුල කිරීමෙන් ඊට පැමිණ වාසය කරන්නාහුය. මහණෙනි, දැන් වනාහි ඇතැම් භික්ෂූහු ආශ්‍රවයන්ගේ නැතිකිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත් ඵල සමාධිය හා අර්හත් ඵල ප්‍රඥාව මේ අත් බැව්හිම තෙමේ විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කෙරෙත්ද, ඒ

සියල්ලෝ සතර ඍද්ධි පාදයන්ගේ වැඩීමෙන් බහුල කිරීමෙන් ඊට පැමිණ වාසය කරත්.

3. "කවර සතරක්ද යත්, මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීය්‍ය්‍ර්යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. වීය්‍ය්‍ර්යය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීය්‍ය්‍ර්යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. සිත අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීය්‍ය්‍ර්යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. විමංසාව අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීය්‍ය්‍ර්යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි.

4. "මහණෙනි, අතීතකාලයෙහි ඇතැම් භික්ෂූහු ආශ්‍රවයන්ගේ නැතිකිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත් ඵල සමාධිය හා අර්හත් ඵල ප්‍රඥාව මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කළාහුද, අනාගත කාලයෙහි ඇතැම් භික්ෂූහු ආශ්‍රවයන්ගේ නැති කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත් ඵල සමාධිය හා අර්හත් ඵල ප්‍රඥාව මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරන්නාහුද, දැන් කාලයෙහි ඇතැම් භික්ෂූහු ආශ්‍රවයන්ගේ නැති කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත් ඵල සමාධිය හා අර්හත් ඵල ප්‍රඥාව මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරත්.

"ඒ සියල්ලෝම මේ සතර ඉද්ධිපාදයන් වැඩීමෙන් බහුල කිරීමෙන් ඊට පැමිණ වාසය කරත්."

---

## 8. සම්මාසම්බුද්ධ සූත්‍රය.

2. "මහණෙනි, මේ සතර ඉද්ධිපාදයෝ වෙත්. කවර සතරක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීය්‍ය්‍ර්යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. වීය්‍ය්‍ර්යය අධිපති කොට ඇති සමාධියෙන් හා

සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. සිත අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. විමංසය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි.

3 'මහණෙනි, මේ සතර ඉද්ධිපාදයෝයි. මහණෙනි, මේ සතර ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල කළ බැවින් තථාගත තෙම අර්හත් සම්‍යක් සම්බුද්ධයයි කියනු ලැබේ."

---

## 9. පුබ්බේඤාණ සූත්‍රය.

2. "මහණෙනි, මේ ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදයයි. පෙර නොඇසූ විරූ ධර්මයන්හි මාහට නුවණැස පහළ විය. ඥානය පහළවිය ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ආලොකය පහළ විය. මහණෙනි, ඒ මේ ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වැඩිය යුතුයයි මට පෙර නොඇසූවිරූ ධර්මයන්හි නුවණැස පහළවිය. ඥානය පහළවිය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලොකය පහළ විය.

"මහණෙනි, වඩන ලද්දේයයි මට පෙර නොඇසූවිරූ ධර්මයන්හි නුවණැස පහළවිය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළවිය. ආලොකය පහළ විය.

3. "මහණෙනි, මේ වීර්‍ය්‍යය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදයයි පෙර නොඇසූ පිරූ ධර්මයන්හි මාහට නුවණැස පහළ විය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළ වීය. ආලොකය පහළ වීය. මහණෙනි, ඒ මේ වීර්‍ය්‍යය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වැඩිය යුතුයයි මට පෙර නොඇසූ විරූ ධර්මයන්හි නුවණැස පහළ විය. ඥානය පහළවිය ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලොකය පහළ විය.

"මහණෙනි, වඩන ලද්දේයයි මට පෙර නොඇසූ විරූ ධර්මයන්හි නුවණැස පහළවිය. ඥානය පහළවිය. ප්‍රඥාව පහළ වීය. විද්‍යාව පහළ වීය. ආලොකය පහළ වීය.

4. "මහණෙනි, මේ සිත අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදයයි. පෙර නොඇසූ විරූ ධර්මයන්හි මාහට නුවණැස පහළ විය. ඥානය පහළ වීය. ප්‍රඥාව පහළ වීය. විද්‍යාව පහළ වීය. ආලොකය පහළ විය. මහණෙනි, ඒ මේ සිත අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වැඩිය යුතුයයි මට පෙර නොඇසූ විරූ ධර්මයන්හි නුවණැස පහළ විය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය.

"මහණෙනි, වඩන ලද්දේයයි මට පෙර නොඇසූවිරූ ධර්මයන්හි නුවණැස පහළ විය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලොකය පහළ විය.

5. "මහණෙනි, මේ විමංසය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදයයි පෙර නොඇසූ විරූ ධර්මයන්හි මාහට නුවණැස පහළ වීය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළ විය විද්‍යාව පහළ විය. ආලොකය පහළ විය. මහණෙනි, ඒ මේ විමංසය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වැඩිය යුතුයයි මට පෙර නොඇසූවිරූ ධර්මයන්හි නුවණැස පහළ විය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ වීය. ආලොකය පහළ විය.

"මහණෙනි, වඩන ලද්දේයයි මට පෙර නොඇසූවිරූ ධර්මයන්හි නුවණැස පහළ විය. ඥානය පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලොකය පහළ විය.

## 10. චාපාලචෙතිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විශාලානුවර මහවනයෙහි කූටාගාර ශාලාවෙහි වැඩවසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ, පොරවා විශාලා නුවරට පිණ්ඩපාතය පිණිස වැඩිසේක. විශාලා නුවර පිඩු පිණිස හැසිර සවස් කාලයෙහි පිණ්ඩපාතයෙන් හැරී වැඩියේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් ඇමතුසේක.

2. "ආනන්දය, නිසීදනය ගනුව, චාපාල චෙතිය යම් තැනකද දිවා විහරණය සඳහා එහි යන්නෙමි"යි-ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ "එසේය, ස්වාමීනියි" භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දී නිසීදනය ගෙන භාග්‍යවතුන් වහන්සේගේ පසුපසින් ගියේය.

3. එකල්හි භාග්‍යවතුන් වහන්සේ චාපාල චෙතිය යම් තැනකද එතැනට වැඩියහ. වැඩ, පැනවූ අස්නෙහි වැඩහුන් සේක. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේද භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක හිඳගත්තේය. එක්පසෙක හිඳගත් ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්ට භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළසේක.

4. "ආනන්දය, විශාලාව සිත්කළුය, උදෙන චෛත්‍යය සිත්කළුය, ගොතමක චෛත්‍යය සිත්කළුය, සත්තම්බ චෛත්‍යය සිත්කළුය, බහුපුත්ත චෛත්‍යය සිත්කළුය. සාරන්දද චෛත්‍යය සිත්කළුය, චාපාල චෛත්‍යය සිත්කළුය.

"ආනන්දය යම් කිසිවෙකු විසින් මේ සතර ඉද්ධිපාදයෝ වඩනලද්දාහුද බහුලකරන ලද්දාහුද, යානාවක් මෙන් කරන ලද්දාහුද, සිටින තැනක් මෙන් කරනලද්දාහුද පුරුදුකරන ලද්දාහුද මනාකොට පටන්ගන්නා ලද්දාහුද හෙතෙම කැමැත්තේ නම් ආයුෂ් කල්පයක් හෝ ආයුෂ් කල්පයකට අඩුව වැඩිව හෝ සිටින්නේය.

5. "ආනන්දය, තථාගතයන් විසින් වනාහි සතර ඉද්ධිපාදයෝ වඩන ලද්දාහුය. නැවත නැවත වඩන ලද්දාහුය, යානාවක් මෙන් කරන ලද්දාහුය. සිටින තැනක් මෙන් කරන ලද්දාහුය, අධිෂ්ඨාන කරන ලද්දාහුය, පුරුදුකරන ලද්දාහුය. මනාකොට පටන්ගන්නා ලද්දාහුය. ආනන්දය, තථාගතයන් වහන්සේ කැමති වන්නේ නම් ආයුෂ් කල්පයක් හෝ ආයුෂ් කල්පයකට අඩුව වැඩිව හෝ සිටින්නේයයි" වදාළේය. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ වනාහි ඖදාරික නිමිති කරන කල්හි ඖදාරික ඇඟවීම් කරනු ලබන කල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ තේරුම් ගැනීමට අසමත් වීය.

6. 'බොහෝ ජනයාට හිත පිණිස, බොහෝ ජනයාට සැප පිණිස, ලෝකයාට අනුකම්පා පිණිස දෙව් මිනිසුන්ගේ අර්ථය පිණිස හිත පිණිස සැප පිණිස ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, කල්පයක් සිටිනසේක්වා!' සුගතයන් වහන්ස, කල්පයක් සිටිනසේක්වා!' අනික් පෘථග්ජනයෙකු මෙන් මාරයා විසින් ආවේසවූ සිත් ඇත්තේ භාග්‍යවතුන්වහන්සේට යාඥා නොකෙළේය.

භාග්‍යවතුන් වහන්සේ විසින් දෙවනුවත් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට මෙය වදාළසේක.

7. "ආනන්දය, විශාලානුවර සිත්කළුය, උදෙනී චෛත්‍යය සිත්කළුය. ගොතමක චෛත්‍යය සිත්කළුය. සත්තම්බ චෛත්‍යය සිත්කළුය. බහුපුත්ත චෛත්‍යය සිත්කළුය. සාරන්දද චෛත්‍යය සිත්කළුය. චාපාල චෛත්‍යය සිත්කළුය.

"ආනන්දය, යම්කිසිවෙකු විසින් මේ සතර ඉද්ධිපාදයෝ වඩනලද්දාහුද බහුලකරන ලද්දාහුද යානාවක් මෙන් කරන ලද්දාහුද, සිටින තැනක්මෙන් කරනලද්දාහුද පුරුදුකරන ලද්දාහුද මනාකොට පටන්ගන්නා ලද්දාහුද හෙතෙම කැමැති වන්නේ නම් ආයුෂ් කල්පයක් හෝ ආයුෂ් කල්පයකට අඩුව හෝ වැඩිව හෝ සිටින්නේය.

8. "ආනන්දය, තථාගතයන් විසින් වනාහි සතර ඉද්ධිපාදයෝ වඩනලද්දාහුය. නැවත නැවත වඩනලද්දාහුය.

යානාවක් මෙන් කරවනලද්දාහුය. සිටින තැනක් මෙන් කරන ලද්දාහුය. අධිෂ්ඨාන කරනලද්දාහුය. පුරුදුකරන ලද්දාහුය. මනාකොට පටන්ගන්නා ලද්දාහුය. ආනන්දය, තථාගතයන් වහන්සේ කැමතිවන්නේ නම් ආයුෂ් කල්පයක් හෝ ආයුෂ් කල්පයකට අඩුව වැඩිව හෝ සිටින්නේයයි" වදාළේය. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ වනාහි ඖදාරික නිමිති කරන කල්හි ඖදාරික ඇඟවීම් කරනු ලබන කල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ තේරුම් ගැනීමට අසමත් විය.

**9** 'බොහෝ ජනයාට හිත පිණිස, බොහෝ ජනයාට සැප පිණිස ලොකයාට අනුකම්පා පිණිස දෙව් මිනිසුන්ගේ අර්ථය පිණිස, හිත පිණිස, සැප පිණිස, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, කල්පයක් සිටින සේක්වා! සුගතයන් වහන්ස කල්පයක් සිටිනසේක්වා!' අනික් පෘථග්ජනයෙකු මෙන් මාරයා විසින් ආවේසවූ සිත් ඇත්තේ භාග්‍යවතුන් වහන්සේට යාඥා නොකෙළේය.

**10.** තුන්වෙනුවත් භාග්‍යවතුන් වහන්සේ විසින් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට මෙය වදාළසේක

'ආනන්දය, විසාලා නුවර සිත්කළුය. උදේනි චෛත්‍යය සිත්කළුය. ගොතමක චෛත්‍යය සිත්කළුය. සත්තම්බ චෛත්‍යය සිත්කළුය. බහුපුත්ත චෛත්‍යය සිත්කළුය. සාරන්දද චෛත්‍යය සිත්කළුය. චාපාල චෛත්‍යය සිත්කළුය. ආනන්දය, යම්කිසිවකු විසින් සතර ඉද්ධිපාදයෝ වඩනලද්දාහුද නැවත නැවත වඩනලද්දාහුද යානාවක් මෙන් කරන ලද්දාහුද සිටින තැනක් මෙන් කරනලද්දාහුද අධිෂ්ඨාන කරන ලද්දාහුද පුරුදු කරන ලද්දාහුද මනාකොට ආරම්භ කරන ලද්දාහුද ආනන්දය, හෙතෙම කැමති වන්නේනම් කල්පයක් හෝ කල්පයට අඩුව වැඩිව හෝ සිටින්නේය.

**11.** "ආනන්දය, තථාගතයන් විසින් වනාහි සතර ඉද්ධිපාදයෝ වඩනලද්දාහුය, නැවත නැවත වඩනලද්දාහුය, යානාවක් මෙන් කරන ලද්දාහුය, සිටීමට තැනක් මෙන් කරනලද්දාහුය අදිෂ්ඨාන කරන ලද්දාහුය. පුරුදු කරන ලද්දාහුය.

මනාකොට ආරම්භ කරන ලද්දාහුය. ආනන්දය, තථාගතයන් කැමතිවන්නේනම්, කල්පයක් හෝ කල්පයකට අඩුව වැඩිව හෝ සිටින්නේය" යනුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ ඖදාරික නිමිති කරන කල්හි ඖදාරික ඇඟවීම කරනු ලබන කල්හි ආයුෂ්මත් ආනන්දතෙමේ තේරුම්ගැනීමට අසමත් වීය.

'බොහෝ ජනයාට හිත පිණිස බොහෝ ජනයාට සැප පිණිස ලෝකයාට අනුකම්පා පිණිස දෙව් මිනිසුන්ගේ අර්ථය පිණිස සැප පිණිස ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, කල්පයක් සිටින සේක්වා යයි' අනික් පෘථග්ජනයකුමෙන් මාරයා විසින් ආවේසවූ සිත් ඇත්තේ භාග්‍යවතුන් වහන්සේට යාඥා නොකෙළේය.

12. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට ඇමතූසේක. "ආනන්දය, දැන් නුඹ යව, දැන් ඊට කල් දනුව." "ස්වාමීනි, එසේ යයි" ආයුෂ්මත් ආනන්දතෙමේ භාග්‍යවතුන් වහන්සේට උත්තර දී ආසනයෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ ගෞරව කොට නුදුරු තැනෙක්හි වූ එක්තරා ගසක් මුල හුන්නේය.

13. ඉක්බිති පාපී මාරතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, දැන් පිරිනිවන් පාන සේක්වා, සුගතයන් වහන්ස, පිරිනිවන් පාන සේක්වා. ස්වාමීනි, දැන් පිරිනිවන් පාන කාලයයි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් 'යම්තාක් මාගේ ශ්‍රාවක භික්ෂූහු ව්‍යක්ත නොවූවාහුද, වීනීත නොවූවාහුද විසාරද නොවූවාදහුද නිවනට නොපැමිණියාහුද බහුශ්‍රැත නොවූවාහුද ධර්මධර නොවූවාහුද ධර්මානුධර්මයෙහි නොපිළිපන්නාහුද සුදුසු ප්‍රතිපදාවට පිළිපන්නෝ නොවූවාහුද ධර්මයට අනුව නොහැසුරුණු හුද ස්වකීයාචාර්‍ය්‍යවාද ඉගෙන නොකියත්ද, දෙශනා නොකරත්ද, නොපණවත්ද, විවරණය නොකරද්ද, ප්‍රකට නොකෙරෙත්ද බෙදා නොදක්වත්ද, උපන්නාවූ පරවාද හේතු සහිතව මනාකොට ගෙන නිග්‍රහ කොට නෛර්‍ය්‍යානික කොට

ධර්මය දේශනා නොකරත්ද, පාපිය, මම ඒතාක් පිරිනිවන් නොපාන්නෙමි”යි යන වචනය කියන ලදී.

‘ස්වාමීනි, දැන් වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක භික්ෂූහු ව්‍යක්තවූහ. විනීතවූහ. විශාරදවූහ. නිවනට පැමිණියාහුය. බහුශ්‍රැතවූවාහුය ධර්මධරවූවාහුය. ආර්‍යධර්මයට අනුව පිළිපන්නාහුය. සුදුසු පිළිවෙතට පිළිපන්නාහුය. ධර්මයට අනුකූල පැවතුම් ඇත්තාහුය. ස්වකීය ආචාර්‍ය වාද ඉගෙන කියන්නාහුය. දේශනා කරන්නාහුය. පණවන්නාහුය. තබන්නාහුය. විවරණය කරන්නාහුය. බෙදන්නාහුය ප්‍රකට කරන්නාහුය. උපන්පරවාද හේතු සහිතව මනාකොට නිග්‍රහකොට ධර්මය නෛර්‍යාණිකකොට දේශනා කරන්නාහුය. ස්වාමීනි, භාග්‍යවතුන්වහන්ස, දැන් පිරිනිවන් පානාසේක්වා. සුගතයන් වහන්ස, පිරිනිවන් පානා සේක්වා. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේට දැන් පිරිනිවන්පානා කාලයයි.

14. “ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේ විසින් ‘යම්තාක් මාගේ ශ්‍රාවිකා භික්ෂූණීහු ව්‍යක්ත නොවෙත්ද, විනීත නොවෙත්ද, විශාරද නොවෙත්ද, නිවනට නොපැමිණියාහුද, බහුශ්‍රැත නොවූවාහුද, ධර්මධර නොවූවාහුද, ධර්මානුධර්මයෙහි නොපිළිපන්නාවූවාහුද, සුදුසු ප්‍රතිපදාවට පිළිපන්නෝ නොවූවාහුද ධර්මයට අනුව නොහැසුරුණාහුද, ස්වකීයාචාර්‍යවාද ඉගෙන නොකියත්ද, දෙශනා නොකරත්ද, නොපණවත්ද, විවරණය නොකරත්ද, ප්‍රකට නොකරත්ද, බෙදා නොදක්වත්ද, උපන්නාවූ පරවාද හේතු සහිතව මනාකොට ගෙන නිග්‍රහකොට නෛර්‍යානික කොට ධර්මය දේශනා නොකරත්ද පාපිය, මම ඒතාක් පිරිනිවන් නොපාන්නෙමි’ යි යන වචනය කියන ලදී.

“ස්වාමීනි, දැන් වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවික භික්ෂූණීහු ව්‍යක්තවූහ. විනීතවූහ. විශාරදවූහ. නිවනට පැමිණියාහුය. බහුශ්‍රැත වූවාහුය. ධර්මධර වූවාහුය. ආර්‍ය ධර්මයට අනුව පිළිපන්නාහුය. ධර්මයට අනුව පිළිපන්නාහුය. ධර්මයට අනුකූල පැවතුම් ඇත්තාහුය. ස්වකීයාචාර්‍ය වාද

ඉගෙන කියත්. දේශනා කරත්. පනවත්. තබත්. විවරණය කරත්. විභරණය කරත්. ප්‍රකට කරත්. උපන් පරවාද හේතු සහිතව මනාකොට නිග්‍රහකොට නෛර්‍යාණිකකොට ධර්මය දේශනා කරත්.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන්පානා සේක්වා! සුගතයන් වහන්සේ පිරිනිවන්පානා සේක්වා! දැන් පිරිනිවීමට කාලයයි.

15 "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම්තාක් මාගේ ශ්‍රාවක උපාසකයෝ ව්‍යක්ත නොවෙත්ද, 'යම්තාක් මාගේ ශ්‍රාවක උපාසකයෝ ව්‍යක්ත නොවූවාහුද, විනීත නොවූවාහුද විශාරද නොවූවාහුද නිවනට නොපැමිණියාහුද බහුශ්‍රැත නොවූවාහුද ධර්මධර නොවූවාහුද ධර්මානුධර්මයෙහි නොපිළිපන්නාහුද සුදුසු ප්‍රතිපදාවට පිළිපන්නෝ නොවූවාහුද ධර්මයට අනුව නොහැසුරුණාහුද, ස්වකීයාචාර්‍යවාද ඉගෙන නොකියත්ද, දෙශනා නොකරත්ද, නොපණවත්ද, විවරණය නොකරත්ද, ප්‍රකට නොකරත්ද, බෙදා නොදක්වත්ද, උපන්නාවූ පරවාද හේතු සහිතව මනාකොට ගෙන නිග්‍රහ කොට නෛර්‍යාණික කොට ධර්මය දේශනා නොකරත්ද, පාපිය, මම ඒතාක් පිරිනිවන් නොපාන්නෙමි'යි යන වචනය කියන ලදී.

"ස්වාමීනි, දැන් වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක උපාසකයෝ ව්‍යක්තවූහ. විනීතවූහ. විශාරදවූහ නිවනට පැමිණියාහුය. බහුශ්‍රැත වූවාහුය. ධර්මධර වූවාහුය. ආර්‍ය ධර්මයට අනුව පිළිපන්නාහුය. ධර්මයට අනුව පිළිපන්නාහුය. ධර්මයට අනුකූල පැවැතුම් ඇත්තාහුය. ස්වකීයාචාර්‍ය වාද ඉගෙන කියත්. දේශනා කරත්. පනවත්. තබත්. විවරණය කරත්. විභරණය කරත්. ප්‍රකට කරත්. උපන් පරවාද හේතු සහිතව මනාකොට නිග්‍රහකොට නෛර්‍යාණික කොට ධර්මය දේශනා කරත්.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන්පානා සේක්වා! සුගතයන් වහන්සේ පිරිනිවන්පානා සේක්වා! දැන් පිරිනිවීමට කාලය වෙයි.

16. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම්තාක් මාගේ ශ්‍රාවිකා උපාසිකාවෝ ව්‍යක්ත නොවෙත්ද, විනීත නොවෙත්ද, විශාරද නොවෙත්ද, නිවනට නොපැමිණියාහුද, බහුශ්‍රැත නොවූවාහුද, ධර්මධර නොවූවාහුද, ආය්‍ය්‍ධර්මයට අනුව නොපිළිපන්නාහුද, සුදුසු පිළිවෙතට නොපිළිපන්නාහුද ධර්මයට අනුව පැවතුම් නැත්තාහුද ස්වකීය ආචාය්‍ය්‍ය වාද ඉගෙන නොකියත්ද, දේශනා නොකරත්ද, නොපනවත්ද, විවරණය නොකරත්ද, ප්‍රකාශ නොකරත්ද, නොබෙදත්ද, ප්‍රකට නොකරත්ද, උපන්නාවූ පරවාද හේතු සහිතව මනාකොට නිග්‍රහකොට නෛය්‍ය්‍ාණික කොට ධර්මය දේශනා නොකෙරෙත්ද, පාපිය. ඒතාක් මම පිරිනිවන් නොපාන්නෙමි' යන වචනය කියන ලදී.

"ස්වාමීනි, දැන් වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවිකා උපාසිකාවෝ ව්‍යක්තවූහ. විනීතවූහ. විශාරදවූහ. නිවනට පැමිණියාහුය. බහුශ්‍රැත වූවාහුය. ධර්මධරවූවාහුය ආය්‍ය්‍ ධර්මයට අනුව පිළිපන්නාහුය. ධර්මයට අනුව පිළිපන්නාහුය. ධර්මයට අනුකූල පැවැතුම් ඇත්තාහුය. ස්වකීයාචාය්‍ය්‍ වාද ඉගෙන කියත්. දේශනා කරත්. පනවත්. තබත්. විවරණය කරත්. විහරණය කරත්. ප්‍රකට කරත් උපන් පරවාද හේතු සහිතව මනාකොට නිග්‍රහකොට නෛය්‍ය්‍ාණික කොට ධර්මය දේශනා කරත්.

17. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පානා සේක්වා! සුගතයන් වහන්සේ පිරිනිවන් පානා සේක්වා! දැන් පිරිනිවීමට කාලය වෙයි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් 'යම්තාක් මාගේ ශාසනය ධ්‍යානාදි වශයෙන්ද සමාධියට නොපැමිණෙන්නේද අභිඥා වශයෙන් වැඩීමට නොපැමිණියේද හැම දිශාවන්හි නොපැතුරුණේද බොහෝ දෙනා විසින් නොදැනගන්නා ලද්දේද, විශාල බවට නොපැමිණියේද දෙවි මිනිසුන් විසින් ප්‍රකාශ නොකරන ලද්දේද, පාපිය, මම ඒතාක් පිරිනිවන් නොපාන්නෙමි' යි කියන ලදී.

"ස්වාමීනි, දැන් භාග්‍යවතුන් වහන්සේගේ ශාසනය ධ්‍යානාදි වශයෙන් සමෘද්ධියට පැමිණියේය. වැඩීමට පැමිණියේය. අභිඥා වශයෙන් හැම දිශාවන්හි පැතුරුණේය. බොහෝ දෙනා විසින්

දැනගන්නා ලද්දේය. විශාල බවට පැමිණියේය. දෙව් මිනිසුන් විසින් ප්‍රකාශ කරන ලදී, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස දැන් පිරිනිවන් පානා සේක්වා! සුගතයන් වහන්ස, පිරිනිවන්පානා සේක්වා! ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, දැන් පිරිනිවීමට කාලයයි."

18. මෙසේ කීකල්හි භාග්‍යවතුන් වහන්සේ පාපී මාරයාට මෙසේ වදාළසේක. "පාපීය, තෝ වෙහෙස නොවෙව. නොබෝ කලකින් තථාගතයන්ගේ පිරිනිවීම වන්නේය. මෙයින් තුන් මසක්හුගේ ඇවෑමෙන් තථාගත තෙමේ පිරිනිවන් පාන්නේයයි" වදාළේය.

19. එකල්හි භාග්‍යවතුන් වහන්සේ චාපාල චෛත්‍යයෙහි සිහි නුවණින් යුක්තව ආයුසංස්කාරය අත්හළේය. භාග්‍යවතුන් වහන්සේ විසින් ආයු සංස්කාරය අත්හළ කල්හි මහා පොළොව කම්පාවිය. භයානකවූ ලොමු ඩැහැගන්නාවූ අහස ගිගුරුම් වූහ.

20. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන ඒ වේලාවෙහි මේ උදානය නිකුත් කළ සේක.

"බුද්ධ මුනි තෙමේ භවය ඇති කරන හෙයින් භව සංඛාර යන නම ඇත්තාවූද, තුල අතුලයයි කියන ලද්දාවූද, ලෞකික කර්ම අත්හළේය. යුද්ධ භූමියෙහි මහා යොධයෙක් මෙන් ආත්මභාවය උපදවන ක්ලෙශ කවචය (යුද්ධ ඇඳුම) අධ්‍යාත්මයෙහි ඇළුණේ සමාධියෙන් යුක්තවූයේ බිඳුලූවේය."

---

## 2. පාසාද කම්පන වර්ගය.

### 1. හෙතු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතුසේක.

'ස්වාමීනියි' කියා ඒ භික්ෂූන් භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, බුදුවීමට පළමුව බුදු නොවූ බෝසත්වූ මාහට මෙබඳු අදහසක් පහළවිය. ඉද්ධිපාදයන් වැඩීමට හේතුව කවරේද, ප්‍රත්‍යය කවරේද" යනුයි.

3. "මහණෙනි, ඒ මට මේ අදහස පහළවිය. 'මේ ශාසනයෙහි මහණතෙමේ ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඍද්ධිපාදය වඩන්නේය. කෙසේද? මේ ආකාරයෙන් මාගේ ඡන්දය ඉතා හැකුළුණේ නොවන්නේය. ඉතා එසවුණේත් නොවන්නේය. ඇතුළත හැකුළුණේත් නොව පිටත විසිර ගියේත් නොවන්නේය. රහත් වීමට පෙර මෙන් රහත් වීමට පසුවද පසුව මෙන් පෙරද, ශරීරයෙහි යට මෙන් උඩද උඩ මෙන් යටද, දවල් මෙන් රෑද රෑ මෙන් දවල්ද, එක හා සමාන හැඟීම් ඇතිව වාසය කරන්නේය කියායි. මෙසේ නොවැසූ විවෘත කළ සිතින් බැබලීම් සහිත සිත වඩයි.

4. "වීර්‍ය්‍යය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඍද්ධිපාදය වඩයි. කෙසේද? 'මේ ආකාරයෙන් මාගේ වීර්‍ය්‍යය ඉතා හැකුළුණේත් නොවන්නේය. ඉතා එසවුණේත් නොවන්නේය. ඇතුළත හැකුළුණේත් නොවන්නේය. පිටත විසිර ගියේත් නොවන්නේය. පෙර පසු දෙක්හිම එකහා සමාන හැඟීම් ඇතිව වාසය කරයි. රහත්වීමට පළමු මෙන්ම පසුවත් පසුව මෙන්ම පෙරත් ශරීරයෙහි උඩ මෙන්ම යටත් යට මෙන්ම උඩත්, දවල් මෙන්ම රෑත් රෑ මෙන් දවල්හිත්, එක හා සමාන හැඟීම් ඇතිව වාසය කරන්නේය' කියායි. මෙසේ විවෘතවූ නොවැසූ සිතින් බැබලීම් සහිත සිතක් වඩයි.

5. "චිත්තය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඍද්ධිපාදය වඩයි. කෙසේද? 'මේ ආකාරයෙන් මාගේ සිත ඉතා හැකුළුණේද නොවන්නේය. ඉතා එසවුණේද නොවන්නේය. ඇතුළත හැකුළුණේද නොවන්නේය. පිටත්හි විසිර ගියේද නොවන්නේය. පෙර හා පසුව එකහා

සමාන හැඟීම් ඇතිව වාසය කරන්නේය. පෙර මෙන් පසුවද පසුව මෙන් පෙරද, යටිකය මෙන් උඩු කයද උඩු කය මෙන් යටිකයද, දවල් මෙන් රෑද රෑ මෙන් දවල්ද, එකහා සමාන හැඟීම් ඇතිව වාසය කරන්නේය' කියායි. මෙසේ නොවසන ලද විවෘත කළ සිතින් බැබලීම් සහිත සිත වඩයි.

**6.** "විමංසය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීය‍ර්‍යයෙන් යුත් ඍද්ධිපාදය වඩයි. කෙසේද? 'මේ ආකාරයෙන් මාගේ විමංසය ඉතා හැකුළුණේත් නොවන්නේය. ඉතා එසවුණේත් නොවන්නේය. ඇතුළත හැකුළුණේත් නොවන්නේය. පිටත්හි විසිර ගියේත් නොවන්නේය. පෙර පසු සමාන හැඟීම් ඇතිව වාසය කරයි. පෙර මෙන්ම පසුවද පසුව මෙන්ම පෙරද, යටි කයෙහි මෙන්ම උඩු කයෙහිද උඩුකයෙහි මෙන්ම යටි කයෙහිද, දවල් මෙන්ම රෑද රෑ මෙන්ම දවල්ද, සමාන හැඟීම් ඇතිව වාසය කරන්නේය' කියායි. මෙසේ නොවසන ලද විවෘතවූ සිතින් බැබලීම් සහිත සිත වඩයි.

**7.** "මහණෙනි, මහණතෙම සතර ඍද්ධිපාදයන් මෙසේ වැඩූකල්හි නැවත නැවත වැඩූ කල්හි නොයෙක් වැදෑරුම් ඍද්ධි කොටස් දක්වන්නේය. එක් කෙනෙක්ව බොහෝ දෙනෙක් වෙත්. බොහෝ දෙනෙක්ව එක්කෙනෙක්ද වේ. ප්‍රකට බවට මුවහ බවට අහසෙහි මෙන් බිත්තියෙන් ඔබට පර්වතයෙන් ඔබට ප්‍රාකාරයෙන් ඔබට නොගැටී යයි. ජලයෙහි මෙන් පොළොවෙහි ගැලීම් කිමිදීම් කරයි. පොළොවෙහි මෙන් ජලයෙහි දිය නොබිඳිමින් යයි. පක්ෂියෙකු මෙන් අහසෙහි යේද පය‍ර්‍යංකයෙන් හිඳගෙන මහත් ඍද්ධි ඇති මහත් අනුභාව ඇති මේ සඳ හිරු දෙදෙනා පවා අතින් ස්පර්ශ කරයි. පිරිමදියි. බ්‍රහ්මලෝක පවා කයින් වසඟ බවට පමුණුවයි.

**8.** "මහණෙනි, මහණතෙමේ මෙසේ සතර ඍද්ධිපාදයන් මෙසේ වැඩූ කල්හි නැවත නැවත වැඩූ කල්හි මිනිස් බව ඉක්මවූ පිරිසිදුවූ දිව කණින් දිව්‍යමයවූද මනුෂ්‍යමයවූද දුරවූද ළංවූද ශබ්ද අසයි. මහණෙනි, මහණතෙමේ මෙසේ සතර ඍද්ධිපාදයන් වැඩූ කල්හි නැවත නැවත වැඩූ කල්හි අනික්

සත්වයන්ගේ අනික් පුද්ගලයන්ගේ සිතින් සිත වෙන් කොට දැනගනියි. රාග සහිත සිත රාග සහිත සිතයයි දැනගනියි. රාග රහිත සිත රාග රහිත සිතයයි දැනගනියි. දොස සහිත සිත දොස සහිත සිතයයි දැනගනියි. දොස රහිත සිත දොස රහිත සිතයයි දැනගනියි. මොහ සහිත සිත මොහ සහිත සිතයයි දැනගනියි. මොහ රහිත සිත මොහ රහිත සිතයයි දැනගනියි.

**9.** "හැකිලුන සිත හැකිලුන සිතයයි දැනගනියි. විසිරගිය සිත විසිර ගිය සිතයයි දැනගනියි. මහග්ගත සිත මහග්ගත සිතයයි දැනගනියි. මහග්ගත නොවූ සිත මහග්ගත නොවූ සිතයයි දැනගනියි. උසස් සිත උසස් සිතයයි දැනගනියි. උසස් නොවූ සිත උසස් නොවූ සිතයයි දැනගනියි. සමාහිත නොවූ සිත සමාහිත නොවූ සිතයයි දැනගනියි. සමාහිත සිත සමාහිත සිතයයි දැනගනියි. නොමිඳුනු සිත නොමිඳුනු සිත යයි දැනගනියි. මිදුනු සිත මිදුනු සිතයයි දැනගනියි.

**10.** "මහණෙනි, මහණතෙම මෙසේ සතර ඉද්ධිපාදයන් වැඩූකල්හි නැවත නැවත වැඩූකල්හි නොයෙක් වැදෑරුම් පෙරවිසූ කඳ පිළිවෙල සිහි කරයි. ඒ කෙසේදයත්?

"ජාති එකක්ද ජාති දෙකක්ද ජාති තුනක්ද ජාති සතරක්ද ජාති පහක්ද ජාති දහයක්ද ජාති විස්සක්ද ජාති තිහක්ද ජාති හතලිහක්ද ජාති පණහක්ද ජාති සියයක්ද ජාති දහසක්ද ජාති ලක්ෂයක්ද නොයෙක් සංවට්ට කල්පයන්ද නොයෙක් විවට්ට කල්පයන්ද නොයෙක් සංවට්ට විවට්ට කල්පයන් අසවල් තැන සිටියෙමි. නම මෙසේය. ගොත්‍රය මෙසේය වර්ණය මෙසේය. ආහාරය මෙසේය. මෙසේ සැප දුක් වින්දේ මෙසේ ආයු කෙළවර විය. හෙතෙම එයින් චුතව මෙහි උපන්නේය. මෙසේ ආකාර සහිතව කොටස් සහිතව නොයෙක් වැදෑරුම් පෙරවිසූ කඳ පිළිවෙල සිහි කරයි.

**11.** "මහණෙනි, මෙසේ සතර ඉද්ධිපාදයන් වැඩූකල්හි නැවත නැවත වැඩූ කල්හි මිනිස්බව ඉක්මවූ පිරිසිදු දිව ඇසින් චුතවන්නාවූද උපදින්නාවූද හීනවූද, ප්‍රණීතවූද, මනා පැහැ

ඇත්තාවූද, දුර්වර්ණවූද සැපයට පැමිණියාවූද, දුකට පැමිණියාවූද, සත්වයන් දකියි. කර්මානුකූලව උපන් සත්වයන් දකියි.

"මේ පින්වත් සත්වයෝ ඒකාන්තයෙන් කාය දුශ්චරිතයෙන් යුක්ත වූවාහුය. වචී දුශ්චරිතයෙන් යුක්ත වූවාහුය. මනො දුෂ්චරිතයෙන් යුක්ත වූවාහුය. ආර්‍යයන්ට නිග්‍රහ කළාවූ මිසදිටු වූවාහුය. මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන් වූවාහුය. ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇත්තාවූ විවසව වැටෙන්නාවූ නිරයෙහි උපන්නාහුය.

12. "මේ පින්වත් සත්වයෝ ඒකාන්තයෙන් කාය සුචරිතයෙන් යුක්තවූවාහුය. වචී සුචරිතයෙන් යුක්තවූවාහුය. මනො සුචරිතයෙන් යුක්තවූවාහුය. ආර්‍යයන්ට නිග්‍රහ නොකළාහුය. සම්‍යක්දෘෂ්ටියෙන් යුක්ත වූවාහුය. සම්‍යක් දෘෂ්ටි කර්ම සමාදන් වූවාහුය. ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් යුත් ස්වර්ගලෝකයෙහි උපන්නාහුයයි කර්මානුකූලව උපන් සත්වයන් දකියි.

"මෙසේ මිනිස්බව ඉක්මවූ පිරිසිදුවූ දිවඇසින් චුතවන්නාවූද උපදින්නාවූද හීනවූද ප්‍රණීතවූද මනා වර්ණ ඇත්තාවූද, යහපත් වර්ණ ඇත්තාවූද, සැප ඇත්තාවූද සැප නැත්තාවූද සත්වයන් දකියි. කර්මානුකූලව උපන් සත්වයන් දකියි.

13. "මහණෙනි, මහණතෙමේ මෙසේ සතර ඉද්ධිපාදයන් වැඩූකල්හි නැවත නැවත වැඩූකල්හි ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධියත් අර්හත් ඵල ප්‍රඥාවත් මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරන්නේය."

---

## 2. මහප්ඵල සූත්‍රය.

1. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 1 ඡේදය මෙනි)

2. 'මහණෙනි, වඩනලද්දාවූ බහුලකරන ලද්දාවූ මේ සතර ඉද්ධිපාදයෝ මහත්ඵල ඇත්තාහු වෙත්. මහානිසංස ඇත්තාහු වෙත්.

"මේ සතර ඍද්ධිපාදයෝ කෙසේ වඩන ලද්දාහු කෙසේ බහුල කරන ලද්දාහු වෙත්ද, මහත්ඵල මහානිසංස වෙත්ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම 'මේ ආකාරයෙන් මගේ ඡන්දය ඉතා හැකුළුණේ නොවන්නේය. ඉතා එසවුණේ නොවන්නේය. අධ්‍යාත්මයෙහි හැකිලුනේ නොවන්නේය. පිටත විසිර ගියේ නොවන්නේය. පෙර පසු එක හා සමාන හැඟීම් ඇතිව වාසය කරන්නේය.

"පෙර මෙන් පසුද පසුව මෙන් පෙරද, යටි කයෙහි මෙන් උඩු කයෙහිද උඩු කයෙහි මෙන් යටි කයෙහිද, දවල් මෙන් රෑද රෑ මෙන් දවල්ද, සමාන හැඟීම් ඇතිව වාසය කරන්නේය. මෙසේ විවෘතවූ සිතින් නොවැසුණාවූ සිතින් බැබලීම් සහිත සිත වඩන්නේයයි' ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුක්තවූ ඍද්ධිපාදය වඩන්නේද,

3. "මේ ආකාරයෙන් මගේ වීර්‍ය්‍යය ඉතා හැකුළුණේ නොවන්නේය. ඉතා එසවුණේ නොවන්නේය. අධ්‍යාත්මයෙහි හැකිලුනේ නොවන්නේය. පිටත විසිර ගියේ නොවන්නේය. පෙර පසු එක හා සමාන හැඟීම් ඇතිව වාසය කරන්නේය.

'පෙර මෙන් පසුද පසුව මෙන් පෙරද, යටි කයෙහි මෙන් උඩු කයෙහිද උඩු කයෙහි මෙන් යටි කයෙහිද, දවල් මෙන් රෑද රෑ මෙන් දවල්ද, සමාන හැඟීම් ඇතිව වාසය කරන්නේය. මෙසේ විවෘතවූ සිතින් නොවැසුණාවූ සිතින් බැබලීම් සහිත සිත වඩන්නේයයි' වීර්‍ය්‍යය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුක්තවූ ඍද්ධිපාදය වඩන්නේද,

4. 'මේ ආකාරයෙන් මගේ සිත ඉතා හැකුළුණේ නොවන්නේය. ඉතා එසවුණේ නොවන්නේය. අධ්‍යාත්මයෙහි හැකිලුනේ නොවන්නේය. පිටත විසිර ගියේ නොවන්නේය. පෙර පසු එක හා සමාන හැඟීම් ඇතිව වාසය කරන්නේය.

'පෙර මෙන් පසුද පසුව මෙන් පෙරද, යටි කයෙහි මෙන් උඩු කයෙහිද උඩු කයෙහි මෙන් යටි කයෙහිද, දවල් මෙන් රෑද රෑ මෙන් දවල්ද, සමාන හැඟීම් ඇතිව වාසය කරන්නේය. මෙසේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

විවෘතවූ සිතින් නොවැසුණාවූ සිතින් බැබලීම් සහිත සිත වඩන්නේයයි සිත අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුක්තවූ ඍද්ධිපාදය වඩන්නේද,

**5.** "මේ ආකාරයෙන් මාගේ විමංසය ඉතා හැකුළුණේත් නොවන්නේය. ඉතා එසවුණේත් නොවන්නේය. අධ්‍යාත්මයෙහි හැකිළුණේ නොවන්නේය. පිටත විසිර ගියේ නොවන්නේය. පෙර පසු එක හා සමාන හැඟීම් ඇතිව වාසය කරයි. පෙර මෙන් පසුවද පසුව මෙන් පෙරද, යටි කයෙහි මෙන් උඩු කයෙහිද උඩු කයෙහි මෙන් යටි කයෙහිද, දවල් මෙන් රෑද රෑ මෙන් දවල්ද, සමාන හැඟීම් ඇතිව වාසය කරන්නේය.

'මෙසේ විවෘතවූ නොවැසුන සිතින් සිතින් බැබලීම් සහිත සිත වඩන්නේයයි' වීමංසය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඍද්ධිපාදය වඩයිද,

**6.** "මහණෙනි, මෙසේ වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ සතර ඍද්ධිපාදයෝ මහත්ඵල ඇත්තාහු මහානිසංස ඇත්තාහු වෙත්. මහණෙනි, මෙසේ වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ සතර ඍද්ධිපාදයන් ඇතිකල්හි නොයෙක් ආකාර ඍද්ධි කොටස් වළඳයි.

"එක්කෙනෙක්ව බොහෝ දෙනෙක් වෙත්. බොහෝ දෙනෙක්ව එක්කෙනෙක්ද වේ. ප්‍රකට බවට මුවහ බවට අහසෙහි මෙන් බිත්තියෙන් ඔබට පර්වතයෙන් ඔබට ප්‍රාකාරයෙන් ඔබට නොගැටී යයි. ජලයෙහි මෙන් පොළොවෙහි ගිලීම් කිමිදීම් කරයි. පොළොවෙහි මෙන් ජලයෙහි දිය නොබිඳිමින් යයි. පක්ෂියෙකු මෙන් අහසෙහි යේද පර්‍ය්‍යංකයෙන් හිඳගෙන මහත් ඍද්ධි ඇති මහත් ආනුභාව ඇති මේ සඳහිරු දෙදෙන පවා අතින් ස්පර්ශ කරයි. පිරිමදියි. බ්‍රහ්ම ලෝක පවා කයින් වසඟ බවට පමුණුවයි.

**7.** "මහණෙනි, මෙසේ වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ සතර ඍද්ධිපාදයන් ඇති කල්හි ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධියට හා අර්හත්ඵල ප්‍රඥාවට

මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරයි.

---

## 3. ඡන්ද සමාධි සූත්‍රය.

1. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡේදය මෙනි)

2. "මහණෙනි, මහණතෙමේ ඉදින් ඡන්දය නිසා (අධිපති) සමාධියක් සිතේ එකඟකමක් ලබයිද, එය ඡන්ද සමාධියයි කියනු ලැබේ. හෙතෙම නූපන් ලාමක අකුසල ධර්මයන්ගේ නූපදීම පිණිස කැමැත්ත උපදියිද, වෑයම්කරයිද, වීර්‍ය්‍ය පටන් ගනියිද සිත ඔසවයිද, උත්සාහ කරයිද උපන් ලාමක අකුසල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද, වීර්‍ය්‍ය පටන්ගනියිද, සිත ඔසවයිද, උත්සාහ කරයිද, නූපන් කුසල ධර්මයන්ගේ ඉපදීම පිණිස කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද වීර්‍ය්‍ය පටන්ගනියිද, සිත ඔසවයිද, උත්සාහ කරයිද උපන් කුසල ධර්මයන්ගේ පැවැත්ම පිණිස නොමුළාවීම පිණිස බොහෝබව පිණිස මහත්බව පිණිස වැඩීම පිණිස සම්පූර්ණවීම පිණිස කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද වීර්‍ය්‍ය පටන්ගනියිද සිත ඔසවයිද උත්සාහ කරයිද, මේ ප්‍රධාන සංස්කාරයෝ යයි කියනු ලැබෙත්.

"මෙසේ මේ ඡන්දය වෙයි, මේ ඡන්දසමාධිය වෙයි. මොව්හු ප්‍රධාන සංස්කාරයෝ වෙත්. මහණෙනි, මේ ඡන්ද සමාධිපධාන සංඛාර සමන්නාගත ඍද්ධිපාදයයි කියනු ලැබේ.

3. "මහණෙනි, මහණතෙමේ ඉදින් වීර්‍ය්‍යය නිසා (අධිපති) සමාධියක් සිතේ එකඟකමක් ලබයිද, එය වීර්‍ය්‍ය සමාධියයි කියනු ලැබේ. හෙතෙම නූපන් ලාමක අකුසල ධර්මයන්ගේ නූපදීම පිණිස කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද, වීර්‍ය්‍ය පටන්ගනියි සිත ඔසවයිද උත්සාහ කරයිද උපන් ලාමක අකුසල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද, වීර්‍ය්‍ය පටන්ගනියිද, සිත ඔසවයිද, උත්සාහ කරයිද, නූපන් කුසල

ධර්මයන්ගේ ඉපදීම පිණිස කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද, වීර්‍ය්‍යී පටන්ගනියිද, සිත ඔසවයිද උත්සාහ කරයිද, උපන් කුසල ධර්මයන්ගේ පැවැත්ම පිණිස, නොමුළාවීම පිණිස, බොහෝ බව පිණිස, මහත්බව පිණිස, වැඩීම පිණිස, සම්පූර්ණවීම පිණිස කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද, වීර්‍ය්‍යී පටන් ගනියිද, සිත ඔසවයිද, උත්සාහ කරයිද මේ ප්‍රධාන සංස්කාරයෝයයි කියනු ලැබෙත්.

"මෙසේ මේ වීර්‍ය්‍යීයවෙයි. මේ වීර්‍ය්‍යී සමාධියවෙයි මොව්හු ප්‍රධාන සංස්කාරයෝ වෙත්. මහණෙනි, මේ වීර්‍ය්‍යීසමාධිපධාන සංඛාර සමන්නාගත ඍද්ධිපාදයයි කියනු ලැබේ.

4. "මහණෙනි, මහණතෙමේ ඉදින් සිත නිසා (අධිපති) සමාධියක් සිතේ එකඟකමක් ලබයිද, එය සිත සමාධියයි කියනු ලැබේ. හෙතෙම නූපන් ලාමක අකුසල ධර්මයන්ගේ නූපදීම පිණිස කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද, වීර්‍ය්‍යී පටන්ගනියිද සිත ඔසවයිද, උත්සාහ කරයිද, උපන් ලාමක අකුසල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද, වීර්‍ය්‍යී පටන්ගනියිද, සිත ඔසවයිද, උත්සාහ කරයිද, නූපන් කුසල ධර්මයන්ගේ ඉපදීම පිණිස කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද, වීර්‍ය්‍යී පටන්ගනීද, සිත ඔසවයිද, උත්සාහ කරයිද, උපන් කුසලධර්මයන්ගේ පැවැත්ම පිණිස, නොමුළාවීම පිණිස, බොහෝබව පිණිස, මහත් බව පිණිස, වැඩීම පිණිස, සම්පූර්ණවීම පිණිස, කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද, වීර්‍ය්‍යී පටන්ගනියිද, සිත ඔසවයිද, උත්සාහ කරයිද, මේ ප්‍රධාන සංස්කාරයෝයයි කියනු ලැබෙත්.

"මෙසේ මේ සිත වෙයි මේ සිත සමාධිය වෙයි. මොව්හු ප්‍රධාන සංස්කාරයෝ වෙත්. මහණෙනි, මේ සිත සමාධිපධාන සංඛාර සමන්නාගත ඍද්ධිපාදයයි කියනු ලැබේ.

5. "මහණෙනි, මහණතෙමේ ඉදින් වීමංසය නිසා (අධිපති) සමාධියක් සිතේ එකඟකමක් ලබයිද, එය වීමංසය සමාධියයයි කියනු ලැබේ. හෙතෙම නූපන් ලාමක අකුසල ධර්මයන්ගේ නූපදීම පිණිස කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද, වීර්‍ය්‍යී

පටන්ගනියිද සිත ඔසවයිද, උත්සාහකරයිද, උපන් ලාමක අකුසල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද, වීර්‍ය්‍ය පටන්ගනියිද, සිත ඔසවයිද, උත්සාහ කරයිද, නූපන් කුසලධර්මයන්ගේ ඉපදීම පිණිස කැමැත්ත උපදවයිද, වෑයම්කරයිද, වීර්‍ය්‍ය පටන්ගනියිද, සිත ඔසවයිද උත්සාහකරයිද උපන් කුසල ධර්මයන්ගේ පැවැත්ම පිණිස නොමුළාවීම පිණිස බොහෝබව පිණිස මහත්බව පිණිස වැඩීම පිණිස සම්පූර්ණවීම පිණිස කැමැත්ත උපදවයිද වෑයම් කරයිද, වීර්‍ය්‍ය පටන්ගනියිද, සිත ඔසවයිද, උත්සාහ කරයිද, මේ ප්‍රධාන සංස්කාරයෝයයි කියනු ලැබෙත්.

"මෙසේ මේ වීමංසය වෙයි. මේ වීමංසය සමාධිය වෙයි. මොව්හු ප්‍රධාන සංස්කාරයෝ වෙත්. මහණෙනි, මේ වීමංසය සමාධිපධාන සංඛාර සමන්නාගත ඍද්ධිපාදයයි කියනු ලැබේ."

---

## 4. පාසාද කම්පන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මිගාර මාතු පාය නම්වූ පූර්වාරාමයෙහි වැඩ සිටිසේක. එකල්හි බොහෝ භික්ෂූහු මිගාරමාතු පහය තුල ඔසවාගත් හිස් මානය ඇතිව පාත්‍ර සිවුරු සැරසීම් ආදි චපලගති ඇතිව කෘෘර වචන ඇතිව නිරර්ථක වචන කියමින් සිහි මුළාව නුවණින් තොරව සමාධියෙන් තොරව තැතිගත් සිත් ඇතිව නොදැමුනු ඉඳුරන් ඇතිව වාසය කරත්.

2. "එකල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරයන්ට ඇමතූසේක. "මොග්ගල්ලානය මේ සබ්බ්‍රහ්මචාරීහු මිගාරමාතු පහය යට හිස් මානයෙන් යුක්තව චපලව කෘෘර වචන ඇතිව හිස් වචන කියමින් සිහියෙන් තොරව සමාධියෙන් තොරව නුවණින් තොරව නොදැමුණු ඉඳුරන් ඇතිව වාසයකරත්. 'මොග්ගල්ලානය, යව. ඒ භික්ෂූන් සංවේගයට පත්කරව'යයි වදාළේය. ආයුෂ්මත් මොග්ගල්ලාන ස්ථවිරතෙමේ "එසේය, ස්වාමීනියි" භාග්‍යවතුන් වහන්සේට පිළිතුරුදී යම්සේ පා

සුලඟිල්ලෙන් මිගාරමාතු පහය සෙලවීද මනාකොට කම්පා කෙළේද මනාකොට සෙලවීද, එබඳු ඍද්ධීන් විය. ඉක්බිති ඒ භික්ෂූහු සංවේගයට පැමිණියාහු ලොමුඩැහැ ගත්තාහු එක්පසෙක හුන්නාහුය. "පින්වත්නි, ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයකි. පින්වත්නි, ඒකාන්තයෙන් අද්භූතයකි. වාතයක්ද නැත. මේ මිගාරමාතු පහය ගැඹුරු පොළොවෙහි පිහිටියේය. මනාව පිහිටුවා ඇත්තේය. නොසෙල් වෙන්නේය. කම්පා නොවන්නේය. එසේද වුවත් සෙලවුණි කම්පාවිණියි" කීහ.

3. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන් යම් තැනකද එතැනට වැඩිසේක. වැඩ, ඒ භික්ෂූන්ට මෙසේ වදාළසේක. "මහණෙනි, තෙපි සංවේගයට පැමිණියාහු ලොමු ඩැහැගත්තාහු එක් පසෙක කුමක් නිසා සිටින්නහුද?" යනුයි.

"ස්වාමීනි, ආශ්චර්‍ය්‍යයකි, ස්වාමීනි, අද්භූතයකි. වාතයක්ද නැත. මේ මිගාරමාතු පහය ගැඹුරු පොළොවෙහි පිහිටියේය. ශක්තිමත්ව ගොඩනගා ඇත්තේය. මනාකොට පිහිටුවා ඇත්තේය. නිශ්චලය. නොසෙල් වෙන්නේය. එසේ වුවත් සෙලවුණි. කම්පාවුණියයි" කීහ.

4. "මහණෙනි, තොප සංවෙගයට පමුණුවනු කැමතිවූ මහා මොග්ගල්ලාන භික්ෂුව විසින් පා සුලඟිල්ලෙන් මිගාර මාතු පහය කම්පා කරන ලදී. මනාකොට කම්පා කරන ලදී. මනාකොට සොලවන ලදී.

"මහණෙනි, එය කුමකැයි සිතව්ද? මහා මොග්ගල්ලාන භික්ෂුව කුමන ධර්මයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් මෙසේ මහත් ඍද්ධි ඇත්තේ මහත් ආනුභාව ඇත්තේවේද?"

"ස්වාමීනි, ධර්මය භාග්‍යවතුන්වහන්සේ මුල්කොටම පවතී. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගෙන් අසා දරන්නාහුය.

5. "මහණෙනි සතර ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් මහා මොග්ගල්ලාන භික්ෂුව මෙසේ මහත් ඍද්ධි ඇත්තේ මහත් ආනුභාව ඇත්තේ විය. කවර සතරක්ද යත්.

6. "මහණෙනි, මෙහි මහාමොග්ගල්ලාන භික්ෂුව 'මේ ආකාරයෙන් මාගේ ඡන්දය අතිශයින් හැකුළුණේ නොවන්නේය. අතිශයින් එසවුණේ නොවන්නේය. අධ්‍යාත්මයෙහි හැකුළුණේ නොවන්නේය. පිටතට විසිරගියේ නොවන්නේය. පසු පෙර එක හා සමාන සංඥාවෙන් වාසය කරයි. මෙසේ නොවසන ලද විවෘතකළ සිතින් බැබලීම් සහිත සිත වඩන්නේයයි ඡන්දය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඍද්ධිපාදය වඩයි.

7. 'මේ ආකාරයෙන් මාගේ වීර්‍ය්‍යයෙන් ඉතා හැකුළුණේ නොවන්නේය. අතිශයින් එසවුනේ නොවන්නේය. අධ්‍යාත්මයෙහි හැකුළුනේ නොවන්නේය. පිටතට විසිරිගියේ නොවන්නේය. පසු පෙර එක හා සමාන සංඥාවෙන් වාසය කරයි. මෙසේ නොවසන ලද විවෘත කළ සිතින් බැබලීම් සහිත සිත වඩන්නේයයි වීර්‍ය්‍යය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි.

8. 'මේ ආකාරයෙන් මාගේ සිත නොහැකුළුණේ වෙයි. අතිශයින් එසවුණේ නොවෙයි. අධ්‍යාත්මයෙහි හැකුළුනේ නොවෙයි. පිටතට විසිරගියේ නොවෙයි. පසු පෙර එක හා සමාන සංඥාවෙන් වාසය කරයි. මෙසේ නොවසනලද විවෘත කළ සිතින් බැබලීම් සහිත සිත වඩන්නේයයි සිත අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඍද්ධිපාදය වඩයි.

9. 'මේ ආකාරයෙන් මාගේ වීමංසය අතිශයින් හැකුළුණේ නොවන්නේය. අතිශයින් එසවුණේ නොවන්නේය. අධ්‍යාත්මයෙහි හැකුළුණේ නොවන්නේය. පිටතට විසිරගියේ නොවන්නේය. පසු පෙර එක හා සමාන සංඥාවෙන් වාසය කරයි. පෙර මෙන් පසුද පසුව මෙන් පෙරද, යටිකයෙහි මෙන්

උඩුකයෙහිද උඩුකයෙහි මෙන් යටි කයෙහිද, දවල් මෙන් රෑද රෑ මෙන් දවල්ද, හැඟීම් ඇතිව වාසය කරයි. මෙසේ විවෘතවූ නොවසනලද සිතින් බැබලීම් සහිත සිත වඩන්නේයයි වීමංසන අධිපතිකොට ඇති සමාධියෙන් සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි.

10. "මහණෙනි, මේ සතර ඍද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් මොග්ගල්ලාන භික්ෂුව මහත් ඍද්ධි ඇත්තේ වෙයි. මහත් ආනුභාව ඇත්තේ වෙයි. මහණෙනි, මේ සතර ඉද්ධිපාදයන්ගේ වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් මොග්ගල්ලාන භික්ෂුව නොයෙක් වැදෑරුම් ඉද්ධි විධි අනුභව කරයි.

11. "එක්කෙනෙක්ව බොහෝ දෙනෙක් වෙත් බොහෝ දෙනෙක්ව එක්කෙනෙක්ද වේ. ප්‍රකට බවට මුවහ බවට අහසෙහි මෙන් බිත්තියෙන් ඔබට පර්වතයෙන් ඔබට ප්‍රාකාරයෙන් ඔබට නොගැටී යයි. ජලයෙහි මෙන් පොළොවෙහි ගිලීම් කිමිදීම් කරයි. පොළොවෙහි මෙන් ජලයෙහි දිය නොබිඳිමින් යයි. පක්ෂියෙකු මෙන් අහසෙහියේද පර්‍ය්‍යංකයෙන් හිඳගෙන යයි. මහත් ඉද්ධි ඇති මහත් ආනුභාව ඇති මේ සඳ හිරු දෙදෙනා පවා අතින් ස්පර්ශ කරයි. පිරිමදියි. බ්‍රහ්මලෝක පවා කයින් වසඟ බවට පමුණුවයි.

"මහණෙනි, මේ සතර ඉද්ධිපාදයන් වනාහි වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් මොග්ගල්ලාන භික්ෂුව ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධියට, අර්හත් ඵල ප්‍රඥාවට පැමිණ වාසය කෙරේයයි" වදාළසේක.

---

## 5. උණ්ණාභ බ්‍රාහ්මණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ කොසඹෑ නුවර ඝොසිතා රාමයෙහි වාසය කළහ. එකල්හි උණ්ණාභ බ්‍රාහ්මණ තෙමේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම යම්තැනකද එතැනට

පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් සමග සතුටුවිය. සතුටු විය යුතු සිහිකටයුතු කථාවන් කොට නිමවා එක්පසෙක හුන්නේය. එක් පසෙක හුන් උණ්ණාභ බ්‍රාහ්මණ තෙමේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් හට මෙය කීය.

2. 'පින්වත් ආනන්ද ස්ථවිර වහන්ස, කිනම් අර්ථයක් පිණිස ශ්‍රමණ භවත් ගෞතමයන් කෙරෙහි බ්‍රහ්මචය්‍ර්‍යාවෙහි වසන්නේදැයි?" ඇසීය.

"බ්‍රාහ්මණය, තෘෂ්ණා ඡන්දය දුරුකරනු පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බ්‍රහ්මචය්‍ර්‍යාවෙහි වසන්නේයයි" කීය.

"පින්වත් ආනන්දයන් වහන්ස, මේ තෘෂ්ණා ඡන්දයාගේ දුරුකිරීම පිණිස මාර්ගයක් ඇත්තේද ප්‍රතිපදාවක් ඇත්තේද?"

'බ්‍රාහ්මණය, මේ තෘෂ්ණා ඡන්දයාගේ දුරුකිරීම පිණිස මාර්ගයක් ඇත්තේය ප්‍රතිපදාවක් ඇත්තේය."

'පින්වත් ආනන්දයන් වහන්ස, මේ තෘෂ්ණා ඡන්දයාගේ දුරුකිරීම පිණිස ඇති මාර්ගය කුමක්ද ප්‍රතිපදාව කුමක්ද?"

3. "බ්‍රාහ්මණය, මේ ශාසනයෙහි මහණතෙම ඡන්දය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීය්‍ර්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, විරිය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීය්‍ර්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, සිත අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීය්‍ර්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, වීමංසය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීය්‍ර්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, බ්‍රාහ්මණය, මේ තෘෂ්ණා ඡන්දයාගේ ප්‍රහාණය පිණිස මේ මාර්ගය වෙයි. මේ ප්‍රතිපදාව වෙයි"

4 "පින්වත් ආනන්දයන් වහන්ස, මෙසේ ඇති කල්හි තමා අයත් වෙයිද? තමා අයත් නොවෙයිද? ඡන්දයෙන්ම ඡන්දය දුරුකරන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවෙයි."

"බ්‍රාහ්මණය, එසේ නම් නුඹගෙන්ම අසන්නෙමි. යම්සේ නුඹ කැමැති වන්නේද එසේ ප්‍රකාශ කරන්නෙහිය. බ්‍රාහ්මණය,

එය කුමකැයි භගින්නෙහිද නුඹට පළමුව ආරාමයට යන්නෙමි යන ඡන්දයක් (කැමැත්තක්) විය. ඒ ආරාමයට ගියාවූ නුඹගේ ඒ යෑම උපදවන්නාවූ යම් කැමැත්තක් වීද ඒ කැමැත්ත සංසිඳුනේද?"

"පින්වතුන් වහන්ස, එසේය."

"නුඹට පළමුව ආරාමයට යන්නෙමියි වීර්‍ය්‍යයක් වීය. ඒ ආරාමයට ගියාවූ නුඹට ඒ ආරාමයට යෑම උපදවන්නාවූ වීර්‍ය්‍යයක් වීනම් එය සංසිඳුනේද?"

"පින්වතුන් වහන්ස! එසේය."

"නුඹට පළමුව ආරාමයට යන්නෙමි'යි සිතක් විය. ඒ ආරාමයට ගියාවූ නුඹගේ ඒ ආරාමයට යෑම උපදවන්නාවූ සිතක් වීනම් එය සංසිඳුනේද?"

"පින්වතුන් වහන්ස, එසේය."

"නුඹටත් පළමුව ආරාමයට යන්නෙමියි නුවණෙක් වීය. ඒ ආරාමයට ගියාවූ නුඹගේ යම් ඒ ආරාමයට යෑම උපදවන්නාවූ නුවණෙක්වීද ඒ නුවණ සංසිඳුනේය."

"පින්වතුන් වහන්ස, එසේය."

5. "බ්‍රාහ්මණය, එපරිද්දෙන්ම අර්හත්වූ පහකරණ ලද කෙලෙස් ඇති වැස නිමවන ලද බඹසර ඇති කරන ලද කටයුතු ඇති බහා තැබූ බර ඇති තමාගේ අර්ථයට පැමිණි ක්ෂය කරන ලද සසර බැඳුම් ඇති අර්හත් මාර්ගයට පැමිණි විමුක්තවූ යම් මේ භික්ෂුවක් වේද, ඔහුගේ රහත්වීමට පළමුව යම් ඡන්දයක් වීද, රහත් බවට පැමිණි කල්හි එය උපදවන්නාවූ යම් ඡන්දයක් වීද? එය සංසිඳුනේය. රහත්වීමට පළමුව යම් වීර්‍ය්‍යයක් වීද, රහත් බවට පැමිණි කල්හි එය උපදවන්නාවූ යම් වීර්‍ය්‍යයක් වීද එය සංසිඳුනේය. රහත්වීමට පළමුව යම් සිතක් වීද රහත් බවට පැමිණි කල්හි එය උපදවන්නාවූ සිත සංසිඳුනේය. රහත්වීමට පළමුව යම් විමසීමක් වීද, රහත් බවට පැමිණි කල්හි එය උපදවන්නට යම් විමසීමක්වීද එය සංසිඳුනේය.

"බ්‍රාහ්මණය, එය කුමකැයි හඟින්නෙහිද? මෙසේ ඇති කල්හි තමා අයත් හෝ වේද තමා අයත් හෝ නොවේද?"

"පින්වත් ආනන්දයන් වහන්ස, මෙසේ ඇති කල්හි ඒකාන්තයෙන් තමා අයත්වේ. අයත් නොවන්නේ නොවේ.

**6.** "පින්වත් ආනන්දයන් වහන්ස, ඉතා යහපති. පින්වත් ආනන්දයන් වහන්ස, ඉතා යහපති. පින්වත් ආනන්දයන් වහන්ස, යම්සේ යටිකුරු කරන ලද්දක් උඩුකුරු හෝ කෙරේද, සැඟවූවක් විවෘත හෝ කෙරේද, මංමුළාවූවෙකුට මාර්ගය හෝ කියයිද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි, අන්ධකාරයෙහි තෙල් පහනක් හෝ දරාද, එපරිද්දෙන් පින්වත් ආනන්දයන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් දේශනා කරන ලදී. ස්වාමීනි, ඒ මම අද පටන් දිවිහිම්යෙන් භාග්‍යවතුන් වහන්සේද, ධර්මයද, සංඝයාද සරණ යමි. භවත් ගෞතමයන් වහන්සේ දිවිහිම්කොට සරණ ගිය උපාසකයෙකු කොට මා දරණ සේක්වා"

---

## 6. මහිද්ධික සූත්‍රය.

**1.** (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

**2.** "මහණෙනි, අතීත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ මහත් ඍද්ධි ඇත්තෝ මහත් ආනුභාව ඇත්තෝ වූවාහුද ඒ සියල්ලෝ සතර ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් මහත් ඉද්ධි ඇත්තෝ මහත් ආනුභාව ඇත්තෝ වූහ. මහණෙනි, අනාගත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ මහත් ඉද්ධි ඇත්තෝ මහත් ආනුභාව ඇත්තෝ වන්නාහුද ඒ සියල්ලෝ සතර ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් මහත් ඉද්ධි ඇත්තෝ මහත් ආනුභාව ඇත්තෝ වන්නාහුය. මහණෙනි, දැන් වනාහි ඇතැම් ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ මහත් ඉද්ධි ඇත්තෝ මහත් ආනුභාව ඇත්තෝ වෙත්ද ඒ සියල්ලෝ සතර ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් මහත් ඉද්ධි ඇත්තෝ මහත් ආනුභාව ඇත්තෝ වෙත්. කවර සතරක්ද යත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, විරිය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, සිත අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, වීමංසය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද,

4. "මහණෙනි, අතීත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මහත් ඉද්ධි ඇත්තෝ මහත් ආනුභාව ඇත්තෝ වූවාහුද ඒ සියල්ලෝ සතර ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් මහත් ඍද්ධි ඇත්තෝ මහත් ආනුභාව ඇත්තෝවූහ. මහණෙනි, අනාගත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මහත් ඉද්ධි ඇත්තෝ මහත් ආනුභාව ඇත්තෝ වන්නාහුද, ඒ සියල්ලෝ සතර ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් මහත් ඉද්ධි ඇත්තෝ මහත් ආනුභාව ඇත්තෝ වන්නාහුය. මහණෙනි, දැන් වනාහි ඇතැම් ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ මහත් ඉද්ධි ඇත්තෝ මහත් ආනුභාව ඇත්තෝ වෙත්ද ඒ සියල්ලෝ සතර ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් මහත් ඉද්ධිපාද ඇත්තෝ මහත් ආනුභාව ඇත්තෝ වෙත්. ඒ සියල්ලෝ මේ සතර ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් එසේ වූහ."

---

## 7. ඉද්ධිවිධ සූත්‍රය

1. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 1 ඡේදය මෙනි)

2. "මහණෙනි, අතීත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ නොයෙක් ඉර්ධි විධි වැළඳුවාහුද එකෙක්ව බොහෝ දෙනෙක් වූහ. බොහෝ දෙනෙක්ව එකෙක් විය. අහසෙහි යම්සේද එසේ ප්‍රකටවීම, මුවහවීම, බිත්තියෙන් ඔබට පවුරෙන් ඔබට පර්වතයෙන් ඔබට නොගැටී ගියාහුය. ජලයෙහි

මෙන් පොළවෙහි ගිලීම් මතුවීම් කළාහුය. පොළොවෙහි මෙන් ජලයෙහි දිය නොබිඳිමින් ගියාහුය. අහසෙහි පක්ෂියකු මෙන් පයඹංකයෙන් ගියාහුය. මහත් ඉද්ධි ඇති මහත් ආනුභාව ඇති මේ සඳ හිරු දෙදෙනා පවා අතින් ස්පර්ශ කළාහුය. පිරිමැද්දාහුය. බඹලොව තෙක් කයින් වසඟ බව පැවැත්වූවාහුය. ඒ සියලුදෙන මේ සතර ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් එසේවූහ.

3. "මහණෙනි, අනාගත කාලයෙහි ඇතැම් ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ නොයෙක් ඉද්ධිවිධි වළඳන්නාහුය. එක් කෙනෙක්වී බොහෝ දෙනෙක් වන්නාහුයි බොහෝදෙනෙක් වී එකෙක් වන්නේය. අහසෙහි මෙන් ප්‍රකට බවට මුවහ බවට බිත්තියෙන් පිටතට පවුරෙන් පිටතට පර්වතයෙන් හරහට නොගැටී යන්නාහුය. ජලයේ මෙන් පොළොවෙහිද ගිලීම් මතුවීම් කරන්නාහුය. පොළොවෙහි මෙන් ජලයෙහි දිය නොබිඳිමින් යන්නාහුය. පක්ෂියෙකු මෙන් අහසෙහි පයඹංකයෙන් යන්නාහුය. මහත් ඉද්ධි ඇති මහත් ආනුභාව ඇති මේ සඳ හිරු දෙදෙනා පවා අතින් ස්පර්ශ කරන්නාහුය. පිරිමදින්නාහුය. බඹ ලොව තෙක් කයින් වසඟ බව පවත් වන්නාහුය. ඒ සියලුදෙන සතර ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් එසේ කරත්.

4. "මහණෙනි, මේ කාලයෙහි ඇතැම් ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ නොයෙක් ඉද්ධිවිධි වළඳන්නාහුය. එකෙක්ව බොහෝ දෙනෙක් වෙත් බොහෝ දෙනෙක්වී එකෙක් වෙයි. අහසෙහි මෙන් ප්‍රකට බවට මුවහ බවට බිත්තියෙන් පිට පවුරෙන් පිට පර්වතයෙන් පිට හරහට නොගැටී යති. ජලයේ මෙන් පොළොවෙහි ගිලීම් මතුවීම් කරත්. පොළොවෙහි මෙන් ජලයෙහි දිය නොබිඳිමින් යත්. පක්ෂියෙකු මෙන් අහසෙහි පයඹංකයෙන් යත්. මහත් ඉද්ධි ඇති මහත් ආනුභාව ඇති මේ සඳ හිරු දෙදෙනා පවා අතින් ස්පර්ශ කරන්නාහුය. පිරිමදින්නාහුය. බඹලොව තෙක් කයින් වසඟෙහි පවත්වති. ඒ සියලුදෙන සතර ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවිනුත් එසේ වෙත්.

**5.** "කවර සතරක්ද යත්. මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන යෙන් යුත් ඉද්ධිපාදය වඩයි. විරිය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. සිත අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. වීමංසය අධිපති කොට ඇති සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි.

**6.** "මහණෙනි, අතීත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ නොයෙක් ඉද්ධි විධි වැළඳුවාහුද එකෙක්ව බොහෝ දෙනෙක් වූහ. බොහෝ දෙනෙක්ව එකෙක් විය. අහසෙහි යම්සේද එසේ ප්‍රකටවීම, මුවහවීම, බිත්තියෙන් ඔබට පවුරෙන් ඔබට පර්වතයෙන් ඔබට නොගැටී ගියාහුය. ජලයෙහි මෙන් පොළොවෙහි ගිලීම් මතුවීම් කළාහුය. පොළොවෙහි මෙන් ජලයෙහි දිය නොබිඳෙමින් ගියාහුය. අහසෙහි පක්ෂියෙකු මෙන් පර්‍ය්‍යංකයෙන් ගියාහුය. මහත් ඍද්ධි ඇති මහත් ආනුභාව ඇති මේ සඳ හිරු දෙදෙනා පවා අතින් ස්පර්ශ කළාහුය. පිරිමැද්දාහුය. බඹලොව තෙක් කයින් වසඟ බව පැවැත්වූවාහුය. ඒ සියලු දෙන සතර ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් එසේ කරත්.

**7.** "මහණෙනි, අනාගත කාලයෙහි ඇතැම් ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ නොයෙක් ඉද්ධි විධි වළඳන්නාහුය. එක් කෙනෙක්වී බොහෝ දෙනෙක් වන්නාහුය. බොහෝදෙනෙක් වී එකෙක් වන්නේය. අහසෙහි මෙන් ප්‍රකට බවට මුවහ බවට බිත්තියෙන් පිටතට පවුරෙන් පිටතට පර්වතයෙන් පිටතට නොගැටී යන්නාහුය. ජලයේ මෙන් පොළොවෙහිද ගිලීම් මතුවීම් කරන්නාහුය. පොළොවෙහි මෙන් ජලයෙහිද දිය නොබිඳිමින් යන්නාහුය. පක්ෂියෙකු මෙන් අහසෙහි පර්‍ය්‍යංකයෙන් යන්නාහුය. මහත් ඉද්ධි ඇති මහත් ආනුභාව ඇති මේ සඳ හිරු දෙදෙනා පවා අතින් ස්පර්ශ කරන්නාහුය පිරිමදින්නාහුය. බඹලොව තෙක් කයින් වසඟ බව පවත්වන්නාහුය. ඒ සියලුදෙන සතර ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් එසේ කරත්.

8. "මහණෙනි, මේ කාලයෙහි ඇතැම් ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ නොයෙක් ඉද්ධිවිධි වළඳන්නාහුය. එකෙක්ව බොහෝ දෙනෙක් වෙත්. බොහෝ දෙනෙක්වී එකෙක් වෙයි. අහසෙහි මෙන් ප්‍රකට බවට මුවහ බවට බිත්තියෙන් පිට පවුරෙන් පිට පර්වතයෙන් පිට නොගැටී යති. ජලයේ මෙන් පොළොවෙහි ගිලීම් මතුවීම් කරත්. පොළොවෙහි මෙන් ජලයෙහි දිය නොබිඳිමින් යත්. පක්ෂියෙකු මෙන් අහසෙහි පයඞ්කයෙන් යත්. මහත්, ඉද්ධි ඇති මහත් ආනුභාව ඇති මේ සඳහිරු දෙදෙනා පවා අතින ස්පර්ශ කරන්නාහුය. පිරිමදින්නාහුය. බඹලොව වසගෙහි පවත්වති. ඒ සියලු දෙන සතර ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවිනුත් එසේ වෙත්.

---

## 8. ආසවක්ඛය සූත්‍රය.

1. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 1 ඡේදය මෙනි)

2. "මහණෙනි, සතර ඉන්ද්‍රියයන් හොඳින් බහුල වශයෙන් වැඩූ මහණතෙම ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත් ඵල සමාධිය හා අර්හත් ඵල ප්‍රඥාව මේ ආත්මයෙහිදීම තෙමේ මනා නුවණින් ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරයි. කවර සතරක්හුගේද යත්?

3. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ඡන්දය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. විරිය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. සිත අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. විමංසය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි.

4. "මහණෙනි, මේ සතර ඉද්ධිපාදයන් වැඩීමෙන් බහුල වශයෙන් වැඩීමෙන් මහණතෙම ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධිය හා අර්හත් ඵල ප්‍රඥාව මේ

ආත්මයේම තෙමේ මනා නුවණින් ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරයි.

---

## 9. ඉද්ධිපාද භාවනා සූත්‍රය.

1. (මේ ඡෙදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 1 ඡෙදය මෙනි)

2. "මහණෙනි, නුඹලාට ඉද්ධියත් ඉද්ධිපාදයත්, ඉද්ධිපාදයන් වැඩීමත් ඉද්ධිපාදයන් වැඩීමට පැමිණෙන ප්‍රතිපදාවත් කියන්නෙමි. එය අසව්.

3. "මහණෙනි, ඉද්ධිය නම් කුමක්ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ නොයෙක් ඉද්ධි අනුභව කරයි. එකෙක්ව බොහෝ දෙනෙක් වූහ. බොහෝ දෙනෙක්ව එකෙක් වීය. අහසෙහි යම්සේද එසේ ප්‍රකටවීම මුවහවීම බිත්තියෙන් ඔබට පවුරෙන් ඔබට පර්වතයෙන් ඔබට නොගැටී ගියාහුය. ජලයෙහි මෙන් පොළොවෙහි ගිලීම් මතුවීම් කළාහුය. පොළොවෙහි මෙන් ජලයෙහි දිය නොබිඳිමින් යන්නාහුය. අහසෙහි පක්ෂියකු මෙන් පයඹිාංකයෙන් ගියාහුය. මහත් ඍද්ධි ඇති මහත් ආනුභාව ඇති මේ සඳ හිරු දෙදෙන පවා අතින් ස්පර්ශ කළාහුය. පිරිමැද්දාහුය. බඹලොව තෙක් කයින් වසඟ බව පැවැත්වූවාහුය. මහණෙනි, මෙය ඉද්ධියයි කියනු ලැබේ.

4. "මහණෙනි, ඉද්ධිය නම් කුමක්ද? මහණෙනි යම් මාර්ගයක් යම් ප්‍රතිපදාවක් ඉද්ධිය ලැබීම පිණිස පවතියිද, මහණෙනි, එය ඉද්ධිපාදයයි කියනු ලැබේ.

5. "මහණෙනි, ඉද්ධිපාදයන් වැඩීමනම් කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ඡන්දය අධිපති කොට ඇති සමාධිය හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, විරිය අධිපති කොට සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, සිත අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, විමංසය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන්

යුත් ඉද්ධිපාදය වඩයිද, මහණෙනි, මේ ඉද්ධිපාදයන් වැඩීමයයි කියනු ලැබේ.

6. "මහණෙනි, ඉද්ධිපාදයන් වැඩීමට පැමිණෙන ප්‍රතිපදාව නම් කවරේද? ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය මැයි. ඒ කවරේදයත් සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් කල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යනුයි. මහණෙනි, මේ සතර ඍද්ධිපාදයන් වැඩීමට පැමිණෙන ප්‍රතිපදාවයයි කියනු ලැබේ.

---

## 10. ඉද්ධිපාද විභංග සූත්‍රය.

1. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. "මහණෙනි, වඩන ලද බහුල කරනලද මේ සතර ඉද්ධිපාදයෝ මහත්ඵල ඇත්තාහු මහත් ආනිශංසය ඇත්තාහු වෙත්. මහණෙනි, කෙසේ වඩන ලද්දාවූ කෙසේ බහුල කරන ලද්දාවූ සතර ඉද්ධිපාදයෝ මහත් ඵල ඇත්තාහු මහානිසංසය ඇත්තාහු වෙත්ද?

3. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ඡන්දය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. කෙසේද? 'මෙසේ මාගේ ඡන්දය අතිශයින් නොහැකුලුණේ නොවන්නේය. අතිශයින් එසවුණේ නොවන්නේය. ඇතුළත හැකුළුණේ නොවන්නේය. පිටත විසිරගියේ නොවන්නේය.' පෙර පසු එක හා සමාන සංඥා ඇතිව වාසය කරයි. පෙර මෙන් පසුවද පසුව මෙන් පෙරද යටිකයෙහි මෙන් උඩු කයෙහිද උඩු කයෙහි මෙන් යටි කයෙහිද දවල්මෙන් රෑද රෑමෙන් දවල්ද මෙසේ විවෘතවූ නොවැසුනු සිතින් බැබලීම් සහිත සිත වඩයිද,

4. "විරිය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධානවීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. කෙසේද? 'මෙසේ මාගේ විරිය අතිශයින් නොහැකුළුණේ නොවන්නේය. අතිශයින්

එසවුණේ නොවන්නේය. ඇතුළත හැකුළුනේ නොවන්නේය. පිටත විසිරගියේ නොවන්නේය' පෙර පසු එක හා සමාන සංඥා ඇතිව වාසය කරයි. පෙර මෙන් පසුවද පසුව මෙන් පෙරද යටිකයෙහි මෙන් උඩු කයෙහිද උඩු කයෙහි මෙන් යටි කයෙහිද දවල් මෙන් රෑද රෑමෙන් දවල්ද මෙසේ විවෘතවූ නොවැසුනු සිතින් බැබලීම් සහිත සිත වඩයිද,

**5.** "සිත අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදයවඩයි. කෙසේද? 'මෙසේ මාගේ සිත අතිශයින් නොහැකුළුණේ නොවන්නේය. අතිශයින් එසවුණේ නොවන්නේය. ඇතුළත හැකුළුණක් මෙන් නොවන්නේය. පිටත විසිරිගියේ නොවන්නේය,' පෙර පසු එක හා සමාන සංඥා ඇතිව වාසය කරයි. පෙරමෙන් පසුවද පසුවමෙන් පෙරද යටිකයෙහි මෙන් උඩුකයෙහිද උඩු කයෙහි මෙන් යටි කයෙහිද දවල් මෙන් රෑද රෑමෙන් දවල්ද මෙසේ විවෘතවූ නොවැසුනු සිතින් බැබලීම් සහිත සිත වඩයිද,

**6.** "වීමංසයන් අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි, කෙසේද? 'මේ ආකාරයෙන් මාගේ වීමංසය අතිශයින් හැකුළුණේ නොවන්නේය. අතිශයින් එසවුනේ නොවන්නේය. අධ්‍යාත්මයෙහි හැකුලුනේ නොවන්නේ පිට විසිරගියේ නොවන්නේය.' පෙර පසු එක හා සමාන සංඥා ඇතිව වාසය කරයි. පෙරමෙන් පසුවද පසුවමෙන් පෙරද යටිකයෙහි මෙන් උඩුකයෙහිද උඩු කයෙහි මෙන් යටි කයෙහිද දවල් මෙන් රෑද රෑ මෙන් දවල්ද මෙසේ විවෘතවූ නොවැසුනු සිතින් බැබලීම් සහිත සිත වඩයි.

**7.** "මහණෙනි, ඉතා හැකුළුණාවූ ඡන්දය නම් කවරේද? මහණෙනි, යම් ඡන්දයක් කුසීත බව සමග එක්වූයේ වේද? කුසීත බව සමග යෙදුණේ වේද, මහණෙනි, මෙය ඉතා හැකුළුණාවූ ඡන්දයයි කියනු ලැබේ.

**8.** "මහණෙනි, ඉතා එසවුණාවූ ඡන්දය නම් කවරේද? මහණෙනි, යම් ඡන්දයක් උද්ධච්චය හා එක්වූයේවේද, උද්ධච්චය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සමග යෙදුණේ වේද, මහණෙනි, මෙය ඉතා එසවුණු ඡන්දය යයි කියනු ලැබේ.

9. "මහණෙනි, ඇතුළත හැකුළුණු ඡන්දය නම් කවරේද? මහණෙනි, යම් ඡන්දයක් ථීනමිද්ධය හා එක්වූයේ වේද, ථීනමිද්ධයෙන් යුක්තවූයේද, මහණෙනි, මෙය ඇතුළත හැකුළුණු ඡන්දයයි කියනු ලැබේ.

10. "මහණෙනි, පිටත්හි විසිරගිය ඡන්දය නම් කවරේද? මහණෙනි, යම් ඡන්දයක් පඤ්චකාම ගුණයන් අරබයා පිටත්හි වික්ෂිප්තවූයේ වෙයිද, විසිරගියේ වෙයිද, මහණෙනි, මෙය පිටත්හි විසිරගිය ඡන්දයයි කියනු ලැබේ.

11. "මහණෙනි, මහණතෙමේ කෙසේනම් පෙර මෙන් පසුවද පසුව මෙන් පෙරද, මෙසේ පෙර පසු දෙක්හි සමාන හැඟීම් ඇතිව වාසය කරයිද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව විසින් රහත්වීමට පසුවද පෙරද සඤ්ඤාව නුවණින් මනාකොට ගන්නා ලද්දේද, මනාකොට මෙනෙහි කරන ලද්දේද, මනාකොට දරන ලද්දේද, මනාකොට අවබොධ කරන ලද්දේද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම පෙර මෙන් පසුවද පසුව මෙන් පෙරද පෙර පසු දෙක්හි සමාන සංඥාව ඇතිව වාසය කරයි.

12. "මහණෙනි, මහණතෙම කෙසේනම් යටි කයෙහි මෙන් උඩු කයෙහිද, උඩුකයෙහි මෙන් යටිකයෙහිද, සමානව වාසය කරයිද, මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම මේ සිරුරෙහි කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර, ඇට, ඇටමිදුළු, වකුගඩුව, හදවත, අක්මාව, දළබුව, බඩදිව, පපුමස, බඩවැල, කුඩා බඩවැල, නොපැසුණු ආහාර, මල, පිත, සෙම, සැරව, ලේ, ඩහදිය, මෙදතෙල්, කඳුලු, වුරුණුතෙල්, කෙල, සොටු, සෑමිදුළු, මුත්‍ර, ඇත්තේයයි පාතලයෙන් උඩද, කෙසාන්තයෙන් යටද, සමින් වටවූද මේ ශරීරය නොයෙක් අසුචියෙන් පිරුණේයයි නුවණින් මෙනෙහි කරයිද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම යටිකයෙහි මෙන් උඩුකයෙහිද, උඩුකයෙහි මෙන් යටිකයෙහිද, සමානව වාසය කරයි.

13. "මහණෙනි, මහණතෙම කෙසේ නම් දවල් මෙන් රෑද රෑ මෙන් දවල්ද සමානව වාසය කරයිද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම යම් ආකාරයකින් යම් සටහණකින් යම් නිමිත්තකින් දවල් කාලයෙහි ඡන්දය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, හෙතෙම ඒ ආකාරයෙන් ඒ සටහණින් ඒ නිමිත්තෙන් රාත්‍රියෙහිද, ඡන්දය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, රාත්‍රියෙහි යම් ආකාරයකින් යම් සටහණකින් යම් නිමිත්තකින් ඡන්දය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, හෙතෙම ඒ ආකාරයෙන් ඒ සටහණින් ඒ නිමිත්තෙන් දවල්ද, ඡන්දය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, මහණෙනි, මහණතෙම මෙසේ වනාහි දවල් මෙන් රෑද රෑමෙන් දවල්ද සමානව වාසය කරයි.

14. "මහණෙනි, මහණතෙම කෙසේනම් නොවසන ලද විවෘතවූ සිතින් බැබලීම් සහිත සිත වඩයිද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව විසින් ආලොක සඤ්ඤාව මනාකොට ගන්නා ලද්දේ වෙයිද, දවල්ය යන හැඟීම මනාකොට ඉවත ලද්දේ වෙයිද, මහණෙනි, මහණතෙම මෙසේ වනාහි නොවැසුණාවූ විවෘතවූ සිතින් ආලෝක සහිත සිත වඩයි.

15. "මහණෙනි, ඉතා හැකුළුණාවූ වීර්‍ය්‍යය කවරේද? මහණෙනි, යම් වීර්‍ය්‍යයක් කුසීත බව හා එක්වූයේද, කුසීත බව හා යෙදුණේද, මහණෙනි, මෙය ඉතා හැකුළුණු වීර්‍ය්‍යයයි කියනු ලැබේ.

16. "මහණෙනි, ඉතා ඔසවන ලද වීර්‍ය්‍ය කවරේද? මහණෙනි, යම් වීර්‍ය්‍යයක් උද්ධච්චය හා එක්වූයේද, උද්ධච්චය හා යෙදුණේද, මහණෙනි, මෙය ඉතා එසවුණු වීර්‍ය්‍යයයි කියනු ලැබේ.

17. "මහණෙනි, ඇතුළත හැකුළුණු වීර්‍ය්‍යය කවරේද? මහණෙනි, යම් වීර්‍ය්‍යයක් ථීනමිද්ධය හා එක්වූයේද ථීනමිද්ධයෙන්

යුක්තද, මහණෙනි, මෙය ඇතුළත හැකුළුණු වීයර්‍ය්‍යයයි කියනු ලැබේ.

18. "මහණෙනි, පිටත්හි විසිරගිය වීයර්‍ය්‍යය කවරේද? මහණෙනි, යම් වීයර්‍ය්‍යයක් බාහිර පඤ්චකාම ගුණයන් අරබයා වික්ෂිප්තවූයේද විසිරගියේ වේද, මහණෙනි, මේ පිටත්හි විසිර ගිය වීයර්‍ය්‍යයයි කියනු ලැබේ.

19. "මහණෙනි, මහණතෙමේ කෙසේ නම් පෙර මෙන් පසුවද පසුව මෙන් පෙරද මෙසේ පෙර පසු දෙක්හි සමාන හැඟීම් ඇතිව වාසය කරයිද, මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව විසින් රහත්වීමට පසුවද පෙරද සඤ්ඤාව නුවණින් මනාකොට ගන්නා ලද්දේද, මනාකොට මෙනෙහි කරන ලද්දේද, මනාකොට දරන ලද්දේද, මනාකොට අවබොධ කරන ලද්දේද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම පෙර මෙන් පසුවද, පසුව මෙන් පෙරද පෙර පසු දෙක්හි සමාන සංඥාව ඇතිව වාසය කරයි.

20. "මහණෙනි, මහණතෙම කෙසේ නම් යටිකයෙහි මෙන් උඩුකයෙහිද, උඩුකයෙහි මෙන් යටිකයෙහිද සමානව වාසය කරයිද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම මේ සිරුරෙහි කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර, ඇට, ඇටමිදුලු, වකුගඩුව, හදවත අක්මාව, දළබුව, බඩදිව, පපුමස බඩවැල, කුඩා බඩවැල, නොපැසුණු ආහාර, මල, පිත, සෙම, සැරව, ලේ, ඩහදිය, මෙද තෙල්, කඳුළු, වුරුණු තෙල්, කෙල, සොටු, සඳමිදුළු, මූත්‍ර ඇත්තේය. පාතලයෙන් උඩද, කෙසාන්තයෙන් යටද සමින් වටවූද, මේ ශරීරය නොයෙක් අසුචියෙන් පිරුණේයයි නුවණින් මෙනෙහි කරයිද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම යටිකයෙහි මෙන් උඩුකයෙහිද උඩුකයෙහි මෙන් යටි කයෙහිද සමානව වාසය කරයි.

21. "මහණෙනි, මහණතෙම කෙසේනම් දවල් මෙන් රෑද රෑමෙන් දවල්ද සමානව වාසය කරයිද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම යම් ආකාරයකින් යම් සටහණකින් යම් නිමිත්තකින් දවල් කාලයෙහි විරිය අධිපතිකොට ඇති

සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, හෙතෙම ඒ ආකාරයෙන් ඒ සටහණින් ඒ නිමිත්තෙන් රාත්‍රියෙහිද විරිය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, රාත්‍රියෙහි යම් ආකාරයකින් යම් සටහණකින් යම් නිමිත්තකින් විරිය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, හෙතෙම ඒ ආකාරයෙන් ඒ සටහණින් ඒ නිමිත්තෙන් දවල්ද, විරිය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, මහණෙනි, මහණතෙම මෙසේ වනාහි දවල්මෙන් රෑද රෑමෙන් දවල්ද සමානව වාසය කරයි.

**22.** "මහණෙනි, මහණතෙම කෙසේ නම් නොවසන ලද විවෘතවූ සිතින් බැබලීම් සහිත සිත වඩයිද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුව විසින් ආලොක සඤ්ඤාව මනාකොට ගන්නා ලද්දේ වෙයිද, දවල්ය යන හැඟීම මනාකොට ඉවත ලද්දේ වෙයිද, මහණෙනි, මහණතෙම මෙසේ වනාහි නොවැසුනාවූ විවෘතවූ සිතින් ආලොකය සහිත සිත වඩයි.

**23.** "මහණෙනි, ඉතා හැකුළුණු සිත කවරේද? මහණෙනි, යම් සිතක් වනාහි කුසීතකම හා එක්වූයේද කුසීතකමින් යුක්තද, මහණෙනි, මේ ඉතා හැකුළුණු චිත්තය යයි කියනු ලැබේ

**24.** "මහණෙනි, ඉතා ඔසවන ලද සිත කවරේද? මහණෙනි, යම් සිතක් උද්ධච්චය හා එක්වූයේද උද්ධච්චයෙන් යුක්තද මහණෙනි, මේ ඉතා ඔසවන ලද සිතයයි කියනු ලැබේ.

**25.** "මහණෙනි, අධ්‍යාත්මයෙහි හැකුළුණු සිත කවරේද? මහණෙනි, යම් සිතක් ථීන මිද්ධය හා එක්වූයේද ථීන මිද්ධයෙන් යුක්තද, මහණෙනි, මේ අධ්‍යාත්මයෙහි හැකුළුණු සිතයයි කියනු ලැබේ.

**26.** මහණෙනි, පිටත්හි විසිර ගිය සිත කවරේද? මහණෙනි, යම් සිතක් බාහිර පඤ්චකාම ගුණයන් අරබයා වික්ෂිප්ත වූයේ (විසිර ගියේ) වෙයිද, මහණෙනි, මේ පිටත්හි විසිර ගිය සිතයයි කියනු ලැබේ.

**27.** "මහණෙනි, මහණ තෙමේ කෙසේ නම් පෙර මෙන් පසුවද පසුව මෙන් පෙරද මෙසේ පෙර පසු දෙක්හි සමාන හැඟීම් ඇතිව වාසය කරයිද, මහණෙනි, මේ සාසනයෙහි භික්ෂුව විසින් රහත් වීමට පසුවද පෙරද සඤ්ඤාව නුවණින් මනා කොට ගන්නා ලද්දේද මනාකොට මෙනෙහි කරන ලද්දේද, මනාකොට දරන ලද්දේද, මනාකොට අවබොධ කරන ලද්දේද, මහණෙනි, මෙසේ වනාහි මහණ තෙම පෙර මෙන් පසුවද පසුව මෙන් පෙරද, පෙර පසු දෙක්හි සමාන සංඥාව ඇතිව වාසය කරයි.

**28.** "මහණෙනි, මහණතෙම කෙසේ නම් යටි කයෙහි මෙන් උඩු කයෙහිද උඩු කයෙහි මෙන් යටි කයෙහිද සමානව වාසය කරයිද? මහණෙනි, මේ සාසනයෙහි මහණ තෙම මේ සිරුරෙහි කෙස්, ලොම්, නිය දත්, සම්, මස්, නහර, ඇට, ඇටමිඳුළු, වකුගඩුව, හදවත, අක්මාව, දළබුව, බඩදිව, පපු මස, බඩවැල-කුඩා බඩවැල, නොපැසුණු, ආහාර මල, පිත සෙම, සැරව, ලේ, ඩහදිය මෙදතෙල්, කඳුලු, වුරුණු තෙල්, කෙල, සොටු, සඳමිඳුළු මුත්‍ර, ඇත්තේයයි පාතලයෙන් උඩද කෙසාන්තයෙන් යටද සමින් වටවූද මේ ශරීරය නොයෙක් අසුචියෙන් පිරුණේයයි නුවනින් මෙනෙහි කරයිද, මහණෙනි, මෙසේ වනාහි මහණ තෙම යටි කයෙහි මෙන් උඩු කයෙහිද උඩු කයෙහි මෙන් යටි කයෙහිද සමානව වාසය කරයි.

**29.** "මහණෙනි, මහණ තෙම කෙසේ නම් දවල් මෙන් රෑද රෑ මෙන් දවල්ද සමානව වාසය කරයිද? මහණෙනි, මේ සාසනයෙහි මහණ තෙම යම් ආකාරයකින් යම් සටහණකින් යම් නිමිත්තකින් දවල් කාලයෙහි සිත අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීය්‍ය්‍යීයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද හෙතෙම ඒ ආකාරයෙන් ඒ සටහණින් ඒ නිමිත්තෙන් රාත්‍රියෙහිද සිත අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීය්‍ය්‍යීයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, රාත්‍රියෙහි යම් ආකාරයකින් යම් සටහණකින් යම් නිමිත්තකින් සිත අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීය්‍ය්‍යීයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද,

හෙතෙම ඒ ආකාරයෙන් ඒ සටහණින් ඒ නිමිත්තෙන් දවල්ද, සිත අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, මහණෙනි, මහණතෙම මෙසේ වනාහි දවල් මෙන් රෑ මෙන් දවල්ද සමානව වාසය කරයි.

30. "මහණෙනි, මහණතෙම කෙසේ නම් නොවසන ලද විවෘතවූ සිතින් බැබලීම් සහිත සිත වඩයිද? මහණෙනි, මේ සාසනයෙහි භික්ෂුව විසින් ආලොක සඤ්ඤාව මනාකොට ගන්නා ලද්දේ වෙයිද, දවල්ය යන හැඟීම මනාකොට ඉවත ලද්දේ වෙයිද, මහණෙනි, මහණතෙම මෙසේ වනාහි නොවැසුනාවූ විවෘතවූ සිතින් ආලොක සහිත සිත වඩයි.

31. "මහණෙනි, ඉතා හැකුළුණු වීමංසය නම් කවරේද? මහණෙනි යම් වීමංසයක් කුසීත බව හා එක්වූයේද කම්මැලිකමින් යුක්තද, මහණෙනි, මේ ඉතා හැකුළුණු වීමංසයයයි කියනු ලැබේ.

32. "මහණෙනි, ඉතා ඔසවන ලද වීමංසය නම් කවරේද? මහණෙනි, යම් වීමංසයක් උද්ධච්චය හා එක්වූයේද, උද්ධච්චයෙන් යුක්ත වූයේද, මහණෙනි, මේ ඉතා ඔසවන ලද වීමංසයයි කියනු ලැබේ.

33. "මහණෙනි, ඇතුළත හැකුළුණු වීමංසය නම් කවරේද? මහණෙනි, යම් වීමංසයක් ථීනමිද්ධය හා එක්වූයේද ථීනමිද්ධයෙන් යුක්ත වූයේද, මහණෙනි, මේ ඇතුළත හැකුළුණු වීමංසය යයි කියනු ලැබේ.

34. 'මහණෙනි, පිටත්හි විසිර ගිය වීමංසය නම් කවරේද? මහණෙනි, යම් වීමංසයක් බාහිර පඤ්චකාම ගුණයන් අරබයා වික්ෂිප්ත වූයේ වෙයිද විසිරගියේ වෙයිද මහණෙනි මේ පිටත්හි විසිරගිය වීමංසය යයි කියනු ලැබේ.

35. "මහණෙනි, මහණ තෙමේ පෙර මෙන් පසුද පසුව මෙන් පෙරද පෙර පසු එක හා සමාන සඤ්ඤාවෙන් වාසය කරයිද, මහණෙනි, මේ සාසනයෙහි භික්ෂුව විසින් රහත්වීමට

පසුද පෙරද සඤ්ඤාව නුවණින් මනාකොට ගන්නා ලද්දේද, මනාකොට මෙනෙහි කරන ලද්දේද, මනාකොට දරන ලද්දේද, මනාකොට අවබොධය කරන ලද්දේද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙමේ පෙර මෙන් පසුද පසුව මෙන් පෙරද, පෙර පසු සමාන සඤ්ඤාවෙන් වාසය කරයි.

**36.** "මහණෙනි, මහණතෙමේ යටි කයෙහි මෙන් උඩු කයෙහිද උඩු කයෙහි මෙන් යටි කයෙහිද සමානව කෙසේ වාසය කරයිද? මහණෙනි, මේ සාසනයෙහි මහණතෙම මේ සිරුරෙහි කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර, ඇට, ඇටමිඳුළු, වකුගඩුව-හදවත අක්මාව, දළබුව, බඩදිව, පපු මස, බඩවැල-කුඩා බඩවැල නොපැසුණු ආහාර, මල, පිත, සෙම, සැරව, ලේ, ඩහදිය, මෙදතෙල්, කඳුලු, වුරුණු තෙල්, කෙල, සොටු, සඳමිදුලු, මුත්‍ර, ඇතැයි මහණ තෙම පාතලයෙන් උඩද කෙසාන්තයෙන් යටද සමින් වටවූ මේ සිරුර නොයෙක් අසුචියෙන් පිරුණේයයි සලකයි. මහණෙනි මෙසේ වනාහි මහණතෙම යටි කයෙහි මෙන් උඩු කයෙහිද උඩු කයෙහි මෙන් යටි කයෙහිද වාසය කරයි.

**37.** "මහණෙනි, මහණ තෙම දවල් මෙන් රෑද රෑ මෙන් දවල්ද කෙසේ වාසය කරයිද? මහණෙනි, මේ සාසනයෙහි මහණ තෙම යම් ආකාරයකින් යම් සටහණකින් යම් නිමිත්තකින් දවල් කාලයෙහි විමංසය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. හෙතෙම එම ආකාරයකින් ඒ සටහනින් ඒ නිමිත්තෙන් රාත්‍රියෙහිද වීමංසය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. යම් ආකාරයකින් යම් සටහණකින් යම් නිමිත්තකින් රාත්‍රියෙහි වීමංසය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, හෙතෙම ඒ ආකාරයෙන් ඒ සටහණින් ඒ නිමිත්තෙන් දවල් කාලයෙහිද වීමංසය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. මහණෙනි මෙසේ වනාහි මහණතෙමේ දවල් මෙන් රෑද රෑ මෙන් දවල්ද වාසය කරයි.

38. "මහණෙනි, විවෘතවූ නොවැසුනු සිතින් ආලෝක සිත කෙසේ වඩයිද? මහණෙනි, මේ සාසනයෙහි භික්ෂුව විසින් ආලෝක සඤ්ඤාව මනාකොට ගන්නා ලද්දේ වෙයිද? දිවා සඤ්ඤාව මනාකොට ඉවත ලද්දේ වෙයිද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම නොවැසුනු විවෘතවූ සිතින් ආලෝක සහිත සිත වඩයි.

39. "මහණෙනි, මෙසේ වඩන ලද්දාවූ මෙසේ බහුල කරන ලද්දාවූ සතර ඍද්ධිපාදයෝ මහත් ඵල ඇත්තාහු වෙත්. මහානිසංස ඇත්තාහු වෙත්. මහණෙනි, මෙසේ මහණ තෙම සතර ඉද්ධිපාදයන් මෙසේ වැඩූ කල්හි මෙසේ බහුල කොට වැඩූ කල්හි නොයෙක් ඉද්ධි කොටස් අනුභව කරයි. එකෙක්ව බොහෝ දෙනෙක් වූහ. බොහෝ දෙනෙක්ව එකෙක් විය. අහසෙහි යම් සේද එසේ ප්‍රකටවීම, මුවහවීම, බිත්තියෙන් ඔබට පවුරෙන් ඔබට, පර්වතයෙන් ඔබට නොගැටී ජලයෙහි මෙන් පොළොවෙහි ගිලීම් මතුවීම් කළාහුය. පොළොවෙහි මෙන් ජලයෙහි දිය නොබිඳීමින් ගියාහුය. අහසෙහි පක්ෂියකු මෙන් පයඹ්ංකයෙන් ගියාහුය. මහත් ආනුභාව ඇති මේ සඳ හිරු දෙදෙනා පවා අතින් ස්පර්ශ කළාහුය. පිරිමැද්දාහුය. බඹ ලොව තෙක් කයින් වසඟ බව පැවැත්වූවාහුය.

40. "මහණෙනි, මෙසේ මහණ තෙමේ සතර ඉද්ධිපාදයන් වැඩූ කල්හි බහුලකොට වැඩූ කල්හි ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත් ඵල සමාධිය හා අර්හත් ඵල ප්‍රඥාව මේ අත්බැව්හිම තෙමේ මනා නුවණින් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරන්නේයයි" වදාළේය.

(දෙවෙනි පාසාද කම්පන වර්ගය නිමි.)

---

# 3. අයොගුළ වර්ගය.

## 1. ඉද්ධිපාද මග්ග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසයකරනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට 'මහණෙනියි' කිය ඇමතූ සේක. 'ස්වාමීනි'යි කියා භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, චතුස්සත්‍ය අවබොධ කිරීමට පළමුවම බුදු නොවූ බොධිසත්වවූ මට මෙසේ සිතක් ඇතිවිය. 'ඉද්ධිපාදයන් වැඩීම පිණිස පවත්නා මාර්ගය කවරේද ප්‍රතිපදාව කුමක්ද?' කියායි. මහණෙනි, ඒ මට මෙසේ අදහස් ඇති විය. 'මේ සාසනයෙහි මහණතෙම ඡන්දය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, විරිය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, සිත අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද වීමංසය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, මෙසේ මාගේ වීමංසය ඉතා හැකුළුණේ නොවන්නේය. ඉතා එසවුණේ නොවන්නේය. ඇතුළත හැකුළුණේත් නොවන්නේය. පිටත්හි විසිර ගියේත් නොවන්නේය. පෙර මෙන් පසුවද පසුව මෙන් පෙරද පෙර මෙන් පසු සමාන හැඟීම් ඇතිව වාසය කරන්නේය. යටි කයෙහි මෙන් උඩු කයෙහිද උඩු කයෙහි මෙන් යටි කයෙහිද සමානව වාසය කරන්නේය. දවල් මෙන් රෑද රෑ මෙන් දවල්ද මෙසේ විවෘතවූ නොවැසුනු සිතින් ආලොක සහිත සිත වඩයි'

3. "මහණෙනි, මහණතෙම සතර ඉද්ධිපාදයන් මෙසේ වැඩූ කල්හි බහුල වශයෙන් වැඩූ කල්හි නොයෙක් ඉද්ධි කොටස් අනුභව කරයි. එකෙක්ව බොහෝ දෙනෙක් වූහ. බොහෝ දෙනෙක්ව එකෙක් විය. අහසෙහි යම් සේද එසේ ප්‍රකටවීම,

මුවහවීම, බිත්තියෙන් ඔබට පවුරෙන් ඔබට පර්වතයෙන් ඔබට නොගැටී ගියාහුය. ජලයෙහි මෙන් පොළොවෙහි ගිලීම් මතුවීම් කළාහුය. පොළොවෙහි මෙන් ජලයෙහි දිය නොබිඳිමින් ගියාහුය. අහසෙහි පක්ෂියෙකු මෙන් පයර්‍යංකයෙන් ගියාහුය. මහත් ඉද්ධි ඇති මහත් ආනුභාව ඇති මේ සඳ හිරු දෙදෙනා පවා අතින් ස්පර්ශ කළාහුය. පිරිමැද්දාහුය. බඹලොව කයින් වසඟ බව පැවැත්වූවාහුය.

4. "මහණෙනි, මහණතෙම සතර ඉද්ධිපාදයන් මෙසේ වැඩූ කල්හි බහුල වසයෙන් වැඩූ කල්හි ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත් ඵල සමාධියත් අර්හත් ඵල ප්‍රඥාවත් මේ තෙමේ විශෙෂ නුවණින් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරයි."

---

## 2. අයොගුල සූත්‍රය.

1. (මෙතැන් සිට මේ සූත්‍ර සියල්ල ජේතවනාරාමයේදී දේසනා කරනලදී.)

2. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන්වහන්සේට වැඳ එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

3. "ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේට ඉද්ධියෙන් සිතින් උපදවාගත් කයින් බ්‍රහ්ම ලෝකයට පැමිණිය හැක්කේද?"

"ආනන්දය, ඉද්ධියෙන් සිතින් උපදවාගත් කයින් මම බ්‍රහ්ම ලෝකයට පැමිණිය හැක්කෙමි."

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේට මේ සතර මහා භූතයන්ගෙන් ඇතිවූ කයින් ඉද්ධියෙන් බ්‍රහ්ම ලෝකයට පැමිණිය හැක්කේද?"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ආනන්දය මම මේ සතරමහා භූතයන්ගෙන් හටගත් කයින් ඉද්ධියෙන් බ්‍රහ්ම ලෝකයට පැමිණිය හැක්කේ වෙමියි" වදාළේය.

"ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේට ඉද්ධියෙන් සිතින් උපදවාගත් කයින් බ්‍රහ්මලෝකයට පැමිණිය හැකි බවත් ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේට මේ සතර මහා භූතයන් ගෙන් ඇතිවූ කයින් ඉද්ධියෙන් බ්‍රහ්මලෝකයට පැමිණිය හැකි බවත් භාග්‍යවතුන්වහන්සේගේ ආශ්චර්‍ය්‍යයක්ද අද්භූතයක්ද වේ."

**4.** "ආනන්දය, තථාගතවරයෝ ආශ්චර්‍ය්‍යද වෙත්. ආශ්චර්‍ය්‍ය ධර්මයන්ගෙන් සමන්විතද වෙත්. ආනන්දය, තථාගතවරයෝ අද්භූතද වෙත්. අද්භූත ධර්මයන්ගෙන් සමන්විතද වෙත්. ආනන්ය, තථගත තෙමේ යම් කලෙක්හි කය සිතෙහි පිහිටුවයිද සිත කයෙහි පිහිටුවයිද සුඛ, සඤ්ඤාවත් ලහු සඤ්ඤාවත්* කයෙහි බස්වා වාසය කරයි. ආනන්දය, එකල්හි තථාගතයන්වහන්සේගේ කය අතිශයින් සැහැල්ලුද අතිශයින් මෘදුද අතිශයින් කටයුතුවලට යෝග්‍යද අතිශයින් පැහැ විහිදුවන්නේද වෙයි.

**5,** "ආනන්දය, යම් සේ දවසක් මුළුල්ලෙහි රත්කරන ලද යකඩ ගුලියක් අතිශයින් සැහැල්ලුද අතිශයින් මෘදුද කටයුතුවලට යොග්‍යද අතිශයින් පැහැ විහිදුවන්නේ වෙයිද, ආනන්දය, එපරිද්දෙන්ම යම් කලෙක්හි තථාගත තෙමේ කය සිතෙහි පිහිටුවයිද, සිත කයෙහි පිහිටුවයිද සුඛ සංඥාවත් ලහු සංඥාවත් කයෙහි බස්වා වාසය කරයිද ආනන්දය එකල්හි තථාගතයන් වහන්සේගේ කය අතිශයින් සැහැල්ලුද අතිශයින් මෘදුද අතිශයින් කටයුතුවලට යොග්‍යද අතිශයින් පැහැ විහිදුවන්නේද වෙයි.

**6.** "ආනන්දය, යම් කලෙක්හි තථාගතයන් වහන්සේ කය සිතෙහි පිහිටුවයිද සිත කයෙහි පිහිටුවයිද සුඛ සඤ්ඤාවත් ලහු සඤ්ඤාවත් කයෙහි බස්වා වාසය කෙරේද, ආනන්දය එකල්හි තථාගතයන් වහන්සේගේ කය පහසුවෙන්ම

* අභිඥා සිත සමග යෙදුණු සඤ්ඤාව සුඛ සඤ්ඤාව ලහු සඤ්ඤාවයයි කියනු ලැබේ.

පොළොවෙන් අහසට පැනනගියි. හෙතෙම නොයෙක් ඉර්ධි විධි අනුභව කරයි. එකෙක්ව බොහෝදෙනෙක් වූහ. බොහෝ දෙනෙක්ව එකෙක් විය. අහසෙහි යම් සේද එසේ ප්‍රකටවීම, මුවහවීම, බිත්තියෙන් ඔබට පවුරෙන් ඔබට පර්වතයෙන් ඔබට නොගැටී ගියාහුය. ජලයෙහි මෙන් පොළොවෙහි ගිලීම් මතුවීම් කළාහුය. පොළොවෙහි මෙන් ජලයෙහි දිය නොබිඳිමින් ගියාහුය. අහසෙහි පක්ෂියකු මෙන් පයඝ්‍රංකයෙන් ගියාහුය. මහත් ඍද්ධි ඇති මහත් ආනුභාව ඇති මේ සඳ හිරු දෙදෙනා පවා අතින් ස්පර්ශ කළාහුය. පිරිමැද්දාහුය. බඹලොව කයින් වසඟ බව පැවැත්වූවාහුය.

7. "ආනන්දය, යම් සේ ඉඹුල් පුළුන් හෝ කපු පුළුන් සැහැල්ලු වූයේ වාතයෙන් ගන්නා ලද්දේ පහසුවෙන් පොළොවෙන් අහසට නගියි. ආනන්දය, එපරිද්දෙන්ම යම් කලෙක්හි තථාගතයන්වහන්සේ කය සිතෙහි පිහිටුවයිද සිත කයෙහි පිහිටුවයිද සුඛ සඤ්ඤාවත් ලහු සඤ්ඤාවත් කයෙහි බස්වා වාසය කෙරේද, ආනන්දය එකල්හි තථාගතයන් වහන්සේගේ කය පහසුවෙන් පොළොවෙන් අහසට නගියි. හෙතෙම නොයෙක් ඍද්ධි විධි අනුභව කරයි. එකෙක්ව බොහෝදෙනෙක් වූහ. බොහෝදෙනෙක් එකෙක් විය. අහසෙහි යම් සේද එසේ ප්‍රකටවීම. මුවහවීම, බිත්තියෙන් ඔබට පවුරෙන් ඔබට පර්වතයෙන් ඔබට නොගැටී ගියාහුය. ජලයෙහි මෙන් පොළොවෙහි ගිලීම් මතුවීම් කළාහුය. පොළොවෙහි මෙන් ජලයෙහි දිය නොබිඳිමින් ගියාහුය. අහසෙහි පක්ෂියකු මෙන් පයඝ්‍රංකයෙන් ගියාහුය. මහත් ඍද්ධි ඇති මහත් ආනුභාව ඇති මේ සඳ හිරු දෙදෙනා පවා අතින් ස්පර්ශ කළාහුය. පිරිමැද්දාහුය. බඹලොව කයින් වසඟ බව පවත්වන්නේයයි" වදාළේය.

---

## 3. ඉද්ධිපාද ආසවක්ඛය සූත්‍රය.

2. "මහණෙනි, මේ ඉද්ධිපාදයෝ සතරකි. කවර සතරක්ද? මහණෙනි, මේ සාසනයෙහි මහණතෙම ඡන්දය අධිපතිකොට

ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් ඉද්ධිපාදය වඩයිද, විරිය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් ඉද්ධිපාදය වඩයිද, සිත අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් ඉද්ධිපාදය වඩයිද, වීමංසය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, මහණෙනි, මේ සතර ඉද්ධිපාදයෝයි.

3. "මහණෙනි, මේ සතර ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වසයෙන් වැඩූ බැවින් මහණ තෙම ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත් ඵල සමාධියෙන් අර්හත් ඵල ප්‍රඥාවත් මේ ආත්ම භාවයෙහිම තෙමේ විශෙෂ නුවණින් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරන්නේය."

---

## 4. ද්විඵල ඉද්ධිපාද සූත්‍රය

2. "මහණෙනි, මේ ඉද්ධිපාදයෝ සතරකි. කවර සතරක්ද? මහණෙනි, මේ සාසනයෙහි මහණ තෙම ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි, විරිය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි, සිත අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි, වීමංසය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, මහණෙනි, මේ සතර ඉද්ධිපාදයෝයි.

---

## 5. සත්තඵලානිසංස සූත්‍රය

2. "මහණෙනි, මේ ඉද්ධිපාදයෝ සතරකි. කවර සතරක්ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ඡන්දය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, වීර්‍ය්‍යය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන

වීර්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, සිත අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, වීමංසය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, මහණෙනි, මේ වනාහි සතර ඉද්ධිපාදයෝයි.

3. "මහණෙනි, මේ සතර ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් මේ ආත්මයෙහිම රහත් ඵලය හෝ ස්කන්ධශෙෂය ඇති කල්හි අනාගාමි ඵලය හෝ යන ඵල දෙක අතුරෙන් එක්තරා ඵලයක් කැමතිවිය යුතුය."

---

## 6. ආනන්ද පඤ්හ සූත්‍රය

2. "මහණෙනි, මේ ඉද්ධිපාදයෝ සතරකි. කවර සතරක්ද යත්, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, වීර්‍යය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, සිත අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, වීමංසය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, මහණෙනි, මේ වනාහි සතර ඉද්ධිපාදයෝයි.

3. "මහණෙනි, මේ සතර ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් ඵල සතක් ආනිසංස සතක් කැමතිවිය යුත්තාහ. කවර ඵල සතක් ආනිසංස සතක්ද, පළමුකොට මේ ආත්මයෙහිම රහත් ඵලය ලබයි. ඉදින් මේ ආත්මයෙහිම පළමුකොට රහත් ඵලය නොලබයිද එකල්හි මරණ සමයෙහි රහත් ඵලය ලැබෙයි. ඉදින් පළමුකොට මේ ආත්මභාවයෙහි රහත්ඵලය නොලබයිද? ඉදින් මරණ කාලයෙහි රහත්ඵලය නොලබයිද එකල්හි පඤ්ච ඔරම්භාගිය සංයෝජනයන් නැතිකිරීමෙන් අන්තරා පරිනිබ්බායී අනාගාමි වෙයි. උපහච්ච පරිනිබ්බායි අනාගාමි හෝ වෙයි. අසංඛාර පරිනිබ්බායී හෝ

වෙයි. සසංඛාර පරිනිබ්බායි හෝ වෙයි. උද්ධංසොත අකනිට්ඨගාමි හෝ වෙයි.

4. "මහණෙනි, මේ සතර ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් මේ ඵල සත ආනිසංස සත කැමති විය යුත්තාහ.

---

## 7. දුතිය ආනන්ද පඤ්හ සූත්‍රය

2. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

3. "ස්වාමීනි, ඉද්ධිය නම් කුමක්ද, ඉද්ධිපාද නම් කුමක්ද, ඉද්ධිපාදයන් වැඩීමට පැමිණෙන මාර්ගය නම් කුමක්ද? යනුයි.

"ආනන්දය මේ ශාසනයෙහි මහණතෙමෙ නොයෙක් ඉද්ධි කොටස් අනුභව කරයිද, එකෙක්ව බොහෝ දෙනෙක් වූහ. බොහෝ දෙනෙක්ව එකෙක් විය. අහසෙහි යම්සේද එසේ ප්‍රකටවීම මුවහවීම, බිත්තියෙන් ඔබට පවුරෙන් ඔබට පර්වතයෙන් ඔබට නොගැටී ගියාහුය. ජලයෙහි මෙන් පොළොවෙහි ගිලීම් මතුවීම් කළාහුය. පොළොවෙහි මෙන් ජලයෙහි දිය නොබිඳිමින් ගියාහුය. අහසෙහි පක්ෂියෙකු මෙන් පයඞ්කයෙන් ගියාහුය. මහත් ඉද්ධි ඇති මහත් ආනුභාව ඇති මේ සඳ හිරු දෙදෙනා පවා අතින් ස්පර්ශ කළාහුය. පිරිමැද්දාහුය. බඹලොව තෙක් කයින් වසඟ බව පැවැත්වූවාහුය. ආනන්දය, මේ ඉද්ධියයි කියනු ලැබේ.

4. "ආනන්දය, ඉද්ධිපාදය කවරේද? ආනන්දය, ඉද්ධිපාද වැඩීම පිණිස ඉද්ධිය ලැබීම පිණිස යම් මාර්ගයක් යම් ප්‍රතිපදාවක් වෙයිද, ආනන්දය, මේ ඉද්ධිපාදයයි කියනු ලැබේ.

5. "ආනන්දය, ඉද්ධිපාද වැඩීම නම් කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙමේ ඡන්දය අධිපති කොට ඇති

සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, විරිය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, සිත අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, වීමංසය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, ආනන්දය මේ ඉද්ධිපාද වැඩීම යයි කියනු ලැබේ.

6. "ආනන්දය, ඉද්ධිපාද වැඩීමට පැමිණෙන ප්‍රතිපදාව කවරීද? මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය මැයි. ඒ කවරේද? සම්‍යක් දිට්ඨිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කාර්මාන්තය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ආජීවය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධිය යනුයි. ආනන්දය, මේ ඉද්ධිපාද වැඩීමට පැමිණෙන ප්‍රතිපදාවයයි කියනු ලැබේ."

---

## 8. සම්බහුල භික්ඛු සූත්‍රය.

2. එක්පසෙක සිටියාවූ ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. ආනන්දය, ඉද්ධි යනු කවරේද? ඉද්ධිපාදය නම් කවරේද? ඉද්ධිපාදයන් වැඩීමට පැමිණෙන ප්‍රතිපදාව නම් කවරේද?"

3. "ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන්වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගෙන් අසා දරන්නාහුය."

4. "ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම නොයෙක් ඉද්ධි විධි අනුභව කරයි. එකෙක්ව බොහෝ දෙනෙක් වූහ බොහෝදෙනෙක්ව එකෙක් විය. අහසෙහි යම් සේද එසේ ප්‍රකටවීම මුවහවීම, බිත්තියෙන් ඔබට පවුරෙන් ඔබට පර්වතයෙන් ඔබට නොගැටී ගියාහුය. ජලයෙහි මෙන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පොළොවෙහි ගිලීම් මතුවීම් කළාහුය. පොළොවෙහි මෙන් ජලයෙහි දිය නොබිඳිමින් ගියාහුය. අහසෙහි පක්ෂියෙකු මෙන් පයඪිංකයෙන් ගියාහුය. මහත් ඉද්ධි ඇති මහත් ආනුභාව ඇති මේ සඳ හිරු දෙදෙනා පවා අතින් ස්පර්ශ කළාහුය. පිරිමැද්දාහුය. බඹලොව තෙක් කයින් වසඟ බව පැවැත්වූවාහුය. මහණෙනි, මේ ඉද්ධියයි කියනු ලැබේ.

**5, 6, 7.** (මේ ඡේද මේ වර්ගයේ 7 වෙනි සූත්‍රයේ 4, 5, 6 වෙනි ඡේද මෙන් වේ.)

---

## 9. දුතිය සම්බහුල භික්ඛු සූත්‍රය

**2.** එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක උන්නාහුය. එක්පසෙක හුන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට මෙය කීවාහුය. ස්වාමීනි, ඉද්ධි යනු කවරේද? ඉද්ධිපාදය කවරේද? ඉද්ධිපාද වැඩීම කවරේද? ඉද්ධිපාද වැඩීමට පැමිණෙන ප්‍රතිපදාව කවරීද?" කියායි.

**3.** "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම නොයෙක් ඉද්ධි කොටස් අනුභව කරයි. එකෙක්ව බොහෝදෙනෙක් වූහ. බොහෝ දෙනෙක්ව එකෙක් විය. අහසෙහි යම්සේද එසේ ප්‍රකටවීම, මුවහවීම, බිත්තියෙන් ඔබට පවුරෙන් ඔබට පර්වතයෙන් ඔබට නොගැටී ගියාහුය ජලයෙහි මෙන් පොළොවෙහි ගිලීම් මතුවීම් කළාහුය. පොළොවෙහි මෙන් ජලයෙහි දිය නොබිඳිමින් ගියාහුය. අහසෙහි පක්ෂියෙකු මෙන් පයඪිංකයෙන් ගියාහුය. මහත් ඉද්ධි ඇති මහත් ආනුභාව ඇති මෙ සඳ හිරු දෙදෙනා පවා අතින් ස්පර්ශ කළාහුය. පිරිමැද්දාහුය. බඹලොව තෙක් කයින් වසඟ බව පැවැත්වූවාහුය. මහණෙනි, මේ ඉද්ධියයි කියනු ලැබේ.

**4. 5. 6.** (මේ ඡේද මේ වර්ගයේ 7 වෙනි සූත්‍රයේ 4. 5. 6 වෙනි ඡේද මෙන් වේ.)

---

## 10. භික්ඛු සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක.

2. එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසෙක හුන්නාහුය. එක් පසෙක හුන්නාවූ ඒ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක. " මහණෙනි, ඉද්ධිය යනු කවරේද? ඉද්ධිපාදය කවරේද? ඉද්ධිපාද වැඩීම කවරේද? ඉද්ධිපාද වැඩීමට පැමිණෙන ප්‍රතිපදාව කවරේද?" යනුයි.

3. "ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන්වහන්සේ මුල් කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට ඇත්තාහුය. භාග්‍යවතුන්වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන්වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගෙන් අසා දරන්නාහුය."

4. "මහණෙනි, ඉද්ධිය කවරේද? මහණෙනි, මේ සාසනයෙහි මහණ තෙම නොයෙක් ඉද්ධි කොටස් අනුභව කරයිද එකෙක්ව බොහෝදෙනෙක් වූහ. බොහෝදෙනෙක් එකෙක් විය. අහසෙහි යම්සේද එසේ ප්‍රකටවීම, මුවහවීම, බිත්තියෙන් ඔබට පවුරෙන් ඔබට පර්වතයෙන් ඔබට නොගැටී ගියාහුය. ජලයෙහි මෙන් ගිලීම් මතුවීම් පොළොවෙහි කළාහුය. පොළොවෙහි මෙන් ජලයෙහි දිය නොබිඳිමින් ගියාහුය. අහසෙහි පක්ෂියකු මෙන් පයඞ්කයෙන් ගියාහුය. මහත් ඍද්ධි ඇති මහත් ආනුභාව ඇති මේ සඳ හිරු දෙදෙනා පවා අතින් ස්පර්ශ කළාහුය. පිරිමැද්දාහුය. බඹලොව තෙක් කයින් වසඟ බව පැවැත්වූවාහුය. මහණෙනි, මේ ඉද්ධියයි කියනු ලැබේ.

5. "මහණෙනි, ඉද්ධිපාදය කවරේද? මහණෙනි, ඉද්ධිපාදයන්ගේ වැඩීම පිණිස ඉද්ධිපාදයන් ලැබීම පිණිස යම්

මාර්ගයක් යම් ප්‍රතිපදාවක් පවතියිද, මහණෙනි, මේ ඉද්ධිපාදයයි කියනු ලැබේ.

6. "මහණෙනි, ඉද්ධිපාදයන්ගේ වැඩීම කවරේද? මහණෙනි, මේ සාසනයෙහි මහණ තෙම ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, විරිය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, සිත අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, වීමංසය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයිද, මහණෙනි, මේ ඉද්ධිපාදයන්ගේ වැඩීමයයි කියනු ලැබේ.

7. "මහණෙනි, ඉද්ධිපාදයන්ගේ වැඩීමට පැමිණෙන ප්‍රතිපදාව කවරීද? මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයමැයි. ඒ කවරේදයත්? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් කල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ආජීවය, සම්‍යක් සතිය, සම්‍යක්සමාධිය යනුයි. මහණෙනි, මේ ඉද්ධිපාදයන්ගේ වැඩීමට පැමිණෙන ප්‍රතිපදාවයයි කියනු ලැබේ."

---

## 11. මහිද්ධික මොග්ගල්ලාන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී වනාහි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි,' කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. 'මහණෙනි, ඒ කුමකැයි සිතව්ද, කවර ධර්මයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් මොග්ගල්ලාන භික්ෂු තෙම මෙසේ මහත් ඉද්ධි ඇත්තේ මහත් ආනුභාව ඇත්තේ වෙයිද?

3. "ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා කොට

ඇත්තාහුය. භාග්‍යවතුන්වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන්වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගෙන් අසා දරන්නාහුය.”

4. “මහණෙනි, සතර ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් මොග්ගල්ලාන භික්ෂුව මෙසේ මහත් ඍද්ධි ඇත්තෙක් මහත් ආනුභාව ඇත්තෙක් වෙයි.

5. “කවර සතරක්ද? මහණෙනි, මේ ශාසනයෙහි මොග්ගල්ලාන භික්ෂුව ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩන්නේය. කෙසේද? ‘මේ ආකාරයෙන් මාගේ ඡන්දය ඉතා හැකුළුණේ නොවන්නේය. ඉතා එසවුණේත් නොවන්නේය. ඇතුළත හැකුළුණේත් නොවන්නේය. පිටත විසිර ගියේත් නොවන්නේය. රහත්වීමට පෙර මෙන් පසුවද පසුව මෙන් පෙරද, ශරීරයෙහි යට මෙන් උඩද උඩ මෙන් යටද, දවල් මෙන් රෑද රෑ මෙන් දවල්ද, එක හා සමාන හැඟීම් ඇතිව වාසය කරන්නේය’ කියායි. මෙසේ නොවැසූ විවෘතකළ සිතින් බැබලීම් සහිත සිත වඩයි.

6. “වීර්‍ය්‍යය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. කෙසේද? ‘මේ ආකාරයෙන් මාගේ වීර්‍ය්‍යය ඉතා හැකුළුණේත් නොවන්නේය. ඉතා එසවුණේත් නොවන්නේය. ඇතුළත හැකුළුණේත් නොවන්නේය. පිටත විසිර ගියේත් නොවන්නේය. පෙර පසු දෙක්හිම එක හා සමාන හැඟීම් ඇතිව වාසය කරයි. පළමු මෙන්ම පසුවත් පසුව මෙන්ම පෙරත් ශරීරයෙහි උඩ මෙන්ම යටත් යට මෙන්ම උඩත්, දවල් මෙන් රෑත් රෑ මෙන් දවල්හිත්, එක හා සමාන හැඟීම් ඇතිව වාසය කරන්නේය’ කියායි. මෙසේ විවෘතවූ නොවැසූ සිතින් බැබලීම් සහිත සිතක් වඩයි.

7. “චිත්තය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. කෙසේද? ‘මේ ආකාරයෙන් මාගේ සිත ඉතා හැකුළුණේද නොවන්නේය. ඉතා

එසවුණේද නොවන්නේය. ඇතුළත හැකුළුණේද නොවන්නේය. පිටත්හි විසිර ගියේද නොවන්නේය. පෙර හා පසුව එක හා සමාන හැඟීම් ඇතිව වාසය කරන්නේය. පෙර මෙන් පසුවද පසුව මෙන් පෙරද, යටිකය මෙන් උඩු කයද උඩු කය මෙන් යටිකයද, දවල් මෙන් රෑද රෑ මෙන් දවල්ද, එකහා සමාන හැඟීම් ඇතිව වාසය කරන්නේය' කියායි. මෙසේ නොවසන ලද විවෘත කළ සිතින් බැබලීම් සහිත සිත වඩයි.

8. "වීමංසය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. කෙසේද? 'මේ ආකාරයෙන් මාගේ වීමංසය ඉතා හැකුළුණේත් නොවන්නේය. ඉතා එසවුණේත් නොවන්නේය. ඇතුළත හැකුළුණේත් නොවන්නේය. පිටත්හි විසිර ගියේත් නොවන්නේය. පෙර පසු සමාන හැඟීම් ඇතිව වාසය කරයි. පෙර මෙන් පසුවද පසුව මෙන් පෙරද, යටි කයෙහි මෙන් උඩු කයෙහිද උඩු කයෙහි මෙන් යටි කයෙහිද, දවල් මෙන් රෑද රෑ මෙන් දවල්ද, සමාන හැඟීම් ඇතිව වාසය කරන්නේය' කියායි. මෙසේ නොවසනලද විවෘතවූ සිතින් බැබලීම් සහිත සිත වඩයි.

9. "මහණෙනි, මේ සතර ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් මහා මොග්ගල්ලාන භික්ෂුව මෙසේ නොයෙක් ඉද්ධි කොටස් අනුභව කරයි. එක් කෙනෙක්ව බොහෝ දෙනෙක් වෙත්. බොහෝ දෙනෙක්ව එක්කෙනෙක්ද වේ. ප්‍රකට බවට මුවග බවට අහසෙහිමෙන් බිත්තියෙන් ඔබට පර්වතයෙන් ඔබට ප්‍රාකාරයෙන් ඔබට නොගැටී යයි. ජලයෙහි මෙන් පොළොවෙහි ගිලීම් කිමිදීම් කරයි. පොළොවෙහි මෙන් ජලයෙහි දිය නොබිඳිමින් යයි. පක්ෂියෙකු මෙන් අහසෙහියේද, පර්‍ය්‍යංකයෙන් හිඳගෙන මහත් ඉද්ධි ඇති මහත් අනුභාව ඇති මේ සඳ හිරු දෙදෙනා පවා අතින් ස්පර්ශ කරයි. පිරිමදියි. බ්‍රහ්මලෝක පවා කයින් වසඟ බවට පමුණුවයි.

10. "මහණෙනි, මේ සතර ඍද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් මොග්ගල්ලාන භික්ෂුව ආශ්‍රවයන් නැති කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධියත් අර්හත්ඵල

ප්‍රඥාවත් මේ ආත්මභාවයෙහි තෙමේ විශෙෂ නුවණින් ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරන්නේයයි" වදාළේය.

---

## 12. මහිද්ධික තථාගත සූත්‍රය.

1. (මේ ඡේදය මේ වර්ගයේ 11 සූත්‍රයේ 1 ඡේදය මෙනි)

2. "මහණෙනි, එය කුමකැයි සිතව්ද? කවර ධර්මයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් තථාගතතෙම මෙසේ මහත් ඉද්ධි ඇත්තේ මහත් ආනුභාව ඇත්තේ වේද?

3. "ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන්වහන්සේ මුල් කොට ඇත්තාහුය. භාග්‍යවතුන්වහන්සේ පමුණුවන්නාකොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් ඉතා හොඳය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගෙන් අසා දරන්නාහුය."

4. "මහණෙනි, සතර ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් තථාගත තෙම මෙසේ මහත් ඉර්ධි ඇත්තේ මහත් ආනුභාව ඇත්තේ වේ.

5. "කවර සතරක්ද යත්? මහණෙනි, මෙහි තථාගත තෙමේ ඡන්දය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩන්නේය. කෙසේද? 'මේ ආකාරයෙන් මාගේ ඡන්දය ඉතා හැකුළුණේ නොවන්නේය. ඉතා එසවුණේත් නොවන්නේය. ඇතුළත හැකුළුණේත් නොවන්නේය. පිටත විසිර ගියේත් නොවන්නේය. පෙර මෙන් පසුවද, පසුව මෙන් පෙරද, ශරීරයෙහි යට මෙන් උඩද, උඩමෙන් යටද, දවල් මෙන් රෑද, රෑ මෙන් දවල්ද එක හා සමාන හැඟීම් ඇතිව වාසය කරන්නේය' කියායි. මෙසේ විවෘත කළ සිතින් බැබලීම් සහිත සිත වඩයි.

6. "වීර්‍ය්‍යය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. කෙසේද? 'මේ

ආකාරයෙන් මාගේ වීර්‍ය්‍යය ඉතා හැකුළුණේත් නොවන්නේය. ඉතා එසවුණේත් නොවන්නේය. ඇතුළත හැකුළුණේත් නොවන්නේය. පිටත විසිරගියේත් නොවන්නේය. පෙර පසු දෙක්හිම එක හා සමාන හැඟීම් ඇතිව වාසය කරයි. පළමු මෙන් පසුවත් පසුව මෙන්ම පෙරත් ශරීරයෙහි උඩ මෙන් යටත් යට මෙන්ම උඩත්, දවල් මෙන්ම රෑත් රෑමෙන් දවල්හිත්, එක හා සමාන හැඟීම් ඇතිව වාසය කරන්නේය' කියායි. මෙසේ විවෘතවූ නොවැසූ සිතින් බැබලීම් සහිත සිත වඩයි.

7. "චිත්තය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. කෙසේද? 'මේ ආකාරයෙන් මාගේ සිත ඉතා හැකුළුණේද නොවන්නේය. ඉතා එසවුණේද නොවන්නේය. ඇතුළත හැකුළුණේද නොවන්නේය. පිටත්හි විසිරගියේද නොවන්නේය. පෙර හා පසුව එක හා සමාන හැඟීම් ඇතිව වාසය කරන්නේය. පෙර මෙන් පසුවද, පසුව මෙන් පෙරද, යටිකය මෙන් උඩු කයද උඩු කය මෙන් යටි කයද, දවල් මෙන් රෑද, රෑමෙන් දවල්ද, එකහා සමාන හැඟීම් ඇතිව වාසය කරන්නේය' කියායි. මෙසේ නොවසන ලද විවෘතකළ සිතින් බැබලීම් සහිත සිත වඩයි.

8. "විමංසය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. කෙසේද? 'මේ ආකාරයෙන් මාගේ වීමංසය ඉතා හැකුළුණේත් නොවන්නේය. ඉතා එසවුණේත් නොවන්නේය. ඇතුළත හැකුළුණේත් නොවන්නේය පිටත්හි විසිර ගියේත් නොවන්නේය. පෙර පසු සමාන හැඟීම් ඇතිව වාසය කරයි. පෙරමෙන් පසුවද, පසුව මෙන් පෙරද, යටි කයෙහි මෙන් උඩුකයෙහිද, උඩු කයෙහි මෙන් යටි කයෙහිද, දවල් මෙන් රෑද, රෑ මෙන් දවල්ද, සමාන හැඟීම් ඇතිව වාසය කරන්නේය' කියායි. මෙසේ නොවසන ලද විවෘතවූ සිතින් බැබලීම් සහිත සිත වඩයි.

9. "මහණෙනි, මේ සතර ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් තථාගත තෙමේ මෙසේ මහත් ඉද්ධි ඇත්තේ මහත් ආනුභාව ඇත්තේ වේ. මහණෙනි, මේ සතර

ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල කරනලද බැවින් නොයෙක් ඉර්ධි කොටස් අනුභව කරයි. එක් කෙනෙක්ව බොහෝ දෙනෙක් වෙත් බොහෝ දෙනෙක්ව එක් කෙනෙක් ද වේ ප්‍රකට බවට මුවහ බවට අහසෙහි මෙන් බිත්තියෙන් ඔබට පර්වතයෙන් ඔබට ප්‍රාකාරයෙන් ඔබට නොගැටී යයි. ජලයෙහි මෙන් පොළොවෙහි ගිලීම් කිමිදීම් කරයි පොළොවෙහි මෙන් ජලයෙහි දිය නොබිඳිමින් යයි. පක්ෂියෙකු මෙන් අහසෙහි යේද, පයඹංකයෙන් හිඳගෙන මහත් ඉර්ධි ඇති මහත් ආනුභාව ඇති මේ සඳ හිරු දෙදෙනා පවා අතින් ස්පර්ශ කරයි. පිරිමදියි. බ්‍රහ්මලෝක පවා කයින් වසඟ බවට පමුණුවයි.

10. "මහණෙනි, සතර ඉද්ධිපාදයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් තථාගත තෙමේ ආශ්‍රවයන් නැති කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධියෙන් අර්හත්ඵල ප්‍රඥාවත් මේ ආත්මයෙහිම තෙමේ විශෙෂ නුවණින් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරන්නේය." (ෂඩ්අභිඥාවන්ට මෙසේ විස්තර කළ යුතුයි)

(තුන්වෙනි අයොගුළ වර්ගය නිමි.)

---

## 4. ගංගා පෙය්‍යාල වර්ගය.

2. "මහණෙනි, යම්සේ ගංගා නදිය පෙරදිගට නැමීයේද පෙරදිගට වක්ව යේද පෙරදිගට අවනතව යේද...." (යනාදී වශයෙන් විස්තර කටයුතුය)

(2-12) ගංගා පෙය්‍යාලය ඉර්ධිපාදය වශයෙන් විස්තර කළයුතුයි.

---

## 5. අප්පමාද වර්ගය.

2. "මහණෙනි, පා නැත්තාවූ දෙපා ඇත්තාවූ සිව්පා ඇත්තාවූ යම්තාක් සත්වයෝ වෙත්ද....." (යනාදී වශයෙන් විස්තර කටයුතුයි.)

(1-12)-(අප්පමාද වර්ගය ඉර්ධිපාද වශයෙන් විස්තර කළ යුතුයි.)

---

## 6. බලකරණීය වර්ගය.

2. "මහණෙනි, යම්සේ යම්කිසි ශරීර බලයෙන් කළයුතු කර්මාන්තයෝ කරනු ලැබෙත්......" (යනාදී වශයෙන් විස්තර කළ යුතුයි.)

(1-12)-(බලකරණී වර්ගය ඉර්ධිපාද වශයෙන් විස්තර කළ යුතුයි.)

---

## 7. එසන වර්ගය.

2. "මහණෙනි, මේ සෙවීම් තිදෙනෙකි. කවර තිදෙනෙක්ද? (යනදී වශයෙන් විස්තර කළ යුතුයි.)

(1-10) - (ඒසනා වර්ගය ඉර්ධිපාද වශයෙන් විස්තර කළ යුතුයි.)

---

## 8. ඔඝ වර්ගය.

### 10. උද්ධම්භාගිය සූත්‍රය

2. "මහණෙනි, මේ උද්ධම්භාගිය සංයෝජනයෝ පසක් වෙත්. කවර පසෙක්ද? රූප රාගය, අරූප රාගය, මානය, උද්ධච්චය, අවිජ්ජාවය යනුයි මහණෙනි, මේ උද්ධම්භාගිය සංයෝජන පස වෙත්. මහණෙනි, මේ උද්ධම්භාගිය සංයොජන පස විශෙෂයෙන් දැනීම පිණිස පිරිසඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස පහ කිරීම පිණිස සතර ඉර්ධිපාදයෝ වැඩිය යුත්තාහ.

3. "කවර සතරක්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක්

ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉර්ධිපාදය වඩයි. වීර්‍ය්‍යය අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉද්ධිපාදය වඩයි. සිත අධිපති කොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉර්ධිපාදය වඩයි. වීමංසය අධිපතිකොට ඇති සමාධියෙන් හා සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුත් ඉර්ධිපාදය වඩයි.

4. "මහණෙනි, මේ උද්ධම්භාගිය සංයෝජන පස විශෙෂයෙන් දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂයකිරීම පිණිස පහකිරීම පිණිස මේ සතර ඉද්ධිපාදයන් වැඩිය යුත්තාහ.

(1-9) "මහණෙනි, මේ ඔඝ සතරකි කවර සතරක්ද? කාම ඔඝය, භව ඔඝය, දිට්ඨි ඔඝය, අවිජ්ජා ඔඝය යනුයි. (විස්තර කළ යුතුයි)

(ඔඝ වර්ගය ඉද්ධිපාද වශයෙන් විස්තර කළ යුතුයි. මෙසේ සතිපට්ඨානය දක්වා විස්තර කළ යුතුයි.)

(සත්වෙනි ඉර්ධිපාද සංයුත්තය නිමි)

---

# 8. අනුරුද්ධ සංයුත්තය.

## 1. රහොගත වර්ගය.

### 1 පඨම රහොගත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිර තෙමේ සැවැත් නුවර ජේතවන නම්වූ අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වාසය කරයි. එකල රහසිගතව විවේකයෙන් සිටි ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්ට මෙබඳු අදහසක් ඇතිවිය. 'යම්කිසි කෙනෙකුන් විසින් සතර සතිපට්ඨානයෝ සම්පූර්ණ නොකරන ලද්දාහුද, ඔවුන් විසින් මනාකොට දුක් ක්ෂය කිරීමට පැමිණෙන්නාවූ ආර්‍ය්‍ය මාර්ගය සම්පූර්ණ නොකරන ලද්දේය. යම්කිසි කෙනෙකුන් විසින් සතර සතිපට්ඨානයෝ සම්පූර්ණ කරන ලද්දාහුද ඔවුන් විසින්

මනාකොට දුක් ක්ෂය කිරීමට පැමිණෙන්නාවූ ආර්‍ය්‍ය මාර්ගය සම්පූර්ණ කරන ලදී,' යනුයි.

2. එකල්හි ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්ගේ සිත තමාගේ සිතින් දැන යම්සේ බලවත් පුරුෂයෙක් වක්කල අතක් දික් කරන්නේද, දික්කල අතක් වක්කරන්නේද, එපරිද්දෙන් ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්ගේ ඉදිරියෙහි පහළවූහ. එකල්හි ආයුෂ්මත් මහා මොග්ගල්ලාන තෙරණුවෝ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්ට මෙය කීහ.

3. "ඇවැත් අනුරුද්ධයෙනි, කොපමණකින් වනාහි භික්ෂුව විසින් සතර සතිපට්ඨානයෝ පටන්ගන්නා ලද්දාහු වෙත්ද?" "ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ස්කන්ධලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට තමාගේ කයෙහි ඉපදීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ කයෙහි විනාශවීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ කයෙහි ඉපදීම් ස්වභාවයත් විනාශවීම් ස්වභාවයත් නැවත නැවත බලමින් වාසය කෙරේද,

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට අනුන්ගේ කයෙහි ඉපදීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, අනුන්ගේ කයෙහි විනාශවීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, අනුන්ගේ කයෙහි ඉපදීම් ස්වභාවයත් විනාශවීම් ස්වභාවයත් නැවත නැවත බලමින් වාසය කෙරේද,

"කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට තමාගේ කයෙහිද අනුන්ගේ කයෙහිද ඉපදීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ කයෙහිද අනුන්ගේ කයෙහිද විනාශවීම් ස්වභාවය නැවත නැවත

බලමින් වාසය කෙරේද, තමාගේ කයෙහිද අනුන්ගේ කයෙහිද ඉපදීම් ස්වභාවයත් විනාශවීම් ස්වභාවයත් නැවත නැවත බලමින් වාසය කෙරේද,

"හෙතෙම ඉදින් 'නොපිළිකුල් දෙයෙහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරමියි කැමති වේද, එහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් පිළිකුල් දෙයෙහි නොපිළිකුල්ය යන හැඟීමෙන් යුක්තව වාසය කරන්නෙමියි' කැමති වෙයිද,

"එහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් නොපිළිකුල් දෙයෙහිද පිළිකුල් දෙයෙහිද පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරන්නෙමියි' කැමති වේද එහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් 'පිළිකුල් දෙයෙහිද නොපිළිකුල් දෙයෙහිද නොපිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරන්නෙමියි' කැමති වෙයිද, එහි නොපිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් 'නොපිළිකුලද පිළිකුලද යන දෙක මනාකොට ඉක්මවා මධ්‍යස්ථව සිහි ඇතිව යහපත් නුවණ ඇතිව වාසය කරන්නෙමියි' කැමති වේද, එහි මධ්‍යස්ථව සිහි ඇතිව මනා නුවණ ඇතිව වාසය කරයිද,

4. "මහණතෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට තමාගේ වේදනාවෙහි ඉපදීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ වේදනාවෙහි විනාශවීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ වේදනාවෙහි ඉපදීම් ස්වභාවයත් විනාශවීම් ස්වභාවයත් නැවත නැවත බලමින් වාසය කෙරේද,

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට අනුන්ගේ වේදනාවෙහි ඉපදීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, අනුන්ගේ වේදනාවෙහි විනාශවීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, අනුන්ගේ වේදනාවෙහි ඉපදීම් ස්වභාවයත් විනාශවීම් ස්වභාවයත් නැවත නැවත බලමින් වාසය කෙරේද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට තමාගේ වේදනාවෙහිද අනුන්ගේ වේදනාවෙහිද ඉපදීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ වේදනාවෙහිද අනුන්ගේ වේදනාවෙහිද විනාශවීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ වේදනාවෙහිද අනුන්ගේ වේදනාවෙහි ඉපදීම් ස්වභාවයත් විනාශවීම් ස්වභාවයත් නැවත නැවත බලමින් වාසය කෙරේද,

"හෙතෙම ඉදින් 'නොපිළිකුල් දෙයෙහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරමියි' කැමතිවේද, එහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් 'පිළිකුල් දෙයෙහි නොපිළිකුල්ය යන හැඟීමෙන් යුක්තව වාසය කරන්නෙමියි' කැමති වෙයිද,

"එහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් 'නොපිළිකුල් දෙයෙහිද පිළිකුල් දෙයෙහිද පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරන්නෙමියි' කැමතිවේද එහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් 'පිළිකුල් දෙයෙහිද නොපිළිකුල් දෙයෙහිද නොපිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරන්නෙමියි' කැමති වෙයිද, එහි නොපිළිකුල්ය යන හැඟීමෙන් වාසයකරයිද, ඉදින් 'නොපිළිකුලද පිළිකුලද යන දෙක මනාකොට ඉක්මවා මධ්‍යස්ථව සිහි ඇතිව යහපත් නුවණ ඇතිව වාසය කරන්නෙමියි' කැමතිවේද, එහි මධ්‍යස්ථව සිහි ඇතිව මනා නුවණ ඇතිව වාසය කරයිද,

**5.** "මහණතෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට තමාගේ සිතෙහි ඉපදීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ සිතෙහි විනාශවීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ සිතෙහි ඉපදීම් ස්වභාවයත් විනාශවීම් ස්වභාවයත් නැවත නැවත බලමින් වාසය කෙරේද,

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද

දුරුකොට අනුන්ගේ සිතෙහි ඉපදීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, අනුන්ගේ සිතෙහි විනාශවීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, අනුන්ගේ සිතෙහි ඉපදීම් ස්වභාවයත් විනාශවීම් ස්වභාවයත් නැවත නැවත බලමින් වාසය කෙරේද,

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට තමාගේ සිතෙහිද අනුන්ගේ සිතෙහිද ඉපදීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ සිතෙහිද අනුන්ගේ සිතෙහිද විනාශවීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ සිතෙහිද අනුන්ගේ සිතෙහිද ඉපදීම් ස්වභාවයත් විනාශවීම් ස්වභාවයත් නැවත නැවත බලමින් වාසය කෙරේද

"හෙතෙම ඉදින් 'නොපිළිකුල් දෙයෙහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසයකරමියි' කැමතිවේද, එහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් 'පිළිකුල් දෙයෙහි නොපිළිකුල්ය යන හැඟීමෙන් යුක්තව වාසය කරන්නෙමියි' කැමති වෙයිද,

"එහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් 'නොපිළිකුල් දෙයෙහිද පිළිකුල් දෙයෙහිද පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරන්නෙමියි' කැමතිවේද, එහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද ඉදින් 'පිළිකුල් දෙයෙහිද නොපිළිකුල් දෙයෙහිද නොපිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරන්නෙමියි' කැමති වෙයිද, එහි නොපිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් 'නොපිළිකුලද පිළිකුලද යන දෙක මනාකොට ඉක්මවා මධ්‍යස්ථව සිහි ඇතිව යහපත් නුවණ ඇතිව වාසය කරන්නෙමියි' කැමතිවේද, එහි මධ්‍යස්ථව සිහි ඇතිව මනා නුවණ ඇතිව වාසය කරයිද,

**6.** "මහණතෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට තමාගේ ධර්මයන්හි ඉපදීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ

ධර්මයන්හි විනාශවීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ ධර්මයන්හි ඉපදීම් ස්වභාවයත් විනාශවීම් ස්වභාවයත් නැවත නැවත බලමින් වාසය කෙරේද,

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට අනුන්ගේ ධර්මයන්හි ඉපදීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, අනුන්ගේ ධර්මයන්හි විනාශවීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, අනුන්ගේ ධර්මයන්හි ඉපදීම් ස්වභාවයත් විනාශවීම් ස්වභාවයත් නැවත නැවත බලමින් වාසය කෙරේද,

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට තමාගේ ධර්මයන්හිද අනුන්ගේ ධර්මයන්හිද ඉපදීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ ධර්මයන්හිද අනුන්ගේ ධර්මයන්හිද විනාශවීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ ධර්මයන්හිද අනුන්ගේ ධර්මයන්හිද ඉපදීම් ස්වභාවයත් විනාශවීම් ස්වභාවයත් නැවත නැවත බලමින් වාසය කෙරේද,

"හෙතෙම ඉදින් 'නොපිළිකුල් දෙයෙහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරමියි' කැමතිවේද, එහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් 'පිළිකුල් දෙයෙහි නොපිළිකුල්ය යන හැඟීමෙන් යුක්තව වාසය කරන්නෙමියි' කැමති වෙයිද,

'එහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් 'නොපිළිකුල් දෙයෙහිද පිළිකුල් දෙයෙහිද පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරන්නෙමියි' කැමතිවේද, එහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් 'පිළිකුල් දෙයෙහිද නොපිළිකුල් දෙයෙහිද නොපිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරන්නෙමියි' කැමති වෙයිද, එහි නොපිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් නොපිළිකුලද පිළිකුලද යන දෙක මනාකොට ඉක්මවා මධ්‍යස්ථව සිහි ඇතිව යහපත් නුවණ ඇතිව

වාසයකරන්නෙමියි' කැමතිවේද, එහි මධ්‍යස්ථව සිහි ඇතිව මනා නුවණ ඇතිව වාසය කරයි.

7. "ඇවැත්නි, මෙපමණකින් වනාහි භික්ෂුවගේ සතර සතිපට්ඨානයෝ සම්පූර්ණ කරන ලද්දාහුයයි" කීය.

---

## 2. දුතිය රහොගත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරතෙමේ සැවැත් නුවර ජේතවන නම්වූ අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වාසය කරයි. එකල්හි රහසිගතව විවේකයෙන් සිටි ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්ට මෙබඳු අදහසක් ඇතිවිය. 'යම්කිසි කෙනකුන් විසින් සතර සතිපට්ඨානයෝ සම්පූර්ණ නොකරන ලද්දාහුද ඔවුන් විසින් මනා කොට දුක් නැති කරන ආර්‍ය්‍ය මාර්ගය සම්පූර්ණ නොකරන ලද්දේය. යම් කිසිවකු විසින් සතර සතිපට්ඨානයෝ සම්පූර්ණ කරන ලද්දාහුද ඔවුන් විසින් මනාකොට දුක් නැති කරන ආර්‍ය්‍යමාර්ගය සම්පූර්ණ කරන ලද්දේය' කියායි.

2. එකල්හි ආයුෂ්මත් මහා මොග්ගල්ලාන තෙරණුවෝ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්ගේ අදහස තමන්ගේ සිතින් දැන යම්සේ බලවත් පුරුෂයෙක් වක්කළ අතක් දික්කරන්නේද, දික්කළ අතක් වක්කරන්නේද එපරිද්දෙන් ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්ගේ ඉදිරියෙහි පහළ වූහ. ඉක්බිති ආයුෂ්මත් මහා මොග්ගල්ලාන තෙරණුවෝ ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවන්ට මෙය කීහ.

3. "ඇවැත් අනුරුද්ධයෙනි, කොපමණකින් භික්ෂුවක් විසින් සතර සතිපට්ඨානයෝ සම්පූර්ණ කරන ලද්දාහු වෙත්ද?" යනුයි. "ඇවැත්නි, මේ ශාසනයෙහි මහණ තෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරු කොට තමාගේ කයෙහි ඉපදීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද,

තමාගේ කයෙහි විනාශවීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ ඉපදීම් ස්වභාවයත් විනාශවීම් ස්වභාවයත් නැවත නැවත බලමින් වාසය කෙරේද,

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට අනුන්ගේ කයෙහි ඉපදීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, අනුන්ගේ කයෙහි විනාශවීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, අනුන්ගේ කයෙහි ඉපදීම් ස්වභාවයත් විනාශවීම් ස්වභාවයත් නැවත නැවත බලමින් වාසය කෙරේද,

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට තමාගේ කයෙහිද අනුන්ගේ කයෙහිද ඉපදීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ කයෙහිද අනුන්ගේ කයෙහිද විනාශවීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ කයෙහිද අනුන්ගේ කයෙහිද ඉපදීම් ස්වභාවයත් විනාශවීම් ස්වභාවයත් නැවත නැවත බලමින් වාසය කෙරේද,

"හෙතෙම ඉදින් 'නොපිළිකුල් දෙයෙහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරමියි' කැමති වේද, එහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් 'පිළිකුල් දෙයෙහි නොපිළිකුල්ය යන හැඟීමෙන් යුක්තව වාසය කරන්නෙමියි' කැමති වේද,

'එහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද ඉදින් 'නොපිළිකුල් දෙයෙහිද පිළිකුල් දෙයෙහිද පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරන්නෙමියි' කැමතිවේද, එහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් 'පිළිකුල් දෙයෙහිද නොපිළිකුල් දෙයෙහිද නොපිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරන්නෙමියි' කැමතිවේද, එහි නොපිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරන්නෙමියි' කැමතිවේද, එහි නොපිළිකුල්යි යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් 'නොපිළිකුල්ද පිළිකුල්ද යන

දෙක මනාකොට ඉක්මවා මධ්‍යස්ථව සිහි ඇතිව යහපත් නුවණ ඇතිව වාසය කරන්නෙමියි' කැමතිවේද, එහි මධ්‍යස්ථව සිහි ඇතිව මනා නුවණ ඇතිව වාසය කරයිද,

4. "මහණතෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට තමාගේ වේදනාවෙහි ඉපදීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ වේදනාවෙහි විනාශවීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ වේදනාවෙහි ඉපදීම් ස්වභාවයත් විනාශවීම් ස්වභාවයත් නැවත නැවත බලමින් වාසය කෙරේද,

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට අනුන්ගේ වේදනාවෙහි ඉපදීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, අනුන්ගේ වේදනාවෙහි විනාශවීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, අනුන්ගේ වේදනාවෙහි ඉපදීම් ස්වභාවයත් විනාශවීම් ස්වභාවයත් නැවත නැවත බලමින් වාසය කෙරේද,

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට තමාග් වේදනාවෙහිද අනුන්ගේ වේදනාවෙහිද ඉපදීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ වේදනාවෙහිද අනුන්ගේ වේදනාවෙහිද විනාශවීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ වේදනාවෙහිද අනුන්ගේ වේදනාවෙහිද ඉපදීම් ස්වභාවයත් විනාශවීම් ස්වභාවයත් නැවත නැවත බලමින් වාසය කෙරේද,

"හෙතෙම ඉදින් 'නොපිළිකුල් දෙයෙහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරමියි' කැමතිවේද, එහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද ඉදින් 'පිළිකුල් දෙයෙහි නොපිළිකුල්ය යන හැඟීමෙන් යුක්තව වාසය කරන්නෙමියි' කැමති වෙයිද,

"එහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් 'නොපිළිකුල් දෙයෙහිද පිළිකුල් දෙයෙහිද පිළිකුල්ය යන

හැඟීමෙන් වාසය කරන්නෙමියි’ කැමතිවේද එහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් ‘පිළිකුල් දෙයෙහිද නොපිළිකුල් දෙයෙහිද නොපිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරන්නෙමියි’ කැමති වෙයිද, එහි නොපිළිකුල්ය යන හැඟීමෙන් වාසයකරයිද, ඉදින් ‘නොපිළිකුලද පිළිකුලද යන දෙක මනාකොට ඉක්මවා මධ්‍යස්ථව සිහි ඇතිව යහපත් නුවණ ඇතිව වාසය කරන්නෙමියි’ කැමතිවේද, එහි මධ්‍යස්ථව සිහි ඇතිව මනා නුවණ ඇතිව වාසය කරයිද,

**5.** “මහණතෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට තමාගේ සිතෙහි ඉපදීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ සිතෙහි විනාශවීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ සිතෙහි ඉපදීම් ස්වභාවයත් විනාශවීම් ස්වභාවයත් නැවත නැවත බලමින් වාසය කෙරේද,

“කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට අනුන්ගේ සිතෙහි ඉපදීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, අනුන්ගේ සිතෙහි විනාශවීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, අනුන්ගේ සිතෙහි ඉපදීම් ස්වභාවයත් විනාශවීම් ස්වභාවයත් නැවත නැවත බලමින් වාසය කෙරේද,

‘කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට තමාගේ සිතෙහිද අනුන්ගේ සිතෙහිද ඉපදීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ සිතෙහිද අනුන්ගේ සිතෙහිද විනාශවීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ සිතෙහිද අනුන්ගේ සිතෙහිද ඉපදීම් ස්වභාවයත් විනාශවීම් ස්වභාවයත් නැවත නැවත බලමින් වාසය කෙරේද,

"හෙතෙම ඉදින් 'නොපිළිකුල් දෙයෙහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසයකරමියි' කැමතිවේද, එහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් 'පිළිකුල් දෙයෙහි නොපිළිකුල්ය යන හැඟීමෙන් යුක්තව වාසය කරන්නෙමියි' කැමති වෙයිද,

"එහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් නොපිළිකුල් දෙයෙහිද පිළිකුල් දෙයෙහිද පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරන්නෙමියි' කැමතිවේද, එහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද ඉදින් 'පිළිකුල් දෙයෙහිද නොපිළිකුල් දෙයෙහිද නොපිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරන්නෙමියි' කැමති වෙයිද, එහි නොපිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් 'නොපිළිකුලද පිළිකුලද යන දෙක මනාකොට ඉක්මවා මධ්‍යස්ථව සිහි ඇතිව යහපත් නුවණ ඇතිව වාසය කරන්නෙමියි' කැමතිවේද, එහි මධ්‍යස්ථව සිහි ඇතිව මනා නුවණ ඇතිව වාසය කරයිද,

**6.** "මහණ තෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට තමාගේ ධර්මයන්හි ඉපදීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ ධර්මයන්හි විනාශවීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ ධර්මයන්හි ඉපදීම් ස්වභාවයත් විනාශවීම් ස්වභාවයත් නැවත නැවත බලමින් වාසය කෙරේද,

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට අනුන්ගේ ධර්මයන්හි ඉපදීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, අනුන්ගේ ධර්මයන්හි විනාශවීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, අනුන්ගේ ධර්මයන්හි ඉපදීම් ස්වභාවයත් විනාශවීම් ස්වභාවයත් නැවත නැවත බලමින් වාසය කෙරේද,

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද

දුරුකොට තමාගේ ධර්මයන්හිද අනුන්ගේ ධර්මයන්හිද ඉපදීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ ධර්මයන්හිද අනුන්ගේ ධර්මයන්හිද විනාශවීම් ස්වභාවය නැවත නැවත බලමින් වාසය කෙරේද, තමාගේ ධර්මයන්හිද අනුන්ගේ ධර්මයන්හිද ඉපදීම් ස්වභාවයත් විනාශවීම් ස්වභාවයත් නැවත නැවත බලමින් වාසය කෙරේද,

"හෙතෙම ඉදින් 'නොපිළිකුල් දෙයෙහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරමියි' කැමතිවේද, එහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් පිළිකුල් දෙයෙහි නොපිළිකුල්ය යන හැඟීමෙන් යුක්තව වාසය කරන්නෙමියි' කැමතිවෙයිද,

"එහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් 'නොපිළිකුල් දෙයෙහිද පිළිකුල් දෙයෙහිද පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරන්නෙමියි' කැමතිවේද, එහි පිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් 'පිළිකුල් දෙයෙහිද නොපිළිකුල් දෙයෙහිද නොපිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරන්නෙමියි' කැමති වෙයිද, එහි නොපිළිකුල්ය යන හැඟීමෙන් වාසය කරයිද, ඉදින් නොපිළිකුලද පිළිකුලද යන දෙක මනාකොට ඉක්මවා මධ්‍යස්ථව සිහි ඇතිව යහපත් නුවණ ඇතිව වාසයකරන්නෙමියි' කැමතිවේද, එහි මධ්‍යස්ථව සිහිඇතිව මනා නුවණ ඇතිව වාසය කරයි.

7. "ඇවැත්නි, මෙපමණකින් වනාහි භික්ෂුවගේ සතර සතිපට්ඨානයෝ සම්පූර්ණ කරන ලද්දාහුයයි" කීය.

---

## 3. සුතනු සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරතෙමේ සැවැත් නුවර සුතනු ගංඉවුරෙහි වාසය කරයි. එකල්හි බොහෝ භික්ෂූහු ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිර තෙමේ යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් සමග සතුටු වූවාහුය. සතුටුවිය

යුතු සිහිකටයුතු කථාවන් කොට නිමවා එක් පසෙක හුන්නාහුය. එක් පසෙක හුන්නාවූ ඒ භික්ෂූහු ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්ට මෙය කීවාහුය. "ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරතෙමේ කවර නම් ධර්මයන් වැඩූ බැවින් බහුල වසයෙන් වැඩූ බැවින් මහත් අභිඥා ඇති බවට පැමිණියේද?"

2. "ආයුෂ්මත්නි, මම වනාහි සතර සතිපට්ඨානයන් වැඩූ බැවින් බහුල වසයෙන් වැඩූ බැවින් මහත් අභිඥා ඇති බවට පැමිණියෙමි කවර සතරක්දයත්?

'ඇවැත්නි, මම මේ සාසනයෙහි කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට කයෙහි කය නැවත නැවත බලමින් වාසය කෙළෙමි.

මම මේ සාසනයෙහි කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට වේදනාවෙහි වේදනාවන් නැවත නැවත බලමින් වාසය කෙළෙමි.

මම මේ සාසනයෙහි කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට සිතෙහි සිත නැවත නැවත බලමින් වාසය කෙළෙමි.

කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට ධර්මයන් කෙරෙහි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කෙළෙමි.

3. "ඇවැත්නි, මම වනාහි මේ සතර සතිපට්ඨානයන් වැඩූ බැවින් බහුල වසයෙන් වැඩූ බැවින් මහත් අභිඥා ඇති බවට පැමිණියෙමි. ඇවැත්නි මම මේ සතර සතිපට්ඨානයන් වැඩූ බැවින් බහුල වසයෙන් වැඩූ බැවින් හීන ධර්ම හීන වසයෙන් මනාකොට දැනගත්තෙමි. මධ්‍යම ධර්ම මධ්‍යම වසයෙන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දැනගත්තෙමි. ප්‍රණීත ධර්ම ප්‍රණීත වසයෙන් දැන ගත්තෙමියි" කීය.

---

## 4. පඨම කණ්ටකීවන සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්වහන්සේද ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන්වහන්සේද ආයුෂ්මත් මහාමොග්ගල්ලානස්ථවිරයන් වහන්සේද සාකෙත නුවර කණ්ඨකී වනයෙහි වාසය කළාහුය. ඉක්බිති ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේද ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේද සවස් කාලයෙහි විවේකයෙන් නැගීසිටියාහු ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය පැමිණ, ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් සමග සතුටු වූවාහුය. සතුටු වියයුතු සිහි කටයුතු කථාවකොට නිමවා එක්පසෙක වැඩහුන්නාහුය. එක් පසෙක වැඩහුන් ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්ට මෙය කීහ.

2. "ඇවැත් අනුරුද්ධයෙනි, ශෛක්ෂ භික්ෂුව විසින් කිනම් ධර්මයන්ට පැමිණ වාසය කළ යුත්තාහුද?"

"ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, ශෛක්ෂ භික්ෂුව විසින් සතර සතිපට්ඨානයන්ට පැමිණ වාසය කළ යුතුයි. කවර සතරක්ද? ඇවැත්නි මේ සාසනයෙහි මහණතෙම කෙළෙස් තවන වීය්‍ය්‍ය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරයි.

කෙලෙස් තවන වීය්‍ය්‍ය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට වේදනාවෙහි වේදනාව නැවත නැවත බලමින් වාසය කරයි.

කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට සිතෙහි සිත නැවත නැවත බලමින් වාසය කරයි.

කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරයි.

3. "ඇවැත් ශාරිපුත්‍ර ස්ථවිරයෙනි, ශෛක්ෂ භික්ෂුව විසින් මේ සතර සතිපට්ඨානයන්ට, පැමිණ වාසය කළ යුත්තේයයි" කීය.

---

## 5. දුතිය කණ්ටකීවන සූත්‍රය.

1. (මේ ඡෙදයද මේ වර්ගයේ 4 සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

"ඇවැත් අනුරුද්ධයෙනි, අශෛක්ෂ භික්ෂුව විසින් කවර ධර්මයන්ට පැමිණ වාසය කළ යුතුද?"

2. "ඇවැත් ශාරිපුත්‍ර ස්ථවිරයනි, අශෛක්ෂ භික්ෂුව විසින් සතර සතිපට්ඨානයන්ට පැමිණ වාසය කළ යුතුයි. කවර සතරක්ද?

"ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරයි.

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට වේදනාවන්හි වේදනාවන් නැවත නැවත බලමින් වාසය කරයි

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට සිතෙහි සිත නැවත නැවත බලමින් වාසය කරයි.

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට ධර්මයන්හි ධර්මයන් නැවතනැවත බලමින් වාසය කරයි.

3. "ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයනි, අශෛක්ෂ භික්ෂුව විසින් මේ සතර සතිපට්ඨානයන්ට පැමිණ වාසය කළ යුත්තේයයි" කීය.

---

## 6. තතිය කණ්ටකීවන සූත්‍රය.

1. (මේ ඡෙදය මේ වර්ගයේ 4 සූත්‍රයේ 1 ඡෙදය මෙනි.)

2. "කවර ධර්මයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් ආයුෂ්මත් අනුරුද්ධතෙමේ මහත් අභිඥා ඇතිබවට පැමිණියේද?"

"ඇවැත්නි, සතර සතිපට්ඨානයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් මහත් අභිඥා ඇති බවට පැමිණියෙමි. කවර සතරක්ද යත්?

3. "ඇවැත්නි, මම මේ ශාසනයෙහි කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට කයෙහි කය නැවත නැවත බලමින් වාසය කළෙමි.

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට වේදනාවන්හි වේදනාවන් නැවත නැවත බලමින් වාසය කළෙමි.

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට සිතෙහි සිත නැවත නැවත බලමින් වාසය කළෙමි.

"ඇවැත්නි, මම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලෝකයෙහි ලොභයද

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ද්වෙෂයද දුරුකොට ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කෙළෙමි.

4. "ඇවැත්නි, මම මේ සතර සතිපට්ඨානයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් මහත් අභිඥා ඇති බවට පැමිණියෙමි.

"ඇවැත්නි, මම මේ සතර සතිපට්ඨානයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් චක්‍රවාළ දහසක් එක් ආවර්ජනයකින් දැන ගනිමියි" කීය.

---

## 7. අනුරුද්ධ තණ්හාක්ඛය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්සමයෙක්හි ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරතෙමේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරයි. එහිදී ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරතෙමේ භික්ෂූන් ඇමතූහ.

2. "ඇවැත්නි, කවර ධර්මයන් වැඩූ බැවින් තෘෂ්ණාව නැති බවට පැමිණියේද?

"ඇවැත්නි, වඩන ලද්දාවූ බහුල වශයෙන් වඩන ලද්දාවූ මේ සතර සතිපට්ඨානයෝ තෘෂ්ණාව නැතිකිරීම පිණිස පවතිත්. කවර සතරක්ද යත්?

3 "ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට කයෙහි කය නැවත බලමින් වාසය කරයි.

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට වේදනාවන්හි වේදනාවන් නැවත නැවත බලමින් වාසය කරයි.

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට සිතෙහි සිත නැවත නැවත බලමින් වාසය කරයි.

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරයි.

3. "ඇවැත්නි, වඩන ලද්දාවූ බහුල වශයෙන් වඩන ලද්දාවූ මේ සතර සතිපට්ඨානයෝ තෘෂ්ණාව නැතිකිරීම පිණිස පවතිත්" යනුයි.

---

## 8. සලළාගාර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ සැවැත්නුවර සලළාගාරයෙහි විසූහ. එහිදී ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ භික්ෂූන් අමතා මෙය කීහ.

2. "ඇවැත්නි, යම්සේ ගංගා නදිය පෙරදිගට නැමී පෙරදිගට හැරී පෙරදිගට නැඹුරුවී පවතීද, ඉක්බිති 'අපි මේ ගංගානදිය බටහිරට නැමුනක් බටහිරට හැරුණක් බටහිරට නැඹුරුවූවක් කරන්නෙමුයි' උදළු කූඩා ගත් මහජන සමූහයක් එන්නේය. ඇවැත්නි, ඒ කුමකැයි සිතව්ද? ඒ මහජන සමූහය ගංගානදිය බටහිරට නැමුනක් බටහිරට හැරුණක් බටහිරට නැඹුරුවූවක් කෙරේද?"

"ඇවැත්නි, එය එසේ නොවේ."

"එයට හේතුව කවරේද?'

"ඇවැත්නි, ගංගානදිය පෙරදිගට නැමී පෙරදිගට හැරී පෙරදිගට නැඹුරුවී පවත්නේය. එය බටහිරට නැමුණක් බටහිරට හැරුණක් බටහිරට නැඹුරුවූවක් කිරීමට පහසු නොවේ. ඒ

මහාජන සමූහය එයින් ක්ලාන්ත බවට වෙහෙසීමට පත්වන්නේය.”

3, “ඇවැත්නි, එපරිද්දෙන්ම සතර සතිපට්ඨානය වඩන්නාවූ බහුල වශයෙන් වඩන්නාවූ භික්ෂුවට රජු හෝ රාජ මහාමාත්‍යයෙක් හෝ, මිත්‍රයෙක් හෝ අසල්වැස්සෝ හෝ සහලේ නෑයෝ හෝ, ‘පින්වත් පුරුෂය, නුඹ කුමක් නිසා මේ කාෂාය වස්ත්‍රය පෙරවන්නෙහිද, කුමක් නිසා හිස මුඩුකොට කබලක් ගෙන හැසිරෙන්නෙහිද, එව සිව්රු හැර සම්පත්ද අනුභව කරව පින්ද කරවයි පවරන්නාහු නම් ඇවැත්නි, ‘සතර සතිපට්ඨානයන් වඩන්නාවූ සතර සතිපට්ඨානයන් බහුල වශයෙන් වඩන්නාවූ ඒ භික්ෂුව වනාහි ශික්ෂා ප්‍රත්‍යඛ්‍යානය කොට (භික්ෂුභාවය ප්‍රතික්ෂෙප කොට) ගිහි වන්නේය’ යන මේ කරුණ විද්‍යමාන නොවේ. එයට හේතුව කවරේද? ඇවැත්නි, යම් සිතක් බොහෝ කාලයක් විවේකයට නැමුනේද, විවේකයට හැරුණේද, විවෙකයට නැඹුරු වූයේද? එය එසේ ගිහි බවට පැමිණෙන්නේය යන මේ කරුණ විද්‍යමාන නොවේ.

4. “ඇවැත්නි, මහණතෙමේ කෙසේ නම් සතර සතිපට්ඨානයන් වඩන්නේද, සතර සතිපට්ඨානයන් බහුල කරන්නේද? ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම කෙලෙස් තවන වීය්‍ය්‍ය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට කයෙහි කය නැවත නැවත බලමින් වාසය කෙරේද,

“කෙලෙස් තවන වීය්‍ය්‍ය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට වේදනාවන්හි වේදනාවන් නැවත නැවත බලමින් වාසය කෙරේද,

“කෙලෙස් තවන වීය්‍ය්‍ය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට සිතෙහි සිත නැවත නැවත බලමින් වාසය කෙරේද,

“කෙලෙස් තවන වීය්‍ය්‍ය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දුරුකොට ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කෙරේද,

5. "ඇවැත්නි, මහණතෙමේ මෙසේ වනාහි සතර සතිපට්ඨානයන් වඩන්නේය. සතර සතිපට්ඨානයන් බහුල වශයෙන් වඩන්නේය" යනුයි.

---

## 9. අම්බපාලිවන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේද ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේද විසාලා මහනුවර අම්බපාලි වනයෙහි වාසය කෙරෙත්.

2. එකල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සවස් කාලයෙහි විවේකයෙන් නැඟී සිටියේ ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් සමග සතුටුවූහ. සතුටුවිය යුතු සිහිකටයුතු කථාව කොට එක්පසෙක වැඩ උන්හ. එක්පසෙක උන්නාවූ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්ට මෙය කීහ.

"ඇවැත් අනුරුද්ධයෙනි, ඔබගේ ඉන්ද්‍රියයෝ අතිශයින් ප්‍රසන්නයහ. මුහුණෙහි වර්ණය පිරිසිදුය, විශෙෂයෙන් පැහැපත්ය ආයුෂ්මත් අනුරුද්ධ තෙමේ මේ කාලයෙහි කවර නම් විහරණයකින් වැඩි වශයෙන් වාසය කරන්නේද?"යනුයි.

"ඇවැත්නි, මම මේ කාලයෙහි වැඩි වශයෙන් සතර සතිපට්ඨානයන්හි මනාකොට පිහිටවූ සිත් ඇතිව වාසය කරමි. කවර නම් සතරක්හිද යත්?

"ඇවැත්නි, මම මේ ශාසනයෙහි කෙලෙස් තවන වීය්‍ර්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරමි.

"කෙලෙස් තවන වීය්‍ර්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද

දුරුකොට වේදනාවන්හි වේදනාව නැවත නැවත බලමින් වාසය කරමි.

"කෙලෙස් තවන වීය්‍ර්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට සිතෙහි සිත නැවත නැවත බලමින් වාසය කරමි.

"කෙලෙස් තවන වීය්‍ර්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව මේ ස්කන්ධ ලෝකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරමි.

4. "ඇවැත්නි, මම මේ සතර සතිපට්ඨානයන්හි මනා කොට පිහිටවූ සිත් ඇතිව මේ කාලයෙහි වැඩි වශයෙන් වාසය කරමි."

5. "ඇවැත්නි යම් ඒ භික්ෂුවක් රහත් වූයේ ක්ෂය කළ ආශ්‍රවයන් ඇත්තේ සසර වැස නිමවූ බඹසර ඇත්තේ කරන ලද කටයුතු ඇත්තේ බහා තැබූ කෙලෙස් බර ඇත්තේ තමාගේ අර්ථයට පැමිණියේ ක්ෂය කළ භව බැඳුම් ඇත්තේ මනා කොට දැන කෙලෙසුන් කෙරෙන් මිදුණේද ඒ භික්ෂුව මේ සතර සතිපට්ඨානයන්හි මනාකොට පිහිටවූ සිත් ඇතිව වැඩි වශයෙන් වාසය කරන්නේයයි" කීය.

6. "ඇවැත්නි, අපි ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්ගේ සමීපයෙන්ම කියන්නාවූ යම් අභීත වචනයක් ඇසුවෙමුද එය අපට ලාභයකි. අප විසින් මනාව ලබන ලද්දකියි" (ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ) කීහ.

## 10. අනුරුද්ධ අන්ධවන සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්වහන්සේ රෝගීව දුකට පැමිණ දැඩි ගිලන්ව සැවැත් නුවර අන්ධ වනයෙහි වාසය කළහ. එකල්හි බොහෝ භික්ෂූහු ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්වහන්සේ යම් තැනෙක්හිද

එතැනට පැමිණියාහුය. පැමිණ ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්ට මෙය කීවාහුය. කිනම් විහරණයකින් වාසය කරන්නාවූ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්ගේ උපන් ශරීරික දුක් වේදනාවෝ සිත මැඩගෙන නොසිටිත්ද?"

2. "ආයුෂ්මත්නි, සතර සතිපට්ඨානයන්හි මනාකොට පිහිටුවන ලද සිත් ඇතිව වාසය කරන්නාවූ මාගේ උපන්නාවූ ශාරීරික දුක් වේදනාවෝ සිත මැඩගෙන නොසිටිත්. කවර සතරෙක්හිද? ආයුෂ්මත්නි, මම මේ සාසනයෙහි කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරමි.

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට වේදනාවන්හි වේදනාවන් නැවත නැවත බලමින් වාසය කරයි.

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට සිතෙහි සිත නැවත නැවත බලමින් වාසය කරයි.

කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරයි.

3. "ඇවැත්නි, මේ සතර සතිපට්ඨානයන් කෙරෙහි මනාකොට පිහිටුවන ලද සිත් ඇතිව වාසය කරන්නාවූ මාගේ උපන් ශාරීරික දුක් වේදනාවෝ සිත මැඩගෙන නොසිටිත්" යනුයි.

(පළමුවැනි රහොගත වර්ගය නිමි)

---

# 2. දුතිය වර්ගය.

## 1. කප්ප සතසහස්ස සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක්සමයෙක්හි ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරති. එකල්හි බොහෝ භික්ෂූහු ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් සමග සතුටු වූවාහුය. සතුටු වියයුතු සිහිකටයුතු කථාවන් කොට නිමවා එක්පසෙක හුන්නෝය. එක්පසෙක හුන් භික්ෂූහු ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්ට මෙය කීවාහුය

"ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිර තෙමේ කවර නම් ධර්මයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් මහා අභිඥා ඇති බවට පැමිණියේද?" යනුයි.

2. "ඇවැත්නි, මම සතර සතිපට්ඨානයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් මහා අභිඥා ඇති බවට පැමිණියෙමි. කවර සතරක්ද යත්,

"ඇවැත්නි, මම මේ ශාසනයෙහි කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට කයෙහි කය නැවත නැවත බලමින් වාසය කෙළෙමි.

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට වේදනාවන්හි වේදනාවන් නැවත නැවත බලමින් වාසය කෙළෙමි.

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට සිතෙහි සිත නැවත නැවත බලමින් වාසය කෙළෙමි.

"කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කෙළෙමි.

3. 'ඇවැත්නි, මම මේ සතර සතිපට්ඨානයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් මහා අභිඥා ඇති බවට පැමිණියෙමි. ඇවැත්නි මම මේ සතර සතිපට්ඨානයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් චක්‍රවාල දහසක් සිහි කරන්නෙමියි" කීහ.

---

## 2. අනුරුද්ධ ඉද්ධිවිධ සූත්‍රය.

1. (මේ වර්ගයේ සියලු සූත්‍රයන්හි 1 වෙනි ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 1 වෙනි ඡේදය මෙනි.)

2. "ඇවැත්නි, මම මේ සතර සතිපට්ඨානයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් නොයෙක් ඉද්ධි අනුභව කරමි. එකෙක්ව බොහෝ දෙනෙක්ව වෙමි. බොහෝ දෙනෙක්ව එකෙක් වෙමි. ප්‍රකට බවට මුවහ බවට අහසෙහි මෙන් බිත්තියෙන් පිටතට පවුරෙන් පිටතට පර්වතයෙන් පිටතට නොගැටී යන්නෙමි. ජලයෙහි මෙන් පොළොවෙහිද ගිලීම් මතුවීම් කරමි. පොළොවෙහි මෙන් ජලයෙහිද දිය නොබිඳිමින් යමි. පක්ෂියෙකු මෙන් අහසෙහි පර්‍ය්‍යංකයෙන් හිඳ ගෙනම යමි. මහත් ඉද්ධි ඇති මහත් ආනුභාව ඇති මේ සඳ හිරු දෙදෙන පවා අතින් ස්පර්ශ කරමි. පිරිමදිමි. බ්‍රහ්මලොව දක්වා කයින් වසඟයෙහි පවත්වමි" කීය.

---

## 3. දිබ්බචක්ඛු සූත්‍රය.

2. "ඇවැත්නි, මේ සතර සතිපට්ඨානයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් මිනිස් බව ඉක්මවූ පිරිසිදුවූ දිව්‍ය

ශොත්‍ර ධාතුවෙන් දිව්‍යවූද මනුෂ්‍යවූද දුරවූද ළඟවූද දෙවදෑරුම් ශබ්දයන්ම අසන්නෙමි.”

---

## 4. චෙතොපරිච්ච සූත්‍රය

2 “ඇවැත්නි, මම මේ සතර සතිපට්ඨානයන් වැඩූ බැවින් අන් සත්වයන්ගේ අන් පුද්ගලයන්ගේ සිත් සිතින් සිත පිරිසිඳ දැනගතිමි. රාග සහිත සිත රාග සහිත සිතයයි දැනගතිමි. පහවූ රාග ඇති සිත පහවූ රාග ඇති සිතයයි දැන ගතිමි රාග රහිත සිත රාග රහිත සිතයයි දැනගතිමි. දොස සහිත සිත දොස සහිත සිතයයි දැනගතිමි. දොස රහිත සිත දොස රහිත සිතයයි දැනගතිමි. මොහ සහිත සිත මොහ සහිත සිතයයි දැනගතිමි. මොහ රහිත සිත මොහ රහිත සිතයයි දැන ගතිමි. හැකුලුන සිත හැකුලුන සිතයයි දැනගතිමි. විසිර ගිය සිත විසිර ගිය සිතයයි දැනගතිමි. මහග්ගත සිත මහග්ගත සිත යයි දැනගතිමි මහග්ගත නොවූ සිත මහග්ගත නොවූ සිත යයි දැනගතිමි. උසස් සිත උසස් සිතයයි දැනගතිමි. උසස් නොවූ සිත උසස් නොවූ සිතයයි දැනගතිමි. සමාහිත නොවූ සිත සමාහිත නොවූ සිතයයි දැනගතිමි. සමාහිත සිත සමාහිත සිතයයි දැනගතිමි නොමිදුනු සිත නොමිදුනු සිතයයි දැන ගතිමි. මිදුනු සිත මිදුනු සිතයයි දැනගතිමියි” කීය.

---

## 5. ඨාන ඨාන සූත්‍රය

“ඇවැත්නි, මම මේ සතර සතිපට්ඨානයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් හෙතුන් හෙතුන් වශයෙනුත් හෙතු නොවන කරුණු හෙතු නොවන කරුණු වශයෙනුත් තත්වූ පරිද්දෙන් දන්නෙමියි” කීය.

---

## 6. කම්ම විපාක සූත්‍රය

"ඇවැත්නි, මම මේ සතර සතිපට්ඨානයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් අතීත අනාගත වර්තමාන කර්මයන්ගේ හෙතුවට කාරණයට අනුකූල විපාක තත්වූ පරිද්දෙන් දන්නෙමියි" කීය.

---

## 7. සබ්බත්ථ ගාමිනී සූත්‍රය.

2. "ඇවැත්නි, මම මේ සතර සතිපට්ඨානයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් සියලු තැන්වලට පැමිණෙන ප්‍රතිපදාව තත්වූ පරිද්දෙන් දන්නෙමි" යනුයි

---

## 8. නානාධාතු ලොක සූත්‍රය.

2. "ඇවැත්නි, මම මේ සතර සතිපට්ඨානයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් අනෙකධාතු නානාධාතු ලෝකය තත්වූ පරිද්දෙන් දන්නෙමි" යනුයි.

---

## 9. නානාධිමුත්ති සූත්‍රය.

2. "ඇවැත්නි, මම මේ සතර සතිපට්ඨානයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් සත්වයන්ගේ නොයෙක් අදහස් තත්වූ පරිද්දෙන් දන්නෙමි" යනුයි.

---

## 10. ඉන්ද්‍රිය පරොපරියත්ත සූත්‍රය.

2. "ඇවැත්නි, මම මේ සතර සතිපට්ඨානයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් අන් සත්වයන්ගේ අන් පුද්ගලයන්ගේ මේ රූප නොමේරූ බව තත්වූ පරිද්දෙන් දන්නෙමි" යනුයි.

---

## 11. ඣාන විමොක්ඛ සූත්‍රය.

2. "ඇවැත්නි, මම මේ සතර සතිපට්ඨානයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් ධ්‍යාන විමොක්ෂ සමාධි සමාපත්තීන්ගේ කිළුටු බව පිරිසිදු බව නැඟීසිටීම තත්වූ පරිද්දෙන් දන්නෙමි" යනුයි

---

## 12. පුබ්බේනිවාස සූත්‍රය

2. "ඇවැත්නි, මම මේ සතර සතිපට්ඨානයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් නොයෙක් වැදෑරුම් පෙර විසුම් සිහිකරමි. කෙසේද යත්? "ජාති එකක්ද ජාති දෙකක්ද ජාති තුනක්ද ජාති සතරක්ද ජාති පහක්ද ජාති දහයක්ද ජාති විස්සක්ද ජාති තිහක්ද ජාති හතලිහක්ද ජාති පණහක්ද ජාති සියයක්ද ජාති දහසක්ද ජාති ලක්ෂයක්ද නොයෙක් සංවට්ට කල්පයන්ද නොයෙක් විවට්ට කල්පයන්ද නොයෙක් සංවට්ට විවට්ට කල්පයන් අසවල් තැන සිටියෙමි. නම මෙසේය. ගොත්‍රය මෙසේය. වර්ණය මෙසේය. ආහාරය මෙසේය. මෙසේ සැප දුක් වින්දෙමි. මෙසේ ආයු කෙළවරවිය. මම එයින් චුතව මෙහි උපන්නෙමි. මෙසේ ආකාර සහිතව කොටස් සහිතව නොයෙක් වැදෑරුම් පෙර විසූ කඳ පිළිවෙල සිහි කරමි" යනුයි.

---

## 13. චුතූපපාතඤාණ සූත්‍රය

2. "ඇවැත්නි, මම මේ සතර සතිපට්ඨානයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් මිනිස් බව ඉක්මවූ පිරිසිදුවූ දිවැසින් චුතවන්නාවූද උපදින්නාවූද හීනවූද ප්‍රණීතවූද, මනා පැහැ ඇත්තාවූද, දුර්වර්ණවූද සැපයට පැමිණියාවූද දුකට පැමිණියාවූද සත්වයන් දකිමි. කර්මානුකූලව උපන් සත්වයන් දකිමි.

"මේ පින්වත් සත්වයෝ ඒකාන්තයෙන් කාය දුශ්චරිතයෙන් යුක්ත වූවාහුය. වචී දුශ්චරිතයෙන් යුක්ත වූවාහුය. මනො

දුශ්චරිතයෙන් යුක්ත වූවාහුය. ආර්‍ය්‍යයන්ට නිග්‍රහ කළාවූ මිසදිටු වූවහුය. මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන් වූවාහුය. ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇත්තාවූ විවසව වැටෙන්නාවූ නිරයෙහි උපන්නාහුය.

"මේ පින්වත් සත්වයෝ ඒකාන්තයෙන් කාය සුචරිතයෙන් යුක්තවූවාහුය. වචී සුචරිතයෙන් යුක්ත වූවාහුය. මනො සුචරිතයෙන් යුක්තවූවාහුය. ආර්‍ය්‍යයන්ට නිග්‍රහ නොකළාහුය. සම්‍යක් දෘෂ්ටියෙන් යුක්තවූවාහුය. සම්‍යක් දෘෂ්ටි කර්ම සමාදන් වූවාහුය. ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් යුත් ස්වර්ගලෝකයෙහි උපන්නාහුයයි කර්මානුකූලව උපන් සත්වයන් දකිමි.

"මෙසේ මිනිස් බව ඉක්මවූ පිරිසිදුවූ දිව ඇසින් චුතවන්නාවූද උපදින්නාවූද හීනවූද ප්‍රණීතවූද මනා වර්ණ ඇත්තාවූද දුර්වර්ණ ඇත්තාවූද, සැප ඇත්තාවූද, සැප නැත්තාවූද සත්වයන් දකිමි. කර්මානුකූලව උපන් සත්වයන් දකිමි."

---

## 14. ආසවක්ඛයඤාණ සූත්‍රය.

2. "ඇවැත්නි, මම මේ සතර සතිපට්ඨානයන් වැඩූ බැවින් බහුල වශයෙන් වැඩූ බැවින් ආශ්‍රවයන් නැතිකිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත් ඵල සමාධියත් අර්හත් ඵල ප්‍රඥාවත් මේ ආත්මයෙහිම තෙමේ මනා නුවණින් දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරමි' යනුයි.

(අටවැනි අනුරුද්ධ සංයුත්තය නිමි.)

---

# 9. ඣාන සංයුත්තය.

## 1. ඣාන ගංගාපෙයයාලය.

### 1. පාචීන නින්න සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. ස්වාමීනියි කියා ඒ භික්ෂූන් භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, මේ ධ්‍යාන සතරක් වෙත්. කවර සතරක්ද යත්, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම කාමයන්ගෙන් වෙන්ව අකුසල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයි. විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් ඇතුළත පැහැදීම් සහිත සිත එකඟ බව ඇති විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. ප්‍රීතිය දුරුකිරීමෙන් සිහි ඇතිව මනා නුවණ ඇතිව මධ්‍යස්ථව වාසය කෙරේ. ධ්‍යාන සුවයද කයින් මනාකොට විඳියි. මධ්‍යස්ථව සිහි ඇතිව සුවසේ වාසය කෙරේයයි ආය්‍යීයෝ යමක් කියත්ද? ඒ තෘතීයධ්‍යානයට පැමිණ වාසය කරයි. සුඛ දුක්ඛයන්ගේ ප්‍රහාණයෙන් පළමුවම සොම්නස් දොම්නස් දෙක පහකිරීමෙන් දුක්ද නොවූ සැපද නොවූ උපෙක්ඛා සතියෙන් පිරිසිදුවූ චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරයි. මහණෙනි, මේ සතර ධ්‍යානයෝයි."

'මහණෙනි, යම්සේ ගංගානදිය පෙර දිගට නැමී පෙර දිගට හැරී පෙරදිගට නැඹුරුවී පවතිත්ද මහණෙනි, එසේම ධ්‍යාන සතර වඩන්නාවූ, ධ්‍යාන සතර බහුල කරන්නාවූ, මහණතෙම වනාහි නිවනට නැමුනේ, නිවනට හැරුණේ, නිවනට බරවූයේ වෙයි.

---

## 2-12 පාචීන නින්න සූත්‍ර

(මේ සූත්‍ර 12 ද මේ වර්ගයේ මුල් සූත්‍රය මෙන් ධ්‍යාන වශයෙන් යොදාගන්න.)

---

## 2. ධ්‍යාන අප්පමාද වර්ගය.

1-10 (මග්ග සංයුත්තයේ අප්පමාද වර්ගය මෙහිදී ධ්‍යාන වශයෙන් ගැනීමෙන් සූත්‍ර 10 සම්පූර්ණ වේ.)

---

## 3. ධ්‍යාන බලකරණීය වර්ගය.

1-12 (මග්ග සංයුත්තයේ බලකරණීය වර්ගය මෙහිදී ධ්‍යාන වශයෙන් ගැනීමෙන් සූත්‍ර 12 සම්පූර්ණ වේ.)

---

## 4. ධ්‍යාන එසනා වර්ගය.

1-10 (මග්ගසංයුත්තයේ එසනා වර්ගය මෙහිදී ධ්‍යාන වශයෙන් ගැනීමෙන් සූත්‍ර 10 සම්පූර්ණ වේ.)

---

## 5. ධ්‍යාන ඔඝ වර්ගය.

1-9 (මග්ග සංයුත්තයේ ඔඝවර්ගය මෙහිදී ධ්‍යාන වශයෙන් ගැනීමෙන් සූත්‍ර 9 සම්පූර්ණ වේ.)

---

### 10. උද්ධම්භාගිය සූත්‍රය.

1. (මේ ඡේදය මේ වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ මෙනි)

2. "මහණෙනි, මේ උද්ධම්භාගීය සංයෝජන පසකි. කවර පසෙක්ද? රූපරාගය, අරූප රාගය, මානය, උද්ධච්චය, අවිද්‍යාව

යනුයි මහණෙනි, මේ පස උද්ධම්භාගිය සංයෝජනයෝයි. මහණෙනි, මේ පඤ්ච උද්ධම්භාගිය සංයෝජන දැනීම පිණිස පිරිසිඳ දැනීම පිණිස ක්ෂය කිරීම පිණිස පහකිරීම පිණිස සතර ධ්‍යානයෝ වැඩිය යුත්තාහ.

3. "කවර සතරක්දයත්, මහණෙනි, මේ සාසනයෙහි මහණතෙම කාමයන්ගෙන් වෙන්ව අකුසල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයි, "විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් ඇතුළත පැහැදීම් සහිත සිත එකඟ බව ඇති විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කරයි. ප්‍රීතිය දුරුකිරීමෙන් සිහි ඇතිව මනා නුවණ ඇතිව මධ්‍යස්ථව වාසය කෙරේ. ධ්‍යාන සුවයද කයින් මනාකොට විඳියි. මධ්‍යස්ථව සිහි ඇතිව සුවසේ වාසය කෙරේයයි, ආර්‍යයෝ යමක් කියත්ද? ඒ තෘතීයධ්‍යානයට පැමිණ වාසය කරයි. සුඛ දුක්ඛයන්ගේ ප්‍රහාණයෙන් පළමුවම සොම්නස් දොම්නස් දෙක පහකිරීමෙන් දුක්ද නොවූ සැපද නොවූ උපෙක්ඛාසතියෙන් පිරිසිදුවූ චතුර්ථ ධ්‍යානයට පැමිණ වාසය කරයි. මහණෙනි, මේ සතර ධ්‍යානයෝයි."

4. "මහණෙනි, මේ පඤ්ච උද්ධම්භාගීය සංයෝජනයන් දැනීම පිණිස, පිරිසිඳ දැනීම පිණිස ක්ෂයකිරීම පිණිස, පහකිරීම පිණිස මේ සතර ධ්‍යානයෝ වැඩිය යුත්තාහ" යනුයි.

නවවැනි ඣාන සංයුත්තය නිමි.

---

# 10. ආනාපාන සංයුත්තය.

## 1. එකධම්ම වර්ගය.

### 1 ඒකධම්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූන් භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

"මහණෙනි, කෙසේ වඩන ලද්දාවූ කෙසේ බහුල වශයෙන් වඩන ලද්දාවූ එක් ධර්මයක් මහත්ඵල ඇත්තේ මහත් ආනිසංස ඇත්තේ වෙයි. කවර නම් එක ධර්මයක්ද? ආනාපාන සතියයි.

2. "මහණෙනි, කෙසේ වඩන ලද්දාවූ කෙසේ බහුල වශයෙන් වඩන ලද්දාවූ ආනාපාන සතිය මහත්ඵල ඇත්තේ මහත් ආනිසංස ඇත්තේ වෙත්ද?

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ වනයට ගියේ හෝ ගසක් මුලකට ගියේ හෝ හිස් ගෙයකට ගියේ හෝ පයඹිංක බැඳ ශරීරය කෙලින් පිහිටුවාගෙන සිහිය ඉදිරිපත් කොට තබාගෙන හිඳින්නේය. හෙතෙම සිහියෙන්ම ආශ්වාස කරන්නේය. සිහියෙන්ම ප්‍රස්වාස කරන්නේය. දීර්ඝකොට ආශ්වාස කරන්නේ හෝ දීර්ඝකොට ආශ්වාස කරන්නෙමි' යි දන්නේය. දීර්ඝකොට ප්‍රශ්වාස කරන්නේ හෝ දීර්ඝකොට ප්‍රශ්වාස කරන්නෙමි' යි දන්නේය. හ්‍රස්ව (ලුහුඬු) කොට ආශ්වාස කරන්නේ හෝ හ්‍රස්වකොට ආශ්වාස කරන්නෙමියි දන්නේය. හ්‍රස්වකොට ප්‍රශ්වාස කරන්නේ හෝ හ්‍රස්ව කොට ප්‍රශ්වාස කරන්නෙමියි දන්නේය.

3. "මුල මැද අග යන සියලු ආශ්වාස ප්‍රශ්වාස කය දැන ගනිමියි යන අදහසින් ආශ්වාස කරන්නෙමියි හික්මෙන්නේය.

සියලු ආස්වාස ප්‍රස්වාස කය දැනගනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආශ්වාස ප්‍රශ්වාසයන් සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආශ්වාස ප්‍රශ්වාසයන් සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි.

"ප්‍රීතිය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සුවය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සුවය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි.

චිත්ත සංස්කාරය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි.

සිත දැනගනිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත දැනගනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත සතුටු කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත සතුටු කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත එකඟ කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත සතුටු කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. අනිත්‍ය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. අනිත්‍ය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි.

නොඇලීම දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. නොඇලීම දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි.

නිරෝධය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. නිරෝධය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. පටිනිස්සග්ගය දක්වමින් පටිනිස්සග්ගයාගේ (හැරදැමීම) දකිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. පටිනිස්සග්ගය දකිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි.

"මහණෙනි, මෙසේ වඩන ලද්දාවූ මෙසේ බහුල වශයෙන් වඩන ලද්දාවූ ආනාපානා සතිය මහත්ඵල ඇත්තේ මහත් අනුභාව ඇත්තේවෙයි.

---

## 2 බොජ්ඣංග සූත්‍රය.

1. (මේ ඡේද 8 වෙනි සූත්‍රය තෙක් 1 සූත්‍රයේ මෙනි.)

2. "මහණෙනි, වඩන ලද්දාවූ බහුල වශයෙන් වඩන ලද්දාවූ ආනාපාන සතිය මහත්ඵල ඇත්තේ මහත් ආනිසංස ඇත්තේ වෙයි. මහණෙනි, කෙසේ වඩන ලද්දාවූ කෙසේ බහුල වශයෙන් වඩන ලද්දාවූ ආනාපානා සතිය මහත්ඵල ඇත්තේ මහත් ආනිසංස ඇත්තේවේද?

3. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ, නිරෝධය ඇසුරුකළාවූ, නිවනට නැමුනු ආනාපාන සති සහගතවූ සතිසම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළාවූ විරාගය ඇසුරුකළාවූ නිරොධය ඇසුරුකළාවූ නිවනට නැමුනු ආනාපානා සති සහගතවූ ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළාවූ විරාගය ඇසුරුකළාවූ නිරොධය ඇසුරුකළාවූ නිවනට නැමුනු ආනාපානා සති සහගතවූ පීති සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළාවූ විරාගය ඇසුරුකළාවූ නිරොධය ඇසුරුකළාවූ නිවනට නැමුනු ආනාපානා සති සහගතවූ පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළාවූ විරාගය ඇසුරුකළාවූ නිරොධය ඇසුරුකළාවූ නිවනට නැමුනු ආනාපානා සති සහගතවූ සමාධි සම්බොජ්ඣංගය වඩයිද,

"විවේකය ඇසුරුකළාවූ විරාගය ඇසුරුකළාවූ නිරොධය ඇසුරුකළාවූ නිවනට නැමුනු ආනාපානා සති සහගතවූ උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයිද,

"මහණෙනි, මෙසේ වඩන ලද්දාවූ බහුල වශයෙන් වඩන ලද්දාවූ ආනාපාන සතිය මහත්ඵල මහානිසංස ඇත්තේ වෙයි.

---

## 3. සුද්ධික ආනාපාන සූත්‍රය

2. "මහණෙනි, වඩන ලද්දාවූ බහුල වශයෙන් වඩන ලද්දාවූ ආනාපාන සතිය මහත්ඵල මහානිසංස ඇත්තේ වෙයි. මහණෙනි, කෙසේ වඩන ලද්දාවූ කෙසේ බහුල වශයෙන් වඩන ලද්දාවූ ආනාපාන සතිය මහත් ඵල මහානිසංස ඇත්තේ වෙයිද?

මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙමේ ආරණ්‍යයට ගියේ හෝ ගසක් මුලකට ගියේ හෝ හිස් ගෙයකට ගියේ හෝ පයර්‍යංක බැඳ ශරීරය කෙලින් පිහිටුවාගෙන සිහිය ඉදිරිපත් කොට තබා ගෙන හිඳින්නේය. හෙතෙම සිහියෙන්ම ආශ්වාස කරන්නේය. සිහියෙන්ම ප්‍රශ්වාස කරන්නේය. දීර්ඝකොට ආශ්වාස කරන්නේ හෝ දීර්ඝ කොට ආශ්වාස කරන්නෙමි' යි දන්නේය. දීර්ඝ කොට ප්‍රශ්වාස කරන්නේ හෝ දීර්ඝ කොට ප්‍රශ්වාස කරන්නෙමි'යි දන්නේය. හ්‍රස්ව (ලුහුඬු) කොට ආශ්වාස කරන්නේ හෝ හ්‍රස්ව කොට ආශ්වාස කරන්නෙමි' යි දන්නේය. හ්‍රස්ව කොට ප්‍රශ්වාස කරන්නේ හෝ හ්‍රස්ව කොට ප්‍රශ්වාස කරන්නෙමි' යි දන්නේය.

3. "මුල මැද අග යන සියලු ආශ්වාස ප්‍රශ්වාස කය දැනගනිමියි යන අදහසින් ආශ්වාස කරන්නෙමියි හික්මෙන්නේය. සියලු ආශ්වාස ප්‍රශ්වාස කය දැනගනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආශ්වාස ප්‍රශ්වාසයන් සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආශ්වාස ප්‍රශ්වාසයන් සංසිඳුමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය සුවය කරමින්

ආස්වාස කරන්නෙමියි හික්මෙයි ප්‍රීතිය සුවය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සුවය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සුවය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත දැනගනිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත දැනගනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත සතුටු කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත සතුටුකරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත එකඟකරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත එකඟකරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ප්‍රශ්වාස කරමියි හික්මෙයි. අනිත්‍ය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. අනිත්‍ය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. නොඇලීම දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. නොඇලීම දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. නිරොධය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. පටිනිස්සග්ගය (හැරදැමීම්) දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. පටිනිස්සග්ගය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. මහණෙනි, මෙසේ වඩන ලද්දාවූ මෙසේ බහුල වශයෙන් වඩන ලද්දාවූ ආනාපාන සතිය මහත් ඵල මහානිසංස ඇත්තේ වෙයි.

---

## 4. ඵලමය ආනාපාන සූත්‍රය.

2. "මහණෙනි, වඩන ලද්දාවූ බහුල වශයෙන් වඩන ලද්දාවූ ආනාපාන සතිය මහත් ඵල මහානිසංස ඇත්තේ වෙයි. මහණෙනි කෙසේ වඩන ලද්දාවූ කෙසේ බහුල වශයෙන් වඩන ලද්දාවූ ආනාපාන සතිය මහත් ඵල මහානිසංස ඇත්තේ වෙයිද? මහණෙනි මේ ශාසනයෙහි මහණතෙමේ ආරණ්‍යයට ගියේ

හෝ ගසක් මුලකට ගියේ හෝ හිස් ගෙයකට ගියේ හෝ පයඹිංක බැඳ ශරීරය කෙලින් පිහිටුවාගෙන සිහිය ඉදිරිපත් කොට තබාගෙන හිඳින්නේය. හෙතෙම සිහියෙන්ම ආශ්වාස කරන්නේය. සිහියෙන්ම ප්‍රස්වාස කරන්නේය. දීර්ඝකොට අස්වාස කරන්නේ හෝ දීර්ඝකොට ආස්වාස කරන්නෙමියි දන්නේය. දීර්ඝ කොට ප්‍රස්වාස කරන්නේ හෝ දීර්ඝකොට ප්‍රස්වාස කරන්නෙමි' යි දන්නේය. හ්‍රස්ව (ලුහුඬු) කොට ආස්වාස කරන්නේ හෝ හ්‍රස්ව කොට ආස්වාස කරන්නෙමියි දන්නේය. හ්‍රස්වකොට ප්‍රස්වාස කරන්නේ හෝ හ්‍රස්ව කොට ප්‍රස්වාස කරන්නෙමියි දන්නේය.

3. "මුල මැද අග යන සියලු ආස්වාස ප්‍රස්වාස කය දැනගනිමියි යන අදහසින් ආස්වාස කරන්නෙමියි හික්මෙන්නේය. සියලු ආස්වාස ප්‍රස්වාස කය දැනගනිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආස්වාස ප්‍රස්වාසයන් සංසිඳුවමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආස්වාස ප්‍රස්වාසයන් සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය ප්‍රකට කරමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. සුවය ප්‍රකට කරමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. සුවය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්තසංස්කාරය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්තසංස්කාරය සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත දැනගනිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත දැනගනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත සතුටු කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත සතුටුකරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත එකඟ කරමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. සිත එකඟකරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. අනිත්‍ය දකිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. අනිත්‍ය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි

හික්මෙයි. නොඇලීම දකිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. නොඇලීම දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. නිරොධය දකිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. නිරොධය දකිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. පටිනිස්සග්ගය දකිමින් ආස්වාස කරන්නෙමියි ආස්වාස කරමියි හික්මෙයි. පටිනිස්සග්ගය දකිමින් ප්‍රස්වාස කරන්නෙමියි ප්‍රස්වාස කරමියි හික්මෙයි.

"මහණෙනි, මෙසේ වඩන ලද්දාවූ බහුල වශයෙන් වඩන ලද්දාවූ ආනාපානා සතිය මහත් ඵල මහත් ආනිසංස ඇත්තේ වෙයි. මහණෙනි මෙසේ වඩන ලද්දාවූ බහුල වශයෙන් වඩන ලද්දාවූ ආනාපානා සතිය හෙතුකොට ගෙන මේ ආත්මයෙහිම රහත් ඵලය හෝ ස්කන්ධ ශෙෂය ඇතිකල්හි අනාගාමි බව යන ඵල දෙදෙනාගෙන් එක්තරා ඵලයක් කැමතිවිය යුතුයි.

---

## 5. සත්ත ඵල ආනාපාන සූත්‍රය.

1. (මේ ඡෙදය 4 වන සූත්‍රයේ 1 ඡෙදය හා සමයි.)

2. "මහණෙනි, වඩන ලද්දාවූ බහුල වශයෙන් වඩන ලද්දාවූ ආනාපාන සතිය මහත් ඵල මහානිසංස ඇත්තේ වෙයි. මහණෙනි, කෙසේ වඩන ලද්දාවූ කෙසේ බහුල වශයෙන් වඩන ලද්දාවූ ආනාපාන සතිය මහත් ඵල මහානිසංස ඇත්තේ වේද? මේ ශාසනයෙහි මහණතෙම ආරණ්‍යයට ගියේ හෝ ගහක් මුලට ගියේ හෝ හිස් ගෙයකට ගියේ හෝ පයඹිංක බැඳ ශරීරය කෙලින් පිහිටුවාගෙන සිහිය ඉදිරිපත් කොට තබාගෙන හිඳින්නේය. හෙතෙම සිහියෙන්ම ආස්වාස කරන්නේය. සිහියෙන්ම ප්‍රශ්වාස කරන්නේය. දීර්ඝ කොට ආස්වාස කරන්නේ හෝ දීර්ඝ කොට ආස්වාස කරන්නෙමියි දන්නේය. දීර්ඝකොට ප්‍රස්වාස කරන්නේ හෝ දීර්ඝකොට ප්‍රස්වාස කරන්නෙමියි දන්නේය. හ්‍රස්ව (ලුහුඬු) කොට ආස්වාස කරන්නේ හෝ හ්‍රස්ව කොට ආස්වාස කරන්නෙමියි දන්නේය. හ්‍රස්ව කොට ප්‍රස්වාස කරන්නේ හෝ හ්‍රස්ව කොට ප්‍රස්වාස කරන්නෙමියි දන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. "මුල මැද අග යන සියලු ආශ්වාස ප්‍රශ්වාස කය දැනගනිමියි යන අදහසින් ආශ්වාස කරන්නෙමියි හික්මෙන්නේය. සියලු ආශ්වාස ප්‍රශ්වාස කය දැනගනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි ඖදාරික ආශ්වාස ප්‍රශ්වාසයන් සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආශ්වාස ප්‍රශ්වාසයන් සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සුවය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සුවය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත දැනගනිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත දැන ගනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත සතුටු කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත සතුටු කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත එකඟ කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත එකඟ කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. අනිත්‍ය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. අනිත්‍ය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. නොඇලීම දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. නොඇලීම දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. නිරොධය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. නිරොධය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. පටිනිස්සග්ගය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. පටිනිස්සග්ගය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. මහණෙනි, මෙසේ වඩන ලද්දාවූ මෙසේ බහුල වශයෙන් වඩන ලද්දාවූ ආනාපාන සතිය මහත් ඵල මහානිසංස ඇත්තේ වෙයි මෙසේ වඩන ලද්දාවූ මෙසේ බහුල වශයෙන්

වඩන ලද්දාවූ ආනාපාන සතිය හෙතුකොට ගෙන ඵල සතක් ආනිසංස සතක් කැමතිවිය යුතුයි. කවර ඵල සතක් කවර ආනිසංස සතක්ද යත්?

"පළමුකොට මේ ආත්මයෙහිම රහත් වෙයි. ඉදින් පළමුකොට මේ ආත්මයෙහිම රහත් ඵලය නොලබයිද, නැවත මරණ කාලයෙහි රහත් ඵලය ලබයි. ඉදින් පළමුකොට මේ අත්බැව්හිම රහත් ඵලය අවබොධ නොකෙරේද, ඉදින් මරණ කාලයෙහිත් රහත් ඵලය අවබොධ නොකෙළේද, නැවත ඔරම්භාගීය සංයෝජන පස නැතිකිරීමෙන් අන්තරා පරිනිබ්බයී නම් අනාගාමි වෙයි. උපහච්ච පරිනිබ්බායි නම් අනාගාමි වෙයි. අසංඛාර පරිනිබ්බායී නම් අනාගාමි වෙයි. සසංඛාර පරිනිබ්බායී නම් අනාගාමි වෙයි. උද්ධංසොත අකනිට්ඨගාමී නම් අනාගාමි වෙයි

"මහණෙනි, මෙසේ වඩන ලද්දාවූ මෙසේ බහුල වශයෙන් වඩන ලද්දාවූ ආනාපාන සතිය හෙතුකොට ගෙන මේ ඵල සත ආනිසංස සත කැමති විය යුතුයි.

---

## 6 අරිට්ඨ සූත්‍රය.

**2.** "මහණෙනි, තෙපි අනාපාන සතිය භාවනා කරව්ද?" මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් අරිට්ඨ භික්ෂු තෙමේ භාග්‍යවතුන්වහන්සේට මෙය කීය. "ස්වාමීනි, මම ආනාපාන සතිය වඩන්නෙමි" යනුයි. "අරිට්ඨ, නුඹ කෙසේ නම් ආනාපාන සතිය වඩන්නෙහිද?" "ස්වාමීනි, මාගෙ අතීත කාම වස්තූන් කෙරෙහි කාමච්ඡන්දය පහවීය. මාගේ අනාගත කාම වස්තූන් කෙරෙහි කාමච්ඡන්දය පහවීය. මාගේ අධ්‍යාත්මික බාහිර ආයතනයන් කෙරෙහි ප්‍රතිඝ සඤ්ඤාව මනාකොට හික්මවන ලදී. ඒ මම සිහියෙන් යුක්තවම ආශ්වාස කරන්නෙමි. සිහියෙන් යුක්තවම ප්‍රශ්වාස කරන්නෙමි. ස්වාමීනි, මම මෙසේ ආනාපාන සතිය වඩමි" යනුයි.

3. "අරිට්ඨය, මෙසේවූ ආනාපාන සතියක්ද ඇත. මෙය ආනාපාන සතිය නොවේයයි නොකියමි. අරිට්ඨය එසේවුවත් යම්සේ ආනාපාන සතිය විස්තර වසයෙන් සම්පූර්ණ වේද, එය අසව, මනාකොට මෙනෙහි කරව කියන්නෙමි.

"අරිට්ඨය, කෙසේනම් ආනාපාන සතිය විස්තර වසයෙන් සම්පූර්ණවේද? අරිට්ඨය, මේ සාසනයෙහි මහණතෙමේ ආරණ්‍යයකට ගියේ හෝ ගසක්මුලකට ගියේ හෝ හිස් ගෙයකට ගියේ හෝ පයඹිංක බැඳ ශරීරය කෙලින් පිහිටුවාගෙන සිහිය ඉදිරිපත්කොට තබාගෙන හිඳින්නේය. හෙතෙම සිහියෙන්ම ආශ්වාස කරන්නේය. සිහියෙන්ම ප්‍රශ්වාස කරන්නේය. දීර්ඝකොට ආශ්වාස කරන්නේ හෝ දීර්ඝකොට ආශ්වාස කරන්නෙමි' යි දන්නේය. දීර්ඝකොට ප්‍රශ්වාස කරන්නේ හෝ දීර්ඝකොට ප්‍රශ්වාස කරන්නෙමි' යි දන්නේය. හ්‍රස්ව (ලුහුඬු) කොට ආශ්වාස කරන්නේ හෝ හ්‍රස්ව කොට ආශ්වාස කරන්නෙමියි දන්නේය. හ්‍රස්ව කොට ප්‍රස්වාස කරන්නේ හෝ හ්‍රස්ව කොට ප්‍රශ්වාස කරන්නෙමියි දන්නේය.

"මුල මැද අග යන සියලු ආශ්වාස ප්‍රශ්වාස කය දැන ගනිමියි යන අදහසින් ආශ්වාසකරන්නෙමියි හික්මෙන්නේය.

"සියලු ආශ්වාස ප්‍රශ්වාස කය දැනගනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආශ්වාස ප්‍රශ්වාසයන් සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආශ්වාස ප්‍රශ්වාසයන් සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සුවය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි සුවය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි චිත්ත සංස්කාරය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත දැනගනිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත දැන ගනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි

හික්මෙයි. සිත සතුටු කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි සිත සතුටු කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි සිත එකඟකරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත එකඟ කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. අනිත්‍ය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. අනිත්‍ය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. නොඇලීම දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. නොඇලීම දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. නිරෝධය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. නිරෝධය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි පටිනිස්සග්ගය (හැරදැමීම) දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. පටිනිස්සග්ගය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. අරිට්ඨය, මෙසේ වනාහි ආනාපාන සතිය විස්තර වශයෙන් සම්පූර්ණ වේයයි" වදාළේය.

---

## 7. කප්පින සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක.

එසමයෙහි වනාහි ආයුෂ්මත් මහා කප්පින ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට නුදුරු තන්හි පළඟ බැඳ කය ඍජුව තබාගෙන සිහිය ඉදිරිපත්කොට තබාගෙන හුන්නේ වෙයි. පළඟ බැඳගෙන කය ඍජුව තබාගෙන සිහිය ඉදිරිපත් කොට තබාගෙන නුදුරු තන්හි හුන්නාවූ ආයුෂ්මත් කප්පින තෙරුන් භාග්‍යවතුන්වහන්සේ දුටුසේක. දැක, භික්ෂූන් ඇමතූසේක.

2 "මහණෙනි, තෙපි මේ භික්ෂුවගේ ශරීරයෙහි සෙලවීමක් හෝ කම්පාවීමක් හෝ දකින්නහුද?"

"ස්වාමීනි, අපි යම් කලෙක්හි සංඝයා මැද හුන්නාවූ හෝ හුදෙකලාව රහසිගතව හුන්නාවූ හෝ ඒ ආයුෂ්මතුන් දකිමුද ඒ

කවර කලෙක්හිදු අපි ඒ ආයුෂ්මතුන්ගේ ශරීරයෙහි සෙලවීමක් හෝ කම්පාවීමක් හෝ නොදකිමුයි” කීහ.

3. “මහණෙනි, යම් සමාධියක් වැඩූ බැවින් බහුල වසයෙන් වැඩූ බැවින් ශරීරයෙහි සෙලවීමක් හෝ කම්පාවීමක් හෝ නොවේද චිත්තයාගේ සෙලවීමක් හෝ කම්පාවීමක් හෝ නොවේ නම්, මහණෙනි ආනාපාන සති සමාධිය වැඩූ බැවින් බහුල වසයෙන් වැඩූ බැවින් ශරීරයෙහි සෙලවීමක් හෝ කම්පාවීමක් හෝ නොවේ. චිත්තයාගේ සෙලවීමක් හෝ කම්පාවීමක් හෝ නොවේද, මහණෙනි, ආනාපාන සති සමාධිය කෙසේ වැඩූ කල්හි කෙසේ බහුල වසයෙන් වැඩූ කල්හි කයෙහි සෙලවීමක් හෝ කම්පාවීමක් හෝ නොවේද? සිතෙහි සෙලවීමක් හෝ කම්පාවීමක් හෝ නොවේද?

4. “මහණෙනි, මේ සාසනයෙහි මහණතෙමේ ආරණ්‍යයට ගියේ හෝ ගසක් මුලට ගියේ හෝ හිස් ගෙයකට ගියේ හෝ පර්‍ය්‍යංක බැඳ ශරීරය කෙලින් පිහිටුවාගෙන සිහිය ඉදිරිපත්කොට තබාගෙන හිඳින්නේය. හෙතෙම සිහියෙන්ම ආශ්වාස කරන්නේය. සිහියෙන්ම ප්‍රශ්වාස කරන්නේය. දීර්ඝකොට ආශ්වාස කරන්නේ හෝ දීර්ඝකොට ආශ්වාස කරන්නෙමි’යි දන්නේය. දීර්ඝකොට ප්‍රශ්වාස කරන්නේ හෝ දීර්ඝකොට ප්‍රශ්වාස කරන්නෙමි’යි දන්නේය. හ්‍රස්ව (ලුහුඬු) කොට ආශ්වාස කරන්නේ හෝ හ්‍රස්වකොට ආස්වාස කරන්නෙමියි දන්නේය. හ්‍රස්වකොට ප්‍රස්වාස කරන්නේ හෝ හ්‍රස්වකොට ප්‍රස්වාස කරන්නෙමියි දන්නේය.

5. “මුල මැද අග යන සියලු ආශ්වාස ප්‍රශ්වාස කය දැනගනිමියි යන අදහසින් ආශ්වාස කරන්නෙමියි හික්මෙන්නේය.

“සියලු ආශ්වාස ප්‍රශ්වාස කය දැනගනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආශ්වාස ප්‍රශ්වාසයන් සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආශ්වාස ප්‍රශ්වාසයන් සංසිඳුවමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය

ප්‍රකට කරමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි ප්‍රීතිය ප්‍රකට කරමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. සුවය ප්‍රකට කරමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. සුවය ප්‍රකට කරමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය ප්‍රකට කරමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය ප්‍රකට කරමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය සංසිඳුවමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය සංසිඳුවමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. සිත දැනගනිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. සිත දැන ගනිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. සිත සතුටු කරමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. සිත සතුටු කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත එකඟ කරමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි සිත එකඟ කරමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. අනිත්‍ය දකිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. අනිත්‍ය දකිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. නොඇලීම දකිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. නොඇලීම දකිමින් ප්‍රස්වාසකරන්නෙමියි හික්මෙයි. නිරෝධය දකිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. නිරෝධය දකිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. පටිනිස්සග්ගය (හැරදැමීම) දකිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. පටිනිස්සග්ගය (හැරදැමීම) දකිමින් ප්‍රස්වාසකරන්නෙමියි හික්මෙයි.

**6.** "මහණෙනි, මෙසේ ආනාපානසති සමාධිය වැඩූ කල්හි බහුල වශයෙන් වැඩූ කල්හි ශරීරයෙහි සෙලවීමක් හෝ කම්පාවීමක් හෝ නොවේ සිතෙහි සෙලවීමක් හෝ කම්පාවීමක් හෝ නොවේයයි" වදාළේය.

---

## 8. කාය ජීවිත පරියන්තික සූත්‍රය

1. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. "මහණෙනි, වඩන ලද්දාවූ බහුල වසයෙන් වඩන ලද්දාවූ ආනාපාන සති සමාධිය මහත්ඵල මහානිසංස ඇත්තේ වෙයි. මහණෙනි, කෙසේ වඩන ලද්දාවූ, කෙසේ බහුල වසයෙන් වඩන ලද්දාවූ ආනාපාන සති සමාධිය මහත් ඵල මහානිසංස ඇත්තේ වේද

3. "මහණෙනි, මේ සාසනයෙහි මහණ තෙමේ ආරණ්‍යයට ගියේ හෝ ගසක් මුලකට ගියේ හෝ හිස් ගෙයකට ගියේ හෝ පයඹිංක බැඳ ශරීරය කෙලින් පිහිටුවාගෙන සිහිය ඉදිරිපත්කොට තබාගෙන හිඳින්නේය. හෙතෙම සිහියෙන්ම ආස්වාස කරන්නේය. සිහියෙන්ම ප්‍රස්වාස කරන්නේය. දීර්ඝකොට ආස්වාස කරන්නේ හෝ දීර්ඝකොට ආස්වාස කරන්නෙමි'යි දන්නේය. දීර්ඝකොට ප්‍රස්වාස කරන්නේ හෝ දීර්ඝකොට ප්‍රස්වාස කරන්නෙමි'යි දන්නේය. හ්‍රස්ව (ලුහුඬු) කොට ආස්වාස කරන්නේ හෝ හ්‍රස්වකොට ආස්වාස කරන්නෙමියි දන්නේය. හ්‍රස්ව කොට ප්‍රස්වාස කරන්නේ හෝ හ්‍රස්ව කොට ප්‍රස්වාස කරන්නෙමියි දන්නේය.

"මුල මැද අග යන සියලු ආස්වාස ප්‍රස්වාස කය දැන ගනිමියි යන අදහසින්ද ආස්වාස කරන්නෙමියි හික්මෙන්නේය.

"සියලු ආස්වාස ප්‍රස්වාස කය දැනගනිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආස්වාස ප්‍රස්වාසයන් සංසිඳුවමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආස්වාස ප්‍රස්වාසයන් සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය ප්‍රකට කරමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි, ප්‍රීතිය ප්‍රකට කරමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. සුවය ප්‍රකට කරමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. සුවය ප්‍රකට කරමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය ප්‍රකට කරමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය ප්‍රකට කරමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය

සංසිඳුවමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය සංසිඳුවමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. සිත දැනගනිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. සිත දැනගනිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. සිත සතුටු කරමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. සිත සතුටු කරමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. සිත එකඟ කරමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. සිත එකඟ කරමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. අනිත්‍ය දකිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. අනිත්‍ය දකිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. නොඇලීම දකිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. නොඇලීම දකිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. නිරෝධය දකිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. නිරෝධය දකිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. පටිනිස්සග්ගය (හැරදැමීම) දකිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. පටිනිස්සග්ගය (හැරදැමීම) දකිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. මහණෙනි, මෙසේ වඩන ලද්දාවූ මෙසේ බහුල වශයෙන් වඩන ලද්දාවූ ආනාපාන සතිය මහත් ඵල මහානිසංස ඇත්තේ වෙයි.

**4.** "මහණෙනි, මමද බුදුවීමට පළමුවම බුදු නොවූයේ බොධිසත්ව වූයේ බහුල වසයෙන් මේ විහරණයෙන් වාසය කෙළෙමි. මහණෙනි, මේ විහරණයෙන් බහුල වසයෙන් වාසය කරන්නාවූ මගේ කය ක්ලාන්ත නොවීය. ඇස්ද ක්ලාන්ත නොවීය. මාගේ සිත කෙලෙසුන්ගෙන් සම්පූර්ණයෙන් මිදුනේය.

**5.** "මහණෙනි, එසේ නම් භික්ෂුවද 'මාගේ ශරීරය ක්ලාන්ත නොවන්නේය. ඇස්ද ක්ලාන්ත නොවන්නේය. මගේ සිත කෙලෙසුන්ගෙන් සම්පූර්ණයෙන් මිදෙන්නේයයි' කැමැති වන්නේ නම් මේ ආනාපානසති සමාධියම මනාකොට මෙනෙහි කළ යුතුයි.

6. "මහණෙනි, එසේනම් භික්ෂුවද යම් ඒ පඤ්චකාම නිශ්‍රිතවූ විතර්කයෝ වෙත්ද, ඔවුන් ප්‍රහීණ කිරීමට කැමති වන්නේ නම් මේ ආනාපාන සති සමාධියම මනාකොට මෙනෙහි කළ යුතුයි. මහණෙනි, එහෙයින් භික්ෂුවද නොපිළිකුලෙහි පිළිකුල් හැඟීමෙන් වාසය කරමියි කැමති වේනම් මේ ආනාපාන සති සමාධියම මනාකොට මෙනෙහි කළ යුතුයි.

"මහණෙනි, එහෙයින් භික්ෂුවද පිළිකුලෙහි නොපිළිකුල් හැඟීමෙන් වාසය කරමියි කැමති වේනම් මේ ආනාපාන සති සමාධියම මනාකොට මෙනෙහි කළයුතුයි. මහණෙනි, එහෙයින් භික්ෂුව නොපිළිකුලෙහිද පිළිකුලෙහිද පිළිකුලෙහිද පිළිකුල් හැඟීමෙන් වාසය කරමියි කැමතිවේනම් මේ ආනාපාන සති සමාධියම මනාකොට වැඩිය යුතුයි

"මහණෙනි, එහෙයින් භික්ෂුව පිළිකුලෙහිද නොපිළිකුලෙහිද නොපිළිකුල් හැඟීමෙන් වාසය කරමියි කැමති වන්නේ නම් මේ ආනාපාන සති සමාධියම මනාකොට මෙනෙහි කළ යුතුයි.

7. "මහණෙනි, එහෙයින් භික්ෂුව නොපිළිකුලද පිළිකුලද යන දෙකම මනාකොට දුරුකොට මධ්‍යස්ථව සිහියෙන් යුක්තව මනා නුවණැතිව වාසය කරමියි කැමති වන්නේනම් මේ ආනාපාන සති සමාධියම මනාකොට මෙනෙහි කළ යුතුයි.

"මහණෙනි, එහෙයින්ම භික්ෂුව කාමයන්ගෙන් වෙන්ව අකුසල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් උපන් ප්‍රීති සුවය ඇති පඨමධ්‍යානයට පැමිණ වාසය කරමියි කැමති වන්නේ නම් මේ ආනාපාන සති සමාධියම මනාකොට මෙනෙහි කළ යුතුය.

8. "මහණෙනි, එහෙයින් භික්ෂුව විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති සිතෙහි එකඟ බැව් ඇති විතර්කය නැති විචාරය නැති විවේකයෙන් උපන් ප්‍රීති සැපය ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කරමියි කැමති වන්නේ නම් මේ ආනාපාන සති සමාධියම මනාකොට මෙනෙහි කළ යුතුය.

"මහණෙනි, එහෙයින්ම භික්ෂුව ප්‍රීතියෙහිද නොඇලීමෙන් මධ්‍යස්ථවද වාසය කරන්නේද? සිහියෙන් යුක්තව මනා නුවණ ඇතිව වාසය කයින් විඳියිද? "මධ්‍යස්ථව සිහියෙන් යුක්තව සැපසේ වාසය කරන්නේයයි" ආර්‍ය්‍යයෝ යමක් කියත්ද, ඒ තෘතීයධ්‍යානයට පැමිණ වාසය කරමියි කැමති වන්නේනම් මේ ආනාපානසතිසමාධියම වැඩිය යුතුයි.

9. "මහණෙනි, එහෙයින්ම භික්ෂුව සැපයාගේද දුක්ඛයාගේද ප්‍රහාණයෙන් පළමුවම සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැති කිරීමෙන් දුක්ද නොවූ සැපද නොවූ උපෙක්ඛා සතියෙන් පිරිසිදුවූ චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරමියි කැමති වන්නේනම් මේ ආනාපාන සති සමාධියම මනාකොට මෙනෙහි කළ යුතුයි.

10. "මහණෙනි, එහෙයින්ම භික්ෂුව සියලු ආකාරයෙන් රූප සඤ්ඤාවන්ගේ ඉක්මවීමෙන් පටිඝ සඤ්ඤාවන්ගේ නැති කිරීමෙන් නානත්ත සඤ්ඤාවන් සිහි නොකිරීමෙන් ආකාශය අනන්තයයි ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කරමියි කැමති වන්නේනම් මේ ආනාපාන සති සමාධියම මනාකොට මෙනෙහි කළ යුතුයි.

11. "මහණෙනි, එසේම භික්ෂුව සියලු ආකාරයෙන් ආකාසානාඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤානඤ්චායතනයට පැමිණ වාසය කරමියි කැමතිවන්නේ නම් මේ ආනාපාන සති සමාධියම මනාකොට මෙනෙහි කළ යුතුයි.

12. "මහණෙනි, එහෙයින්ම භික්ෂුව සියලු ආකාරයෙන් විඤ්ඤානඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරමියි කැමති වන්නේ නම් මේ ආනාපාන සති සමාධියම මනාකොට මෙනෙහි කළ යුතුයි.

13. "මහණෙනි, එහෙයින්ම භික්ෂුව සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනයට පැමිණ වාසය කරමියි කැමති වන්නේනම් මේ ආනාපාන සති සමාධියම මනාකොට මෙනෙහි කළ යුතුයි.

14. "මහණෙනි, එහෙයින් භික්ෂුව සියලු ආකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවේදයිත නිරෝධයට පැමිණ වාසය කරමියි කැමති වන්නේ නම් මේ ආනාපාන සති සමාධියම මනාකොට මෙනෙහි කළ යුතුයි.

15. "මහණෙනි, මෙසේ ආනාපාන සති සමාධිය වැඩූ කල්හි බහුල වශයෙන් වැඩූ කල්හි ඉදින් සුඛ වේදනාවක් විඳීද, එය අනිත්‍යයයි දැනගනියි. තණ්හාවෙන් නොබැසගත යුතුයයි දැනගනියි. සතුටු නොවිය යුතුයයි දැනගනියි. ඉදින් දුක් වේදනාවක් විඳීද? එය අනිත්‍යයයි දැනගනියි. නොබැසගත යුතුයයි දැනගනියි. සතුටු නොවිය යුතුයයි දැනගනියි. දුක්ද නොවූ සැපද නොවූ වේදනාවක් විඳිනු ලැබේද, එය අනිත්‍යයයි දැනගනියි. නොබැසගත යුත්තකැයි දැනගනියි. සතුටු නොවිය යුතුයයි දැනගනියි.

16. "ඉදින් හෙතෙම සැප වේදනාවක් විඳියිද, එය ආශාවෙන් නොබැඳී විඳියි. දුක් වේදනාවක් විඳියිද, එය ආශාවෙන් වෙන්ව විඳියි. ඉදින් දුක්ද නොවූ සැපද නොවූ වේදනාවක් විඳියිද එය ආශාවෙන් වෙන්ව විඳියි.

"හෙතෙම කය කෙළවරකොට ඇති වේදනාවක් විඳින්නේ කය කෙළවරකොට ඇති වේදනාවක් විඳිමියි දැනගනියි. ජීවිතය කෙළවරකොට ඇති වේදනාවක් විඳින්නේ ජීවිතය කෙළවරකොට ඇති වේදනාවක් විඳින්නේමියි දැනගනියි. කය බිඳීමෙන් ජීවිතය කෙළවරවීමෙන් පසු මෙහිදීම නොඇලෙන්නාවූ සියලු වේදනා සන්සිඳෙන්නාහුයයි දැනගනියි.

17. "මහණෙනි, යම්සේ තෙල්ද තිරයද නිසා තෙල් පහන දැල්වේද, ඒ තෙල්ද තිරයද කෙළවරවීමෙන් හේතුව නැතිව නිවෙන්නේද, මහණෙනි, එපරිද්දෙන්ම මහණතෙමේ කය කෙළවරකොට ඇති වේදනා විඳින්නේ කය කෙළවර කොට ඇති වේදනා විඳින්නෙමියි දැනගනියි. ජීවිතය කෙළවරකොට ඇති වේදනා විඳින්නේ ජීවිතය කෙළවර කොට ඇති වේදනා විඳින්නෙමියි දැනගනියි. ශරීරයාගේ බිඳීමෙන් ජීවිතයාගේ

කෙළවරවීමෙන් පසු මෙහිදීම නොඇලෙන්නාවූ සියලු වේදනා සංසිඳෙන්නාහුයයි දැන ගනීයයි වදාළේය.

---

## 9. (වේසාලී) සත්ථා'හරණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විසාලා මහනුවර මහවනයෙහි කූටාගාර ශාලාවෙහි වාසය කළසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට නොයෙක් ආකාරයෙන් අසුභ කථාව දෙශනාකළ සේක. අසුභයෙහි ගුණ වදාළසේක. අසුභය වැඩීමෙහි ගුණ වදාළසේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ඇමතූ සේක.

2. "මහණෙනි, මම අඩමසක් විවේකව විසීමට කැමැත්තෙමි. පිණ්ඩපාතය ගෙනෙන්න එක් භික්ෂුවක් හැර අන්කිසිවෙකු මාවෙත නොපැමිණිය යුතුයයි" වදාළේය. ඒ භික්ෂූහු එසේය, ස්වාමීනියි" භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දී පිණ්ඩපාතය ගෙන යන භික්ෂුව හැර අන් කිසිවෙක් නොඑළඹෙයි.

3. එකල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ නොයෙක් ආකාරයෙන් අසුභ කථාව දේශනා කරන සේක. අසුභයෙහි ගුණ වදාරන්නාහ. අසුභය වැඩීමෙහි ගුණ ප්‍රකාශ කරන්නාහයි නොයෙක් ආකාරයෙන් පිළිකුල්වූ අසුභ භාවනාවෙහි යෙදී වාසය කරන්නාහු වෙත්. මේ කයෙහි පිළිකුල් කරන්නාවූ කලකිරෙන්නාවූ නොකැමැත්තාවූ ඔව්හු ආයුධයෙන් ගෙල කපාගෙන මැරෙන්නාහ. එක් දිනකට දසනමක්ද කපාගනිත් විසි නමක්ද කපා ගනිත්. තිස් නමක්ද කපා ගනිත්.

4. එකල්හි භාග්‍යවතුන්වහන්සේ ඒ අඩමස ඇවෑමෙන් විවේකයෙන් නැගී සිටියේ ආයුෂ්මත් ආනන්ද තෙරුන් ඇමතූසේක. "කිමෙක්ද? ආනන්දය, භික්ෂුසංඝයා තුනීවූවාක් මෙන් පෙනේ."

"ස්වාමීනි එසේය, භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට නොයෙක් ආකාරයෙන් අසුභ කථා දෙශනාකළ සේක.

අසුභයෙහි ගුණ වදාළසේක. අසුභය වැඩීමෙහි ගුණ වදාළ සේක. ස්වාමීනි, ඒ භික්ෂූහුද භාග්‍යවතුන්වහන්සේ විනාහි නොයෙක් ආකාරයෙන් අසුභ කථාව දෙශනා කරන සේක. අසුභයෙහි ගුණ වදාරණ සේක. අසුභය වැඩීමෙහි ගුණ ප්‍රකාශ කරනසේකැයි නොයෙක් අයුරින් පිළිකුල්කළාවූ අසුභයන් වැඩීමෙහි යෙදී වාසය කරන්නාහු වෙත්. මේ කයෙහි කලකිරෙන්නාවූ පිළිකුල් කරන්නාවූ නොකැමැත්තාවූ ඒ භික්ෂූහු ආයුධයෙන් ගෙල කපාගෙන මැරෙන්නාහ. දිනකට දස නමක්ද, විසි නමක්ද, තිස් නමක්ද කපා ගනිති. භික්ෂූහු ස්වාමීනි, මේ භික්ෂු සංඝයා යම්සේ දැනීමෙහි පිහිටත්ද, භාග්‍යවතුන්වහන්සේ එවැනි ක්‍රමයක් දෙශනාකරන වදාරන්නේ නම් මැනව" යනුයි.

**5.** "ආනන්දය, එසේනම් යම් පමණ භික්ෂූහු විශාලා මහනුවර ඇසුරුකොට වෙසෙත්ද, ඒ සියලු භික්ෂූහු උපස්ථාන ශාලාවට රැස්කරවයි" වදාළේය. ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ "එසේය, ස්වාමීනියි" භාග්‍යවතුන්වහන්සේට උත්තර දී යම් පමණ භික්ෂූහු විශාලාමහනුවර ඇසුරුකොට වෙසෙත්ද, ඒ සියලු භික්ෂූහු උපස්ථාන ශාලාවට රැස්කරවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන්වහන්සේට මෙය කීය. "ස්වාමීනි, භික්ෂු සංඝයා රැස් වූයේය. ස්වාමීනි, යමක් සඳහා භික්ෂූන් රැස්කරවීද, දැන් ඊට කාලය භාග්‍යවතුන් වහන්සේ දන්නාසේකැයි" කීය.

**6.** එකල්හි භාග්‍යවතුන් වහන්සේ උපස්ථාන ශාලාව යම් තැනෙක්හිද එතැනට වැඩිසේක. වැඩමවා පනවන ලද ආසනයෙහි වැඩහුන් සේක. වැඩහුන්නාවූ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ඇමතූසේක.

"මහණෙනි, මේ වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ ආනාපාන සති සමාධිය ශාන්තද වෙයි. ප්‍රණීතද වෙයි. ශාන්ත වීමට පිටතින් එක්කළ යුක්තක් නැත්තේද වෙයි. සැප විහරණ ඇත්තේද වෙයි. උපනුපන් ලාමක අකුසල ධර්මයන් කරුණු අනුව අතුරුදන් කරයි. සංසිඳුවයි.

"මහණෙනි, යම්සේ ඇසල මස නැගුණු රජස් (දූලි) මහත් අකල් වැස්සක් වැස අතුරුදන් කරයිද, සංසිඳුවයිද, මහණෙනි, එපරිද්දෙන්ම වඩන ලද්දාවූ බහුල වශයෙන් වඩන ලද්දාවූ ආනාපාන සති සමාධිය ශාන්තද වෙයි. ප්‍රණීතද වෙයි. ශාන්තවීමට පිටතින් එක්කළ යුත්තක් නැත. සැපවිහරණ ඇත්තේදවෙයි. ලාමක අකුසල ධර්මයන් සුදුසු පරිදි අතුරුදන් කරයි, සන්සිඳවයි.

7. "මහණෙනි, කෙසේ වඩන ලද්දාවූ කෙසේ බහුල වසයෙන් වඩන ලද්දාවූ ආනාපාන සති සමාධිය ශාන්ත වේද, ප්‍රණීත වේද පිටතින් එක්කළ යුත්තක් නැත්තේද සැප විහරණ ඇත්තේද උපනු'පන් ලාමක අකුසල ධර්මයන් අතුරුදහන් කරයිද, සන්සිඳවයිද,

"මහණෙනි, මේ සාසනයෙහි මහණතෙමේ ආරණ්‍යයට ගියේ හෝ ගසක් මුලකට ගියේ හෝ හිස් ගෙයකට ගියේ හෝ පයඹ්ංක බැඳ ශරීරය කෙලින් පිහිටුවාගෙන සිහිය ඉදිරි පත්කොට තබාගෙන හිඳින්නේය. හෙතෙම සිහියෙන්ම ආස්වාස කරන්නේය. සිහියෙන්ම ප්‍රස්වාස කරන්නේය. දීර්ඝකොට ආස්වාස කරන්නේ හෝ 'දීර්ඝකොට ආස්වාස කරන්නෙමි' යි දන්නේය. දීර්ඝකොට ප්‍රස්වාස කරන්නේ හෝ 'දීර්ඝ කොට ප්‍රස්වාස කරන්නෙමි'යි දන්නේය. හ්‍රස්ව (ලුහුඬු) කොට ආස්වාස කරන්නේ හෝ හ්‍රස්ව කොට ආස්වාස කරන්නෙමියි' දන්නේය. හ්‍රස්ව කොට ප්‍රස්වාස කරන්නේ හෝ 'හ්‍රස්වකොට ප්‍රස්වාස කරන්නෙමියි' දන්නේය.

8. "මුල මැද අග යන සියලු ආස්වාස ප්‍රස්වාස කය දැන ගනිමියි යන අදහසින් ආස්වාස කරන්නෙමියි' හික්මෙන්නේය.

"සියලු ආස්වාස ප්‍රස්වාස කය දැනගනිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආස්වාස ප්‍රස්වාසයන් සංසිඳුවමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආස්වාස ප්‍රස්වාසයන් සංසිඳුවමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය ප්‍රකට කරමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය ප්‍රකට

කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සුවය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සුවය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය සන්සිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරයන් සන්සිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත දැනගනිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත දැනගනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත සතුටු කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත සතුටු කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත එකඟ කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත එකඟ කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. අනිත්‍ය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. අනිත්‍ය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. නොඇලීම දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. නොඇලීම දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි නිරෝධය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි නිරෝධය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. පටිනිස්සග්ගය (හැරදැමීම) දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. පටිනිස්සග්ගය (හැරදැමීම) දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි.

**9.** "මහණෙනි, මෙසේ වඩන ලද්දාවූ බහුල වශයෙන් වඩන ලද්දාවූ ආනාපාන සති සමාධිය ශාන්තද වෙයි. ප්‍රණීතද වෙයි. පිටතින් එක්කළ යුත්තක් නැත්තේද වෙයි. සැප විහරණ ඇත්තේද වෙයි. උපනුපන් ලාමක අකුසල ධර්මයන් අතුරුදහන් කරන්නේය. සන්සිඳවන්නේයයි" වදාළේය.

---

## 10. කිම්බිලපඤ්හ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කිම්බිල නගරයෙහිවූ වෙළුවනයෙහි වාසය කළසේක. එහිදී වනාහි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් කිම්බිල ස්ථවිරයන්ට කථා කළසේක.

"කිම්බිලය, කෙසේ වඩන ලද්දාවූ, කෙසේ බහුල වශයෙන් වඩන ලද්දාවූ, ආනාපාන සති සමාධියෙන් මහත්ඵල මහා'නිසංස ඇත්තේ වේද?" යනුවෙනි.

2. මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් කිම්බිල ස්ථවිරතෙමේ නිහඬ විය. භාග්‍යවතුන් වහන්සේ දෙවනුවත් ආයුෂ්මත් කිම්බිල තෙරුන් ඇමතූසේක.

"කිම්බිලය, කෙසේ වඩන ලද්දාවූ කෙසේ බහුල වශයෙන් වඩනලද්දාවූ ආනාපාන සති සමාධියෙන් මහත්ඵල මහානිසංස ඇත්තේ වේද?" යනුවෙනි. දෙවනුවත් ආයුෂ්මත් කිම්බිල තෙරුන් නිහඬවිය.

"භාග්‍යවතුන්වහන්සේ තුන්වෙනුවත් ආයුෂ්මත් කිම්බිල තෙරුන්ට ඇමතූසේක. "කිම්බිලය, කෙසේ වඩන ලද්දාවූ කෙසේ බහුල වශයෙන් වඩන ලද්දාවූ ආනාපාන සති සමාධිය මහත්ඵල මහානිසංස ඇත්තේවේද?" කියායි. ආයුෂ්මත් කිම්බිල ස්ථවිරතෙමේ තුන්වෙනුවත් නිහඬ විය.

3. මෙසේ කී කල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ මෙය කීය "භාග්‍යවතුන් වහන්සේ ආනාපාන සති සමාධිය දෙශනා කරන්නේ නම්, භාග්‍යවතුන් වහන්ස, මේ ඊට කාලයයි. සුගතයන් වහන්ස මේ ඊට කාලයයි. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරාගනිත්."

"ආනන්දය, එසේනම් අසව, මනාකොට මෙනෙහි කරව, දෙශනා කරන්නෙමියි" වදාළේය.

ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ "එසේය ස්වාමීනියි,' භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

4. "ආනන්දය, කෙසේ වඩන ලද්දාවූ කෙසේ බහුල වශයෙන් වඩන ලද්දාවූ ආනාපාන සති සමාධිය මහත් ඵල මහානිසංස ඇත්තේ වේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙමේ ආරණ්‍යයට ගියේ හෝ ගසක්මුලකට ගියේ හෝ හිස් ගෙයකට ගියේ හෝ පයඹිංක බැඳ ශරීරය කෙලින් පිහිටුවාගෙන සිහිය ඉදිරිපත්කොට තබා ගෙන හිඳින්නේය. හෙතෙම සිහියෙන්ම ආශ්වාස කරන්නේය. සිහියෙන්ම ප්‍රශ්වාස කරන්නේය. දීර්ඝකොට ආශ්වාස කරන්නේ හෝ දීර්ඝ කොට ආශ්වාස කරන්නෙමි'යි දන්නේය. දීර්ඝකොට ප්‍රශ්වාස කරන්නේ හෝ දීර්ඝකොට ප්‍රශ්වාස කරන්නෙමි'යි දන්නේය. හ්‍රස්ව (ලුහුඬු) කොට ආශ්වාස කරන්නේ හෝ හ්‍රස්ව කොට ආශ්වාස කරන්නෙමි'යි දන්නේය. හ්‍රස්වකොට ප්‍රශ්වාස කරන්නේ හෝ හ්‍රස්වකොට ප්‍රශ්වාස කරන්නෙමි'යි දන්නේය.

"මුල මැද අග යන සියලු ආශ්වාස ප්‍රශ්වාස කය දැනගනිමියි යන අදහසින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සියලු ආශ්වාස ප්‍රශ්වාස කය දැනගනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආශ්වාස ප්‍රශ්වාසයන් සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආශ්වාසප්‍රශ්වාසයන් සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සුවය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි සුවය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත දැනගනිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත දැනගනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත සතුටු කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත සතුටුකරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත එකඟකරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත එකඟ කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත

කෙලෙසුන් කෙරෙන් මුදවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ප්‍රශ්වාස කරමියි හික්මෙයි. අනිත්‍ය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. අනිත්‍ය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. නොඇලීම දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. නොඇලීම දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. නිරොධය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. නිරොධය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. පටිනිස්සග්ගය (හැරදැමීම) දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. පටිනිස්සග්ගය (හැරදැමීම) දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. ආනන්දය, මෙසේ වඩන ලද්දාවූ මෙසේ බහුල වශයෙන් වඩන ලද්දාවූ ආනාපාන සතිය මහත් ඵල මහානිසංස ඇත්තේ වෙයි.

5. "ආනන්දය, යම් කලෙක මහණතෙමේ දීර්ඝව ආස්වාස කරන්නේ හෝ දීර්ඝව ආස්වාස කරන්නෙමියි දැනගනීද, දීර්ඝව ප්‍රස්වාස කරන්නේ හෝ දීර්ඝව ප්‍රස්වාස කරන්නෙමියි දැන ගනීද, කෙටිව ආස්වාස කරන්නේ හෝ කෙටිව ආස්වාස කරන්නෙමියි දැනගනියිද කෙටිව ප්‍රස්වාස කරන්නේ හෝ කෙටිව ප්‍රස්වාස කරන්නෙමියි දැනගනියිද, සියලු ආස්වාස කය දැනගනිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයිද, සියලු ප්‍රශ්වාස කය දැනගනිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයිද, කාය සංස්කාරය සංසිඳුවමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයිද, කාය සංස්කාරය සංසිඳුවමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයිද, ආනන්දය, එකල්හි මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලෝකයෙහි ලොභය හා ද්වෙෂය හික්මවා කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරයි. එයට හේතුව කවරේද? ආනන්දය, යම් මේ ආස්වාස ප්‍රස්වාසයක් වේද, එය මම කයින් එක්තරා දෙයකැයි කියමි. ආනන්දය, එසේ හෙයින් මහණතෙමේ එකල්හි කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව යහපත් නුවණින් යුක්තවූ සිහි ඇතිව ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරයි.

6. "ආනන්දය, යම්කෙලක මහණතෙමේ ධ්‍යාන ප්‍රීතිය දැනගනිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයිද, ධ්‍යාන ප්‍රීතිය දැනගනිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයිද, සැපය දැන ගනිමින් ආස්වාසකරන්නෙමියි හික්මෙයිද, සැපය දැනගනිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයිද, චිත්ත සංස්කාරයන් දැන ගනිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයිද, චිත්ත සංස්කාරයන් දැනගනිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයිද, චිත්ත සංස්කාරයන් සංසිඳුවමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයිද, චිත්ත සංස්කාරයන් සංසිඳුවමින් ප්‍රස්වාසකරන්නෙමියි හික්මෙයිද, ආනන්දය එකල්හි මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට වේදනාවන්හි වේදනාවන් නැවත නැවත බලමින් වාසය කරයි. එයට හේතුව කවරේද? ආනන්දය යම් මේ ආස්වාස ප්‍රස්වාසයන්ගේ යහපත්ව මෙනෙහි කිරීමක් වේද? එය මම වේදනා අතුරෙන් එක්තරා වේදනාවක්යයි කියමි. ආනන්දය එසේ හෙයින් මහණ තෙමේ එකල්හි කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට වේදනාවන්හි වේදනාවන් නැවත නැවත බලමින් වාසය කෙරෙයි."

7. "ආනන්දය, යම් කලක මහණතෙමේ ධ්‍යාන සිත් දැනගනිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයිද, ධ්‍යාන සිත දැනගනිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයිද, සිත සතුටු කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයිද, සිත සතුටු කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයිද, සිත එකඟ කරමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයිද, සිත එකඟ කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයිද, සිත කෙලෙසුන්ගෙන් මුදවමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයිද, සිත කෙලෙසුන්ගෙන් මුදවමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයිද, ආනන්දය, එකල්හි මහණතෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව, සිහියෙන් යුක්තව ස්කන්ධ ලොකයෙහි ලොභයද

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ද්වෙෂයද දුරුකොට චිත්තයෙහි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කරයි. එයට හේතුව කවරේද?

"ආනන්දය මම මුළාවූ සිහිය ඇත්තහුට නුවණ නැත්තහුට ආනාපාන සති සමාධි නොකියමි. ආනන්දය එසේ හෙයින් මහණතෙමේ එකල්හි කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට චිත්තයන්හි චිත්තයන් නැවත නැවත බලමින් වාසය කරයි.

8. "ආනන්දය, යම් කලෙක මහණතෙමේ අනිත්‍යය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයිද, අනිත්‍යය දකිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයිද, විරාගය දකිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයිද, විරාගය දකිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයිද, නිරොධය දකිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයිද, නිරොධය දකිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයිද, පටිනිස්සග්ගය දකිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයිද, පටිනිස්සග්ගය දකිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයිද, ආනන්දය ඒ කාලයෙහි මහණතෙමේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරයි. හෙතෙම යම් ඒ ලොභ ද්වෙෂයන්ගේ පහකිරීමක් වේද, එය නුවණින් දැක මනාකොට මැදහත් වන්නේ වෙයි. ආනන්දය එසේ හෙයින් මහණතෙමේ එකල්හි කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහියෙන් යුක්තව ස්කන්ධ ලොකයෙහි ලොභයද ද්වෙෂයද දුරුකොට ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරයි.

9. "ආනන්දය, යම්සේ සතරමං සන්ධියක මහා පස් ගොඩක් වේද පෙරදිගින් ගැලක් හෝ රියක් එන්නේද, එයිනුදු ඒ පස්ගොඩ තැලෙන්නේමය. බස්නාහිරින් ගැලක් හෝ රියක් එන්නේද, එයිනුදු ඒ පස්ගොඩ තැලෙන්නේමය. උතුරු දිගින් ගැලක් හෝ රියක් එන්නේද එයිනුදු ඒ පස්ගොඩ තැලෙන්නේමය. දකුණු දිසාවෙන්ද ගැලක් හෝ රියක් එන්නේද, එයිනුදු ඒ පස්ගොඩ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

තැලෙන්නේය. ආනන්දය එපරිද්දෙන්ම මහණතෙමේ කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරන්නේද, ලාමක අකුසල ධර්මයන් නසන්නේමය. මහණතෙමේ වේදනාවන්හි වේදනාවන් නැවත නැවත බලමින් වාසය කරන්නේද, ලාමක අකුසල ධර්මයන් නසන්නේමය. මහණතෙමේ සිතෙහි සිත නැවත නැවත බලමින් වාසය කරන්නේද, ලාමක අකුසල ධර්මයන් නසන්නේමය. මහණ තෙමේ ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරන්නේද, ලාමක අකුසල ධර්මයන් නසන්නේමය.

(එකධම්ම වර්ගය නිමි)

---

## 2. දුතිය ඒක ධමම වර්ගය.

### 1. ඉච්ඡානංගල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ ඉච්ඡානංගල ජනපදයෙහි ඉච්ඡානංගල වනලැහැබෙහි වැඩසිටිසේක එහිදී වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට අමතා මෙසේ වදාළසේක. "මහණෙනි මම විවෙකව සිටීමට කැමැත්තෙමි. පිණ්ඩපාතය ගෙනෙන්නාවූ එක් භික්ෂුවක් හැර කිසිවකු මා වෙත නොපැමිණිය යුතුයි."

"එසේය ස්වාමීනි"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දී පිණ්ඩපාතය ගෙනයන එක් භික්ෂුවක් හැර භාග්‍යවතුන් වහන්සේ වෙත කිසිවෙක් නොඑළඹියේය.

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ තෙමස ඉක්මීමෙන් විවෙකයෙන් නැගී සිටිසේක් භික්ෂූන්ට කථාකොට මෙසේ වදාළේය.

"ඉදින් මහණෙනි, නුඹලාගෙන් අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ ඇවැත්නි, ශ්‍රමණ ගෞතම තෙමේ වස් කාලය තුළ කවර විහරණයකින් බහුලව විසුවේදැයි මෙසේ අසන්නාහු නම් මහණෙනි, මෙසේ විචාරණ ලද්දාවූ තෙපි ඒ අන්‍ය තීර්ථක

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පරිබ්‍රාජකයන්ට මෙසේ කියව්. ‘ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ වනාහි වස්කාලය තුළ බහුලව අනාපාන සති සමාධියෙන් විසූ සේක’ කියායි.

“මහණෙනි, මම මෙහිදී සිහියෙන් යුක්තව ආශ්වාස කරමි. සිහියෙන් යුක්තව ප්‍රශ්වාස කරමි. දීර්ඝව ආශ්වාස කරන්නේ හෝ දීර්ඝව ආශ්වාස කරමියි දැනගනිමි. දීර්ඝව ප්‍රස්වාස කරන්නේ හෝ දීර්ඝව ප්‍රස්වාස කරමියි දැනගනිමි මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ආරණ්‍යයට ගියේ හෝ ගහක් මුලට ගියේ හෝ හිස් ගෙයකට ගියේ හෝ පයඹිංකබැඳ ශරීරය කෙලින් පිහිටුවාගෙන සිහිය ඉදිරිපත්කොට තබාගෙන හිඳින්නේය. හෙතෙම සිහියෙන්ම ආස්වාස කරන්නේය. සිහියෙන්ම ප්‍රශ්වාස කරන්නේය. දීර්ඝ කොට ආස්වාසකරන්නේ හෝ දීර්ඝකොට ආස්වාස කරන්නෙමියි දන්නේය. දීර්ඝකොට ප්‍රස්වාස කරන්නේ හෝ දීර්ඝකොට ප්‍රස්වාස කරන්නෙමියි දන්නේය. හ්‍රස්ව (ලුහුඬු) කොට ආස්වාස කරන්නේ හෝ හ්‍රස්ව කොට ආස්වාස කරන්නෙමියි දන්නේය හ්‍රස්ව කොට ප්‍රස්වාස කරන්නේ හෝ හ්‍රස්ව කොට ප්‍රස්වාස කරන්නෙමියි දන්නේය.

“මුල මැද අග යන සියලු ආස්වාස ප්‍රස්වාස කය දැනගනිමියි යන අදහසින් ආස්වාස කරන්නෙමියි හික්මෙන්නේය. සියලු ආස්වාස ප්‍රස්වාස කය දැනගනිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආස්වාස ප්‍රස්වාසයන් සංසිඳුවමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආස්වාස ප්‍රස්වාසයන් සංසිඳුවමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය ප්‍රකට කරමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය ප්‍රකට කරමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. සුවය ප්‍රකට කරමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. සුවය ප්‍රකට කරමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය ප්‍රකට කරමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය ප්‍රකට කරමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය සංසිඳුවමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය සංසිඳුවමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. සිත දැනගනිමින්

ආස්වාස කරන්නෙමියි හික්මෙයි. සිත දැන ගනිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. සිත සතුටු කරමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. සිත සතුටු කරමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. සිත එකග කරමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. සිත එකග කරමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. අනිත්‍ය දකිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. අනිත්‍ය දකිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. නොඇලීම දකිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. නොඇලීම දකිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. නිරොධය දකිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. නිරොධය දකිමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි.

"මහණෙනි, යම් විහරණයකට ආර්‍ය්‍ය විහාරය කියාද, බ්‍රහ්ම විහාරය කියාද, තථාගත විහාරය කියාද, මනාව කියන්නේ නම් ආනාපාන සති සමාධියට ආර්‍ය්‍ය විහාරයයිද බ්‍රහ්ම විහාරයයිද තථාගත විහාරයයිද කියයුතු වන්නේය.

4. "මහණෙනි, යම් ඒ රහත්බවට නොපැමිණියාවූ, ශෛක්ෂ භික්ෂූහු නිරුත්තරවූ නිර්වාණය ප්‍රාර්ථනා කරමින් වාසය කරත්ද, වඩනලද්දාවූ බහුල වසයෙන් වඩනලද්දාවූ ආනාපානාසතිසමාධිය ඔවුන්ගේ ආශ්‍රවයන් ක්ෂයවීම පිණිස පවත්නේය.

"මහණෙනි, යම් ඒ අර්හත්වූ ක්ෂයකළ ආශ්‍රවයන් ඇති බඹසර වැස නිමවූ කරනලද කටයුතු ඇති බහා තැබූ කෙලෙස් බර ඇති තමාගේ අර්ථයට පැමිණියාවූ සියලු සසර බැඳුම් ඇති මනාකොට දැන මිදුනාවූ භික්ෂූහු වෙත්ද, වඩන ලද්දාවූ බහුල වසයෙන් වඩන ලද්දාවූ ආනාපානසතිසමාධිය ඔවුන්ට මේ අත්බැව්හිම සැප විහරණය පිණිසද සිහි නුවණ දෙක පිණිසද පවත්නේය.

"මහණෙනි, යමකට ආයර්‍යවිහාරයයයිද බ්‍රහ්මවිහාරයයයිද තථාගතවිහාරයයයිද මනාව කියන්නේ නම් ආනාපානසති සමාධියටම ආයර්‍යවිහාරයයයිද බ්‍රහ්මවිහාරයයයිද තථාගත විහාරයයයිද මනාව කියයුතු වන්නේය."

---

## 2. ලොමසවඞ්ගීස සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් ලෝමසවංගීස ස්ථවිරතෙමේ ශාක්‍යරට කිඹුල්වත් පුරයෙහි නිග්‍රොධාරාමයෙහි වාසය කරනසේක. එකල්හි මහානාම සාක්‍යතෙමේ ආයුෂ්මත් ලොමසවංගීස ස්ථවිරයන් යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ලෝමසවංගීස ස්ථවිරයන්ට වැඳ එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ මහානාම සාක්‍යතෙමේ ආයුෂ්මත් ලෝමසවංගීස තෙරුන්ට මෙය කීය.

2. "ස්වාමීනි, සෙඛ විහරණය, තථාගත විහරණය යනු එකක්මද, නොහොත් සෙඛ විහරණය අනිකක්මද? තථාගත විහරණය අනිකක්ද?" "ඇවැත් මහානාමය, ඒ සෙඛ විහරණය ඒ තථාගත විහරණය නොවන්නේමය. ඇවැත් මහානාමය සෙඛ විහරණය අනිකකි. තථාගත විහරණය අනිකකි. ඇවැත් මහානාමය, යම් මේ රහත් නොවූ ශෛක්ෂ භික්ෂූහු නිරුත්තරවූ නිර්වාණය ප්‍රාර්ථනා කරන්නාහු වෙසෙත්ද ඔවුහු පඤ්චනීවරණයන් පහකරමින් වාසය කරත්.

3. 'කවර නම් පසෙක්ද? කාමච්ඡන්ද නීවරණය පහකොට වෙසෙත්.

ව්‍යාපාද නීවරණය පහකොට වෙසෙත්. ථීනමිද්ධ නීවරණය පහකොට වෙසෙත්. උද්ධච්චකුක්කුච්ච නීවරණය පහකොට වෙසෙත්. විචිකිච්ඡා නීවරණය පහකොට වෙසෙත් ඇවැත් මහානාමය, යම් ඒ රහත් නොවූ ශෛක්ෂ භික්ෂූහුද, අනුත්තරවූ නිර්වාණය ප්‍රාර්ථනා කරමින් වාසය කරත්ද, ඔවුහු මේ පඤ්ච නීවරණයන් පහකරමින් වාසය කරත්.

4. "ඇවැත් මහානාමය, අර්හත්වූ ක්ෂය කල ආශ්‍රවයන් ඇති බඹසර වැස නිමවූ කරන ලද කටයුතු ඇති, බහා තැබූ කෙලෙස් බර ඇති තමාගේ අර්ථයට පැමිණියාවූ නැති කල සසර බැඳුම් ඇති, මනාකොට දැන මිදුනාවූ යම් ඒ භික්ෂූහු වෙත්ද ඔවුන්ගේ පඤ්ච නීවරණයෝ පහවූහ. සිඳින ලද මුල් ඇත්තාහ. සිඳින ලද තල් ගසක් මෙන් කරන ලද්දාහ. විනාශ කරන ලදහ. නැවත නූපදින බවට පත්කරන ලදහ.

5. කවර පසෙක්ද? කාමච්ඡන්ද නීවරණය පහවිය. සිඳලූ මුල් ඇත්තේය. සිඳිනලද තල් ගසක්මෙන් කරන ලදී. විනාශ කරන ලදී. නැවත නූපදින බවට පත්කරන ලදී.

"ව්‍යාපාද නීවරණය පහවිය. සිඳලූ මුල් ඇත්තේය. සිඳින ලද තල් ගසක් මෙන් කරන ලදී. විනාශ කරන ලදී. නැවත නූපදින බවට පත් කරන ලදී.

"ථිනමිද්ධ නීවරණය පහවිය. සිඳලූ මුල් ඇත්තේය. සිඳින ලද තල්ගසක් මෙන් කරන ලදී. විනාශ කරන ලදී. නැවත නූපදින බවට පත් කරන ලදී.

"උද්ධච්චකුක්කුච්ච නීවරණය පහවිය. සිඳලූ මුල් ඇත්තේය. සිඳින ලද තල් ගසක් මෙන් කරන ලදී. විනාශ කරන ලදී නැවත නූපදින බවට පත්කරන ලදී.

"විචිකිච්ඡා නීවරණය පහවිය. සිඳන ලද මුල් ඇත්තේය. සිඳලූ තල් ගසක් මෙන් කරන ලදී. විනාශ කරන ලදී. නැවත නූපදින බවට පත් කරන ලදී.

6. "ඇවැත් මහානාමය, යම් මේ භික්ෂූහු නැති කල ආශ්‍රවයන් ඇත්තාවූ බඹසර වැස නිමවූ කරන ලද කටයුතු ඇත්තාවූ බහා තැබූ කෙලෙස් බර ඇත්තාවූ තමාගේ අර්ථයට පැමිණියාවූ නැති කල භව බැඳුම් ඇත්තාවූ මනාකොට දැන මිදුණාවූ රහත්හු වෙත්ද, ඔවුන්ගේ මේ පඤ්චනීවරණයෝ ප්‍රහීණවූවාහුය. සිඳලූ මුල් ඇත්තාහුය. සිඳිනලද තල් ගසක් මෙන් කරන ලද්දාහුය. විනාශ කරන ලදහ. නැවත නූපදින ස්වභාවයට පමුණුවන ලදහ. ඇවැත් මහානාමය යම්සේ අනික් විහරණයක්

සෙඛ විහරණය වන්නේද අනික් විහරණයක් තථාගත විහරණය වන්නේද එය මේ අකාරයෙන් දත යුතුය.

7. "ඇවැත් මහානාමය, එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ඉච්ඡානංගල ජනපදයෙහි ඉච්ඡානංගල වන ලැහැබෙහි වාසය කළසේක. ඇවැත්නි, එහිදී වනාහි භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්ට අමතා මෙසේ වදාළසේක.

"මහණෙනි, මම තෙමසක් විවේකව විසීමට කැමැත්තෙමි. පිණ්ඩපාතය ගෙනෙන එක් භික්ෂුවක් හැර කිසිවෙක් නොඑළඹිය යුතුය යනුයි, ඇවැත්නි, ඒ භික්ෂූහු 'එසේය ස්වාමීනියි' භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දී එක් පිණ්ඩපාතය ගෙන යන එක් භික්ෂුවක් හැර කිසිවෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත නොඑළඹියේය.

8. "ඇවැත්නි, එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ තුන් මාසය ඇවෑමෙන් විවේකයෙන් නැඟී සිටිසේක් භික්ෂූන් ඇමතූසේක 'මහණෙනි, ඉදින් අන්‍යතීර්ථක පරිබ්‍රාජකයෝ තොපගෙන් මෙසේ අසන්නාහු වෙත්ද, 'ඇවැත්නි, ශ්‍රමණ ගෞතමතෙම කිනම් විහරණයකින් බහුලව වස්විසුවේද?' කියායි. මහණෙනි, මෙසේ විචාරණ ලද්දාවූ තොපි ඒ අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයන්හට මෙසේ ප්‍රකාශ කරව්. (කියව්). 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ ආනාපාන සති සමාධියෙන් බහුලව වස්විසූසේක.' කියායි.

"මහණෙනි, මම මෙහිදී සිහියෙන් ආශ්වාස කරමි. සිහියෙන් ප්‍රස්වාස කරමි. දීර්ඝව හෝ ආස්වාස කරන්නේ දීර්ඝව ආස්වාස කරන්නෙමියි දනිමි. දීර්ඝව හෝ ප්‍රස්වාස කරන්නේ දීර්ඝව ප්‍රස්වාස කරන්නෙමියි දනිමි. හ්‍රස්ව (ලුහුඬු) කොට ආශ්වාස කරන්නේ හෝ හ්‍රස්වකොට ආශ්වාස කරන්නෙමියි දන්නේය. හ්‍රස්වකොට ප්‍රස්වාස කරන්නේ හෝ හ්‍රස්වකොට ප්‍රශ්වාස කරන්නෙමියි දන්නේය.

"මුල මැද අග යන සියලු ආශ්වාස ප්‍රශ්වාස කය දැනගනිමියි යන අදහසින් ආශ්වාස කරන්නෙමියි හික්මෙන්නේය.

"සියලු ආශ්වාස ප්‍රශ්වාස කය දැනගනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආශ්වාස ප්‍රශ්වාසයන් සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආශ්වාස ප්‍රශ්වාසයන් සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සුවය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සුවය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත දැනගනිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත දැනගනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත සතුටු කරමින් ආශ්වාසකරන්නෙමියි හික්මෙයි. සිත සතුටු කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත එකඟකරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත එකඟ කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. අනිත්‍ය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. අනිත්‍ය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. නොඇලීම දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. නොඇලීම දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. නිරෝධය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. නිරෝධය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි පටිනිස්සග්ගය (හැරදැමීම) දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. පටිනිස්සග්ගය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි.

"මහණෙනි, යම් ඒ දෙයක් වනාහි මනාකොට කියනු ලබන්නේ ආර්‍ය්‍ය විහාරයයි කියාත්, බ්‍රහ්ම විහාරයයි කියාත්, තථාගත විහාරයයි කියාත් කියන්නේවේද. ආනාපාන සති සමාධිය වනාහි මනාකොට කියනු ලබන්නේ ආර්‍ය්‍ය විහාරයයි

කියාත්, බ්‍රහ්ම විහාරයයි කියාත්, තථාගත විහාරයයි කියාත් කියන්නේ වෙයි

9. "මහණෙනි, යම් ඒ භික්ෂූහු හික්මෙන්නාහු, නොපැමිණි රහත් බැව් ඇත්තාහු, අති උතුම්වූ නිර්වාණය ප්‍රාර්ථනා කරන්නාහු වාසය කෙරෙද්ද, වඩන ලද්දාවූ, පුරුදු කරන ලද්දාවූ ඒ භික්ෂූන්ගේ ආනාපාන සති සමාධි භාවනාව ආශ්‍රවයන් ක්ෂයකිරීම පිණිස පවතියි.

10. "මහණෙනි, අර්හත්වූ ආශ්‍රවයන් ක්ෂය කළාවූ බ්‍රහ්ම චරියාවෙහි හැසිර නිමවන ලද්දාවූ කොට අවසන් කරන ලද කටයුතු ඇත්තාවූ බහා තබන ලද බර ඇත්තාවූ, නිවනට පැමිණෙන ලද්දාවූ, ක්ෂය කරන ලද භව බැඳුම් ඇත්තාවූ මනාකොට දැන මිදුනාවූ යම් ඒ භික්ෂූහු වෙත්ද, වඩන ලද්දාවූ පුරුදු කරන ලද්දාවූ, ඒ භික්ෂූන්ගේ ආනාපාන සති සමාධි භාවනාව වනාහි මේ ආත්මයේදීම සුඛ විහාරණය පිණිසද සතිසම්පජඤ්ඤය පිණිසද පවතියි.

"මහණෙනි, යම් ඒ දෙයක් වනාහි මනාකොට කියනු ලබන්නේ ආර්‍ය්‍ය විහාරයයි කියාත්, බ්‍රහ්ම විහාරයයි කියාත්, තථාගත විහාරයයි කියාත් කියන්නේ වේද, ආනාපාන සති සමාධිය වනාහි මනාකොට කියනු ලබන්නේ ආර්‍ය්‍ය විහාරයයි කියාත් බ්‍රහ්ම විහාරයයි කියාත්, තථාගත විහාරයයි කියාත් කියන්නේ වෙයි. ඇවැත් මහානාමය, මේ ක්‍රමයෙන් වනාහි 'සෙඛ' විහාරය අනිකකි. තථාගත විහාරය අනිකකියි කියා දත යුත්තේය."

---

## 3. පඨම ආනන්ද එකධම්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේ

යම්තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පැත්තක උන්හ. එක් පැත්තක හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය.

2. "ස්වාමීනි, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ එක් ධර්මයක් ධර්ම සතරක් සම්පූර්ණ කෙරේද? වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ ධර්ම සතරක්, ධර්ම සතක් සම්පූර්ණ කෙරෙත්ද? වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ ධර්ම සතක්, ධර්ම දෙකක් සම්පූර්ණකෙරෙත්ද (එබඳුවූ ධර්මයක්) ඇත්තේද?"

"ආනන්දය, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ එක් ධර්මයක් ධර්ම සතරක් සම්පූර්ණ කෙරේද? වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ ධර්ම සතරක් ධර්ම සතක් සම්පූර්ණ කෙරෙත්ද? වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ ධර්ම සතක් ධර්ම දෙකක් සම්පූර්ණ කෙරෙත්ද? (එබඳුවූ ධර්මයක්) ඇත්තේය."

3. "ස්වාමීනි, එක් ධර්මයක් වඩන ලද්දාවූ බහුල කරන ලද්දේ ධර්ම සතරක් සම්පූර්ණ කෙරේද? ධර්ම සතරක් වඩන ලද්දාහු බහුල කරන ලද්දාහු ධර්ම සතක් සම්පූර්ණ කෙරෙත්ද? ධර්ම සතක් වඩන ලද්දාවූ බහුල කරන ලද්දාහු ධර්ම දෙකක් සම්පූර්ණ කෙරෙත්ද? (එබඳුවූ ධර්මය) කවරේද?"

4. "ආනන්දය, එකම ආනාපාන සතිසමාධිය වනාහි වඩන ලද්දේ බහුල කරන ලද්දේ සතර සතිපට්ඨාන ධර්මයන් සම්පූර්ණ කෙරෙයි. සතර සතිපට්ඨාන ධර්මයෝ වඩන ලද්දාහු, බහුල කරන ලද්දාහු සත්තබොජ්ඣංගයන් සම්පූර්ණ කෙරෙත්. සත්ත බොජ්ඣංගයෝ වඩන ලද්දාහු, බහුල කරන ලද්දාහු අර්හත්මාර්ගය හා ඵලය සම්පූර්ණ කෙරෙත්.

5. "ආනන්දය, කෙසේ වඩනලද්දාවූ, කෙසේ බහුල කරන ලද්දාවූ ආනාපාන සතිසමාධිය සතර සතිපට්ඨානයන් සම්පූර්ණ කෙරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම ආරණ්‍යයට ගියේ හෝ රුක් මුලට ගියේ හෝ සූන්‍යාගාරයට ගියේ හෝ හිස් ගෙයකට ගියේ හෝ පයඞ්කය බැඳ ශරීරය කෙලින්

පිහිටුවාගෙන සිහිය ඉදිරිපත් කොට තබාගෙන හිඳින්නේය. හෙතෙම සිහියෙන්ම ආශ්වාස කරන්නේය. සිහියෙන්ම ප්‍රස්වාස කරන්නේය. දීර්ඝකොට ආස්වාස කරන්නේ හෝ දීර්ඝකොට ආස්වාස කරන්නෙමියි දන්නේය. දීර්ඝ කොට ප්‍රස්වාස කරන්නේ හෝ දීර්ඝකොට ප්‍රස්වාස කරන්නෙමි'යි දන්නේය. හ්‍රස්ව (ලුහුඬු) කොට ආස්වාස කරන්නේ හෝ හ්‍රස්ව කොට ආස්වාස කරන්නෙමියි දන්නේය. හ්‍රස්වකොට ප්‍රස්වාස කරන්නේ හෝ හ්‍රස්ව කොට ප්‍රස්වාස කරන්නෙමියි දන්නේය.

"මුල මැද අග යන සියලු ආස්වාස ප්‍රස්වාස කය දැන ගනිමියි යන අදහසින් ආස්වාස කරන්නෙමියි හික්මෙන්නේය. සියලු ආස්වාස ප්‍රස්වාස කය දැනගනිමින් ප්‍රස්වාසකරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආස්වාස ප්‍රස්වාසයන් සංසිඳුවමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආස්වාස ප්‍රශ්වාසයන් සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය ප්‍රකට කරමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයි. සුවය ප්‍රකටකරමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. සුවය ප්‍රකටකරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි චිත්තසංස්කාරය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්තසංස්කාරය සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත දැනගනිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත දැනගනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත සතුටු කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත සතුටු කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත එකග කරමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. සිත එකගකරමින් ප්‍රශ්වාසකරන්නෙමියි හික්මෙයි සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි අනිත්‍ය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. අනිත්‍ය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. නොඇලීම දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. නොඇලීම දකිමින් ප්‍රශ්වාස

කරන්නෙමියි හික්මෙයි. නිරොධය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. නිරොධය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. පටිනිස්සග්ගය (හැරදැමීම) දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. පටිනිස්සග්ගය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි.

**6.** "ආනන්දය, යම් කලෙක්හි මහණතෙම වනාහි දීර්ඝව ආශ්වාස කරන්නේ, දීර්ඝව ආශ්වාස කරන්නෙමියි, දනියි. දීර්ඝව ප්‍රශ්වාස කරන්නේ දීර්ඝව ප්‍රශ්වාස කරන්නෙමියි දනියි. හ්‍රස්ව (ලුහුඬු) කොට ආශ්වාස කරන්නේ හෝ හ්‍රස්වකොට ආශ්වාස කරන්නෙමියි දන්නේය. හ්‍රස්වකොට ප්‍රශ්වාස කරන්නේ හෝ හ්‍රස්වකොට ප්‍රශ්වාස කරන්නෙමියි දන්නේය.

"මුල මැද අග යන සියලු ආශ්වාස ප්‍රශ්වාස කය දැනගනිමියි යන අදහසින් ආශ්වාස කරන්නෙමියි හික්මෙන්නේය.

සියලු ආස්වාස ප්‍රස්වාස කය දැනගනිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආශ්වාස ප්‍රශ්වාසයන් සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. ඖදාරික ආශ්වාස ප්‍රශ්වාසයන් සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි.

**7.** "ආනන්දය, එකල්හි කෙලෙස්තවන වීය්‍ර්‍යය ඇත්තාවූ, නුවණින් යුක්තවූ සිහියෙන් යුක්තවූ භික්ෂුව ස්කන්ධ ලෝකයෙහි ලොභය හා ද්වෙෂය දුරුකොට කයෙහි කය නැවත නැවත බලමින් වාසයකෙරෙයි. ඊට හේතු කවරේද? ආනන්දය, මම මේ ආස්වාසය ප්‍රස්වාසය එක්තරා කයක්යයි කියමි. ආනන්දය, එහෙයින් මහණතෙම එකල්හි කෙලෙස් තවන වීය්‍ර්‍යය ඇත්තේ, නුවණින් යුක්තවූයේ සිහි ඇත්තේ ස්කන්ධ ලොකයෙහි ලොභය සහ ද්වෙෂය දුරුකොට කයෙහි කය නැවත නැවත බලමින් වාසය කෙරෙයි.

**8.** "ආනන්දය, යම් කලෙක මහණතෙම ප්‍රීතිය ප්‍රකට කරමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රීතිය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. සුවය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. සුවය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි.

"චිත්තසංස්කාරය ප්‍රකට කරමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය ප්‍රකට කරමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. චිත්ත සංස්කාරය සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි.

"ආනන්දය එකල්හි මහණතෙම කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ, නුවණින් යුක්තවූයේ සිහි ඇත්තේ ස්කන්ධලෝකයෙහි ලොභය සහ ද්වෙෂය දුරුකොට වෙදනාවන්හි වෙදනා නැවත නැවත බලමින් වාසය කෙරෙයි. ඊට හේතු කවරේද? ආනන්දය, මම මේ ආස්වාස ප්‍රස්වාසයන් මනාකොට මෙනෙහි කිරීම එක්තරා වෙදනාවක්යයි කියමි. ආනන්දය, එහෙයින් මහණතෙම එකල්හි කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ, නුවණින් යුක්තවූයේ සිහි ඇත්තේ ස්කන්ධ ලෝකයෙහි ලොභය සහ ද්වෙෂය දුරුකොට වෙදනාවන්හි වෙදනා නැවත නැවත බලමින් වාසය කෙරෙයි.

**9.** "ආනන්දය, යම් කලක මහණතෙම ධ්‍යාන සිත දැන ගනිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයිද, ධ්‍යාන සිත සංසිඳුවමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයිද,

"සිත අතිශයින් සතුටු කරමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයිද, සිත සංසිඳුවමින් ප්‍රස්වාස කරන්නෙමියි හික්මෙයිද,

අරමුණෙහි සිත පිහිටුවමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයිද,

(නීවරණයන් කෙරෙන්) සිත මුදමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයිද, ආනන්දය, මහණතෙම එකල්හි කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ, නුවණින් යුක්තවූයේ, සිහි ඇත්තේ ස්කන්ධ ලෝකයෙහි ලෝභය සහ ද්වෙෂය දුරුකොට චිත්තයෙහි චිත්තය නැවත නැවත බලමින් වාසය කෙරෙයි. ඊට හේතු කවරේද? ආනන්දය, මම සිහි මුළාවූ නුවණ නැත්තාට ආනාපාන සතිසමාධි භාවනාව නොවදාරමි.

**10.** "ආනන්දය, එහෙයින් මෙහි මහණතෙම එකල්හි කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ, නුවණින් යුක්තවූයේ සිහි

ඇත්තේ ස්කන්ධ ලොකයෙහි ලෝභය සහ ද්වෙෂය දුරුකොට චිත්තයන්හි චිත්තය නැවත නැවත බලමින් වාසය කෙරෙයි.

11. "ආනන්දය, යම් කලෙක මහණතෙම අනිත්‍යය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. අනිත්‍යය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. අනිත්‍ය සිත සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. අනිත්‍ය සිත සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. විරාගය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. විරාගය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. විරාගය සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි විරාගය සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. නිරොධය දකිමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. නිරොධය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. පටිනිස්සග්ගය දකිමින් ආස්වාස කරන්නෙමියි හික්මෙයි. පටිනිස්සග්ගය දකිමින් ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙයි. ආනන්දය, මහණතෙම එකල්හි කෙලෙස්තවන වීය්‍ය්‍ය ඇත්තේ, නුවණින් යුක්තවූයේ සිහි ඇත්තේ ස්කන්ධ ලොකයෙහි ලොභය සහ ද්වෙෂය දුරුකොට ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කෙරෙයි. හෙතෙම ඒ ලොභ ද්වෙෂයන්ගේ යම් පහකිරීමක් වේද එය නුවණින් බල බලා මනාකොට මැදහත් වූයේ වෙයි.

12. "ආනන්දය, එහෙයින් මෙහි මහණතෙම එකල්හි කෙලෙස් තවන වීය්‍ය්‍ය ඇත්තේ නුවණින් යුක්තවූයේ සිහි ඇත්තේ ස්කන්ධ ලෝකයෙහි ලොභය සහ ද්වෙෂය දුරු කොට ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කෙරෙයි. ආනන්දය, මෙසේ වඩන ලද්දාවූ මෙසේ බහුල කරන ලද්දාවූ ආනාපාන සතිසමාධිය වනාහි සතර සතිපට්ඨානයන් සම්පූර්ණ කෙරෙයි.

13. "ආනන්දය, කෙසේ වඩන ලද්දාවූ කෙසේ බහුල කරන ලද්දාවූ සතර සතිපට්ඨානයෝ සත්ත බොජ්ඣංගයන් සම්පූර්ණ කෙරෙත්ද? ආනන්දය, යම් කලක මහණතෙම කයෙහි කය නැවත නැවත බලමින් වාසය කෙරේද, එකල්හි ඒ මහණහුගේ සිහිය එළඹ සිටියේ වෙයි. මුළානොවූයේ වෙයි. ආනන්දය, යම්

කලක මහණහුගේ සිහිය එළඹ සිටියේ වේද, මුළානොවූයේ වේද, එකල්හි භික්ෂුව විසින් සති සම්බොජ්ඣංගය සම්පූර්ණ කරන ලද්දේ වෙයි. එකල්හි මහණතෙම සති සම්බොජ්ඣංගය වඩයි. එකල්හි මහණහුගේ සතිසම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණ වීමට පැමිණෙයි. එසේ සිහියෙන් වාසය කරන්නාවූ ඒ මහණතෙම ඒ ධර්මය නුවණින් සොයයි. හැසිරෙයි. විමසීමට පැමිණෙයි.

14. "ආනන්දය, යම් කලෙක එසේ සිහියෙන් වාසය කරන්නාවූ මහණතෙම ඒ ධර්මය නුවණින් සොයාද, හැසිරේද විමසීමට පැමිණේද එකල්හි මහණහු විසින් ධම්මවිචය සම්බොජ්ඣංගය සම්පූර්ණ කරනලද්දේ වෙයි. එකල්හි මහණ තෙම ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයි. එකල්හි මහණහුගේ ධම්මවිචය සම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි. ඒ ධර්මය නුවණින් සොයන්නාවූ, හැසිරෙන්නාවූ විමසීමට පැමිණෙන්නාවූ ඒ මහණහුගේ වීර්‍ය්‍යය පටන්ගන්නා ලද්දේ වෙයි. පසුබට නොවූයේ වෙයි.

15. ආනන්දය, යම් කලක ඒ ධර්මය නුවණින් සොයන්නාවූ හැසිරෙන්නාවූ විමසීමට පැමිණෙන්නාවූ මහණහුගේ වීර්‍ය්‍යය පටන්ගන්නා ලද්දේ වේද, පසුබට නොවූයේ වේද එකල්හි මහණහු විසින් විරිය සම්බොජ්ඣංගය සම්පූර්ණ කරන ලද්දේ වෙයි. එකල්හි මහණතෙම විරිය සම්බොජ්ඣංගය වඩයි

16. "ආනන්දය, යම් කලක ඒ ධර්මය නුවණින් සොයන්නාවූ, හැසිරෙන්නාවූ, විමසීමට පැමිණෙන්නාවූ මහණහුගේ වීර්‍ය්‍යය පටන් ගන්නා ලද්දේ වේද, පසුබට නොවූයේ වේද, එකල්හි මහණහු විසින් විරිය සම්බොජ්ඣංගය සම්පූර්ණ කරන ලද්දේ වෙයි. එකල්හි මහණතෙම විරිය සම්බොජ්ඣංගය වඩයි. එකල්හි මහණහුගේ විරියසම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි. පටන් ගන්නා ලද වීර්‍ය්‍යය ඇති මහණහට නිරාමිස (නික්ලෙශ) ප්‍රීතිය උපදියි. එකල්හි මහණහු විසින් පීති සම්බොජ්ඣංගය සම්පූර්ණ කරන ලද්දේ වෙයි. එකල්හි මහණතෙම පීති සම්බොජ්ඣංගය වඩයි. එකල්හි මහණහුගේ

පීති සම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි. ප්‍රීති සිත් ඇත්තාහුගේ කයද සංසිඳෙයි. සිතද සංසිඳෙයි.

"ආනන්දය, යම් කලක ප්‍රීති සිත් ඇති මහණහුගේ කයද සංසිඳෙයිද සිතද සංසිඳෙයිද එකල්හි මහණහු විසින් පස්සද්ධි සම්බොජ්ඣංගය සම්පූර්ණ කරන ලද්දේ වෙයි. එකල්හි මහණතෙම පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයි. එකල්හි මහණහුගේ පස්සද්ධි සම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි. සංසිඳුණු කය ඇතිව සැපවත්වූවහුගේ සිත සමාධි ගතවේ. (එකඟවේ.)

"ආනන්දය, යම් කලක සංසිඳුණු කය ඇතිව සැපවත්වූ මහණහුගේ සිත සමාධිගතවේද, එකල්හි මහණහු, විසින් සමාධි සම්බොජ්ඣංගය සම්පූර්ණ කරන ලද්දේ වෙයි. එකල්හි මහණතෙම සමාධි සම්බොජ්ඣංගය වඩයි. එකල්හි මහණහුගේ සමාධි සම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි. ඒ මහණතෙම එසේ එකඟවූ සිත මනාකොට මැදහත්ව බලන්නේවෙයි.

17. "ආනන්දය, යම් කලක මහණතෙම එසේ එකඟවූ, සිත මැදහත්ව බලන්නේවේද, එකල්හි මහණහු විසින් උපෙක්ඛා සම්බොජ්ඣංගය සම්පූර්ණ කරන ලද්දේවෙයි. එකල්හි මහණ තෙම උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයි. එකල්හි මහණහුගේ උපෙක්ඛා සම්බොජ්ඣංගය වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙයි.

18. "ආනන්දය, යම් කලෙක මහණතෙම වීර්‍ය්‍යයෙන් යුක්තව යහපත් නුවණින් යුක්තව සිහියෙන් යුක්තව ලොකයෙහි ලොභ ද්වෙෂයන් දුරුකොට කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරයිද කයෙහි කය නැවත නැවත, බලමින් වාසය කරන්නාවූ ඔහුගේ සිත සමාධියට පැමිණෙයි. ක්ලෙශයෝ පහවෙත්. හෙතෙමේ ඒ නිමිත්ත උගනියි.

"වීර්‍ය්‍යයෙන් යුක්තව යහපත් නුවණින් යුක්තව සිහියෙන් යුක්තව ලොකයෙහි ලොභ ද්වෙෂයන් දුරුකොට වේදනාවන්හි වේදනාවන් නැවත නැවත බලමින් වාසය කරයිද, වේදනාවන්හි වේදනාවන් නැවත නැවත බලමින් වාසය කරන්නාවූ ඔහුගේ

සිත සමාධියට පැමිණෙයි. ක්ලෙශයෝ පහවෙත්. හෙතෙම ඒ නිමිත්ත උගනියි.

"වීර්‍ය්‍යයෙන් යුක්තව යහපත් නුවණින් යුක්තව සිහියෙන් යුක්තව ලොකයෙහි ලොභ ද්වෙෂයන් දුරුකොට සිතෙහි සිත නැවත නැවත බලමින් වාසය කරයිද, සිතෙහි සිත නැවත නැවත බලමින් වාසය කරන්නාවූ ඔහුගේ සිත සමාධියට පැමිණෙයි. ක්ලෙශයෝ පහවෙත්. හෙතෙම ඒ නිමිත්ත උගනියි.

"වීර්‍ය්‍යයෙන් යුක්තව යහපත් නුවණින් යුක්තව සිහියෙන් යුක්තව ලොකයෙහි ලොභ ද්වෙෂයන් දුරුකොට ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරයිද, ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරන්නාවූ ඔහුගේ සිත සමාධියට පැමිණෙයි. ක්ලෙශයෝ පහවෙත්. හෙතෙම ඒ නිමිත්ත උගනියි.

"ආනන්දය, මෙසේ වඩන ලද්දාවූ, මෙසේ බහුල කරන ලද්දාවූ සතර සතිපට්ඨානයෝ වනාහි සත්තබොජ්ඣංගයන් සම්පූර්ණ කෙරෙත්.

**19.** "ආනන්දය, කෙසේ වඩන ලද්දාවූ, කෙසේ බහුල කරන ලද්දාවූ සත්ත බොජ්ඣංගයෝ (අර්හත් මාර්ගය හා ඵලය) විජ්ජාවිමුත්තිය සම්පූර්ණ කෙරෙද්ද? ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ, නිරෝධය ඇසුරුකළාවූ නිවනට නැමුණාවූ සති සම්බොජ්ඣංගය වඩාද,

"මහණතෙම විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ, නිරෝධය ඇසරුකළාවූ නිවනට නැමුණාවූ ධම්ම විචය සම්බොජ්ඣංගය වඩාද,

"මහණතෙම විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ, නිරෝධය ඇසුරුකළාවූ නිවනට නැමුණාවූ විරිය සම්බොජ්ඣංගය වඩාද,

"මහණතෙම විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ, නිරෝධය ඇසුරුකළාවූ නිවනට නැමුණාවූ පීති සම්බොජ්ඣංගය වඩාද,

"මහණතෙම විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ, නිරෝධය ඇසුරුකළාවූ නිවනට නැමුණාවූ පස්සද්ධි සම්බොජ්ඣංගය වඩාද,

"මහණතෙම විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ, නිරෝධය ඇසුරුකළාවූ නිවනට නැමුණාවූ සමාධි සම්බොජ්ඣංගය වඩාද,

'මහණතෙම විවේකය ඇසුරුකළාවූ, විරාගය ඇසුරුකළාවූ, නිරෝධය ඇසුරුකළාවූ නිවනට නැමුණාවූ උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩාද,

"ආනන්දය, මෙසේ වඩන ලද්දාවූ, මෙසේ බහුල කරන ලද්දාවූ සත්තබොජ්ඣඞගයෝ විජ්ජාවිමුත්තිය (අර්හත් මාර්ගය හා ඵලය) සම්පූර්ණ කරත්.

---

## 4. දුතිය ආනන්ද එකධර්ම සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වාසය කරනසේක.

එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පැත්තක උන්හ. එක් පැත්තක හුන්නාවූ, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "ආනන්දය, එක් ධර්මයක් වඩන ලද්දේ බහුල කරන ලද්දේ ධර්ම සතරක් සම්පූර්ණ කෙරේද, ධර්ම සතරක් වඩන ලද්දාහු පුරුදු කරන ලද්දාහු ධර්ම සතක් සම්පූර්ණ කෙරෙද්ද, ධර්ම සතක් වඩන ලද්දාහු, පුරුදු කරන ලද්දාහු ධර්ම දෙකක් සම්පූර්ණ කෙරෙද්ද (එබඳුවූ ධර්මයක්) ඇත්තේද?

3. "ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පමුණුවන්නා

කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තාහුය. ස්වාමීනි, මේ කීමේ අදහස භාග්‍යවතුන් වහන්සේ විසින්ම කියා දෙතොත් හොඳය. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ ගෙන් අසා දරන්නාහුය.”

4. (මේ ඡේදය මේ වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 2 ඡේදයේ 2 වෙනි කොටස මෙනි.)

5-20. (මේ ඡේද මේ වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 4-19 ඡේද මෙනි.)

---

## 5. පඨම භික්ඛු එකධම්ම සූත්‍රය

2. “එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය කීවාහුය.

3. “එක් ධර්මයක් වඩන ලද්දේ, බහුල කරන ලද්දේ ධර්ම සතරක් සම්පූර්ණ කෙරේද, ධර්ම සතරක් වඩන ලද්දාහු පුරුදු කරන ලද්දාහු ධර්ම සතක් සම්පූර්ණ කෙරෙද්ද, ධර්ම සතක් වඩන ලද්දාහු, පුරුදු කරන ලද්දාහු ධර්ම දෙකක් සම්පූර්ණ කෙරෙත්ද (එබඳුවූ ධර්මයක්) ඇත්තේද?

4-20. (මේ වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 3-19 ඡේද මෙනි. ආමන්ත්‍රන වචනය ‘ආනන්දය’ වෙනුවට ‘මහණෙනි’ වියයුතුයි)

---

## 6. දුතිය භික්ඛු එකධම්ම සූත්‍රය

2. ඉක්බිති බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පැත්තක හුන්නේය. එක්පැත්තක හුන්නා වූ ඒ භික්ෂූන් හට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. "එක් ධර්මයක් වඩන ලද්දේ, බහුල කරන ලද්දේ ධර්ම සතරක් සම්පූර්ණ කෙරේද, ධර්ම සතරක් වඩන ලද්දාහු, පුරුදු කරන ලද්දාහු ධර්ම සතක් සම්පූර්ණ කෙරෙත්ද, ධර්ම සතක් වඩන ලද්දාහු, පුරුදු කරන ලද්දාහු ධර්ම දෙකක් සම්පූර්ණ කෙරෙත්ද, (එබඳුවූ ධර්මයක්) ඇත්තේද?

4-20. (මේ ඡේදය මේ වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 3-19 ඡේදය මෙනි) ආමන්ත්‍රන වචනය 'ආනන්දය' වෙනුවට 'මහණෙනි' විය යුතුයි.

---

## 7. සංයෝජන පහාණ සූත්‍රය

2. "මහණෙනි, වඩන ලද්දාවූ, බහුල කරන ලද්දාවූ ආනාපාන සති සමාධිය සංයෝජනයන් පහකිරීම පිණිස පවතියි. මහණෙනි, කෙසේ වඩන ලද්දාවූ කෙසේ බහුල කරන ලද්දාවූ ආනාපාන සති සමාධිය සංයෝජනයන් පහකිරීම පිණිස පවතීද?

3. (මේ ඡේදය ඒක ධම්ම වර්ගයේ 4 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡේදයේ 'මහණෙනි, මේ ශාසනයෙහි'..... සිට, 3 වෙනි ඡේදයේ 'පටිනිස්සග්ගය..... හික්මෙයි' දක්වා යොදා ගතයුතුයි.

4. 'මහණෙනි, මෙසේ වඩන ලද්දාවූ මෙසේ බහුල කරන ලද්දාවූ ආනාපාන සති සමාධිය වනාහි සංයෝජනයන් පහකිරීම පිණිස පවතියි."

---

## 8. අනුසය සමුග්ඝාත සූත්‍රය.

2. "මහණෙනි, වඩන ලද්දාවූ, බහුල කරන ලද්දාවූ ආනාපාන සති සමාධිය අනුසය නැසීම පිණිස පවතියි. මහණෙනි, කෙසේ වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ ආනාපාන සති සමාධිය අනුසයන් නැසීම පිණිස පවතීද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 7 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි මෙසේ වඩනලද්දාවූ මෙසේ බහුල කරන ලද්දාවූ ආනාපාන සති සමාධිය වනාහි අනුසය නැසීම පිණිස පවතියි."

---

## 9. අද්ධානපරිඤ්ඤා සූත්‍රය.

2 "මහණෙනි, වඩන ලද්දාවූ, බහුල කරන ලද්දාවූ, ආනාපාන සති සමාධිය අතීත අනාගත වර්තමාන කාලත්‍රය දැනීම පිණිස පවතියි මහණෙනි, කෙසේ වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ ආනාපාන සති සමාධිය අතීත අනාගත වර්තමාන කාලත්‍රය දැනීම පිණිස පවතීද?

3. (මේ ඡෙදය මේ වර්ගයේ 7 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි.)

4. "මහණෙනි, මෙසේ වඩන ලද්දාවූ මෙසේ බහුල කරන ලද්දාවූ ආනාපාන සති සමාධිය වනාහි අතීත අනාගත වර්තමාන කාලත්‍රය දැනීම පිණිස පවතියි."

---

## 10. ආසවක්ඛය සූත්‍රය.

2. "මහණෙනි, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ ආනාපාන සති සමාධිය ආශ්‍රවයන් ක්ෂය කිරීම පිණිස පවතියි. මහණෙනි, කෙසේ වඩන ලද්දාවූ, කෙසේ බහුල කරන ලද්දාවූ ආනාපාන සති සමාධිය ආශ්‍රවයන් ක්ෂයකිරීම පිණිස පවතීද?

3. (මේ ඡෙදය මේ වර්ගයේ 7 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි)

4. "මහණෙනි, මෙසේ වඩන ලද්දාවූ, මෙසේ බහුල කරන ලද්දාවූ ආනාපාන සති සමාධිය වනාහි ආශ්‍රවයන් ක්ෂයකිරීම පිණිස පවතියි"

(දසවෙනි ආනාපාන සති සංයුත්තය නිමි.)

---

# 11. සොතාපත්ති සංයුත්තය.

## වේළුද්වාර වර්ගය

### 1. චක්කවත්තිරාජ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේ පිඬු සිටුහු විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. ස්වාමීනියි' කියා ඒ භික්ෂූන් භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය.

2. "මහණෙනි, හුදෙක් සක්විති රජතෙම සතර මහාද්වීපයට අධිපති වූ, රාජ්‍යය කරවා කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇත්තාවූ ස්වර්ගලෝකයෙහි උපදියිද, තව්තිසා දෙවියන් හා එක්වීමට පැමිණෙයිද ඒ සක්විති රජතෙම ඒ දෙව්ලොවදී දෙවඟනන් විසින් පිරිවරන ලද්දේ දිව්‍යමය වූ පඤ්චකාම ගුණයෙන් සම්පූර්ණවූයේ යුක්තවූයේ ඉන්ද්‍රියයන් පිනවයිද එහෙත් හෙතෙම ධර්ම සතරකින් යුක්තවූයේ නොවෙයි, එහෙයින් ඒ සක්විති රජ තෙම වනාහි නිරයෙන් නො මිදුනේම වෙයි. තිරිසන් යෝනියෙන් නො මිදුණේම වෙයි. ප්‍රෙත විෂයෙන් නොමිදුණේම වෙයි. නපුරු ගති ඇති, විසම වැටීම් ඇති අපායෙන් නො මිදුණේ වෙයි.

3. 'මහණෙනි, හුදෙක් ආර්‍ය්‍යශ්‍රාවකතෙම පිණ්ඩපාතයෙන් යැපෙයිද, කඩරෙදි දරයිද, එහෙත් හෙතෙම ධර්ම සතරකින් යුක්තවූයේ වෙයි, එහෙයින් ඒ ආර්‍ය්‍යශ්‍රාවකතෙම වනාහි නිරයෙන් මිදුණේ වෙයි. තිරිසන් යෝනියෙන් මිදුණේ වෙයි. ප්‍රේත විෂයෙන් මිදුණේ වෙයි. නපුරු ගති ඇති, විසමවූ වැටීම් ඇති අපායෙන් මිදුණේ වෙයි.

4. "කවර සතරකින්ද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවකතෙම, ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේත් අර්හත් වෙන සේක, සම්‍යක් සම්බුද්ධ වනසේක, විජ්ජාචරණ සම්පන්න

වනසේක. සුගත වනසේක, ලෝකවිදූ වනසේක. අනුත්තර පුරිසදම්මසාරථී වනසේක. දෙව් මිනිසුන්ගේ ශාස්තෘ වනසේක. චතුස්සත්‍යය අවබොධ කළසේක. භාග්‍යවත් වනසේකැයි බුදුරජාණන් වහන්සේ කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයිද,

**5.** "ධර්මය තෙම භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට දෙශනා කරන ලද්දේය. මේ ආත්මයෙහි දෙන ඵල ඇත්තේය. කල්නොයවා විපාක දෙන්නේය. එව බලවයි පෙන්වියහැකි ගුණ ඇත්තේය. තමන් තුළ එළවා වැඩියයුතු ගුණයෙන් යුක්තවූයේය. නුවණැත්තන් විසින් වෙන වෙනම දතයුත්තේයයි මෙසේ ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයිද,

**6.** "භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝතෙම ශාසන ප්‍රතිපත්තියෙහි මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය. නිවනට සුදුසුව පිළිපන්නේය. ගරුබුහුමනට යොග්‍යව පිළිපන්නේය. යම් මේ පුරිස යුගසතරක් වෙත්ද, පුද්ගලයන් අටදෙනෙක් වෙත්ද මේ ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන් උදෙසා පිළියෙළකළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. තුටු පඬුරු පිණිස පිළියෙල කළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. කම්පල අදහා දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසු වූ සේක. ඇඳිළිකිරීමට (වැඳීමට) සුදුසු වූයේය. ලෝකයාගේ උතුම් පින් කෙතය. මෙසේ සංඝයා කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයිද,

**7.** "නොකැඩුනාවූ, සිදුරු නොවූ, කබර නොවූ කැළල් නොවූ නිදහස්වූ නුවණ ඇත්තන් විසින් ප්‍රසංසා කරන ලද්දාවූ, තෘෂ්ණා දෘෂ්ටීන් විසින් පරාමර්ශනය නොකරන ලද්දාවූ සමාධිය පිණිස පවතින්නාවූ ආර්‍ය්‍යයන් කැමති ශීලයෙන් යුක්තවූයේ වෙයිද,

**8.** "මහණෙනි, යම් සතරමහා දිවයින ලැබීමක් වේද, යම් ධර්ම සතරක් ලැබීමක් වේද, ඒ සතර මහා දිවයින ලැබීම මේ ධර්මසත ධර්මයන්ගේ ලැබීමෙන් සොළොස් කලාවෙන් කලාවකුදු නොවටීයයි" වදාළේය.

---

## 2. බ්‍රහ්මචරියොගධ සූත්‍රය.

1. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡේදය මෙනි.)

2. "මහණෙනි, ධර්මසතරකින් යුක්තවූ, ආය්‍යීශ්‍රාවකතෙම අපායෙහි නොවැටෙන ස්වභාව ඇති, රහත්බව නියතවූ, රහත් බව පිහිටකොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයෙක් වෙයි. කවර සතරකින්ද?

3. "මහණෙනි, මේ ශාසනයෙහි ආය්‍යීශ්‍රාවකතෙම, ඒ භාග්‍යවතුන්වහන්සේ මෙසේත් අර්හත් වනසේක. සම්‍යක් සම්බුද්ධ වනසේක. විජ්ජාචරණසම්පන්න වනසේක සුගත වනසේක. ලෝකවිදූ වනසේක. අනුත්තර පුරිස ධම්මසාරථී වනසේක. දෙවි මිනිසුන්ගේ ශාස්තෲ වනසේක. චතුස්සත්‍යය අවබොධ කළසේක. භාග්‍යවත් වනසේකැයි බුදුරජාණන් වහන්සේ කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයිද,

3. "භාග්‍යවතුන් වහන්සේ විසින් සද්ධර්මය මනාකොට දෙශනා කරන ලද්දේය. මේ ආත්මයෙහි දෙනඵල ඇත්තේය. කල්නොයවා විපාක දෙන්නේය. එව බලවයි පෙන්වියහැකි ගුණ ඇත්තේය. තමන් තුළ එළවා වැඩියයුතු ගුණයෙන් යුක්තවූයේය. නුවණැත්තන් විසින් වෙනවෙනම දතයුත්තේ යයි මෙසේ ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවෙයිද,

4. "භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම ශාසන ප්‍රතිපත්තියෙහි මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය. නිවනට සුදුසුව පිළිපන්නේය. ගරුබුහුමනට යොග්‍යව පිළිපන්නේය. යම් මේ පුරිස යුග සතරක් වෙත්ද, පුද්ගලයන් අටදෙනෙක් වෙත්ද මේ ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන් උදෙසා පිළියෙළකළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. තුටු පඬුරු පිණිස පිළියෙල කළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. කම්පල අදහා දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසු වූ සේක. අඤ්ජලිකර්මයට (වැඳීමට) සුදුසු වූයේය. ලෝකයාගේ උතුම් පින් කුඹුරය. මෙසේ සංඝයා කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයි.

5. (මේ ඡෙදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 7 වෙනි ඡෙදය මෙනි.)

6. "මහණෙනි, මේ ධර්ම සතරින් යුක්තවූ ආර්‍ය්‍යශ්‍රාවක තෙම අපායෙහි නොවැටෙන ස්වභාව ඇති, රහත් බව නියතවූ, රහත්බව පිහිටකොට ඇත්තාවූ සෝවාන් වූයේ වෙයි." භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක. මෙය වදාරා අනතුරුව සුගතවූ ශාස්තෲන් වහන්සේ මෙසේද වදාළසේක.

> "යමෙක්හට බුදුරජාණන් වහන්සේ කෙරෙහි ප්‍රසාදයද, ධර්මය කෙරෙහි ප්‍රසාදයද, සංඝයා කෙරෙහි ප්‍රසාදයද, ආර්‍ය්‍යයන් කැමතිවූ සීලයද ඇත්තාහුද ඔවුහු සුදුසු කාලයෙහි ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි බැස සිටි මතු මාර්ගත්‍රය හා යෙදුණ සැපයට සුදුසු කාලයෙහි පැමිණෙත් යනුයි."

---

## 3. ආබාධික දීඝාවු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දක නිවාප නම් ලත් උණවනයෙහි වාසය කරන සේක. එකල්හි වනාහි දීඝාවූ උපාසකතෙම රෝගාතුරවූයේ, දුකට පත්වූයේ, දැඩි ගිලන් වූයේ වෙයි. ඉක්බිති දීඝාවූ උපාසක තෙම පියාවන ජෝතික නම් ගහපතියාහට කථාකොට මෙසේ කීය.

2. "ගහපතිය, ඔබ මෙහි එනු මැනවි. භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එහි යනු මැනව ගොස් 'ස්වාමීනි, දීඝාවූ උපාසකතෙම රෝගාතුරවූයේ, දුකටපත්වූයේ, දැඩි ගිලන්වූයේ වෙයි. හෙතෙම භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී පාදයන් සිරසින් වඳීයයි' කියා මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ පාදය සිරසින් වඳිනු මැනවි (වැඳ) මෙසේත් කියන්න. 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ දීඝාවූ උපාසකයාගේ ගෙදර යම් තැනෙක්හිද අනුකම්පා උපදවා එතැන්හි වඩිනසේක් නම් හොඳය' කියායි."

3. "දරුව එසේයයි" ජොතිය ගෘහපතිතෙම දීඝාවු උපාසකයාහට පිළිතුරුදී, භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතැන්හි ගියේය. ගොස් භාග්‍යවතුන්වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ජොතිය ගහපති තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. ස්වාමීනි, දීඝාවු උපාසකතෙම රෝගාතුරවූයේ, දුකට පත්වූයේ දැඩි ගිලන්වූයේ වෙයි. හෙතෙම භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් සිරසින් වඳියි. මෙසේත් කියයි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ දීඝාවු උපාසකයාගේ ගෙදර යම් තැනෙක්හිද අනුකම්පා උපදවා එතැන්හි වඩිනසේක්නම් හොඳය' කියායි."

4. "භාග්‍යවතුන් වහන්සේ එය නිශ්ශබ්ද භාවයෙන් ඉවසූසේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හැඳ, පාත්‍ර සිවුරු ගෙන, දීඝාවු උපාසකයාගේ ගෙදර යම්තැනෙක්හිද එතැන්හි වැඩිසේක. වැඩ, පණවන ලද ආසනයෙහි වැඩ සිටිසේක. වැඩ හුන්නාවූ භාග්‍යවතුන් වහන්සේ දීඝාවු උපාසකයාහට මෙය වදාළසේක.

"කිම, දීඝාවූ, නුඹට ඉවසිය හැකිද? කිම, යැපිය හැකිද? කිම, දුක් වේදනාවෝ සංසිඳෙත්ද? නොවැඩෙත්ද? සංසිඳෙන බවක් පෙනේද? වැඩෙන බවක් නොපෙනේද?'

"ස්වාමීනි, මට ඉවසිය නොහැක. යැපිය නොහැක. මාගේ බලවත්වූ දුක් වේදනාවෝ නොසංසිඳෙත්. වැඩෙන බව පෙනෙත්. සංසිඳෙන බවක් නොපෙනේයයි කීය. දීඝාවූ, එසේ නම් මෙහිදී නුඹ විසින් මෙසේ හික්මිය යුතුයි.

5. "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේත් අර්හත්වන සේක. සම්‍යක් සම්බුද්ධවන සේක. විද්‍යාචරණසම්පන්නවන සේක. සුගත වන සේක. ලෝකවිදූ වන සේක. අනුත්තර පුරිසදම්ම සාරථී වන සේක දෙවි මිනිසුන්ගේ ශාස්තෘ වන සේක. චතුස්සත්‍යය අවබෝධකළ සේක. භාග්‍යවත් සේකැයි. බුදුරජාණන් වහන්සේ කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයිද, මෙසේ වනාහි හික්මිය යුතු වන්නේය.

"භාග්‍යවතුන්වහන්සේ විසින් ධර්මය මනාකොට දෙශනා කරන ලද්දේය. මේ ආත්මයෙහි දෙන ඵල ඇත්තේය, කල් නොයවා දෙන විපාක දෙන්නේය. එව බලවයි, පෙන්විය හැකි ගුණ ඇත්තේය. තමන් තළා එළවා වැඩිය යුතු ගුණයෙන් යුක්තවූයේය. නුවණැත්තන් විසින් වෙන වෙනම දත යුත්තේයයි මෙසේ ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ වෙයිද, මෙසේ වනාහි හික්මිය යුතු වන්නේය.

"භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම ශාසන ප්‍රතිපත්තියෙහි මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය. නිවනට සුදුසුව පිළිපන්නේය, ගරු බුහුමනට යොග්‍යව පිළිපන්නේය. යම් මේ පුරිසයුග සතරක් වෙත්ද, පුද්ගලයන් අට දෙනෙක් වෙත්ද? මේ ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන් උදෙසා පිළියෙල කළ දෙය පිළිගැනීමට සුදුසුවූයේය. තුටු පඬුරු පිණිස පිළියෙල කළ දෙය පිළිගැන්මට සුදුසුවූයේය. කම්පල අදහා දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසු වූසේක. ඇඳිලි කිරීම (වැඳීමට) සුදුසු වූයේය. ලෝකයාගේ උතුම් පින් කුඹුරය. මෙසේ සංඝයා කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේද, මෙසේ වනාහි හික්මිය යුතු වන්නේය.

**6.** (මේ ඡෙදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 7 වෙනි ඡෙදය මෙනි.)

**7.** "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් සොතාපත්තියංග ධර්ම සතරක් දෙශනා කරන ලද්දාහුද ඒ ධර්මයෝ මා කෙරෙහි ඇත්තාහුය. ඒ ධර්මයන්හි මම දකිනු ලබමි. ස්වාමීනි, මම වනාහි ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේත් අර්හත් වන සේක. විද්‍යාචරණසම්පන්න වන සේක. සුගත වන සේක. ලෝකවිදූවන සේක. අනුත්තර පුරිසදම්ම සාරථී වන සේක. දෙවි මිනිසුන්ගේ ශාස්තෘවන සේක. චතුස්සත්‍යය අවබෝධකළ සේක භාග්‍යවත්සේකැයි බුදුරජාණන්වහන්සේ කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයිද,

"ධර්මයතෙම භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට දෙශනා කරන ලද්දේය. මේ ආත්මයෙහි දෙන ලද ඵල ඇත්තේය.

කල් නොයවා දෙන විපාක දෙන්නේය. එව බලවයි පෙන්විය හැකි ගුණ ඇත්තේය. තමන් තුළ එළවා වැඩිය යුතු ගුණයෙන් යුක්තවූයේය. නුවණැත්තන් විසින් වෙන වෙනම දත යුත්තේයයි මෙසේ ධර්මයෙහි නොසෙල් වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයිද,

"භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම (ශාසන ප්‍රතිපත්තියෙහි) මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය. නිවනට සුදුසුව පිළිපන්නේය. ගරු බුහුමනට යොග්‍යව පිළිපන්නේය. යම් මේ පුරිසයුග සතරක් වෙත්ද, පුද්ගලයන් අට දෙනෙක් වෙත්ද, මේ ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන් උදෙසා පිළියෙල කළ දෙය පිළිගැනීමට සුදුසුවූයේය. තුටු පඬුරු පිණිස පිළියෙල කළ දෙය පිළිගැන්මට සුදුසුවූයේය, කම්පල අදහා දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසුවූසේක. ඇඳිලි කිරීමට (වැඳීමට) සුදුසු වූයේය. ලෝකයාගේ උතුම් පින් කුඹුරය. මෙසේ සංඝයා කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේද,

8. "දීඝාවු, එසේනම් මෙහිදී නුඹ මේ සතර සෝතාපත්ති අංගයන්හි පිහිටා මතු භය වැදෑරුම් විජ්ජාභාගීය ධර්මයන් වඩව. දීඝාවූ, නුඹ මෙහිදී සියලු සංස්කාරයන් කෙරෙහි අනිත්‍යය අනුව බලමින් අනිත්‍යයෙහි දුක්ඛ සංඥාව ඇතිව දුකෙහි අනාත්ම සංඥා පහාණ සංඥා ඇතිව විරාග සංඥා ඇතිව නිරොධ සංඥා ඇතිව වාසය කරව දීඝාවූ මෙසේ වනාහි නුඹ විසින් හික්මිය යුතුවන්නේය.

9. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ යම් මේ විජ්ජාභාගීය ධර්මයෝ සය දෙනෙක් දෙශනා කරන ලද්දාහුද, ඒ ධර්මයෝ මා කෙරෙහි ඇත්තාහුය. මම ඒ ධර්මයන්හි දකිනු ලබමි. ස්වාමීනි, මම වනාහි සියලු සංස්කාරයන් කෙරෙහි අනිත්‍යය අනුව බලමින්, අනිත්‍යයෙහි දුක්ඛ සංඥාව ඇතිව දුකෙහි අනාත්ම සංඥාව ඇතිව, පහාණ සංඥාව ඇතිව, විරාග සංඥා ඇතිව, නිරොධ සංඥා ඇතිව වාසය කරමි. ස්වාමීනි, එතකුදුවුවත් මට මෙසේ සිතේ. මේ ජොතිය ගහපතිතෙම මාගේ මරණයෙන් පසු දුකට පත් නොවේවායි" කියායි.

10. "දරුව, දීඝාවූ, නුඹ මෙසේ නොසිතව. දරුව දීඝාවූ, යමක් භාග්‍යවතුන්වහන්සේ වදාළේනම් නුඹ එයම මනාකොට මෙනෙහි කරව. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ දීඝාවූ උපාසකයාහට මේ අවවාදයෙන් අවවාදකොට හුනස්නෙන් නැගිට වැඩිසේක ඉක්බිති දීඝාවූ උපාසකතෙම භාග්‍යවතුන් වහන්සේ වැඩි නොබෝ වේලාවකින් කළුරිය කෙළේය.

11. එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැන්හි පැමිණියාහුය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක හුන්නාහුය. එක්පසක හුන්නාවූ ඒ භික්ෂූහු වනාහි භාග්‍යවතුන් වහන්සේට මෙය කීවාහුය.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් කෙටි අවවාදයකින් අවවාද කරන ලද්දාවූ යම් ඒ දීඝාවූ නම් උපාසකයෙක් වූයේද, හෙතෙම කළුරිය කෙළේය. ඔහුට කිනම් ගතියක්වීද පරලොව කුමක්ද?" යනුයි.

12. "මහණෙනි, දීඝාවූ උපාසකතෙම පණ්ඩිතයෙක් විය. ලොකොත්තර ධර්මයට අනුකූල ධර්මයෙහි පිළිපැද්දේය. ධර්මාවබොධය කරුණුකොට මා නොවෙහෙසවිය. දීඝාවූ උපාසකතෙම ඔරම්භාගීය සංයොජන පස ක්ෂය කිරීමෙන් ඒ බඹලොව පිරිනිවෙන්නාවූ ඒ ලෝකයෙන් නැවත ආපසු නොඑන්නාවූ ඔපපාතිකයෙක් වන්නේයයි' වදාළේය.

---

## 4. සාරිපුත්තානන්ද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් සාරිපුත්ත ස්ථවිර තෙමේද ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේද සැවැත් නුවර අනේපිඩු සිටුහුගේ ජේතවනාරාමයෙහි වාසය කෙරෙත්. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම සවස් කාලයෙහි විවේකස්ථානයෙන් නැගීසිටියේ ආයුෂ්මත් සාරිපුත්ත ස්ථවිර තෙමේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් සාරිපුත්ත ස්ථවිරයන් වහන්සේ හා සමග සතුටුවූයේය. සතුටු විය යුතු සිහිකටයුතු කථාව කොට අවසාන කර එක්පසෙක

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

හුන්නේය. එක්පසක හුන්නාවූ, ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම ආයුෂ්මත් සාරිපුත්ත ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය.

2. "ආයුෂ්මත් සාරිපුත්ත ස්ථවිරයන් වහන්ස, කවර ධර්මයන්ගෙන් යුක්තවීම හේතු කොට ගෙන, මෙසේ මේ ප්‍රජාව අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත් බවට නියතවූ රහත් බව පිහිට කොට ඇත්තාවූ සෝවාන් වූවෝයයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දාහුද?"

"ඇවැත්නි, ධර්ම සතරකින් යුක්තවීමේ හේතුවෙන් මෙසේ මේ ප්‍රජාව අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත්බව නියතවූ රහත්බව පිහිටකොට ඇත්තාවූ සෝවාන් වූවෝයයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදහ.

3. (මේ ඡේදය මේ වර්ගයේ 3 සූත්‍රයේ 5 වෙනි ඡේදය මෙනි.)

4. "ඇවැත්නි, මේ ධර්ම සතරින් යුක්තවීම හේතුකොට ගෙන මෙසේ මේ ප්‍රජාව අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත්බවට නියතවූ රහත්බවට පිහිටකොට ඇත්තාවූ සෝවාන්වූවෝයයි' භාග්‍යවතුන්වහන්සේ විසින් වදාරණලදහ.

---

## 5. සොතාපත්තියංග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

ඉක්බිති ආයුෂ්මත් සාරිපුත්ත ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක් පසක

හුන්නාවූ ආයුෂ්මත් සාරිපුත්ත ස්ථවිරයන්හට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "සාරිපුත්තය, සොතාපත්ති අංගය, ශොතාපත්ති අංගයයි කියනු ලැබේ. සාරිපුත්තය, සොතාපත්ති අංගය වනාහි කවරක්ද?"

3. "ස්වාමීනි, සත්පුරුෂයන් සේවනය කිරීම වනාහි සොතාපත්ති අංගයකි ධර්මශ්‍රවණය සොතාපත්ති අංගයකි. නුවණින් මෙනෙහි කිරීම සොතාපත්ති අංගයකි. ලොකොත්තර ධර්මයට අනුව පිළිපැදීම සොතාපත්ති අංගයකියි'

4. "සාධු! සාධු!! සාරිපුත්තය, සාරිපුත්තය, සත්පුරුෂයන් සේවනය කිරීම වනාහි සොතාපත්ති අංගයකි. ධර්ම ශ්‍රවණය කිරීම වනාහි සොතාපත්ති අංගයකි. නුවණින් මෙනෙහි කිරීම සොතාපත්ති අංගයකි. ලොකොත්තර ධර්මයට අනුව පිළිපැදීම සොතාපත්ති අංගයකි. සාරිපුත්තය, සොතය-සොතයයි කියනු ලැබේ. සාරිපුත්තය, සොතය නම් කවරේද"?

5. "ස්වාමීනි, මේ ආය්‍යී අෂ්ඨාංගික මාර්ගයම සොතය නමි. හේ කවරේද? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධියයි.

6. "සාධු! සාධු!! සාරිපුත්තය සාරිපුත්තය, මේ ආය්‍යී අෂ්ටාංගික මාර්ගයම ශ්‍රොතය නමි. හේ කවරේද? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය, සම්‍යක් සමාධියයි.

"සාරිපුත්තය, සොතාපන්නය, සොතාපන්නයයි කියනු ලැබේ. සාරිපුත්තය සොතාපන්න තෙම කවරේද?"

7. "ස්වාමීනි, යමෙක් මේ ආය්‍යී අෂ්ටාංගික මාර්ගයෙන් යුක්තවූයේද මෙතෙමේ සොතාපන්නයයි කියනු ලැබේ. ඒ ආයුෂ්මත් තෙමේ මෙනම් ඇත්තේය. මෙනම් ගොත්‍ර ඇත්තේය."

8. "සාධූ! සාධූ! සාරිපුත්තය, සාරිපුත්තය යමෙක් මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයෙන් යුක්තවූයේද හෙතෙමේ සොතාපන්නයයි කියනු ලැබේ. ඒ ආයුෂ්මත් තෙමේ මෙනම් ඇත්තේය. මෙනම් ගොත්‍ර ඇත්තේයයි' වදාළේය.

---

## 6. ඉසිදත්ත පුරාණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එසමයෙහි වනාහි බොහෝ භික්ෂූහු මසා කටයුතු නිමකරන ලද සිවුර ඇති භාග්‍යවතුන් වහන්සේ මාස තුනකින් පසු චාරිකාවෙහි වඩින්නේයයි භාග්‍යවතුන්වහන්සේගේ සිවුරෙහි වැඩ කෙරෙත්.

2. "එසමයෙහි වනාහි ඉසිදත්ත සහ පුරාණ යන ගෘහපති දෙදෙන කිසියම් කරුණක් නිසා සාධුකයෙහි වෙසෙත්. ඉසිදත්ත සහ පුරාණ යන ගෘහපති දෙදෙන වනාහි නිමකරන සිවුර ඇති භාග්‍යවතුන් වහන්සේ මාස තුනකින් පසු චාරිකාවෙහි වඩින්නේයයි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේගේ සිවුරෙහි වැඩ කෙරෙත්' (යන මේ කථාව) ඇසුවාය.

3. ඉක්බිති ඉසිදත්ත, පුරාණ ගෘහපති යන දෙදෙන මාර්ගයෙහි මිනිසෙකු තැබ්බවූහ 'පින්වත් පුරුෂය, වඩින්නාවූ අර්හත් සම්‍යක් සම්බුද්ධ භාග්‍යවතුන් වහන්සේ යම් කලක නුඹ දකින්නෙහිද, එවිට අපට දැනුම් දෙව' කියායි. දෙතුන් දිනක් සිටියාවූ ඒ පුරුෂ තෙම වනාහි වඩින්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුරදීම දැක්කේය. දැක ඉසිදත්ත පුරාණ යන ගෘහපති දෙදෙන යම් තැනෙක්හිද, එතැන්හි ගියේය. ගොස් ඉසිදත්ත පුරාණ යන ගෘහපති දෙදෙනාහට මෙය කීයේය. "ස්වාමීනි, ඒ මේ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ, භාග්‍යවතුන් වහන්සේ වඩිනසේක. එයට සුදුසු කාලය දැනගන්න" කියායි.

4. ඉක්බිති ඉසිදත්ත-පුරාණ යන ගෘහපති දෙදෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ භාග්‍යවතුන් වහන්සේගේ පසුපස ලුහුබැන්දාහුය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මගින්

ඉවත්වී, එක්තරා රුක්මුලක් යම්තැනෙක්හිද එතැන්හි වැඩියේය. වැඩ, පණවන ලද ආසනයෙහි වැඩහුන්සේක. ඉසිදත්ත, පුරාණ යන ගෘහපති දෙදෙනත් භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නාහුය. එක්පසෙක හුන් ඉසිදත්ත පුරාණ නම් ගෘහපති දෙදෙන භාග්‍යවතුන් වහන්සේට මෙය කීවාහුය.

**5.** "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවරින් නික්ම කොසොල් රට චාරිකාවෙහි වඩිනසේකැයි යම් කලක අපි අසමුද එකල්හි භාග්‍යවතුන් වහන්සේ අපගෙන් ඈත්වෙන සේකැයි අපට නොසතුටු බව ඇතිවෙයි. දොම්නස ඇති වෙයි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවරින් නික්ම කොසොල් රට චාරිකාවෙහි වැඩියාහුයයි යම් කලක අපි අසමුද එකල්හි අපට භාග්‍යවතුන් වහන්සේ අපගෙන් ඈත්වුණු සේකැයි අපට නොසතුටු බව ඇතිවෙයි. දොම්නස ඇති වෙයි.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කොසොල් රටින් නික්ම මල්ල රට චාරිකාවෙහි වඩිනසේකැයි යම් කලක අපි අසමුද, එකල්හි භාග්‍යවතුන් වහන්සේ අපගෙන් ඈත්වෙනසේකැයි අපට නොසතුට ඇතිවෙයි. දොම්නස ඇතිවෙයි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කොසොල් රටින් නික්ම මල්ල රට චාරිකාවෙහි වැඩිසේකැයි යම් කලක අපි අසමුද, එකල්හි භාග්‍යවතුන් වහන්සේ අපගෙන් ඈත්වුණු සේකැයි අපට නොසතුට ඇතිවෙයි. දොම්නස ඇතිවෙයි.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මල්ල රටින් නික්ම වැදෑරට චාරිකාවෙහි වඩිනසේකැයි යම් කලක අපි අසමුද, එකල්හි භාග්‍යවතුන් වහන්සේ අපගෙන් ඈත්වනසේකැයි අපට නොසතුටු බව ඇතිවෙයි. දොම්නස ඇතිවෙයි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මල්ල රටින් නික්ම වැදෑරට චාරිකාවෙහි වඩිනසේකැයි යම් කලක අපි අසමුද, එකල්හි භාග්‍යවතුන් වහන්සේ අපගෙන් ඈත්වූසේකැයි අපට නොසතුටු බව ඇතිවෙයි දොම්නස ඇතිවෙයි.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ වැදෑරටින් නික්ම කසී රට චාරිකාවෙහි වඩිනසේකැයි යම් කලක අපි අසමුද, එකල්හි

භාග්‍යවතුන් වහන්සේ අපගෙන් ඈත්වන සේකැයි අපට නොසතුටු බව ඇතිවෙයි. දොම්නස ඇතිවෙයි.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ වැදෑරටින් නික්ම කසී රට චාරිකාවෙහි වැඩිසේකැයි යම් කලක අපි අසමුද, එකල්හි භාග්‍යවතුන් වහන්සේ අපගෙන් ඈත්වූසේකැයි අපට නොසතුටු බව ඇතිවෙයි. දොම්නස හටගනියි.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කසීරටින් නික්ම මගධ රට චාරිකාවෙහි වඩිනසේකැයි යම් කලක අපි අසමුද, එකල්හි භාග්‍යවතුන් වහන්සේ අපගෙන් ඈත්වනසේකැයි අපට නොසතුටු බව ඇතිවෙයි. දොම්නස ඇතිවෙයි.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කසීරටින් නික්ම වජ්ජීන්ගේ නුවර චාරිකාවෙහි වඩිනසේකැයි යම් කලක අපි අසමුද, එකල්හි භාග්‍යවතුන් වහන්සේ අපට ඈත්වූසේකැයි අපේ කලකිරීම ඇතිවෙයි. නොසතුට ඇතිවෙයි.

**6.** "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මගධ රටින් නික්ම කසී රට චාරිකාවෙහි වඩිනසේකැයි යම් කලක අපි අසමුද, එකල්හි භාග්‍යවතුන් වහන්සේ අපට ළංවෙන සේකැයි අපට සතුට උපදියි. සොම්නස පහළවෙයි.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මගධ රටින් නික්ම කසීරට චාරිකාවෙහි වැඩිසේකැයි යම් කලක අපි අසමුද, එකල්හි භාග්‍යවතුන් වහන්සේ අපට ළංවූ සේකැයි සතුට උපදියි සොම්නස් ඇතිවෙයි.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කසීරටින් නික්ම වැදෑරට චාරිකාවෙහි වැඩිසේකැයි යම් කලක අපි අසමුද එකල්හි භාග්‍යවතුන් වහන්සේ අපට ළංවූසේකැයි සතුට උපදියි සොම්නස් ඇතිවෙයි.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ වැදෑරටින් නික්ම මල්ල රට චාරිකාවෙහි වැඩිසේකැයි යම් කලක අපි අසමුද, එකල්හි භාග්‍යවතුන් වහන්සේ අපට ළංවූ සේකැයි සතුට උපදියි. සොම්නස් ඇතිවෙයි.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මල්ලරටින් නික්ම කොසොල් රට චාරිකාවෙහි වැඩිසේකැයි යම් කලක අපි අසමුද, එකල්හි භාග්‍යවතුන් වහන්සේ අපට ළංවූසේකැයි සතුට උපදියි. සොම්නස් ඇතිවෙයි.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කොසොල් රටින් නික්ම සැවැත් නුවර චාරිකාවෙහි වැඩිසේකැයි යම් කලක අපි අසමුද, එකල්හි භාග්‍යවතුන් වහන්සේ අපට ළංවූසේකැයි සතුට උපදියි. සොම්නස් ඇතිවෙයි.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේකැයි යම් කලක අපි අසමුද, එකල්හි භාග්‍යවතුන් වහන්සේ අපට ළංවූසේකැයි මහත් සතුටක් උපදියි. මහත් සොම්නසක් පහළවෙයි."

7. "එසේනම් ගෘහපතියෙනි, කෙලෙසුන්ට ස්ථානවූ ගිහිගෙයි විසීම කරදර සහිතය. පැවිදිබව නිදහස්ය. ගෘහපතියෙනි, තොප විසින් අප්‍රමාදවීම සුදුසුයි" වදාළේය.

8. "ස්වාමීනි, අපට මීට වඩා ඉතා මහත්වූ ඉතා අධිකවූ විශෙෂයෙන් අධිකවූ කරදරයක් ඇත්තේය."

"ගෘහපතියෙනි, මීට වඩා ඉතා මහත්වූ ඉතා අධිකවූ විශෙෂයෙන් අධිකවූ කරදරය කුමක්ද?"

9. "ස්වාමීනි, මෙහි අපි යම් කලක පසේනදී කොසොල් රජතෙම උයනට පැමිණෙනු කැමති වෙයිද, (එකල්හි) පසේනදී කොසොල් රජුට නැගීමට සුදුසුවූ යම් ඒ ඇත්තු වෙත්ද, ඔවුන් සරසා, පසේනදී කොසොල් රජුට ප්‍රියවූ, මනාපවූ, යම් ඒ බිසෝවරු වෙත්ද ඒ බිසෝවරුන් ගෙන් එක් බිසවක් ඉදිරියෙන්ද එක් බිසවක් පස්සෙන්ද හිඳුවමු.

"ස්වාමීනි, ඒ නැගෙනියන්ගේ වනාහි මෙවැනි වූ සුවඳ ඇත්තේ වෙයි. යම් ඒ රජවරුන්හට සුදුසු වූ සුගන්ධයෙන් අලංකාරවූ සුවඳ පෙට්ටියක් ඇරී කෙණෙහි යම් සේද එමෙනි.

ස්වාමීනි, ඒ නැගෙනියන්ගේ වනාහි මෙවැනි වූ කායස්පර්ශය ඇත්තේ වෙයි.

"ඉඹුල් පුළුන් හෝ කපු පුළුන් යම්සේද සැපසේ වැඩුනාවූ ඒ රාජකන්‍යාවන්ගේ ස්පර්ශයද, එමෙනි ස්වාමීනි, එකල්හි වනාහි ඇතාද රැකිය යුත්තේ වෙයි. ඒ නැගෙනිවරුද රැකිය යුත්තෝ වෙත්. තමා ද රැකියයුතු වෙයි. ස්වාමීනි, අපි වනාහි ඒ නැගනියන් කෙරෙහි පාප සිතක් ඉපදවූ බවක් නොදනිමු. ස්වාමීනි, මෙය වනාහි අපට මීට වඩා මහත්වූද, අධිකවූද විශෙෂයෙන් අධිකවූද, කරදරය වන්නේයයි" කීහ.

10. "ගෘහපතියෙනි, එසේනම් කෙලෙස් උපදින ස්ථානයවූ ගිහිගෙයි විසීම කරදර සහිතය. පැවිදි බව නිදහස්ය. ගෘහපතියෙනි, තොප විසින් අප්‍රමාදවීමට සුදුසුයි" වදාළේය.

11. "ගෘහපතියෙනි, ධර්ම සතරකින් යුක්තවූ ආර්‍ය්‍යශ්‍රාවක තෙම වනාහි අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත් බවට නියතවූ රහත්බව පිහිටකොට ඇත්තාවූ නිවන පිහිට කොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයෙක් වෙයි. කවරසතරකින්ද?

"ගෘහපතියෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම බුදුරජාණන්වහන්සේ කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්ත වූවාහුය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අර්හත්යහ. සම්‍යක් සම්බුද්ධයහ. විජ්ජාචරණ සම්පන්නයහ. සුගතයහ ලොකවිදූහ. පුරුෂයන් දමනය කිරීමෙහි අති උතුම් රියැදුරෙකු හා සමානය. දෙව් මිනිසුන්ගේ ශාස්තෲහ. චතුරාර්‍ය්‍යසත්‍යය අවබොධ කළසේක. භාග්‍යවත්හ කියායි.

"ධර්මය කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්ත වූවාහුය. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට දේශනා කරන ලද්දේය. මේ ආත්මයෙහි දෙන ඵල ඇත්තේය. කල් නොයවා විපාක දෙන්නේය. එව, බලවයි, පෙන්විය හැකි ගුණ ඇත්තේය. තමන් තුළ එළවා වැඩියයුතු ගුණයෙන් යුක්ත වූයේය. නුවණැත්තන් විසින් වෙන වෙනම දතයුත්තේය, කියායි.

"සංඝයා කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූවාහුය. භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවක සංඝතෙම ශාසන ප්‍රතිපත්තියෙහි

මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය. නිවනට සුදුසුව පිළිපන්නේය. ගරුබුහුමනට යොග්‍යව පිළිපන්නේය යම් මේ පුරිසයුග සතරක් වෙත්ද, පුද්ගලයන් අටදෙනෙක්වෙත්ද, ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන් උදෙසා පිළියෙළ කළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. කම්පල අදහාදෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසුවූ සේක. ඇඳිලි කිරීමට (වැඳීමට) සුදුසු වූයේය. ලොකයාගේ උතුම් පිංකුඹුරය, කියායි

'පහවූ මසුරුමල ඇති අතින් මුදන ලද ත්‍යාග ඇත්තෙක්ව සෝදන ලද අත් ඇත්තාවූ ත්‍යාගයෙහි ඇළුනෙක්ව යාචකයන් කෙරෙහි දීමෙහි යෙදුනෙක්ව දන් බෙදා දීමෙහි නිරතවූවෙක්ව ගිහි ගෙයි වාසය කෙරේද,

"ගෘහපතියෙනි, මේ සතර ධර්මයන්ගෙන් යුක්තවූ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම වනාහි අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත්බව නියතවූ රහත්බව පිහිටකොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයෙක් වෙයි.

12. "ගෘහපතියෙනි, තොපි වනාහි බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචලප්‍රසාදයෙන් යුක්තවූවාහුය, මෙසේ භාග්‍යවතුන් වහන්සේ අර්හත්හ. සම්‍යක් සම්බුද්ධයහ. විජ්ජාචරණ සම්පන්නයහ. සුගතයහ. ලෝකවිදූහ පුරුෂයන් දමනය කිරීමෙහි අති උතුම් රියැදුරෙකු හා සමානයහ. දෙවි මිනිසුන්ගේ ශාස්තෲහ. චතුරාර්‍ය්‍යසත්‍යය අවබොධ කළසේක. භාග්‍යවත්හ කියායි.

"ධර්මයන් කෙරෙහි අචලප්‍රසාදයෙන් යුක්තවූවාහුය, භාග්‍යවතුන්වහන්සේ විසින් ධර්මය මනාකොට දේශනා කරන ලද්දේය මේ ආත්මයෙහි දෙන ඵල ඇත්තේය. කල් නොයවා විපාක දෙන්නේය. එව බලවයි, පෙන්විය හැකි ගුණ ඇත්තේය. තමන්තුළ එළවා වැඩිය යුතු ගුණයෙන් යුක්ත වූයේය. නුවණැත්තන් විසින් වෙන වෙනම දත යුත්තේය, කියායි.

"සංඝයා කෙරෙහි අචලප්‍රසාදයෙන් යුක්තවූවාහුය. භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවක සංඝතෙම ශාසන ප්‍රතිපත්තියෙහි මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය. නිවනට සුදුසුව

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පිළිපන්නේය ගරු බුහුමනට යොග්‍යව පිළිපන්නේය. යම් මේ පුරිසයුග සතරක් වෙත්ද, පුද්ගලයන් අටදෙනෙක් වෙත්ද, මේ ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන් උදෙසා පිළියෙළ කළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. කම්පල අදහා දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසුවූ සේක. ඇදිලි කිරීමට (වැඳීමට) සුදුසු වූයේය. ලොකයාගේ උතුම් පිංකුඹුරය, කියායි.

"ගෘහපතියෙනි, ඒ කිමැයි හඟින්නෙහුද? කල්‍යාණ ධර්මයන්ගෙන් යුක්තවූ සීලවන්තයන් කෙරෙහි නොබෙදා දෙන ලද සියලු වස්තුව ඇති යම්කිසි කුලයයෝ වෙද්ද, කොසොල් රට යම් ඒ මිනිස්සු වෙත්ද, ඔවුහු කෙසේ දන් දීමෙන් තොප හා සමාන වෙත්ද?

13. "ස්වාමීනි, අපට ලාභයකි. ස්වාමීනි, අපට මනා ලාභයකි. යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේ අප මෙසේ දන්නා සේක්ද එහෙයිනියි" කීය.

---

## 7. වෙළුද්වාර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසොල් නුවර චාරිකාවෙහි හැසිරෙනසේක් මහත්වූ භික්ෂු සංඝයා සමග කොසොල් රට වෙළුද්වාර නම් බමුණුගම යම් තැනෙක්හිද, එතැනට වැඩිසේක. වෙළුද්වාර ගම්වාසී බ්‍රාහ්මණ ගෘහපතියෝ ශාක්‍යපුත්‍රවූ ශාක්‍යකුලයෙන් පැවිදිවූ, ශ්‍රමණ භවත් ගෞතමතෙම මහත්වූ භික්ෂු සංඝයා සමග කොසොල්රට චාරිකාවෙහි වඩින්නේ වෙළුද්වාර ගමට පැමිණියේයයි ඇසුවාහුය.

2. ඒ භවත් ගෞතමයන් වහන්සේගේ මෙවැනි යහපත් වූ කීර්ති ඝෝෂාවක් උස්ව පැනනැංගේය. ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේ අර්හත් වනසේක. සම්‍යක් සම්බුද්ධයහ. විජ්ජාචරණ සම්පන්නයහ. සුගතයහ. ලෝකවිදූහ. පුරුෂයන් දමනය කිරීමෙහි තමහට වඩා උතුම් කෙනෙක් නැතියහ. දෙව්මිනිසුන්හට ශාස්තෘෘ

වනසේක. බුද්ධයහ. භාග්‍යවත් වන සේක. උන්වහන්සේ දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත, මහණ බමුණන් සහිත, දෙව්මිනිසුන් සහිත මේ සත්ව ප්‍රජාව තෙමේම දැන, ප්‍රත්‍යක්ෂකොට දෙශනා කරනසේක. උන්වහන්සේ මුල යහපත් වූ, මැද යහපත් වූ, අග යහපත්වූ අර්ථ සහිතවූ ව්‍යඤ්ජන සහිතවූ, ධර්මය දෙශනා කරනසේක. මුළුමනින් සම්පූර්ණවූ, පිරිසිදුවූ බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කරනසේක. එවැනි රහතුන්ගේ දැකීම වනාහි යහපත් වේයයි සිතූහ.

3. ඉක්බිති වෙළුද්වාර ගම්වාසී බ්‍රාහ්මණ ගෘහපතියෝ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියාහුය පැමිණ ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්හ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටු වූවාහුය. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එක් පසෙක හුන්නාහුය. ඇතැම්කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ දෙසට ඇඳිලිබැඳ හිඳගත්හ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි (තමන්ගේ) නම් ගොත් කියා එක්පසෙක හුන්නාහුය. ඇතැම් කෙනෙක් නිශ්ශබ්දව එක් පසෙක හුන්නාහුය. එක්පසෙක හුන්නාවූ වෙළුද්වාර ගම්වාසී බ්‍රාහ්මණ ගෘහපතියෝ භාග්‍යවතුන් වහන්සේට මෙය කීවාහුය.

4. "භවත් ගෞතමයන් වහන්ස, අපි ගිහිගෙයි වෙසෙන්නෙමු. කසීසලු සහ සඳුන්සුවඳ පරිභොග කරන්නෙමු මල් ගඳ විලවුන් දරන්නෙමු. රන් රිදී මසු කහවණු ඉවසන්නෙමු. (ඒ අපි) කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගතිඇති ස්වර්ගලෝකයෙහි උපදින්නෙමු යන කැමැත්ත ඇත්තෝ ඡන්දය ඇත්තෝ, අභිප්‍රාය ඇත්තෝ වෙමු. මෙසේ කැමැත්තා වූ, මෙසේ ඡන්දය ඇත්තාවූ මෙසේ අභිප්‍රාය ඇත්තාවූ ඒ අපට යම් සේ ගිහිගෙයින් වසන්නෙමුද, කසීසලු සහ සඳුන් සුවඳත් පරිභොග කරන්නෙමුද, මල් ගඳ විලවුනුත් දරන්නෙමුද, රන්රිදී මසු කහවණුත් ඉවසන්නෙමුද, කයබිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලෝකයෙහිත් උපදින්නෙමුද එවැනි ධර්මයක් අපට දෙශනාකරන සේක්වා."

5. "ගෘහපතියෙනි, තොපට තමා කෙරෙහි පමුණුවා දතයුතු ධර්ම ක්‍රමයක් දෙශනා කරන්නෙමි එය අසව්. මනා කොට මෙනෙහි කරව්. දෙසනා කරන්නෙමි."-"එසේය, පින්වතුන් වහන්සැයි" වෙළුද්වාර ගම්වැසි බ්‍රාහ්මණ ගෘහපතියෝ භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නාහුය. භාග්‍යවතුන් වහන්සේ මෙය දෙශනා කළසේක.

6. "ගෘහපතියෙනි, තමා කෙරෙහි පමුණුවා දැනගතයුතු ධර්ම ක්‍රමය කවරේද? ගෘහපතියෙනි, මේ ශාසනයෙහි ආය්‍ය්‍යී ශ්‍රාවකතෙම මෙසේ සිතයි. 'මම වනාහි ජීවත්වෙනු කැමැත්තේ, නො මැරෙනු කැමැත්තේ, සැප කැමැත්තේ වෙමි' දුක් පිළිකුල් කරන්නෙමි.

'යමෙක් වනාහි ජීවත්වෙනු කැමති, නොමැරෙනු කැමති, සැප කැමති දුක් පිළිකුල් කරන මා ජීවිතයෙන් තොර කරන්නේද, එය මට අප්‍රිය වෙයි. මනාප නොවෙයි. මම ජීවත්වෙනු කැමැත්තාවූ, නොමැරෙනු කැමැත්තාවූ, සැප කැමැත්තාවූ, දුක් පිළිකුල් කරන්නාවූ, අන්‍යයෙකු ජීවිතයෙන් තොර කරන්නෙම්ද, අන්‍යයාටත් එය අප්‍රිය වෙයි අමනාපවෙයි. යම් මේ ධර්මයක් තෙම මට අප්‍රිය අමනාපවේද, එය අනුන්ටත් ඒ ධර්මය අප්‍රිය වෙයි. අමනාප වෙයි. යම් මේ ධර්මයක් වනාහි මට අප්‍රියවේද, අමනාපවේද, කෙසේ මම අනිකෙකු ඒ හා සම්බන්ධ කෙරෙම්ද' යනුවෙනි. හෙතෙම මෙසේ සලකා තමාද ප්‍රාණඝාතයෙන් වෙන්වූයේ වෙයි. අනුන්ද ප්‍රාණඝාතයෙන් වෙන්වීමෙහි සමාදන් කරවයි. ප්‍රාණඝාතයෙන් වෙන්වීමෙහි ගුණද කියයි. මෙසේ ඔහුගේ මේ කායික පැවැත්ම තුන් ආකාරයකින් පිරිසිදු වූයේ වෙයි.

7. "නැවතද ගෘහපතියෙනි, ආය්‍ය්‍යී ශ්‍රාවකතෙම මෙසේ කල්පනා කෙරෙයි. 'යමෙක් වනාහි මා සතු නුදුන් දෙයක් සොරෙන් පැහැර ගනීද, එය මට ප්‍රිය නොවෙයි. මනාප නොවෙයි. මමද අන්සතු නුදුන් දෙයක් සොරෙන් පැහැර ගන්නෙම්ද, එය අනුන්හටද ප්‍රිය නොවෙයි. මනාප නොවෙයි. යම් මේ ධර්මයක් වනාහි මට අප්‍රිය වෙයිද, අමනාප වෙයිද, අනුන්ටත් ඒ ධර්මය අප්‍රිය වෙයි. අමනාප වෙයි. යම් මේ ධර්මයක්

වනාහි මට අප්‍රියවේද, අමනාප වෙයිද, මම කෙසේ අනිකකු ඒ හා සම්බන්ධ කෙරෙම්ද?' යනුවෙනි. හෙතෙම මෙසේ සලකා තමාද හොරකමින් වැලකුණේ වෙයි. අනුන්ද හොරකමින් වැලකීමෙහි සමාදන් කරවයි. හොරකමින් වෙන්වීමෙහි ගුණද කියයි. ඔහුගේ මේ කාය සමාචාරය මෙසේ තුන් ආකාරයකින් පිරිසිදු වූයේ වෙයි.

8. "නැවතද ගෘහපතියෙනි, ආයර්‍ය්‍යශ්‍රාවකතෙම මෙසේ කල්පනා කෙරෙයි. 'යමෙක් වනාහි මාගේ ස්ත්‍රීන් කෙරෙහි හැසිරීමට පැමිණෙන්නේද, එය මට ප්‍රිය නොවෙයි. මනාප නොවෙයි. මමද අනුන්ගේ ස්ත්‍රීන් කෙරෙහි හැසිරෙන්නෙම්ද එය අනුන්ටත් ප්‍රිය නොවේ. මනාප නොවේ. යම් මේ ධර්මයක් මට අප්‍රියද අමනාපද ඒ ධර්මය වනාහි අනුන්ටත් අප්‍රිය වෙයි. අමනාප වෙයි. යම් මේ ධර්මයක් වනාහි මට අප්‍රියවේද අමනාප වේද, මම කෙසේ අනිකෙකු ඒ හා සම්බන්ධ කෙරෙම්ද?" කියායි. හෙතෙම මෙසේ සලකා, තෙමේද කාමයන්හි වරදවා හැසිරීමෙන් වැලකුණේ වෙයි. අනුන්ද කාමයන්හි වරදවා හැසිරීමෙන් වැලකීමෙහි සමාදන් කරවයි. කාමයන්හි වරදවා හැසිරීමෙන් වැලකීමෙහි ගුණද කියයි. ඔහුගේ මේ කාය සමාචාරය මෙසේ තුන් ආකාරයකින් පිරිසිදු වූයේ වෙයි.

9. "නැවතද ගෘහපතියෙනි, ආයර්‍ය්‍යශ්‍රාවක තෙම මෙසේ කල්පනා කෙරෙයි. 'යමෙක් වනාහි බොරු කීමෙන් මාගේ අර්ථය බිඳින්නේද, එය මට ප්‍රිය නොවෙයි. මනාප නොවෙයි. මමද අනුන්ගේ අර්ථය බොරු කීමෙන් බිඳින්නෙම්ද, එය අනුන්ටත් අප්‍රිය වෙයි. අමනාප වෙයි. යම් මේ ධර්මයක් මට අප්‍රියවේද, අමනාප වේද, ඒ ධර්මය අනුන්ටත් අප්‍රිය වෙයි. අමනාප වෙයි. යම් මේ ධර්මයක් වනාහි මට අප්‍රියද අමනාපද මම කෙසේ අනිකෙකු ඒ හා සම්බන්ධ කෙරෙම්ද?' යනුවෙනි. හෙතෙම මෙසේ කල්පනා කොට, තමාද බොරුකීමෙන් වෙන්වූයේ වෙයි. අනුන්ද බොරු කීමෙන් වෙන්වීමෙහි සමාදන් කරවයි. බොරු කීමෙන් වෙන් වීමෙහි ගුණද කියයි. ඔහුගේ වචනයේ පැවැත්ම මෙසේ තුන්ආකාරයකින් පිරිසිදුවූයේ වෙයි.

10. "නැවතද ගෘහපතියෙනි, ආයාර්‍ය්‍යශ්‍රාවක තෙම මෙසේ කල්පනා කෙරෙයි. 'යමෙක් වනාහි කේලාම් කියා මාගේ මිතුරන් බිඳින්නේද එය මට ප්‍රිය නොවෙයි. මනාප නොවෙයි. මමද කේලාම් කියා අනුන්ගේ මිතුරන් බිඳින්නෙම් නම් එය අනුන්ටද ප්‍රිය නොවෙයි. මනාප නොවෙයි. යම් මේ ධර්මයක් වනාහි මට අප්‍රියද අමනාපද ඒ ධර්මය අනුන්ටත් අප්‍රියවෙයි. අමනාප වෙයි. යම් මේ ධර්මයක් වනාහි මට අප්‍රියද අමනාපද මම අනිකෙකු කෙසේ ඒ හා සම්බන්ධ කරන්නෙම්ද?" යනුවෙනි. හෙතෙම මෙසේ කල්පනා කොට, තමාද කේලාම් කීමෙන් වෙන්වූයේ වෙයි. අනුන්ද කේලාම් කීමෙන් වෙන්වීමෙහි සමාදන් කරවයි. කේලාම් කීමෙන් වෙන්වීමෙහි ගුණද කියයි. මෙසේ ඔහුගේ වචනයේ පැවැත්ම තුන්ආකාරයකින් පිරිසිදුවූයේ වෙයි.

11. "නැවතද ගෘහපතියෙනි, ආයාර්‍ය්‍යශ්‍රාවක තෙම මෙසේ කල්පනා කෙරෙයි. 'යමෙක් වනාහි මට ඵරුස වචනයෙන් ගටා බණින්නේද එය මට ප්‍රිය නොවේ. මනාප නොවේ. මමද ඵරුස බසින් අනුන්ට ගටා බණින්නෙම් නම් එය අනුන්ටද ප්‍රිය නොවේ මනාප නොවේ. යම් මේ ධර්මයක් වනාහි මට අප්‍රියද අමනාපද ඒ ධර්මය අනුන්ටත් අප්‍රිය වෙයි. අමනාප වෙයි. යම් මේ ධර්මයක් වනාහි මට අප්‍රියද අමනාපද මම අනිකකු ඒහා කෙසේ සම්බන්ධ කරවන්නෙම්ද?' කියායි. හෙතෙම මෙසේ කල්පනාකොට තමාද ඵරුස වචනයෙන් වෙන්වූයේ වෙයි. අනුන්ද ඵරුස වචනයෙන් වෙන්වීමෙහි සමාදන් කරවයි ඵරුස වචනයෙන් වෙන්වීමෙහි ගුණද කියයි. මෙසේ ඔහුගේ වචනයේ පැවැත්ම තුන්ආකාරයකින් පිරිසිදුවූයේ වෙයි.

12. "නැවතද ගෘහපතියෙනි, ආයාර්‍ය්‍යශ්‍රාවක තෙමේ මෙසේ කල්පනා කෙරෙයි. 'යමෙක් වනාහි මට හිස් වචන කියන්නේද එය මට ප්‍රිය නොවෙයි. මනාප නොවෙයි. මමද අනුන්ට හිස්වචන කියන්නෙම් නම් එය අනුන්ටද ප්‍රියනොවේ මනාප නොවෙයි. යම් මේ ධර්මයක් වනාහි මට අප්‍රියද අමනාපද ඒ ධර්මය අනුන්ටත් අප්‍රිය වෙයි, අමනාප වෙයි. යම් මේ ධර්මයක් වනාහි මට අප්‍රියද අමනාපද මම එහි අනිකකු කෙසේ සම්බන්ධ

කරවන්නෙම්ද? කියායි. හෙතෙම මෙසේ කල්පනාකොට තමාද හිස් වචන කීමෙන් වෙන්වූයේ වෙයි. අනුන්ද හිස් වචන කීමෙන් වෙන්වීමෙහි සමාදන් කරවයි. හිස් වචන කීමෙන් වෙන්වීමෙහි ගුණද කියයි මෙසේ ඔහුගේ වචනයේ පැවැත්ම තුන් ආකාරයකින් පිරිසිදුවූයේ වෙයි.

13. "හෙතෙම බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූවාහුය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ, විජ්ජාචරණ සම්පන්නයහ, සුගතයහ, ලොකවිදූහ, පුරුෂයන් දමනය කිරීමෙහි අති උතුම් රියැදුරෙකු හා සමානයහ, දෙවිමිනිසුන්ගේ ශාස්තෘහ, චතුරාර්‍ය්‍යසත්‍යය අවබොධ කළසේක, භාග්‍යවත්හ කියායි.

"ධර්මය කෙරෙහි අචලප්‍රසාදයෙන් යුක්ත වූවාහුය. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට දේශනා කරන ලද්දේය. මේ ආත්මයෙහි දෙන ඵල ඇත්තේය. කල් නොයවා විපාක දෙන්නේය. එව බලවයි, පෙන්විය හැකිගුණ ඇත්තේය තමන් තුළ එළවා වැඩිය යුතු ගුණයෙන් යුක්ත වූයේය. නුවණැත්තන් විසින් වෙන වෙනම දත යුත්තේය කියායි.

"සංඝයා කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්ත වූවාහුය. භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම ශාසන ප්‍රතිත්තියෙහි මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය. නිවනට සුදුසුව පිළිපන්නේය. ගරු බුහුමනට යොග්‍යව පිළිපන්නේය. යම් මේ පුරිසයුග සතරක් වෙත්ද, පුද්ගලයන් අටදෙනෙක් වෙත්ද, මේ ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන් උදෙසා පිළියෙළ කළ දෙය පිළිගැනීමට සුදුසු වූසේක. ඇඳිලි කිරීමට (වැඳීමට) සුදුසු වූයේය. ලොකයාගේ උතුම් පිං කුඹුරය, කියායි.

14. "ගෘහපතියෙනි, යම් තැනක සිට ආර්‍ය්‍යශ්‍රාවක තෙම වනාහි මේ ධර්ම සතෙන් යුක්ත වන්නේද හෙතෙම කැමතිවන්නේ මේ කැමැති වන්නාවූ කරුණු සතරින් තෙමේම තමහට ප්‍රකාශකරන්නේය කෙසේද? මම ක්ෂය කළ නිරය ඇත්තේ වෙමි. ක්ෂය කළ තිරිසන් අපාය ඇත්තේ වෙමි. ක්ෂය

කළ ප්‍රේතවිෂය ඇත්තේවෙමි. ක්ෂය කළ නපුරු ගති ඇති, විසම වැටීම් ඇති අපාය ඇත්තේ වෙමි. අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත් බව නියතවූ, රහත් බව පිහිට කොට සෝවාන්වූවෙක් වෙමි' කියායි.

15. මෙසේ වදාළ කල්හි වෙළුද්වාර ගම්වාසී බ්‍රාහ්මණ ගෘහපතියෝ භාග්‍යවතුන් වහන්සේට මෙය කීවාහුය. "භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපති, භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපති, භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිකුරු කරන ලද්දක් උඩුකුරු හෝ කෙරේද, සැඟවූවක් විවෘත හෝ කෙරේද මංමුළාවූවෙකුට මාර්ගය හෝ කියයිද, ඇස්ඇත්තෝ රූප දකිත්වායි, අන්ධකාරයෙහි තෙල් පහනක් හෝ දරාද, එපරිද්දෙන් භවත් ගෞතමයන්වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් ධර්මය දේශනා කරනලදී. ස්වාමීනි, අපද අද පටන් දිවිහිමියෙන් භාග්‍යවතුන් වහන්සේද ධර්මයද සංඝයාද සරණ යමු. භවත් ගෞතමයන් වහන්සේ දිවිහිම්කොට සරණ ගිය උපාසකයන් කොට අප දරණ සේක්වා."

---

## 8. ගිඤ්ජකාවසථ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ඤාතික නම් ගමෙහිවූ උළුගෙහි වැඩ වසනසේක. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය.

2. "ස්වාමීනි, සාළ්හ මහණතෙම කළුරිය කෙළේය. උන්වහන්සේගේ ගතිය කුමක්ද, පරලොව කුමක්ද, ස්වාමීනි, නන්දානම් මෙහෙණ කළුරිය කළාය. ඇගේ ගතිය කුමක්ද, පරලොව කුමක්ද? ස්වාමීනි, සුදත්ත නම් උපාසකතෙම කළුරිය කෙළේය. ඔහුගේ ගතිය කුමක්ද? පරලොව කුමක්ද, ස්වාමීනි,

සුජාතා නම් උපාසිකාව කළුරිය කළාය. ඇගේ ගතිය කුමක්ද? පරලොව කුමක්ද?" යනුයි

3. "ආනන්දය, කළුරිය කළ සාළ්හ මහණතෙම ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධිය හා අර්හත්ඵල ප්‍රඥාවත් මේ ආත්මයෙහිම තෙමේ දැන, ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ විසීය.

"ආනන්දය, කළුරිය කළාවූ නන්දා මෙහෙණ ඕරම්භාගිය සංයෝජන පස ක්ෂය කිරීමෙන් ඕපපාතිකවූවා, ඒ බ්‍රහ්ම ලෝකයෙන් නැවත නොඑන ස්වභාව ඇත්තී එහිදී පිරිනිවන් පාන්නීය.

"ආනන්දය, කළුරිය කළාවූ සුදත්ත ගෘහපතිතෙම ත්‍රිවිධ සංයෝජනයන් ක්ෂය කිරීමෙන් රාග ද්වෙෂ මෝහයන් තුනී කිරීමෙන් සකෘදාගාමීව එක් වරක් පමණක් මේ ලෝකයට අවුත් දුක් කෙළවර කරන්නේය.

"ආනන්දය, කාලක්‍රියා කළාවූ සුජාතා උපාසිකාතොමෝ ත්‍රිවිධ සංයෝජනයන් ක්ෂය කිරීමෙන් අපායෙහි නොවැටීම ස්වභාව කොට ඇත්තාවූ රහත්බවට මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් තැනැත්තියක් වූවාය.

4. "ආනන්දය, මිනිසෙකු මැරෙන්නේය යන මෙය පුදුමයක් නොවේ. ඉදින් ඒ ඒ මිනිසුන් මළ කල්හි මා කරා පැමිණ, මේ කරුණ අසන්නහුනම්, ආනන්දය, මේ ඇසීම තථාගතයන් වහන්සේට වෙහෙසක්ම වන්නේය. ආනන්දය, ඒ නිසා ධර්මාදාස (දහම් කැටපත) නම් ධර්ම ක්‍රමයක් දෙශනා කරන්නෙමි. එයින් යුක්තවූ ආය්‍යීශ්‍රාවකතෙම කැමතිවන්නේ නම් 'මම ක්ෂය කරනලද නිරය ඇත්තේ වෙමි. ක්ෂය කරන ලද තිරිසන් යෝනි ඇත්තේ වෙමි. ක්ෂය කරන ලද ප්‍රේත විෂය ඇත්තේ වෙමි. ක්ෂය කරන ලද විෂම වැටීම් ඇති දුර්ගති නම්වූ අපාය ඇත්තේ වෙමි. අපායෙහි වැටෙන ස්වභාවය නැත්තාවූ නියතවූ මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයෙක් වෙමැයි' තෙමේම තමහට කියන්නේය.

**5.** "ආනන්දය, යම් ධර්මයකින් යුක්තවූ ආර්‍යශ්‍රාවක තෙම වනාහි කැමැතිවන්නේ 'මම ක්ෂය කරන ලද නිරය ඇත්තේවෙමි. ක්ෂය කරන ලද තිරිසන් යෝනි ඇත්තේ වෙමි. ක්ෂය කරන ලද ප්‍රේත විෂය ඇත්තේ වෙමි. ක්ෂය කරන ලද විෂම වැටීම් ඇති දුර්ගති නම්වූ අපාය ඇත්තේවෙමි. අපායෙහි වැටෙන ස්වභාවය නැත්තාවූ, නියතවූ මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයෙක් වෙමියි තෙමේම තමහට ප්‍රකාශ කරන්නේද ඒ ධම්මාදාස නම්වූ ධර්මක්‍රමය කවරේද?

**6.** "ආනන්දය, මේ ශාසනයෙහි ආර්‍ය ශ්‍රාවකතෙම ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේත් අර්හත්වනසේක. සම්‍යක් සම්බුද්ධවන සේක. විජ්ජාචරණ සම්පන්නවන සේක. සුගතවන සේක ලෝකවිදූවන සේක. අනුත්තර පුරිසදම්මසාරථී වන සේක. දෙව්මිනිසුන්ගේ ශාස්තෘවන සේක. චතුස්සත්‍යය අවබොධකළ සේක. භාග්‍යවත්සේකැයි බුදුරජාණන්වහන්සේ කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයි.

'භාග්‍යවතුන්වහන්සේ විසින් ධර්මය මනාකොට දේශනා කරන ලද්දේය. මේ ආත්මයෙහි දෙන ඵල ඇත්තේය. කල් නොයවා විපාක දෙන්නේය. එව බලවයි, පෙන්විය හැකි ගුණ ඇත්තේය. තමන් තුළ එළවා වැඩිය යුතු ගුණයෙන් යුක්ත වූයේය. නුවණැත්තන් විසින් වෙන වෙනම දත යුත්තේයයි මෙසේ ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයි.

"භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම ශාසන ප්‍රතිපත්තියෙහි මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය. නිවනට සුදුසුව පිළිපන්නේය. ගරුබුහුමනට යොග්‍යව පිළිපන්නේය. යම් මේ පුරිසයුග සතරක් වෙත්ද, පුද්ගලයන් අටදෙනෙක් වෙත්ද, මේ ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන් උදෙසා පිළියෙලකළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. කම්පල අදහා දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසු වූසේක. ඇඳිලි කිරීමට (වැඳීමට) සුදුසු වූයේය. ලොකයාගේ උතුම් පිං කුඹුරය. මෙසේ සංඝයා කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ වෙයි.

"නොකැඩුනාවූ, සිදුරු නොවූ, කබර නොවූ, කැළල් නොවූ, නිදහස්වූ, නුවණ ඇත්තන් විසින් ප්‍රශංසා කරන ලද්දාවූ තෘෂ්ණා දෘෂ්ටීන් විසින් පරාමර්ෂණය නොකරන ලද්දාවූ සමාධිය පිණිස පවතින්නාවූ ආර්‍ය්‍යයන් කැමැති ශීලයෙන් යුක්ත වූයේවෙයි.

7. "ආනන්දය, යම් ධර්ම ක්‍රමයකින් යුක්තවූ ආර්‍ය්‍යශ්‍රාවක තෙම කැමැතිවන්නේ 'මම ක්ෂය කරන ලද නිරය ඇත්තේ වෙමි ක්ෂය කරන ලද තිරිසන් යෝනි ඇත්තේ වෙමි ක්ෂය කරන ලද ප්‍රේත විෂය ඇත්තේ වෙමි. ක්ෂයකරන ලද විසමවූ වැටීම් ඇති, දුර්ගති නම්වූ අපාය ඇත්තේ වෙමි. අපායෙහි නොවැටෙන ස්වභාව ඇත්තාවූ නියතවූ මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයෙක් වෙමියි' තෙමේම තමහට ප්‍රකාශ කරන්නේද, ආනන්දය මේ ධර්මාදාස නම්වූ ඒ ධර්මක්‍රමය වෙයි."

---

## 9. අසොක ධම්මා'දාස සූත්‍රය.

1. (මේ ඡේදය මේ වර්ගයේ 8 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡේදය මෙනි)

2. "ස්වාමීනි, අසොක නම් මහණතෙම කළුරිය කෙළේය ඒ මහණහුගේ ගතිය කුමක්ද, පරලොව කුමක්ද? ස්වාමීනි, අසෝක නම් මෙහෙණ කළුරිය කළාය. ඒ මෙහෙණගේ ගතිය කුමක්ද, පරලොව කුමක්ද? ස්වාමීනි, අසෝක නම් උපාසක තෙම කළුරිය කෙළේය. ඔහුගේ ගතිය කුමක්ද, පරලොව කුමක්ද? ස්වාමීනි, අසොක නම් උපාසිකාව කළුරිය කළාය. ඇගේ ගතිය කුමක්ද, පරලොව කුමක්ද?

3. "ආනන්දය, කළුරිය කළ අසෝක මහණතෙම ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධිය හා අර්හත්ඵල ප්‍රඥාවත් මේ ආත්මයෙහිම තෙමේ දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ විසීය.

"ආනන්දය, කළුරිය කළාවූ අසොක මෙහෙණ ඕරම්භාගිය සංයෝජන පස ක්ෂය කිරීමෙන් ඔපපාතික වූවා, ඒ බ්‍රහ්ම

ලෝකයෙන් නැවත නොඑන ස්වාභාව ඇත්තී එහිදී පිරිනිවන් පාන්නීය.

"ආනන්දය, කළුරිය කළාවූ අසොක ගෘහපතිතෙම ත්‍රිවිධ සංයෝජනයන් ක්ෂය කිරීමෙන්, රාග ද්වෙෂ මෝහයන් තුනී කිරීමෙන් සකෘදාගාමීව එක්වරක් පමණක් මේ ලෝකයට අවුත් දුක් කෙළවර කරන්නේය.

"ආනන්දය, කාලක්‍රියා කළාවූ අසොක උපාසිකා තොමෝ ත්‍රිවිධ සංයෝජනයන් ක්ෂය කිරීමෙන් අපායෙහි නොවැටීම ස්වභාව කොට ඇත්තාවූ රහත් බවට නියතවූ මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් තැනැත්තියක් වූවාය.

**4, 5, 6, 7.** (මේ ඡෙද මේ වර්ගයේ 8 වෙනි සූත්‍රයේ 4, 5, 6, 7 වෙනි ඡෙද මෙන් වේ)

---

## 10. කකුධ ධම්මාදාස සූත්‍රය.

**1.** (මේ ඡෙදය මේ වර්ගයේ 8 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡෙදය මෙනි)

**2.** "ස්වාමීනි, ඤාතිකයෙහි කකුධ නම් උපාසක තෙම කළුරිය කෙළේය. ඔහුගේ ගතිය කුමක්ද, පරලොව කුමක්ද? ස්වාමීනි, ඤාතිකයෙහිවූ කාලිංග නම් උපාසක තෙම කළුරිය කෙළේය. ඔහුගේ ගතිය කුමක්ද, පරලොව කුමක්ද?

"ස්වාමීනි, ඤාතිකයෙහි නික්ඛ නම් උපාසක තෙම කළුරිය කෙළේය. ඔහුගේ ගතිය කුමක්ද, පරලොව කුමක්ද? ස්වාමීනි, ඤාතිකයෙහි කටිස්සභ නම් උපාසක තෙම කළුරිය කෙළේය. ඔහුගේ ගතිය කුමක්ද, පරලොව කුමක්ද? ස්වාමීනි, ඤාතිකයෙහි තුට්ඨ නම් උපාසක තෙම කළුරිය කෙළේය. ඔහුගේ ගතිය කුමක්ද, පරලොව කුමක්ද? ස්වාමීනි, ඤාතිකයෙහි සන්තුට්ඨ නම් උපාසක තෙම කළුරිය කෙළේය. ඔහුගේ ගතිය කුමක්ද, පරලොව කුමක්ද? ස්වාමීනි, ඤාතිකයෙහි භද්ද නම් උපාසක තෙම කළුරිය කෙළේය. ඔහුගේ ගතිය කුමක්ද, පරලොව කුමක්ද?

ස්වාමීනි, ඤාතිකයෙහිවූ සුභද්ද නම් උපාසක තෙම කළුරිය කෙළේය. ඔහුගේ ගතිය කුමක්ද පරලොව කුමක්ද?"

3. "ආනන්දය, කළුරිය කළාවූ කකුධ උපාසකතෙම තෙම ඔරම්භාගිය සංයොජන පස ක්ෂය කිරීමෙන් බ්‍රහ්ම ලෝකයෙන් මේ ලෝකයට නොඑන ස්වභාව ඇත්තේ ඔපපාතිකව එහිම පිරිනිවන් පාන්නේ වෙයි.

"ආනන්දය, කළුරිය කළාවූ කාලිංග උපාසකතෙම ඔරම්භාගීය සංයෝජන පස ක්ෂය කිරීමෙන් බ්‍රහ්ම ලෝකයෙන් මේ ලෝකයට නොඑන ස්වභාව ඇත්තේ ඔපපාතිකව එහිම පිරිනිවන් පාන්නේ වෙයි.

"ආනන්දය, කළුරිය කළාවූ නික්ඛ උපාසකතෙම ඔරම්භාගීය සංයෝජන පස ක්ෂය කිරීමෙන් බ්‍රහ්ම ලෝකයෙන් නැවත මේ ලෝකයට නොඑන ස්වභාව ඇත්තේ ඔපපාතිකව එහිම පිරිනිවන් පාන්නේ වෙයි.

"ආනන්දය, කළුරිය කළාවූ කටිස්සභ උපාසකතෙම ඔරම්භාගීය සංයෝජන පස ක්ෂය කිරීමෙන් බ්‍රහ්ම ලෝකයෙන් මේ ලෝකයට නොඑන ස්වභාව ඇත්තේ ඔපපාතිකව එහිම පිරිනිවන් පාන්නේ වෙයි.

'ආනන්දය, කළුරිය කළාවූ තුට්ඨ උපාසකතෙම ඔරම්භාගීය සංයෝජන පස ක්ෂය කිරීමෙන් බ්‍රහ්ම ලෝකයෙන් නැවත මේ ලෝකයට නො එන ස්වභාව ඇත්තේ ඔපපාතිකව එහිම පිරිනිවන් පාන්නේ වෙයි.

"ආනන්දය, කළුරිය කළාවූ සන්තුට්ඨ උපාසකතෙම ඔරම්භාගීය සංයෝජන පස ක්ෂය කිරීමෙන් බ්‍රහ්ම ලෝකයෙන් නැවත මේ ලෝකයට නොඑන ස්වභාව ඇත්තේ ඔපපාතිකව එහිම පිරිනිවන් පාන්නේ වෙයි.

"ආනන්දය, කළුරිය කළාවූ භද්ද උපාසකතෙම ඔරම්භාගීය සංයෝජන පස ක්ෂය කිරීමෙන් බ්‍රහ්ම ලෝකයෙන් නැවත මේ ලෝකයට නොඑන ස්වභාව ඇත්තේ ඔපපාතිකව එහිම පිරිනිවන් පාන්නේ වෙයි.

"ආනන්දය, කළුරිය කළාවූ භද්ද උපාසකතෙම ඔරම්භාගීය සංයෝජන පස ක්ෂය කිරීමෙන් බ්‍රහ්ම ලෝකයෙන් මේ ලෝකයට නැවත නොඑන ස්වභාව ඇත්තේ ඕපපාතිකව එහිම පිරිනිවන් පාන්නේ වෙයි.

"ආනන්දය, කළුරිය කළාවූ ඥාතිකයෙහිවූ පනසකට අධික උපාසකයෝ තුමූ ඔරම්භාගිය සංයෝජන පස ක්ෂය කිරීමෙන් ඒ බඹ ලෝකයෙන් මේ කාම ලොකයට නැවත නො එන ස්වභාව ඇත්තේ ඕපපාතිකව එහිම පිරිනිවන් පාන්නේ වෙයි.

"ආනන්දය, කළුරිය කළාවූ ඥාතිකයෙහිවූ අනූවකට අධික උපාසකයෝ තුමූ ත්‍රිවිධ සංයෝජනයන් ක්ෂයකිරීමෙන් රාග-ද්වෙෂ-මොහයන් තුනී කළ සකෘදාගාමිව වරක් පමණක් මේ ලොකයට අවුත් දුක් කෙළවර කෙරෙත්.

"ආනන්දය, කළුරිය කළාවූ පන්සිය සයදෙනෙකුට අධික වූ ඤාතිකයෙහි වූ උපාසකයෝ තුමූ ත්‍රිවිධ සංයෝජනයන් ක්ෂය කිරීමෙන් අපායෙහි නොවැටෙන ස්වභාව ඇත්තාවූ, නිවන නියතවූ, මතුමාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයෝ වූහයි" වදාළේය.

4, 5, 6, 7. (මේ ඡේද මේ වර්ගයේ 8 වෙනි සූත්‍රයේ 4, 5, 6, 7 වෙනි ඡේද මෙනි.)

---

## 2. රාජකාරාම වර්ගය.

### 1. සහස්ස භික්ඛුනී සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ රාජකාරාමයෙහි වාසය කරනසේක. ඉක්බිති සහස්ස නම් භික්ඛුනී සමූහයා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක සිටියේය. එක්පසෙක

සිටියාවූ ඒ භික්ඛුනීන්හට භාග්‍යවතුන් වහන්සේ මෙය දෙශනා කළසේක.

2. "මෙහෙණෙනි, ධර්ම සතරකින් යුක්තවූ ආර්‍ය්‍යශ්‍රාවක තෙම අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත් බවට නියතවූ මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයෙක් වන්නේය. කවර සතරකින්ද? මෙහෙණනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවක තෙම, ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේත් අර්හත් වනසේක. සම්‍යක් සම්බුද්ධ වන සේක. විජ්ජාචරණ සම්පන්න වන සේක. සුගත වන සේක. ලෝකවිදූ වන සේක. අනුත්තර පුරිසදම්ම සාරථී වන සේක. දෙව් මිනිසුන්ගේ ශාස්තෲ වනසේක. චතුස්සත්‍යය අවබොධ කළසේක. භාග්‍යවත්සේකැයි බුදුරජාණන් වහන්සේ කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ වෙයිද,

"ධර්මය තෙම භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට දෙශනා කරන ලද්දේය. මේ ආත්මයෙහි දෙන ඵල ඇත්තේය. කල් නොයවා විපාක දෙන්නේය. එව, බලවයි පෙන්වියහැකි ගුණ ඇත්තේය. තමන් තුළ එළවා වැඩිය යුතු ගුණයෙන් යුක්තවූයේය. නුවණැත්තන් විසින් වෙන වෙනම දතයුත්තේයයි මෙසේ ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේ වෙයිද,

"භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම ශාසන ප්‍රතිපත්තියෙහි මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය. නිවනට සුදුසුව පිළිපන්නේය ගරුබුහුමනට යොග්‍යව පිළිපන්නේය යම් මේ පුරුෂ යුග සතරක් වෙත්ද පුද්ගලයන් අටදෙනෙක් වෙත්ද මේ ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන් උදෙසා පිළියෙල කළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. තුටු පඬුරු පිණිස පිළියෙළ කළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. කම්පල අදහා දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසුවූසේක. ඇඳිලි කර්මයට (වැඳීමට) සුදුසු වූයේය. ලෝකයාගේ උතුම් පිං කෙතය මෙසේ සංඝයා කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේද,

නොකැඩුනාවූ, සිදුරු නොවූ, කබර නොවූ කැළල් නොවූ නිදොස්වූ නුවණ ඇත්තන් විසින් ප්‍රශංසා කරන ලද්දාවූ, තෘෂ්ණා දෘෂ්ටීන් විසින් පරාමර්ෂණය නොකරන ලද්දාවූ සමාධිය පිණිස පවතින්නාවූ ආර්‍ය්‍යයන් කැමති සීලයෙන් යුක්තවූයේ වෙයිද,

3. "මෙහෙණනි, මේ ධර්ම සතරින් යුක්තවූ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත් බවට නියතවූ මතුමාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයෙක් වන්නේයයි" වදාළේය.

---

## 2. උදය ගාමිනි සූත්‍රය.

1. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡේදය මෙනි.)

2. මහණෙනි, බ්‍රාහ්මණයෝ "උදයගාමිණී" නම් ප්‍රතිපදාවක් පණවත්. ඔවුහු ශ්‍රාවකයන් මෙසේ සමාදන් කරවත්. (කෙසේද?) පින්වත් පුරුෂය, නුඹ මෙහි එව. උදෙන්ම නැගිට පෙරදිගට මුහුණලා යව. ඒ නුඹ මඩ වගුරද ප්‍රපාතයද කණුද කටුවලින් ගැවසී තැනද ගවරවලද කුණුවලද අත් නොහරුව. යම් තැනක වැටෙන්නෙහිද, එහිදීම මරණයට පැමිණෙව. පින්වත් පුරුෂය, මෙසේ වනාහි නුඹ කය බිඳීමෙන් මරණින් මතු සුගති සංඛ්‍යාත ස්වර්ගලොකයෙහි උපදින්නේය' කියායි.

3. "මහණෙනි, මෙය වනාහි ඒ බමුණන්ගේ අඥාන ගමනකි. මෝඩගමනකි. (එය) කලකිරීම පිණිස, විරාගය පිණිස නිරොධය පිණස, සංසිඳීම පිණිස, දැනගැනීම පිණිස අවබොධ කිරීම පිණිස නො පවතියි.

4. "මහණෙනි, මමද ආර්‍ය්‍ය විනයෙහි උදය ගාමිනී ප්‍රතිපදාවක් පනවමි. එය ඒකාන්තයෙන් කලකිරීම පිණිස, විරාගය පිණිස, නිරොධය පිණිස, සංසිඳීම පිණිස, දැනගැනීම පිණිස, අවබොධ කිරීම පිණිස පවතියි.

මහණෙනි, එය ඒකාන්තයෙන් කලකිරීම පිණිස, විරාගය පිණිස, නිරොධය පිණිස, සංසිඳීම පිණිස, දැනගැනීම පිණිස

අවබොධ කිරීම පිණිස පවතින්නාවූ උදයගාමිණී පටිපදාව කවරීද?

"මහණෙනි, මේ ශාසනයෙහි ආය්‍ය්‍යශ්‍රාවක තෙම ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේත් අර්හත් වන සේක. සම්‍යක් සම්බුද්ධ වනසේක. විද්‍යාචරණසම්පන්න වනසේක. සුගත වනසේක. ලෝකවිදූ වනසේක. අනුත්තර පුරිසදම්මසාරථී වන සේක. දෙව් මිනිසුන්ගේ ශාස්තෲ වනසේක, චතුස්සත්‍යය අවබොධ කළසේක. භාග්‍යවත්සේකැයි බුදුරජාණන් වහන්සේ කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයිද,

"ධර්මයතෙම භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට දෙශනාකරන ලද්දේය. මේ ආත්මයෙහි දෙන ඵල ඇත්තේය. කල්නොයවා දෙන විපාක දෙන්නේය. එව බලවයි පෙන්විය හැකි ගුණ ඇත්තේය. තමන් තුළ එළවා වැඩිය යුතු ගුණයෙන් යුක්තවූයේය. නුවණැත්තන් විසින් වෙන වෙනම දතයුත්තේයයි මෙසේ ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයිද,

"භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝතෙම ශාසන ප්‍රතිපත්තියෙහි මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය නිවනට සුදුසුව පිළිපන්නේය. ගරුබුහුමනට යොග්‍යව පිළිපන්නේය. යම් මේ පුරිසයුග සතරක් වෙත්ද පුද්ගලයන් අට දෙනෙක් වෙත්ද මේ ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන් උදෙසා පිළියෙල කළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. තුටු පඬුරු පිණිස පිළියෙල කළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. කම්ඵල අදහා දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසුවූ සේක. ඇඳිලි කර්මයට (වැඳීමට) සුදුසුවූයේය. ලෝකයාගේ උතුම් පිංකෙතය. මෙසේ සංඝයා කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේද,

"නොකැඩුනාවූ, සිදුරුනොවූ, කබරනොවූ, කැළල්නොවූ නිදොස්වූ, නුවණ ඇත්තන් විසින් ප්‍රශංසා කරන ලද්දාවූ, තෘෂ්ණා දෘෂ්ටීන් පරාමර්ෂණය නොකරන ලද්දාවූ සමාධිය පිණිස පවත්නාවූ ආය්‍ය්‍යයන් කැමැති ශීලයෙන් යුක්ත වූයේ වෙයිද,

"මහණෙනි, මේ වනාහි ඒකාන්තයෙන් කලකිරීම පිණිස, විරාගය පිණිස නිරෝධය පිණිස. සංසිඳීම පිණිස, දැනගැනීම පිණිස, අවබොධකිරීම පිණිස, නිවන පිණිස පවතියි.

---

## 3. ආනන්ද සොතාපත්තියංග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් සාරිපුත්ත ස්ථවිර තෙමේද, ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේද සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කෙරෙත්. ඉක්බිති ආයුෂ්මත් සාරිපුත්ත ස්ථවිර තෙම සවස් කාලයෙහි විවේකයෙන් නැගීසිටියේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් හා සමග සතුටුවිය. සතුටුවිය යුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිර තෙමේ වනාහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට මෙය කීයේය.

2. "ඇවැත් ආනන්දය, කෙතෙක් ධර්මයන් නැතිකිරීම කෙතෙක් ධර්මයන්ගෙන් යුක්තවීම හෙතුකොටගෙන මෙසේ මේ ප්‍රජාව අපායෙහි වැටීමක් නැති රහත් බවට නියතවූ මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් බවට පැමිණියායි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේද?"

3. "ඇවැත්නි, ධර්ම සතරක් නැතිකිරීමත් ධර්ම සතරකින් යුක්තවීමත් හෙතුකොටගෙන මෙසේ මේ ප්‍රජාව අපායෙහි වැටීමක් නැති රහත් බවට නියතවූ මතුමාර්ගත්‍රයට පිහිටවූ සෝවාන් බවට පැමිණියා යයි' භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. කවර සතරකින්ද? ඇවැත්නි, බුදුන් කෙරෙහි යම්බඳුවූ අප්‍රසාදයකින් යුක්තවූ අශ්‍රැතවත් පෘථග්ජන තෙම කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ, නපුරු ගති ඇති, විසම වැටීම් ඇති නිරයෙහි උපදියිද, බුදුන් කෙරෙහි ඔහුට එවැනි අප්‍රසාදයක් නැත. ඇවැත්නි, බුදුන් කෙරෙහි යම්බඳුවූ අචල

ශ්‍රද්ධාවකින් යුත් ශ්‍රැතවත් ආය්‍ය ශ්‍රාවකතෙම කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදියිද, ඔහුට බුදුන් කෙරෙහි එවැනි නොසෙල්වෙන ප්‍රසාදයක් ඇත්තේය. මෙසේ ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත් වනසේක සම්‍යක්සම්බුද්ධ වන සේක. විජ්ජාචරණසම්පන්න වන සේක. සුගත වන සේක. ලෝකවිදූ වන සේක. අනුත්තර පුරුසදම්මසාරථී වන සේක දෙව් මිනිසුන්ගේ ශාස්තෘ වන සේක චතුස්සත්‍යය අවබොධ කළ සේක. භාග්‍යවත්සේකැයි බුදුරජාණන් වහන්සේ කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයි.

4 'ඇවැත්නි, ධර්මය කෙරෙහි යම්බඳුවූ අප්‍රසාදයෙන් යුක්තවූ අශ්‍රැතවත් පෘථග්ජන තෙම කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ, නපුරු ගති ඇති, විසම වැටීම් ඇති නිරයෙහි උපදියිද, ඔහුට ධර්මය කෙරෙහි එබඳු අප්‍රසාදයක් නැත. ඇවැත්නි, ධර්මය කෙරෙහි යම්බඳු අචල ප්‍රසාදයෙන් යුක්තවූ ශ්‍රැතවත් ආය්‍යශ්‍රාවක තෙම කය බිඳීමෙන් මරණින්මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදියිද. ඔහුට ධර්මය කෙරෙහි එබඳු අචල ප්‍රසාදය ඇත්තේය.

"ධර්මය තෙම භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට දෙශනාකරන ලද්දේය. මේ ආත්මයෙහි දෙන ඵල ඇත්තේය. කල්නොයවා දෙන විපාක දෙන්නේය. එව බලවයි පෙන්විය හැකි ගුණ ඇත්තේය. තමන් තුළ එළවා වැඩිය යුතු ගුණයෙන් යුක්තවූයේය. නුවණැත්තන් විසින් වෙන වෙනම දත යුත්තේය, කියායි.

5. "ඇවැත්නි, සංඝයා කෙරෙහි යම්බඳුවූ අප්‍රසාදයෙන් යුක්තවූ අශ්‍රැතවත් පෘථග්ජන තෙම කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති, විසම වැටීම් ඇති, නිරයෙහි උපදියිද, ඔහුට සංඝයා කෙරෙහි එබඳුවූ අප්‍රසාදය නැත්තේය ඇවැත්නි, සංඝයා කෙරෙහි යම්බඳුවූ අචලප්‍රසාදයෙන් යුක්තවූ ශ්‍රැතවත් ආය්‍ය ශ්‍රාවක තෙම කය බිඳීමෙන් මරණින් මතු යහපත්

ගති ඇති ස්වර්ගලෝකයෙහි උපදියිද ඔහුට සංඝයා කෙරෙහි එබඳු අචල ප්‍රසාදය ඇත්තේය.

"භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම ශාසන ප්‍රතිපත්තියෙහි මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය. නිවනට සුදුසුව පිළිපන්නේය. ගරුබුහුමනට යොග්‍යව පිළිපන්නේය. යම් මේ පුරිසයුග සතරක් වෙත්ද, පුද්ගලයන් අට දෙනෙක් වෙත්ද, මේ ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන් උදෙසා පිළියෙල කළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. තුටු පඬුරු පිණිස පිළියෙල කළ දෙය පිළිගැන්මට සුදුසු වූයේය. කම්පල අදහා දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසුවූ සේක. ඇඳිලි කර්මයට (වැඳීමට) සුදුසු වූයේය. ලෝකයාගේ පින් කෙතය, කියායි. මෙසේ සංඝයා කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේද,

**6.** "ඇවැත්නි, යම්බඳුවූ දුස්සීල බවකින් යුක්තවූ අශ්‍රැතවත් පෘථග්ජනතෙම කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ, නපුරු ගති ඇති, විසම වැටීම් ඇති නිරයෙහි උපදියිද, ඔහුට එබඳුවූ දුශ්ශීල බවක් නැත්තේය. ඇවැත්නි, යම්බඳුවූ ආර්‍ය්‍යයන් කැමති සීලයෙන් යුක්තවූ ආර්‍ය්‍යශ්‍රාවක තෙම කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලෝකයෙහි උපදියිද, ඒ ඔහුට නොකැඩුනාවූ, සිදුරු නොවූ, කබර නොවූ, කැළැල් නොවූ, දොස් නොවූ, නුවණැත්තන් විසින් පසස්නා ලද්දාවූ තෘෂ්ණාදෘෂ්ටීන් විසින් පරාමර්ෂණය නොකරන ලද්දාවූ සමාධිය පිණිස පවත්නාවූ ආර්‍ය්‍යයන් කැමති සීලය ඇත්තේ වෙයි.

**7.** "ඇවැත්නි, මේ සතර ධර්මයන් නැතිකිරීම හා මේ සතර ධර්මයන්ගෙන් යුක්තවීම හේතුකොට ගෙන මෙසේ මේ ප්‍රජාව වනාහි අපායෙහි වැටෙන ස්වභාව නැත්තාවූ, රහත් බවට නියතවූ මතු මාර්ගත්‍රයට පැමිණීම ඒකාන්තවූ සෝවාන් බවට පැමිණියේයයි" භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණලදී.

---

## 4. දුග්ගති භය සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේ පිඬු සිටුහු විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූන් භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය.

"මහණෙනි, ධර්ම සතරකින් යුක්තවූ ආර්‍ය්‍යශ්‍රාවක තෙම සියලු දුර්ගති භය ඉක්මවූයේ වෙයි.

2. "කවර සතරකින්ද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේත් අර්හත් වන සේක, සම්‍යක් සම්බුද්ධ වනසේක, විද්‍යාචරණ සම්පන්න වන සේක, සුගත වන සේක, ලෝකවිදූ වන සේක, අනුත්තර පුරිස දම්ම සාරථී වනසේක. දෙව් මිනිසුන්ගේ ශාස්තෘ වන සේක. චතුස්සත්‍යය අවබොධ කළ සේක. භාග්‍යවත් සේකැයි බුදුරජාණන් වහන්සේ කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයිද,

3. "ධර්මයතෙම භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට දෙශනාකරන ලද්දේය. මේ ආත්මයෙහි දෙන ඵල ඇත්තේය. කල්නොයවා දෙන විපාක දෙන්නේය. එව බලවයි පෙන්විය හැකි ගුණ ඇත්තේය. තමන් තුළ එළවා වැඩිය යුතු ගුණයෙන් යුක්තවූයේය. නුවණැත්තන් විසින් වෙන වෙනම දතයුත්තේයයි මෙසේ ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයිද,

"භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝතෙම ශාසන ප්‍රතිපත්තියෙහි මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය. නිවනට සුදුසුව පිළිපන්නේය. ගරුබුහුමනට යොග්‍යව පිළිපන්නේය. යම් මේ පුරිසයුග සතරක් වෙත්ද, පුද්ගලයන් අටදෙනෙක් වෙත්ද මේ ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන් උදෙසා පිළියෙල කළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. තුටු

පඬුරු පිණිස පිළියෙල කළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. කම්පල අදහා දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසුවූ සේක. ඇඳිලි කර්මයට (වැඳීමට) සුදුසු වූයේය. ලෝකයාගේ උතුම් පින් කෙත විය. මෙසේ සංඝයා කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්ත වූයේද,

"නොකැඩුනාවූ, සිදුරු නොවූ, කබර නොවූ, කැළල් නොවූ, නිදොස්වූ, නුවණ ඇත්තන් විසින් ප්‍රශංසා කරන ලද්දාවූ, තෘෂ්ණාදෘෂ්ටීන් විසින් පරාමර්ෂණය නොකරන ලද්දාවූ සමාධිය පිණිස පවත්නාවූ ආර්‍ය්‍යයන් කැමති ශීලයෙන් යුක්ත වූයේ වෙයිද,

4. "මහණෙනි, මේ සතර ධර්මයන් ගෙන් යුක්තවූ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම වනාහි සියලු දුර්ගති භය ඉක්මවූයේ වෙයි."

---

## 5. විනිපාතභය සූත්‍රය.

1. (මේ ඡෙදය මේ වර්ගයේ 4 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡෙදය මෙනි.)

2. "මහණෙනි, ධර්ම සතරකින් යුක්තවූ ආර්‍ය්‍යශ්‍රාවක තෙම සියලු නපුරු ගති ඇති අපාය භය ඉක්මවූයේ වෙයි.

3. (මේ ඡෙදය මේ වර්ගයේ 4 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි.)

"මහණෙනි, මේ සතර ධර්මයන්ගෙන් යුක්තවූ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම වනාහි සියලු නපුරු ගති ඇති අපාය ඉක්මවූයේ වෙයි."

---

## 6. පඨම මිත්තා'මච්ච සූත්‍රය.

1. (මේ ඡෙදය මේ වර්ගයේ 4 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡෙදය මෙනි.)

2. "මහණෙනි, යමෙකුන්ට අනුකම්පා කරන්නහු නම් ඇසිය යුත්තන් වශයෙන් යම් මිත්‍රයෝ හෝ, විශ්වාසයෝ හෝ නෑයෝ

හෝ සහලේ නෑයෝ හෝ හඟින්නාහුද, මහණෙනි ඔවුහු තොප විසින් සොතාපත්ති අංග සතරෙහි සමාදන් කරවිය යුත්තාහුය. වාසය කරවිය යුත්තාහුය. පිහිටුවිය යුත්තාහුය. කවර සතරෙක්හිද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 4 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡේදය මෙනි.)

4. "මහණෙනි, යමෙකුන්ට අනුකම්පා කරන්නහු නම් ඇසිය යුත්තන් වශයෙන් යම් මිත්‍රයෝ හෝ, විශ්වාසයෝ හො නෑයෝ හෝ, සහලේ නෑයෝ හෝ හඟින්නාහුද, මහණෙනි, ඔවුහු තොප විසින් සොතාපත්ති අංග සතරෙහි සමාදන් කරවිය යුත්තාහුය. වාසය කරවිය යුත්තාහුය. පිහිටුවිය යුත්තාහුය."

---

## 7. දුතිය මිත්තා'මච්ච සූත්‍රය.

1. (මේ ඡේදය මේ වර්ගයේ 6 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡේදය මෙනි.)

2. (මේ ඡේදය මේ වර්ගයේ 6 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡේදය මෙනි.)

3. "බුදුරජාණන්වහන්සේ කෙරෙහි නොසැලෙන පැහැදීමෙහි සමාදන් කරවිය යුත්තාහුය. වාසය කරවිය යුත්තාහුය. පිහිටුවිය යුත්තාහුය. (කෙසේද?) භාග්‍යවතුන් වහන්සේ මෙසේත් අර්හත් වන සේක. සම්‍යක් සම්බුද්ධ වනසේක. විද්‍යාචරණසම්පන්න වන සේක සුගත වන සේක. ලොකවිදූ වන සේක. අනුත්තර පුරිස දම්ම සාරථී වන සේක. දෙවි මිනිසුන්ගේ ශාස්තෘ වන සේක. චතුස්සත්‍යය අවබොධ කළ සේක. භාග්‍යවත් සේකැයි කියායි.

"මහණෙනි, පඨවිධාතු, ආපෝධාතු, තේජෝධාතු, වායෝධාතු යන සතර මහා භූතයින් හෝ (තදදෙය මොළොක් වීම යනාදි) වෙනස්වීම ඇත්තේය. බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචලප්‍රසාදයෙන් යුක්තවූ ආර්‍ය්‍යශ්‍රාවකයාගේ

වෙනස්වීමක් නැත්තේය. එහි ඒකාන්තයෙන් බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූ ඒ ආර්‍යශ්‍රාවක තෙම නිරයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ, ප්‍රේතවිෂයෙහි හෝ උපදින්නේය යන මේ කරුණ විද්‍යමාන නොවේ.

4. "ධර්මය කෙරෙහි නොසෙල්වෙන පැහැදීමෙහි සමාදන් කරවිය යුත්තාහුය. වාසය කරවිය යුත්තාහුය. පිහිටුවිය යුත්තාහුය. (කෙසේද?) භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට දෙශනාකරන ලද්දේය. මේ ආත්මයෙහි දෙන ඵල ඇත්තේය. කල්නොයවා දෙන විපාක දෙන්නේය. එව බලවයි පෙන්විය හැකි ගුණ ඇත්තේය. තමන් තුළ එළවා වැඩිය යුතු ගුණයෙන් යුක්ත වූයේය. නුවණැත්තන් විසින් වෙන වෙනම දතයුත්තේයයි කියායි.

"මහණෙනි, පඨවිධාතු, ආපෝධාතු, තේජොධාතු, වායොධාතු යන සතර මහාභූතයින් හෝ (තදදෙය මොළොක් වීම යනාදී) වෙනස්වීම ඇත්තේය. ධර්මය කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූ ආර්‍ය ශ්‍රාවකයාගේ වෙනස්වීමක් නැත්තේය. එහි ඒකාන්තයෙන් බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූ ඒ ආර්‍යශ්‍රාවකතෙම නිරයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ, ප්‍රේතවිෂයෙහි හෝ උපදින්නේය යන මේ කරුණ විද්‍යමාන නොවේ.

5. "සංඝයා කෙරෙහි නොසෙල්වෙන පැහැදීමෙහි සමාදන් කරවිය යුත්තාහුය. වාසය කරවිය යුත්තාහුය. පිහිටුවිය යුත්තාහුය. (කෙසේද?) භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම ශාසනප්‍රතිපත්තියෙහි මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය. නිවනට සුදුසුව පිළිපන්නේය. ගරු බුහුමනට යොග්‍යව පිළිපන්නේය. යම් මේ පුරිසයුග සතරක් වෙත්ද, පුද්ගලයන් අටදෙනෙක් වෙත්ද, මේ ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන් උදෙසා පිළියෙල කළ දෙය පිළිගැනීමට සුදුසුවූයේය. තුටුපඬුරු පිණිස පිළියෙල කළ දෙය පිළිගැන්මට සුදුසු වූයේය. කම්පල අදහා දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසුවූ සේක. ඇඳිලිකර්මයට (වැඳීමට) සුදුසු වූයේය. ලෝකයාගේ උතුම් පිං කෙතය කියායි.

"මහණෙනි, පඨවිධාතු, ආපෝධාතු, තේජෝධාතු, වායොධාතු යන සතර මහා භූතයින් හෝ (තදදෙය මොළොක් වීම යනාදි) වෙනස්වීම ඇත්තේය. සංඝයා කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූ ආර්‍යශ්‍රාවකයාගේ වෙනස්වීමක් නැත්තේය. එහි ඒකාන්තයෙන් බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූ ඒ ආර්‍යශ්‍රාවකතෙම නිරයෙහි හෝ ප්‍රේතවිෂයෙහි හෝ උපදින්නේය යන මේ කරුණ විද්‍යමාන නොවේ.

**6.** 'නොකැඩුනාවූ සිදුරු නොවූ, කබර නොවූ කැළල් නොවූ නිදොස්වූ නුවණ ඇත්තන් විසින් ප්‍රසංසා කරන ලද්දාවූ, (තෘෂ්ණා දෘෂ්ටීන් විසින්) පරාමර්ෂණය නොකරන ලද්දාවූ සමාධිය පිණිස පවතින්නාවූ ආර්‍යයන් කැමතිවෙනු ලබන්නාවූ ශීලයෙහි සමාදන් කරවිය යුත්තාහුය වාසය කරවිය යුත්තාහ. පිහිටුවිය යුත්තාහුය."

'මහණෙනි, පඨවිධාතු, ආපෝධාතු, තේජෝධාතු, වායෝධාතු යන සතර මහාභූතයින් හෝ (තදදෙය මොළොක් වීම යනාදි) වෙනස්වීම ඇත්තේය. ආර්‍යයන් කැමති වන්නාවූ ශීලයෙන් යුක්තවූ ආර්‍ය ශ්‍රාවකයාගේ වෙනස්වීමක් නැත්තේය. එහි ඒකාන්තයෙන් බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූ ඒ ආර්‍යශ්‍රාවකතෙම නිරයෙහි හෝ තිරිසන් යොනියෙහි හෝ ප්‍රේතවිෂයෙහි හෝ උපදින්නේය යන මේ කරුණ විද්‍යමාන නොවේ.

**7.** (මේ ඡෙදය මේ වර්ගයේ 6 වෙනි සූත්‍රයේ 4 වෙනි ඡෙදය මෙනි.)

---

## 8. පඨම දෙවචාරිකා සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම සැවැත්නුවර අනේපිඬුසිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කෙරෙයි. එකල්හි ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිර තෙම යම්සේ බලවත්

පුරුෂයෙක් හකුළුවනලද අතක් දිගහරින්නේද, දිගහරිනලද, අතක් හකුළුවන්නේද එමෙන් ජේතවනාරාමයෙන් අතුරුදහන්ව තව්තිසා දෙවියන් අතරෙහි පහළවිය. එකල්හි බොහෝ වූ තව්තිසා දෙවියෝ මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ, ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වැඳ එක්පසෙක හුන්නාහුය එක්පසෙක හුන්නාවූ, ඒ දෙවියන්ට ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරතෙම මෙය කීයේය.

2. "ඇවැත්නි, බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවීම යහපත් වෙයි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ අර්හත්හ. සම්‍යක් සම්බුද්ධයහ විජ්ජාචරණ සම්පන්නයහ. සුගතයහ. ලෝකවිදූහ. පුරුෂයන් දමනය කිරීමෙහි අතිඋතුම් රියදුරෙකු හා සමානයහ. දෙව් මිනිසුන්ගේ ශාස්තෘහ. චතුරාර්‍ය්‍යසත්‍යය අවබොධ කළසේක. භාග්‍යවත්හ කියායි.

"ඇවැත්නි, බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවීම හේතුකොටගෙන මෙසේ සමහර සත්වයෝ කය බිඳීමෙන්. මරණින් මතු යහපත් ගති ඇත්තාවූ ස්වර්ගලොකයෙහි උපදිත්.

3. "නිදුකාණනි, ධර්මය කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවීම යහපත් වෙයි.

"භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට දේශනා කරන ලද්දේය. මේ ආත්මයෙහි දෙන ඵල ඇත්තේය. කල් නොයවා විපාක දෙන්නේය. එව. බලවයි, පෙන්විය හැකි ගුණ ඇත්තේය. තමන් තුළ එළවා වැඩිය යුතු ගුණයෙන් යුක්ත වූයේය. නුවණැත්තන් විසින් වෙන වෙනම දතයුත්තේය කියායි.

4. "නිදුකාණනි, ධර්මය කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවීම හේතුකොටගෙන මෙසේ සමහර සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු, යහපත් ගති ඇත්තාවූ ස්වර්ග ලෝකයෙහි උපදිත්.

"නිදුකාණනි, සංඝයා කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්ත වීම යහපත් වෙයි.

"භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම ශාසන ප්‍රතිපත්තියෙහි මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය. නිවනට සුදුසුව පිළිපන්නේය. ගරුබුහුමනට යොග්‍යව පිළිපන්නේය. යම් මේ පුරිසයුග සතරක් වෙත්ද, පුද්ගලයන් අට දෙනෙක් වෙත්ද, මේ ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන් උදෙසා පිළියෙළකළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. කම්පල අදහා දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසු වූසේක. ඇඳිලි කිරීමට (වැඳීමට) සුදුසු වූයේය. ලෝකයාගේ උතුම් පිංකුඹුරය කියායි.

නිදුකාණනි, සංඝයා කෙරෙහි අචලප්‍රසාදයෙන් යුක්තවීම හේතුකොටගෙන මෙසේ සමහර සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු, යහපත් ගති ඇත්තාවූ ස්වර්ග ලොකයෙහි උපදිත්.

**5.** "ඇවැත්නි, නොකැඩුනාවූ, කැළල් නොවූ, නිදොස්වූ, නුවණ ඇත්තන් විසින් ප්‍රසංසා කරනලද්දාවූ, (තෘෂ්ණා දෘෂ්ටීන් විසින්) පරාමර්ෂණය නොකරන ලද්දාවූ, සමාධිය පිණිස පවතින්නාවූ ආයර්‍ය්‍යයන් විසින් කැමැතිවෙනු ලබන්නාවූ ශීලයෙන් යුක්තවීම යහපත් වෙයි ඇවැත්නි, ආයර්‍ය්‍යයන් කැමති ශීලයෙන් යුක්තවීම හේතුකොටගෙන මෙසේ සමහර සත්වයෝ කයබිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇත්තාවූ ස්වර්ගලෝකයෙහි උපදිත්.

**6, 7, 8, 9.** (2, 3, 4, 5 ඡේදයන්හි ඇති 'ඇවැත්නි,' වෙනුවට 'නිදුකාණෙනි, මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්ස,' කියා වෙනස්කොට ගැනීමෙන් මේ ඡේද හතර සම්පූර්ණ කරගන්න.)

---

## 9. දුතිය දෙවචාරිකා සූත්‍රය

**1-9.** (මේ වර්ගයේ 8 සූත්‍රයේ 1-9 ඡේදයන්හි අග තිබෙන "උපදිත්" යනු මෙහිදී "උපන්නාහුය" කියා වෙනස් කොට ගැනීමෙන් මේ සූත්‍රය සම්පූර්ණවේ.)

---

## 10. තතිය දෙවචාරිකා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ යම්සේ බලවත් පුරුෂයෙක් වක් කළ අතක් දික් කරන්නේද, දික් කළ අතක් වක් කරන්නේද, එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ තව්තිසා දෙව්ලොව පහළවූහ.

ඉක්බිති බොහෝවූ, තව්තිසා දෙව්ලොව වැසි දෙවතාවෝ භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියාහුය පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක හුන්නාහුය. එක්පසෙක හුන්නාවූ ඒ දෙවියන්හට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "ඇවැත්නි, බුදුන් කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්ත වීම යහපත් වෙයි.

"මෙසේ භාග්‍යවතුන් වහන්සේ අර්හත්හ. සම්‍යක් සම්බුද්ධයහ. විජ්ජාචරණ සම්පන්නයහ. සුගතයහ. ලෝකවිදූහ. පුරුෂයන් දමනය කිරීමෙහි අති උතුම් රියැදුරෙකු හා සමානයහ. දෙව් මිනිසුන්ගේ ශාස්තෘහ. චතුරාර්‍ය්‍යසත්‍යය අවබොධ කළසේක. භාග්‍යවත්හ කියායි.

"ඇවැත්නි, බුදුන් කෙරෙහි අචලප්‍රසාදයෙන් යුක්තවීම හේතුකොටගෙන වනාහි ඇතැම් කෙනෙක් අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත්බවට නියතවූ මතු මාර්ගත්‍රයට පැමිණීම ඒකාන්තවූ සෝවාන්වූවෝ වන්නාහුය.

3. "ඇවැත්නි, ධර්මයෙහි අචලප්‍රසාදයෙන් යුක්තවීම යහපත් වෙයි.

"ධර්මය තෙම භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට දෙශනාකරන ලද්දේය. මේ ආත්මයෙහි දෙන ඵල ඇත්තේය. කල් නොයවා දෙන විපාක දෙන්නේය. එව, බලවයි, පෙන්විය හැකි ගුණ ඇත්තේය. තමන් තුළ එළවා වැඩිය යුතු ගුණයෙන්

යුක්ත වූයේය. නුවණැත්තන් විසින් වෙන වෙනම දතයුත්තේයයි මෙසේ ධර්මයෙහි නොසෙල්වෙන ප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයිද, ලෝකයාගේ අති උතුම් පින්කෙත වන්නේය කියායි.

"ඇවැත්නි, ධර්මය කෙරෙහි අචලප්‍රසාදයෙන් යුක්තවීම හේතුකොට ගෙන ඇතැම් කෙනෙක් අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත්බවට නියතවූ මතු මාර්ගත්‍රයට පැමිණීම ඒකාන්තවූ සෝවාන්වූවෝ වන්නාහුය.

4. "ඇවැත්නි, සංඝයා කෙරෙහි අචලප්‍රසාදයෙන් යුක්තවීම යහපත් වෙයි.

"භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම ශාසන ප්‍රතිපත්තියෙහි මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය. නිවනට සුදුසුව පිළිපන්නේය. ගරුබුහුමනට යොග්‍යව පිළිපන්නේය. යම් මේ පුරිසයුග සතරක් වෙත්ද, පුද්ගලයන් අටදෙනෙක් වෙත්ද, මේ ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන් උදෙසා පිළියෙළ කළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. කම්පල අදහා දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසු වූසේක, ඇඳිලිකිරීමට (වැඳීමට) සුදුසුවූයේය. ලොකයාගේ උතුම් පිංකුඹුරය කියායි.

"ඇවැත්නි, සංඝයා කෙරෙහි අචලප්‍රසාදයෙන් යුක්තවීම හේතුකොටගෙන ඇතැම් කෙනෙක් අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත්බවට නියතවූ මතු මාර්ගත්‍රයට පැමිණීම ඒකාන්තවූ සෝවාන්වූවෝ වන්නාහුය.

5. "ඇවැත්නි, නොකැඩුනාවූ, කැළල් නොවූ, නිදොස්වූ, නුවණ ඇත්තන් විසින් ප්‍රසංසා කරන ලද්දාවූ, (තෘෂ්ණා දෘෂ්ටීන් විසින්) පරාමර්ෂණය නොකරන ලද්දාවූ, සමාධිය පිණිස පවතිනනාවූ ආර්‍ය්‍යයන් විසින් කැමැති ශීලයෙන් යුක්තවීම යහපත් වෙයි.

'ඇවැත්නි, කඩනොවූ අචලප්‍රසාදයෙන් යුක්තවීම හේතු කොටගෙන ඇතැම් කෙනෙක් අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත්බවට නියතවූ මතු මාර්ගත්‍රයට පැමිණීම ඒකාන්තවූ සෝවාන්වූවෝ වන්නාහුය."

**6, 7, 8, 9.** (මේ ඡේද මේ සූත්‍රයේ 2, 3, 4, 5 ඡේද මෙන් වෙත්. "ඇවැත්නි" වෙනුවට "නිදුකාණනි" යොදාගත යුතුයි.)

(දෙවැනි සහස්ස වර්ගය නිමි.)

---

## 3. සරකානි වර්ගය.

### 1. මා භායි මහානාම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යජනපදයෙහි කිඹුල්වත්පුරයෙහි නිග්‍රොධාරාමයෙහි වාසය කරන සේක. ඉක්බිති මහානාම ශාක්‍යතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක හුන්නේය එක්පසෙක හුන්නාවූ මහානාම ශාක්‍යතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය.

2. "ස්වාමීනි, මේ කිඹුල්වත් නුවර ආහාරපානාදියෙන් සමෘද්ධය. හැම දෙයින් සම්පූර්ණය. බොහෝ මිනිසුන්ගෙන් යුක්තය. මිනිසුන්ගෙන් අතරක් නැත. කෙළවරක් නොදත හැකි වීථීන්ගෙන් යුක්තය. ස්වාමීනි, ඒ මම වනාහි භාග්‍යවතුන් වහන්සේ හෝ සිත දියුණු කළ භික්ෂුවක් හෝ ආශ්‍රය කොට සවස් කාලයෙහි කිඹුල්වත් නුවරට ඇතුල්වන කල්හි කලබලවූ ඇතුන් ඉදිරියටද පැමිණෙමි. කලබලවූ අසුන් ඉදිරියටද පැමිණෙමි. කලබලවූ රිය ඉදිරියටද පැමිණෙමි. කලබලවූ ගැල් ඉදිරියටද පැමිණෙමි. කලබලවූ පුරුෂයකු ඉදිරියටද පැමිණෙමි. ස්වාමීනි, ඒ මට එකල්හි භාග්‍යවතුන් වහන්සේ අරබයා පවත්නා සිහිය නැතිවෙයි. ධර්මය අරබයා පවත්නා සිහිය නැතිවෙයි. සංඝයා අරබයා පවත්නා සිහිය නැතිවෙයි. ස්වාමීනි, ඒ මට ඉදින් එකල්හි කළුරිය කරන්නෙම් නම් 'මාගේ ගතිය කුමක්ද, පරලොව කුමක්දැයි' යන අදහස පහළවිය.

3. "මහානාමය, බිය නොවව. මහානාමය, බිය නොවව තොපට ලාමක නොවන්නාවූ මරණයක්, ලාමක නොවන්නාවූ

කාලක්‍රියාවක් වන්නේය. මහානාමය, යමෙකුට වනාහි බොහෝ කාලයක් ශ්‍රද්ධාවෙන් වඩනාලද සිතක් ඇත්තේද, සීලයෙන් වඩනාලද සිතක් ඇත්තේද, ශ්‍රැතයෙන් වඩනාලද සිතක් ඇත්තේද, ත්‍යාගයෙන් වඩනාලද සිතක් ඇත්තේද, ප්‍රඥාවෙන් වඩනාලද සිතක් ඇත්තේද, ඔහුගේ යම් මේ කයක් වේද එය වනාහි රූපයන්ගෙන් යුක්තය. සතර මහා භූතයන්ගෙන් හටගත්තේය. මව්පිය (ශුක්‍ර ශෝණිත) යන්ගෙන් උපන්නේය. බත් කොමු පිඩුවලින් එක්වූවකි. අනිත්‍ය ඉලීම් පිරිමැදීම්, බිඳීම් විනාශවීම් ස්වභාවයෙන් යුක්තය. ඒ කය මෙහිදීම කපුටෝ හෝ කා දමත්. ගිජුලිහිණියෝ හෝ කා දමත්. උකුස්සෝ හෝ කා දමත්. සුනඛයෝ හෝ කා දමත්. හිවල්ලු හෝ කා දමත් නොයෙකුත් සත්තු හෝ කා දමත්. බොහෝ කාලයක් මුළුල්លෙහි ශ්‍රද්ධාවෙන් වඩනා ලද සීලයෙන් වඩනාලද ශ්‍රැතයෙන් වඩනාලද ත්‍යාගයෙන් වඩනාලද ප්‍රඥාවෙන් වඩනාලද ඔහුගේ යම් සිතක්වේද එය උඩට යන්නාවූ විශෙෂයට පැමිණෙන්නාවූ සිතක් වෙයි

4. "මහානාමය, යම්සේ බලවත් පුරුෂයෙක් වනාහි ගිතෙල් සැළියක් හෝ තෙල් සැළියක් හෝ ගැඹුරුවූ දියක ගිල්වා බිඳින්නේ වේද, (එවිට) එහි යම් කැට හෝ කැබිලිති හෝ වේද, ඒ යට යන්නේය. එහි යම් ගිතෙලක් හෝ තෙලක් හෝ වේද, එය උඩට මතුවන්නේ, විශෙෂයට පැමිණෙන්නේ වේද, මහානාමය, එසේම යම් කිසිවෙකුගේ ශ්‍රද්ධාවෙන් වඩනාලද, සීලයෙන් වඩනාලද ශ්‍රැතයෙන් වඩනාලද ත්‍යාගයෙන් වඩනාලද ප්‍රඥාවෙන් වඩනාලද සිතක් වේද එය උඩට යන්නාවූ විශෙෂයට පැමිණෙන්නාවූ සිතක් වෙයි.

"ඔහුගේ මේ කය වනාහි රූපයන්ගෙන් යුක්තය. සතර මහාභූතයන්ගෙන් හටගත්තේය. මව්පිය (ශුක්‍ර ශෝණිතයන්) ගෙන් උපන්නේය. බත් කොමු පිඬුවලින් එක්වූවකි. අනිත්‍ය ඉලීම්, පිරිමැදීම්, බිඳීම්, විනාශවීම්, ස්වභාවයෙන් යුක්තය. ඒ කය මෙහිදීම කපුටෝ හෝ කා දමත්. ගිජුලිහිණියෝ හෝ කා දමත්. උකුස්සෝ හෝ කා දමත්. සුනඛයෝ හෝ කා දමත්.

හිවල්ලු හෝ කා දමත්. නොයෙකුත් සත්තු හෝ කාදමත් බොහෝ කාලයක් මුළුල්ලෙහි ශ්‍රද්ධාවෙන් වඩනා ලද සීලයෙන් වඩනාලද ශ්‍රැතයෙන් වඩනාලද ත්‍යාගයෙන් වඩනාලද ප්‍රඥාවෙන් වඩනාලද ඔහුගේ යම් සිතක්වේද එය උඩට යන්නාවූ විශෙෂයට පැමිණෙන්නාවූ සිතක් වෙයි.

5. "මහානාමය, තොපගේ සිත බොහෝ කාලයක් මුළුල්ලෙහි ශ්‍රද්ධාවෙන් වඩනා ලද්දේය. සීලයෙන් වඩනා ලද්දේය. ශ්‍රැතයෙන් වඩනා ලද්දේය. ත්‍යාගයෙන් වඩනා ලද්දේය. ප්‍රඥාවෙන් වඩනා ලද්දේය. මහානාමය, බය නොවව. මහානාමය, බය නොවව. තොපට උතුම්වූ මරණයත් උතුම්වූ කාලක්‍රියාවක් වන්නේයයි" වදාළේය.

---

## 2. යෙන නින්න මහානාම සූත්‍රය.

1, 2. (මේ ඡෙද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1, 2 වෙනි ඡෙද මෙනි)

3. "මහානාමය, බය නොවව. මහානාමය, බය නොවව. ඔබට උතුම් මරණයක්, උතුම් කාලක්‍රියාවක් වන්නේය. මහානාමය, ධර්ම සතරකින් යුක්තවූ ආර්‍ය්‍යශ්‍රාවකතෙම නිවනට නැමුණේ, නිවනට හැරුණේ, නිවනට බරවූයේ වෙයි.

4. කවර සතරකින්ද? මහානාමය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවිය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අර්හත්යහ. සම්‍යක් සම්බුද්ධයහ. විජ්ජාචරණ සම්පන්නයහ. සුගතයහ. ලොකවිදූහ. පුරුෂයන් දමනය කිරීමෙහි අති උතුම් රියැදුරෙකු හා සමානයහ. දෙව් මිනිසුන්ගේ ශාස්තෘහ. චතුරාර්‍ය්‍යසත්‍යය අවබොධ කළසේක භාග්‍යවත්හ කියායි.

"ධර්මය කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූවාහුය. 'භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට දෙශනා කරන ලද්දේය. මේ ආත්මයෙහි දෙන ඵල ඇත්තේය, කල් නොයවා

දෙන විපාක දෙන්නේය. එව බලවයි. පෙන්විය හැකි ගුණ ඇත්තේය. තමන් තුළ එළවා වැඩිය යුතු ගුණයෙන් යුක්තවූයේය. නුවණැත්තන් විසින් වෙන වෙනම දත යුත්තේය කියායි.

"සංඝයා කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූවාහුය. "භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසංඝතෙම ශාසන ප්‍රතිපත්තියෙහි මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය. නිවනට සුදුසුව පිළිපන්නේය, ගරු බුහුමනට යොග්‍යව පිළිපන්නේය. යම් මේ පුරිසයුග සතරක් වෙත්ද, පුද්ගලයන් අට දෙනෙක් වෙත්ද, මේ ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන් උදෙසා පිළියෙල කළ දෙය පිළිගැනීමට සුදුසුවූයේය. තුටු පඬුරු පිණිස පිළියෙල කළ දෙය පිළිගැන්මට සුදුසු වූයේය. කම්පල අදහා දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසු වූයේය. ඇඳිලි කිරීමට (වැඳීමට) සුදුසු වූයේය. ලෝකයාගේ උතුම් පින් කුඹුරය කියායි.

"නොකැඩුනාවූ, සිදුරුනොවූ, කබරනොවූ, කැළල්නොවූ නිදොස්වූ, නුවණ ඇත්තන් විසින් ප්‍රශංසා කරන ලද්දාවූ තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් පරාමර්ෂණය නොකරන ලද්දාවූ සමාධිය පිණිස පවත්නාවූ ආර්‍ය්‍යයන් කැමැති ශීලයෙන් යුක්ත වූයේ වෙයි කියායි.

5. මහානාමය, යම්සේ නැගෙනහිරට නැමුණාවූ නැගෙනහිරට හැරුණාවූ නැගෙනහිරට බරවූ ගසක්වේද, එය මුලින් කපන ලද්දේ කවර දිශාවට වැටෙන්නේද?

"ස්වාමීනි, යම් දිසාවකට නැමුණේවේද, යම් දිසාවකට හැරුණේ වේද, යම් දිසාවකට බරවූයේ වේද (ඒ දිසාවටය)

"මහානාමය, එසේම මේ ධර්ම සතරින් යුක්තවූ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම නිවනට නැමුණේ, නිවනට හැරුණේ, නිවනට බරවූයේ වෙයි."

---

## 3. ගොධසක්ක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යයන්ගේ ජනපදයෙහි කිඹුල්වත් නුවර

නිග්‍රොධාරාමයෙහි වාසය කරන සේක. එකල්හි මහානාම ශාක්‍යතෙම "ගොධ" නම් ශාක්‍යතෙම යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ, "ගොධ" නම් ශාක්‍යයාහට මෙය කීයේය.

2. "ගොධය, ඔබ කෙතෙක් ධර්මයකින් යුක්තවූවෙකු අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත්බවට නියතවූ මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයෙකැයි දන්නෙහිද?

"මහානාමය, මේ ධර්ම තුනකින් යුක්තවූවාහු අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත්බවට නියතවූ මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයෙකැයි දනිමි.

3. "කවර තුනකින්ද? මහානාමය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූවාහුය. මෙසේ භාග්‍යවතුන්වහන්සේ අර්හත්හ. සම්‍යක් සම්බුද්ධයහ. විජ්ජාචරණ සම්පන්නය, සුගතයහ, ලෝකවිදූහ. පුරුෂයන් දමනය කිරීමෙහි අති උතුම් රියැදුරෙකු හා සමානයහ. දෙවි මිනිසුන්ගේ ශාස්තෲහ. චතුරාර්‍ය්‍යසත්‍යය අවබොධ කළසේක. භාග්‍යවත්හ කියායි.

"ධර්මය කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්ත වූවාහුය. "භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මයතෙම මනාකොට දෙශනා කරන ලද්දේය. මේ ආත්මයෙහි දෙන ලද ඵල ඇත්තේය. කල් නොයවා දෙන විපාක දෙන්නේය. එව බලවයි පෙන්විය හැකි ගුණ ඇත්තේය. තමන් තුළ එළවා වැඩිය යුතු ගුණයෙන් යුක්තවූයේය. නුවණැත්තන් විසින් වෙන වෙනම දත යුත්තේය" කියායි.

"සංඝයා කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූවාහුය. මෙසේ "භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම (ශාසන ප්‍රතිපත්තියෙහි) මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය. නිවනට සුදුසුව පිළිපන්නේය. ගරු බුහුමනට යොග්‍යව පිළිපන්නේය. යම් මේ පුරිසයුග සතරක් වෙත්ද, පුද්ගලයන් අට දෙනෙක් වෙත්ද, මේ ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන්

උදෙසා පිළියෙල කළ දෙය පිළිගැනීමට සුදුසුවූයේය. තුටු පඬුරු පිණිස පිළියෙල කළ දෙය පිළිගැන්මට සුදුසුවූයේය. කම්පල අදහා දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසුවූසේක. ඇඳිලි කිරීමට (වැඳීමට) සුදුසු වූයේය. ලෝකයාගේ උතුම් පින් කුඹුරය කියායි.

"මහානාමය, මම මේ ධර්ම තුනින් යුක්තවූවාහු අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත්බවට නියතවූ මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ පුද්ගලයායයි දනිමි.

4. 'මහානාමය, ඔබ වනාහි කොතෙක් ධර්මයකින් යුක්තවූවාහු අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත්බවට නියතවූ මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයායයි දන්නෙහිද?

'පින්වත් ගොධය, මම වනාහි ධර්ම සතරකින් යුක්ත වූවහු අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත්බවට නියතවූ මතුමාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයායයි දනිමි.

"කවර සතරකින්ද? පින්වත් ගොධය, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවකතෙම බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූවාහුය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අර්හත්ය. සම්‍යක් සම්බුද්ධයහ. විජ්ජාචරණ සම්පන්නයහ. සුගතයහ. ලෝකවිදූහ. පුරුෂයන් දමනය කිරීමෙහි අති උතුම් රියැදුරෙකු සමානයහ. දෙව් මිනිසුන්ගේ ශාස්තෘහ. චතුරාර්‍ය්‍යසත්‍යය අවබෝධ කළසේක භාග්‍යවත්හ කියායි.

"ධර්මයන් කෙරෙහි අචලප්‍රසාදයෙන් යුක්තවූවාහුය. "ධර්මයතෙම භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට දෙශනා කරන ලද්දේය. මේ ආත්මයෙහි දෙන ඵල ඇත්තේය. කල්නොයවා විපාක දෙන්නේය. එව බලවයි පෙන්වියහැකි ගුණ ඇත්තේය. තමන් තුළ එළවා වැඩියයුතු ගුණයෙන් යුක්තවූයේය. නුවණැත්තන් විසින් වෙන වෙනම දතයුත්තේය කියායි.

"සංඝයා කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූවාහුය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම ශාසන ප්‍රතිපත්තියෙහි මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය.

නිවනට සුදුසුව පිළිපන්නේය. ගරුබුහුමනට යොග්‍යව පිළිපන්නේය. යම් මේ පුරිස යුගසතරක් වෙත්ද, පුද්ගලයන් අටදෙනෙක් වෙත්ද මේ ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන් උදෙසා පිළියෙළකළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. තුටු පඬුරු පිණිස පිළියෙල කළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. කම්පල අදහා දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසු වූයේය. ඇඳිලිකිරීමට (වැඳීමට) සුදුසු වූයේය. ලෝකයාගේ උතුම් පින් කෙතය කියායි.

“නොකැඩුනාවූ, සිදුරුනොවූ, කබරනොවූ, කැළල්නොවූ, නිදොස්වූ, නුවණ ඇත්තන් විසින් ප්‍රශංසා කරන ලද්දාවූ, තෘෂ්ණා දෘෂ්ටීන් විසින් පරාමර්ෂණය නොකරන ලද්දාවූ, සමාධිය පිණිස පවතින්නාවූ, ආයර්‍ය්‍යයන් කැමැති ශීලයෙන් යුක්තවූයේ වෙයි කියායි.

**5.** “ගොධය, මම මේ ධර්ම සතරින් යුක්තවූවහු වනාහි අපායෙහි නොවැටෙන ස්වභාව ඇත්තාවූ රහත්බවට නියතවූ මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයායයි දනිමි.

**6.** “මහානාමය, ඔබ නවතිනු මැනව. මහානාමය, ඔබ නවතිනු මැනව. මේ ධර්මයන්ගෙන් යුක්තවූවකු බව හෝ යුක්තනොවූවකු බව හෝ භාග්‍යවතුන් වහන්සේම දන්නාසේක.

**7.** “ගොධය, යමු. භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට යමු. ගොස්, භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කියන්නෙමුයි” කීය.

**8.** ඉක්බිති මහානාම ශාක්‍යතෙමේද, ගොධ ශාක්‍ය තෙමේද භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක් පසෙක හුන්නාහුය. එක්පසෙක හුන්නාවූ මහානාම ශාක්‍ය තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය.

**9.** “ස්වාමීනි, මම ගොධ ශාක්‍යතෙම යම් තැනෙක්හිද එතැනට ගියෙමි. ගොස් ගොධ ශාක්‍යයාහට මෙසේ කීවෙමි. ‘ගොධය, නුඹ කෙතෙක් ධර්මයකින් යුක්තවූවහු අපායෙහි

නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත්බවට මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සොවාන් පුද්ගලයායයි දන්නෙහිද? ස්වාමීනි, මෙසේ කී කල්හි ගොධ ශාක්‍යතෙම මට මෙය කීයේය. “මහානාමය, මම වනාහි ධර්ම තුනකින් යුක්තවූවහු අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත්බවට නියතවූ මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයායයි දනිමි.

“කවර තුනකින්ද? මහානාමය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූවාහුය මෙසේ භාග්‍යවතුන් වහන්සේ අර්හත්යහ. සම්‍යක් සම්බුද්ධයහ. විජ්ජාචරණ සම්පන්නයහ. සුගතයහ, ලෝකවිදූහ, පුරුෂයන් දමනය කිරීමෙහි අති උතුම් රියැදුරෙකු හා සමානයහ. දෙව් මිනිසුන්ගේ ශාස්තෲහ. චතුරාර්‍ය්‍යසත්‍යය අවබොධ කළසේක භාග්‍යවත්හ කියායි.

“ධර්මය කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූවාහුය. භාග්‍යවතුන් වහන්සේ විසින් ‘ධර්මයතෙම මනාකොට දෙශනා කරන ලද්දේය. මේ ආත්මයෙහි දෙන ලද ඵල ඇත්තේය. කල් නොයවා දෙන විපාක දෙන්නේය. එව, බලවයි, පෙන්විය හැකි ගුණ ඇත්තේය. තමන් තුළ එළවා වැඩිය යුතු ගුණයෙන් යුක්තවූයේය. නුවණැත්තන් විසින් වෙන වෙනම දතයුත්තේය කියායි.

“සංඝයා කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්ත වූවාහුය. ‘භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම ශාසන ප්‍රතිපත්තියෙහි මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය. නිවනට සුදුසුව පිළිපන්නේය. ගරු බුහුමනට යොග්‍යව පිළිපන්නේය. යම් මේ පුරිසයුග සතරක් වෙත්ද, පුද්ගලයන් අටදෙනෙක් වෙත්ද, මේ ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන් උදෙසා පිළියෙල කළ දෙය පිළිගැනීමට සුදුසුවූයේය. තුටු පඬුරු පිණිස පිළියෙල කළ දෙය පිළිගැන්මට සුදුසුවූයේය. කම්පල අදහා දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසුවූසේක. ඇඳිලි කිරීමට (වැඳීමට) සුදුසු වූයේය. ලෝකයාගේ උතුම් පින් කුඹුරය, කියායි.

"මහානාමය, මම මේ ධර්ම තුනකින් යුක්තවූවහු අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත්බවට නියතවූ මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයායයි දනිමියි' කීය.

"මහානාමය, නුඹ වනාහි ධර්ම කීයෙකින් යුක්තවූවහු අපායෙහි නොවැටෙන ස්වභාවය ඇති රහත්බවට නියතවූ මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සොවාන් පුද්ගලයෙකැයි දන්නෙහිදැයි' ඇසීය.

**10.** "ස්වාමීනි, මෙසේ කී කල්හි මම ගොධ ශාක්‍යයාහට මෙසේ කීයෙමි. 'ගොධය, මම ධර්ම සතරකින් යුක්තවූවහු අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත්බවට නියතවූ මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සොවාන් පුද්ගලයෙකැයි දනිමියි කීවෙමි.

කවර සතරකින්ද? ගොධය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූවාහුය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අර්හත්හ. සම්‍යක් සම්බුද්ධයහ, විජ්ජාචරණ සම්පන්නයහ, සුගතයහ, ලෝකවිදූහ. පුරුෂයන් දමනය කිරීමෙහි අති උතුම් රියැදුරෙකු හා සමානයහ, දෙව් මිනිසුන්ගේ ශාස්තෘහ. චතුරාර්‍ය්‍ය සත්‍යය අවබොධ කළසේක, භාග්‍යවත් වෙයි, කියායි.

"ධර්මය කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්ත වූවාහුය. 'ධර්මතෙම භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට දෙශනා කරන ලද්දේය. මේ ආත්මයෙහි දෙන ලද ඵල ඇත්තේය. කල් නොයවා දෙන විපාක දෙන්නේය. එව බලවයි පෙන්විය හැකි ගුණ ඇත්තේය. තමන් තුළ එළවා වැඩිය යුතු ගුණයෙන් යුක්තවූයේය. නුවණැත්තන් විසින් වෙන වෙනම දත යුත්තේය' කියායි.

"සංඝයා කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්ත වූවාහුය. 'භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම ශාසන ප්‍රතිපත්තියෙහි මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය.

නිවනට සුදුසුව පිළිපන්නේය, ගරු බුහුමනට යොග්‍යව පිළිපන්නේය. යම් මේ පුරිසයුග සතරක් වෙත්ද, පුද්ගලයන් අටදෙනෙක් වෙත්ද, මේ ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන් උදෙසා පිළියෙළ කළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. තුටුපඬුරු පිණිස පිළියෙල කළ දෙය පිළිගැන්මට සුදුසු වූයේය. කම්ඵල අදහා දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසු වූයේය. ඇඳිලි කිරීමට (වැඳීමට) සුදුසුවූයේය. ලෝකයාගේ උතුම් පින්කුඹුරය' කියායි.

"නොකැඩුනාවූ, සිදුරුනොවූ, කබරනොවූ, කැළල් නොවූ නිදොස්වූ, නුවණ ඇත්තන් විසින් ප්‍රශංසා කරන ලද්දාවූ, තෘෂ්ණා දෘෂ්ටීන් විසින් පරාමර්ෂණය නොකරන ලද්දාවූ, සමාධිය පිණිස පවතින්නාවූ ආර්‍ය්‍යයන් කැමැති ශීලයෙන් යුක්තවූයේ වෙයි.

"ගොධය, මම මේ ධර්ම සතරින් යුක්තවූවහු අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත්බවට නියතවූ මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සොවාන් පුද්ගලයායයි දනිමි යනුයි.

11. "ස්වාමීනි, මෙසේ කී කල්හි ගොධ ශාක්‍යතෙම මට මෙය කීයේය. 'මහානාමය. ඔබ නැවතුන මැනවි. මහානාමය, ඔබ නැවතුන මැනවි. මේ ධර්මයන්ගෙන් යුක්තවූවෙකු බව හෝ යුක්ත නොවූවෙකු බව හෝ භාග්‍යවතුන් වහන්සේම දන්නා සේක' කියායි.

12. "ස්වාමීනි, මෙහිදී කිසියම් ධර්ම කාරණයක් උපදින්නේය. එහි භාග්‍යවතුන් වහන්සේ එක් පැත්තක වන්නාහුද භික්ෂු සංඝයා එක්පැත්තක වන්නේද භාග්‍යවතුන් වහන්සේ යම් පැත්තක වන්නේ නම් මමද ඒ පැත්තෙහි වන්නෙමි. ස්වාමීනි, මා මෙසේ පැහැදුණෙකැයි භාග්‍යවතුන් වහන්සේ දරණසේක්වා.

13. "ස්වාමීනි, මෙහිදී කිසියම් ධර්ම කාරණයක් උපදින්නේය. එහි භාග්‍යවතුන් වහන්සේ එක් පැත්තක වන්නාහුද භික්ෂු සංඝයා එක් පැත්තක වන්නේද භික්ෂුණී සංඝයා එක් පැත්තක වන්නේද භාග්‍යවතුන් වහන්සේ යම් පැත්තක නම්

මමද ඒ පැත්තෙහි වන්නෙමි. ස්වාමීනි, මා මෙසේ පැහැදුණෙකැයි භාග්‍යවතුන් වහන්සේ දරණ සේක්වා.

14. "ස්වාමීනි, මෙහිදී කිසියම් ධර්ම කාරණයක් උපදින්නේය. එහි භාග්‍යවතුන් වහන්සේ එක් පැත්තක වන්නාහුද භික්ෂු සංඝයා එක් පැත්තක වන්නේද භික්ඛුණී සංඝයා එක් පැත්තක වන්නේද උපාසකයෝ එක් පැත්තක වන්නාහුද භාග්‍යවතුන් වහන්සේ යම් පැත්තක නම් මමද ඒ පැත්තෙහි වන්නෙමි. ස්වාමීනි, මා මෙසේ පැහැදුණෙකැයි භාග්‍යවතුන් වහන්සේ දරණසේක්වා.

15. "ස්වාමීනි, මෙහිදී කිසියම් ධර්ම කාරණයක් උපදින්නේය. එහි භාග්‍යවතුන් වහන්සේ එක් පැත්තක වන්නාහුද භික්ෂු සංඝයා එක් පැත්තක වන්නේද භික්ඛුණී සංඝයා එක් පැත්තක වන්නාහුද උපාසකයෝ එක් පැත්තක වන්නාහුද උපාසිකාවෝ එක් පැත්තක වන්නාහුද භාග්‍යවතුන්වහන්සේ යම් පැත්තක නම් මමද ඒ පැත්තෙහි වන්නෙමි. ස්වාමීනි, මා මෙසේ පැහැදුණෙකැයි භාග්‍යවතුන් වහන්සේ දරණ සේක්වා.

16. "ස්වාමීනි, මෙහිදී යම්කිසි ධර්ම කාරණයක් උපදින්නේය. එහි භාග්‍යවතුන් වහන්සේ එක් පැත්තක වන්නාහුද භික්ෂු සංඝයා එක් පැත්තක වන්නේද භික්ඛුණී සංඝයා එක් පැතතක වන්නාහුද උපාසකයෝ එක් පැත්තක වන්නාහුද උපාසිකාවෝ එක් පැත්තක වන්නාහුද දෙවියන් සහිතවූ මරුන් සහිතවූ මහණ බමුණන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ සත්වලොකයාද එක් පැත්තක වන්නේද භාග්‍යවතුන් වහන්සේ යම් පැත්තක නම් මමද ඒ පැත්තෙහි වන්නෙමි. ස්වාමීනි, මා මෙසේ පැහැදුණෙකැයි භාග්‍යවතුන් වහන්සේ දරණසේක්වා.

17. "ගොධය, මෙසේ කියන්නාවූ මහානාම ශාක්‍යයාහට නුඹ කුමක් කියන්නෙහිද?

"ස්වාමීනි, මෙසේ කියන්නාවූ මහානාම ශාක්‍යයාහට මම යහපත්ය, දක්ෂය, කීම හැර අන් කිසිවක් නොකියමියි" කීයේය.

---

## 4. පඨම සරකානි සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත් නුවර නීග්‍රොධාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි සරකානි නම් ශාක්‍යතෙම කාලක්‍රියා කෙළේය භාග්‍යවතුන් වහන්සේ විසින් හෙතෙම අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත් බවට නියතවූ මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයෙකැයි වදාරණලදී.

2. "එහිදී බොහෝ ශාක්‍යයෝ එක්ව රැස්ව, මෙසේ දොස් කියත්, ගර්හා කරත්, බැණවදිත් කෙසේද? පින්වතුනි, ආශ්චර්‍ය්‍යයකි පුදුමයකි. සාරකානි ශාක්‍යතෙම කළුරිය කෙළේය. භාග්‍යවතුන් වහන්සේ විසින් හෙතෙම අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත් බවට නියතවූ මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයෙකැයි ප්‍රකාශ කරනලදී. එසේ නම් මෙහි කවරෙක් සෝවාන් වූවෙක් නොවන්නේද? සරකානි ශාක්‍යතෙම ශීලයෙන් දුර්වලවූ මත්පැන් පානය කරන්නෙක් විය යනුවෙනි."

3. ඉක්බිති මහානාම ශාක්‍යතෙම භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන් මහානාම ශාක්‍යතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, මෙහි සරකානි ශාක්‍යතෙම කළුරිය කෙළේය. භාග්‍යවතුන් වහන්සේ විසින් හෙතෙම අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත් බවට නියතවූ මතු මාර්ගත්‍රය පිහිට කොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයෙකැයි වදාරණලදී.

"ස්වාමීනි, එහි බොහෝ ශාක්‍යයෝ එක්ව රැස්ව මෙසේ දොස් කියත්, ගර්හා කරත්, බැණ වදිත්. කෙසේද? පින්වත්නි, ආශ්චර්‍ය්‍යයකි, පුදුමයකි. සරකානි ශාක්‍යතෙම කළුරිය කෙළේය. භාග්‍යවතුන් වහන්සේ විසින් හෙතෙම අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත් බවට නියතවූ මතුමාර්ගත්‍රය පිහිට

කොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයෙකැයි ප්‍රකාශ කරන ලදී. එසේ නම් මෙහි කවරෙක් සෝවාන් වූවෙක් නොවන්නේද? සරකානි ශාක්‍යතෙම ශීලයෙන් දුර්වලවූ මත්පැන් පානය කරන්නෙක් විය යනුවෙනි.”

4. “මහානාමය, යම් ඒ උපාසකයෙක් තෙම බොහෝ කාලයක් මුළුල්ලෙහි බුදුන් සරණකොට ගියේ වේද, ධර්මය සරණකොට ගියේ වේද, සංඝයා සරණකොට ගියේ වේද, හෙතෙම කෙසේ අපායට යන්නේද? මහානාමය, යමෙකුට වනාහි බොහෝ කාලයක් මුළුල්ලෙහි බුදුරජාණන් වහන්සේ සරණකොට ගියාවූ, ධර්මය සරණකොට ගියාවූ සංඝයා සරණකොට ගියාවූ උපාසකයෙකැයි මනාව කියන්නේ නම් සරකානි ශාක්‍යයාහට මනාකොට කියන්නේය. මහානාමය, සරකානි ශාක්‍යතෙම බොහෝ කාලයක් මුළුල්ලෙහි බුදුන් සරණ ගියාවූ ධර්මය සරණ ගියාවූ සංඝයා සරණ ගියාවූ උපාසකයෙක් වන්නේය. හෙතෙම කෙසේ අපායට යන්නේද?

5. “මහානාමය, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් බුදුන් කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයිද, (මෙහි මේ වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 4 වෙනි ඡේදයේ බුදුගුණ, දහම් ගුණ, සඟගුණ කොටස් යොදන්න.) මහත් නුවණින් යුක්ත වූයේද තියුණු නුවණින් යුක්ත වූයේ වෙයිද, අර්හත් ඵලයෙන් යුක්ත වූයේ වෙයිද, හෙතෙම ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත් ඵල සමාධියත් අර්හත් ඵල ප්‍රඥාවත් මේ ආත්මයෙහිදීම තෙමේ දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ, වාසය කෙරෙයි.

මහානාමය, මේ පුද්ගලතෙමේද, නිරයෙන් මිදුනේ, තිරිසන් යොනියෙන් මිදුනේ, ප්‍රෙත විෂයෙන් මිදුනේ, නපුරු ගති ඇති, විෂමවූ වැටීම් ඇති අපායෙන් මිදුනේ වෙයි.

6. “මහානාමය, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් බුදුන් කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූයේම වෙයිද, (මෙහි මේ වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 4 වෙනි ඡේදයේ බුදුගුණ, දහම්ගුණ, සඟගුණ කොටස් යොදන්න) මහත් නුවණ ඇත්තේ තියුණු

නුවණ ඇත්තේ අර්හත් ඵලයෙන් යුක්ත නොවූයේ වෙයිද හෙතෙම පඤ්චවිධවූ ඔරම්භාගිය සංයොජනයන් ක්ෂය කිරීමෙන් ඕපපාතිකව එහිදී පිරිනිවන් පාන්නාවූ ඒ බඹලොවින් නැවත නොඑන ස්වභාවය ඇතියෙක් වෙයි. මහානාමය, මේ පුද්ගල තෙමේද, නිරයෙන් මිදුනේ, තිරිසන් යොනියෙන් මිදුනේ, ප්‍රේත විෂයෙන් මිදුනේ, නපුරු ගති ඇති, විෂමවූ වැටීම් ඇති, අපායෙන් මිදුනේ වෙයි.

7. "මහානාමය, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් බුදුන් කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූයේම වෙයිද (මෙහි මේ වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 4 වෙනි ඡේදයේ බුදුගුණ, දහම්ගුණ, සඟගුණ කොටස් යොදන්න.) මහත් නුවණින් යුක්ත නොවූයේ, තියුණු නුවණින් යුක්ත නොවූයේ අර්හත් ඵලයෙන් යුක්ත නොවූයේ වේද, හෙතෙම ත්‍රිවිධ සංයෝජනයන් ක්ෂය කිරීමෙන් රාග-ද්වෙෂ-මොහයන් තුනී කිරීමෙන් මේ ලෝකයට එක් වරක් පමණක් අවුත් දුක් කෙළවර කෙරෙයි. මහානාමය, මේ පුද්ගල තෙමේද නිරයෙන් මිදුනේ, තිරිසන් යොනියෙන් මිදුනේ, ප්‍රේතවිෂයෙන් මිදුනේ නපුරු ගති ඇති, විෂමවූ වැටීම් ඇති, අපායෙන් මිදුනේ වෙයි.

8. "මහානාමය, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙම බුදුන් කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූයේම වෙයිද, (මෙහි මේ වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 4 වෙනි ඡේදයේ බුදුගුණ, දහම්ගුණ, සඟගුණ කොටස් යොදන්න.) මහත් නුවණින් යුක්ත නොවූයේ තියුණු නුවණින් යුක්ත නොවූයේ අර්හත් ඵලයෙන් යුක්තනොවූයේ වේද හෙතෙම සංයෝජන තුනක් ක්ෂය කිරීමෙන් අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ, රහත් බවට නියතවූ, මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයෙක් වෙයි. මහානාමය, මේ පුද්ගල තෙමේද නිරයෙන් මිදුනේ, තිරිසන් යොනියෙන් මිදුනේ ප්‍රේතවිෂයෙන් මිදුනේ, නපුරු ගති ඇති, විෂමවූ වැටීම් ඇති අපායෙන් මිදුනේ වෙයි.

9. "මහානාමය, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙම බුදුන් කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්ත නොවූයේම වෙයිද,

ධර්මය කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තනොවූයේම වෙයිද, සංඝයා කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්ත නොවූයේ වෙයිද, මහත් නුවණින් යුක්තනොවූයේ, තියුණු නුවණින් යුක්ත නොවූයේ අර්හත් ඵලයෙන් යුක්ත නොවූයේත් වේද, එහෙයින් සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යන මේ ධර්මයෝ වෙත්ද, තථාගතයන් වහන්සේ විසින් වදාරණ ලද්දාවූ ධර්මයෙන් නුවණින් ප්‍රමාණකොට බලත්ද, මහානාමය, මේ පුද්ගලතෙමේද නිරයට නොයන්නේ, තිරිසන් යොනියට නොයන්නේ, ප්‍රේතවිෂයට නොයන්නේ, විෂමවූ වැටීම් ඇති දුර්ගති නම් ලත් අපායට නොයන්නේ වෙයි.

10. "මහානාමය, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙම වනාහි බුදුන් කෙරෙහි අචලප්‍රසාදයෙන් යුක්ත නොවූයේ වෙයිද, ධර්මය කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තනොවූයේ වෙයිද, සංඝයා කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තනොවූයේ වෙයිද, මහත් ප්‍රඥාවෙන් යුක්ත නොවූයේ තියුණු ප්‍රඥාවෙන් යුක්ත නොවූයේ. අර්හත් ඵලයෙහි යුක්ත නොවූයේත් වෙයිද එහෙත් සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය සහ පඤ්ඤින්ද්‍රිය යන මේ ධර්මයෝ වෙත්ද තථාගතයන් කෙරෙහි ශ්‍රද්ධා මාත්‍රයක් ප්‍රෙම මාත්‍රයක් ඇත්තේද තථාගතයන් වහන්සේ විසින් වදාරණලද ධර්මයන් නුවණින් ප්‍රමාණකොට බලත්ද මහානාමය, මේ පුද්ගල තෙමේද, නිරයට නොයන්නේ තිරිසන් යෝනියට නොයන්නේ, ප්‍රෙතවිෂයට නොයන්නේ, විෂම වූ පතිතවීම් ඇති දුර්ගති නම් ලත් අපායට නොයන්නේ වෙයි.

11. "මහානාමය, මේ මහ සල්ගස් ඉදින් සුභාෂිත දුර්භාෂිත දනිත් නම් මේ සල්ගස්පවා අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත්බවට නියතවූ මතු මාර්ගත්‍රය පිහිට කොට ඇත්තාවූ සෝවාන් වූවෝයයි මම ප්‍රකාශ කරන්නෙමි. සරකානි ශාක්‍යයා ගැන කියනුම කවරේද? මහානාමය, සරකානි ශාක්‍යතෙම වනාහි මැරෙන කාලයෙහි ත්‍රිවිධ ශික්ෂාව සම්පූර්ණ කෙළේයයි" (වදාළසේක.)

## 5 දුතිය සරකානි සූත්‍රය.

1. (මේ ඡේදය මේ වර්ගයේ 4 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡේදය මෙනි)

2. එහිදී බොහෝවූ ශාක්‍යයෝ එක්ව, රැස්ව, මෙසේ දොස් කියත්, ගර්හා කරත්. බැණවදිත්, කෙසේද, පින්වතුනි, ආශ්චර්‍ය්‍යයකි. පුදුමයකි. සරකානි ශාක්‍යතෙම කළුරිය කෙළේය. භාග්‍යවතුන් වහන්සේ විසින් හෙතෙම අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත්බව නියතවූ මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයෙකැයි ප්‍රකාශ කරනලදී. එසේනම් මෙහි කවරෙක් සෝවාන්වූවෙක් නොවන්නේද? සරකානි ශාක්‍යතෙම සීලය සම්පූර්ණ කරන්නෙක් නොවීය කියායි.

3. ඉක්බිති මහානාම ශාක්‍යතෙම භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන් මහානාම ශාක්‍යතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. " ස්වාමීනි, මෙහි සරකානි ශාක්‍යතෙම කළුරිය කෙළේය. භාග්‍යවතුන් වහන්සේ විසින් හෙතෙම අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත් බවට නියතවූ මතු මාර්ගත්‍රය පිහිට කොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයෙකැයි වදාරණලදී.

"ස්වාමීනි, එහි බොහෝ ශාක්‍යයෝ එක්ව රැස්ව මෙසේ දොස් කියත්, ගර්හා කරත්, බැණවදිත්. කෙසේද? පින්වත්නි, ආශ්චර්‍ය්‍යයකි, පුදුමයකි. සරකානි ශාක්‍යතෙම කළුරියකෙළේය. භාග්‍යවතුන් වහන්සේ විසින් හෙතෙම අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ රහත්බවට නියතවූ මතු මාර්ගත්‍රය පිහිට කොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයෙකැයි ප්‍රකාශ කරන ලදී. එසේ නම් මෙහි කවරෙක් සෝවාන් වූවෙක් නොවන්නේද? සරකානි ශාක්‍යතෙම සීලය සම්පූර්ණ නොකෙළෙක් විය කියායි.

4. (මේ ඡේදය මේ වර්ගයේ 4 වෙනි සූත්‍රයේ 4 වෙනි ඡේදය මෙනි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**5-10.** (මේ ඡේදයන්හි ඇති "අචල ප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයි." යන්න මෙහිදී "ස්ථිරගති ඇත්තෙක්, අතිශයින් ප්‍රසන්න වූයෙක් වෙයි" කියා වෙනස්කොට මේ වර්ගයේ 4 වෙනි සූත්‍රයේ 5-10 ඡේද යොදාගන්න.)

11. "මහානාමය, යම්සේ වනාහි නොනසන ලද කටු කොහොල් ඇත්තාවූ විෂමවූ කෙතක් විෂමවූ භූමියක් වෙයිද කැඩුනාවූ කුණුවූ වාතයට සහ අව්වට අසුවූ හරය නැත්තාවූ මනාකොට නොතබන ලද්දාවූ බීජයෝ වන්නාහුද, වැස්ස මනාව වසින්නේය. එහෙත් ඒ බීජයෝ වැඩීමට හැදීමට මහත් බවට පැමිණෙන්නාහුද? ස්වාමීනි, එය නොවේමය.

12. "මහානාමය, එසේම මේ ලොකයෙහි ධර්මය නපුරු කොට කියන ලද්දේද නපුරු කොට ප්‍රකාශ කරන ලද්දේද නෛර්‍යාණික නොවන්නේද සංසිඳීම පිණිස නොපවත්නේද සම්‍යක්සම්බුද්ධ නොවූවකු විසින් ප්‍රකාශ කරන ලද්දේද ඒ ධර්මය මම විෂම ක්ෂෙත්‍රයෙහිලා කියමි. ඉදින් ඒ ධර්මයෙහි ශ්‍රාවක තෙම ධර්මානුකූල ප්‍රතිපත්තියෙහි පිළිපදිමින් ගෞරවයට සුදුසුසේ පිළිපදිමින් ධර්මය අනුව හැසිරෙමින් වාසය කෙරෙයිද මම එය අයහපත් බීජයයි කියමි.

13. 'මහානාමය, යම්සේ වනාහි නසනලද කටු කොහොල් ඇත්තාවූ යහපත් කෙතක්, යහපත් භූමියක් වෙයිද, කඩනොවූ, කුණු නොවූ, වාතයට සහ අව්වට අසුනොවූ හරය ඇත්තාවූ, මනාකොට තබන ලද්දාවූ බීජයෝ වෙත්ද, වැසිද මනාව වසින්නේය. ඒ බීජයෝ වැඩීමට හැදීමට මහත් බවට පැමිණෙන්නාහුද?"-"එසේය ස්වාමීනි"

14. "මහානාමය, එසේම මේ ලොකයෙහි ධර්මය තෙම මනාකොට කියන ලද්දේද, මනාකොට ප්‍රකාශකරන ලද්දේද නෛර්‍යාණික වේද, සංසිඳීම පිණිස පවත්නේද සම්‍යක් සම්බුදු කෙනකු විසින් වදාරන ලද්දේද මම එය යහපත් කෙතයයි කියමි. ඉදින් ඒ ධර්මයෙහි ශ්‍රාවකතෙම ධර්මයට අනුකූල ප්‍රතිපත්තියෙහි පිළිපදිමින් ගෞරවයට සුදුසුසේ පිළිපදිමින් ධර්මය අනුව හැසිරෙමින් වාසය කෙරෙයිද, මෙය මම යහපත්

බීජයයි කියමි. සරකානි ශාක්‍යයා ගැන කියනුම කවරේද? මහානාමය සරකානි ශාක්‍යතෙම මැරෙන කාලයෙහි ශික්ෂාව සම්පූර්ණ කෙළේ වීය."

## 6 ආබාධික අනාථ පිණ්ඩික සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එසමයෙහි වනාහි අනාථපිණ්ඩික ගෘහපති තෙම ලෙඩවූයේ දුකට පත්වූයේ බලවත් සේ ගිලන්වූයේ විය. ඉක්බිති අනාථපිණ්ඩික ගෘහපති තෙම එක්තරා පුරුෂයෙකුට කථා කෙළේය. 'පින්වත් පුරුෂය, නුඹ මෙහි එව. ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම්තැනෙක්හිද, එතැනට යව. ගොස් මාගේ වචනයෙන් ආයුෂ්මත් සාරිපුත්‍රස්ථවිරයන් වහන්සේගේ දෙපා හිසින් වඳුව. ස්වාමීනි, අනාථපිණ්ඩික ගෘහපති තෙම රොගාතුරව දුක් සහිතව දැඩිගිලන්ව වෙසෙයි. හෙතෙම ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ දෙපා සිරසින් වදියි' කියායි. මෙසේත් කියව. ස්වාමීනි, ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ අනාථ පිණ්ඩික ගෘහපතිහුගේ ගෙදර යම් තැනෙක්හිද, එතැනට අනුකම්පා කර වඩිනසේක් නම් යහපත කියායි.

2. "එසේය ස්වාමීනියි කියා ඒ පුරුෂතෙම අනාථ පිණ්ඩික ගෘහපතිහට උත්තරදී ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ඒ පුරුෂතෙම ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය.

3. "ස්වාමීනි, අනාථපිණ්ඩික ගෘහපතිතෙම ලෙඩව දුකට පැමිණ බලවත්සේ ගිලන්ව වාසය කරයි. හෙතෙම ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ පාදයන් සිරසින් වදියි. මෙසේත් කියයි. ස්වාමීනි ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ අනාථපිණ්ඩික ගෘහපතියාගේ ගෙදර යම් තැනෙක් හිද,

අනුකම්පාකර එහි වඩිනසේක් නම් යහපති" යනුයි. ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ තුෂ්ණීම් භාවයෙන් ඉවසූසේක.

4. "ඉක්බිති ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරතෙම උදේ කාලයෙහි හැඳ පාත්‍ර සිවුරු ගෙන, පසුව යන ශ්‍රමණයන් වශයෙන් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් කැටුව අනාථපිණ්ඩික ගෘහපතිහුගේ ගෙය යම් තැනෙක්හිද එහි වැඩියේය. වැඩ, පණවනලද ආසනයෙහි වැඩ උන්නේය. වැඩ උන්නාවූ ආයුෂ්මත් සාරිපුත්ත ස්ථවිරයන් වහන්සේ අනාථ පිණ්ඩික ගෘහපතිහට මෙය කීහ.

5. "ගෘහපතිය, කිම නුඹට ඉවසිය හැකිද? කිම යැපිය හැකිද? කිම දුක්වේදනාවෝ සංසිඳෙත්ද? නොවැඩෙත්ද? සංසිඳෙන සැටියක් පෙනේද? වැඩීමක් නොපෙනේද?"

"ස්වාමීනි, මට ඉවසිය නොහැක. යැපිය නොහැක. මාගේ බලවත් දුක්වේදනාවෝ වැඩෙත්. නොසංසිඳෙත්. වැඩෙන සැටියක් පෙනේ. සංසිඳෙන සැටියක් නොපෙනේ.'

6. "ගෘහපතිය, බුදුරජාණන්වහන්සේ කෙරෙහි යම්බඳු නොපැහැදීමකින් යුක්තවූ අශ්‍රැතවත් පෘථග්ජනතෙම වනාහි කය බිඳීමෙන් මරණින් මතු පහවූ සැප ඇති, විෂමවූ වැටීම් ඇති, නරකයෙහි උපදීද තොපට එබඳුවූ ඔවුන්ගේ බුදුරජාණන් වහන්සේ කෙරෙහි නොපැහැදීමක් නැතද ගෘහපතිය, තොපහට බුදුරජාණන් වහන්සේ කෙරෙහිවූ අචල ප්‍රසාදයක් ඇත්තේය.

"මෙසේ භාග්‍යවතුන් වහන්සේ අර්හත්ය. සම්‍යක් සම්බුද්ධයහ. විජ්ජාචරණ සම්පන්නයහ. සුගතයහ. ලෝකවිදූහ. පුරුෂයන් දමනය කිරීමෙහි අති උතුම් රියැදුරෙකු හා සමානයහ. දෙවිමිනිසුන්ගේ ශාස්තෲහ. චතුරාර්‍ය්‍යසත්‍යය අවබොධ කළසේක. භාග්‍යවත්හ කියායි.

බුදුරජාණන් වහන්සේ කෙරෙහිවූ ඒ අචල ප්‍රසාදය තමා කෙරෙහි දක්නාවූ තොපගේ ඒ වේදනාව ක්ෂණයකින් සංසිඳෙන්නේය.

7. "ගෘහපතිය, ධර්මය කෙරෙහි යම්බඳුවූ නොපැහැදීමකින් යුත් අශ්‍රැතවත් පෘථග්ජනතෙම වනාහි කය බිඳීමෙන් මරණින්

මතු පහවූ සැප ඇති විෂමවූ වැටීම් ඇති, නරකයෙහි උපදීද තොපට එබඳුවූ ධර්මය කෙරෙහි නොපැහැදීමක් නැතද ගෘහපතිය, තොපට ධර්මය කෙරෙහි අචල ප්‍රසාදයක් ඇත්තේය.

"ධර්මයන් කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූවාහුය. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට දේශනා කරන ලද්දේය. මේ ආත්මයෙහි දෙන ඵල ඇත්තේය. කල් නොයවා විපාක දෙන්නේය. එව බලවයි, පෙන්විය හැකි ගුණ ඇත්තේය. තමන් තුළ එළවා වැඩිය යුතු ගුණයෙන් යුක්තවූයේය. නුවණැත්තන් විසින් වෙන වෙනම දත යුත්තේය කියායි.

"ධර්මය කෙරෙහිවූ ඒ අචලප්‍රසාදය තමා කෙරෙහි දකින්නාවූ තොපගේ ඒ වේදනාව ක්ෂණයකින් සංසිඳෙන්නේය.

8. "ගෘහපතිය, සංඝයා කෙරෙහි යම්බඳුවූ නොපැහැදීමකින් යුක්තවූ අශ්‍රැතවත් පෘථග්ජනතෙම වනාහි කය බිඳීමෙන් මරණින් මතු පහවූ සැප ඇති, විෂමවූ වැටීම් ඇති, නරකයෙහි උපදියිද, තොපට එබඳුවූ සංඝයා කෙරෙහි නොපැහැදීමක් නැතද ගෘහපතිය, තොපට සංඝයා කෙරෙහි අචල ප්‍රසාදයක් ඇත්තේය.

"භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම ශාසන ප්‍රතිපත්තියෙහි මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය. නිවනට සුදුසුව පිළිපන්නේය. ගරුබුහුමනට යොග්‍යව පිළිපන්නේය. යම් මේ පුරිසයුග සතරක් වෙත්ද, පුද්ගලයන් අටදෙනෙක් වෙත්ද, මේ ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන් උදෙසා පිළියෙල කළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. කම්පල අදහා දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසුවූ සේක. ඇඳිලි කිරීමට (වැඳීමට) සුදුසු වූයේය ලොකයාගේ උතුම් පිංකුඹුරය" කියායි. සංඝයා කෙරෙහිවූ ඒ අචල ප්‍රසාදය තමා කෙරෙහි දකින්නාවූ තොපගේ ඒ වේදනාව ක්ෂණයකින් සංසිඳෙන්නේය.

9. "ගෘහපතිය, යම්බඳුවූ දුශ්ශීල භාවයකින් යුක්තවූ අශ්‍රැතවත් පෘථග්ජනතෙම වනාහි කය බිඳීමෙන් මරණින් මතු පහවූ සැප ඇති, විෂමවූ වැටීම් ඇති, නරකයෙහි උපදියිද තොපහට එබඳුවූ දුශ්ශීල භාවයක් නැත්තේය. ගෘහපතිය,

තොපහට කඩනොවූ සිදුරු නොවූ, කබරනොවූ, කැළල් නොවූ, නිදොස්වූ, නුවණ ඇත්තන් විසින් ප්‍රශංසා කරන ලද්දාවූ තෘෂ්ණාදෘෂ්ටීන් පරාමර්ෂණය නොකරන ලද්දාවූ සමාධිය පිණිස පවත්නාවූ, ආයර්‍යයන් විසින් කැමතිවූ ශීලයෝ ඇත්තාහ. ඒ ආයර්‍යයන් විසින් කැමතිවූ ශීලයෝ තමා කෙරෙහි දක්නාවූ තොපගේ ඒ වේදනාව ක්ෂණයකින් සංසිඳෙන්නේය.

10. "ගෘහපතිය, යම්බඳුවූ මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්තවූ අශ්‍රැතවත් පුද්ගලතෙම කය බිඳීමෙන් මරණින් මතු පහවූ සැප ඇති විෂමවූ වැටීම් ඇති නරකයෙහි උපදියිද, තොපහට එබඳුවූ මිථ්‍යාදෘෂ්ටියක් නැත. ගෘහපතිය, තොපහට සම්‍යක් දෘෂ්ටිය ඇත්තේය. ඒ සම්‍යක් දෘෂ්ටිය තමා කෙරෙහි දකින්නාවූ තොපගේ වේදනාව ක්ෂණයකින් සංසිඳෙන්නේය.

11. "ගෘහපතිය, යම්බඳුවූ මිථ්‍යාසංකල්පනාවකින් යුක්තවූ අශ්‍රැතවත් පුද්ගලතෙම වනාහි කය බිඳීමෙන් මරණින් මතු, පහවූ සැප ඇති, විෂමවූ වැටීම් ඇති නරකයෙහි උපදියි. තොපට එබඳුවූ මිථ්‍යාසංකල්පනාවක් නැත. ගෘහපතිය, තොපට සම්‍යක් සංකල්පනාව ඇත්තේය. ඒ සම්‍යක් සංකල්පනාව තමා කෙරෙහි දකින්නාවූ තොපගේ ඒ වේදනාව ක්ෂණයකින් සංසිඳෙන්නේය.

12. "ගෘහපතිය, යම්බඳුවූ මිථ්‍යාවචනයෙන් යුක්තවූ අශ්‍රැතවත් පෘථග්ජනතෙම වනාහි කය බිඳීමෙන් මරණින් මතු පහවූ සැප ඇති, විෂමවූ වැටීම් ඇති, නරකයෙහි උපදීද, තොපට එබඳුවූ මිථ්‍යාවචනයක් නැත. ගෘහපතිය, තොපහට සම්‍යක් වචනය ඇත්තේය. ඒ සම්‍යක් වචනය තමා කෙරෙහි දකින්නාවූ තොපගේ ඒ වේදනාව ක්ෂණයකින් සංසිඳෙන්නේය.

13. "ගෘහපතිය, යම්බඳුවූ මිථ්‍යා කර්මාන්තයෙන් යුක්තවූ අශ්‍රැතවත් පෘථග්ජනතෙම වනාහි කය බිඳීමෙන් මරණින් මතු පහවූ සැප ඇති, විෂමවූ වැටීම් ඇති නරකයෙහි උපදියිද තොපට එබඳුවූ මිථ්‍යා කර්මාන්තයක් නැත. ගෘහපතිය, තොපහට සම්‍යක් කර්මාන්තය ඇත්තේය. ඒ සම්‍යක් කර්මාන්තය තමා කෙරෙහි දකින්නා තොපගේ ඒ වේදනාව ක්ෂණයකින් සංසිඳෙන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

14, "ගෘහපතිය, යම් බඳුවූ මිථ්‍යා ආජීවයෙන් යුක්තවූ අශ්‍රැතවත් පෘථග්ජනතෙම වනාහි කය බිඳීමෙන් මරණින් මතු පහවූ සැප ඇති විෂමවූ වැටීම් ඇති නරකයෙහි උපදියිද තොපට එබඳුවූ මිථ්‍යා ආජීවයක් නැත්තේය. ගෘහපතිය, තොපට සම්‍යක් ආජීවය ඇත්තේය. ඒ සම්‍යක් ආජීවය තමා කෙරෙහි දකින්නාවූ තොපගේ ඒ වේදනාව ක්ෂණයකින් සංසිඳෙන්නේය.

15. "ගෘහපතිය, යම් බඳුවූ මිථ්‍යා ව්‍යායාමයෙන් යුක්තවූ අශ්‍රැතවත් පෘථග්ජනතෙම කය බිඳීමෙන් මරණින් මතු පහවූ සැප ඇති විසමවූ වැටීම් ඇති නරකයෙහි 'උපදියිද, තොපට එබඳුවූ මිථ්‍යා ව්‍යායාමයක් නැත්තේය ගෘහපතිය, තොපට සම්‍යක් ව්‍යායාමය ඇත්තේය. ඒ සම්‍යක් ව්‍යායාමය තමා කෙරෙහි දකින්නාවූ තොපගේ වේදනාව ක්ෂණයකින් සංසිඳෙන්නේය.

16. "ගෘහපතිය, යම්බඳුවූ මිථ්‍යා ස්මෘතියෙන් යුක්තවූ අශ්‍රැතවත් පෘථග්ජනතෙම කය බිඳීමෙන් මරණින් මතු පහවූ සැප ඇති විසමවූ වැටීම් ඇති නරකයෙහි උපදියිද, තොපට එබඳුවූ මිථ්‍යා ස්මෘතියක් නැත. ගෘහපතිය, තොපට සම්‍යක් ස්මෘතිය ඇත්තේය. ඒ සම්‍යක් ස්මෘතිය තමා කෙරෙහි දකින්නාවූ තොපගේ ඒ වේදනාව ක්ෂණයකින් සංසිඳෙන්නේය.

17. "ගෘහපතිය, යම් බඳුවූ මිථ්‍යා සමාධියෙන් යුක්තවූ අශ්‍රැතවත් පෘථග්ජනතෙම කය බිඳීමෙන් මරණින් මතු පහවූ සැප ඇති විසමවූ වැටීම් ඇති නරකයෙහි උපදියිද තොපට එබඳුවූ මිථ්‍යා සමාධියක් නැත්තේය. ගෘහපතිය, තොපට සම්‍යක් සමාධිය ඇත්තේය. ඒ සම්‍යක් සමාධිය තමා කෙරෙහි දකින්නාවූ තොපගේ ඒ වේදනාව ක්ෂණයකින් සංසිඳෙන්නේය.

18. "ගෘහපතිය, යම්බඳුවූ මිථ්‍යා ඥානයෙන් යුක්තවූ, අශ්‍රැතවත් පෘථග්ජනතෙම කය බිඳීමෙන් මරණින් මතු පහවූ සැප ඇති, විසමවූ වැටීම් ඇති නරකයෙහි උපදියිද, තොපට එබඳුවූ, මිථ්‍යාඥානයක් නැත්තේය. ගෘහපතිය, තොපට සම්‍යක් ඥානය ඇත්තේය. ඒ සම්‍යක් ඥානය කෙරෙහි දකින්නාවූ තොපගේ ඒ වේදනාව ක්ෂණයකින් සංසිඳෙන්නේය.

**19.** "ගෘහපතිය, යම්බඳුවූ මිථ්‍යා විමුක්තියෙන් යුක්තවූ, අශ්‍රැතවත් පෘථග්ජනතෙම කය බිඳීමෙන් මරණින් මතු පහවූ සැප ඇති, විසමවූ වැටීම් ඇති, නරකයෙහි උපදියිද, තොපට එබඳුවූ, මිථ්‍යා විමුක්තියක් නැත්තේය. ගෘහපතිය, තොපට සම්‍යක් විමුක්තිය ඇත්තේය. ඒ සම්‍යක් විමුක්තිය තමා කෙරෙහි දකින්නාවූ තොපගේ වේදනාව ක්ෂණයකින් සංසිඳෙන්නේය.

**20.** ඉක්බිති අනාථපිණ්ඩික ගෘහපතිහුගේ වේදනාව ක්ෂණයකින් සංසිඳුනේය. ඉක්බිති අනාථපිණ්ඩික ගෘහපති තෙම ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේද තමාගේම බත් තලියෙන් වැළඳවිය. ඉක්බිති අනාථ පිණ්ඩික ගෘහපතිතෙම වනාහි සාරිපුත්ත ස්ථවිරයන් වහන්සේ වළඳා, පාත්‍රයෙන් අත පිටතට ගත් කල්හි එක්තරා පහත් ආසනයක් ගෙන එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ අනාථ පිණ්ඩික ගෘහපතිහට ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන්ගෙන් අනුමෝදනා කළසේක.

> **21.** "යමෙකුහට තථාගතයන් වහන්සේ කෙරෙහි අචලවූ ශ්‍රද්ධාව පිහිටියාද යහපත්වූ ආර්‍ය්‍යයන් විසින් කැමතිවන්නාවූ ප්‍රශංසා කරන ලද්දාවූ, ශීලය යමෙකුට ඇත්තේද, යමෙකුහට සංඝයා කෙරෙහි ප්‍රසාදයක් ඍජුවූ දෘෂ්ටියක් ඇත්තේද, හෙතෙම දුප්පතෙක් නොවේයයි කීහ. ඔහුගේ ජීවිතය හිස් නොවේ. එහෙයින් බුදුවරයන්ගේ අනුශාසනය සිහිකරන්නාවූ නුවණැති පුද්ගලතෙමේ ශ්‍රද්ධාවද, ශීලයද, ප්‍රසාදයද, ධර්මය දැකීමද, අනුව යෙදෙන්නේය.

**22.** ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ අනාථ පිණ්ඩික ගෘහපතිහට මේ ගාථාවන්ගෙන් අනුශාසනා කොට හුනස්නෙන් නැගිට වැඩිසේක.

**23.** ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක

හුන්නාවූ, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ගෙන් භාග්‍යවතුන් වහන්සේ "ආනන්දය, නුඹ මේ දවල් කාලයෙහි කොහිසිට එන්නෙහිදැයි" ඇසූහ.

"ස්වාමීනි, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ විසින් අනාථපිණ්ඩික ගෘහපතිතෙම මේ අවවාදයෙන් අවවාද කරන ලද්දේයයි" කීය.

"ආනන්දය, සාරිපුත්තතෙම පණ්ඩිතය, ආනන්දය, සාරිපුත්ත තෙම මහා ප්‍රාඥයෙක. යම් හෙයකින් සොතාපත්ති අංග සතර දස ආකාරයකින් බෙදන්නේද එහෙයිනි."

---

## 7. ආනන්ද අනාථපිණ්ඩික සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එසමයෙහි වනාහි බොහෝ භික්ෂූහු මසා කටයුතු නිමකරන ලද සිවුර ඇති භාග්‍යවතුන් වහන්සේ මාස තුනකින් පසු චාරිකාවෙහි වඩින්නේයයි භාග්‍යවතුන්වහන්සේගේ සිවුරෙහි වැඩ කෙරෙත්.

2. එසමයෙහි වනාහි අනාථපිණ්ඩික ගෘහපතිතෙම ලෙඩව, දුකට පත්ව, බලවත්සේ ගිලන්ව වාසය කරයි. ඉක්බිති අනාථපිණ්ඩික ගෘහපතිතෙම වනාහි එක්තරා පුරුෂයෙකුට කථාකළේය. 'පින්වත් පුරුෂය, නුඹ මෙහි එව, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම්තැනෙක්හිද එහි පැමිණෙව, පැමිණ, මාගේ වචනයෙන් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ පාද සිරසින් වඳුව.

"ස්වාමීනි, අනාථ පිණ්ඩික ගෘහපතිතෙම රොගාතුරව දුක් සහිතව, දැඩි ගිලන්ව, වෙසෙයි. හෙතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ දෙපා සිරසින් වඳියි' කියායි. මෙසේත් කියව, 'ස්වාමීනි, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ අනාථපිණ්ඩික ගෘහපතිහුගේ ගෙදර යම් තැනෙක්හිද එතැනට අනුකම්පාකර වඩිනසේක් නම් යහපත.'

'එසේය, ස්වාමීනියි කියා ඒ පුරුෂතෙම අනාථපිණ්ඩික ගෘහපතිහට උත්තරදී, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ

යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට වැඳ, එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ, ඒ පුරුෂතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය.

3. "ස්වාමීනි, අනාථපිණ්ඩික ගෘහපතිතෙම ලෙඩව දුකට පැමිණ, බලවත්සේ ගිලන්ව වාසය කරයි. හෙතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ පාදයන් සිරසින් වඳියි. මෙසේත් කියයි. 'ස්වාමීනි, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ අනාථපිණ්ඩික ගෘහපතියාගේ ගෙදර යම් තැනෙක්හිද, අනුකම්පාකර එහි වඩිනසේක්නම් යහපති' යනුයි"

ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ තුෂ්ණීම් භාවයෙන් ඉවසූසේක.

3. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ උදේ කාලයෙහි හැඳ, පාත්‍ර සිවුරු ගෙන අනාථ පිණ්ඩික ගෘහපතිහුගේ ගෙය යම් තැනෙක්හිද එතැනට පැමිණියහ පැමිණ, පණවන ලද ආසනයෙහි වැඩ උන්හ. වැඩහුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම අනාථපිණ්ඩික ගෘහපතියාට මෙය කීයේය.

4. "ගෘහපතිය, කිම නුඹට ඉවසිය හැකිද? කිම යැපිය හැකිද? කිම දුක් වේදනාවෝ සංසිඳෙත්ද? සංසිඳෙන සැටියක් පෙනේද? වැඩිවන සැටියක් නොපෙනේද?" යනුයි.

"ස්වාමීනි, මට ඉවසිය නොහැක. යැපිය නොහැක. මාගේ දැඩි දුක් වේදනාවෝ වැඩිවෙත්. නො සංසිඳෙත්. වැඩිවීම පෙනේ. අඩුවීම නොපෙනේ."

5. "ගෘහපතිය, ධර්ම සතරකින් යුක්තවූ, අශ්‍රැතවත් පෘථග්ජනයාට බය උපදියි. තැතිගැනීම් උපදියි. පරලොව පිළිබඳ මරණ භය උපදියි. කවර සතරකින්ද? ගෘහපතිය, මේ ලොකයෙහි අශ්‍රැතවත් පෘථග්ජනතෙම බුදුරජාණන් වහන්සේ කෙරෙහි අප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයිද ඒ බුදුරජාණන් වහන්සේ කෙරෙහිවූ අප්‍රසාදය තමා කෙරෙහි දක්නාහට බය ඇතිවෙයි. තැතිගැනීම ඇතිවෙයි. පරලොව පිළිබඳ මරණ භය ඇතිවෙයි.

6. "ගෘහපතිය, නැවතද අශ්‍රැතවත් පෘථග්ජනතෙම ධර්මය කෙරෙහි අප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයිද ඒ ධර්මය කෙරෙහි වූ අප්‍රසාදය තමා කෙරෙහි දකින්නාහට බය ඇති වෙයි. තැතිගැනීම ඇතිවෙයි. පරලොව පිළිබඳ මරණ භය ඇතිවෙයි.

7. "ගෘහපතිය, නැවතද අශ්‍රැතවත් පෘථග්ජනතෙම සංඝයා කෙරෙහි අප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයිද, ඒ සංඝරත්නය කෙරෙහිවූ අප්‍රසාදය තමා කෙරෙහි දක්නාහට බය ඇතිවෙයි තැතිගැනීම ඇතිවෙයි. පරලොව පිළිබඳ මරණභය ඇතිවෙයි.

8. "ගෘහපතිය, නැවතද අශ්‍රැතවත් පෘථග්ජනතෙම දුස්සීල භාවයෙන් යුක්තවූයේවේද ඒ දුස්සීල භාවය තමා කෙරෙහි දක්නාහට බය ඇතිවෙයි තැතිගැනීම ඇති වෙයි. පරලොව පිළිබඳ මරණභය ඇතිවෙයි. ගෘහපතිය, මේ ධර්ම සතරින් යුක්තවූ අශ්‍රැතවත් පෘථග්ජනයාට බය හටගනියි. තැතිගැනීම හටගනියි. පරලොව පිළිබඳ මරණභය හටගනියි.

9. "ගෘහපතිය, ධර්ම සතරකින් යුක්තවූ ශ්‍රැතවත් ආය්‍ය‍ර්‍ය ශ්‍රාවකයාට භය ඇති නොවෙයි. තැතිගැනීම ඇති නොවෙයි. පරලොව පිළිබඳ භය ඇති නොවෙයි. කවර සතරකින්ද? ගෘහපතිය, ලොකයෙහි ශ්‍රැතවත් ආය්‍ය‍ර්‍යශ්‍රාවකතෙම බුදු රජාණන් වහන්සේ කෙරෙහි අචලප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අර්හත්ය. සම්‍යක් සම්බුද්ධයහ. විජ්ජාචරණ සම්පන්නයහ. සුගතයහ. ලෝකවිදූය. පුරුෂයන් දමනය කිරීමෙහි අති උතුම් රියැදුරෙකු හා සමානයහ දෙව් මිනිසුන්ගේ ශාස්තෘහ. චතුරාය්‍ය‍ර්‍යසත්‍යය අවබොධ කළසේක. භාග්‍යවත්හ කියායි.

"ඒ බුදුරජාණන් වහන්සේ කෙරෙහිවූ අචලප්‍රසාදය තමා කෙරෙහි දක්නාහට භය ඇතිනොවෙයි. තැතිගැනීම ඇති නොවෙයි. පරලොව ගැන බිය ඇතිනොවෙයි.

10. "ගෘහපතිය, නැවතද ශ්‍රැතවත් ආය්‍ය‍ර්‍යශ්‍රාවකතෙම ධර්මය කෙරෙහි අචලප්‍රසාදයෙන් යුක්තවූවාහුය. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට දේශනා කරන ලද්දේය. මේ

ආත්මයෙහි දෙන ඵල ඇත්තේය. කල් නොයවා විපාක දෙන්නේය. එව බලවයි, පෙන්විය හැකි ගුණ ඇත්තේය. තමන් තුළ එළවා වැඩි යුතු ගුණයෙන් යුක්ත වූයේය. නුවණැත්තන් විසින් වෙන වෙනම දතයුත්තේය, කියායි.

ඒ ධර්මය කෙරෙහිවූ අචල ප්‍රසාදය තමා කෙරෙහි දක්නාහට භය ඇති නොවෙයි. තැතිගැනීම ඇතිනොවෙයි. පරලොව ගැන බිය ඇති නොවෙයි.

11. 'ගෘහපතිය, නැවතද ශ්‍රැතවත් ආය්‍ර්‍යශ්‍රාවක තෙම සංඝයා කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්ත වූයේ වෙයි. භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවක සංඝතෙම ශාසන ප්‍රතිපත්තියෙහි මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය. නිවනට සුදුසුව පිළිපන්නේය. ගරු බුහුමනට යොග්‍යව පිළිපන්නේය. යම් මේ පුරිසයුග සතරක් වෙත්ද, පුද්ගලයන් අටදෙනෙක් වෙත්ද, මේ ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන් උදෙසා පිළියෙළ කළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. කම්පල අදහා දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසුවූයේය. ඇඳිලිකිරීමට (වැඳීමට) සුදුසු වූයේය. ලොකයාගේ උතුම් පිංකුඹුරය, කියායි.

"ඒ සංඝරත්නය කෙරෙහිවූ අචල ප්‍රසාදය තමා කෙරෙහි දක්නාහට බිය ඇති නොවෙයි. තැතිගැනීම් ඇති නොවෙයි. පරලොව ඇති නොවෙයි.

12. "ගෘහපතිය, නැවතද ආය්‍ර්‍යශ්‍රාවකතෙම නොකැඩුනාවූ, සිදුරු නොවූ, කබර නොවූ, කැළල් නොවූ, නිදොස්වූ, නුවණ ඇත්තන් විසින් ප්‍රශංසා කරන ලද්දාවූ තෘෂ්ණා දෘෂ්ටීන් විසින් පරාමර්ෂණය නොකරන ලද්දාවූ සමාධිය පිණිස පවත්නාවූ ආය්‍ර්‍යයන් කැමැති ශීලයෙන් යුක්තවූයේ වෙයි. ඒ ආය්‍ර්‍යයන් විසින් කැමතිවන්නාවූ ශීලය තමා කෙරෙහි දකින්නාහට බිය ඇතිනොවෙයි. තැතිගැනීම ඇතිනොවෙයි, පරලොව ගැන බිය ඇතිනොවේයයි" කීය.

13. "ආනන්ද ස්ථවිරයන් වහන්ස, මම භය නොවෙමි. කවරහෙයින් මම බිය වන්නෙම්ද? ස්වාමීනි, මම බුදුරජාණන්

වහන්සේ කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූයේ වෙමි. මෙසේ භාග්‍යවතුන් වහන්සේ අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ, විජ්ජාචරණ සම්පන්නයහ, සුගතයහ, ලොකවිදූහ, පුරුෂයන් දමනය කිරීමෙහි අති උතුම් රියැදුරෙකු හා සමානයහ, දෙව්මිනිසුන්ගේ ශාස්තෲහ, චතුරාර්‍ය්‍යසත්‍යය අවබොධ කළ සේක, භාග්‍යවත්හ කියායි.

"ධර්මය කෙරෙහි අචලප්‍රසාදයෙන් යුක්ත වූවාහුය. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට දේශනාකරන ලද්දේය. මේ ආත්මයෙහි දෙන ඵල ඇත්තේය. කල් නොයවා විපාකදෙන්නේය. එව බලවයි, පෙන්විය හැකිගුණ ඇත්තේය. තමන් තුළ එළවා වැඩිය යුතු ගුණයෙන් යුක්ත වූයේය. නුවණැත්තන් විසින් වෙන වෙනම දත යුත්තේය කියායි.

"සංඝයා කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්ත වූවාහුය. භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම ශාසන ප්‍රතිපත්තියෙහි මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය. නිවනට සුදුසුව පිළිපන්නේය. ගරු බුහුමනට යොග්‍යව පිළිපන්නේය. යම් මේ පුරිසයුග සතරක් වෙත්ද, පුද්ගලයන් අටදෙනෙක් වෙත්ද, මේ ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන් උදෙසා පිළියෙළ කළ දෙය පිළිගැනීමට සුදුසු වූසේක. ඇඳිලි කිරීමට (වැඳීමට) සුදුසු වූයේය. ලොකයාගේ උතුම් පිං කුඹුරය, කියායි.

**15.** "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ ගිහියන්හට සුදුසුවූ ශික්ෂාපද පණවන ලදද, ඔවුන්ගෙන් කඩවූ කිසි ශික්ෂාපදයක් තමා කෙරෙහි නොදක්නෙමි."

**16.** "ගෘහපතිය, නුඹට ලාභයකි. ගෘහපතිය, නුඹට මහත් ලාභයකි. ගෘහපතිය, නුඹ විසින් සෝවාන් ඵලය ප්‍රකාශ කරන ලදී."

## 8. අනාථ පිණ්ඩික වෙරභය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි අනාථ පිණ්ඩික ගෘහපතිතෙම භාග්‍යවතුන්වහන්සේ යම්තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ අනාථ පිණ්ඩික ගෘහපතියාහට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය.

2. "ගෘහපතිය, යම්තැනක පටන් ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ යම් භය පසක් වෛර පසක් සංසිඳුනාහු වෙත්ද, සිව් වැදෑරුම් ශ්‍රොතාපත්ති අංගයන්ගෙන් යුක්තවූයේ වෙයිද, ඔහු විසින් ආර්‍ය්‍ය න්‍යාය ප්‍රඥාවෙන් මනාකොට දක්නා ලද්දේද, මනාකොට ප්‍රතිවේධ කරන ලද්දේද, හෙතෙම කැමැති වන්නේ තමාම තමහට 'ක්ෂය කරන ලද නිරය ඇත්තේවෙමි. ක්ෂය කරන ලද, තිරිසන් යොනිය ඇත්තේ වෙමි. ක්ෂය කරන ලද ප්‍රේත විෂය ඇත්තේ වෙමි. ක්ෂය කරන ලද නපුරුගති ඇති විසම පතිතවීම් ඇති අපාය ඇත්තේ වෙමි. මම අපායෙහි නොවැටෙන ස්වභාව ඇත්තාවූ නියත ගති ඇත්තාවූ මතු මාර්ගත්‍රය පිහිට කොට ඇත්තාවූ සොවාන් වෙමැයි' ප්‍රකාශ කරන්නේය.

3. "කිනම් භය පසක් වෛර පසක් සංසිඳුනාහු වෙත්ද? ගෘහපතිය, ප්‍රාණඝාත කරන තැනැත්තේ ඒ ප්‍රාණඝාත කිරීම හෙතුකොට ගෙන මේ ආත්මයෙහිත් බියද වෛරයද රැස්කරයි. පරලොවත් බියද වෛරයද රැස්කරයි. මානසික දුකද දොම්නසද විඳියි. ප්‍රාණඝාතයෙන් වෙන්වූවහුට මේ බිය සහ වෛරය සංසිඳුනේ වෙයි.

4. "ගෘහපතිය, හොරකම් කරන තැනැත්තේ ඒ සොරකම් කිරීම් හෙතුකොට ගෙන මේ ආත්මයෙහිත් බියද වෛරයද රැස්කරයි. පරලොවත් බියද වෛරයද රැස්කරයි. මානසික දුකද දොම්නසද විඳියි. සොරකම් කිරීමෙන් වෙන්වූවහුට මේ බිය සහ වෛරය සංසිඳුනේ වෙයි.

5. "ගෘහපතිය, කාමයන්හි වරදවා හැසිරෙන තැනැත්තේ, ඒ කාමයන්හි වරදවා හැසිරීම හේතුකොටගෙන මේ

ආත්මයෙහිත් බියද වෛරයද රැස්කරයි. පරලොවත් බියද වෛරයද රැස්කරයි. මානසික දුකද දොම්නසද විඳියි. කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වූවහුට මේ බිය සහ වෛරය සංසිඳුනේ වෙයි.

**6.** "ගෘහපතිය, බොරු කියන තැනැත්තේ ඒ බොරු කීම හේතුකොටගෙන මේ ආත්මයෙහිත් බියද වෛරයද රැස්කරයි. පරලොවත් බියද වෛරයද රැස්කරයි. මානසික දුකද දොම්නසද විඳියි. බොරු කීමෙන් වෙන් වූවහුට මේ බිය සහ වෛරය සංසිඳුනේ වෙයි.

**7.** "ගෘහපතිය, මදයට හා ප්‍රමාදයට හේතුවන රහමෙර පානය කරන තැනැත්තේ ඒ මදයට හා ප්‍රමාදයට හේතුවන රහමෙර පානය කිරීම හේතුකොටගෙන මේ ආත්මයෙහිද වූ බිය සහ වෛරය රැස්කරයි. පරලොවත් බිය සහ වෛරයද රැස්කරයි. මානසික දුකද දොම්නසද විඳියි. මදයට හා ප්‍රමාදයට හෙතුවන රහමෙර පානය කිරීමෙන් වෙන් වූවහුට මේ බිය සහ වෛර සංසිඳුනේ වෙයි. මේ පස් බිය සහ වෛරයෝ සංසිඳුනාහු වෙත්.

"කිනම් සොතාපත්ති අංග සතරකින් යුක්තවූයේ වේද?

**8.** "ගෘහපතිය, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවකතෙම බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්ත වූයේවෙයි. මෙසේ භාග්‍යවතුන්වහන්සේ අර්හත්වෙයි. සම්‍යක් සම්බුද්ධ වෙයි. විජ්ජාචරණ සම්පන්නවෙයි. සුගතවෙයි. ලෝකවිදූ වෙයි. අනුත්තර පුරිසදම්මසාරථී වෙයි. දෙව් මිනිසුන්ගේ ශාස්තෘ වෙයි. චතුස්සත්‍යය අවබොධ කෙළේ වෙයි. භාග්‍යවත්හයි' කියායි

"ධර්මය කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්තවූයේ වෙයි 'භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට දේශනා කරන ලද්දේය. මේ ආත්මයෙහි දෙන ඵල ඇත්තේය. කල් නොයවා විපාක දෙනනේය. එව බලවයි, පෙන්විය හැකි ගුණ ඇත්තේය. තමන් තුළ එළවා වැඩිය යුතු ගුණයෙන් යුක්තවූයේය. නුවණැත්තන් විසින් වෙන වෙනම දත යුත්තේය' කියායි.

"සංඝයා කෙරෙහි අචල ප්‍රසාදයෙන් යුක්ත වූයේවෙයි "භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙම ශාසන ප්‍රතිපත්තියෙහි මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය. නිවනට සුදුසුව පිළිපන්නේය. ගරුබුහුමනට යොග්‍යව පිළිපන්නේය. යම් මේ පුරිසයුග සතරක් වෙත්ද, පුද්ගලයන් අටදෙනෙක් වෙත්ද, මේ ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන් උදෙසා පිළියෙළ කළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. කම්පල අදහා දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසු වූසේක. ඇඳිලිකිරීමට (වැඳීමට) සුදුසු වූයේය. ලොකයාගේ උතුම් පිං කුඹුරවූයේ වෙයි, කියායි.

"නොකැඩුනාවූ, සිදුරු නොවූ, කබර නොවූ, කැළල් නොවූ, නිදොස්වූ, නුවණ ඇත්තන් විසින් ප්‍රශංසා කරන ලද්දාවූ තෘෂ්ණා දෘෂ්ටීන් විසින් පරාමර්ෂණය නොකරන ලද්දාවූ සමාධිය පිණිස පවතින්නාවූ ආර්‍ය්‍යයන් කැමැති ශීලයෙන් යුක්තවූයේ වෙයි.

"මේ සොතාපත්ති අංග සතරින් යුක්තවූයේ වෙයි.

**9.** "කිනම් ආර්‍ය්‍ය න්‍යායක් ප්‍රඥාවෙන් මනාකොට දක්නා ලද්දේ මනාකොට අවබොධ කරන ලද්දේද? ගෘහපතිය, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවකතෙම පටිච්චසමුප්පාදයම නුවණින් මනාකොට මෙනෙහි කෙරෙයිද, මෙසේ මේ හේතුව ඇති කල්හි මේ ඵලය ඇතිවෙයි. මේ ඉපදීම හේතුකොටගෙන මේ ඵලය ඇතිවෙයි මෙසේ මේ හේතුව නැති කල්හි මේ ඵලය ඇති නොවෙයි මේ හේතුව නැතිවීම හේතුකොටගෙන මේ ඵලය ඇති නොවෙයි හේ කෙසේද යත්.

**10.** "අවිද්‍යාව නිසා සංස්කාරයෝ ඇතිවෙත්. සංස්කාරයන් නිසා විඥානය ඇතිවෙයි. විඥානය නිසා නාමරූප දෙක ඇතිවෙයි, නාමරූපයන් නිසා සළායතන ඇතිවෙයි සළායතන නිසා ස්පර්ශය ඇතිවෙයි. ස්පර්ශය නිසා වේදනාව ඇති වෙයි වේදනාව නිසා තණ්හාව ඇතිවෙයි. තණ්හාව නිසා උපාදානය ඇතිවෙයි. උපාදානය නිසා භවය ඇතිවෙයි. භවය නිසා ජාතිය (ඉපදීම) ඇතිවෙයි. ජාතිය (ඉපදීම) නිසා ජරා, මරණ, සෝක,

පරිදේව, දුක්, දොම්නස්, උපායාසයෝ ඇති වෙත්. මෙසේ මේ සැපයෙන් අමිශ්‍ර දුඃඛ ස්කන්ධයාගේ හටගැනීම ඇතිවෙයි

11. "අවිද්‍යාවගේම ඉතිරි නොකොට නැති කිරීමෙන් සංස්කාරයන් නැතිවෙත්. සංස්කාරයන් නැතිවීමෙන් විඥානය නැතිවෙයි. විඥානය නැතිවීමෙන් නාමරූප දෙක නැතිවෙයි. නාමරූප දෙක නැතිවීමෙන් සළායතන නැතිවෙයි සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවෙයි. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැතිවෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැති වෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (ඉපදීම්) නැතිවෙයි. ජාතිය (ඉපදීම) නැතිවීමෙන් ජරා, මරණ සෝක, පරිදේව, දුක්, දොම්නස්, උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සැපයෙන් අමිශ්‍ර දුඃඛස්කන්ධයාගේ නිරොධය වෙයි. මේ තෙම ආර්‍ය්‍ය න්‍යායය, ප්‍රඥාවෙන් මනාකොට දක්නා ලද්දේ මනාකොට අවබොධ කරන ලද්දේ වෙයි.

12. "ගෘහපතිය, යම්තැනක පටන් ආර්‍ය්‍යශ්‍රාවකයා විසින් මේ පස්බිය සහ වෛරයෝ සංසිඳුවන ලද්දාහු වෙත්ද, මේ ශ්‍රොතාපත්ති අංග සතරින් යුක්තවූයේ වෙයිද, ආර්‍ය්‍ය න්‍යාය ප්‍රඥාවෙන් මනාකොට දක්නා ලද්දේ, මනාකොට අවබොධ කරන ලද්දේ වෙයිද, හෙතෙම කැමතිවන්නේ තෙමේම තමහට ක්ෂයවූ නිරය ඇත්තෙමි. ක්ෂයවූ තිරිසන් යොනි ඇත්තෙමි, ක්ෂයවූ ප්‍රේතවිෂය ඇත්තෙමි, ක්ෂයවූ අපාය දුර්ගති නිරය ඇත්තේ වෙමි. නිරයෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ, නියතගති ඇත්තාවූ, මතුමාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් වූවෙක් වෙමියි' ප්‍රකාශ කරන්නේය."

---

## 9. අරියසාවක වෙරභය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එහි පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්හ. එක්පසෙක හුන් ඒ භික්ෂූහට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

3. "මහණෙනි, යම්තැනක පටන් ආර්‍ය්‍යශ්‍රාවකයාහට මේ පස්බිය සහ වෛරයෝ සංසිඳුනාහු වෙත්ද මේ ශ්‍රොතාපත්ති අංග සතරින් යුක්තවූයේ වෙයිද, මේ ආර්‍ය්‍ය න්‍යාය ප්‍රඥාවෙන් මනාකොට දක්නා ලද්දේ, අවබොධ කරන ලද්දේ වෙයිද, හෙතෙම කැමැති වන්නේ තෙමේම තමාහට 'ක්ෂයවූ නිරය ඇත්තෙමි. ක්ෂයවූ තිරිසන් යොනි ඇත්තෙමි. ක්ෂයවූ ප්‍රේතවිෂය ඇත්තෙමි. ක්ෂයවූ අපාය දුර්ගති නිරය ඇත්තේ වෙමි. අපායෙහි නොවැටෙන ස්වභාව ඇත්තාවූ, නියත ගති ඇත්තාවූ, මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් වූවෙක් වෙමියි' ප්‍රකාශ කරන්නේය"

## 10. නන්දක ලිච්ඡවි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විශාලාමහනුවර මහා වනයෙහිවූ කූටාගාර ශාලාවෙහි වාසය කරන සේක. එකල්හි නන්දක නම් ලිච්ඡවි මහ ඇමති තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ නන්දක නම් ලිච්ඡවි මහ ඇමතිහට භාග්‍යවතුන් වහන්සේ මෙය කීයේය

2. 'නන්දකය, ධර්ම සතරකින් යුක්තවූ ආර්‍ය්‍යශ්‍රාවක තෙම වනාහි නිරයෙහි නොවැටෙන ස්වභාව ඇත්තාවූ නියත ගති ඇත්තාවූ මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයෙක් වෙයි.

3. (මේ වර්ගයේ 8 සූත්‍රයේ 8 ඡේදයේ එන ගෘහපතිය, වෙනුවට නන්දකය, කියාද, "මේ සොතාපත්ති අංග සතරින් යුක්තවූයේ වෙයි" යනු නන්දකය, මේ ධර්ම සතරින් යුක්ත

ආර්‍ය්‍ය ශ්‍රාවකතෙමේ නිරයට නොයන ස්වභාවයෙන් යුක්තවූ, නිවන නියතවූ, නිවන කරා ගමන් කරන්නාවූ සෝවාන් මාර්ගයට පැමිණියෙක් වෙයි" කියාද වෙනස්කොට යොදා ගැනීමෙන් මේ ඡේදය සම්පූර්ණ වේ.)

4. "නන්දකය, මේ ධර්ම සතරින් යුක්තවූ ආර්‍ය්‍යශ්‍රාවක තෙම වනාහි දිව්‍යමයවූද මනුෂ්‍යමයවූද, ආයුසින් යුක්තවූයේ වෙයි. දිව්‍යමය වූද, මනුෂ්‍යමයවූද වර්ණයෙන් යුක්තවූයේ වෙයි. දිව්‍යමයවූද, මනුෂ්‍යමයවූද සැපයෙන් යුක්තවූයේ වෙයි. දිව්‍යමයවූද, මනුෂ්‍යමයවූද යසසින් යුක්තවූයේ වෙයි. දිව්‍යමයවූද, මනුෂ්‍යමයවූද අධිපතිභාවයෙන් යුක්තවූයේ වෙයි. නන්දකය, එය මම අන්‍යවූ ශ්‍රමණයෙකුගෙන් හෝ බ්‍රාහ්මණයෙකුගෙන් හෝ අසා නොකියමි. හුදෙක් මා විසින් යමක් තෙමේම අවබොධ කරන ලද්දේද, තමාම දක්නා ලද්දේද, තමාම දැනගන්නා ලද්දේද එයම මම කියමි" යි වදාළසේක.

5. "මෙසේ වදාළ කල්හි එක්තරා පුරුෂයෙක් නන්දක නම් ලිච්ඡවි මහ ඇමතියාට මෙය කීයේය. 'ස්වාමීනි, ස්නානය කරන කාලයයි."

"පින්වත, දැන් මේ බාහිරවූ ස්නානයෙන් වැඩක් නැත. භාග්‍යවතුන් වහන්සේ කෙරෙහිවූ යම් මේ ප්‍රසාදයක් වේද, මේ ප්‍රසාදය නමැති අධ්‍යාත්මික ස්නානයම ප්‍රමාණයයි" කීය.

---

## 4. පුඤ්ඤාභිසන්ද වර්ගය.

### 1. පුඤ්ඤාභිසන්ද සූත්‍රය (i)

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි කියා භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

"මහණෙනි, සැපයට හේතුවූ පුන්‍යගංගා කුශල ගංගා සතරකි. ඒ කවර සතරක්හුද,

2. "මහණෙනි, මේ ශාසනයෙහි ආයර්‍ය්‍යශ්‍රාවක තෙමේ මේ කාරණයෙන්ද ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත්හ. සම්‍යක් සම්බුද්ධයහ, අෂ්ට විද්‍යාවෙන් හා පසළොස් චරණ ධර්මයෙන් යුක්තයහ, සුගතයහ, සියලු ලෝකයන් දන්නාහ හික්මිය යුතු පුරුෂයන් හික්මවීමෙහි තමන්ට වඩා වැඩි කෙනකු නැත්තාහ, දෙව් මිනිසුන්ට ශාස්තෘයහ. බුද්ධයහ, භාග්‍යවත්හ යනුවෙන් බුදුරජාණන් වහන්සේ කෙරෙහි නොසෙල්වෙන සැදැහැයෙන් යුක්තවූයේ වෙයිද,

3. "මේ සැපයට හේතුවූ පළමුවන පුන්‍ය ගංගාවය, කුසල ගංගාවය,

4. "තවද මහණෙනි, මේ ශාසනයෙහි ආයර්‍ය්‍යශ්‍රාවක තෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය යහපත්කොට වදාරණ ලදී. ප්‍රත්‍යක්ෂව දැකියහැකි නුවණ ඇත්තේය. එවලෙහිම ලැබියහැකි ගුණ ඇත්තේය. එව බලවයි පෙන්විය හැකි ගුණ ඇත්තේය. සිත්හි නිතර එළවා වැඩිය යුතු ගුණ ඇත්තේය. නුවණැතියන් විසින් වෙන වෙනම සිත්හි එළවා දතයුතුය. යනුවෙන් ධර්මය කෙරෙහි නොසෙල්වෙන සැදැහැයෙන් යුක්තවූයේ වෙයිද,

5. "මේ සැපයට හේතුවූ දෙවෙනි පුන්‍යගංගාවය, කුසල ගංගාවය.

6. "තවද මහණෙනි, මේ ශාසනයෙහි ආයර්‍ය්‍යශ්‍රාවක තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා මනාව පිළිපන්නේය. ඍජුව පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා නිවන් පිළිවෙතට පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා සුදුසු පිළිවෙතට පිළිපන්නේය. යම් ඒ පුරිසයුග සතරක් වෙත්ද, පුද්ගලයෝ අටදෙනෙක් වෙත්ද, භාග්‍යවතුන් වහන්සේගේ මේ ශ්‍රාවක සංඝතෙමේ ආගන්තුකයන් උදෙසා පිළියෙලකළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. කම්පල අදහා

දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසුවූයේය. මුදුනත් තබා වැඳීමට සුදුසුය, ලෝකයාගේ ඉතා උතුම්වූ පිංකෙතය යනුවෙන් සංඝයා කෙරෙහි නො සෙල්වෙන සැදැහැයෙන් යුක්තවූයේ වෙයිද,

7. "මේ සැපයට හේතුවූ තුන්වැනි පුන්‍ය ගංගාවයි. කුසල ගංගාවයි.

8. "නැවතද අනික් කරුණක් කියමි. මහණෙනි, ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ කඩනොවූ, සිදුරු නොවූ, කබර නොගැසුනාවූ තිත් නොගැසුනාවූ, නිදොස්වූ, නුවණැත්තන් විසින් පසසනු ලැබුවාවූ, තණ්හා දිට්ඨි දෙකින් අල්වාගනු නොලැබුවාවූ, සමාධිය පිණිස පවත්නාවූ, ආර්‍ය්‍යයන් කැමති වන්නාවූ සීලයෙන් යුක්තවූයේ වෙයිද, මහණෙනි, මේ වනාහි සැපයට හේතුවූ සතරවැනිවූ පුන්‍ය ගංගාව කුසල ගංගාව වෙයි.

9. "මහණෙනි, මේ වනාහි සැපයට හේතුවූ පුන්‍ය ගංගා කුසල ගංගා සතර වෙති."

---

## 2. පුඤ්ඤාභිසන්ද සූත්‍රය (ii)

1-7. (මේ ඡෙද හත මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1-7 වෙනි ඡෙද මෙනි)

8. "තවද මහණෙනි, ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ දානය පිණිස මුදන ලද සිත් ඇත්තේ, දීමෙහි ඇලුනේ, ඉල්ලීමට සුදුසුවූයේ දන් බෙදීමෙහි ඇලුනේ, පහවූ මසුරුමළ ඇති සිතින් ගිහිගෙයි වසයිද සැපයට හේතුවූ මේ සතරවැනි පුන්‍ය ගංගාවය, කුසල ගංගාවය.

9. "මහණෙනි, සැපයට හෙතුවූ මේ පුන්‍යගංගා කුසල ගංගා සතර වෙති."

---

## 3. පුඤ්ඤාභි සන්ද සූත්‍රය (iii)

1-7. (මේ ඡේද හත මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1-7 වෙනි ඡේද මෙනි)

8. "තවද මහණෙනි, ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ උතුම්වූ තියුණු අවබොධයෙන් යුක්තව මනාකොට සියලු දුක් නැති කිරීමට පමුණුවන්නාවූ ඇතිවීම නැතිවීම දක්නා නුවණින් යුක්තවූයේ නුවණැත්තේ වෙයිද සැපයට හේතුවූ මේ සතර වැනි පුන්‍ය ගංගාවය කුසල ගංගාවය.

9. "මහණෙනි, මේ වනාහි සැපයට හේතුවූ පුන්‍ය ගංගා කුසල ගංගා සතර වෙති."

---

## 4 දෙවපද සූත්‍රය. (1)

1. (4, 5, 6, 8 වෙනි සූත්‍රවල 1 ඡේද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡේදය මෙනි.)

2. "මහණෙනි, අපිරිසිදු සත්වයන්ගේ පිරිසිදු බව පිණිසත් අපවිත්‍ර සත්වයන්ගේ පවිත්‍රවීම පිණිසත් විසුද්ධි දෙවියන්ගේ නුවණින් බැසගත් මේ පාදයෝ සතරක් වෙති. කවර සතරක්ද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡේදය මෙනි)

4. "මේ අපිරිසිදු සත්වයන්ගේ පිරිසිදුවීම පිණිසත් අපවිත්‍ර සත්වයන්ගේ පවිත්‍රවීම පිණිසත් විසුද්ධි දෙවියන්ගේ නුවණින් බැස ගන්නාලද පළමුවෙනි පාදයයි.

5. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 4 වෙනි ඡේදය මෙනි)

6. "මේ අපිරිසිදු සත්වයන්ගේ පිරිසිදුවීම පිණිසත් අපවිත්‍ර සත්වයන්ගේ පවිත්‍රවීම පිණිසත් විසුද්ධි දෙවියන්ගේ නුවණින් බැස ගන්නාලද දෙවැනි පාදයයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

7. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 6 වෙනි ඡේදය මෙනි.)

8. "මේ අපිරිසිදු සත්වයන්ගේ පිරිසිදු බව පිණිසත් අපවිත්‍ර සත්වයන්ගේ පවිත්‍රවීම පිණිසද විසුද්ධි දෙවියන්ගේ නුවණින් බැසගන්නාලද තෙවෙනි පාදයයි.

9. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 8 වෙනි ඡේදය මෙනි.)

10. 'මේ අපිරිසිදු සත්වයන්ගේ පිරිසිදු බව පිණිසත් අපවිත්‍ර සත්වයන්ගේ පවිත්‍රවීම පිණිසත් විසුද්ධි දෙවියන්ගේ නුවණින් බැසගන්නාලද මේ සතරවෙනි පාදයයි.

---

## 5. දෙවපද සූත්‍රය. (2)

2. "මහණෙනි, අපිරිසිදු සත්වයන්ගේ පිරිසිදු බව පිණිසත් අපවිත්‍ර සත්වයන්ගේ පවිත්‍රවීම පිණිසත් විසුද්ධි දෙවියන්ගේ නුවණින් බැසගන්නා ලද මේ පාදයෝ සතරක් වෙති. කවර සතරක්ද?

3. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡේදය මෙනි.)

4. "හෙතෙම මෙසේ සිතා බලයි. දෙවියන්ගේ නුවණින් බැසගන්නාලද පාද යනු කුමක්ද කියායි. හෙතෙම 'මම වනාහි දැන් දෙවියන් අවිහිංසාව උතුම්කොට ඇත්තන්යයි අසමියි මම වනාහි තැතිගන්නාවූද බිය නොගන්නාවූද කිසිවෙකුටත් කිසි හිංසාවක් නොකරමි. ඒකාන්තයෙන් මම දිව්‍යපාදයයි කියනලද ධර්මයෙන් යුක්තව වාසය කරමි'යි මෙසේ දනියි. අපිරිසිදු සත්වයන්ගේ පිරිසිදු බව පිණිසත් අපවිත්‍ර සත්වයන්ගේ පවිත්‍රවීම පිණිසත් දෙවියන්ගේ නුවණින් බැසගන්නාලද මේ පළමුවැනි පාදයයි.

5. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 4 වෙනි ඡේදය මෙනි.)

6. "හෙතෙම මෙසේ සිතා බලයි. දෙවියන්ගේ නුවණින් බැසගන්නාලද පාදය යනු කුමක්ද කියායි. හෙතෙම 'මම වනාහි දැන් දෙවියන් අවිහිංසාව උතුම්කොට ඇත්තන් යයි අසමි. මම වනාහි තැති ගන්නාවූද බිය නොවන්නාවූද කිසිවෙකුටත් කිසි හිංසාවක් නොකරමි. ඒකාන්තයෙන් මම දිව්‍යපාද සංඛ්‍යාත ධර්මයෙන් යුක්තව වාසය කරමියි' මෙසේ දනියි. අපිරිසිදු සත්වයන්ගේ පිරිසිදු බව පිණිසත් අපවිත්‍ර සත්වයන්ගේ පවිත්‍රවීම පිණිසත් දෙවියන්ගේ දෙවි නුවණින් බැසගන්නාලද මේ දෙවෙනි පාදයයි.

7. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 6 වෙනි ඡේදය මෙනි.)

8. "හෙතෙම මෙසේ සිතා බලයි. විසුද්ධි දෙවියන්ගේ නුවණින් බැසගන්නාලද පාද යනු කුමක්ද කියායි හෙතෙම 'මම වනාහි දැන් දෙවියන් අවිහිංසාව උතුම් කොට ඇත්තන් යයි අසමි. මම වනාහි තැති නොගන්නාවූද, භය නැත්තාවූද, කිසිවෙකුටත් කිසි හිංසාවක් නොකරමි. ඒකාන්තයෙන් මම දිව්‍යපාද සංඛ්‍යාත ධර්මයෙන් යුක්තව වාසය කරමියි' මෙසේ දනියි. අපිරිසිදු සත්වයන්ගේ පිරිසිදුවීම පිණිසත් අපවිත්‍ර සත්වයන්ගේ පවිත්‍රබව පිණිසත් විසුද්ධි දෙවියන්ගේ නුවණින් බැසගන්නාලද මේ තෙවෙනි පාදයයි.

9. "මහණෙනි, තවද ආර්‍ය්‍යශ්‍රාවකතෙමේ කඩනොවූ, සිදුරුනොවූ, කැළල්නොවූ, නිදොස්වූ, නුවණ ඇත්තන් විසින් ප්‍රසංසා කරන ලද්දාවූ තෘෂ්ණා දෘෂ්ටීන් විසින් පරාමර්ෂණය නොකරන ලද්දාවූ සමාධිය පිණිස පවතින්නාවූ ආර්‍ය්‍යයන් කැමති ශීලයෙන් යුක්ත වූයේ වෙයි.

10. "හෙතෙම මෙසේ සිතා බලයි. විසුද්ධි දෙවියන්ගේ නුවණින් බැසගන්නාලද, පාදය කුමක්ද කියායි. හෙතෙම 'මම වනාහි දැන් දෙවියන් අවිහිංසාව උතුම්කොට ඇත්තන් යයි අසමි. මම වනාහි තැතිගන්නාවූද, බිය නැත්තාවූද, කිසිවෙකුටත් කිසි හිංසාවක් නොකරමි. ඒකාන්තයෙන් මම දිව්‍යපාද සංඛ්‍යාත

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ධර්මයෙන් සමන්විතව වාසය කරමියි’ මෙසේ දනියි. අපිරිසිදු සත්වයන්ගේ පිරිසිදුවීම පිණිසත් අපවිත්‍ර සත්වයන්ගේ පවිත්‍ර බව පිණිසත් දෙවියන්ගේ නුවණින් බැසගන්නාලද මේ සතරවෙනා පාදයයි.”

---

## 6. සභාගත සූත්‍රය.

**2.** “මහණෙනි, කරුණු සතරකින් යුක්තවූ සතුටු සිතැති දෙවියෝ සභාවට ගියාහු මෙසේ කථාකෙරෙත්. කවර නම් සතරකින්ද?

**3.** (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡේදය මෙනි.)

**4.** ‘යම් ඒ දේවතාකෙනෙක් බුදුරදුන් කෙරෙහි නොසැලෙන සැදැහැයෙන් යුක්තවූවාහුය. මෙලොවින් චුතවී දෙව්ලොව උපන්නාහුද, ඒ දේවතාවන්ට මෙබඳු අදහසක් වෙයි. අපි වනාහි යම් ලෙසකින් බුදුරජාණන් වහන්සේ කෙරෙහි නොසෙල්වෙන සැදැහැයෙන් යුක්තවූවාහු මෙලොවින් චුතවීමෙන් මේ දෙව්ලොව උපන්නමෝද එලෙසින් බුදුරදුන් කෙරෙහි නො සැලෙන සැදැහැයෙන් යුක්තවූයේ ආර්‍ය්‍යශ්‍රාවක තෙමේද දෙවියන් වෙත එනුමැනවයි’ කියායි

**5.** (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 4 වෙනි ඡේදය මෙනි.)

**6.** “යම් ඒ දේවතා කෙනෙක් ධර්මය කෙරෙහි නොසැලෙන සැදැහැයෙන් යුක්තවූවාහු මෙලොවින් චුතවීමෙන් දෙව්ලොව උපන්නාහුද ඒ දේවතාවනට මෙබඳු සිතක් වෙයි. යම් ලෙසකින් ‘අපි වනාහි ධර්මය කෙරෙහි නොසැලෙන සැදැහැයෙන් යුක්තවූවෝ එලොවින් චුතව මෙහි උපන්නමෝද එලෙසින් ධර්මය කෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවූ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙමේද දෙවියන් වෙත එනුමැනව’ කියායි.

**7.** (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 6 වෙනි ඡේදය මෙනි.)

8. යම් ඒ දේවතා කෙනෙක් සංඝයා කෙරෙහි නොසැලෙන සැදැහැයෙන් යුක්තවූවාහු මෙලොවින් චුතවීමෙන් දෙව්ලොව උපන්නාහුද ඒ දේවතාවන්ට මෙබඳු සිතක් වෙයි. යම් ලෙසකින් ‘අපි වනාහි සංඝයා කෙරෙහි නොසැලෙන සැදැහැයෙන් යුක්තවූවාහු එලොවින් චුතවීමෙන් මෙහි උපන්නමෝද, එලෙසින් සංඝයාකෙරෙහි අචල ශ්‍රද්ධාවෙන් යුක්තවූයේ ආර්‍යශ්‍රාවක තෙමේද, දෙවියන් වෙත එනු මැනවි’ කියායි.

9. “තවද මහණෙනි, ආර්‍යශ්‍රාවකතෙමේ නොකැඩුනාවූ, සිදුරු නොවූ, කබර නොවූ, කැළල්නොවූ, නිදොස්වූ, නුවණ ඇත්තන් විසින් ප්‍රශංසා කරන ලද්දාවූ තෘෂ්ණාදෘෂ්ටීන් විසින් පරාමර්ෂණය නොකරන ලද්දාවූ සමාධිය පිණිස පවත්නාවූ ආර්‍යයන් කැමැති ශීලයෙන් යුක්තවූයේ වෙයිද,

10. “යම් ඒ දේවතා කෙනෙක් ආර්‍යයන් කැමතිවූ සීලයෙන් යුක්තවූවාහු මෙලොවින් චුතවීමෙන් දෙව්ලොව උපන්නාහුද, ඒ දෙවතාවන්ට මෙබඳු සිතක් වෙයි. යම්බඳුවූ ‘අපි වනාහි ආර්‍යයන් කැමැති සීලයෙන් යුක්තවූවාහුද එයින් චුතවීමෙන් මෙහි උපන්නමෝද ආර්‍යශ්‍රාවක තෙමේද එබඳුවූ ආර්‍යයන් කැමතිවූ සීලයෙන් යුක්තවූයේ දෙවියන් වෙත එනු මැනවි’ කියායි.

11. “මහණෙනි, ධර්ම සතරකින් යුක්තවූ සතුටු සිත් ඇති දෙවියෝ සභාවට ගියාහු මෙසේ කථා කෙරෙත්.”

---

## 7. මහානාම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත්පුර නිග්‍රොධාරාමයෙහි වැඩ වාසය කළහ. එකල්හි මහානාම ශාක්‍ය රජ තෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූයේය. සතුටුවිය යුතු සිහිකටයුතු කථාව කොට නිමවා එක්පසෙක උන්නේය.

එක්පසෙක උන්නාවූ මහානාම ශාක්‍ය රජතෙම භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැළ කෙළේය.

2. "ස්වාමීනි, කොපමණකින් උපාසකයෙක් වෙයිදැයි" (ඇසීය.)

"මහානාමය, යම් වේලාවක පටන් බුදුන් සරණ ගියේ වෙයිද, ධර්මය සරණ ගියේ වෙයිද, සංඝයා සරණ ගියේ වෙයිද මහානාම, එතැන් පටන් උපාසකයෙක් වේයයි" (වදාළහ.)

3. "වහන්ස, කොපමණකින් වනාහි උපාසක තෙම සීලයෙන් යුක්ත වෙයිද?"

"මහානාම, යම් තැනක පටන් උපාසක තෙම ප්‍රාණඝාතයෙන් වැළකුණේ වෙයිද, සොරකමින් වැළකුණේ වෙයිද, කාමයන්හි වැරදි හැසුරුමෙන් වැළකුණේ වෙයිද, බොරු කීමෙන් වැළකුණේවෙයිද, පමාවට කරුණුවූ රහමෙර පීමෙන් වැළකුණේ වෙයිද, මහානාම, මෙපමණකින් උපාසක තෙම සිල්වතෙක් වෙයි."

4. "වහන්ස, කොපමණකින් උපාසකතෙම සැදැහැවතෙක් වෙයිද?"

"මහානාම, මේ ශාසනයෙහි උපාසකතෙම මේ මේ කාරණයෙන් භාග්‍යවතුන් වහන්සේ අර්හත්ය. සම්‍යක් සම්බුද්ධයහ. විජ්ජාචරණ සම්පන්නයහ, සුගතයහ, ලෝකවිදූහ, පුරුෂයන් දමනය කිරීමෙහි අතිඋතුම් රියැදුරෙකු හා සමානයහ. දෙවි මිනිසුන්ගේ ශාස්තෘහ. චතුරාර්‍ය්‍ය සත්‍යය අවබොධ කළසේක. භාග්‍යවත්හ යනුවෙන් සැදැහැ ඇත්තේ වෙයි. තථාගතයන් වහන්සේගේ බුදුබව අදහයිද, මහානාම, මෙපමණකින් උපාසකතෙම සැදැහැයෙන් යුක්තවූවෙක් වෙයි"

5. "වහන්ස, කොපමණකින් උපාසක තෙමේ ත්‍යාගයෙන් යුක්තවූවෙක් වෙයිද?"

"මහානාම, මේ ශාසනයෙහි උපාසකතෙම ත්‍යාගය පිණිස මුදනලද සිත් ඇත්තේ පිරිසිදු කරනලද අත් ඇත්තේ දීමෙහි

ඇලුනේ ඉල්වීමට සුදුසුවූයේ දන් බෙදීමෙහි ඇලුනේ පහවූ මසුරුමල ඇති සිතින් ගිහි ගෙයි වාසය කරන්නේද මහානාමය, මෙපමණකින් උපාසක තෙම ත්‍යාගයෙන් යුක්ත වූයේ වෙයි."

**6.** "වහන්ස, කොපමණකින් වනාහි උපාසකතෙම නුවණ ඇත්තෙක් වූයේ වෙයිද?"

"මහානාම, මේ ශාසනයෙහි උපාසකතෙම තියුණු අවබෝධයෙන් යුත් මනාකොට සියලු දුක් නැති කිරීමට පමුණුවන්නාවූ ඇතිවීම නැතිවීම දක්නා නුවණින් යුක්තවූ නැණවතෙක් වෙයිද, මහානාම, මෙපමණකින්ම උපාසක තෙම නුවණින් යුක්තවූවෙක් වේයයි" වදාළේය.

---

## 8. වස්සූ'පම සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේ පිඬු සිටුහු විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' කියා භික්ෂූන් ඇමතූසේක. 'ස්වාමීනියි' කියා ඒ භික්ෂූන් භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය.

**2.** "මහණෙනි, කඳු මුදුනක මහඝන දිය බින්දු සහිත වැසි වසිනා කල්හි පහත් තැන් අනුව ගලාබස්නා එම වතුර පර්වත කඳුරැළි මහ බිම් විවර ශාඛා යම්සේ පුරවයිද, පර්වත කඳුරැලි මහ බිම්කුහර ශාඛා පිරීයාමෙන් කුඩා වළවල් පුරවයිද, කුඩා වළවල් පිරීමෙන් මහ වළවල් පුරවයිද, මහ වළවල් පිරීයාමෙන් කුඩා ගංගා පුරවයිද, කුඩා ගංගා පිරීයාමෙන් මහ ගංගා පුරවයිද, මහ ගංගා පිරීයාමෙන් මහමුහුදවූ සයුර යම්සේ පුරවයිද, මහණෙනි, එපරිද්දෙන්ම ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ බුදුරදුන් කෙරෙහි යම් ඒ නොසෙල්වෙන පැහැදීමක් වේද, ධර්මය කෙරෙහි යම් ඒ නොසෙල්වෙන පැහැදීමක් වේද, සංඝයා කෙරෙහි යම් ඒ නොසෙල්වෙන පැහැදීමක් වේද, ආර්‍ය්‍යයන් කැමතිවන යම් ඒ

සීලයෝ වෙත්ද? ගලාබස්නාවූ මේ ධර්මයෝ පරතෙරට ගොස් කෙලෙසුන්ගේ නැසීම පිණිස පවතිත්යයි" වදාළහ.

---

## 9. කාලිගොධා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහිවූ කිඹුල්වත් පුර නිග්‍රොධාරාමයෙහි වාසය කළසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍රා සිවුරු ගෙන කාලිගොධා නම්වූ ශාක්‍යාවගේ නිවෙස යම් තැනෙක්හිද එතැනට වැඩියහ. වැඩමවා පනවනලද අසුනෙහි වැඩහුන් සේක.

එකල්හි කාලිගොධා නම්වූ ශාක්‍යාව භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක නම් එතැනට පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නීය. එක්පසෙක හුන්නාවූ කාලිගොධා නම් ශාක්‍යාවට භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය වදාළහ.

2. "ගොධාවෙනි කරුණු සතරකින් යුක්තවූ ආර්‍ය්‍ය ශ්‍රාවිකා තොමෝ දුගතියට නොවැටීම ස්වභාවකොට ඇති නියත ගති ඇති මතු මාර්ගත්‍රය පිහිටකොට ඇති සෝවාන්වූ තැනැත්තියක් වන්නීය. කිනම් සතරකින්ද?

3, 4, 5. (මේ ඡෙද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 2, 4, 6, වෙනි ඡෙද මෙනි. 'මහණෙනි' වෙනුවට 'ගොධාවෙනි' කියා යොදන්න.)

6. "ගොධාවෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවිකා තොම ත්‍යාගය පිණිස මුදන ලද සිත් ඇත්තී පිරිසුදු කරන අත් ඇත්තී දීමෙහි ඇලුනී ඉල්වීමට සුදුසු වූවා දන් බෙදාදීමෙහි ඇලුනි පහවූ මසුරුමළ ඇති සිතින් ගිහිගෙයි වසයිද ගොධාවෙනි මේ කියන ලද කරුණු සතරින් යුත් ආර්‍ය්‍ය ශ්‍රාවිකා තොමෝ දුගතියට නොවැටීම ස්වභාවය කොට ඇති නියත ගති ඇති මතුමාර්ගත්‍රය පිහිටකොට ඇති සෝවාන් තැනැත්තියක් වෙයි."

7. 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ ශ්‍රොතාපත්තියංග සතරක් වදාළේය. ඒ ධර්මයෝ මා කෙරෙහි ඇත්තාහ. මම ඒ ධර්මයන්හි දකිනු ලබමි. ස්වාමීනි, මම වනාහි භාග්‍යවතුන් වහන්සේ මෙසේ අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ, අෂ්ටවිද්‍යාවෙන් හා පසළොස්චරණ ධර්මයෙන් යුක්තයහ, සුගතයහ, සියලු ලෝකයන් දන්නාහ, ශ්‍රෙෂ්ඨයහ, හික්මවියයුතු පුරුෂයන් හික්මවීමෙහි රියැදුරෙකු වැනියහ, දෙව්මිනිසුන්ට ගුරුවරයෙක් වූහ, බුද්ධයහ, භාග්‍යවත්හ. යනුවෙන් බුදුරජාණන් වහන්සේ කෙරෙහි නොසැලෙන සැදැහැයෙන් යුක්තවෙමි.

8. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට වදාරණ ලදී. තමන් විසින් දැක්ක යුත්තාහ. පැවැත්මට අනතුරුව දෙන ඵල ඇත්තාහ. එව, බලව, යන විධානයට සුදුසුය, සිත්හි ඉපිද විය යුතුය. නුවණැත්තන් විසින් තම තමන් කෙරෙහි ලා වෙන් වෙන් වශයෙන් දැක්ක යුතුය යනුවෙන් ධර්මය කෙරෙහි නොසැලෙන සැදැහැයෙන් යුක්ත වෙමි.

9. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝ තෙමේ මනාව පිළිපන්නේය. නොයෙක් පිළිවෙතට පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා නිවන් පිළිවෙතට පිළිපන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා සුදුසු පිළිවෙතට පිළිපන්නේය. යම් ඒ යුගල වශයෙන් සතර පුරුෂ කෙනෙක්වූ පුරුෂ පුද්ගලයෝ අටදෙනෙක් වෙත්ද, භගවත්හුගේ මේ ශ්‍රාවක සංඝ තෙමේ ආගන්තුකයන් උදෙසා පිළියෙලකළ දෙය පිළිගැනීමට සුදුසු වූයේය. කම්පල අදහා දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසු වූයේය. මුදුනත් තබා වැඳීමට සුදුසුය, ලෝකයාගේ ඉතා උතුම්වූ පිංකෙතය යනුවෙන් සංඝයා කෙරෙහි නොසැලෙන සැදැහැයෙන් යුක්ත වෙමි.

10. "ස්වාමීනි, සිය කුලයෙහි දියයුතු යම් කිසි වස්තුවක් වේද ඒ සියල්ල යහපත් ධර්මයන්ගෙන් යුත් සිල්වතුන් "විෂයෙහි බෙදන ලද්දේ වෙයි" ගොධාවෙනි, තොපට ලාභයකි. ගෙධාවෙනි, තොප විසින් යහපත් ලාභයක් ලබන ලදී.

ගොධාවෙනි, තොප විසින් සෝවාන් ඵලය ප්‍රකාශ කරන ලදැයි” වදාළේය.

---

## 10 නන්දිය සක්ක සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත්පුර සමීපයෙහිවූ නිග්‍රොධාරාමයෙහි වැඩවසන සේක. එකල්හි නන්දිය ශාක්‍යතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක උන්නාවූ නන්දිය ශාක්‍ය තෙම භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීයේය.

2. “ස්වාමීනි, යම් ආර්‍ය්‍යශ්‍රාවකයෙකුට ශ්‍රොතාපත්තියංග ධර්ම සතර සියලු ආකාරයෙන් සම්පූර්ණව නැත්තේද? ස්වාමීනි, ඒ ආර්‍ය්‍යශ්‍රාවකයාම ප්‍රමාදව වාසය කරන්නෙකැයි කියනු ලැබේද?

“නන්දිය යමෙකුට සොතාපත්තියංග ධර්ම සතර සියලු ආකාරයෙන් සම්පූර්ණව නැත්තේද මම ඔහු ආර්‍ය්‍යයන්ගෙන් බාහිරවූ පෘථග්ජන පක්ෂයෙහි සිටියෙකැයි කියමි. නන්දිය එතකුදු වුවත් ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ යම්සේ ප්‍රමාදව වාසය කරන්නෙක් වෙයිද අප්‍රමාදව වාසය කරන්නෙක් වෙයිද එය අසව, නන්දිය, ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ කෙසේ නම් ප්‍රමාදව වාසය කරන්නෙක් වෙයිද?

3. “නන්දිය, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ මෙසේ ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ, අෂ්ට විද්‍යාවෙන් හා පසලොස්චරණ ධර්මයෙන් යුක්තයහ, සුගතයහ, සියලු ලෝකයන් දන්නාහ, ශ්‍රෙෂ්ඨයහ, හික්මවිය යුතු පුරුෂයන් හික්මවීමෙහි රියැදුරෙකු වැනියහ, දෙවිමිනිසුන්ට ගුරුවරයෙක් වූහ, බුද්ධයහ, භාග්‍යවත්හ යනුවෙන් බුදුන් කෙරෙහි නොසැලෙන සැදැහැයෙන් යුක්තවූයේ වෙයිද,

4. “හෙතෙම බුදුන් කෙරෙහිවූ ඒ නොසැලෙන ශ්‍රද්ධාවෙන් සතුටුව දහවල් කාලයෙහි විවේකය සඳහාද රාත්‍රි කාලයෙහි

විවේකය සඳහාද මත්තෙහි උත්සාහ නොකරයි. මෙසේ ප්‍රමාදව වාසය කරන්නාවූ ඔහුට සතුට නූපදියි. සතුට නොමැති කල්හි ප්‍රීතිය නූපදියි. ප්‍රීතිය නොමැති කල්හි සන්සිඳීම ඇති නොවේ. සන්සිඳීම නැති කල්හි දුකසේ වාසය කරයි. දුකින් යුක්ත වූවහුගේ සිත එකඟ බවට නොපැමිණෙයි. එකඟ නොවූ සිතෙහි සමථ විදර්ශනා ධර්මයෝ පහළ නොවෙත්. සමථ විදර්ශනා ධර්මයන්ගේ පහළ නොවීමෙන් ප්‍රමාදව වාසය කරන්නේය යන සංඛ්‍යාවට පැමිණෙයි.

**5.** "තවද නන්දිය, ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය යහපත් කොට වදාරණ ලදී. ප්‍රත්‍යක්ෂ ඥාණයෙන් තමන් විසින්ම දැක්කයුතුය. මාර්ගයාගේ පැවැත්මට අනතුරුව දෙන ඵල ඇති බැවින් කල් නොයවා දෙන ගුණ ඇත්තේය. එව, බලව, යන විධානයට සුදුසුය. සිත්හි ඉපිද විය යුතුය. නුවණැත්තන් විසින් තම තමන් කෙරෙහි ලා වෙන් වෙන් වශයෙන් දැක්ක යුතුය යනුවෙන් ධර්මය කෙරෙහි නොසෙල්වෙන සැදැහැයෙන් යුක්තවූයේ වෙයිද,

**6.** "හෙතෙම ධර්මය කෙරෙහිවූ ඒ නොසැලෙන ශ්‍රද්ධාවෙන් සතුටුව දහවල් කාලයෙහි විවේකය සඳහාද රාත්‍රි කාලයෙහි විවේකය සඳහාද මත්තෙහි උත්සාහ නොකරයි. මෙසේ ප්‍රමාදව වාසය කරන්නාවූ ඔහුට සතුට නූපදියි. සතුට නොමැති කල්හි ප්‍රීතිය නූපදියි. ප්‍රීතිය නොමැති කල්හි සන්සිඳීම ඇති නොවේ සන්සිඳීම නැති කල්හි දුකසේ වාසය කරයි. දුකින් යුක්තවූවහුගේ සිත එකඟ බවට නොපැමිණෙයි. එකඟ නොවූ සිතෙහි සමථ විදර්ශනා ධර්මයෝ පහළ නොවෙත්. සමථ විදර්ශනා ධර්මයන්ගේ පහළ නොවීමෙන් ප්‍රමාදව වාසය කරන්නේය යන සංඛ්‍යාවට පැමිණෙයි.

**7.** "තවද නන්දිය, ආර්‍ය්‍යශ්‍රාවකතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා මනාව පිළිපන්නේය. සුදුසුව පිළිපන්නේය, ගරු බුහුමනට යොග්‍යව පිළිපන්නේය, යම් මේ පුරිසයුග සතරක් වෙත්ද, පුද්ගලයන් අටදෙනෙක් වෙත්ද, මේ ශ්‍රාවක සංඝතෙම ආගන්තුකයන් උදෙසා පිළියෙළ කළ දෙය

පිළිගැනීමට සුදුසු වූයේය. තුටුපඬුරු පිණිස පිළියෙල කළ දෙය පිළිගැන්මට සුදුසු වූයේය. කම්පල අදහා දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසුවූයේය. ඇඳිලිකිරීමට (වැඳීමට) සුදුසු වූයේය. ලෝකයාගේ උතුම් පින් කුඹුරය' යනුවෙන් සංඝයා කෙරෙහි නොසෙල්වන සැදැහැයෙන් යුක්තවූයේ වෙයිද.

8. "හෙතෙම සංඝයා කෙරෙහි වූ ඒ නොසැලෙන ශ්‍රද්ධාවෙන් සතුටුව දහවල් කාලයෙහි විවේකය සඳහාද රාත්‍රි කාලයෙහි විවෙකය සඳහාද මත්තෙහි උත්සාහ නොකරයි. මෙසේ ප්‍රමාදව වාසය කරන්නාවූ ඔහුට සතුට නූපදියි. සතුට නොමැති කල්හි ප්‍රීතිය නූපදියි. ප්‍රීතිය නොමැතිකල්හි සන්සිඳීම ඇතිනොවේ. සන්සිඳීම නැතිකල්හි දුකසේ වාසයකරයි. දුකින් යුක්තවූවහුගේ සිත එකාබද්ධ බවට නොපැමිණෙයි. එකග නොවූ සිතෙහි සමථ විදර්ශනා ධර්මයෝ පහළ නොවෙත්. සමථ විදර්ශනා ධර්මයන්ගේ පහළ නොවීමෙන් ප්‍රමාදව වාසය කරන්නේය. යන සංඛ්‍යාවට පැමිණෙයි.

'තවද නන්දිය ආයර්‍ය්‍යශ්‍රාවකතෙමේ නොකැඩුනාවූද, නො සිදුරුවූද, නො ලපවූද නො තිත්වූද, නිදොස්වූද, නුවණැත්තන් විසින් පසස්නා ලැබුවාවූද, තෘෂ්ණා දෘෂ්ටි දෙකින් අල්ලාගනු නොලැබුවාවූද, සිත එකග කරන්නාවූද, ආයර්‍ය්‍යයන් කැමතිවූ සීලයෙන් යුක්ත වෙයිද,

9. "හෙතෙම ඒ අරියකාන්ත සීලයෙන් සතුටුවූයේ මත්තෙහි දහවල් කාලයෙහි විවේකය පිණිසද රාත්‍රි කාලයෙහි විවේකය පිණිසද උත්සාහ නොකරයි. මෙසේ ප්‍රමාදව වාසය කරණ ඔහුට සතුට නැත. සතුට නැතිකල්හි ප්‍රීතිය නැත. ප්‍රීතිය නැතිකල්හි සංසිඳීම නැත. සංසිඳීම නැති කල්හි දුක් සහිතව වාසය කරයි. දුකින් යුක්තවූවහුගේ සිත සමාධියට නොපැමිණෙයි. සමාධිය නැති සිතෙහි ධර්මයන් පහළ නොවෙත්. ධර්මයන් පහළනොවීමෙන් ප්‍රමාදව වාසය කරන්නේය. යන සංඛ්‍යාවට පැමිණේ. නන්දිය මෙසේ වනාහි ආයර්‍ය්‍යශ්‍රාවක තෙමේ ප්‍රමාදව වාසය කරන්නෙක් වෙයි.

10. "නන්දිය, කෙසේනම් ආර්‍ය්‍යශ්‍රාවකතෙමේ අප්‍රමාදව වාසය කරන්නෙක් වෙයිද? නන්දිය මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකතෙමේ මෙසේ ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත්යහ සම්‍යක් සම්බුද්ධයහ. විජ්ජාචරණ සම්පන්නයහ. සුගතයහ. ලොකවිදූහ. අනුත්තර පුරිසදම්මසාරථී වනසේක. දෙව් මිනිසුන්ගේ ශාස්තෘ වනසේක. චතුස්සත්‍යය අවබොධකළ සේක. භාග්‍යවත්සේකැයි බුදුරජාණන් වහන්සේ කෙරෙහි නොසෙල්වෙන සැදැහැයෙන් යුක්තවූයේ වෙයි.

11. "හෙතෙම බුදුරජාණන් වහන්සේ කෙරෙහිවූ අචල ශ්‍රද්ධාවෙන් සතුටු නොවී මත්තෙහි දවල් කාලයෙහි විවේකය සඳහාද රාත්‍රිකාලයෙහි විවේකය සඳහාද උත්සාහ කෙරෙයි. මෙසේ අප්‍රමාදව වාසයකරන ඔහුට සතුටු ඇතිවෙයි. සතුටු වූවාහුට ප්‍රීතිය ඇතිවෙයි. ප්‍රීතිය ඇත්තහුට සංසිඳීම ඇතිවෙයි සංසිඳුණහුට සැපය ඇතිවෙයි. සුවපත් වූවහුගේ සිත එකඟ වෙයි. සිත එකඟවූකල්හි සමථ විදර්ශනා ධර්මයෝ පහළවෙත්. ධර්මයන් පහළවීමෙන් අප්‍රමාදව වාසය කරන්නේය යන සංඛ්‍යාවට පැමිණෙයි.

12. (මේ ඡේදය මේ සූත්‍රයේ 5 වෙනි ඡේදය මෙනි)

13. "හෙතෙම ධර්මය කෙරෙහිවූ අචල ශ්‍රද්ධාවෙන් සතුටු නොවී මත්තෙහි දහවල් කාලයෙහි විවේකය සඳහාද රාත්‍රි කාලයෙහි විවේකය සඳහාද උත්සාහ කෙරෙයි. මෙසේ අප්‍රමාදව වාසයකරන ඔහුට සතුටු ඇතිවෙයි. සතුටු වූවහුට ප්‍රීතිය ඇතිවෙයි. ප්‍රීතිය ඇත්තහුට සංසිඳීම ඇතිවෙයි. සංසිඳුනහුට සැපය ඇතිවෙයි සුවපත්වූවහුගේ සිත එකඟවෙයි. සිත එකඟවූ කල්හි සමථ විදර්ශනා ධර්මයෝ පහළ වෙත්. ධර්මයන් පහළවීමෙන් අප්‍රමාදව වාසය කරන්නේය යන සංඛ්‍යාවට පැමිණෙයි.

14. (මේ ඡේදය මේ සූත්‍රයේ 7 වෙනි ඡේදය මෙනි.)

15. "හෙතෙම සංඝයා කෙරෙහිවූ ඒ නොසැලෙන ශ්‍රද්ධාවෙන් සතුටු නොවී මත්තෙහි දහවල් කාලයෙහි විවේකය

සඳහාද රාත්‍රි කාලයෙහි විවෙකය සඳහාද උත්සාහ කරයි. මෙසේ අප්‍රමාදව වාසය කරන්නාවූ ඔහුට සතුට උපදියි. සතුට ඇති කල්හි ප්‍රීතිය උපදියි. ප්‍රීතිය ඇතිකල්හි සන්සිඳීම ඇතිවේ. සන්සිඳීම ඇතිකල්හි සුවසේ වාසයකරයි. සැපයෙන් යුක්තවූවහුගේ සිත එකඟබවට පැමිණෙයි. එකඟවූ සිතෙහි සමථ විදර්ශනා ධර්මයෝ පහළ වෙත්. සමථ විදර්ශනා ධර්මයන්ගේ පහළවීමෙන් අප්‍රමාදව වාසය කරන්නේය, යන සංඛ්‍යාවට පැමිණෙයි.

16. (මේ ඡෙදය මේ සූත්‍රයේ 8 වෙනි ඡෙදයේ දෙවෙනි කොටස මෙනි)

17. හෙතෙම ඒ ආයර්‍ය්‍යකාන්ත ශීලයෙන් සතුටුනොවී මත්තෙහි දවල් කාලයෙහි විවේකය පිණිසත් රාත්‍රි කාලයෙහි විවේකය පිණිසත් උත්සාහ කරයි. මෙසේ අප්‍රමාදව වාසය කරන්නාවූ ඔහුට සතුට උපදියි. සතුටුවූවහුට ප්‍රීතිය උපදියි, ප්‍රීති සිත් ඇත්තහුගේ කය සංසිඳෙයි, සංසිඳුනු කය ඇත්තේ සැපය විඳීයි, සැපවත් වූවහුගේ සිත එකඟවෙයි. එකඟ වූ සිතෙහි ධර්මයෝ පහළවෙත්, ධර්මයන් ගේ පහළවීමෙන් අප්‍රමාදව වාසය කරන්නේය යන සංඛ්‍යාවට පැමිණේ නන්දිය, මෙසේ වනාහි ආයර්‍ය්‍යශ්‍රාවකතෙමේ අප්‍රමාදව වාසය කරන්නේ වේයයි" වදාළේය.

---

## 5. සගාථක පුඤ්ඤාභිසන්ද වර්ගය.

### 1. පඨමකුසලාභිසන්ද සූත්‍රය

1-9. (මේ ඡෙද 4 වෙනි පුඤ්ඤාභිසන්ද වර්ගයේ 1 වෙනි සූත්‍රයේ ඡෙද මෙනි.)

10. "මහණෙනි, මේ පුන්‍ය ගංගා සතරින් කුශල ගංගා සතරින් යුක්තවූ ආයර්‍ය්‍යශ්‍රාවකයාගේ පින සැපයට හෙතුවූ මෙතරම් පුන්‍ය ගංගාවකි, කුශල ගංගාවකියි ප්‍රමාණය කිරීම පහසු නොවේ. හුදෙක් අසංඛෙය්‍යව අප්‍රමෙය්‍යවූ මහා පුන්‍ය ස්කන්ධයෙක යන සංඛ්‍යාවට පැමිණෙයි.

11. "මහණෙනි, මහා සමුද්‍රයෙහි ජලය යම්සේ මෙපමණ නැලි ගණනකි. මෙපමණ නැලි සිය ගණනකි. මෙපමණ නැලි දහස් ගණනකි. මෙපමණ නැලි ලක්ෂගණනකියි ප්‍රමාණ කිරීම පහසු නොවේ. හුදෙක් අසංඛෙය්‍ය අප්‍රමෙය්‍ය මහා ජලස්කන්ධයෙක යන සංඛ්‍යාවට පැමිණෙයි.

12. "මහණෙනි, එසේම මේ පුන්‍ය ගංගා සතරින් කුසල ගංගා සතරින් සමන්විතවූ ආර්‍ය්‍යශ්‍රාවකයාගේ පින සැපයට කරුණුවූ මෙතරම් පුන්‍යගංගාවකි කුසල ගංගාවකියි ප්‍රමාණය කිරීම පහසු නොවේ. හුදෙක් අසංඛෙය්‍යවූ අප්‍රමෙය්‍යවූ මහා පුන්‍ය ස්කන්ධයෙක යන සංඛ්‍යාවට පැමිණෙයි" භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය. සුගතයන් වහන්සේ මෙසේ වදාරා නැවතද ශාස්තෘන් වහන්සේ මෙසේ වදාළේය.

13. "මහත්වූ ජලය ඇති ප්‍රමාණ නොකළහැකි මහා විලක්වූ බොහෝ බියජනක රත්නයන්ට වාසස්ථානවූ සාගරය කරා ජන සමූහයා විසින් සේවනය කරන ලද ගලාබස්නාවූ බොහෝ ගංගාවෝ යම්සේ පැමිණෙද්ද එපරිද්දෙන්ම ආහාර දෙන්නාවූද පානවර්ග හා වස්ත්‍ර දෙන්නාවූද සයන ආසන ඇඳ ඇතිරිලි දෙන්නාවූද නුවණැති මිනිසා කරා පුන්‍ය ධාරාවෝ ගලා යන ගංගා සාගරයට පැමිණෙන්නාහ."

---

## 2. දුතිය කුසලාභිසන්ද සූත්‍රය

1-7. (මේ ඡෙද 4 වෙනි පුඤ්ඤාභිසන්ද වර්ගයේ 1 වෙනි සූත්‍රයේ ඡෙද 1-7 මෙනි.)

8. "තවද මහණෙනි, දානය පිණිස මුදන ලද සිත් ඇත්තේ පිරිසිදු කරන ලද අත් ඇත්තේ දීමෙහි ඇලුනේ, ඉල්ලීමට සුදුසුවූයේ දන් බෙදීමෙහි ඇලුනේ පහවූ මසුරුමළ ඇති සිතින් ගිහිගෙයි වාසය කරයිද මේ සතරවෙනි පුන්‍ය ගංගාව කුසල ගංගාවය. මහණෙනි, මේ වනාහි සැපයට හේතුවූ පුන්‍යගංගා කුශල ගංගා සතර වෙත්.

**9.** (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 10 ඡේදය මෙනි.)

**10.** "මහණෙනි, යම්සේ වනාහි මේ ගංගා, යමුනා, අචිරවතී, සරභූ, මහී යන පඤ්ච මහා ගංගාවෝ යම් තැනෙක එක්වෙත්ද, සමවෙත්ද එතැන්හි ජලය මෙපමණ නැලි ගණනකි, නැලි සිය ගණනකි, නැලි දහස් ගණනකි, නැලි ලක්ෂ ගණනකියි ප්‍රමාණ කිරීමට පහසු නොවෙයි. හුදෙක් අසංඛෙය්‍යවූ අප්‍රමෙය්‍යවූ මහා ජලස්කන්ධයකි යන සංඛ්‍යාවටම පැමිණේද,

**11, 12.** (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 12, 13 වෙනි ඡේද මෙන් වෙත්)

---

## 3 තතිය කුසලාභිසන්ද සූත්‍රය.

1-7. (මේ ඡේද 4 වෙනි පුඤ්ඤාභි සන්ද වර්ගයේ 1 වෙනි සූත්‍රයේ ඡේද 1-7 මෙනි.)

8. "තවද මහණෙනි, මේ ශාසනයෙහි ආය්‍ය්‍යශ්‍රාවක තෙමේ නුවණැත්තේ වෙයිද උදය ව්‍යය දක්නා නුවණින් යුක්තවූයේ වෙයිද ආය්‍ය්‍යවූ විනිවිද දක්නාවූ මනාකොට දුක් ක්ෂය කරන්නාවූ නුවණින් යුක්තවූයේ වෙයිද සැපයට හෙතුවූ මේ සතරවැනි පුන්‍ය ගංගාව කුසල ගංගාවය

9. "මහණෙනි, මේ සැපයට හේතුවූ පුන්‍ය ගංගා කුසල ගංගා සතර වෙති. මහණෙනි, සැපයට හෙතුවූ මේ පුන්‍ය ගංගා සතරින් කුසල ගංගා සතරින් සමන්විතවූ මේ ආය්‍ය්‍ය ශ්‍රාවකයාගේ පින සැපයට හෙතුවූ මෙතරම් පුන්‍ය ගංගාවකි කුසල ගංගාවෙකැයි ප්‍රමාණය කිරීම පහසුනොවේ. හුදෙක් අසංඛෙය්‍යවූ අප්‍රමෙය්‍යවූ මහා පුන්‍යස්කන්ධයෙක යන සංඛ්‍යාවට පැමිණෙයි" භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සුගතයන් වහන්සේ මෙය වදාරා නැවත සාස්තෘන් වහන්සේ මෙසේ වදාළේය.

"සිත් කැමැත්තාවූ මාර්ග කුශලයෙහි පිහිටියාවූ යමෙක්
නිවණට පැමිණීම පිණිස අර්හත් මාර්ගය වඩයිද,

කෙලෙසුන් නැසීමෙහි ඇළුණු හෙතෙමේ ලැබූ අර්හත්ඵල සංඛ්‍යාත ධර්ම සාරය ඇත්තේ මරහු වෙත යන්නේයයි කම්පා නොවෙයි.”

---

## 4. පඨම මහද්ධන සූත්‍රය.

1. (4, 5, 6, 7 සහ 10 සූත්‍රයන්හි මේ ඡේදය 4 වර්ගයේ 1 සූත්‍රයේ මුල් ඡේදය මෙනි.)

**2.** “මහණෙනි, ධර්ම සතරකින් යුක්තවූ ආර්‍ය්‍යශ්‍රාවක තෙම ආර්‍ය්‍ය ධනයෙන් ආඪ්‍යය. මහත් ධන ඇත්තේය. මහත් භොග ඇත්තේය. මහත් යසස් ඇත්තේයයි කියනු ලැබේ. කවර සතරකින්ද,

**3. 4. 5. 6.** (මේ ඡේද පුඤ්ඤාභිසන්ද වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 2. 4. 6. 8. වෙනි ඡේද මෙන් වෙත්.)

**7.** “මහණෙනි, මේ ධර්ම සතරින් යුක්තවූ ආර්‍ය්‍යශ්‍රාවක තෙම ආර්‍ය්‍ය ධනයෙන් ආඪ්‍යය. මහත් ධන ඇත්තේය. මහත් භොග ඇත්තේය. මහත් යසස් ඇත්තේයයි කියනු ලැබේ යයි” වදාළේය.

---

## 5. දුතිය මහද්ධන සූත්‍රය.

**2.** (මේ ඡේදය මේ වර්ගයේ 4 සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

**3. 4. 5. 6.** (මේ ඡේද පුඤ්ඤාභිසන්ද වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 2. 4. 6. 8. වෙනි ඡේද මෙනි.)

**9.** “මහණෙනි, මේ ධර්ම සතරින් යුක්තවූ ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ ආර්‍ය්‍ය ධනයෙන් ආඪ්‍යය මහධන ඇත්තේය. මහත් භොග ඇත්තේය. මහත් යසස් ඇත්තේයයි කියනු ලැබේයයි” වදාළේය.

---

## 6. අරියකන්ත සූත්‍රය.

2. "මහණෙනි, ධර්ම සතරකින් යුක්තවූ ආර්‍යශ්‍රාවක තෙමේ අපායෙහි නොවැටීම ස්වභාවයකොට ඇත්තාවූ නියත ගති ඇත්තාවූ මතුමාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයෙක් වෙයි. කවර සතරකින්ද?

3. 4. 5. 6. (මේ ඡේද පුඤ්ඤාභිසන්ද වර්ගයේ 1 වෙනිසූත්‍රයේ 2. 4. 6. 8. වෙනි ඡේද මෙනි.)

7. 'මහණෙනි, මේ ධර්මසතරින් යුක්තවූ ආර්‍යශ්‍රාවක තෙමේ අපායෙහි නොවැටීම ස්වභාවකොට ඇත්තාවූ නියත ගති ඇත්තාවූ මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන්වූයේ වේයයි" වදාළේය.

---

## 7. නන්දිය සක්ක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යජනපදයෙහි කිඹුල්වත්පුරයෙහිවූ නිග්‍රොධාරාමයෙහි වැඩවසනසේක. එකල්හි නන්දිය නම් ශාක්‍යතෙම භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටු විය. සතුටු විය යුතුවූ සිහි කටයුතු කථාව කර නිමවා එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ නන්දිය ශාක්‍යයාට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය.

2. "නන්දිය ධර්ම සතරකින් යුත් ආර්‍යශ්‍රාවකතෙම අපායෙහි නොවැටීම ස්වභාවකොට ඇත්තාවූ නියත ගති ඇත්තාවූ මතුමාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයෙක් වූයේ වෙයි. කවර සතරකින්ද යත්?

3, 4, 5, 6, (මේ ඡේද පුඤ්ඤාභිසන්ද වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 2. 4. 6. 8. වෙනි ඡේද මෙනි.)

7. "නන්දිය, මේ ධර්ම සතරින් යුක්තවූ ආර්‍යශ්‍රාවක තෙම අපායෙහි නොවැටීම ස්වභාවකොට ඇත්තාවූ නියත ගති

ඇත්තාවූ මතුමාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන් පුද්ගලයෙක් වේයයි" වදාළේය.

---

## 8. භද්දිය සක්ක සූත්‍රය.

1. (මේ ඡේදය 7 වෙනි සූත්‍රයේ 1 ඡේදය මෙනි එහි " නන්දිය" මෙහිදී "භද්දිය" කියා වෙනස් වේ.)

2. "භද්දිය, ධර්මසතරකින් ආයර්‍ය්‍යශ්‍රාවකතෙම අපායෙහි නොවැටෙන ස්වභාව ඇත්තාවූ නියත ගති ඇත්තාවූ මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන්වූයේ වෙයි. කවර සතරකින්ද යත්?

3, 4, 5, 6, (මේ ඡේද පුඤ්ඤාභිසන්ද වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 2. 4. 6. 8. වෙනි ඡේද මෙනි.)

7. "භද්දිය, මේ ධර්ම සතරින් යුත් ආයර්‍ය්‍යශ්‍රාවකතෙම අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ, නියත ගති ඇත්තාවූ මතුමාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන්වූයේ වෙයි."

---

## 9. මහානාම සක්ක සූත්‍රය.

1. (මේ ඡේදය 7 වෙනි සූත්‍රයේ 1 ඡේදය මෙනි. එහි " නන්දිය" මෙහිදී "මහානාම" කියා වෙනස් වේ.)

2. "මහානාම, ධර්ම සතරකින් යුක්තවූ ආයර්‍ය්‍යශ්‍රාවක තෙම අපායෙහි නොවැටෙන ස්වභාව ඇත්තාවූ නියත ගති ඇත්තාවූ මතු මාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන්වූයේ වෙයි. කවර සතරකින්ද,

3, 4, 5, 6 (මේ ඡේද පුඤ්ඤාභිසන්ද වර්ගයේ පළමුවෙනි සූත්‍රයේ 2, 4, 6, 8, වෙනි ඡේද මෙනි.)

7. "මහානාම, මේ ධර්ම සතරින් යුත් ආයර්‍ය්‍යශ්‍රාවකතෙම අපායෙහි නොවැටෙන ස්වභාවය ඇත්තාවූ නියත ගති ඇත්තාවූ මතුමාර්ගත්‍රය පිහිටකොට ඇත්තාවූ සෝවාන්වූයේ වෙයි" කියායි.

---

## 10. චතුරංග සූත්‍රය.

2. "මහණෙනි, මේ සොතාපත්තියංග සතරක් වෙති. කවර සතරක්ද, සත්පුරුෂ සේවනය, සද්ධර්මශ්‍රවණය, යොනිසොමනසිකාරය ධර්මානුධර්ම ප්‍රතිපත්තිය යනුයි. මහණෙනි, මේ සොතාපත්තියංග සතර වෙති.

---

# 6. සප්පඤ්ඤ වර්ගය.

## 1. අදලිද්ද (සගාථක) සූත්‍රය.

1. (මේ ඡේදය 4 වෙනි වර්ගයේ 1 වෙනි සූත්‍රයේ මුල් ඡේදය මෙනි.)

2. "මහණෙනි, ධර්ම සතරකින් යුක්තවූ ආර්‍ය්‍යශ්‍රාවක තෙමේ අපායෙහි නොවැටීම ස්වභාවය කොට ඇත්තේ නියත ගති ඇත්තේ මතුමාර්ගත්‍රය නම් සම්බොධිය පිහිටකොට ඇත්තේ සෝවාන්වූයේ වෙයි. කවරනම් සතරකින්ද යත්.

3. 4. 5. 6. (මේ ඡේද 4 වෙනි වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 2, 3, 4, 5 ඡේද මෙනි.)

7. "මහණෙනි, මේ සතර ධර්මයෙන් යුක්තවූ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම අපායෙහි නොවැටීම ස්වභාව කොට ඇත්තේ නියත ගති ඇත්තේ මතුමාර්ගත්‍රය පිහිටකොට ඇත්තේ සෝවාන් වූයේ වෙයි" මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක සුගතයන්වහන්සේ මෙය වදාරා නැවත ශාස්තෘන් වහන්සේ මෙසේ වදාළහ.

8. (මේ ඡේදය 3168 වෙනි පිටේ 21 වෙනි ඡේදය මෙනි.)

---

## 2. වස්සවුත්ථ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එකල සැවැත්නුවර වස්විසූ භික්ෂුවක් යම්කිසි කටයුත්තක් සඳහා කිඹුල්වත් පුරයට පැමිණියේ

වෙයි. සැවැත්නුවරට වස්විසූ කිසියම් භික්ෂුවක් කිඹුල්වත් පුරයට පැමිණියේයයි කිඹුල්වත්පුර වාසී ශාක්‍යයෝ ඇසූහ. එකල කිඹුල්වත්පුර වැසි ශාක්‍යයෝ ඒ භික්ෂුව යම්තැනෙක්හිද, එතැනට ගියාහුය. එහි ගොස් ඒ භික්ෂුව වැඳ එක්පසෙක හුන්නාහ. එක්පසෙක හුන්නාවූ කිඹුල්වත්පුර වාසී ශාක්‍යයෝ ඒ භික්ෂුවට මේ කාරණය කීහ.

2. 'ස්වාමීනි, කිමෙක්ද? භාග්‍යවතුන්වහන්සේ නිරෝගිද, ශක්තිමත්ද?"

"ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ නිරෝගිද ශක්තිමත්ද වෙති."

"කිමෙක්ද? ස්වාමීනි, සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ නිරෝගිද ශක්තිමත්ද?"

"ඇවැත්නි, සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ නිරෝගිද ශක්තිමත් වෙති."

"කිමෙක්ද? ස්වාමීනි, භික්ඛු සංඝයා වහන්සේ නිරෝගිද ශක්තිමත්ද?"

"ඇවැත්නි, භික්ඛු සංඝයා වහන්සේ නිරෝගිද ශක්තිමත්ද වෙත්."

3. "ස්වාමීනි, ඔබ වහන්සේ විසින් මේ වස් කාලය තුළ භාග්‍යවතුන් වහන්සේගේ හමුවෙන් අසන ලද (භාග්‍යවතුන් වහන්සේගේ) හමුවෙන් පිළිගන්නා ලද කිසිවක් ඇත්තේද?"

"ඇවැත්නි, මා විසින් භාග්‍යවතුන් වහන්සේගේ හමුවෙන් මේ කාරණය අසන ලදී. භාග්‍යවතුන් වහන්සේගේ හමුවෙන් මෙය පිළිගන්නා ලදී. (කුමක්ද?) 'මහණෙනි, යම් භික්ෂූ කෙනෙක් කෙලෙසුන් නැසීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත් ඵල සමාධියද, අර්හත් ඵල ප්‍රඥාවද, මේ ආත්මයේදීම තුමූම විශිෂ්ට ඥානයෙන් දැන ඊට පැමිණ වාසය කෙරෙත්ද, ඒ භික්ෂූහු ස්වල්ප වෙති. යම් ඒ භික්ෂූ කෙනෙක් ඔරම්භාගිය සංයොජන පස නැසීමෙන් ඕපපාතික වූවාහු ඒ බඹලොවින් නැවත කාමලොකයට නොඑන

එහිම පිරිනිවෙන අනාගාමීහු වෙත්ද, ඔව්හුම බොහෝවෙත්' යනුයි.

"ඇවැත්නි, මා විසින් වනාහි වෙනත් කරුණක්ද භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙන් අසන ලදී. සමීපයෙන් පිළිගන්නා ලදී. ඒ කුමක්ද? 'යම් ඒ භික්ෂු කෙනෙක් ඔරම්භාගිය සංයොජන පස නැසීමෙන් ඕපපාතිකව එහිම පිරිනිවෙන නැවත කාම ලොකයට නොඑන අනාගාමීහු වෙත්ද, ඔව්හු ස්වල්ප වෙති. යම් කෙනෙක් ත්‍රිවිධ සංයොජනයන් නැසීමෙන් රාග දොෂ මොහයන් තුනී කිරීමෙන් නැවත එක්වරක්ම කාම ලොකයට අවුත් පිරිනිවෙන සකෘදාගාමීහු වෙත්ද, ඔව්හුම ඉතා බොහෝ වෙත්.'

5. "ඇවැත්නි, මා විසින් භාග්‍යවතුන් වහන්සේ වෙතින් අනික් කරුණක්ද අසන ලදී. භාග්‍යවතුන් වහන්සේ වෙතින් පිළිගන්නා ලදී, 'යම් භික්ෂු කෙනෙක් සංයොජන තුනක් තුනී කිරීමෙන් රාග දොෂ මෝහයන් තුනීකොට උත්පත්ති වශයෙන් නැවත වරක් මේ කාම ලොකයට පැමිණෙන්නාවූ සකෘදාගාමීහු වෙත්ද, ඔව්හු ස්වල්ප වෙත්. යමෙක් තුමූ සංයොජන තුනක් නැසීමෙන් අපායෙහි නොවැටෙන ස්වභාවය ඇති නියත ගති ඇත්තාවූ මතුමාර්ගඥාන බොධිය පිහිටකොට ඇත්තාවූ සෝවාන්වූවාහු වෙත්ද, ඔව්හුම අතිශයින් බොහෝවෙතියි" වදාළසේක.

---

## 3. ධම්මදින්න සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බරණැස මිගදාය නම්වූ ඉසිපතනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි ධම්මදින්න උපාසක තෙමේ පන්සියයක් උපාසකයන් සමග භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන් ධම්මදින්න උපාසක තෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකෙළේය.

2. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, අපට යමක් දීර්ඝ කාලයක් හිත පිණිස සැප පිණිස පවතීද එබන්දකින් අපට අවවාද කරන සේක්වා. අපට අනුශාසනය කරණ සේක්වා."

3. "ධම්මදින්නයෙහි, එසේනම් මෙහිලා තොප විසින් මෙසේ හික්මවිය යුතුයි. තථාගතයන්වහන්සේ විසින් වදාළාවූ ගැඹුරු ධර්ම ඇති ගැඹුරු අර්ථ ඇති, ලොකොත්තරවූ සූන්‍යතා ධර්මයන්ගෙන් යුක්තවූ ඒ සූත්‍ර දෙශනාවෙන්ද කලින් කල ඊට පැමිණ වාසය කරන්නෙමුයි ධම්මදින්නයෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුයයි' වදාළසේක

4. "ස්වාමීනි, අඹුදරු ගැහැට සහිත ගිහිගෙයි වසන්නාවූ කසීරට උපන් සඳුන් කල්ක පරිභොග කරන්නාවූ මල් ගඳ විලවුන් දරන්නාවූ රන් රිදී පරිහරණය කරන අප විසින් තථාගතයන් වහන්සේ විසින් වදාළ ගැඹුරුවූ, ගැඹුරු අර්ථ ඇති සූන්‍යතා ප්‍රතිසංයුක්තවූ යම් ඒ සූත්‍රාන්ත කෙනෙක් වෙත්ද ඊට කලින් කල පැමිණ වාසය කිරීම යන මෙය පහසු නොවේ. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස පඤ්ච ශික්ෂාපදයෙහි පිහිටියාවූ අපට වැඩිමනත් ධර්මයක් දෙසන සේක්වායි කීය. ධම්මදින්නයෙනි, එසේ නම් තොප විසින් මෙසේ හික්මිය යුතුයි

5, 6, 7, 8. (මේ ඡෙද පුඤ්ඤාභිසන්ද වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 2, 4, 6 සහ 8 වෙනි ඡෙද මෙනි. එහි "වෙයි" යන තැන් මෙහි "වන්නෙමු" කියා වෙයි) තොප විසින් මෙසේ හික්මිය යුත්තාහ

9. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් ඒ සොතාපත්ති අංග සතරක් දෙශනා කරන ලද්දාහුද, අප කෙරෙහි ඒ ධර්මයෝ ඇත්තාහ. ස්වාමීනි, අපි ඒ ධර්මයන්හි දක්නා ලබමු.

10-13. (මේ ඡෙද පුඤ්ඤාභිසන්ද වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 2-8 වෙනි ඡෙදය මෙනි. එහි "වෙයි" යනු මෙහි "වන්නෙමු" වෙයි.

14. "ධම්මදින්නයෙනි, තොපට ලාභයකි. ධම්මදින්නයෙනි තොප විසින් යහපත් ලාභයක් ලබන ලදී. ධම්මදින්නයෙනි, සෝවාන් ඵලය ප්‍රකාශ කරන ලද්දේ වෙයි.

---

## 4. අස්සාසනිය ධම්ම (ගිලායන) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත්පුර සමීපයෙහි නිග්‍රෝධාරාමයෙහි වැඩවසනසේක. එකල වනාහි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ සිවුරු මැසීම කරත්. සිව්රු මැසීම නිමවූ කල්හි භාග්‍යවතුන් වහන්සේ තුන්මසකින් චාරිකාවෙහි වඩින්නේය කියායි. මහානාම ශාක්‍යතෙම වනාහි බොහෝ භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේගේ සිව්රු මැසීම කරත්. නිමවූ සිවුර ඇති භාග්‍යවතුන් වහන්සේ තුන් මසකින් චාරිකාවෙහි වඩින්නේයයි ඇසුවේය.

2. එකල මහානාම ශාක්‍යතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන් මහානාම ශාක්‍යතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය. " ස්වාමීනි, බොහෝ භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේගේ සිවුරු මැසීම කරත්. නිමවන ලද සිවුර ඇති භාග්‍යවතුන් වහන්සේ තෙමසකින් චාරිකාවෙහි වඩින්නේය. යන මෙය මා විසින් අසනලදී. ස්වාමීනි නුවණැති (සෝවාන්වූ) උපාසකයෙක් විසින් රෝගීවූ දුක්ඛිතවූ දැඩි ගිලන්වූ නුවණැති (සෝවාන්වූ) උපාසකතෙම අවවාද කටයුතුය යන මෙය භාග්‍යවතුන් වහන්සේ වෙතින් නොම අසනලදී. භාග්‍යවතුන් වහන්සේ හමුවෙන් නොම පිළිගන්නා ලදී." කියායි.

3. "මහානාමයෙනි, නුවණැති (සෝවාන්වූ) උපාසකයෙකු විසින් රෝගීවූ දුකට පැමිණියාවූ දැඩි ගිලන්වූ (සෝවාන්වූ) උපාසකතෙම අස්වැසියයුතු දහම් සතරෙන් අස්වැසිය යුත්තේය, ආයුෂ්මතුන්හට (මේ ඡේදයේ ඉතුරු කොටස පුඤ්ඤාභිසන්ද

වර්ගයෙහි 1 වන සූත්‍රයේ 2, 4, 6, 8 වෙනි ඡේදය මෙනි) එනිසා ආයුෂ්මත්තෙම සැනසෙනු මැනවි කියායි.

4. මහානාමයෙනි, නුවණැති උපාසකයා විසින් රෝගීවූ දුක්ඛිතවූ දැඩි ගිලන්වූ උපාසකතෙමේ මේ සතර වැදෑරුම් අස්වැසීම් ධර්මයන්ගෙන් අස්වසා මෙසේද කියයුත්තේය, 'ආයුෂ්මතුන් තුළ මව්පියන් කෙරෙහි අපෙක්ෂාවක් ඇත්තේද?" කියායි. ඉදින් හෙතෙම 'මාතුළ මව්පියන් කෙරේ අපෙක්ෂාව ඇත්තේයයි' මෙසේ කීයේ නම් මෙසේ කියයුතු වන්නේය. ආයුෂ්මත් තෙමේද මරණය ස්වභාවකොට ඇත්තෙකි, ඉදින් 'ආයුෂ්මත් තෙමේ මව්පියන් කෙරේ අපෙක්ෂා කරන්නේද ඒත් මැරෙන්නේමය. ඉදින් ආයුෂ්මත්තෙමේ මව්පියන් කෙරේ අපෙක්ෂාවක් ඇතිකර නොගන්නේද ඒත් මැරෙන්නේමය. ඉදින් මව්පියන් කෙරේ ආයුෂ්මතුන්ගේ යම් අපෙක්ෂාවක් ඇත්නම් එය දුරුකරව' කියායි.

5. "හෙතෙම ඉදින් මා තුළ මව්පියන් කෙරේ යම් අපෙක්ෂාවක් වීනම් එය ප්‍රහීනවූයේ යයි කියයි නම් ඔහුට මෙසේ කිවයුතු වන්නේය. 'ආයුෂ්මතුන්ට අඹු දරුවන් කෙරෙහි අපෙක්ෂාවක් ඇත්තේද?' කියායි. ඔහු 'මට අඹු දරුවන් කෙරෙහි අපෙක්ෂාවක් ඇත්තේයයි' ඉදින් කියන්නේ නම් ඔහුට මෙසේ කියයුතු වන්නේය. 'නිදුකාණනි, ආයුෂ්මත් තෙමේ මරණය ස්වභාවය කොට ඇත්තේය. ආයුෂ්මත් තෙමේ අඹු දරුවන් කෙරෙහි අපෙක්ෂා කරන්නේ නමුදු මැරෙන්නේමය. ආයුෂ්මත් තෙමේ අඹු දරුවන් කෙරේ අපෙක්ෂා නොකරන්නේ නමුදු මැරෙන්නේමය. ඉදින් අඹු දරුවන් කෙරේ ආයුෂ්මත්හුගේ යම් අපෙක්ෂාවක් වන්නීද, එය දුරුකරව' කියායි. 'අඹු දරුවන් කෙරේ මාගේ යම් අපෙක්ෂාවක් වූවාද එය ප්‍රහීනවූයේයයි' ඉදින් හෙතෙම කියන්නේ නම් ඔහුට මෙසේ කිය යුතුය. 'ආයුෂ්මතුන්ට මිනිස් පස් කම් සැපයෙහි අපෙක්ෂාවක් ඇත්තේද?' කියායි. 'ඉදින් මට මිනිස් පස්කම් සැපයෙහි අපෙක්ෂාව ඇත්තේයයි' ඉදින් හෙතෙම කියන්නේ නම් ඔහුට මෙසේ කිය යුතුය. 'ඇවැත්නි මනුෂ්‍ය කාමගුණයන්ට වඩා දිව්‍යමයවූ කාමගුණයෝ

අතිශයින් උසස්ය. අතිශයින් ප්‍රණීතය. ආයුෂ්මත් තෙමේ මනුෂ්‍ය කාම ගුණයන් කෙරෙන් සිත ඉවත්කොට චාතුර්මහාරාජික දෙවියන් කෙරේ සිත පිහිටවනු යෙහෙක' කියායි.

"හෙතෙම 'මා විසින් මනුෂ්‍ය කාම ගුණයන්ගෙන් සිත ඉවත් කරන ලදී. චාතුර්මහාරාජික දෙවියන් කෙරෙහි සිත පිහිටුවන ලදැයි' ඉදින් මෙසේ කියන්නේ නම් ඔහුට මෙසේ කියයුතු වන්නේය. 'ඇවැත්නි, චාතුර්මහාරාජික දෙවියන්ට වඩා තව්තිසා වැසි දෙවියෝ අතිශයින් උසස්ය අතිශයින් ප්‍රණීතය, ආයුෂ්මත් තෙමේ චාතුර්මහාරාජික දෙවියන් කෙරෙන් සිත ඉවත්කොට තව්තිසා වැසි දෙවියන් කෙරෙහි සිත පිහිටුවනු මැනව' කියායි

"හෙතෙම ඉදින් 'මාගේ සිත චාතුර්මහාරාජික දෙවියන් කෙරෙන් ඉවත් කරන ලදී. තව්තිසා දෙවියන් කෙරෙහි සිත පිහිටුවන ලදැයි' ඉදින් මෙසේ කියන්නේ නම් ඔහුට මෙසේ කියයුතු වන්නේය. 'ඇවැත්නි, තව්තිසා වැසි දෙවියන්ට වඩා යාම දෙවියෝ අතිශයින් උසස්ය, ප්‍රණීතතරය. ආයුෂ්මත් තෙමේ තව්තිසා දෙවියන් කෙරෙන් සිත ඉවත්කොට යාම දෙවියන් කෙරෙහි සිත පිහිටුවනු මැනව' කියායි.

"හෙතෙම 'මාගේ සිත තව්තිසා වැසි දෙවියන් කෙරෙන් ඉවත් කරන ලද්දේය. යාම දෙවියන් කෙරෙහි මාගේ සිත පිහිටුවන ලදැයි' ඉදින් මෙසේ කියන්නේ නම් ඔහුට මෙසේ කියයුතු වන්නේය. 'ඇවැත්නි, යාම දෙවියන්ට වඩා තුසිත දෙවියෝ අතිශයින් උසස්ය, අතිශයින් ප්‍රණීතය. ආයුෂ්මත් තෙමේ යාම දෙවියන් කෙරෙන් සිත ඉවත්කොට තුසිත දෙවියන් කෙරෙහි සිත පිහිටුවනු මැනව' කියායි.

"හෙතෙමේ 'මාගේ සිත යාම දෙවියන් කෙරෙන් ඉවත් කරන ලදී. තුසිත දෙවියන් කෙරෙහි සිත පිහිටුවන ලද්දේ යයි' ඉදින් මෙසේ කියන්නේ නම් ඔහුට මෙසේ කිවයුතු වන්නේය. 'ඇවැත්නි, තුසිත දෙවියන්ට වඩා නිර්මාණරතී දෙවියෝ වඩා උසස්ය වඩා ප්‍රණීතය. ආයුෂ්මත් තෙමේ තුසිත දෙවියන්

කෙරෙන් සිත ඉවත්කොට නිර්මාණරතී දෙවියන් කෙරෙහි සිත පිහිටුවනු මැනව' කියායි.

"හෙතෙමේ 'මාගේ සිත තුසිත දෙවියන් කෙරෙන් ඉවත් කරන ලදී නිර්මාණරතී දෙවියන් කෙරෙහි මාගේ සිත පිහිටුවන ලදැයි' ඉදින් මෙසේ කියන්නේ නම් ඔහුට මෙසේ කියයුතු වන්නේය. 'ඇවැත්නි, නිර්මාණරතී දෙවියන්ට වඩා පරනිර්මිත වසවර්තී දෙවියෝ විශෙෂයෙන් උසස්ය. විශෙෂයෙන් ප්‍රණීතය. ආයුෂ්මත් තෙමේ නිර්මාණරතී දෙවියන් කෙරෙන් සිත ඉවත්කොට පරනිර්මිත වසවර්තී දෙවියන් කෙරෙහි පිහිටුවනු මැනව' කියායි.

"හෙතෙමේ 'මාගේ සිත නිර්මාණරතී දෙවියන් කෙරෙන් ඉවත් කරන ලදී. පරනිර්මිත වසවර්තී දෙවියන් කෙරෙහි මාගේ සිත පිහිටුවන ලද්දේයයි' ඉදින් කියන්නේ නම් ඔහුට මෙසේ කියයුතු වන්නේය. 'ඇවැත්නි, පරනිර්මිත වසවර්තී දෙවියන්ට වඩා බඹලොව අතිශයින් උසස්ය, අතිශයින් ප්‍රණීතය. ආයුෂ්මත් තෙමේ පරනිර්මිත වසවර්තී දෙවියන් කෙරෙන් සිත ඉවත්කොට බඹලොව සිත පිහිටුවනු මැනව' කියායි.

"හෙතෙමේ 'මාගේ සිත පරනිර්මිත වසවර්තී දෙවියන් කෙරෙන් ඉවත් කරන ලදී. බඹලොව සිත පිහිටුවන ලදැයි' ඉදින් මෙසේ කියන්නේ නම් ඔහුට මෙසේ කියයුතු වන්නේය. 'ඇවැත්නි, බ්‍රහ්ම ලෝකයද අනිත්‍යය. අස්ථිරය. පඤ්චස්කන්ධයට ඇතුළත්ය. (එහෙයින්) ආයුෂ්මත් තෙමේ බඹලොවින් සිත ඉවත්කොට පඤ්චස්කන්ධය නිරොධයෙහි සිත යොමු කරව' යනුයි.

"හෙතෙම 'මාගේ සිත බඹලොවින් ඉවත් කරන ලදී. සක්කාය නිරොධයෙහි සිත යොමු කරන ලදැයි' ඉදින් කියන්නේ නම් මහානාමයෙනි, මෙසේ වනාහි කෙලෙසුන් කෙරෙන් මිදුනු සිත් ඇති, රහත් ඵලයට පැමිණි උපාසකයාගේද සියක් වස් ගිය මිදුණු සිත් ඇති භික්ෂුවගේද විමුක්තිය අතර කිසියම් වෙනසක් නොකියමියි" වදාළේය.

---

## 5 සොතාපත්ති ඵල සූත්‍රය.

1. (මේ ඡේදය 4 වෙනි වර්ගයේ 1 වෙනි සූත්‍රයේ මුල් ඡේදය මෙනි)

2. "මහණෙනි, වඩන ලද්දාවූ බහුල වශයෙන් පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර සෝවාන් ඵලයාගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්. කවර සතරක්ද? සත්පුරුෂ සේවනය සද්ධර්මශ්‍රවණය, නුවණින් මෙනෙහි කිරීම හා ධර්මානුධර්ම ප්‍රතිපත්තියද වෙති. මහණෙනි වඩන ලද්දාවූ නැවත නැවත පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර සෝවාන් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්."

---

## 6. සකෘදාගාමි ඵල සූත්‍රය.

1. (මෙතැන් සිට ඇති මේ වර්ගයේ සූත්‍ර සියල්ලම මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1 ඡේදය මෙනි.)

2. "මහණෙනි, වඩන ලද්දාවූ බහුල වශයෙන් පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර සකෘදාගාමි ඵලයාගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්, කවර සතරක්ද? සත්පුරුෂ සේවනය සද්ධර්මශ්‍රවණය, නුවණින් මෙනෙහි කිරීම ධර්මානුධර්ම ප්‍රතිපත්තියද වෙති. මහණෙනි, වඩන ලද්දාවූ බහුල වශයෙන් පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර සකෘදාගාමි ඵලයාගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්."

---

## 7. අනාගාමි ඵල සූත්‍රය.

2. "මහණෙනි, වඩන ලද්දාවූ බහුල වශයෙන් පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර අනාගාමි ඵලයාගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්, කවර සතරක්ද? සත්පුරුෂ සේවනය සද්ධර්මශ්‍රවණය, යෝනිසොමනස්කාරය, ධර්මානුධර්ම ප්‍රතිපත්තියද වෙති. මහණෙනි, වඩන ලද්දාවූ බහුල වශයෙන්

පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර අනාගාමි ඵලයාගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්."

## 8. අරහන්ත ඵල සූත්‍රය.

**2.** "මහණෙනි, වඩන ලද්දාවූ බහුල වශයෙන් පුරුදු කරන ලද්දාවූ, මේ ධර්ම සතර අර්හත් ඵලයාගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්, කවර නම් සතරක්ද? සත්පුරුෂ සේවනය, සද්ධර්මශ්‍රවණය, යෝනියෝමනස්කාරය හා ධර්මානුධර්ම ප්‍රතිපත්තියද වෙති. මහණෙනි, වඩන ලද්දාවූ බහුල වශයෙන් පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර අර්හත් ඵලයාගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවතිත්."

## 9. පඤ්ඤා පටිලාභ සූත්‍රය.

**2.** "මහණෙනි, වඩන ලද්දාවූ බහුල වශයෙන් පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර ප්‍රඥාව ලැබීම පිණිස පවතිත්. කවර සතරක්ද? සත්පුරුෂ සේවනය. සද්ධර්මශ්‍රවණය, යෝනිසෝමනස්කාරය හා ධර්මානුධර්ම ප්‍රතිපත්තියද වෙති. මහණෙනි, වඩන ලද්දාවූ බහුල වශයෙන් පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර ප්‍රඥාවගේ ලැබීම පිණිස පවතිත්."

## 10. පඤ්ඤාබුද්ධි සූත්‍රය.

**2.** "මහණෙනි, වඩන ලද්දාවූ බහුල වශයෙන් පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර ප්‍රඥාවගේ වැඩීම පිණිස පවතිත් කවර සතරක්ද? සත්පුරුෂයන් සේවනය, සද්ධර්ම ශ්‍රවණය යෝනිසෝමනස්කාරය හා ධර්මානුධර්ම ප්‍රතිපත්තියද වෙති. මහණෙනි, වඩන ලද්දාවූ බහුල වශයෙන් පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර ප්‍රඥාවගේ වැඩීම පිණිස පවතිත්."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 11. පඤ්ඤාවෙපුල්ලතා සූත්‍රය.

2. "මහණෙනි වඩන ලද්දාවූ බහුල වශයෙන් නැවත නැවත පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර ප්‍රඥාවගේ මහත් බව පිණිස පවතිත්, කවර සතරක්ද? සත්පුරුෂ සේවනය, සද්ධර්මශ්‍රවණය, යෝනිසෝමනස්කාරය හා ධර්මානුධර්ම ප්‍රතිපත්තියද වෙති, මහණෙනි, වඩන ලද්දාවූ බහුල වශයෙන් පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර ප්‍රඥාවගේ මහත් බව පිණිස පවතිත්" යයි වදාළසේක.

---

# 7. මහාප්‍රඥා වර්ගය.

## 1. මහා පඤ්ඤතා සූත්‍රය.

1. (මේ වර්ගයේ 1 වෙනි ඡෙද සියල්ල පුඤ්ඤාභිසන්ද වර්ගයේ 1 වෙනි ඡෙදය මෙනි. පිට 3179)

2. "මහණෙනි, වඩනලද්දාවූ බහුලවශයෙන් පුරුදුකරන ලද මේ ධර්ම සතර මහා ප්‍රඥාව ඇතිබව පිණිස පවතිත්.

3. "කවර සතරක්ද? සත්පුරුෂ සේවනය, සද්ධර්ම ශ්‍රවණය, යොනිසොමනසිකාරය, ධර්මානුධර්ම ප්‍රතිපත්තිය යන මේ සතරය.

4. "මහණෙනි, වඩනලද්දාවූ, පුරුදුකරනලද්දාවූ මේ ධර්ම සතර මහා ප්‍රඥාව ඇතිබව පිණිස පවතිත්යයි" වදාළසේක.

---

## 2. පුථුපඤ්ඤතා සූත්‍රය.

2. "මහණෙනි, වඩනලද්දාවූ බහුලවශයෙන් පුරුදුකරන ලද්දාවූ මේ ධර්ම සතර පුථුපඤ්ඤභාවය පිණිස පවතිත්.

3. (මේ ඡෙදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 3 වෙනි ඡෙදය මෙනි.)

4. "මහණෙනි, වඩනලද්දාවූ, පුරුදුකරනලද්දාවූ, මේ ධර්ම සතර පුථුපඤ්ඤතාභාවය පිණිස පවතිත්යයි" වදාළසේක.

---

### 3. විපුලපඤ්ඤතා සූත්‍රය.

2. 'මහණෙනි, වඩනලද්දාවූ පුරුදුකරනලද්දාවූ මේ ධර්ම සතර විපුලපඤ්ඤභාවය පිණිස පවතිත්.

3. (මේ ඡෙදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 3 ඡෙදය මෙනි.)

4. "මහණෙනි, වඩනලද්දාවූ, පුරුදුකරනලද්දාවූ මේ ධර්ම සතර විපුලපඤ්ඤභාවය පිණිස පවතිත්යයි" වදාළසේක.

---

### 4. ගම්භිර පඤ්ඤතා සූත්‍රය

2. "මහණෙනි, වඩනලද්දාවූ පුරුදුකරනලද්දාවූ මේ ධර්ම සතර ගම්භිර පඤ්ඤභාවය පිණිස පවතිත්.

3. (මේ ඡෙදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 3 ඡෙදය මෙනි.)

4. "මහණෙනි, වඩනලද්දාවූ, පුරුදුකරන ලද්දාවූ මේ ධර්ම සතර ගම්භිර පඤ්ඤාභාවය පිණිස පවතිත්යයි" වදාළසේක.

---

### 5. අසාමන්ත පඤ්ඤතා සූත්‍රය

2. "මහණෙනි, වඩනලද්දාවූ, පුරුදුකරනලද්දාවූ, මේ ධර්ම සතර අසාමන්ත පඤ්ඤභාවය පිණිස පවතිත්.

3. (මේ ඡෙදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 3 ඡෙදය මෙනි.)

4. "මහණෙනි, වඩනලද්දාවූ පුරුදුකරන ලද්දාවූ මේ ධර්ම සතර අසාමන්ත පඤ්ඤභාවය පිණිස පවතිත්යයි" වදාළසේක.

---

## 6. භූරිපඤ්ඤතා සූත්‍රය.

2. "මහණෙනි, වඩන ලද්දාවූ පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර භූරිපඤ්ඤභාවය පිණිස පවතිත්.

3. (මේ ඡෙදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 3 ඡෙදය මෙනි.)

4. "මහණෙනි, වඩනලද්දාවූ පුරුදු කරනලද්දාවූ මේ ධර්ම සතර භූරිපඤ්ඤභාවය පිණිස පවතිත්යයි" වදාළසේක.

---

## 7. පඤ්ඤා බාහුල්ලතා සූත්‍රය

2. "මහණෙනි, වඩන ලද්දාවූ බහුල කරන ලද්දාවූ මේ ධර්ම සතර ප්‍රඥාවගේ බහුල බව පිණිස පවතිත්.

3. (මේ ඡෙදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 3 ඡෙදය මෙනි.)

4. "මහණෙනි, වඩන ලද්දාවූ පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර ප්‍රඥාවගේ බහුල බව පිණිස පවතිත්යයි" වදාළසේක.

---

## 8. සීඝ පඤ්ඤතා සූත්‍රය

2. "මහණෙනි, වඩන ලද්දාවූ පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර සීඝ පඤ්ඤා භාවය පිණිස පවතිත්.

3. (මේ ඡෙදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 3 ඡෙදය මෙනි.)

4. "මහණෙනි, වඩන ලද්දාවූ, පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර සීඝපඤ්ඤාභාවය පිණිස පවතිත්යයි" වදාළසේක.

---

## 9. ලහු පඤ්ඤතා සූත්‍රය

2. "මහණෙනි, වඩන ලද්දාවූ පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර ලහු පඤ්ඤා භාවය පිණිස පවතිත්.

3. (මේ ඡෙදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 3 ඡෙදය මෙනි.)

4. "මහණෙනි, වඩන ලද්දාවූ පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර ලහුපඤ්ඤාභාවය පිණිස පවතිත්යයි" වදාළසේක.

---

## 10. හාසු පඤ්ඤතා සූත්‍රය.

2. "මහණෙනි, වඩන ලද්දාවූ පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර හාසු පඤ්ඤාභාවය පිණිස පවතිත්.

3. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

4. 'මහණෙනි වඩන ලද්දාවූ පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර හාසු පඤ්ඤාභාවය පිණිස පවතිත්යයි" වදාළසේක.

---

## 11. ජවන පඤ්ඤතා සූත්‍රය.

2. "මහණෙනි, වඩන ලද්දාවූ පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර ජවන පඤ්ඤා භාවය පිණිස පවතිත්.

3. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

4. "මහණෙනි, වඩන ලද්දාවූ පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර ජවන පඤ්ඤාභාවය පිණිස පවතිත්යයි" වදාළසේක.

---

## 12. තික්ඛ පඤ්ඤතා සූත්‍රය

2. "මහණෙනි, වඩන ලද්දාවූ පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර තික්ඛ පඤ්ඤාභාවය පිණිස පවතිත්.

3. (මේ ඡේදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 3 ඡේදය මෙනි.)

4. "මහණෙනි, වඩන ලද්දාවූ පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර තික්ඛ පඤ්ඤාභාවය පිණිස පවතිත්යයි" වදාළසේක.

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

### 13. නිබ්බෙධික පඤ්ඤතා සූත්‍රය.

2. 'මහණෙනි, වඩන ලද්දාවූ පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර නිබ්බේධික පඤ්ඤා භාවය පිණිස පවතිත්.

3. "මහණෙනි, කවර සතරක්ද? සත්පුරුෂ සේවනය, සද්ධර්මශ්‍රවණය, යෝනිසොමනසිකාරය හා ධර්මානුධර්ම ප්‍රතිපත්තියද වෙති

4. "මහණෙනි, වඩන ලද්දාවූ පුරුදු කරන ලද්දාවූ මේ ධර්ම සතර නිබ්බේධික පඤ්ඤා භාවය පිණිස පවතී"

(එකොළොස් වැනි සොතාපත්ති සංයුත්තය නිමි.)

---

# 12. සච්ච සංයුත්තය.

## 1 සමාධි වර්ගය.

### 1. සමාධි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනියි' භික්ෂූන් ඇමතූහ. 'ස්වාමීනියි' ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක. මහණෙනි, සමාධිය වඩව්. මහණෙනි, එකඟවූ සිත් ඇති භික්ෂුතෙමේ තත්වූ පරිදි දනී. තත්වූ පරිදි කුමක් දනීද?

2. "මේ දුකයයි තත්වූ පරිදි දනී. මේ දුක ඉපදීමේ හේතුවයයි තත්වූ පරිදි දනී. මේ දුක් නැති කිරීමයයි තත්වූ පරිදි දනී. මේ දුක් නැතිකිරීමේ පිළිවෙතයයි තත්වූ පරිදි දනී.

3. "(එහෙයින්) මහණෙනි, සමාධිය වඩව්. මහණෙනි, එකඟවූ සිත් ඇති භික්ෂුතෙම තත්වූ පරිදි දනී. මහණෙනි,

එබැවින් මෙහිදී (නුඹලා විසින්) මේ දුකයයි (තත්වූ පරිද්දෙන් දැනගැනීම පිණිස) උත්සාහ කටයුතුයි. මේ දුක් ඉපදීමේ හේතුවයයි තත්වූ පරිදි දැන ගැනීම පිණිස උත්සාහ කටයුතුයි. මේ දුක් නැතිකිරීමයයි (තත්වූ පරිදි දැනගැනීම පිණිස) උත්සාහ කටයුතුයි. මේ දුක් දුරුකිරීමේ පිළිවෙතයයි (තත්වූ පරිදි දැනගැනීම පිණිස) උත්සාහ කටයුතුය."

---

## 2. පටිසල්ලාන යොග සූත්‍රය

1. (මෙතැන් සිට මේ ඡෙද මහාප්‍රඥා වර්ගයේ 1 වෙනි සූත්‍රයේ මුල් ඡෙදය මෙනි.)

2. "මහණෙනි, හුදකලා භාවනාවෙහි යෙදෙව්. මහණෙනි, හුදකලා භාවනාවෙහි යෙදෙන භික්ෂුතෙම ඇති සැටි දනියි. කුමක් ඇතිසැටි දනීද?

3. (මේ ඡෙදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡෙදය මෙනි)

4. "මහණෙනි, හුදකලා භාවනාවෙහි යෙදෙව්. හුදකලා භාවනාවෙහි යෙදෙන භික්ෂුතෙම ඇතිසැටි දනියි. මහණෙනි, එබැවින් මෙහිදී (භික්ෂුතෙම) මේ දුකයයි දැනගැනීම පිණිස උත්සාහ කටයුතුයි. මේ දුක් හේතුවයයි දැනගැනීම පිණිස උත්සාහ කටයුතුයි. මේ දුක් නැතිකිරීමයයි දැනගැනීම පිණිස උත්සාහ කටයුතුයි. මේ දුක් නැතිකිරීමේ පිළිවෙතයයි දැන ගැනීම පිණිස උත්සාහ කටයුතුයයි" වදාළසේක.

---

## 3. පඨම කුලපුත්තාභිසමය සූත්‍රය

2. "මහණෙනි, පූර්වකාලයෙහි යම්කිසි කුලපුත්‍රයෝ ගිහිගෙය හැර පියා මනාකොට සස්නෙහි පැවිදි වූවාහුද, ඒ සියලු දෙන වනාහි චතුස්සත්‍ය තත්වූ පරිදි දැන ගැනීම සඳහා පැවිදි වූවාහුය.

3. "මහණෙනි, යම්කිසි කුලපුත්‍රයෝ ගිහිගෙයි හැරපියා මනාකොට සස්නෙහි පැවිදි වන්නාහුද ඒ සියළුදෙනා වනාහි චතුස්සත්‍ය තත්වූ පරිදි දැනගැනීම සඳහා පැවිදි වන්නාහුය.

4. "මහණෙනි, දැනුදු යම්කිසි කුලපුත්‍ර කෙනෙක් ගිහි ගෙය හැර මනාකොට සස්නෙහි පැවිදි වෙත්ද ඒ සියලුදෙනද චතුස්සත්‍ය තත්වූ පරිදි දැනගැනීම සඳහා පැවිදිවෙති.

"කවර සතරක්ද? දුක්ඛ ආය්‍යීය සත්‍යයද දුක්ඛ සමුදයාය්‍යී සත්‍යයද දුක්ඛ නිරොධාය්‍යී සත්‍යයද දුක්ඛ නිරොධ ගාමිණී පටිපදා ආය්‍යීය සත්‍යයද වෙති.

5. "මහණෙනි, යම්කිසි අතීත කාලයෙහි කුලපුත්‍රයෝ ගිහිගෙය හැරපියා මනාකොට සස්නෙහි පැවිදි වූවාහුද (අනාගතයෙහි) පැවිදි වන්නාහුද (දැන්) පැවිදිවෙත්ද ඒ සියලුදෙන මේ චතුරාය්‍යී සත්‍යයන් තත්වූ පරිදි දැනුම සඳහා (පැවිදිවූහ පැවිදිවන්නාහ. පැවිදි වෙත්.)

6. 'මහණෙනි එබැවින් තොප විසින් මේ දුකයයි තත්වූ පරිදි දැනුම සඳහා උත්සාහ කටයුතුයි. මේ දුක් ඉපදීමේ හේතුවයයි තත්වූ පරිදි දැනුම සඳහා උත්සාහ කටයුතුයි. මේ දුක්ඛ නිරොධයයයි තත්වූ පරිදි දැනුම සඳහා උත්සාහ කටයුතුයි. මේ දුක් නැතිකිරීමට පැමිණෙන පිළිවෙතයයි තත්වූපරිදි දැනුම සඳහා උත්සාහ කටයුතුයි.

---

## 4. දුතිය කුලපුත්තාභිසමය සූත්‍රය.

2. "මහණෙනි යම්කිසි අතීත කාලයෙහි කුලපුත්‍රයෝ ගිහිගෙය හැරපියා යහපත්කොට සස්නෙහි පැවිදිව තත්වූ පරිදි අවබොධ කළාහුද, ඒ සියලුදෙන චතුස්සත්‍යය තත්වූ පරිදි අවබොධ කළහ

3. "මහණෙනි, යම්කිසි අනාගත කාලයෙහි කුලපුත්‍රයෝ ගිහිගෙය හැරපියා මනාකොට සස්නෙහි පැවිදිවූවාහු තත්වාකාරයෙන් අවබොධ කළාහුද ඒ සියලුදෙන චතුස්සත්‍යම තත්වූ පරිදි අවබොධ කරන්නාහ.

4. "මහණෙනි මෙකල යම්කිසි කුලපුත්‍රයෝ ගිහිගෙය හැරපියා මනාකොට සස්නෙහි පැවිදිව තත්වූ පරිදි අවබොධ කරත්ද ඒ සියලුදෙන චතුස්සත්‍යම තත්වූ පරිදි අවබොධ කරත්

5. (මේ ඡේදය 3 වෙනි සූත්‍රයේ 5 වෙනි ඡේදය මෙනි.)

6. "මහණෙනි, අතීත කාලයෙහි යම්කිසි කුලපුත්‍රයෝ ගිහිගෙයින් නික්ම මනාකොට සස්නෙහි පැවිදි වූවාහු තත්වූ පරිදි අවබොධ කළාහුද (මතු) අවබෝධ කරන්නාහුද (දැන්) අවබොධ කරත්ද, ඒ සියලුදෙන මේ චතුස්සත්‍යම තත්වූ පරිදි අවබොධ කරත්.

7. (මේ ඡේදය මේ වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 6 වෙනි ඡේදය මෙනි.)

---

## 5. පඨම සමණබ්‍රාහ්මණාභි සමය සූත්‍රය.

2. 'මහණෙනි, අතීතයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ වෙත්. තත්වූ පරිදි මනාකොට අවබොධ කළාහුද, ඒ සියල්ලෝ සතර ආය්‍ය්‍යී සත්‍යයන් තත්වූ පරිදි මනාකොට අවබොධ කළාහුය.

3. "මහණෙනි, අනාගත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ තත්වාකාරයෙන් අවබොධ කරන්නාහුද, ඒ සියල්ලෝ සතර ආය්‍ය්‍යී සත්‍යයන් තත්වූ පරිදි මනාකොට අවබොධ කරන්නාහුය.

4. "මහණෙනි, මෙකල වනාහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ තත්වූ පරිදි මනාකොට අවබොධ කරත්ද, ඒ සියල්ලෝ සතර ආය්‍ය්‍යී සත්‍යයන් තත්වූ පරිදි මනාකොට අවබොධ කරත්.

ඒ සතර කවරහුද? දුක්ඛ ආය්‍ය්‍යී සත්‍යය, දුක්ඛ සමුදය ආය්‍ය්‍යී සත්‍යය, දුක්ඛ නිරොධ ආය්‍ය්‍යී සත්‍යය, දුක්ඛ නිරොධ ගාමිනී පටිපදා ආය්‍ය්‍යී සත්‍යය යනුයි

**5.** "මහණෙනි, අතීත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ තත්වූ පරිදි මනාකොට අවබොධ කළාහුද, (මතු) මනාකොට අවබොධ කරන්නාහුද, මෙකල මනාකොට අවබොධ කරත්ද, මේ සතර ආර්‍ය්‍ය සත්‍යයන් තත්වූ පරිදි මනාකොට අවබොධ කරත්.

**6.** (මේ ඡෙදය මේ වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 6 වෙනි ඡෙදය මෙනි.)

---

## 6. දුතිය සමණබ්‍රාහ්මණාභි සමය සූත්‍රය.

**2.** "මහණෙනි, අතීත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ තත්වාකාරයෙන් මැනවින් අවබොධ කළ කෙනෙකැයි ප්‍රකාශ කළාහුද, ඒ සියල්ලෝ චතුරාර්‍ය්‍ය සත්‍යයන්ම තත්වූ පරිදි මැනවින් අවබොධ කළ කෙනෙකැයි ප්‍රකාශ කළාහුය.

**3.** "මහණෙනි, අනාගත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ තත්වූ පරිදි මැනවින් අවබොධ කළ කෙනෙකැයි ප්‍රකාශ කරන්නාහුද ඒ සියල්ලෝ චතුරාර්‍ය්‍ය සත්‍යයන් තත්වූ පරිදි මැනවින් අවබොධ කළ කෙනෙකැයි ප්‍රකාශ කරන්නාහුය.

**4.** "මහණෙනි, මෙකල යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ තත්වූ පරිදි මැනවින් අවබොධ කළ කෙනෙකැයි ප්‍රකාශ කරත්ද, ඒ සියල්ලෝ චතුරාර්‍ය්‍ය සත්‍යයන් තත්වූ පරිදි මැනවින් අවබොධ කළ කෙනෙකැයි පවසත්. ඒ සතර කවරහුද? දුක්ඛ ආර්‍ය්‍ය සත්‍යය, දුක්ඛ සමුදය ආර්‍ය්‍ය සත්‍යය, දුක්ඛ නිරොධ ආර්‍ය්‍ය සත්‍යය, දුක්ඛ නිරොධ ගාමිනී පටිපදා ආර්‍ය්‍ය සත්‍යය යනුයි.

**5.** "මහණෙනි, අතීත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ තත්වූ පරිදි මැනවින් අවබොධ කළ කෙනෙකැයි ප්‍රකාශ කළාහුද, (මතු) ප්‍රකාශ කරන්නාහුද, මෙකල අවබොධ කරත්ද ඒ සියලුදෙන මේ සතර ආර්‍ය්‍යය සත්‍යයන්

තත්වූ පරිදි මැනවින් අවබොධ කළ කෙනෙකැයි ප්‍රකාශ කළහ, ප්‍රකාශ කරන්නාහුය, ප්‍රකාශ කරත්.

**6.** (මේ ඡෙදය මේ වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 6 වෙනි ඡෙදය මෙනි.)

---

## 7. අකුසල විතක්ක සූත්‍රය.

**2.** "මහණෙනි, අකුශල විතර්ක කල්පනා නොකරව්, ඒ කවරහුද? කාම විතර්ක, ව්‍යාපාද විතර්ක, විහිංසා විතර්ක (යනුයි) ඊට හේතු කවරේද? මහණෙනි, මේ විතර්කයෝ අර්ථය පිණිස පවත්නාහු නොවෙති. මාර්ගබ්‍රහ්මචය්‍ය්‍යාවට මුල් වන්නාහු නොවෙත්. කළකිරීම් පිණිසද, නොඇලීම පිණිසද, නිරොධය පිණිසද, සංසිඳීම පිණිසද විශෙෂයෙන් දැනීම පිණිසද මනා අවබොධය පිණිසද නිවන් පිණිසද නොපවතිත්.

**3.** "තෙපි වනාහි කල්පනා කරන්නාහු නම් මේ දුකයයි කල්පනා කරව්. මේ දුක්ඛ සමුදයයි කල්පනා කරව්. මේ දුක්ඛ නිරොධයයි කල්පනා කරව්. මේ දුක්ඛ නිරොධ ගාමිනී ප්‍රතිපදාව යයි කල්පනා කරව්. ඊට හේතු කවරේද?

**4.** "මහණෙනි, මේ කල්පනාවෝ අර්ථය පිණිස පවත්නාහුය. මේ කල්පනාවෝ මාර්ග බ්‍රහ්මචය්‍ය්‍යාව මුල් වෙති. මේ කල්පනාවෝ කළකිරීම පිණිසද, විරාගය පිණිසද, නිරොධය පිණිසද, සංසිඳීම පිණිසද, විශෙෂයෙන් දැනීම පිණිසද, මනා අවබොධ පිණිසද, නිවන් පිණිසද පවතිත්.

**5.** (මේ ඡෙදය මේ වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 6 වෙනි ඡෙදය මෙනි.)

---

## 8. පාපක චින්තා සූත්‍රය.

**2.** "මහණෙනි, ලෝකය සදාකාලිකය කියාද ලෝකය සදාකාලික නොවේයයි කියාද ලොව කෙළවර ඇත කියාද

ලොව කෙළවර නැත කියාද, ජීවිතයත් එයමය, ශරීරයත් එයමය කියාද, ජීවය අනිකක්ය, ශරීරය අනිකක්ය කියාද සත්වතෙමේ මරණින් මතු වෙයි හෝ නොවෙයි කියාද, සත්ව තෙමේ මරණින්මතු වන්නේ නොවෙයි හෝ නොවන්නේ නොවෙයි කියාද, ලාමක අකුසල සිත් නොසිතම්. ඊට හේතුව කවරේද?

3. "මහණෙනි, මේ සිතීම අර්ථය පිණිස පවත්නාහු නොවෙති. මාර්ගබ්‍රහ්මචය‍්‍යාවට මුල් නොවෙති. කළකිරීම පිණිසද, විරාගය පිණිසද, නිරොධය පිණිසද, සංසිඳීම පිණිසද විශෙෂයෙන් දැනීම පිණිසද, මනා අවබොධය පිණිසද නොපවතී, නිවන් පිණිසද නොපවතියි.

4. "මහණෙනි, සිතන්නාවූ තෙපි වනාහි මේ දුකයයි සිතව්. මේ දුක් ඉපදීමේ හේතුවයයි සිතව්. මේ දුක් නැති කිරීමයයි සිතව්. මේ දුක් නැතිකිරීමේ පිළිවෙතයයි සිතව්. ඊට හේතු කවරේද?

5. "මහණෙනි, මේ සිතීම අර්ථය පිණිස පවත්නේය. මාර්ගබ්‍රහ්මචය‍්‍යාවට මුල් වන්නේය. මේ සිතීම කළකිරීම පිණිසද, නොඇල්ම පිණිසද, නිරොධය පිණිසද සංසිඳීම පිණිසද විශෙෂයෙන් දැනීම පිණිසද, මනා අවබොධය පිණිසද නිවන් පිණිසද පවතියි.

6. (මේ ඡේදය මේ වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 6 වෙනි ඡේදය මෙනි.)

---

## 9. විග්ගාහිත කථා සූත්‍රය.

2. "මහණෙනි, 'නුඹ මේ ධර්මවිනය නොදන්නෙහිය. මම මේ ධර්මය විනය දනිමි. කිම, ඔබ මේ ධර්ම විනය දන්නෙහිද? ඔබ වරදවා පිළිපදින්නෙක් වෙහිය. මම මනාකොට පිළිපදින්නෙක් වෙමි. මුලදී කියයුත්ත පසුව කීවෙහිය, පසුව කිවයුත්ත පළමුව කීයෙහිය. මගේ කීම සත්‍යය. ඔබගේ කීම අසත්‍යය. විරුද්ධ මග ගැනීම නුඹගේ පුරුද්දය, ඔබට වාදය නංවන ලදී. වාදයෙන් මිදීම පිණිස උත්සාහ කරව. නිග්‍රහ කරන

ලද්දෙහිය. ඉදින් හැකිනම් නිරවුල් කරවයි' විරුද්ධ කථා නොකරව්. ඊට හේතු කවරේද?

3. "මහණෙනි, මේ කථාව අර්ථය පිණිස පවත්නේ නොවෙයි, මාර්ගබ්‍රහ්මචර්‍යාවට මුල්වන්නේ නොවෙයි, කළකිරීම පිණිසද, විරාගය පිණිසද, නිරොධය පිණිසද, සංසිඳීම පිණිසද විශෙෂයෙන් දැනීම පිණිසද, මනා අවබොධය පිණිසද නිවන් පිණිසද නොපවතියි.

4. "මහණෙනි, තෙපි කථාකරන්නාහු නම් මේ දුකයයි කථා කරව්. මේ දුක් ඉපදීමේ හේතුවයයි කථා කරව්, මේ දුක් නැතිකිරීමයයි කථා කරව්, මේ දුක් නැතිකිරීමේ පිළිවෙතයයි කථා කරව්. ඊට හේතු කවරේද?

5. "මහණෙනි, මේ කථාව අර්ථය පිණිස පවත්නේ වෙයි මාර්ගබ්‍රහ්මචර්‍යාවට මුල්වෙයි. කලකිරීම පිණිසද, විරාගය පිණිසද, නිරොධය පිණිසද, සංසිඳීම පිණිසද, විශෙෂයෙන් දැනීම පිණිසද, මනා අවබොධය පිණිසද, නිවන් පිණිසද පවතියි.

6. (මේ ඡෙදය මේ වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 6 වෙනි ඡෙදය මෙනි.)

---

## 10. තිරච්ඡාන කථා සූත්‍රය

2. "මහණෙනි, සග මොක් දෙකට බාධා කරන (තිරච්ඡාන කථා) කථා නොකරව්. ඒ කවරහුද? රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ කථාය, ඇමතියන් පිළිබඳ කථාය, සේනා පිළිබඳ කථාය, භය පිළිබඳ කථාය, යුද පිළිබඳ කථාය, ආහාර පිළිබඳ කථාය, පානවර්ග පිළිබඳ කථාය, වස්ත්‍ර පිළිබඳ කථාය, යහන් පිළිබඳ කථාය, මල්දම් පිළිබඳ කථාය, සුවඳ පිළිබඳ කථාය, ඤාතීන් පිළිබඳ කථාය, යානා පිළිබඳ කථාය, ගම් පිළිබඳ කථාය, නියම්ගම් පිළිබඳ කථාය, නගර පිළිබඳ කථාය, දනව් පිළිබඳ කථාය, ස්ත්‍රීන් පිළිබඳ කථාය, සූරයන් පිළිබඳ කථාය, වීථීන් පිළිබඳ කථාය, පැන්තොටවල් පිළිබඳ කථාය, පෙර මියගිය නෑයන් පිළිබඳ කථාය, මෙයින් අන්‍යවූ නොයෙක් නිරර්ථක

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කථාය, ලොව අගමුල පිළිබඳ කථාය, සමුද්‍ර පිළිබඳ කථාය, දියුණුව මෙසේ වෙයි, පිරිහීම මෙසේ වෙයි යනුවෙන් කරන තීර්ථක කථාය යන මොහුයි. ඊට හේතු කවරේද?

3. "මේ කථා අර්ථය පිණිස පවත්නේ නොවෙයි. ආදි බ්‍රහ්මචර්‍ය්‍යාවට මුල්වූයේ නොවෙයි. කලකිරීම පිණිස නොඇලීම පිණිස, නිරොධය පිණිස සංසිඳීම පිණිස විශෙෂයෙන් දැනීම පිණිස, මනා අවබොධය පිණිස නිවන් පිණිස නොපවතියි.

4. "මහණෙනි, තෙපි කථාකරන්නහු නම් මේ දුකයයි කථා කරව්, මේ දුක්ඛ සමුදයයි කථා කරව්, මේ දුක්ඛ නිරොධ යයි කථා කරව්, මේ දුක්ඛ නිරොධ ගාමිනී පටිපදායයි කථා කරව්. ඊට හේතු කවරේද?

5. "මහණෙනි, මේ කථාව අර්ථය පිණිස පවත්නේ වෙයි. මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාවට මුල් වූයේ වෙයි. කලකිරීම පිණිස නොඇල්ම පිණිස, නිරොධය පිණිස, සංසිඳීම පිණිස, විශෙෂ නුවණින් දැනීම පිණිස, මනා අවබොධය පිණිස, නිවන් පිණිස පවතී

6. 'මහණෙනි, එහෙයින් මේ දුකයයි දැනගැනීම පිණිස උත්සාහ කටයුතුයි, මේ දුක් ඉපදීමේ හේතුවයයි දැනගැනීම පිණිස උත්සාහ කටයුතුයි, මේ දුක්ඛ නිරොධයයි දැනගැනීම පිණිස උත්සාහ කටයුතුයි, මේ දුක් නැතිකිරීමේ පිළිවෙතයයි දැනගැනීම පිණිස උත්සාහ කටයුතුයයි" වදාළසේක.

(පළමුවන සමාධි වර්ගය නිමි)

---

## 2 ධම්මචක්කප්පවත්ත වර්ගය

### 1. ධම්මචක්කප්පවත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බරණැස්නුවර සමීපයෙහිවූ මිගදාය නම්වූ

ඉසිපතනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ පස්වග භික්ෂූන්ට ඇමතූහ.

2. "මහණෙනි, පැවිද්දා විසින් සේවනය නොකළ යුතු මේ දෙකෙළවරකි. (එනම්) ලාමකවූ ගැමියන්ට අයත්වූ පෘථග්ජනයන්ට අයත්වූ උතුම් නොවූ අනර්ථය පිණිස පවතින්නාවූ වස්තු කාමයන්හි ක්ලෙශ කාමය කරණකොට යම් ඇලී වාසය කිරීමක් වේද දුක්වූ ලාමකවූ අනර්ථය පිණිස පවත්නාවූ යම් ඒ කයට දුක් ගෙන දෙන පිළිවෙතක යෙදීමක් වේද යන මේ අන්ත දෙකය.

3. "මහණෙනි, ඒ මේ දෙකෙළවරට නොපැමිණ තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද ප්‍රඥාචක්ෂුව ඇති කරන්නාවූ, ඥානය ඇති කරන්නාවූ මධ්‍යම ප්‍රතිපදාව කෙලෙසුන්ගේ සංසිඳීම පිණිස චතුස්සත්‍යය දැනීම පිණිස චතුස්සත්‍යය අවබෝධය පිණිස නිවන් පිණිස පවතිත්.

4. "මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් අවබොධ කරන ලද්දාවූ ප්‍රඥා චක්ෂුව ඇති කරන්නාවූ ඥානය ඇති කරන්නාවූ කෙළෙසුන්ගේ සංසිඳීම පිණිස චතුස්සත්‍යයාගේ දැනීම පිණිස චතුස්සත්‍යය අවබොධය පිණිස නිවන් පිණිස පවතින්නාවූ ඒ මධ්‍යම ප්‍රතිපදාව කවරීද?

5. "මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයයි. ඒ කවරේදයත්? සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාවය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මොහුයි.

6. "මහණෙනි, මේ වනාහි තථාගතයන් විසින් අවබෝධ කරන ලද ප්‍රඥා චක්ෂුස ඇති කරන්නාවූ ඥානය ඇති කරන්නාවූ කෙළෙසුන්ගේ සංසිඳීම පිණිස චතුස්සත්‍යයාගේ දැනීම පිණිස චතුස්සත්‍ය අවබොධය පිණිස නිවන් පිණිස පවතින්නාවූ මධ්‍යම ප්‍රතිපදාව වෙයි.

7. "මහණෙනි, මේ වනාහි දුක්ඛාර්‍ය්‍ය සත්‍යයයි. ඉපදීම දුකය, ජරාවද දුකය, රෝගයද දුකය, මරණයද දුකය, අප්‍රියයන්

හා එක්වීම දුකය, ප්‍රියයන්ගෙන් වෙන්වීම දුකය, කැමති යමක් නොලැබේද, එයද දුකය. සැකෙවින් පඤ්ච උපාදානස්කන්ධයෝම දුක් වන්නාහුය.

8. "මහණෙනි, මේ වනාහි දුක්ඛ සමුදයාර්ය්‍යය සත්‍යයයි. නැවත නැවත ඉපදීම ඇති කරන්නාවූ නන්දිරාගය හා එක්වූ ඒ ඒ ආත්මභාවයෙහි ඇලෙන්නාවූ යම් ඒ තෘෂ්ණාවක් වේද, ඒ කවරේද යත්. කාම තෘෂ්ණාවය, භවතෘෂ්ණාවය, විභව තෘෂ්ණාවයි යන මොව්හුයි

9. "මහණෙනි, මේ වනාහි දුක්ඛ නිරෝධ ආර්‍ය්‍ය සත්‍යයවේ. යම් ඒ තෘෂ්ණාවගේ ඉතිරි නොකොට නිරුද්ධ කිරීමක් වේද, දුරු කිරීමක් වේද, නැති කිරීමක් වේද, මිදීමක් වේද, ආලය අත්හැරීමක් වේද එයයි.

10. 'මහණෙනි, මේ වනාහි දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්‍ය්‍යසත්‍යය වේ. එනම් ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගමැයි. හේ කවරේද යත්? සම්‍යක්දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මොහුයි.

11. "මහණෙනි, පෙර නොඇසූවිරූ ධර්මයන්හි මට මේ දුක්ඛ ආර්‍ය්‍ය සත්‍යයයි. නුවණැස පහළවිය. ඥානය පහළවිය. ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ආලෝකය පහළවිය.

12. "මහණෙනි, පෙර නොඇසූවිරූ ධර්මයන්හි මට ඒ මේ දුක්ඛාර්‍ය්‍ය සත්‍යය පිළිසිඳ දත යුතුයයි නුවණැස පහළවිය. ඥානය පහළවිය. ප්‍රඥාව පහළවිය. විද්‍යාව පහළවිය. ආලෝකය පහළවිය.

13. "මහණෙනි, පෙර නොඇසූ විරූ ධර්මයන්හි මට මේ දුක්ඛ ආර්‍ය්‍ය සත්‍යය පිළිසිඳ දැනගන්නාලදැයි නුවණැස පහළවිය, ඥානය පහළවිය, ප්‍රඥාව පහළවිය, විද්‍යාව පහළවිය. ආලෝකය පහළවිය.

"මහණෙනි, මට පෙර නොඇසූවිරූ ධර්මයන්හි මේ දුක්ඛ සමුදය ආර්‍ය්‍ය සත්‍යයයි නුවණැස පහළවිය, ඥානය පහළවිය, ප්‍රඥාව පහළවිය, විද්‍යාව පහළවිය, ආලෝකය පහළවිය.

14. "මහණෙනි, මට පෙර නොඇසූවිරූ ධර්මයන්හි ඒ දුක්ඛ සමුදයායාර්‍ය සත්‍යය පහකළ යුතුයයි නුවණැස පහළවිය, ඥානය පහළවිය, ප්‍රඥාව පහළවිය, විද්‍යාව පහළවිය, ආලෝකය පහළවිය.

15. "මහණෙනි, මට පෙර නොඇසූ විරූ ධර්ම ඒ මේ දුක්ඛ සමුදය ආර්‍ය සත්‍යය ප්‍රහීන කරනලදැයි නුවණැස පහළවිය, ඥානය පහළවිය, ප්‍රඥාව පහළවිය, විද්‍යාව පහළවිය, ආලෝකය පහළවිය.

16. "මහණෙනි, පෙර නොඇසූවිරූ ධර්මයෙහි මට මේ දුක්ඛ නිරෝධායාර්‍ය සත්‍යයයි නුවණැස පහළවිය, ඥානය පහළවිය, ප්‍රඥාව පහළවිය, විද්‍යාව පහළවිය, ආලෝකය පහළවිය.

17. "මහණෙනි, මට පෙර නොඇසූවිරූ ධර්මයන්හි මේ දුක්ඛ නිරොධායාර්‍ය සත්‍යය ප්‍රත්‍යක්ෂකළ යුතුයයි නුවණැස පහළවිය, ඥානය පහළවිය, ප්‍රඥාව පහළවිය, විද්‍යාව පහළවිය, ආලෝකය පහළවිය.

18. "මහණෙනි, මට පෙර නොඇසූවිරූ ධර්මයෙහි මේ දුක්ඛ නිරෝධායාර්‍ය සත්‍යය ප්‍රත්‍යක්ෂ කරන ලදැයි මට නුවණැස පහළවිය, ඥානය පහළවිය, ප්‍රඥාව පහළවිය, විද්‍යාව පහළවිය, ආලෝකය පහළවිය.

19. "මහණෙනි, පෙර නොඇසූවිරූ ධර්ම විෂයෙහි මට මේ දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදා ආර්‍ය සත්‍යයයි නුවණැස පහළවිය, ඥානය පහළවිය, ප්‍රඥාව පහළවිය, විද්‍යාව පහළවිය, ආලෝකය පහළවිය.

20. "මහණෙනි, පෙර නොඇසූවිරූ ධර්මය විෂයෙහි මේ දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදා ආර්‍ය සත්‍යය වැඩිය යුතු යයි නුවණැස පහළවිය, ඥානය පහළවිය, ප්‍රඥාව පහළවිය, විද්‍යාව පහළවිය, ආලෝකය පහළවිය.

21. "මහණෙනි, පෙර නොඅසන ලද ධර්මයන්හි මට දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්‍ය සත්‍යය වඩන ලදැයි නුවණැස

පහළවිය, ඥානය පහළවිය, ප්‍රඥාව පහළවිය, විද්‍යාව පහළවිය, ආලෝකය පහළවිය.

**22.** "මහණෙනි, මට යම්තාක් කල් මෙසේ තුන් පැවැත්මක් (තිපරිවට්ට) ඇති, දොළොස් ආකාරයක් ඇති මේ චතුස්සත්‍යයන්හි යථාභූතඥාන දර්ශනය මනාව පිරිසිඳ නොවීද, මහණෙනි, ඒතාක් කල් මම දෙවියන් සහිතවූ බඹුන් සහිතවූ සත්වලෝකයෙහිද මහණ බඹුන් සහිතවූ දෙව් මිනිසුන් සහිත ප්‍රජාව අතරෙහිද අනුත්තරවූ සම්‍යක් සම්බොධිය අවබොධ කෙළෙමියි ප්‍රතිඥා නොකෙළෙමි.

**23.** "මහණෙනි, මට වනාහි යම් අවස්ථාවක මෙසේ තුන් පැවැත්මක් (තිපරිවට්ට) ඇති, දොළොස් ආකාරයක් ඇති, මේ චතුරාර්‍ය්‍ය සත්‍යයන්හි යථාභූතඥාන දර්ශනය මනාව පිරිසිඳ වූයේද, මහණෙනි, මම එකල්හි දෙවියන් සහිත බඹුන් සහිත ලෝකයෙහිද මහණ බමුණන් ඇතුළු දෙව් මිනිසුන් සහිතවූ ප්‍රජාවෙහිද අනුත්තරවූ සම්‍යක් අවබෝධිය අවබොධ කෙළෙමියි, ප්‍රතිඥා කෙළෙමි.

"මට වනාහි ඥාන දර්ශනය පහළවිය. මාගේ අර්හත් ඵල විමුක්තිය වෙනස් කළ නොහැකිය. මේ අන්තිම ජාතිය වන්නීය. දැන් මට නැවත ඉපදීමක් නැත" භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය.

**24.** සතුටු සිත් ඇති පස්වග භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්හ. මේ සූත්‍රය දෙශනා කරනු ලැබීමෙහිදී ආයුෂ්මත් අඤ්ඤා කොණ්ඩඤ්ඤ භික්ෂුවට කෙලෙස් රජස් නැති පහවූ කෙළෙස් මල ඇති ධර්මචක්ෂුස හෙවත් ශ්‍රොතාපත්ති මාර්ග ඥානය පහළවූයේය (කෙසේද?) 'යම් කිසිවක් ඇතිවීම ස්වභාවකොට ඇත්තේද, ඒ සියල්ල නැතිවීමද ස්වභාවය කොට ඇත්තේය' කියායි,

**25.** "භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මචක්‍රය පැවැත්වූ කල්හි වනාහි භූමිය ඇසුරුකොට වසන දෙවියෝ 'භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම්වූ ඉසිපතනාරාමයේදී

ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් හෝ නොපැවැත්විය හැකි මේ අනුත්තරවූ ධර්මචක්‍රය පවත්වන ලදැයි" සාධුනාද පැවැත්වූහ.

**26.** "භූමාටු දෙවියන්ගේ ශබ්දය අසා චාතුර් මහාරාජික දෙවියෝ 'භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම්වූ ඉසිපතනාරාමයේදී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් නොපැවැත්විය හැකි උතුම් මේ ධර්මචක්‍රය පවත්වනලදැයි' සාධුනාද පැවැත්වූහ.

**27.** චාතුර් මහාරාජික දෙවියන්ගේ ශබ්දය අසා තාවතිංස දෙවියෝ 'භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම්වූ ඉසිපතනාරාමයේදී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් නොපැවැත්විය හැකි උතුම්වූ මේ ධර්ම චක්‍රය පවත්වනලදැයි' තාවතිංස දෙවියෝ සාධුනාද පැවැත්වූහ.

**28.** තාවතිංස දෙවියන්ගේ ශබ්දය අසා යාම දෙවියෝ 'භාග්‍යවතුන්වහන්සේ විසින් බරණැස මිගදාය නම්වූ ඉසිපතනාරාමයේදී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් නොපැවැත්විය හැකි උතුම් මේ ධර්මචක්‍රය පවත්වනලදැයි' යාම දෙවියෝ සාධුකාර දුන්හ.

**29.** යාම දෙවියන්ගේ ශබ්දය අසා තුසිත දෙවියෝ 'භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම්වූ ඉසිපතනාරාමයේදී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් නොපැවැත්විය හැකි උතුම්වූ මේ ධර්ම චක්‍රය පවත්වන ලදැයි' තුසිත දෙවියෝ සාධුකාර දුන්හ.

**30.** තුසිත දෙවියන්ගේ සාධුකාර අසා නිම්මානරතී දෙවියෝ 'භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම්වූ

ඉසිපතනාරාමයේදී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් නොපැවැත්විය හැකි උතුම් මේ ධර්මචක්‍රය පවත්වනලදැයි' නිම්මානරතී දෙවියෝ සාධුකාර දුන්හ.

31. නිම්මානරතී දෙවියන්ගේ සාධුකාර අසා පරනිර්මිත වසවර්ති දෙවියෝ 'භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදාය නම්වූ ඉසිපතනාරාමයේදී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් නොපැවැත්විය හැකි උතුම් මේ ධර්ම චක්‍රය පවත්වන ලදැයි' පරනිර්මිත වසවර්ති දෙවියෝ සාධුකාර දුන්හ.

32. පරනිර්මිත වසවර්ති දෙවියන්ගේ ශබ්දය අසා බ්‍රාහ්මකායික දෙවියෝ 'භාග්‍යවතුන් වහන්සේ විසින් බරණැස මිගදායනම්වූ ඉසිපතනාරාමයේදී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ ලෝකයේ අන් කිසිවෙකු විසින් නොපැවැත්විය හැකි උතුම්වූ මේ ධර්මචක්‍රය පවත්වනලදැයි' බ්‍රහ්මකායික දෙවියෝ සාධුකාර දුන්හ.

මෙසේ ඒ ක්ෂණයකින් ඒ මොහොතින් බඹලොව දක්වා (සාධුකාර) ශබ්දය පැනනැංගේය. මේ දසසහශ්‍ර ලෝක ධාතුව කම්පාවිය. අතිශයින් කම්පාවිය. මහත්සේ වෙව්ලා ගියේය, දෙවියන්ගේ දේවානුභාවය ඉක්මවා අප්‍රමාණවූ පහත්වූ ආලෝකයක් ලෙව්හි පහළවූයේය.

33. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ "පින්වත්නි, කොණ්ඩඤ්ඤතෙම ඒකාන්තයෙන් අවබෝධ කෙළේය. පින්වත්නි, කොණ්ඩඤ්ඤතෙමේ ඒකාන්තයෙන් අවබෝධ කෙළේයයි" ප්‍රීතිවාක්‍යයක් පහළ කෙළේය. මෙය නිමිතිකොට ආයුෂ්මත් කොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේට අඤ්ඤා කොණ්ඩඤ්ඤ යන නාමය වූයේය.

---

## 2. අනුනුස්සුත අරියසච්ච සූත්‍රය

1. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡේදය මෙනි.)

2. "මහණෙනි, මේ දුක්ඛ ආය්‍ර්‍ය සත්‍යයයි කියා තථාගතයන් වහන්සේලාට පෙර නොඇසූවිරූ ධර්මයන්හි නුවණැස පහළවිය. විද්‍යාව පහළවිය. ඥානය පහළවිය ප්‍රඥාව පහළවිය. ආලෝකය පහළවිය.

"මහණෙනි, ඒ මේ දුක්ඛාය්‍ර්‍යසත්‍යය පිරිසිඳ දතයුතුයයි තථාගතයන් වහන්සේලාට පෙර නොඇසූවිරූ ධර්මයන්හි නුවණැස පහළවිය. විද්‍යාව පහළවිය. ඥානය පහළවිය ප්‍රඥාව පහළ විය. ආලෝකය පහළවිය.

"මහණෙනි, ඒ මේ දුක්ඛාය්‍ර්‍යසත්‍යය පිරිසිඳ දන්නාලදැයි තථාගතයන් වහන්සේලාට පෙර නොඇසූවිරූ ධර්මයන්හි නුවණැස පහළවිය. විද්‍යාව පහළවිය. ඥානය පහළවිය. ප්‍රඥාව පහළවිය. ආලෝකය පහළවිය.

3. "මහණෙනි, මේ දුක්ඛසමුදයආය්‍ර්‍ය සත්‍යයයි. තථාගතයන් වහන්සේලාට පෙර නොඇසූවිරූ ධර්මයන්හි නුවණැස පහළවිය. විද්‍යාව පහළවිය. ඥානය පහළවිය. ප්‍රඥාව පහළවිය. ආලෝකය පහළවිය.

"මහණෙනි, මේ දුක්ඛ සමුදය ආය්‍ර්‍ය සත්‍යය පහකළ යුතුයි තථාගතයන් වහන්සේලාට පෙර නොඇසූවිරූ ධර්මයන්හි නුවණැස පහළවිය. විද්‍යාව පහළවිය. ඥානය පහළවිය ප්‍රඥාව පහළවිය. ආලෝකය පහළවිය.

"මහණෙනි, මේ දුක්ඛසමුදයආය්‍ර්‍යසත්‍යය පහකරන ලදැයි තථාගතයන් වහන්සේලාට පෙර නොඇසූවිරූ ධර්මයන්හි නුවණැස පහළවිය. විද්‍යාව පහළවිය. ඥානය පහළවිය. ප්‍රඥාව පහළවිය. ආලෝකය පහළවිය.

4. "මහණෙනි, මේ දුක්ඛ නිරොධ ආය්‍ර්‍යසත්‍යයයි තථාගතයන් වහන්සේලාට පෙර නොඇසූවිරූ ධර්මයන්හි

නුවණැස පහළවිය, විද්‍යාව පහළවිය, ඥානය පහළවිය, ප්‍රඥාව පහළවිය. ආලෝකය පහළවිය.

"මහණෙනි, මේ දුක්ඛ නිරොධායර්‍ය සත්‍යය ප්‍රත්‍යක්ෂ කටයුතුයි. තථාගතයන් වහන්සේලාට පෙර නොඇසූවිරූ ධර්මයන්හි නුවණැස පහළවිය, ඥානය පහළවිය, ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළවිය, ආලෝකය පහළවිය

"මහණෙනි, මේ දුක්ඛ නිරොධායර්‍ය සත්‍යය ප්‍රත්‍යක්ෂ කරන ලදැයි තථාගතයන් වහන්සේලාට පෙර නොඇසූවිරූ ධර්මයන්හි නුවණැස පහළවිය. ඥානය පහළවිය. ප්‍රඥාව පහළවිය, විද්‍යාව පහළවිය. ආලෝකය පහළවිය.

5. "මහණෙනි, මේ දුක්ඛ නිරොධ ගාමිනී පටිපදා ආයර්‍ය සත්‍යයයි තථාගතයන් වහන්සේලාට පෙර නොඅසූවිරූ ධර්මයන්හි නුවණැස පහළවිය, ඥානය පහළවිය, ප්‍රඥාව පහළවිය, විද්‍යාව පහළවිය, ආලෝකය පහළවිය,

"මහණෙනි, මේ දුක්ඛනිරොධගාමිණී පටිපදා ආයර්‍යසත්‍යය වැඩිය යුතුයයි පෙර නො ඇසූ විරූ ධර්මයන්හි නුවණැස පහළවිය, ඥානය පහළවිය, ප්‍රඥාව පහළවිය, විද්‍යාව පහළවිය, ආලෝකය පහළවිය.

"මහණෙනි, මේ දුක්ඛ නිරොධ ගාමිණී පටිපදා ආයර්‍ය සත්‍යය වඩනලදැයි තථාගතයන් වහන්සේලාට පෙර නොඇසූවිරූ ධර්මයන්හි නුවණැස පහළවිය, ඥානය පහළවිය, ප්‍රඥාව පහළවිය, විද්‍යාව පහළවිය, ආලෝකය පහළවිය,

---

## 3. ඛන්ධ සච්ච සූත්‍රය.

1. (මේ ඡෙදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1 වෙනි ඡෙදය මෙනි.)

2. "මහණෙනි, මේ ආයර්‍ය සත්‍යයෝ සතරක් වෙති. කවරක්හුද? දුක්ඛායර්‍ය සත්‍යය, දුක්ඛ සමුදය ආයර්‍ය සත්‍යය,

දුක්ඛ නිරෝධ ආර්‍ය්‍ය සත්‍යය, දුක්ඛ නිරොධ ගාමිණී පටිපදා ආර්‍ය්‍ය සත්‍යය, යනුයි.

3. "මහණෙනි, දුක්ඛාර්‍ය්‍ය සත්‍යය කවරහුද? එයට පඤ්ච උපාදාන ස්කන්ධයයි කියයුතුය. කවර පසක්ද? එනම් රූප උපාදානස්කන්ධය, වෙදනා උපාදානස්කන්ධය, සඤ්ඤා උපාදාන ස්කන්ධය, සඞ්ඛාර උපාදාන ස්කන්ධය, විඤ්ඤාණ උපාදාන ස්කන්ධය, යන මොහුයි. මහණෙනි, මේ දුක්ඛාර්‍ය්‍ය සත්‍යයයි කියනු ලැබේ

4. "මහණෙනි, දුක්ඛ සමුදය ආර්‍ය්‍ය සත්‍යය කවරේද? නැවත ඉපදීම ඇති කරන්නාවූ නන්දිරාගය හා යෙදුනාවූ ඒ ඒ භවයෙහි ඇලෙන්නාවූ යම් තෘෂ්ණාවක් වේද, ඒ කවරේද යත්, කාම තෘෂ්ණාවය, භව තෘෂ්ණාවය, විභව තෘෂ්ණාවය. යන මොහුයි. මහණෙනි, මේ දුක්ඛ සමුදය ආර්‍ය්‍ය සත්‍යයයි කියනු ලැබේ.

5. "මහණෙනි, දුක්ඛ නිරොධාර්‍ය්‍යසත්‍යය කවරේද? ඒ තෘෂ්ණාවගේම යම් ඉතිරිනොකොට නැතිකිරීමක් දුරුකිරීමක් අත්හැරීමක් මිදීමක් නොඇල්මක් වේද, මහණෙනි, මේ දුක්ඛ නිරෝධාර්‍ය්‍ය සත්‍යයයි කියනු ලැබේ.

6. "මහණෙනි, දුක්ඛ නිරොධගාමිණී පටිපදා ආර්‍ය්‍ය සත්‍යය කවරේද? මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයමැයි. හේ කෙසේදයත් සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මෙයයි. මහණෙනි, මේ දුක්ඛ නිරොධගාමිණී පටිපදා ආර්‍ය්‍ය සත්‍යයයි කියනුලැබේ. මහණෙනි, මේ වනාහි චතුරාර්‍ය්‍ය සත්‍යයෝයි.

7. "මහණෙනි, එහෙයින් මෙහිලා මේ දුකයයි දැන ගැනීම පිණිස උත්සාහ කටයුතුයි මේ දුක්ඛ සමුදයයි දැනගැනීම පිණිස උත්සාහකටයුතුයි. මේ දුක්ඛ නිරෝධයයි දැනගැනීම පිණිස උත්සාහ කටයුතු, මේ දුක්ඛ නිරොධ ගාමිණී පටිපදාව යයි දැනගැනීම පිණිස උත්සාහ කටයුතුයි කියායි.

---

## 4. ආයතනසච්ච සූත්‍රය.

**2.** (මේ ඡේදය මේ වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡේදය මෙනි.)

3. "මහණෙනි, දුක්ඛාර්‍ය්‍යසත්‍ය කවරේද? අධ්‍යාත්මික ආයතන සයයයි කියයුතුය ඒ සය කවරහුද? චක්ඛායතනය, සොතායතනය, ඝානායතනය, ජිව්හායතනය, කායායතනය, මනායතනය, යන මොහුයි. මහණෙනි, මේ දුක්ඛාර්‍ය්‍ය සත්‍යයයි කියනු ලැබේ.

**4, 5, 6, 7.** (මේ ඡේදය මේ වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 4 5, 6, 7, ඡේදය මෙනි.)

---

## 5. පඨම සච්චධාරණ සූත්‍රය.

**2.** "මහණෙනි, මා විසින් නුඹලාට චතුරාර්‍ය්‍යසත්‍යයෝ දෙශනාකරණ ලදහයි දරාගනිව්." මෙසේ වදාළ කල්හි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනාකරනලද චතුරාර්‍ය්‍යසත්‍යයන් දරමියි" සැලකෙළේය.

3. "මහණ, නුඹ මවිසින් දෙශනා කරනලද චතුරාර්‍ය්‍ය සත්‍යයන් කෙසේ දරන්නෙහිදැයි" විචාළහ.

"ස්වාමීනි, මම දුක්ඛය භාග්‍යවතුන් වහන්සේ විසින් පළමුකොට දෙශනා කරනලද ආර්‍ය්‍යසත්‍යයයි දරමි. ස්වාමීනි, මම දුක්ඛසමුදය, භාග්‍යවතුන් වහන්සේ විසින් දෙවනුව දෙශනාකරණලද ආර්‍ය්‍යසත්‍යයයි දරමි. ස්වාමීනි, මම දුක්ඛනිරොධය භාග්‍යවතුන් වහන්සේ විසින් තුන්වෙනුව දෙශනාකරණලද, ආර්‍ය්‍යසත්‍යයයි දරමි. ස්වාමීනි, මම දුක්ඛනිරොධගාමිනී පටිපදාව භාග්‍යවතුන් වහන්සේ විසින් සතරවෙනුව දෙශනා කරණලද ආර්‍ය්‍ය සත්‍යයයි දරමි. ස්වාමීනි, මම වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරණලද සතර ආර්‍ය්‍යසත්‍යයන් මෙසේ දරමියි" කීයේය.

4. "මහණෙ, යහපති, යහපති, මහණෙ නුඹවනාහි මවිසින් දෙශනා කරණලද සතරආයර්‍ය්‍යසත්‍යය දරන්නෙහි (ඉතා) මැනවි. මහණෙ, මවිසින් වනාහි පළමුකොට දුක්ඛාර්‍ය්‍යසත්‍යය දෙශනා කරනලදී. එය එසේ දරාගනුව. මහණෙ, මවිසින් වනාහි දෙවනුව දුක්ඛසමුදාර්‍ය්‍යසත්‍යය දෙශනා කරනලදී. එය එසේ දරාගනුව. මහණෙ, මා විසින් තෙවනුව දුක්ඛ නිරොධාර්‍ය්‍ය සත්‍යය දෙශනාකරනලදී. එය එසේ දරාගනුව. මහණෙ, මවිසින් වනාහි සතරවෙනුව දුක්ඛනිරොධගාමිණීපටිපදා ආර්‍ය්‍යසත්‍යය දෙශනා කරන ලදී, එය එසේ දරාගනුව.

5. "මහණෙ, මෙසේ වනාහි මා විසින් දෙශනා කරණලද සතර ආර්‍ය්‍යසත්‍යයන් දරාගනුව. මහණෙ, එබැවින් මෙහිලා මේ දුක්ඛයයි දැනගැනීම පිණිස උත්සාහ කටයුතුයි. මේ දුක්ඛ සමුදයයි දැනගැනීම පිණිස උත්සාහ කටයුතුයි. මේ දුක්ඛ නිරෝධයයි දැනගැනීම පිණිස උත්සාහ කටයුතුයි. මේ දුක්ඛ නිරෝධගාමිණී පටිපදාවයයි දැනගැනීම පිණිස උත්සාහ කටයුතුයි."

---

## 6. දුතිය සච්චධාරණ සූත්‍රය.

2. (මේ ඡෙදය මේ වර්ගයේ 5 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡෙදය මෙනි.)

3. "මහණෙ නුඹ වනාහි මවිසින් දෙශනා කරනලද සතර ආර්‍ය්‍ය සත්‍යයන් කෙසේ දරන්නෙහිදැයි" අසා වදාළහ. "ස්වාමීනි මම වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් පළමුවැනි ආර්‍ය්‍යසත්‍යය දුක්ඛාර්‍ය්‍යසත්‍යයයි දරමි. ස්වාමීනි, යම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ 'ශ්‍රමණ ගෞතමයන් වහන්සේ විසින් දෙශනා කරනලද මේ පළමුවන ආර්‍ය්‍යසත්‍යය දුක්ඛාර්‍ය්‍යසත්‍ය නොවේ. මම මේ පළමුවෙනි දුක්ඛආර්‍ය්‍යසත්‍යය ප්‍රතික්ෂෙපකොට අනික් පළමුවන දුක්ඛාර්‍ය්‍යසත්‍යයක් පනවන්නෙමියි' මෙසේ කියන්නේ නම් ඒ කාරණය සිදුනොවෙයි.

**4.** "ස්වාමීනි, මම වනාහි දුක්ඛසමුදායාර්‍ය්‍යසත්‍යය භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරනලද දෙවෙනි ආර්‍ය්‍ය සත්‍යය දරමි. කිසියම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ 'ශ්‍රමණ ගෞතමයන් වහන්සේ විසින් දෙශනාකරනලද දෙවැනි ආර්‍ය්‍යසත්‍යය දුක්ඛසමුදයායාර්‍ය්‍යසත්‍ය නොවේ. මම මේ දෙවැනි දුක්ඛසමුදය ආර්‍ය්‍යසත්‍යය ප්‍රතික්ෂෙපකොට අනික් දෙවැනි දුක්ඛ සමුදය ආර්‍ය්‍යසත්‍යයක් පනවන්නෙමියි' මෙසේ කියන්නේනම් ඒ කාරණය සිදුනොවේ.

**5.** "ස්වාමීනි, මම වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරනලද තෙවෙනි ආර්‍ය්‍යසත්‍යය දුක්ඛ නිරොධායාර්‍ය්‍ය සත්‍යයයි දරමි යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ 'ශ්‍රමණ ගෞතමයන් වහන්සේ විසින් දෙශනා කරනලද මේ දුක්ඛනිරොධායාර්‍ය්‍යසත්‍යය තෙවෙනි ආර්‍ය්‍යසත්‍යය නොවේ. මම මේ තෙවැනි දුක්ඛ නිරෝධායාර්‍ය්‍ය සත්‍යය ප්‍රතික්ෂෙපකොට අන්‍යවූ තෙවෙනි දුක්ඛ නිරොධායාර්‍ය්‍යසත්‍යයක් පනවන්නෙමියි' කියන්නේ නම් ඒ කාරණය සිදුනොවේ.

**6.** "ස්වාමීනි, මම වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරනලද සතරවෙනි ආර්‍ය්‍යසත්‍යය දුක්ඛ නිරොධ ගාමිණී ප්‍රතිපදායාර්‍ය්‍යසත්‍යයයි දරමි. යම් කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ 'ශ්‍රමණ ගෞතමයන් වහන්සේ විසින් දෙශනාකරනලද මේ දුක්ඛ නිරෝධගාමිණී ප්‍රතිපදායාර්‍ය්‍ය සත්‍යය සතරවෙනි ආර්‍ය්‍යසත්‍යය නොවේ. මම මේ දුක්ඛ නිරොධ ගාමිණී ප්‍රතිපදා ආර්‍ය්‍යසත්‍යය ප්‍රතික්ෂෙපකොට අන්‍යවූ දුක්ඛ නිරෝධගාමිණී ප්‍රතිපදායාර්‍ය්‍ය සත්‍යයක් පනවන්නෙමියි' කියන්නේ නම් ඒ කාරණය සිදුනොවේ. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනාකරන ලද ආර්‍ය්‍ය සත්‍යයන් මෙසේ දරමියි කීය.

**7.** "මහණ, යහපති, යහපති. මහණ, නුඹ වනාහි මා විසින් දේශනා කරනලද සතර ආර්‍ය්‍යසත්‍යයන් මනාව දන්නෙහිය. මහණ, මා විසින් පළමුව දුක්ඛායාර්‍ය්‍යසත්‍යය දෙශනා කරනලදී. එය එසේ දරව. මහණ, යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ 'ශ්‍රමණ ගෞතමයන් විසින් දෙශනා කරන ලද එය

පළමුවෙනි ආර්‍යසත්‍යය නොවේ මම වනාහි මේ පළමුවැනි දුක්ඛාර්‍යසත්‍යය ප්‍රතික්ෂෙපකොට අනිකක් පළමුවැනි දුක්ඛාර්‍යසත්‍යයයි පනවන්නෙමියි' කියන්නේ නම් ඒ කාරණය සිදුනොවේ.

8. "මහණ, මා විසින් දෙවැනිව දුක්ඛසමුදය ආර්‍යසත්‍යය වදාරණලදී. එය එසේ දරනු. මහණ යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ 'ශ්‍රමණ ගෞතමයන් වහන්සේ විසින් දෙවැනිව දෙශනා කරණ ලද එය දුක්ඛසමුදය ආර්‍යසත්‍යය නොවේ. මම වනාහි මේ දෙවැනි දුක්ඛසමුදය ආර්‍යසත්‍යය ප්‍රතික්ෂෙපකොට අනික් දෙවැනි දුක්ඛ සමුදය ආර්‍ය සත්‍යයක් පනවන්නෙමියි' කියන්නේ නම් ඒ කාරණය සිදුනොවේ.

9. "මහණ, මා විසින් තෙවැනිව දුක්ඛනිරොධ ආර්‍ය සත්‍යයයි වදාරණලදී. එය එසේ දරණු. මහණ යම් කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ 'ශ්‍රමණ ගෞතමයන් විසින් තෙවැනිව දෙශනා කරණලද එය දුක්ඛනිරෝධ ආර්‍ය සත්‍යය නොවේ. මම වනාහි මේ තෙවැනි දුක්ඛනිරෝධයආර්‍ය සත්‍යය ප්‍රතික්ෂෙපකොට අනික් දුක්ඛනිරොධ සත්‍යයක් පනවන්නෙමියි' කියන්නේ නම් ඒ කාරණය සිදුනොවේ.

10. "මහණ, මා විසින් සතරවැනිව දුක්ඛ නිරොධගාමිනී පටිපදා ආර්‍ය සත්‍යය වදාරණ ලදී. එය එසේ දරණු. මහණ, යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ 'ශ්‍රමණ ගෞතමයන් වහන්සේ විසින් සතර වැනිව දෙශනා කරන ලද එය දුක්ඛ නිරෝධ ගාමිණී ප්‍රතිපදා ආර්‍ය සත්‍යය නොවේ. මම වනාහි සතරවැනි දුක්ඛ නිරොධ ගාමිණී ප්‍රතිපදා ආර්‍යසත්‍යය ප්‍රතික්ෂෙප කොට අනික් දුක්ඛ නිරොධ ගාමිණී පටිපදා ආර්‍ය සත්‍යයක් පනවන්නෙමියි' මෙසේ කියන්නෙම් ඒ කාරණය සිදුනොවේ.

11. (මේ ඡෙදය මේ වර්ගයේ 5 වෙනි සූත්‍රයේ 5 වෙනි ඡෙදය මෙනි.)

## 7. සච්ච නිඤ්ඤාණ සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බරණැස මිගදාය නම් ලත් ඉසිපතනයෙහි වාසයකරන සේක. එකල්හි වනාහි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැළ කෙළේය. "ස්වාමීනි, අවිද්‍යාවය අවිද්‍යාවයයි කියනු ලැබේ. ස්වාමීනි, අවිද්‍යාව නම් කුමක්ද? කොපමණකින් අවිද්‍යාවට පැමිණියේ වේදැයි" විචාළේය.

2. "මහණ, දුකෙහි යම් නොදැනීමක් වෙයිද දුක්ඛ හෙතුවෙහි යම් නොදැනීමක් වේද, දුක් නැතිකිරීමෙහි යම් නොදැනීමක් වේද, දුක් නැතිකිරීමට පැමිණෙන පිළිවෙතෙහි යම් නොදැනීමක් වේද, මහණ මේ අවිද්‍යාවයයි කියනු ලැබේ. මෙපණකින් අවිද්‍යාවට පැමිණියේද වෙයි

3. (මේ ඡේදය මේ වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 7 වෙනි ඡේදය මෙනි.)

---

## 8. සච්ච ඤාණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බරණැස මිගදාය නම් ලත් ඉසිපතනයෙහි වාසය කරන සේක. "එකල්හි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන් ඒ මහණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "ස්වාමීනි, විද්‍යාව විද්‍යාවයයි කියනු ලැබේ. ස්වාමීනි, කුමක් නම් විද්‍යාවද? කෙතෙකින් විද්‍යාවට පැමිණියේ වේද?" යනුයි.

2. "මහණ, දුකෙහි යම් දැනීමක් වෙයිද දුකට හෙතුවෙහි යම් දැනීමක් වෙයිද දුක්ඛ නිරොධයෙහි යම් දැනීමක් වෙයිද

දුක්ඛ නිරොධයට පැමිණෙන මාර්ගයෙහි යම් දැනීමක් වේද, මෙය විද්‍යාවයයි කියනු ලැබේ. මෙතෙකින් විද්‍යාවට පැමිණියේ වෙයි.

3. (මේ ඡේදය මේ වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 7 වෙනි ඡේදය මෙනි.)

---

## 9. සච්ච සංකාසනා සූත්‍රය

2. "මහණෙනි, මා විසින් මෙය දුක්ඛායයි සත්‍යයයි පනවන ලද්දේද ඒ දුක්ඛායයි සත්‍යයෙහි අක්ෂර අප්‍රමාණයහ. ව්‍යංජන අප්‍රමාණයහ. මෙසේද දුක්ඛායයි සත්‍ය වෙයි යනාදීන් බෙදීම් අප්‍රමාණයහ.

3. "මහණෙනි, මා විසින් මේ දුක්ඛ සමුදයායයි සත්‍යයයි පනවන ලද්දේද එහි අක්ෂර අප්‍රමාණයහ ව්‍යංජන අප්‍රමාණයහ. මෙසේද දුක්ඛ සමුදයායයි සත්‍ය වන්නේය යනාදීන් බෙදීම් අප්‍රමාණයහ.

4. "මහණෙනි, මා විසින් මේ දුක්ඛ නිරොධායයි සත්‍යයයි පනවන ලද්දේද, එහි අක්ෂර අප්‍රමාණයහ. ව්‍යංජන අප්‍රමාණයහ, මෙසේද දුක්ඛ නිරොධායයි සත්‍ය වේයයි බෙදීම් අප්‍රමාණයහ.

5. "මහණෙනි, මා විසින් යම් දුක්ඛ නිරොධ ගාමිණී ප්‍රතිපදායයි සත්‍යයක් පනවන ලද්දේද එහි අක්ෂර අප්‍රමාණයහ, ව්‍යංජන අප්‍රමාණයහ. මෙසේද දුක්ඛ නිරොධායයි සත්‍ය වේයයි බෙදීම්ද අප්‍රමාණයහ.

6. (මේ ඡේදය මේ වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 7 වෙනි ඡේදය මෙනි.)

---

## 10. තථාවිතථ සූත්‍රය

2. "මහණෙනි, තථවූ (ස්වභාවය වෙනස් නොවන්නාවූ) අවිතථවූ (ස්වභාව වශයෙන් හිස් නොවන්නාවූ) අනඤ්ඤථවූ

(අන් ස්වභාවයකට නොපෙරෙළෙන්නාවූ) මේ ධර්මයෝ සතර දෙනෙක් වෙත්. කවර සතරක්ද යත්? මහණෙනි, මෙය දුකය යන මෙය ස්වභාවය වෙනස් නොවන්නේය, ස්වභාවයෙන් හිස් නොවන්නේය, අන් ස්වභාවයකට නොපෙරළෙන්නේය.

3. "මහණෙනි, මෙය දුකට හෙතුවය යන මෙය ස්වභාවය වෙනස් නොවන්නේය. ස්වභාවයෙන් හිස් නොවන්නේය, අන් ස්වභාවයකට නොපෙරළෙන්නේය.

4. 'මහණෙනි, මෙය දුක්ඛ නිරොධය යන මෙය ස්වභාවය වෙනස් නොවන්නේය ස්වභාවයෙන් හිස් නොවන්නේය. අන් ස්වභාවයකට නොපෙරළෙන්නේය."

5. "මහණෙනි, මෙය දුක්ඛ නිරොධගාමිණී පටිපදාවය යන මෙය ස්වභාවය වෙනස් නොවන්නේය. ස්වභාවයෙන් හිස් නොවන්නේය, අන් ස්වභාවයකට නොපෙරළෙන්නේය. මහණෙනි, මේ වනාහි ස්වභාවය වෙනස් නොවන්නාවූ ස්වභාවයෙන් හිස් නොවන්නාවූ අන් ස්වභාවයකට නොපෙරළෙන්නාවූ ධර්ම සතර වෙත්.

6. (මේ ඡෙදය මේ වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 7 වෙනි ඡෙදය මෙනි.)

---

# 3. කොටිගාම වර්ගය.

## 1. කොටිගාම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ වැදෑරට කෝටි නම් ගමෙහි වාසය කරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්හට කථා කළ සේක.

2. "මහණෙනි, චතුරාර්‍ය්‍ය සත්‍යය අවබොධ නොකිරීම හෙතුකොටගෙන ප්‍රතිවෙධ නොකිරීම හෙතුකොට ගෙන මෙසේ මාද තොපද බොහෝ කාලයක් මුළුල්ලෙහි සසර ගමන් කරන ලදී. සැරිසරණ ලදී.

3. "කිනම් සතරකගේද? මහණෙනි, දුක්ඛාර්‍ය්‍ය සත්‍යය අවබෝධ නොකිරීම හෙතුකොටගෙන ප්‍රතිවේධ නොකිරීම හෙතුකොට ගෙන මෙසේ මාද තොපද බොහෝ කාලයක් මුළුල්ලෙහි සසර ගමන් කරන ලදී, සැරිසරණ ලදී.

4. "දුක්ඛ සමුදය ආර්‍ය්‍ය සත්‍යය අවබෝධ නොකිරීම හෙතුකොට ගෙන ප්‍රතිවේධ නොකිරීම හෙතුකොට ගෙන මෙසේ මාද තොපද බොහෝ කාලයක් මුළුල්ලෙහි සසර ගමන් කරන ලදී, සැරිසරණ ලදී.

5. "දුක්ඛ නිරොධ ආර්‍ය්‍ය සත්‍යය අවබෝධ නොකිරීම හෙතුකොටගෙන ප්‍රතිවේධ නොකිරීම හෙතුකොට ගෙන මෙසේ මාද තොපද බොහෝ කාලයක් මුළුල්ලෙහි සසර ගමන් කරන ලදී, සැරිසරණ ලදී.

6. "දුක්ඛ නිරොධ ගාමිණී ප්‍රතිපදා ආර්‍ය්‍ය සත්‍යය අවබෝධ නොකිරීම හෙතුකොට ගෙන ප්‍රතිවේධ නොකිරීම හෙතුකොට ගෙන මෙසේ මාද තොපද බොහෝකාලයක් මුළුල්ලෙහි සසර ගමන් කරන ලදී, සැරිසරණ ලදී.

7. "මහණෙනි, මා විසින් ඒ මේ දුක්ඛාර්‍ය්‍ය සත්‍යය අවබෝධ කරන ලදී. ප්‍රතිවේධ කරන ලදී. දුක්ඛ සමුදය ආර්‍ය්‍ය සත්‍යය අවබෝධ කරන ලදී ප්‍රතිවේධ කරන ලදී. දුක්ඛ නිරොධාර්‍ය්‍ය සත්‍යය අවබෝධ කරන ලදී. ප්‍රතිවේධ කරන ලදී. දුක්ඛ නිරොධ ගාමිණී ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යය අවබෝධ කරන ලදී, ප්‍රතිවේධ කරන ලදී. භව තණ්හාව සිඳින ලදී. භවයෙන් භවයට පැමිණීම ක්ෂය කරන ලදී. දැන් නැවත ඉපදීමක් නැත." මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී.

8. "සුගතයන් වහන්සේ මෙය වදාරා නැවත ශාස්තෲන් වහන්සේ මෙයද වදාළසේක. චතුරාර්‍ය්‍යසත්‍යය ඇති පරිදි නො දැක්මෙන් සසර බොහෝ කාලයක් මුළුල්ලෙහි ඒ ඒ ජාතීන්හි හැසුරුනෙමි. මේ චතුරාර්‍ය්‍ය සත්‍යය මා විසින් දක්නා ලදී. ඒ භවයෙන් භවයට යාම නැති කරන ලදී. දුක්ඛයාගේ මුල් සිඳින ලදී. දැන් නැවත ඉපදීමක් නැත."

---

## 2. නජාතිජරූපග සූත්‍රය

2. "මහණෙනි, යම් කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙය දුකයයි" තත්වූ පරිදි නොදනිත්ද, මේ දුකට හෙතුවයයි, තත්වූ පරිදි නොදනිත්ද, මේ දුක නැතිවීමයයි තත්වූ පරිදි නොදනිත්ද, මේ දුක නැතිකිරීමට පැමිණෙන මාර්ගයයි තත්වූ පරිදි නොදනිත්ද, මහණෙනි, මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණයයි සම්මතද, බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණයයි සම්මතද නොවෙත්. ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණභාවයේ ඵලය හෝ බ්‍රාහ්මණ භාවයේ ඵලය හෝ මේ ආත්මයේදීම තෙමේ දැන ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය නොකෙරෙත්.

3. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙය දුකයයි තත්වූ පරිදි දනිත්ද, මේ දුකට හෙතුවයයි තත්වූ පරිදි දනිත්ද මේ දුක නැතිවීමයයි තත්වූ පරිදි දනිත්ද, මේ දුක නැතිකිරීමට පැමිණෙන මාර්ගයයි තත්වූ පරිදි දනිත්ද, මහණෙනි, මේ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණයයි සම්මතද බ්‍රාහ්මණයන් කෙරෙහි බ්‍රාහ්මණයයි සම්මතද වෙත් ඒ ආයුෂ්මත්හු වනාහි ශ්‍රමණභාවයේ ඵලය හෝ බ්‍රාහ්මණ භාවයේ ඵලය හෝ මේ ආත්මභාවයේ දීම තෙමේ දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය කෙරෙත්.

4. "භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සුගතයන් වහන්සේ මෙය වදාරා නැවත ශාස්තෲන් වහන්සේ මෙයද වදාළසේක යම් කෙනෙක් දුක් නොදනිත්ද වැලි දුකට හෙතුව නොදනිත්ද යම් ධර්මයෙක්හි දුක ඉතිරි නොවී සර්වප්‍රකාරයෙන් නිරුද්ධවේද, එය නොදනිත්ද දුක් නැතිකිරීමට පැමිණෙන මාර්ගය නොදනිත්ද, ඔව්හු අර්හත් ඵල සමාධියෙන් පිරිහුණාහ. තවද අර්හත් ඵල ප්‍රඥාවෙන් පිරිහුණාහ. ඔව්හු දුක් කෙළවර කිරීමට නුසුදුස්සෝය. ඔව්හු ඒකාන්තයෙන් ජාති ජරා දුක් වලට පැමිණෙන්නාහ.

"යම් කෙනෙක් දුක දනිත්ද යලි දුකටහේතුව දනිත්ද යම් තැනෙක දුක ඉතිරි නොවී සර්වප්‍රකාරයෙන් නිරුද්ධ වෙයිනම්

එයද දනිත්ද, දුකසංසිඳීමට පැමිණෙන මාර්ගය දනිත්ද, අර්හත් ඵල සමාධියෙන් හා අර්හත් ඵල ප්‍රඥාවෙන් යුත් ඔව්හු දුක් කෙළවර කිරීමට සුදුස්සෝය. ඔව්හු ජාති ජරා දුකට නොපැමිණෙන්නාහ.”

---

## 3 යථාභූත සම්බුද්ධ සූත්‍රය.

2. (මේ ඡේදය ධම්මචක්කප්පවත්තන වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 2 ඡේදය මෙනි.)

3. ‘මහණෙනි, මේ ආර්‍ය්‍ය සත්‍ය සතර තත්වූ පරිදි මනාව අවබෝධකළ හෙයින් තථාගතතෙම සම්මාසම්බුද්ධයයි කියනු ලැබේ.

4. (මේ ඡේදය ධම්මචක්කප්පවත්තන වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 7 වෙනි ඡේදය මෙනි.)

---

## 4. යථාභූත අරහන්ත සූත්‍රය.

2. මහණෙනි, අතීතයෙහි යම් අර්හත් සම්‍යක් සම්බුදුවරයෝ ඇති සැටි අවබොධ කළාහුද ඒ සියලු බුදුවරයෝ චතුරාර්‍ය්‍ය සත්‍යයන් ඇතිසැටියෙන් අවබොධ කළාහුය. මහණෙනි, අනාගතයෙහි යම් අර්හත් සම්‍යක් සම්බුදුවරයෝ තත්වූ පරිදි අවබොධ කරන්නාහුද ඒ සියලු බුදුවරයෝ චතුරාර්‍ය්‍ය සත්‍යයන් ඇති සැටි අවබොධ කරන්නාහුය. මහණෙනි, මේ කාලයෙහි යම් අර්හත් සම්‍යක් සම්බුදුවරයෝ තත්වූ පරිදි අවබොධ කරත්ද ඒ සියලු බුදුවරයෝ චතුරාර්‍ය්‍ය සත්‍යයන් තත්වූ පරිදි අවබොධ කරත්.

3. (මේ ඡේදය ධම්මචක්කප්පවත්තන වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡේදය මෙනි.)

4. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 වෙනි ඡේදය මෙනි.)

6. (මේ ඡේදය ධම්මචක්කප්පවත්තන වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 7 වෙනි ඡේදය මෙනි.)

---

## 5. සච්ච ආසවක්ඛය සූත්‍රය.

2. "මහණෙනි, මම දන්නාවූ දක්නාවූ පුද්ගලයාගේ ආශ්‍රවයන් ක්ෂය කිරීම කියමි. නොදන්නාහුගේ නොදක්නහුගේ නොකියමි. මහණෙනි, කුමක් දන්නහුගේ දක්නහුගේ ආශ්‍රවයන් ක්ෂයවේද?

3. "මහණෙනි, මෙය දුකයයි දන්නහුගේ දක්නහුගේ ආශ්‍රව ක්ෂයවෙයි. මේ දුකට හේතුවයි දන්නහුගේ දක්නහුගේ ආශ්‍රව ක්ෂයවෙයි මේ දුක නැති කිරීමයයි දන්නහුගේ දක්නහුගේ ආශ්‍රව ක්ෂය වෙයි. මේ දුක නැතිකරන මාර්ගයයි දන්නහුගේ දක්නහුගේ ආශ්‍රව ක්ෂයවෙයි. මහණෙනි, මෙසේ දන්නහුගේ මෙසේ දක්නහුගේ ආශ්‍රව ක්ෂයවෙයි.

4. (මේ ඡේදය ධම්මචක්කප්පවත්තන වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 7 වෙනි ඡේදය මෙනි.)

---

## 6 අනුකම්පෙයයාථ සූත්‍රය.

2. "මහණෙනි, යම් කිසිවෙකුට අනුකම්පා කරන්නාහුද, යම්කිසි මිත්‍රයෝ හෝ යහළුවෝ හෝ නෑයෝ හෝ සහලේ නෑයෝ හෝ ඇසිය යුත්තෝයයි හඟින්නාහුද? මහණෙනි, ඔවුහු චතුරායර්‍ය සත්‍යයන් ඇති පරිදි අවබොධ කිරීම පිණිස සමාදන් කරවිය යුත්තාහ. යෙදිය යුත්තාහ. පිහිටුවිය යුත්තාහ.

3. (මේ ඡේදය මේ වර්ගයේ ධම්මචක්කප්පවත්තන වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡේදය මෙනි.)

4. (මේ ඡේදය මේ සූත්‍රයේ 2 වෙනි ඡේදය මෙනි.)

(මේ ඡේදය ධම්මචක්කප්පවත්තන වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 7 වෙනි ඡේදය මෙනි.)

---

## 7. අරියධම්ම සූත්‍රය.

(මේ ඡේදය ධම්මචක්කප්පවත්තන වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡේදය මෙනි.)

3. "මහණෙනි, මේ ආර්‍ය්‍යසත්‍ය සතර වෙනස් නොවන ස්වභාව ඇත්තාහ. හිස් නොවූ ස්වභාවය ඇත්තාහ. අන් ස්වභාවයකට නොපෙරලෙන්නාහ. එහෙයින් ආර්‍ය්‍යසත්‍යයෝ යයි කියනු ලැබෙත්.

4. (මේ ඡේදය ධම්මචක්කප්පවත්තන වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 7 වෙනි ඡේදය මෙනි.)

---

## 8. අරිය තථාගත සූත්‍රය.

2. (මේ ඡේදය ධම්මචක්කප්පවත්තන වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡේදය මෙනි.)

3. "මහණෙනි, දෙවියන් සහිත, මරුන් සහිත ලෝකයෙහි, මහණ බමුණන් සහිත දෙවිමිනිසුන් සහිත සත්වයන් අතරෙහි තථාගතතෙමේ 'අරිය' නම් වෙයි. එහෙයින් ආර්‍ය්‍ය සත්‍යයෝ යයි කියනු ලැබෙත්.

4. (මේ ඡේදය ධම්මචක්කප්පවත්තන වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 7 වෙනි ඡේදය මෙනි.)

---

## 9. සච්ච පරිඤ්ඤෙය්‍ය සූත්‍රය.

2. (මේ ඡේදය ධම්මචක්කප්පවත්තන වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 2 වෙනි ඡේදය මෙනි.)

3. "මහණෙනි, මේ චතුරාර්‍ය්‍යසත්‍යයන් අතර පිරිසිඳ දතයුතු ආර්‍ය්‍යසත්‍යයන් ඇත්තේය. පහකළ යුතු ආර්‍ය්‍ය සත්‍යයක් ඇත්තේය. ප්‍රත්‍යක්ෂ කළයුතු ආර්යසත්‍යයක් ඇත්තේය.

වැඩියයුතු ආර්ය සත්‍යයක් ඇත්තේය. මහණෙනි, පිරිසිඳ දතයුතු ආයර්‍යසත්‍යය කවරේද?

4. "මහණෙනි, දුක්ඛායර්‍යසත්‍යය පිරිසිඳ දතයුත්තේය. දුක්ඛසමුදයායර්‍යසත්‍යය පහකළයුත්තේය. දුක්ඛනිරොධායර්‍ය සත්‍යය ප්‍රත්‍යක්ෂ කළයුත්තේය. දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදායර්‍යසත්‍යය වැඩිය යුත්තේය

(මේ ඡෙදය ධම්මචක්කප්පවත්තන වර්ගයේ 3 වෙනි සූත්‍රයේ 7 වෙනි ඡෙදය මෙනි.)

---

## 10. ගවම්පති සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි බොහෝ ස්ථවිරභික්ෂූහු සහජාති නුවර සමීපයෙහිවූ චෛත්‍යයන්හි වාසය කෙරෙත්. එසමයෙහි වනාහි සවස් කල්හි පිණ්ඩපාතයෙන් වැළකී මණ්ඩල මාලයෙහි රැස්වී වැඩහුන්නාවූ, බොහෝවූ ස්ථවිර භික්ෂූන් අතරෙහි මේ කථාව පහළවිය. 'ඇවැත, යමෙක් වනාහි දුක දකීද, හෙතෙම දුකට හේතුවත් දකී. දුක නැති කිරීමත් දකී. දුක නැතිකරන මාර්ගයත් දකීය" කියායි

2. මෙසේ කී කල්හි ආයුෂ්මත් ගවම්පති ස්ථවිරතෙම භික්ෂූන්හට මෙය කීයේය. ඇවැත, මෙය මා විසින් භාග්‍යවතුන් වහන්සේගේ සම්මුඛයෙන් අසනලදී. සම්මුඛයෙන් පිළිගන්නාලදී.

3. "මහණෙනි, යමෙක් දුක දකීද හෙතෙම දුකට හේතුවත් දකී. දුක නැතිකිරීමත් දකී. දුක නැතිකරන මාර්ගයත් දකී යමෙක් දුකට හෙතුව දකීද, හෙතෙම දුකද දකියි. දුක නැතිකිරීමද දකියි. දුක නැතිකරන මාර්ගයද දකියි. යමෙක් දුක නැතිකිරීම දකියිද හෙතෙම දුකද දකියි. දුකට හේතුවක් දකියි. දුක නැතිකරන මාර්ගයද දකියි. යමෙක් දුක නැතිකරන මාර්ගය දකියිද, හෙතෙම දුකද දකියි. දුකට හේතුවද දකියි. දුක නැතිවීමද දකීය" කියායි.

---

# 4. සිංසපා වර්ගය.

## 1. සිංසපා වන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවර ඇට්ටේරිය වනයෙහි වාසය කරන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ වනාහි ඇට්ටේරිය කොළ ස්වල්පයක් ශ්‍රී හස්තයෙන් ගෙන භික්ෂූන් ඇමතූසේක.

2. "මහණෙනි, ඒ කිමැයි හඟින්නෙහිද? මා විසින් අතින් ගන්නා ලද ඇට්ටේරිය කොළ ස්වල්පයද මේ ඇට්ටේරිය වනයෙහි ඉතිරි ඇට්ටේරිය කොළද යන දෙකින් කවරක් වැඩිද"

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් අතින් ගන්නා ලද ඇට්ටේරිය කොළ ඉතා ස්වල්පය. ඇට්ටේරිය වනයෙහි ඉතිරි ඇට්ටේරිය කොළම වැඩිය."

3. "මහණෙනි, එසේම මා විසින් අවබොධ කොට නොකියන ලද්දේම අධිකය. කියන ලද දේ ස්වල්පය. මහණෙනි, කවර හෙයකින් මා විසින් නොකියන ලද්දේද? මහණෙනි, එය අර්ථයෙන් යුක්තවූයේ නොවෙයි. මාර්ගබ්‍රහ්මචය්‍ර්‍යාවට මුල්වන්නේද නොවෙයි. කලකිරීම පිණිස, විරාගය පිණිස, නිරොධය පිණිස, සංසිඳීම පිණිස, දැනීම පිණිස, අවබොධ කිරීම පිණිස, නිවන පිණිස නොපවතියි. එහෙයින් මා විසින් එය නොවදාරණ ලදී.

4 "මහණෙනි, කුමක් මා විසින් කියන ලදද? මහණෙනි, මෙය දුකයයි මා විසින් කියන ලදී මේ දුකට හෙතුවයයි මා විසින් කියන ලදී. මේ දුක නැතිවීමයයි මා විසින් කියන ලදී. මේ දුක නැති කිරීමට පැමිණෙන මාර්ගයයි මා විසින් කියන ලදී.

5. "මහණෙනි, කුමක් නිසා මා විසින් මෙය කියන ලදද? මහණෙනි, මෙය අර්ථයෙන් යුක්තය. මාර්ගබ්‍රහ්මචය්‍ර්‍යාවට මුල් වූයේ වෙයි. මෙය කලකිරීම පිණිස, විරාගය පිණිස, නිරොධය පිණිස, සංසිඳීම පිණිස විශෙෂයෙන් දැනගැනීම පිණිස, අවබොධය පිණිස, නිවන පිණිස පවතියි.

6. "මහණෙනි, එහෙයින් මෙය දුකයයි දැනගැනීම පිණිස උත්සාහ කළයුතුයි. මෙය දුකට හේතුවයයි දැනගැනීම පිණිස උත්සාහ කළ යුතුයි. මෙය දුක නැතිවීමයයි දැනගැනීම පිණිස උත්සාහ කළ යුතුයි. මේ දුක නැතිකරන මාර්ගයයි දැනගැනීම පිණිස උත්සාහ කළ යුතුයි"

## 2. ඛදිරපත්ත සූත්‍රය.

2. "මහණෙනි, යමෙක් 'මම දුක්ඛායයි සත්‍යය තත්වූ පරිදි අවබොධ නොකොට, දුක්ඛ සමුදයායයි සත්‍යය තත්වූ පරිදි අවබොධ නොකොට, දුක්ඛ නිරොධායයි සත්‍යය තත්වූ පරිදි අවබොධ නොකොට, දුක්ඛ නිරොධගාමිණී ප්‍රතිපදායයි සත්‍යය තත්වූ පරිදි අවබොධ නොකොට මනාකොට දුක් කෙළවර කරන්නෙමි'යි මෙසේ කියන්නේ නම් එය සිදු නොවේ.

3. "මහණෙනි, යම්සේ යමෙක් 'මම කිහිරි කොළයකින් හෝ ඉඟුරු පියලිය කොළයකින් හෝ නෙල්ලි කොළයකින් හෝ ගොටුවක් කොට, දිය හෝ තල් කොළයක් හෝ ගෙන යන්නෙමි' යි මෙසේ කියන්නේ නම් එය සිදු නොවන්නේද මහණෙනි, මෙසේම යමෙක් වනාහි 'මම දුක්ඛායයි ශාත්‍යය තත්වූ පරිදි අවබොධ නොකොට, දුක්ඛ සමුදයායයි සත්‍යය තත්වූ පරිදි අවබොධ නොකොට, දුක්ඛ නිරොධායයි සත්‍යය තත්වූ පරිදි අවබොධ නොකොට, දුක්ඛ නිරොධ ගාමිණී ප්‍රතිපදායයි සත්‍යය පරිදි අවබොධ නොකොට මනාකොට දුක් කෙළවර කරන්නෙමි' යි මෙසේ කියන්නේ නම් එය සිදු නොවේ.

4. "මහණෙනි, යමෙක් වනාහි 'මම දුක්ඛායයි සත්‍යය තත්වූ පරිදි අවබොධ කොට, දුක්ඛසමුදයායයි සත්‍යය තත්වූ පරිදි අවබොධ කොට දුක්ඛ නිරොධායයි සත්‍යය තත්වූ පරිදි අවබොධ කොට, දුක්ඛ නිරොධායයි සත්‍යය තත්වූ පරිදි අවබොධ කොට, දුක්ඛ නිරොධ ගාමිණී ප්‍රතිපදායයි සත්‍යය තත්වූ පරිදි දැන මනාකොට දුක් කෙළවර කරන්නෙමි' යි මෙසේ කියන්නේ නම් ඒ කාරණය සිදුවෙයි.

**5.** 'මහණෙනි, යම්සේ යමෙක් 'මම නෙළුම් කොළයකින් හෝ කොළ පතකින් හෝ ඕලුවා පතකින් හෝ ගොටුවක් කොට, දිය හෝ තල් කොළයක් හෝ ගෙන යන්නෙමි' යි මෙසේ කියන්නේ නම් ඒ කාරණය සිදුවන්නේද, මහණෙනි, එසේම යමෙක් වනාහි 'මම දුක්ඛාර්‍ය්‍ය සත්‍යය තත්වූ පරිදි අවබොධ කොට, දුක්ඛ සමුදයාර්‍ය්‍ය සත්‍යය තත්වූ පරිදි අවබොධ කොට දුක්ඛ නිරොධාර්‍ය්‍ය සත්‍යය තත්වූ පරිදි අවබොධ කොට, දුක්ඛ නිරොධ ගාමිණී ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යය තත්වූ පරිදි දැන මනාකොට දුක් කෙළවර කරන්නෙමි' යි මෙසේ කියන්නේ නම් මේ කරුණ සිදුවෙයි.

**6.** (මේ ඡෙදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 6 වෙනි ඡෙදය මෙනි.)

---

## 3. දණ්ඩනීරතන සූත්‍රය.

**2.** "මහණෙනි, උඩ අහසට විසිකරන ලද දණ්ඩක් වනාහි යම්සේ වරක් මුලින් බිම වැටේද, වරක් මැදින් බිම වැටේද, වරක් අගින් බිම වැටේද. මහණෙනි, එසේම අවිද්‍යාවෙන් වැසුණාවූ, තණ්හාවෙන් බැඳුනාවූ, සසර ගමන් කරන් කරන්නාවූ, සැරිසරන්නාවූ සත්වයෝ වනාහි වරක් මෙලොවින් පරලොවට යෙත්. වරක් පරලොවින් මෙලොවට එත්. ඊට හේතු කවරේද? මහණෙනි, චතුරාර්‍ය්‍ය සත්‍යය නොදක්නා ලද හෙයිනි. කිනම් සතරක්ද?

**3.** (මේ ඡෙදය මේ වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 4 වෙනි ඡෙදය මෙනි.)

**4.** (මේ ඡෙදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 6 වෙනි ඡෙදය මෙනි.)

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 4. ආදිත්තචෙල සූත්‍රය.

2. "මහණෙනි, රෙද්දට හෝ හිසට හෝ ගිනි ඇවිළුණු කල්හි කුමක් කළ යුතුද?

"ස්වාමීනි, රෙද්දට හෝ හිසට හෝ ගිනි ඇවිළුණු කල්හි ඒ රෙද්ද හෝ හිස හෝ නිවීම පිණිස බලවත් කැමැත්තද වෑයමද, උත්සාහයද, වීය්‍ය්‍යයද, නොපසුබස්නා වීය්‍ය්‍යයද, සිහියද, නුවණද ඇති කළ යුතුයි."

3. "මහණෙනි, ඇවිල ගත් රෙද්ද හෝ හිස හෝ නොබලා, මෙනෙහි නොකොට, අවබොධ නොකරන ලද, චතුරාය්‍ය්‍ය සත්‍යය තත්වූ පරිදි අවබොධ කිරීම පිණිස බලවත් කැමැත්තද, වෑයමද, උත්සාහයද, වීය්‍ය්‍යයද, නොපසුබස්නා වීය්‍ය්‍යයද, සිහියද නුවණද ඇතිකළ යුතුය කවර සතරක්ද?

4. (මේ ඡෙදය මේ වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 4 වෙනි ඡෙදය මෙනි.)

5. (මේ ඡෙදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 6 වෙනි ඡෙදය මෙනි.)

---

## 5. සත්ති සත සූත්‍රය.

2. "මහණෙනි, අවුරුදු සීයක් ආයුෂ ඇති, අවුරුදු සීයක් ජීවත්වෙන පුරුෂයෙක් වෙයි' ඔහුට පින්වත් පුරුෂය, තට උදේ කාලයෙහි යවුල් සීයකින් අනින්නාහුය. දවල් කාලයෙහි යවුල් සීයකින් අනින්නාහුය සවස් කාලයෙහි යවුල් සීයකින් අනින්නාහුයයි කියන්නාහුය. පින්වත් පුරුෂය, දිනපතා යවුල් තුන් සීයකින් අනිනු ලබන්නාවූ ඒ නුඹ වනාහි වර්ෂ සීයක් ආයුෂ ඇතිව වර්ෂ සීයක් ජීවත් වන්නෙහි වර්ෂ සීයකින් පසුව අවබොධ නොකළාවූ චතුරාය්‍ය්‍ය සත්‍යයන් අවබොධ කරන්නේයයි කියන්නාහුද, මහණෙනි, අර්ථය කැමැති වන්නාවූ කුලපුත්‍රයා විසින් එයට පැමිණීමට (එය ඉවසීමට) සුදුසුය. ඊට හේතු කවරේද?

3. "මහණෙනි, මේ සංසාරය නොදතහැකි කෙළවර ඇත්තේය. මහණෙනි, මෙසේ මේ යවුල් පහරවල හා කඩු පහරවල කෙළවරක් නොපෙනේ. මහණෙනි, එය එසේ වූයේවී නමුත් මම දුකින් යුක්තව, දොම්නසින් යුක්තව චතුරාර්‍ය්‍ය සත්‍යයන් අවබොධ කිරීම නොකියමි. මහණෙනි, එතකුදු වුවත් මම සැපයෙන් යුක්තව, සොම්නසින් යුක්තව චතුරාර්‍ය්‍ය සත්‍යයන් අවබොධ කිරීම කියමි. කවර සතරක්ද?

4. (මේ ඡෙදය මේ වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 4 වෙනි ඡෙදය මෙනි.)

5. (මේ ඡෙදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 6 වෙනි ඡෙදය මෙනි.)

---

## 6. සුලාවුණාය සූත්‍රය.

2. "මහණෙනි, පුරුෂයෙක් මේ දඹදිව යම් තණ-දර අතු සහ කොළ වෙත්ද ඒ සියල්ල සැස, එක්තැනකට රැස් කරන්නේය එක්රැස්කොට, හුල්කරන්නේය. හුල්කොට මහාසමුද්‍රයෙහි යම් මහත් ප්‍රාණීහු වෙත්ද, ඔවුහු මහත් හුල්හි අමුණන්නේය. මහා සමුද්‍රයෙහි යම් මධ්‍යම ප්‍රාණීහු වෙත්ද, ඔව්හු මධ්‍යම හුල්හි අමුණන්නේය. මහාසමුද්‍රයෙහි යම් සියුම් ප්‍රාණීහු වෙත්ද, ඔවුහු සියුම් හුල්හි අමුණන්නේය. මහණෙනි, එහෙත් මහා සමුද්‍රයෙහි මහත් ප්‍රාණීහු අවසාන නොවන්නාහුය. මේ දඹදිව තණ, දර, අතු සහ කොළ අවසානයට පැමිණෙන්නේය. මහණෙනි, මහා සමුද්‍රයෙහි හුලින් අමුණා ගැනීමට පහසු නොවූ, සියුම් ප්‍රාණීහු ඊටද වඩා අධිකය. ඊට හේතු කවරේද? මහණෙනි, ආත්ම භාවයන් සියුම් බැවිනි. මහණෙනි, අපාය වනාහි මෙසේ මහත් වේ.

3. "මහණෙනි, යමෙක් මෙය දුකයයි තත්වූ පරිදි දනියිද, මේ දුකට හේතුවයයි තත්වූ පරිදි දනියිද, මේ දුක නැතිකිරීම යයි තත්වූ පරිදි දනියිද, මේ දුක නැතිකරන මාර්ගයයි තත්වූපරිදි

දනියිද, ඒ මාර්ග සම්‍යක්දෘෂ්ටියෙන් යුත් පුද්ගලතෙම වනාහි මෙසේ මහත් අපායෙන් මිදුනේ වෙයි.

4. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 6 වෙනි ඡේදය මෙනි.)

---

## 7. සූරියොපම සූත්‍රය

2. "මහණෙනි, යම් මේ අරුණ නැගීමක් වේද, එය ඉර උදාවීමට පෙරටු වෙයි. පෙරනිමිත්ත වෙයි. මහණෙනි, එසේම යම් මේ සම්‍යක්දෘෂ්ටියක් වේද එය මහණහුගේ චතුරාර්‍ය්‍යසත්‍යය තත්වූ පරිදි අවබොධ කිරීමට පෙරටු වෙයි. පෙර නිමිත්ත වෙයි.

3. 'මහණෙනි, සම්‍යක් දෘෂ්ටියෙන් යුත් භික්ෂුවම මෙය දුකයයි තත්වූ පරිදි දැනගන්නේය. සම්‍යක් දෘෂ්ටියෙන් භික්ෂුවම මෙය දුකට හේතුවයයි තත්වූ පරිදි දැනගන්නේය සම්‍යක් දෘෂ්ටියෙන් යුත් භික්ෂුවම මෙය දුක නැතිකිරීමයයි තත්වූ පරිදි දැනගන්නේය. සම්‍යක් දෘෂ්ටියෙන් යුත් භික්ෂුවම මේ දුක නැතිකරන මාර්ගයයි තත්වූ පරිදි දැනගන්නේය. යන මෙය කැමතිවිය යුතුය.

4. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 6 වෙනි ඡේදය මෙනි.)

---

## 8. චන්දිම සූරියොපම සූත්‍රය

2. "මහණෙනි, යම්තාක් සඳ හිරු දෙදෙන ලොකයෙහි පහළ නොවෙත්ද ඒතාක් මහත්වූ ආලොකයාගේ, මහත්වූ බැබලීමක් පහළ නොවෙයි. එකල්හි ගනඳුර වෙයි. අඳුරෙන් වැඩීම වෙයි. ඒතාක් රෑ දවල් නොපෙනෙත්. මාස අර්ධ මාසයෝ නොපෙනෙත්. ඍතු වර්ෂයෝ නොපෙනෙත්. මහණෙනි, යම් තැනක පටන් සඳ හිරු දෙදෙන ලෝකයෙහි උපදිත්ද, එකල්හි මහත්වූ ආලෝකයාගේ, මහත්වූ දීප්තියේ පහළවීම වෙයි. එකල්හි

අඳුර නැත්තේ වෙයි. එකල්හි රෑ දාවල් පෙනෙත්. මාස අර්ධ මාසයෝ පෙනෙත්. ඍතු වර්ෂයෝ පෙනෙත්.

3. "මහණෙනි, එසේම යම්තාක් අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ තථාගත තෙමේ ලොකයෙහි පහළ නොවේද ඒ තාක් මහත්වූ ආලොකයාගේ, මහත්වූ දීප්තියේ පහළවීම නොවෙයි. එකල්හි ගනඳුර ඒතාක් චතුරාර්‍ය්‍ය සත්‍යය දැකීමක් දෙශනාකිරීමක්, පැණවීමක්, තැබීමක්, විවරණය කිරීමක්, බෙදීමක් උඩුකුරු කිරීමක් නොවෙයි. මහණෙනි, යම් තැනක පටන් අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ තථාගත තෙමේ ලොකයෙහි පහළ වෙයිද, එකල්හි මහත්වූ ආලොකය සහ දීප්තිය පහළ වෙයි. එකල්හි ගනදුර දුරුවෙයි. එකල්හි චතුරාර්‍ය්‍ය සත්‍යය කීම, දෙශනාකිරීම, පැණවීම, තැබීම, විවරණයකිරීම, බෙදීම උඩුකුරු කිරීම වෙයි. කවර සතරක්ද?

4. "දුක්ඛාර්‍ය්‍ය සත්‍යය, දුක්ඛ සමුදය ආර්‍ය්‍ය සත්‍යය, දුක්ඛ නිරොධ ආර්‍ය්‍ය සත්‍යය, දුක්ඛ නිරොධ ගාමිනී ප්‍රතිපදා ආර්‍ය්‍ය සත්‍යය වෙත්.

5. (මේ ඡෙදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 6 වෙනි ඡෙදය මෙනි.)

---

## 9. ඉන්ද ඛීලොපම සූත්‍රය

2. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙය දුකයයි තත්වූ පරිදි නොදනිත්ද, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙය දුකට හේතුවයයි තත්වූ පරිදි නොදනිත්ද, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙය දුක නැතිකිරීමයයි තත්වූ පරිදි නොදනිත්ද, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මේ දුක නැති කරන මාර්ගයයි තත්වූ පරිදි නොදනිත්ද, ඔවුහු අන්‍යවූ ශ්‍රමණයකුගේ හෝ බ්‍රාහ්මණයකුගේ හෝ මුහුණ බලත්. මේ පින්වතා ඒකාන්තයෙන් දැනගත යුත්ත දනී. දැක්ක යුත්ත දකීය" කියායි.

3. "මහණෙනි, යම්සේ සමභූමිභාගයෙහි තබන ලද්දාවූ සැහැල්ලුවූ වාතයෙන් ගෙනයන්නාවූ ඉඹුල් පුළුන් හෝ කපු පුළුන් හෝ වේද, එය පෙරදිග වාතයෙන් අපරදිගට ගෙන යන්නේය. අපරදිග වාතයෙන් පෙරදිගට ගෙනයන්නේය, උතුරුදිග වාතයෙන් දකුණුදිගට ගෙනයන්නේය, දකුණුදිග වාතයෙන් උතුරුදිගට ගෙනයන්නේය. ඊට හේතුව කවරේද? මහණෙනි, කපු පුළුන් සැහැල්ලු බැවිනි.

4. "මහණෙනි, එසේම යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙය දුකයයි තත්වූ පරිදි නොදනිත්ද, මෙය දුකට හේතුවයයි තත්වූ පරිදි නොදනිත්ද, මෙය දුක නැති කිරීම යයි තත්වූ පරිදි නොදනිත්ද, මේ දුක නැති කරන මාර්ගයයි තත්වූ පරිදි නොදනිත්ද, ඔවුහු අන්‍යවූ ශ්‍රමණයෙකුගේ හෝ බ්‍රාහ්මණයෙකුගේ හෝ මුහුණ බලත්. "මේ පින්වතා ඒකාන්තයෙන් දතයුත්ත දන්නේය. දැකිය යුත්ත දක්නේය" කියායි. ඊට හේතුව කවරේද? මහණෙනි, චතුරාර්‍ය්‍ය සත්‍යය නොදක්නා ලද හෙයිනි.

5. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙය දුකයයි තත්වූ පරිදි දනිත්ද, මෙය දුකට හේතුවයයි තත්වූ පරිදි දනිත්ද, මෙය දුක නැතිකිරීම යයි තත්වූ පරිදි දනිත්ද, මෙය දුක නැති කරන මාර්ගයයි තත්වූ පරිදි දනිත්ද ඔවුහු අන්‍යවූ ශ්‍රමණයෙකුගේ හෝ බ්‍රාහ්මණයෙකුගේ හෝ මුහුණ නොබලත්. 'මේ පින්වතා ඒකාන්තයෙන් දතයුත්ත දන්නේය. දැකිය යුත්ත දක්නේය" කියායි.

6. "මහණෙනි, යම්සේ ගැඹුරු බැස්ම ඇත්තාවූ මනාකොට සිටුවන ලද්දාවූ, නොසෙල්වෙන්නාවූ, කම්පානොවෙන්නාවූ, යකඩ කණුවක් හෝ ලී කණුවක් හෝ වෙයිද, එය පෙරදිගින් හමන්නාවූ මහත්වූ කුණාටුවකින්ද කම්පානොවන්නේය. නැවත නැවත කම්පා නොවන්නේය. නොසැලෙන්නේය. අපරදිගින් හමන්නාවූ මහත්වූ කුණාටුවකින්ද කම්පා නොවන්නේය. නැවත නැවත කම්පා නොවන්නේය. නොසැලෙන්නේය. උතුරු දිගින් හමන්නාවූ මහත්වූ කුණාටුවකින්ද කම්පා නොවන්නේය. නැවත

නැවත කම්පා නොවන්නේය, නොසැලෙන්නේය. දකුණු දිගින් හමන්නාවූ මහත්වූ කුණාටුවකින්ද කම්පා නොවන්නේය. නැවත නැවත කම්පා නොවන්නේය. නොසැලෙන්නේය. ඊට හේතුව කවරේද? මහණෙනි, කණුව ගැඹුරෙහි බස්වා මනාව සිටුවන ලද බැවිනි.

7. "මහණෙනි, එසේම යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙය දුකයයි තත්වූ පරිදි දනිත්ද, මෙය දුකට හේතුව යයි තත්වූ පරිදි දනිත්ද, මෙය දුක නැතිවීමයයි තත්වූ පරිදි දනිත්ද, මේ දුක නැති කරන මාර්ගයයි තත්වූ පරිදි දනිත්ද, ඔවුහු අන්‍ය ශ්‍රමණයෙකුගේ හෝ බ්‍රාහ්මණයෙකුගේ හෝ මුහුණ නොබලත්. "මේ පින්වතා ඒකාන්තයෙන් දතයුත්ත දන්නේය. දැකිය යුත්ත දක්නේය" කියායි. ඊට හේතුව කවරේද? චතුරාර්‍ය්‍ය සත්‍යය මනාකොට දක්නා ලද හෙයිනි. කිනම් සතරක්ද?

8. (මේ ඡේදය මේ වර්ගයේ 8 වෙනි සූත්‍රයේ 4 වෙනි ඡේදය මෙනි.)

9. (මේ ඡේදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 6 වෙනි ඡේදය මෙනි.)

---

## 10. වාදර්ථක (හෝ) සිලායූප සූත්‍රය.

2. "මහණෙනි, යම් කිසි මහණෙක් තෙම වනාහි, මෙය දුකයයි තත්වූ පරිදි දනීද, මෙය දුකට හේතුවයයි තත්වූ පරිදි දනීද, මෙය දුක නැතිකිරීමයයි තත්වූ පරිදි දනීද, මෙය දුක නැති කරන මාර්ගයයි තත්වූ පරිදි දනීද, ඉදින් පෙරදිගින් වාදය කැමැත්තාවූ, වාදය සොයන්නාවූ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මොහුට වාදය ආරොපනය කරන්නෙමියි එන්නේවේද, ඒකාන්තයෙන් ඔහු කරුණු සහිතව කම්පා කරන්නේය. විශෙෂයෙන් කම්පා කරන්නේය. සොලවන්නේය යන මීට හෙතු නැත්තේය. අපර දිගින්ද, වාදය කැමැත්තාවූ වාදය සොයන්නාවූ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ

මොහුට වාදය ආරොපනය කරන්නෙමියි එන්නේවේද, ඒකාන්තයෙන් ඔහු කරුණු සහිතව කම්පාකරන්නේය. විශෙෂයෙන් කම්පාකරන්නේය. සොලවන්නේය යන මීට හෙතු නැත්තේය.

"උතුරු දිගින්ද, වාදය කැමැත්තාවූ, වාදය සොයන්නාවූ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මොහුට වාදය ආරොපනය කරන්නෙමියි එන්නේවේද, ඒකාන්තයෙන් ඔහු කරුණු සහිතව කම්පා කරන්නේය. විශෙෂයෙන් කම්පා කරන්නේය. සොලවන්නේය. යන මීට හේතු නැත්තේය.

"දකුණු දිගින්ද, වාදය කැමැත්තාවූ, වාදය සොයන්නාවූ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මොහුට වාදය ආරොපනය කරන්නෙමියි එන්නේවේද, ඒකාන්තයෙන් ඔහු කරුණු සහිතව කම්පා කරන්නේය. විශෙෂයෙන් කම්පා කරන්නේය. සොලවන්නේය. යන මීට හේතු නැත්තේය.

3. "මහණෙනි, සොළොස් රියන් ගල්ටැඹක් ඇත්තේය. එහි අට රියනක් වල යටට බැස ඇත්තේද අට රියනක් වලින් මතුවී සිටියේ වේද ඉදින් පෙර දිගින් මහත්වූ කුණාටුවක් හමන්නේ නමුත් එය කම්පා නොකරන්නේය. විශෙෂයෙන් කම්පා නොකරන්නේය. නොසොල් වන්නේය.

"ඉදින් අපර දිගින් මහත්වූ කුණාටුවක් හමන්නේ නමුත් එය කම්පා නොකරන්නේය. විශෙෂයෙන් කම්පා නොකරන්නේය. නොසොල් වන්නේය.

"ඉදින් උතුරු දිගින් මහත්වූ කුණාටුවක් හමන්නේ නමුත් එය කම්පා නොකරන්නේය. විශෙෂයෙන් කම්පා නොකරන්නේය. නොසොල් වන්නේය.

"ඉදින් දකුණු දිගින් මහත්වූ කුණාටුවක් හමන්නේ නමුත් එය කම්පා නොකරන්නේය විශෙෂයෙන් කම්පා නොකරන්නේය. නොසොල් වන්නේය.

"ඊට හේතුව කුමක්ද? මහණෙනි, ගල් කණුව ගැඹුරු වළක මනාව සිටුවන ලද හෙයිනි.

4 "මහණෙනි, එසේම යම් කිසි මහණෙක් තෙම වනාහි මෙය දුකයයි තත්වූ පරිදි දනීද. මේ දුකට හේතුවයයි තත් පරිදි දනීද, මෙය දුක නැතිකිරීමයයි තත්වූ පරිදි දනීද, මෙය දුක නැති කරන මාර්ගයයි තත් පරිදි දනියිද ඉදින් පෙර දිගින් වාදය කැමැත්තාවූ, වාදය සොයන්නාවූ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මොහුට වාදාරොපනය කරන්නෙමියි එන්නේ වේද, ඒකාන්තයෙන් ඔහු කරුණු සහිතව ධර්මයෙන් කම්පා කරන්නේය. විශෙෂයෙන් කම්පා කරන්නේය. විශෙෂයෙන් සොලවන්නේය. යන මීට හේතු නැත්තේය.

අපර දිගින්ද, වාදය කැමැත්තාවූ වාදය සොයන්නාවූ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මොහුට වාදය ආරොපනය කරන්නෙමියි එන්නේවේද, ඒකාන්තයෙන් ඔහු කරුණු සහිතව කම්පා කරන්නේය. විශෙෂයෙන් කම්පාකරන්නේය. සොලවන්නේය යන මීට හෙතු නැත්තේය.

"දකුණු දිගින්ද, වාදය කැමැත්තාවූ, වාදය සොයන්නාවූ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මොහුට වාදය ආරොපනය කරන්නෙමියි එන්නේවේද, ඒකාන්තයෙන් ඔහු කරුණු සහිතව කම්පා කරන්නේය. විශෙෂයෙන් කම්පා කරන්නේය. සොලවන්නේය. යන මීට හේතු නැත්තේය.

5. මේ ඡෙදය මේ වර්ගයේ 8 වෙනි සූත්‍රයේ 4 වෙනි ඡෙදය මෙනි

6. මේ ඡෙදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 6 වෙනි ඡෙදය මෙනි.

## 5. පපාත වර්ගය.

### 1. ලොකචින්තා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහිවූ කලන්දක නිවාප නම් වෙළුවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්හට අඬගා මෙසේ වදාළේය.

2. "මහණෙනි, පෙරවූ දෙයක් කියමි. එක්තරා පුරුෂයෙක් රජගහ නුවරින් නික්මී, ලෝකය ගැන සිතන්නෙමියි' කියා, සුමාගධ නම් පොකුණ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ සුමාගධ නම් පොකුණු තෙර ලෝකය ගැන සිතමින් හුන්නේය. මහණෙනි, ඒ පුරුෂතෙම වනාහි සුමාගධ නම් පොකුණෙහි නෙළුම් දණ්ඩක සිදුරු වලට ඇතුල් වන්නාවූ සිව්රඟ සෙනඟක් දැක්කේය. දැක, ඔහුට මේ සිත ඇතිවිය. 'මම නම් පිස්සෙක්මි. මම නම් වික්ෂිප්ත සිත් ඇත්තෙක්මි. මා විසින් ලොකයෙහි නැති දෙයක් දක්නා ලද්දේය' කියායි.

3. "මහණෙනි, ඉක්බිති ඒ පුරුෂතෙමේ රජගහනුවරට පැමිණ මහාජනයා හට මෙය කීයේය. පින්වත්නි, මම නම් පිස්සෙක්මි. පින්වත්නි, මම නම් විසුරුණු සිත් ඇත්තෙක්මි. මා විසින් ලොකයෙහි නැති දෙයක් දක්නා ලද්දේය' කියායි.

"පින්වත් පුරුෂය, කෙසේ නම් නුඹ පිස්සෙක් වූයෙහිද කෙසේ විසුරුණු සිත් ඇත්තෙක් වූයෙහිද, නුඹ විසින් දක්නා ලද ඒ ලොකයෙහි නැති දෙය නම් කුමක්ද?

4. "ස්වාමීනි, මම මේ රජගහ නුවරින් නික්මී ලොකය ගැන සිතන්නෙමියි සුමාගධ නම් පොකුණ යම් තැනෙක් හිද එතැනට ගියෙමි ගොස්, සුමාගධ නම් පොකුණු තෙර ලොකය ගැන සිතමින් හුන්නෙමි. ස්වාමීනි, මම වනාහි සුමාගධ නම් පොකුණු ඉවුරෙහි නෙළුම් දණ්ඩකට ඇතුල්වන්නාවූ සිව්රඟ සෙනඟක් දැක්කෙමි. ස්වාමීනි, මෙසේ වනාහි මම පිස්සෙක් වූයෙමි, විසුරුණු සිත් ඇත්තෙක් වූයෙමි. ලොකයෙහි නැත්තාවූ මෙය මා විසින් දක්නා ලදැයි' කීය. පින්වත් පුරුෂය, එසේ නම් නුඹ ඒකාන්තයෙන් පිස්සෙක් වෙහිය. ඒකාන්තයෙන් විසුරුණු සිත් ඇත්තෙක් වෙහිය. නුඹ විසින් ලොකයෙහි නැති දෙයක් දක්නා ලදැයි කීවාහුය.

5. "මහණෙනි, ඒ පුරුෂ තෙම වනාහි වූ දෙයක්ම දුටුවේය. එය නොවූ දෙයක් නොවේමය.

"මහණෙනි, පෙර වූ දෙයක් කියමි. එනම් සුරා'සුර යුද්ධය එළඹ සිටියේ විය. මහණෙනි, ඒ යුද්ධයෙහිදී වනාහි දෙවියෝ

දිනුවාහුය. අසුරයෝ පැරදුනාහුය. මහණෙනි, පැරදුණු අසුරයෝ වනාහි බිය වූවාහු, දෙවියන් මුළා කරමින් නෙළුම් දණ්ඩකට රිංගන්නාක් මෙන් පෙනෙන සේ මායාවක් කොට අසුර පුරයට ගියාහුය. මහණෙනි, එහෙයින් ලොකය නිත්‍යයි කියා හෝ ලෝකය නිත්‍ය නොවේයයි කියා හෝ ලොකයෙහි කොණක් ඇත්තේය කියා හෝ, ලොකයෙහි කොණක් නැත්තේය කියා හෝ එයම ජීවය, එයම ශරීරයයි කියා හෝ ජීවය අනිකකි, ශරීරය අනිකකියි කියා හෝ සත්වතෙම මරණින් මතු වන්නේය කියා හෝ සත්වතෙම මරණින් මතු නොවන්නේය කියා හෝ, සත්වතෙම මරණින් මතු වන්නෙත් වෙයි, නොවන්නෙත් වෙයි කියා හෝ, සත්ව තෙම මරණින් මතු නොවෙයි, නොවන්නෙත් නොවෙයි කියා හෝ ලොකය ගැන කල්පනා නොකරව්. ඊට හේතු කවරේද?

6. "මහණෙනි, මේ සිතීම අර්ථය පිණිස නොවෙයි. මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාවට මුල්වූයේ නොවෙයි. කලකිරීම පිණිස, නො ඇලීම පිණිස, නිරොධය පිණිස, සංසිඳීම පිණිස විශෙෂයෙන් දැනීම පිණිස, අවබොධය පිණිස, නිවන පිණිස නොපවතියි.

7. මහණෙනි, සිතන්නාවූ තෙපි වනාහි මෙය දුකයයි සිතව්. මෙය දුක නැතිවීමයයි සිතව්. මෙය දුක නැති කරන මාර්ගයයි සිතව්. ඊට හේතු කවරේද?

8. 'මහණෙනි, මේ සිතීම අර්ථය පිණිස වෙයි. මෙය මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාවට මුල්වෙයි. මෙය කලකිරීම පිණිස, නොඇලීම පිණිස, නිරොධය පිණිස, සංසිඳීම පිණිස, විශෙෂයෙන් දැනීම පිණිස, අවබොධය පිණිස, නිවන පිණිස පවතියි.

9. "මහණෙනි, එහෙයින් මෙය දුකයයි දැනීම පිණිස උත්සාහ කටයුතුයි. මෙය දුකට හේතුවයයි දැනීම පිණිස උත්සාහ කළයුතුයි. මෙය දුක නැතිකිරීමයයි දැනීම පිණිස උත්සාහ කළයුතුයි. මෙය දුක නැති කරන මාර්ගයයි දැනීම පිණිස උත්සාහ කළයුතුයි.

---

## 2. පපාත සූත්‍රය (හෝ) පටිභාණකූට සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ගිජ්ඣකූට පර්වතයෙහි වාසය කරන සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්හට අඬගා මෙසේ වදාළේය.

2. "මහණෙනි, යමු. පටිභානකූටය යම් තැනෙක්හිද, එතැන දවල් වාසය පිණිස පැමිණෙමු" කියායි. "එසේය ස්වාමීනියි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බොහෝ භික්ෂූන් හා සමග 'පටිභානකූටය' යම් තැනෙක්හිද එතැනට වැඩිසේක

3. එක්තරා භික්ෂුවක් වනාහි පටිභාන පර්වතයෙහි මහත්වූ ප්‍රපාතයක් දුටුවේය. දැක භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, මේ ප්‍රපාතය විශාලය. ස්වාමීනි, මේ ප්‍රපාතය අතිශයින් විශාලය. ස්වාමීනි, මේ ප්‍රපාතයට වඩා විශාල වූත්, භයානකවූත් වෙන ප්‍රපාතයක් ඇත්තේද?" කියායි.

3. "මහණ, මෙයට වඩා විශාලවූත්, භයානකවූත් වෙන ප්‍රපාතයක් ඇත්තේය.

"ස්වාමීනි, මේ ප්‍රපාතයට වඩා විශාලවූත් භයානකවූත් අන්‍යවූ ප්‍රපාතය කවරේද?"

4. "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙය දුකයයි තත්වූ පරිදි නොදනිත්ද, මේදුකට හෙතුව යයි තත්වූ පරිදි නොදනිත්ද, මේ දුක නැතිවීම යයි තත්වූ පරිදි නොදනිත්ද, මේ දුක නැතිකරන මාර්ගයයි තත්වූ පරිදි නොදනිත්ද ඔවුහු ඉපදීම පිණිස පවත්නාවූ සංස්කාරයන් කෙරෙහි ඇලෙත්. දිරීම පිණිස පවත්නාවූ සංස්කාරයන් කෙරෙහි ඇලෙත්. මරණය පිණිස පවතින්නාවූ සංස්කාරයන් කෙරෙහි ඇලෙත්. ශොක, පරිදෙව, දුක්ඛ, දොමනස්ස උපායාසයන් පිණිස පවත්නාවූ සංස්කාරයන් කෙරෙහි ඇලෙත්.

"ඔව්හු ඉපදීම පිණිස පවත්නාවූ සංස්කාරයන් කෙරෙහි ඇලුනාවූ දිරීම පිණිස පවත්නාවූ සංස්කාරයන් කෙරෙහි

ඇලුනාහු. මරණය පිණිස පවත්නාවූ සංස්කාරයන් කෙරෙහි ඇලුනාහු ශොක, පරිදෙව, දුක්ඛ දොමනස්ස, උපායාසයන් පිණිස පවත්නාවූ සංස්කාරයන් කෙරෙහි ඇලුනාහු ඉපදීම පිණිස පවත්නාවූ සංස්කාරයන්ද රැස්කෙරෙත්. දිරීම පිණිස පවත්නාවූ සංස්කාරයන්ද රැස්කෙරෙත්. මැරීම පිණිස පවත්නාවූ සංස්කාරයන්ද රැස්කෙරෙත්. ශොක-පරිදෙව-දුක්ඛ-දොමනස්ස උපායාසයන්ද පිණිස පවත්නාවූ සංස්කාරයන්ද රැස්කෙරෙත්.

5. "ඔවුහු ඉපදීම පිණිස පවත්නාවූ සංස්කාරයන්ද රැස්කොට, ජරාව පිණිස පවත්නාවූ සංස්කාරයන්ද රැස්කොට මරණය පිණිස පවත්නාවූ සංස්කාරයන්ද රැස්කොට, ශොක-පරිදෙව-දුක්ඛ-දොමනස්ස සහ උපායාස යන පිණිස පවත්නාවූ සංස්කාරයන්ද රැස්කොට ඉපදීම් නැමති ප්‍රපාතයෙහිද වැටෙත්. ජරා නමැති ප්‍රපාතයෙහිද වැටෙත්. මරණය නමැති ප්‍රපාතයෙහිද වැටෙත්. ශොක පරිදෙව-දුක්ඛ-දොමනස්ස උපායාසයන් පිණිස පවතින්නාවූ ප්‍රපාතයන්හිද, වැටෙත්. ඔවුහු ජාති-ජරා-මරණ-ශොක - පරිදෙව - දුක්ඛ - දොමනස්ස - උපායාසයන්ගෙන් නොමිදෙත්. දුකින් නොමිදෙත් යයි කියමි.

6. "මහණ, යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මෙය දුකයයි තත්වූ පරිදි දනිත්ද,

මෙය දුකට හේතුවයයි තත්වූපරිදි දනිත්ද, මෙය දුක නැතිකරන මාර්ගයයි තත්වූ පරිදි දනිත්ද, ඔවුහු ඉපදීම පිණිස පවත්නාවූ සංස්කාරයන් කෙරෙහි නොඇලෙත්. ජරාව පිණිස පවත්නාවූ සංස්කාරයන් කෙරෙහි නො ඇලෙත්. මරණය පිණිස පවත්නාවූ සංස්කාරයන් කෙරෙහි නො ඇලෙත්. ශොක-පරිදෙව-දුක්ඛ දොමනස්ස උපායාසයන් පිණිස පවත්නාවූ සංස්කාරයන් කෙරෙහි නොඇලෙත්.

7. "ඔවුහු ඉපදීම, පිණිස පවත්නාවූ සංස්කාරයන් කෙරෙහි නොඇලෙන්නාහු ජරාව පිණිස පවත්නාවූ සංස්කාරයන් කෙරෙහි නො ඇලෙන්නාහු, මරණය පිණිස පවත්නාවූ සංස්කාරයන් කෙරෙහි නොඇලෙන්නාහු, ශොක-පරිදෙව-දුක්ඛ-දොමනස්ස උපායාසයන් පිණිස පවත්නාවූ සංස්කාරයන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කෙරෙහි නොඇලෙන්නාහු, ඉපදීම පිණිස පවත්නාවූ සංස්කාරයන්ද රැස්නොකෙරෙත්. ජරාව පිණිස පවත්නාවූ, සංස්කාරයන්ද රැස්නොකෙරෙත්. මරණය පිණිස පවත්නාවූ සංස්කාරයන්ද රැස්නොකෙරෙත්. ශොක-පරිදෙව-දුක්ඛ-දොමනස්ස උපායාසයන් පිණිස පවත්නාවූ සංස්කාරයන්ද, රැස්නොකෙරෙත්.

8. "ඔවුහු ඉපදීම පිණිස පවත්නාවූ සංස්කාරයන්ද රැස් නොකොට, දිරීම පිණිස පවත්නාවූ සංස්කාරයන්ද රැස්නොකොට, මැරීම පිණිස පවත්නාවූ සංස්කාරයන්ද රැස්නොකොට ශොක-පරිදෙව-දුක්ඛ-දොමනස්ස උපායාසයන් පිණිස පවතින්නාවූ සංස්කාරයන්ද රැස්නොකොට, ඉපදීම් නමැති ප්‍රපාතයෙහිද නොවැටෙත්. දිරීම් නමැති ප්‍රපාතයෙහිද නොවැටෙත්. මැරීම නමැති ප්‍රපාතයෙහිද නො වැටෙත්. ශොක-පරිදෙව-දුක්ඛ-දොමනස්ස, උපායාසයන් පිණිස පවතින්නාවූ ප්‍රපාතයන්හිද නොවැටෙත්. ඔවුහු ජාති, ජරා, මරණ, ශොක, පරිදෙව, දුක්ඛ, දොමනස්ස උපායාසයන්ගෙන් මිදෙත්. දුක්ඛයන්ගෙන් මිදෙත්යයි කියමි.

9. (මේ ඡෙදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 9 වෙනි ඡෙදය මෙනි.)

---

## 3. මහා පරිළාහ නිරය සූත්‍රය

1. (මේ ඡෙදය මේ වර්ගයේ 1 සූත්‍රයේ 1 වෙනි ඡෙදයමෙනි.)

2. "මහණෙනි, 'මහාපරිළාහ, නම් නිරයක් ඇත්තේය. එහි ඇසින් යම් කිසි රූපයක් දකියිද, අනිෂ්ට රූපයක්ම දකියි. ඉෂ්ට රූපයක් නොදකියි. නොකැමති රූපයක් ම දකියි. කැමැති රූපයක් නොදකියි. අමනාප රූපයක් ම දකියි. මනාප රූපයක් නොදකියි.

3. "කනින් යම් කිසි ශබ්දයක් අසයිද, අනිෂ්ට ශබ්දයක්ම අසයි ඉෂ්ට ශබ්දයක් නොඅසයි. නො කැමති ශබ්දයක් ම අසයි.

කැමැති ශබ්දයක් නොඅසයි. අමනාප ශබ්දයක්ම ම අසයි. මනාප ශබ්දයක් නොඅසයි.

"නහයෙන් යම්කිසි ගන්ධයක් ආඝ්‍රාණය කෙරෙයිද අනිෂ්ට ගන්ධයක්ම ආඝ්‍රාණය කරයි. ඉෂ්ට ගන්ධයක් ආඝ්‍රාණය නො කරයි. නොකැමති ගන්ධයක්ම ආඝ්‍රාණය කරයි. කැමැති ගන්ධයක් ආඝ්‍රාණය නොකරයි. අමනාප ගන්ධයක් ම ආඝ්‍රාණය කරයි. මනාප ගන්ධයක් ආඝ්‍රාණය නොකරයි

"දිවෙන් යම්කිසි රසයක් විඳියිද අනිෂ්ට රසයක්ම විඳියි. ඉෂ්ට රසයක් නොවිඳියි නොකැමති රසයක් ම විඳියි. කැමැති රසයක් නො විඳියි. අමනාප රසයන් ම විඳියි. මනාප රසයක් නො විඳියි.

"කයින් යම් කිසි ස්පර්ශයක් ස්පර්ශ කෙරෙයිද, අනිෂ්ට ස්පර්ශයක් ම ස්පර්ශ කරයි. ඉෂ්ට ස්පර්ශයක් ස්පර්ශ නො කරයි. නොකැමති ස්පර්ශයක් ම ස්පර්ශ කරයි. කැමැති ස්පර්ශයක් ස්පර්ශ නොකරයි අමනාප ස්පර්ශයක් ම ස්පර්ශ කරයි. මනාප ස්පර්ශයක් ස්පර්ශ නොකරයි.

"සිතින් යම්කිසි ධර්මයක් දනියිද අනිෂ්ට ධර්මයක්ම දනියි. ඉෂ්ට ධර්මයක් නො දනියි. නො කැමති ධර්මයක් ම දනියි. කැමැති ධර්මයක් නො දනියි. අමනාප ධර්මයක් ම දනියි. මනාප ධර්මයක් නො දනියි.

**4.** මෙසේ කී කල්හි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, ඒ දැවීම ඒකාන්තයෙන් මහත්ය. ස්වාමීනි, ඒ දැවීම අතිශයින් මහත්ය. ස්වාමීනි, මේ දැවීමට වඩා මහත්වූද, භයානකවූද, අන්‍යවූ දැවීමක් ඇත්තේ ද?"

**5.** "මහණ මේ දැවීමට ඉතා මහත්වූද ඉතා භයානකවූ ද අන්‍යවූ දැවීමක් ඇත්තේය."

"ස්වාමීනි, මේ දැවීමට වඩා ඉතා මහත් වූ ද, ඉතා භයානක වූ ද අන්‍ය දැවීම නම් කුමක්ද?"

**6.** (මේ ඡේදය මේ වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 4 වෙනි ඡේදය මෙනි.)

7. "ඔවුහු ඉපදීම පිණිස පවත්නාවූ සංස්කාරයන්ද රැස් කොට දිරීම පිණිස පවත්නාවූ සංස්කාරයන්ද රැස් කොට මැරීම පිණිස පවත්නාවූ සංස්කාරයන්ද රැස් කොට ශොක-පරිදෙව-දුක්ඛ-දොමනස්ස උපායාසයන් පිණිස පවත්නාවූ සංස්කාරයන්ද රැස් කොට ඉපදීම් නමැති දැවීමෙන්ද දැවෙත්. දිරීම් නමැති දැවීමෙන්ද දැවෙත් මැරීම් නමැති දැවීමෙන්ද දැවෙත් ශොක-පරිදෙව-දුක්ඛ දොමනස්ස සහ උපායාස නැමැති දැවීමෙන්ද දැවෙත්. ඔවුහු ජාති-ජරා-මරණ ශොක, පරිදෙව, දුක්ඛ, දොමනස්ස උපායාසයන්ගෙන් නොමිදෙත්. දුකින් නොමිදෙත්යයි කියමි.

8-9. (මේ ඡෙද දෙක මේ වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 6-7 වෙනි ඡෙද මෙනි.)

10. "ඔවුහු ඉපදීම පිණිස පවත්නාවූ සංස්කාරයන්ද රැස්නොකොට දිරීම පිණිස පවත්නාවූ සංස්කාරයන්ද රැස් නොකොට මැරීම පිණිස පවත්නාවූ සංස්කාරයන්ද රැස් නොකොට ශොක-පරිදෙව-දුක්ඛ දොමනස්ස උපායාසයන් පිණිස පවත්නාවූ සංස්කාරයන්ද රැස් නොකොට ඉපදීම් නමැති දැවීමෙන්ද නො දැවෙත්. දිරීම් නමැති දැවීමෙන්ද නො දැවෙත්. මැරීම් නමැති දැවීමෙන්ද නො දැවෙත් ශොක-පරිදෙව-දුක්ඛ-දොමනස්ස සහ උපායාස නමැති දැවීමෙන්ද නොදැවෙත්. ඔවුහු ජාතිජරා-මරණ ශොක, පරිදේව, දුක්ඛ, දොමනස්ස උපායාසයන්ගෙන් මිදෙත්. දුකින් මිදෙත්. යයි කියමි.

11. (මෙතැන් සිට මේ වර්ගයේ සියලු සූත්‍රයන්හි අන්තිමට මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 9 වෙනි ඡෙදය යොදාගන්න)

---

## 4. කූටාගාරොපම සූත්‍රය

2. "මහණෙනි, යමෙක් 'මම දුක්ඛායයි සත්‍යය තත්වූ පරිදි අවබොධ නොකොට, දුක්ඛ සමුදයායයි සත්‍යය තත්වූ පරිදි අවබොධ නොකොට, දුක්ඛ නිරොධආයයි සත්‍යය තත්වූ පරිදි අවබොධ නොකොට. දුක්ඛ නිරොධ ගාමිනී ප්‍රතිපදායයි සත්‍යය

තත්වූ පරිදි අවබොධ නොකොට මනාකොට දුක් කෙළවර කරන්නෙමි'යි මෙසේ කියන්නේ නම් ඒ කාරණය සිදු නොවේ.

3. "මහණෙනි, යමෙක් 'මම දෙමහල් ගෙයක (කූටාගාරයක) යට මහල නොකොට උඩු මහල කරන්නෙමියි කියන්නේ නම් යම් සේ එය සිදු නොවන්නේද මහණෙනි, එසේම වනාහි යමෙක් මම දුක්ඛාර්‍ය්‍ය සත්‍යය තත්වූ පරිදි අවබොධ නොකොට, දුක්ඛ සමුදයාර්‍ය්‍ය සත්‍යය තත්වූ පරිදි අවබොධ නොකොට, දුක්ඛ නිරොධ ආර්‍ය්‍ය සත්‍යය තත්වූ පරිදි අවබොධ නොකොට, දුක්ඛ නිරොධ ගාමිණී ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යය තත්වූ පරිදි අවබොධ නොකොට මනාකොට දුක් කෙළවර කරන්නෙමියි මෙසේ කියන්නේ නම් ඒ කාරණය සිදු නොවේ.

4. "මහණෙනි, යමෙක් වනාහි 'මම දුක්ඛාර්‍ය්‍ය සත්‍යය තත්වූ පරිදි අවබොධ කොට, දුක්ඛ සමුදය ආර්‍ය්‍ය සත්‍යය තත්වූ පරිදි අවබොධ කොට, දුක්ඛනිරොධ ආර්‍ය්‍යසත්‍යය තත්වූ පරිදි අවබොධ කොට. දුක්ඛ නිරොධ ගාමිනී ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යය තත්වූ පරිදි අවබෝධ කොට මනාකොට දුක් කෙළවර කරන්නෙමි' යි මෙසේ කියන්නේ නම් ඒ කාරණය සිදු වන්නේය.

5. "මහණෙනි, යමෙක් වනාහි 'මම දෙමහල් ගෙයක යට මහල කොට උඩු මහල කරන්නෙමියි කියන්නේ නම් යම්සේ එය සිදුවන්නේද, මහණෙනි, එසේම වනාහි යමෙක් මම දුක්ඛාර්‍ය්‍ය සත්‍යය තත්වූ පරිදි අවබොධ කොට, දුක්ඛ සමුදයආර්‍ය්‍යසත්‍යය තත්වූ පරිදි අවබොධ කොට, දුක්ඛ නිරොධ ආර්‍ය්‍ය සත්‍යය තත්වූ පරිදි අවබොධ කොට, දුක්ඛ නිරොධ ගාමිනී ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යය තත්වූ පරිදි අවබොධ කොට, මනාකොට දුක් කෙළවර කරන්නෙමි' යි මෙසේ කියන්නේ නම් එය සිදුවන්නේය.

---

## 5. ලිච්ඡවි සන්ථාගාර සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විසාලා මහනුවර මහ වනයෙහිවූ කූටාගාර ශාලාවෙහි

වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ උදය කාලයෙහි හැඳ, පාත්‍ර සිවුරු ගෙන විසාලා මහනුවරට පිණ්ඩපාතයේ වැඩියහ.

2. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ වනාහි ශාස්ත්‍රශාලාවෙහි ඉගෙණ ගන්නාවූ දුරදීම සියුම්වූ යතුරු සිදුරෙන් මුල් හීයේ අග දෙවෙනි හීයේ මුල වදිනසේ නොවරද්දා හී විදින්නාවූ බොහෝ ලිච්ඡවී කුමාරයන් දැක්කේය. දැක, උන්වහන්සේට මේ සිත ඇතිවිය. 'මේ ලිච්ඡවි කුමරුවෝ ඒකාන්තයෙන් (ශිල්පයෙහි) හික්මුණාහුය. ඒකාන්තයෙන් මේ ලිච්ඡවි කුමරුවෝ අතිශයින් හික්මුණාහුය. යම්හෙයකින් දුරදීම සියුම්වූ යතුරු සිදුරෙන් මුල්හීයේ අග දෙවෙනි හීයේ මුල වදිනසේ නොවරද්දා හී විදිත්ද එහෙයිනි"

3. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ විසාලා මහනුවර පිඬු පිණිස හැසිර සවස පිණ්ඩපාතයෙන් වැළකුණේ, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසෙක හුන්නේය. එක්පසෙක හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ හට මෙය කීයේය.

4. "ස්වාමීනි, මම මෙහිදී උදේ කාලයෙහි හැඳ, පාත්‍ර සිවුරු ගෙන විසාලා මහනුවරට පිඬු පිණිස පැමිණියෙමි. ස්වාමීනි, එහිදී මම ශාස්ත්‍ර ශාලාවෙහි ඉගෙන ගන්නාවූ, දුරදීම සියුම්වූ යතුරු සිදුරෙන් මුල් හීයේ අග දෙවෙනි හීයේ මුල වදිනසේ නොවරද්දා හී විදින්නාවූ බොහෝ වූ ලිච්ඡවි කුමාරයන් දැක්කෙමි. දැක මට මේ සිත ඇතිවීය. "මේ ලිච්ඡවි කුමරුවෝ ඒකාන්තයෙන් (ශිල්පයෙහි) හික්මුණාහුය. මේ ලිච්ඡවි කුමරුවෝ ඒකාන්තයෙන් විශෙෂයෙන් හික්මුණාහුය. යම් හෙයකින් දුරදීම සියුම් වූ යතුරු සිදුරෙන් මුල් හීයේ අග දෙවෙනි හීයේ මුල වදිනසේ නොවරද්දා හී විදිත්ද එහෙයිනි"

5. "ආනන්දය, ඒ කිමැයි සිතන්නෙහිද? යමෙක් දුරදීම සියුම් වූ කෙසි සිදුරෙන් මුල් හීයේ අග දෙවෙනි හීයේ මුල වදින සේ නොවරද්දා හී විදින්නේද, යමෙක් සත්කඩක් කොට

පලන ලද අස්ලොම් කොණක අස්ලොම් කොණක් වදින සේ විදින්නේද යන මේ දෙකින් කවරක් වනාහි අතිශයින් දුෂ්කර වූයේත් අතිශයින් නොවියහැකි වූයේත් වේද?"

"ස්වාමීනි, යමෙක් සත්කඩක් කොට පළන ලද අස්ලොම් කොණක අස්ලොම් කොණක් වදිනසේ විදින්නේ වේද මෙයම වනාහි අතිශයින් දුෂ්කර වූයේත් අතිශයින් නොවියහැකි වූයේත් වෙයි."

**6.** "ආනන්දය, යමෙක් මෙය දුකයයි තත්වූ පරිදි දනීද, දුකට හේතුවයයි තත්වූ පරිදි දනීද දුක නැතිවීමයයි තත්වූ පරිදි දනීද මේ දුක නැති කරන මාර්ගයයි තත්වූ පරිදි දනියිද ඔවුහු ඊටද වඩා අතිශයින් දුෂ්කරවූද අතිශයින් නොවිය හැකි වූද විදීමක් කරත්."

---

## 6. ලොකන්තරික (හෝ) අන්ධකාර සූත්‍රය.

**2.** "මහණෙනි, ලොකයන්ගෙන් අතරෙහිවූ වැස්මක් නැත්තාවූ අඳුරෙන් පිරී ගියාවූ මේ මහත් සෘද්ධි ඇත්තාවූ මහත් ආනුභාව ඇත්තාවූ චන්ද්‍ර සූර්‍ය්‍යයන්ගේ ආලෝකය නොවැටෙන්නාවූ ආකාශ කුහරයෝ ඇත්තාහ"

**3.** මෙසේ වදාළ කල්හි එක්තරා භික්ෂුවක් "ස්වාමීනි, ඒ අන්ධකාරය මහත්ය ඒ අන්ධකාරය ඉතා මහත්ය. ස්වාමීනි, මේ අන්ධකාරයට වඩා ඉතා මහත්වූද ඉතා භයානකවූද අනික් අන්ධකාරයක් ඇත්තේදැයි?" ඇසීය.

**4.** "මහණ, මේ අන්ධකාරයට වඩා ඉතා මහත්වූද ඉතා භයානකවූද අනික් අන්ධකාරයක් ඇත්තේය."

"ස්වාමීනි, මේ අන්ධකාරයට වඩා ඉතා මහත්වූද, ඉතා භයානකවූද අන්ධකාරය කුමක්දැයි?" විචාළේය.

**5.** (මේ ඡෙදය මේ වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 4 වෙනි ඡෙදය මෙනි)

**6.** ඔව්හු ජාතිය පිණිස පවත්නා සංස්කාරයන්ද රැස් කොට, ජරාව පිණිස පවත්නාවූ සංස්කාරයන්ද රැස්කොට, මරණය

පිණිස පවත්නාවූ සංස්කාරයන්ද රැස්කොට සොක පරිදෙව දුක්ඛ දොමනස්සයන් පිණිස පවත්නාවූ සංස්කාරයන් ද, රැ ස්කොට ජාති අන්ධකාරයෙහිද වැටෙත්. ජරා අන්ධකාරයෙහිද වැටෙත්. මරණ අන්ධකාරයෙහිද වැටෙත්.

7. "ඔව්හු ජාතියෙන්ද, ජරාවෙන්ද, මරණයෙන්ද, ශොකයන්ගෙන්ද, පරිදේවයන්ගෙන්ද, දුක්ඛයන්ගෙන්ද, දොමනස්සයන්ගෙන්ද, උපායාසයන්ගෙන්ද නොමිදෙත්. දුකින් නොමිදෙත්යයි කියමි.

8-9. (මේ ඡෙද දෙක මේ වර්ගයේ 2 වෙනි සූත්‍රයේ 6-7 වෙනි ඡෙද මෙනි)

10. ජාතිය පිණිස පවත්නා සංස්කාරයන්ද රැස් නොකොට, ජරාව පිණිස පවත්නා සංස්කාරයන්ද රැස්නොකොට මරණය පිණිස පවත්නාවූ සංස්කායන්ද රැස්නොකොට සොක පරිදෙව දුක් දොම්නස් උපායාසයන් පිණිස පවත්නා සංස්කාරයන්ද රැස්නොකොට ජාති අන්ධකාරයටද නොවැටෙත්. ජරා අන්ධකාරයටද නොවැටෙත් මරණ අන්ධකාරයටද නොවැටෙත්. සෝක පරිදෙව දුක් දොම්නස් උපායාස අන්ධකාරයටද නොවැටෙත්. ඔව්හු ජාතියෙන්ද, ජරාවෙන්ද, මරණයෙන්ද, සෝකයන්ගෙන්ද, පරිදේවයන් ගෙන්ද, දුක්ඛයන්ගෙන්ද, දොම්නස්සයන්ගෙන්ද, උපායාසයන් ගෙන්ද, මිදෙත්. (ඔව්හු) දුකෙන් මිදෙත් යයි කියමි

(මේ ඡෙදය මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 9 වෙනි ඡෙදය මෙනි)

---

## 7. පඨමඡකච්ඡිග්ගල සූත්‍රය.

2 "මහණෙනි, පුරුෂයෙක්තෙමේ එක් සිදුරක් ඇති වියදණ්ඩක් මහ සයුරෙහි දමන්නේය. එහි (මහසයුරෙහි) කණ කැස්බෙක් වාසය කරන්නේය. උ ෟ සියක් වසකට සියක් වසකට වරක් මතුවන්නේය. මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද? සියක් වසකට, සියක් වසකට වරක් උඩඑන්නාවූ කණකැස්බා ඒ

කියනලද එක් සිදුරක් ඇති දණ්ඩෙහි (වියදඬු සිදුරෙහි) බෙල්ල දමන්නේද?"

"ස්වාමීනි, දීර්ඝ කාලයක්හුගේ ඇවෑමෙන් කිසියම් කලෙක ඉදින් සිදුවියහැකි වන්නේය."

3. "මහණෙනි, සියක් වසකට සියක්වසකට වරක් උඩඑන්නාවූ ඒ කණකැස්බා ඒ එක්සිදුරක් ඇති වියදණ්ඩෙහි බෙල්ල දමයි නම් එය ඉක්මනින් වියහැකිය. මහණෙනි, එය සිදුවූවත් වරක් දුගතියට පැමිණි බාලයාහට මිනිසත් බවක් ලැබිය හැකියයි මම නොකියමි. මහණෙනි, ඊට හේතුව කවරේද?

4. 'මහණෙනි, එහි ධර්මයෙහි හැසිරීමක් නැත්තේය. පින් කිරීමක් නැත්තේය. මහණෙනි එහි ඔවුනොවුන් කාගැනීම බලවන්තයා, දුබලයා කාදැමීම පවත්නේය. ඊට හේතුව කවරේද? සතර ආය්‍ර්‍යසත්‍යයන් නොදක්නාලද බැවිනි. කවර සතරක්ද?

5. (මේ ඡෙදය සිංසපා වර්ගයේ 8 වෙනි සූත්‍රයේ 4 වෙනි ඡෙදය මෙනි)

---

## 8. දුතිය එකච්ඡිග්ගල සූත්‍රය.

2. "මහණෙනි, යම්සේ මේ මහාපඨවිය එකම ජලාසයක් වන්නේද. එහි කිසියම් පුරුෂයෙක් එක් සිදුරක් ඇති විය දණ්ඩක් බහා ලන්නේය. ඒ වියදණ්ඩ පෙරදිග වාතයෙන් අපරදිගට ගසායන්නේය. අපරදිග වාතයෙන් පෙරදිගට ගසායන්නේය. උතුරුදිග වාතයෙන් දකුණුදිගට ගසායන්නේය. දකුණුදිග වාතයෙන් උතුරුදිගට ගසායන්නේය. එහි කණකැස්බෙක් වාසය කරන්නේය. ඌ සියවසකට සිය වසකට වරක් උඩට එන්නේය. මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද?"

"සිය වසකට සිය වසකට වරක් උඩ එන ඒ කැස්බා ඒ එක් සිදුරක් ඇති වියදණ්ඩෙහි බෙල්ල දමන්නේද?"

"ස්වාමීනි, මෙය බොහෝ කලකින් කරුණු යෙදෙන සැටියෙන් වියහැකිද වන්නේය."

3. "යම්හෙයකින් සියක් වසකට සියක් වසකට වරක් උඩ එන්නාවූ ඒ කැස්බා එක් සිදුරකින් යුත් වියදණ්ඩෙහි බෙල්ල ඇතුල් කරන්නේද. මහණෙනි, එපරිද්දෙන් බොහෝ කලකින් කරුණු යෙදෙන සැටියෙන් මිනිසත් බවක් ලබන්නේය.

"මහණෙනි, එපරිද්දෙන් බොහෝ කලකින් කරුණු යෙදෙන සැටියෙන් අර්හත් සම්‍යක්සම්බුද්ධවූ තථාගත තෙමේ ලොව උපදින්නේය. මහණෙනි, එපරිද්දෙන් බොහෝ කාලයකින් කරුණු යෙදෙන සැටියෙන් තථාගතයන් විසින් දෙසිත ධර්මවිනය ලෝකයෙහි බබලන්නේය. මහණෙනි, ඒ මිනිසත් බව ලබන ලදී. ලෝකයෙහි ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධ වූ තථාගතතෙමේ පහළවිය. තථාගතයන් විසින් අවබොධ කරනලද ධර්ම විනය ලෝකයෙහි බබලන්නේය."

---

## 9. පඨම සිනෙරුසක්ඛරොපම සූත්‍රය.

2. "මහණෙනි, යම්සේ පුරුෂයෙක් මුංඇට සතක් පමණවූ ගල්කැටයක් මහාමේරු පර්වතයාගේ සමීපයෙහි තබන්නේය. මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද? මුංඇට සතක් පමණවූ ඒ ගල්කැටයක් මහාමේරු පර්වතයත් යන දෙකින් කුමක් මහත් වන්නේද?"

'ස්වාමීනි, ඒ මහාමේරු පර්වතයම ඉතා මහත් වන්නේය. මුංඇට සතක් පමණවූ ගල ඉතා කුඩාය. ඒ තබනලද මුංඇට සතක් පමණවූ ගල්කැටය මහාමේරු පර්වතය හා සසඳන කල ගණනකට නොපැමිණෙයි. උපමාවකටද නොපැමිණෙයි. කලාවෙන් කලාවකටද නොපැමිණෙයි."

3. "මහණෙනි, එපරිද්දෙන්ම යමෙක් මෙය දුකයයි තත්වූ පරිදි දැනගනියිද මේ දුකට හේතුවයයි තත්වූ පරිදි දැනගනියිද, මේ දුක නැතිකිරීම යයි තත්වූපරිදි දැනගනියිද, මේ දුක් නැතිකිරීමේ මාර්ගයයි තත්වූ පරිදි දැනගනියිද, චතුස්සත්‍ය අවබොධ කළාවූ සෝවාන්වූ ඒ ආර්‍ය්‍ය පුද්ගලයා විසින් ක්ෂය

කරනලද කෙළවර කරනලද දුකම අතිශයින් විශාලය. ක්ෂය කරනලද, කෙළවර කරනලද පළමු දුඃඛ ස්කන්ධය හා සසඳනකල භව සතකට සීමාවූ ඒ ඉතිරිව පවත්නාවූ දුක ගණනටද නොගැනේ. උපමාවටද නොපැමිණෙයි. කලාවෙන් කලාවකටද නොපැමිණෙයි.

---

## 10. දුතිය සිනෙරුසක්ඛරොපම සූත්‍රය.

2. "මහණෙනි, මුං සතක් පමණවූ ගල්කැටය තිබියදී මහාමේරු පර්වතය ක්ෂයවීමට කෙළවර වීමට යන්නේනම් මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද? ක්ෂයවූ, කෙළවරවූ, ඒ මහාමේරු පර්වතය මහත්ද, ඉතිරිවූ මුංඇට සතක් පමණවූ ගල මහත්ද?

3. "ස්වාමීනි, ඒ ක්ෂයකළ කෙළවර කළ මහාමේරු පර්වතයම ඉතා මහත්ය. ඉතිරිවූ මුංඇට සතක් පමණවූ ගල ඉතා ස්වල්පය. ක්ෂය කළ කෙළවර කළ මහාමේරු පර්වතය හා සමකරන කල මුංඇට සතක් පමණවූ ගල ගණනකටද නොගැනේ. උපමාවටද නොපැමිණෙයි. කලාවෙන් කලාවකටද නොපැමිණෙයි.

4. "මහණෙනි, එපරිද්දෙන්ම යමෙක් මෙය දුකයයි තත්වූ පරිදි දනීද මේ දුකට හේතුවයයි තත්වූ පරිදි දනීද මේ දුක් නැතිකිරීමයයි තත්වූ පරිදි දනීද, මේ දුක නැති කිරීමේ මගයයි තත්වූපරිදි දනීද චතුස්සත්‍යය අවබොධ කළාවූ සෝවාන් ආයර්‍ය්‍යශ්‍රාවකයා විසින් ක්ෂයකරනලද කෙළවර කරනලද දුකම අතිශයින් විශාලය. ක්ෂයකරන ලද, කෙළවර කරන ලද පළමු දුඃස්කන්ධය හා සසඳන කල සත් සත්භාවයකට සීමාවූ ඉතිරිවූ දුක ගණනකටද නොගැනේ. උපමාවටද නොපැමිණෙයි. කලාවෙන් කලාවකටද නොපැමිණෙයි.

---

# 6. අභි සමය වර්ගය.

## 1. නඛ සිඛොපම සූත්‍රය.

1. එකල්හි භාග්‍යවතුන් වහන්සේ නිය පිටට පස්ටිකක් නගා භික්ෂූන්ට කථා කොට මෙසේ වදාළේය. "මහණෙනි, ඒ කුමක් දැයි සිතන්නහුද? මා විසින් නිය පිටට ගන්නා ලද මේ ස්වල්පවූ පසත් මහ පොළොවත් යන මේ දෙකින් කුමක් නම් අතිශයින් බොහෝ වන්නේද?" කියායි.

2. "ස්වාමීනි, යම් ඒ මහා පෘථුවියක් වන්නීද එයම අතිශයින් බොහෝ වන්නීය. භාග්‍යවතුන් වහන්සේ විසින් නිය පිටට ගන්නාලද මේ පස ඉතා ස්වල්ප වන්නේය. භාග්‍යවතුන් වහන්සේ විසින් නිය පිටට ගන්නා ලද පස මහා පෘථුවිය හා සමාන කරන කල ගණනකටද නොපැමිණෙයි. උපමාවකටද නොපැමිණෙයි. කලාවෙන් කලාවකටද නොපැමිණෙයි."

3. "මහණෙනි, එපරිද්දෙන්ම යමෙක් මේ දුකයයි තත්වූ පරිදි දනීද, දුක ඇතිවීමේ හේතුව තත්වූ පරිදි දනීද, දුක නැතිකිරීම තත්වූ පරිදි දනීද, දුක නැතිකරන මාර්ගය තත්වූ පරිදි දනීද,

ඒ චතුස්සත්‍යය අවබොධ කළ ඒ සෝවාන් ආර්‍ය්‍ය පුද්ගලයා විසින් ක්ෂය කරන ලද කෙළවර කරන ලද යම් ඒ දුකක්වේද එයම අතිශයින් බොහෝ වෙයි. භව සතකට සීමාවූ ඉතිරි දුක ඉතා ස්වල්ප වෙයි. පළමු ක්ෂය කරන ලද දුක්ඛය හා සමකරන කල මේ සත් භවයකට සීමාවූ ස්කන්ධ දුක ගණනටද නොගැනේ, උපමාවකටද නොපැමිණෙයි, කලාවෙන් කලාවකටද නොපැමිණෙයි.

4. (මේ ඡෙදය 5 වෙනි වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 9 වෙනි ඡෙදය මෙනි.)

## 2. පොක්ඛරණෝපම සූත්‍රය.

2. "මහණෙනි, පණස් යොදුනක් දික්වූ පණස් යොදුනක් පලල්වූ පණස් යොදුනක් ගැඹුරුවූ කවුඩන් විසින් බිය හැකිසේ මුවවිට දක්වා පිරුණු පොකුණක් වෙයි, පුරුෂයෙක් එයින් කුසතණ අගින් වතුර ගන්නේය. මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද, කුසතණ අගින් යම් ජලයක් වේනම් එයත් පොකුණෙහි, තිබෙන යම් ජලයක් වේනම් එයත් යන දෙකින් කුමක නම් අතිශයින් බොහෝ වේද?

"ස්වාමීනි, පොකුණෙහි යම් ඒ ජලයක් වේද එයම අතිශයින් බොහෝ වෙයි, කුසතණ අගින් ගත් ජලය ඉතා ස්වල්පවෙත්, පොකුණෙහි ජලය හා සමාන කරන කල්හි කුස තණ අගින් ගත් ජලය ගණනකටද නොපැමිණෙයි. උපමාවකටද නොපැමිණෙයි, කලාවෙන් කලාවකටද නොපැමිණෙයි.

3, 4. (මෙතැන් සිට ඇති සියලු සූත්‍රයන්හිම අනිත්මට මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 3, 4 වෙනි ඡේදදෙක යොදාගන්න.)

---

## 3. පඨම සම්භෙජ්ජොදක සූත්‍රය.

2. 'මහණෙනි, යම් තැනෙක්හි ගංගා යමුනා අචිරවති සරභූ මහී යන මේ පඤ්ච මහා ගංගාවෝ එකට එක්වෙත්ද පුරුෂයෙක් එතැනින් වතුර බින්දු දෙකක් හෝ තුනක් හෝ ගන්නේය. මහණෙනි, හේ කුමැකැයි සිතන්නහුද? ගත් දිය බිංදු දෙක තුනත් ඒ පඤ්ච මහා ගංගා එක්වන තැන ජලය යන දෙකින් කුමක් නම් අතිශයින් බොහෝ වේද?"

"ස්වාමීනි, යම් ඒ ගංගා එක්වන තැන පවත්නා ජලයක් වේද එයම අතිශයින් බොහෝ වෙත්. පුරුෂයා විසින් ගන්නා ලද දිය බින්දු දෙක තුන ඉතා ස්වල්ප වන්නේය. ගන්නාලද දිය බින්දු දෙක තුන ඒ ජලය සමාන කරන කලද ගණනටද නො පැමිණෙයි. උපමාවකටද නොපැමිණෙයි කලාවෙන් කලාවටද නොපැමිණෙයි.

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 4. දුතිය සම්භෙජ්ජෝදක සූත්‍රය

2. "මහණෙනි, යම් තැනෙක්හි ගංගා යමුනා අචිරවතී සරභූ මහී යන පඤ්ච මහා ගංගාවෝ එකට එක්වෙත්ද දිය බින්දු දෙකක් හෝ තුනක් හෝ හැර ඒ ජලය ක්ෂය වීමට කෙළවර වීමට පැමිණෙන්නේය. මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද ඒ ක්ෂයවූ කෙළවරවූ ගංගා එක්වන තැන ජලයත් ඉතිරිවූ දිය බින්දු දෙක තුනත් යන මෙයින් කුමක් නම් අතිශයන් බොහෝ වේද?

"ස්වාමීනි, ඒ ක්ෂය භාවයට ගියාවූ කෙළවරවූ ගංගා එක්වූ තැන ජලයම අතිශයින් බොහෝ වෙයි. ඉතුරුවූ දිය බින්දු දෙක හෝ තුන හෝ ඉතා ස්වල්ප වෙයි. ගංගා එක්වූ තැන ජලය හා ඉතිරිවූ දිය බින්දු දෙක තුන සමාන කරන කල්හි ගණනටද නොගැනේ. උපමාවටද නොපැමිණෙයි. කලාවෙන් කලාවටද නොපැමිණෙයි.

## 5. පඨම කොලට්ඨිකොපම සූත්‍රය

2. "මහණෙනි, පුරුෂයෙක් ඩෙබර ගෙඩි පමණ මැටි ගුලි සතක් මහපොළොව හා එකට තබන්නේය. මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද? මහ පොළොව හා එකට තබන ලද ඩෙබර ගෙඩි සතක් පමණවූ ඒ මැටි ගුලි සතත් මහපොළවත් යන දෙකින් කුමක් වඩා මහත්ද? ස්වාමීනි, මහ පොළොවම අතිශයින් මහත් වන්නේය. එකට තබන ලද ඩෙබර ගුලි සතක් පමණවූ මැටි ගුලි සත ඉතා කුඩාවන්නාහ. ඩෙබර ගෙඩි සතක් පමණවූ මැටි ගුලි සත මේ මහා පොළොව හා සමාන කරන කල්හි සංඛ්‍යාවකට නොපැමිණෙයි. උපමාවකටද නොපැමිණෙයි. කලාවෙන් කලාවටද නොපැමිණෙයි.

## 6. දුතිය කොලට්ඨිකොපම සූත්‍රය

2. "මහණෙනි, මේ මහපොළොව ඩෙබරගෙඩි පමණවූ මැටි ගුලි සතක් ඉතිරිව තිබියදී ක්ෂයවීමට යන්නේය. කෙළවරට

යන්නේය. මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද? ක්ෂයවූ කෙළවරට ගියාවූ ඒ මහ පොළවත් ඉතිරිවූ ඩෙබර ගෙඩි පමණවූ මැටි ගුලි සතත් යන මෙයින් කුමක් නම් අතිශයින් මහත් වන්නේද?"

"ස්වාමීනි, ක්ෂයවූ කෙළවරවූ මහ පොළවම අතිශයින් බොහෝ වන්නේය. ඉතුරුවූ ඩෙබර ඵල පමණ මැටි ගුළි සත ඉතා ස්වල්ප වෙයි. ක්ෂයවූ කෙළවරවූ මහ පොළොව හා ඉතිරිවූ ඩෙබර ඵල පමණ මැටි ගුළි සත ගණනකටද නොපැමිණෙයි. උපමාවකටද නොපැමිණෙයි. කලාවෙන් කලාවටද නොපැමිණෙත්.

## 7. පඨම සමුද්දඋසිතොපම සූත්‍රය.

2. "මහණෙනි, පුරුෂයෙක් තෙමේ මහ මුහුදෙන් දිය බින්දු දෙකක් හෝ තුනක් හෝ ගන්නේය. මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද මහමුහුදෙන් දිය බින්දු දෙක තුනක් මහ මුහුදෙහි ජලයත් යන දෙකින් කුමක් නම් අතිශයින් බොහෝ වේද?"

"ස්වාමීනි, යම් ඒ මහ මුහුදෙහි ජලයක් වේද මෙයම අතිශයින් බොහෝ වන්නේය. එයින් ගත් දිය බින්දු දෙක හෝ තුන හෝ ස්වල්ප වන්නාහ. එයින් දිය බින්දු දෙක තුන මහ මුහුදෙහි ජලය සමාන කරන කල සංඛ්‍යාවකටද නොපැමිණෙයි. උපමාවකටද නොපැමිණෙයි. කලාවෙන් කලාවකටද නොපැමිණෙයි."

## 8. දුතිය සමුද්දඋසිතොපම සූත්‍රය

2. 'මහණෙනි, මහ මුහුද දිය බින්දු දෙකක් හෝ තුනක් හෝ ඉතිරිව ක්ෂය වීමට කෙළවරවීමට යන්නේය. මහණෙනි ඒ කුමකැයි සිතන්නහුද? මහණෙනි, මහ මුහුදෙහි ක්ෂයවූ කෙළවරවූ යම් ඒ ජලයක් වෙයිද ඉතුරුවූ යම් ඒ දිය බින්දු දෙක තුනක් වෙයිද, එයින් කුමක් නම් අතිශයින් බොහෝ වේද?"

"ස්වාමීනි, මහ මුහුදෙහි යම් ඒ ජලයක් ක්ෂයවූයේද කෙළවරවූයේද එයම අතිශයින් බොහෝ වෙයි. ඉතුරුවූ දිය බින්දු දෙක තුන ස්වල්ප වෙයි. මහමුහුදෙහි ක්ෂයවූ කෙළවරවූ ජලය හා සමාන කරන කල ඉතුරුවූ දිය බින්දු දෙක තුන ගණනකටද නොපැමිණෙයි උපමාවකටද නොපැමිණෙයි. කලාවෙන් කලාවකටද නොපැමිණෙයි"

---

## 9. පඨම පබ්බත සක්ඛරොපම සූත්‍රය

2. "මහණෙනි, පුරුෂයෙක් තෙමේ හිමාලය පර්වත රාජයාගේ සමීපයෙහි අබැට සතක් පමණවූ ගල් කැටයක් තබන්නේය. මහණෙනි, ඒ කුමකැයි හඟින්නහුද, ඒ තබන ලද යම් ඒ අබැට සතක් පමණවූ ගල් කැටය හිමාලය පර්වත රාජයා ය යන දෙකින් කුමක් නම් අතිශයින් මහත් වෙයිද?"

"ස්වමීනි, යම් ඒ හිමාලය පර්වත රාජයෙක් වේද එයම අතිශයින් මහත් වන්නේය. සමීපයෙහි තබන ලද සත් අබැටක් පමණවූ ගල් කැටය ඉතා ස්වල්ප වෙයි. හිමාලය පර්වත රාජයා හා සමාන කරන කල ළඟ තබන ලද සත් අබැටක් පමණවූ කැටගල් සංඛ්‍යාවටද නොපැමිණෙයි, උපමාවකටද නොපැමිණෙයි, කලාවෙන් කලාවකටද නොපැමිණෙයි."

---

## 10. දුතිය පබ්බත සක්ඛරොපම සූත්‍රය.

2. "මහණෙනි, හිමාලය පර්වතරාජයා අබැට සතක් පමණවූ ගල් කැටයක් ඉතිරිව තිබියදී ක්ෂය වීමට කෙළවර වීමට යන්නේද, මහණෙනි, ඒ කුමකැයි සිතන්නහුද? ක්ෂයවූ කෙළවරවූ හිමාලය පර්වත රාජයාත් ඉතිරිවූ අබඇට සතක් පමණවූ ගල් කැටයත් යන මේ දෙකින් කුමක් නම් අතිශයින් බොහෝ වේද?"

"ස්වාමීනි, ක්ෂයවූ කෙළවරවූ හිමාලය පර්වත රාජයාම බොහෝ වෙයි. ඉතිරිවූ අබ ඇට සතක් පමණවූ ගල්කැටය ඉතා ස්වල්පවෙතියි ක්ෂයවූ කෙළවරවූ හිමාලය පර්වත රාජයා හා සමාන කරන කල අබ ඇට සතක් පමණවූ ගල් කැටය

ගණනකටද නොගැනේ. උපමාවකටද නොපැමිණේ. කලාවෙන් කලාවකටද නොපැමිණෙයි."

---

## 7. චක්ක පෙයයාලයේ පඨම ආමකධඤ්ඤ වර්ගය

### 1. අප්පකමනුස්ස (හෝ) අඤ්ඤාභූ සූත්‍රය.

1, 2. (මේ වර්ගයේ සියලු සූත්‍රයන්හිම මේ ඡෙද 6 වෙනි අභිසමය වර්ගයේ 1 සූත්‍රයේ 1, 2 ඡෙද මෙනි)

3. "මහණෙනි, එපරිද්දෙන් වනාහි යම් සත්වකෙනෙක් මිනිස් ලොව උපදිත්ද, ඒ සත්වයෝ ඉතා ස්වල්පවෙත්. යම් සත්වකෙනෙක් මිනිස්ලොවින් අන්තන්හි උපදිත්ද, ඒ සත්වයෝම අතිශයින් බොහෝවෙත්. ඊට හේතු කවරේද යත්, මහණෙනි, චතුස්සත්‍යයන් නොදක්නාලද හෙයිනි. කවර සතරක්ද?

4, 5. (මේ චක්කපෙයයාලයේ සියලු සූත්‍රයන්හිම මේ ඡෙද 4 වෙනි සිංසපා වර්ගයේ 1 වෙනි සූත්‍රයෙහි 4, 5 වෙනි ඡෙද මෙනි)

---

### 2 පච්චන්තජායන සූත්‍රය.

1. 2. (මේ ඡෙද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1. 2. ඡෙද මෙන් වෙත්.)

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වකෙනෙක් මධ්‍යම ජනපදයෙහි උපදිත්ද, ඒ සත්වයෝ ඉතා ස්වල්පවෙත්. අප්‍රසිද්ධ ප්‍රත්‍යන්ත ම්ලෙච්ඡ ජනපදයන්හි උපදිත්ද, ඔව්හුම අතිශයින් බොහෝ වෙති ඊට හේතු කවරේද යත්, චතුස්සත්‍යයන් නොදක්නාලද හෙයිනි කවර සතරක්ද?

4. 5. (මේ ඡෙද සිංසපා වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 4 5. වෙනි ඡෙද මෙන් වෙත්.)

---

## 3. පඤ්ඤාචක්ඛු සූත්‍රය.

1. 2. (මේ ඡේද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1. 2. ඡේද මෙන් වෙත්.)

3. මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වකෙනෙක් ආර්‍යයවූ ප්‍රඥා චක්ෂුසින් යුක්තවූවාහුද ඔව්හු ඉතා ස්වල්පවෙත්. යම් සත්ව කෙනෙක් අවිද්‍යාවෙන් මුළා වූවාහුද ඔව්හුම බොහෝ වෙත්.

4. 5. (මේ ඡේදය සිංසපා වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 4. 5 වෙනි ඡේද මෙනි.)

---

## 4. සුරාමෙරය සූත්‍රය.

1. 2. (මේ ඡේද මේ වර්ගයේ 1. 2. ඡේද මෙන් වෙත්.)

3. "මහණෙනි, එපරිද්දෙන්ම මත්වීමට සහ ප්‍රමාදයට කරුණුවූ රහමෙර පානය කිරීමෙන් වැළකුනාවූ යම් සත්වයෝ වෙත්ද, ඔවුහු අතිශයින් ස්වල්ප වෙති. මත්වීමට හා ප්‍රමාදයට කාරණවූ රහමෙර පානය කරන්නාවූ යම් සත්වයෝ වෙත්ද, ඔවුහුම අතිශයින් බොහෝවෙති. ඊට හේතු කවරේද යත්, මහණෙනි, සතර ආර්‍යයසත්‍යයන් නොදැනීමය. කවර සතරක්ද?

4. 5. (මේ ඡේද සිංසපා වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 4. 5 ඡේද මෙන් වෙත්.

---

## 5. ඔදකජලජ සූත්‍රය.

1. 2. (මේ ඡේද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1, 2 ඡේද මෙන් වෙත්.)

3. "මහණෙනි, එපරිද්දෙන්ම වනාහි ගොඩබිම ඉපදුනාවූ යම් සත්වයෙක් වෙත්ද ඔවුහු ඉතා ස්වල්ප වෙත්. දියෙහි ඉපදුනාවූ යම් සත්වයෝ වෙත්ද ඔවුහුම ඉතා බොහෝ වෙත්. ඊට හේතු කවරේද මහණෙනි, සතර ආර්‍යය සත්‍යයන්ගේ නොදැනීමය, කවර නම් සතර ආර්‍යය සත්‍යයන්ගේද, යත්?

4, 5. (මේ ඡේද සිංසපා වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 4, 5 ඡේද මෙන් වෙත්.)

---

## 6. මත්තෙය්‍ය සූත්‍රය.

1. 2. (මේ ඡේද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1, 2 ඡේද මෙන් වෙත්.)

5. "මහණෙනි, එපරිද්දෙන්ම මවු කෙරෙහි මනාව පිළිපදින්නාවූ යම් සත්වයෝ වෙත්ද, ඔවුහු ස්වල්ප වෙති. මවුට උපකාර නොකරන්නාවූ යම් සත්වයෝ වෙත්ද, ඔවුහුම බොහෝ වෙත්. ඊට හේතු කවරේද, චතුස්සත්‍යයන්ගේ නොදත් බැවිය. කවර නම් චතුස්සත්‍යයන්ගේද යත්?

4, 5. (මේ ඡේද සිංසපා වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 4, 5 ඡේද මෙන් වෙත්.)

---

## 7. පෙත්තෙය්‍ය සූත්‍රය.

1, 2. (මේ ඡේද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1, 2 ඡේද මෙන් වෙත්.)

3. "මහණෙනි, එපරිද්දෙන්ම වනාහි පියා කෙරෙහි මනාව පිළිපදින්නාවූ යම් සත්වයෝ වෙත්ද ඔවුහු ඉතා ස්වල්ප වෙත් පියාට උපකාර නොකරන්නාවූ යම් සත්වයෝ වෙත්ද, ඔවුහුම අතිශයින් බොහෝ වෙත්. ඊට හේතු කවරේද යත් සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදැනීම වෙති. කවර නම් සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේද යත්?

4, 5. (මේ ඡේද සිංසපා වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 4, 5. වෙනි ඡේද මෙන් වෙත්.)

---

## 8. සාමඤ්ඤ සූත්‍රය.

1, 2. මේ ඡේද මේ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1, 2 ඡේද මෙන් වෙත්.

3. "මහණෙනි, එපරිද්දෙන්ම ශ්‍රමණයන් කෙරෙහි මනාකොට පිළිපදින්නාවූ යම් ඒ සත්වයෝ වෙත්ද ඔවුහු ඉතා ස්වල්ප වෙති. ශ්‍රමණයන් කෙරෙහි මනාකොට නො පිළිපදින්නාවූ සත්වයෝ අතිශයින් බොහෝ වෙත්. ඊට හේතු කවරේද යත්,

4, 5. (මේ ඡේද සිංසපා වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 4, 5 වෙනි ඡේද මෙන් වෙත්.)

## 9. බ්‍රහ්මඤ්ඤ සූත්‍රය.

1, 2. (මේ ඡේද මේ වර්ගයේ 1, වෙනි සූත්‍රයේ 1, 2 ඡේද මෙන් වෙත්.)

3. "මහණෙනි, එපරිද්දෙන්ම බ්‍රාහ්මණයන් කෙරෙහි මනාකොට පිළිපන්නාවූ යම් ඒ සත්වයෝ වෙත්ද ඔව්හු ඉතා ස්වල්ප වෙති, බ්‍රාහ්මණයන් කෙරෙහි මනාව නොපිළිපදින්නාවූම සත්වයෝ ඉතා බොහෝ වෙති. ඊට හේතු කවරේද? සතර ආය්‍යී සත්‍යයන්ගේ නොදක්නා ලද බවය, කවර නම් සතරකගේද යත්?

4, 5. (මේ ඡේද සිංසපා වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 4, 5 වෙනි ඡේද මෙන් වෙත්.)

## 10. ජෙය්‍යාපචායී සූත්‍රය.

1, 2. (මේ ඡේද මේ වර්ගයේ 1, වෙනි සූත්‍රයේ 1, 2 ඡේද මෙන් වෙත්.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. "මහණෙනි, එපරිද්දෙන්ම වනාහි යමෙක් තුමූ කුල දෙටුවන් පුදත්ද එබඳු සත්වයෝ ඉතා ස්වල්ප වෙති. යමෙක් තමාගේ කුල දෙටුවන් නොපුදත්ද එබඳු සත්වයෝ ඉතා බොහෝ වෙති. ඊට හේතු කවරේද? මහණෙනි, සතර ආර්‍ය්‍ය සත්‍යයන් නොදත්බවය, කවර නම් සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේද යත්,

4, 5. මේ ඡේද සිංසපා වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 4, 5 වෙනි ඡේද මෙන් වෙත්.

---

## දුතිය ආමකධඤ්ඤ වර්ගය.

### 1. පාණාතිපාත සූත්‍රය.

1, 2. (මේ ඡේද පඨම ආමකධඤ්ඤ වක්ක පෙයාාල වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1, 2 ඡේදමෙන් වෙත්.)

3. "මහණෙනි, එපරිද්දෙන්ම ප්‍රාණඝාතයෙන් වැළකුණාවූ යම් සත්වයෝ වෙත්ද, ඔව්හු ඉතා ස්වල්ප වෙති. ප්‍රාණඝාතයෙන් නොවැළකුණාවූ යම් සත්වයෝ වෙත්ද, ඔව්හු ඉතා බොහෝ වෙත්, ඊට හේතු කවරේද යත්, සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදැනීම වෙති. කවර නම් සතරකගේද යත්,

4, 5. (මේ ඡේද සිංසපා වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 4, 5 වෙනි ඡේද මෙන් වෙත්.)

---

### 2. අදින්නාදාන සූත්‍රය.

1, 2. (මේ ඡේද පඨම ආමකධඤ්ඤ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1. 2. ඡේද මෙනි.)

3. "මහණෙනි, එපරිද්දෙන්ම සොරකම් කිරීමෙන් වැළකුණාවූ යම් සත්වයෝ වෙත්ද ඔව්හු ඉතා ස්වල්පවෙති. සොරකම් කිරීමෙන් නොවැළකුණාවූ සත්වයෝ ඉතා බොහෝ

වෙත්. ඊට හේතුව කවරේද යත්, සතරආර්‍යසත්‍යයන්ගේ නොදැනීම වෙති. කවරනම් සතරකගේද යත්,

4, 5. (මේ ඡේද පඨම ආමකධඤ්ඤ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 4, 5 ඡේද මෙනි.)

---

## 3. කාමමිච්ඡාචාර සූත්‍රය.

1, 2. (මේ ඡේද පඨම ආමකධඤ්ඤ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1, 2, වෙනි ඡේද මෙනි.)

3. මහණෙනි, එපරිද්දෙන්ම කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකුණාවූ යම් සත්වයෝ වෙත්ද ඔව්හු ඉතා ස්වල්පවෙති. කාමයෙහි වරදවා හැසිරීමෙන් නොවැළකුණාවූ සත්වයෝම බොහෝ වෙත්. ඊට හේතු කවරේද යත්, සතරආර්‍යසත්‍යයන්ගේ නොදැනීම වෙති. කවරනම් සතර ආර්‍ය සත්‍යයන්ගේද යත්,

4, 5. (මේ ඡේද පඨම ආමකධඤ්ඤ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 4, 5 ඡේද මෙනි.)

---

## 4. මුසාවාද සූත්‍රය.

1, 2. (මෙතැන් සිට සියලුම සූත්‍රයන්හිම මේ ඡේද පඨම ආමකධඤ්ඤ වර්ගයේ 1 වෙනි සූත්‍රයේ 1. 2. ඡේද මෙනි.)

3. "මහණෙනි, එපරිද්දෙන්ම යමෙක් තුමූ බොරු කීමෙන් වැළකුණාහුද ඒ සත්වයෝ ඉතා ස්වල්පවෙත්. යමෙක් තුමූ බොරුකීමෙන් නොවැළකුණාහුද ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්. ඊට හේතුව කවරේද යත්, සතරආර්‍යසත්‍යයන් නොදැනීම වෙත්, කවරනම් සතරකගේද යත්,

4, 5. (මෙතැන් සිට ඇති සියලු සූත්‍රයන්හිම අගට 1 ආමකධඤ්ඤ වර්ගයේ මුල් සූත්‍රයේ 4, 5 ඡේද දෙක යොදා ගන්න.)

---

## 5. පිසුණාවාචා සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යමෙක් තුමූ කේළාම් කීමෙන් වැළකුණාහුද ඒ සත්වයෝ ඉතා ස්වල්පවෙත්. යමෙක් තුමූ කේළාම් කීමෙන් නොවැළකුණාහුද ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්. ඊට හේතුව කවරේද යත්, සතරආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නාලද බවය, කවරනම් සතරකගේද?

---

## 6. ඵරුසාවාචා සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යමෙක් තුමූ ඵරුෂවචන කීමෙන් වැළකුණාහුද, ඒ සත්වයෝම ඉතා ස්වල්පවෙත්. යමෙක් තුමූ ඵරුෂවචන කීමෙන් නොවැළකුණාහුද. ඒ සත්වයෝම ඉතා බොහෝවෙත්. ඊට හේතුව කවරේද යත්, සතර ආර්‍ය්‍යසත්‍යයන්ගේ නොදක්නාලද බවය. කවර නම් සතරකගේද යත්,

---

## 7. සම්ඵප්පලාප සූත්‍රය.

3. "මහණෙනි, එපරිදිම යමෙක් තුමූ ප්‍රලාප කීමෙන් වැළකුණාහුවෙද්ද, එබඳු සත්වයෝ තුමූ ඉතා ස්වල්පවෙති. යමෙක් තුමූ ප්‍රලාපකීමෙන් නොවැළකුණාහුද ඔව්හුම අතිශයින් බොහෝ වෙත්. ඊට හේතුව කවරේද යත්, සතර ආර්‍ය්‍යසත්‍යයන්ගේ නොදැනීම වෙත්. කවර සතරකගේද?

---

## 8. බීජගාමසමාරම්භ සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යමෙක් තුමූ බීජ වර්ග සහ ගස් වැල් කැඩීමෙන් බිඳීමෙන් වැළකුණාහු වෙත්ද එබඳු සත්වයෝ ඉතා ස්වල්පවෙති. යමෙක් තුමූ බීජ වර්ග සහ ගස් වැල් කැඩීමෙන් බිඳීමෙන් වෙන්නොවූවාහු වෙත්ද, එබඳු සත්වයෝම අතිශයින් බොහෝ වෙත්. ඊට හේතුව කවරේද

යත්, සතරආයර්‍ය්‍යසත්‍යයන්ගේ නොදක්නාලද බවය. කවර සතරකගේද යත්?

---

## 9. විකාලභොජන සූත්‍රය

3. "මහණෙනි, එපරිද්දෙන් යමෙක් තුමූ විකාලභෝජනයෙන් වැළකුණාහුද ඒ සත්වයෝ තුමූ ඉතා ස්වල්ප වෙත්. යමෙක් තුමූ විකාල භොජනයෙන් නොවැළකුණාහු වෙත්ද. ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්. ඊට හේතුකවරේද? මහණෙනි, සතර ආයර්‍ය්‍යසත්‍යයන් නොදක්නා ලද බවය. ඒ සතර කවරේද,

---

## 10. ගන්ධවිලෙපන සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම වනාහි යමෙක් තුමූ (අලංකාරය වශයෙන්) මල් ගඳ විලවුන් දැරීම අඩුතැන්පිරවීම සැරසීම යන මෙයින් වැළකුණාහුද ඒ සත්වයෝ තුමූ ඉතා ස්වල්ප වෙත්. යමෙක් තුමූ මල් ගඳ විලවුන් දැරීම අඩුතැන් පිරවීම සැරසීම යන මෙයින් නො වැළකුණාහු වෙත්ද? ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්. ඊට හේතුව කවරේද යත්? මහණෙනි, සතර ආයර්‍ය්‍යසත්‍යයන්ගේ නොදක්නාලද බවය. ඒ සතර කවරේද?

---

# තතිය ආමකධඤ්ඤ වර්ගය.

## 1. නච්චගීත සූත්‍රය.

1, 2. (මේ වර්ගයේ මේ ඡේද සියල්ලම 1 වෙනි ඡේදය පඨම ආමකධඤ්ඤ පෙයයාල වර්ගයේ 1 වෙනි සූත්‍රයේ මෙනි.

3. "මහණෙනි, එපරිද්දෙන් යම්කෙනෙක් තුමූ නැටුම් ගැයුම් වැයුම් විසුළු දැකීම් යන මෙයින් වැළකුණාහුද ඒ සත්වයෝ

ඉතා ස්වල්පවෙත්. යම් කෙනෙක් නැටුම් ගැයුම් වැයුම් විසුළු දැකීම් යන මෙයින් නොවැළකුණාහුද ඒ සත්වයෝම ඉතා බොහෝ වෙත්. ඊට හේතුව කවරේද, මහණෙනි, සතර ආර්‍ය්‍යසත්‍යයන්ගේ නොදැකීම වෙති. කවර සතරකගේද යත්,

4, 5. (මේ ඡේද සියල්ලම ඉහත වර්ගයේ සූත්‍රවල 4, 5 වෙනි ඡේද මෙන් වෙත්.)

---

## 2. උච්චාසයන සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් කෙනෙක් උස් ආසන මහ ආසන පරිභොගයෙන් වැළකුණාහුද ඒ සත්වයෝ ඉතා ස්වල්පවෙති. යම් කෙනෙක් උස් ආසන මහ ආසන පරිභොගයෙන් වැළකුණාහුද ඒ සත්වයෝම ඉතා බොහෝ වෙත්. ඊට හේතුව කවරේද, මහණෙනි, සතරආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නාලද බවය. කවර සතරකගේද යත්?

---

## 3. ජාතරූපරජත සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් කෙනෙක් රන්රිදී මසු, කහවණු පිළිගැන්මෙන් වැළකුණාහු වෙත්ද ඒ සත්වයෝ තුමූ ඉතා ස්වල්පවෙත්. යම් කෙනෙක් රන්, රිදී, මසු කහවණු පිළිගැන්මෙන් නොවැළකුණාහුද, ඒ සත්වයෝම ඉතා බොහෝ වෙත්. ඊට හේතු කවරේද යත්, මහණෙනි සතර ආර්‍ය්‍යසත්‍යයන්ගේ නොදක්නාලද බවය. කවර සතරකගේද යත්?

---

## 4. ආමකධඤ්ඤ සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් කෙනෙක් අමු ධාන්‍ය වර්ග පිළිගැන්මෙන් වැළකුණාහුවෙත්ද ඒ සත්වයෝ තුමූ ඉතා ස්වල්පවෙත්. යම් කෙනෙක් අමු ධාන්‍ය වර්ග පිළිගැනීමෙන් නොවැළකුණාහුවෙත්ද ඔව්හුම ඉතා බොහෝ වෙත්, ඊට හේතුව

කවරේද යත්, මහණෙනි, සතර ආර්‍ය්‍යසත්‍යයන්ගේ නොදක්නාලද බවය. කවරනම් සතරකගේද යත්.

---

## 5. ආමකමංස සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම වනාහි යම් සත්වකෙනෙක් අමු මස් පිළිගැණීමෙන් වැළකුණාහු වෙත්ද ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙත්. යම් සත්වකෙනෙක් අමු මස් පිළිගැන්මෙන් නොවැළකුණාහුවෙත්ද, ඒ සත්වයෝ තුමූ අතිශයින් බොහෝ වෙත්. ඊට හේතු කවරේද, මහණෙනි, සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නාලද බවය කවර සතරකගේද යත්,

---

## 6. ඉත්ථිකුමාරි සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම වනාහි යම් සත්වකෙනෙක් ස්ත්‍රීන්, තරුණියන් පිළිගැන්මෙන් වැළකුණාහු වෙත්ද ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙති. යම් සත්වකෙනෙක් ස්ත්‍රීන් තරුණියන් පිළිගැන්මෙන් වැළකුණාහු වෙත්ද ඒ සත්වයෝ ඉතා බොහෝ වෙත්. මහණෙනි, ඊට හේතුව කවරේද, සතර ආර්‍ය්‍යසත්‍යයන් නොදක්නාලද බවය, කවර සතරකගේද යත්?

---

## 7. දාසිදාස සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම වනාහි යම් සත්වකෙනෙක් දාස දාසීන් පිළිගැන්මෙන් වැළකුණාහුද ඒ සත්වයෝ ඉතා ස්වල්පවෙත්. යම් සත්වකෙනෙක් දාස දාසීන් පිළිගැන්මෙන් නොවැළකුණාහුද ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්. ඊට හේතුව කවරේද?

මහණෙනි, සතර ආර්‍ය්‍යසත්‍යයන්ගේ නොදක්නාලද බවය. කවරනම් සතරකගේද යත්,

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 8. අජෙළක සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන් වනාහි යම් සත්වකෙනෙක් එළුවන් බැටළුවන් පිළිගැන්මෙන් වැළකුණාහු වෙත්ද, ඒ සත්වයෝ තුමූ ඉතා ස්වල්පවෙත්. යම් සත්වකෙනෙක් එළුවන් බැටළුවන් පිළි ගැනීමෙන් වැළකුණාහු වෙත්ද, ඒ සත්වයෝම ඉතා බොහෝවෙත්. ඊට හේතුව කවරේද?

මහණෙනි, සතරආය්‍ය්‍යසත්‍යයන්ගේ නොදක්නා ලද බවය. කවර සතරකගේද යත්,

---

## 9. කුක්කුට සූකර සූත්‍රය

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්ව කෙනෙක් ඌරන් කුකුළන් පිළිගැනීමෙන් වැළකුණාහුද ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙති. යම් සත්ව කෙනෙක් ඌරන් කුකුළන් පිළිගැනීමෙන් නොවැළකුණාහුද ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙති. ඊට හේතු කවරේද සතර ආය්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නා ලද බවය. කවර සතරකගේද යත්.

---

## 10. හත්ථිගවාස්ස සූත්‍රය

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝතුමූ ඇතුන් ගවයන් අශ්වයන් වෙළඹුන් පිළිගැනීමෙන් වැළකුණාහුද ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙති. යම් සත්ව කෙනෙක් ඇතුන් ගවයන් අශ්වයන් වෙළඹුන් පිළිගැන්මෙන් නො වැළකුණාහුද ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්, ඊට හේතු කවරේද යත් සතර ආය්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නා ලද බවය, කවර සතරකගේද යත්

---

# චතුර්ථ ආමකධඤ්ඤ වර්ගය

## 1. ඛෙත්තවත්ථු සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෙක් තුමූ කෙත්වතු පිළිගැණීමෙන් වැළකුණාහුද ඒ සත්වයෝ ඉතා ස්වල්පවෙති. යම් සත්වයෝ කෙත්වතු පිළිගැණීමෙන් නොවැළකුණාහුද ඒ සත්වයෝ අතිශයින් බොහෝ වෙත්. ඊට හේතු කවරේද යත් සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නාලද බවය.

කවර සතරකගේද යත්,

## 2. කායවික්කය සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ මිලදී ගැනීමෙන් හා විකිණීමෙන් වෙන්වූවාහුද ඒ සත්වයෝ ඉතා ස්වල්පවෙත්, යම් සත්වයෝ මිලදී ගැනීමෙන් හා විකිණීමෙන් වෙන් නොවූවාහුද ඒ සත්වයෝ අතිශයින් බොහෝ වෙති. ඊට හේතු කවරේද යත් "මහණෙනි, සතර ආර්‍ය්‍ය සත්‍යයන් නොදක්නාලද බවය.

## 3. දූතෙය්‍ය ගමන සූත්‍රය

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ දූතනම් පණිවුඩ පණත්කම් කිරීමෙහි යෙදීමෙන් වෙන්වූවාහුද ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙති. යම් සත්වයෝ දූතකම් පණිවුඩ පණත් කම් කිරීමෙහි යෙදීමෙන් වෙන් නොවූවාහුද ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්, ඊට හේතුකවරේද යත්, සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නා ලද බවය, කවර සතරකගේද?

## 4. තුලාකූටාදි සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ තුමූ හොර තරාදිවලින් කිරීම හොඳ රන් සේ බොරු රන් දීම හොරට මැනීම මෙයින් වෙන් වූවාහුද ඒ සත්වයෝ ඉතා ස්වල්පවෙත්. යම් සත්වයෝ හොර තරාදි වලින් කිරීම හොඳ රන් සේ බොරු රන් දීම හොරට මැනීම් යන මෙයින් වෙන් නොවූවාහුද ඒ සත්වයෝ අතිශයින් බොහෝ වෙත්. ඊට හේතු කවරේද? සතර ආර්‍ය්‍ය සත්‍යයන් ගේ නොදක්නා ලද බවය. කවර සතරකගේද යත්

---

## 5. උක්කෝටනාදි සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ අයුක්ති වඤ්චා රැවටිලි වංක කම් වලින් වෙන් වූවාහුද ඒ සත්වයෝ ඉතා ස්වල්පවෙත්. යම් සත්වයෝ තුමූ අයුක්ති වඤ්චා රැවටිලි වංකකම් වලින් වෙන් නොවූවාහුද ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්, ඊට හේතු කවරේද? සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නාලද බවය, කවර සතරකගේද යත්

---

## 6. ඡේදන සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ තුමූ කැපීම් මැරීම් බැඳීම් රැවටීම් පැහැරගැනීම් සැහැසිකම්වලින් වෙන් නොවූවාහුද ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්. ඊට හේතු කවරේද යත් සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නාලද බවය, කවර සතරකගේද යත්

---,

## 7. වධ සූත්‍රය.

3. "මහණෙනි, එසේම වධකිරීමෙන් වැළකුණාවූ යම් සත්වයෝ වෙත්ද, ඒ සත්වයෝ ස්වල්පයහ. එහෙත් වධ කිරීමෙන්

නොවැළකුණුවූ යම් සත්වයෝ වෙත්ද, ඒ සත්වයෝම බොහෝවූහ. ඊට හේතු කවරේද? මහණෙනි, චතුරාර්‍ය්‍යසත්‍යය නොදක්නා ලද හෙයිනි. කිනම් සතරක්ද?

---

## 8. බන්ධන සූත්‍රය

3. "මහණෙනි, එසේම වධබන්ධනයෙන් වැළකුණාවූ යම් සත්වයෝ වෙත්ද, ඒ සත්වයෝ ස්වල්පයහ. එහෙත් වධබන්ධනයෙන් නොවැළකුණාවූ යම් සත්වයෝ වෙත්ද, ඒ සත්වයෝම බොහෝවූහ. ඊට හේතු කවරේද? මහණෙනි, චතුරාර්‍ය්‍යසත්‍යය නොදක්නා ලද හෙයිනි. කිනම් සතරක්ද?

---

## 9. විපරාමොස සූත්‍රය,

3. "මහණෙනි, එසේම වඤ්චාකිරීමෙන් වැළකුණාවූ යම් සත්වයෝ ස්වල්පයහ. එහෙත් වඤ්චාකිරීමෙන් නොවැළකුණාවූ යම් සත්වයෝ වෙත්ද, ඒ සත්වයෝම බොහෝ වූහ. ඊට හේතුව කවරේද? මහණෙනි, චතුරාර්‍ය්‍යසත්‍යය නොදක්නා ලද හෙයිනි. කිනම් සතරක්ද?

---

## 10. ආලෝප සූත්‍රය

3. "මහණෙනි, එසේම කොල්ලකෑමෙන් වැළකුණාවූ යම් සත්වයෝ වෙත්ද, ඒ සත්වයෝ ස්වල්පයහ. එහෙත් කොල්ලකෑමෙන් නොවැළකුණාවූ යම් සත්වයෝ වෙත්ද, ඒ සත්වයෝම බොහෝවූහ. ඊට හේතුව කවරේද? මහණෙනි, චතුරාර්‍ය්‍යසත්‍යය නොදක්නාලද හෙයිනි. කිනම් සතරක්ද?

---

## 11. සහසාකාර සූත්‍රය.

3. "මහණෙනි, එසේම බලහත්කාරකමින් වැළකුණාවූ යම් සත්වයෝ වෙත්ද, ඒ සත්වයෝ ස්වල්පයහ. එහෙත්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

බලහත්කාරකමින් නොවැළකුණාවූ යම් සත්වයෝ වෙත්ද, ඒ සත්වයෝම බොහෝ වූහ. ඊට හේතු කවරේද? මහණෙනි, චතුරාර්‍ය්‍යසත්‍යය නොදක්නාලද හෙයිනි. කිනම් සතරක්ද?

---

## පඤ්චම ආමකධඤ්ඤ වර්ගය.

### 1. මනුස්සගති සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ මිනිස් ලොවින් චුතව නැවත මිනිස් ලොව උපදින්නාහුද, ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙත්, යම් සත්වයෝ මිනිස් ලොවින් චුතව නරකයෙහි උපදිත්ද ඒ සත්වයෝ අතිශයින් බොහෝ වෙත්. ඊට හේතු කවරේද, මහණෙනි, සතර ආර්‍ය්‍ය සත්‍යයන් නොදක්නා ලද බවය, ඒ සතර කවරහුද?

---

### 2. තිරච්ඡානගති සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ මිනිස් ලොවින් චුතව මිනිස් ලොව උපදිත්ද, ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙති. යම් සත්වයෝ මිනිස් ලොවින් චුතව තිරිසන් යෝනියෙහි උපදිත්ද, ඒ සත්වයෝ ඉතා බොහෝ වෙත්. ඊට හේතු කවරේද යත්? සතර ආර්‍ය්‍ය සත්‍යයන් නොදක්නා ලද බැවිනි, කවර ඒ සතරකගේද,

---

### 3. පෙත්තිවිසය සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ මිනිස් ලොවින් චුතව මිනිස් ලොව උපදිත්ද, ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙති. යම් සත්වයෝ මිනිස් ලොවින් චුතව ප්‍රේත ලෝකයෙහි උපදිත්ද, ඒ සත්වයෝ ඉතා බොහෝ වෙත්, ඊට හේතු කවරේද? සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදැනීම වෙත්, කවර සතරකගේද යත්?

---

## 4. නිරයගති සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම මිනිස් ලොවින් චුතවූවාහු දෙවියන් අතරෙහි උපදිත්ද, ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙත්. යම් සත්වයෝ මිනිස් ලොවින් චුතව නරකයෙහි උපදිත්ද, ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්. ඊට හේතු කවරේද සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නා ලද බවය. කවර සතරකගේද යත්?

---

## 5. දෙවගති සූත්‍රය. i

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ මිනිස් ලොවින් චුතව දෙවියන් අතරෙහි උපදිත්ද, ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙති. යම් සත්වයෝ මිනිස් ලොවින් චුතව තිරිසන් යෝනියෙහි උපදිත්ද ඒ සත්වයෝ අතිශයින් බොහෝ වෙත්. ඊට හේතු කවරේද යත්, සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නා ලද බවයි. කවර සතරකගේද යත්?

---

## 6. දෙවගති සූත්‍රය. ii

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ මිනිස් ලොවින් චුතව දෙවියන් අතරෙහි උපදිත්ද, ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙත්, යම් සත්වයෝ මිනිස් ලොවින් චුතව ප්‍රේත ලෝකයෙහි උපදිත්ද, ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්. ඊට හේතු කවරේද යත් සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නා ලද බවය, කවර සතරකගේද?

---

## 7. දෙව නිරයගති සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ දෙව්ලොවින් චුතව දෙවියන් අතර උපදිත්ද, ඒ සත්වයෝ තුමූ ඉතා ස්වල්ප වෙත්, එතකුදු වුවත් යම් සත්වයෝ දෙව් ලොවින් චුතව නිරයෙහි උපදිත්ද, ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්. ඊට හේතු

කවරේද යත්? සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නා ලද බවය, කවර සතරකගේද?

## 8. දෙවතිරච්ඡානගති සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ දෙව් ලොවින් චුතව දෙවියන් අතරෙහි උපදිත්ද, ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙත්, යම් සත්වයෝ දෙව් ලොවින් චුතව තිරිසන් යෝනියෙහි උපදිත්ද, ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්. ඊට හේතු කවරේද යත්? සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නා ලද බවය, කවර සතරකගේද?

## 9. දේවපෙත්තිවිසය සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ දෙවියන් කෙරෙන් චුතව දෙවියන් අතරෙහි උපදිත්ද, ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙත්. යම් සත්වයෝ දෙවියන් කෙරෙන් චුතව ප්‍රේත ලෝකයෙහි උපදිත්ද, ඒ සත්වයෝ අතිශයින් බොහෝ වෙත්. ඊට හේතු කවරේද යත් සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නා ලද බවය, කවර සතරකගේද යත්?

## 10. දෙවනිරයගති සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ දෙව් ලොවින් චුතව දෙවියන් කෙරෙහි උපදිත්ද, ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙති යම් සත්වයෝ දෙවියන් කෙරෙන් චුතව නිරයෙහි උපදිත්ද, ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්. ඊට හේතු කවරේද යත්? සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නා ලද බවය. කවර සතරකගේද?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 11. දෙවමනුස්සගති සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ දෙවියන් කෙරෙන් චුතව මනුෂ්‍යයන් අතරෙහි උපදිත්ද, ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙත්, යම් සත්වයෝ දෙවියන් කෙරෙන් චුතව තිරිසන් යෝනියෙහි උපදිත්ද, ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්, ඊට හේතු කවරේද යත්? සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නා ලද බවය, කවර සතරකගේද?

---

## 12. දෙවපෙත්ති විසය සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම වනාහි යම් සත්වයෝ දෙව් ලොවින් චුතව මිනිසුන් අතරෙහි උපදිත්ද ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙති යම් සත්වයෝ දෙව් ලොවින් චුතව ප්‍රේතයන් කෙරෙහි උපදිත්ද, ඒ සත්වයෝ අතිශයින් බොහෝ වෙත්. ඊට හේතු කවරේද යත්? සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නා ලද බවය. කවර සතරකගේද?

---

## 13. නිරය නිරය ගති සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ නිරයෙන් චුතව මිනිසුන් අතර උපදිත්ද, ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙත්. යම් සත්වයෝ නිරයෙන් චුතව නිරයෙහි උපදිත්ද, ඒ සත්වයෝම ඉතා බොහෝ වෙත්. ඊට හේතු කවරේද යත්? සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නා ලද බවය, කවර සතරකගේද යත්?

---

## 14. නිරය තිරච්ඡානගති සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ නිරයෙන් චුතව මිනිසුන් අතරෙහි උපදිත්ද, ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙත්. යම් සත්වයෝ නිරයෙන් චුතව තිරිසන් යෝනියෙහි උපදිත්ද, ඒ සත්වයෝම ඉතා බොහෝ වෙත්. ඊට හේතු කවරේද යත්?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මහණෙනි, සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නා ලද බැවිනි, කවර සතරකගේද?

---

## 15. නිරයපෙතගති සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ නරකයෙන් චුතව මිනිසුන් අතර උපදිත්ද ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙත්. යම් සත්වයෝ නරකයෙන් චුතව ප්‍රේත විෂයෙහි උපදිත්ද, ඒ සත්වයෝම බොහෝ වෙත්, ඊට හේතු කවරේද? සතර ආර්‍ය්‍ය සත්‍යයන් නොදක්නා ලද බැවිනි. කවර සතරකගේද?

---

## 16. නිරය නිරයගති සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ නිරයෙන් චුතවූවාහු දෙවියන් අතර උපදිත්ද, එබඳු සත්වයෝ ඉතා ස්වල්ප වෙත්. යම් සත්වයෝ නිරයෙන් චුතවූවාහු නිරයෙහිම උපදිත්ද? ඒ සත්වයෝ අතිශයින් බොහෝ වෙත්, ඊට හේතු කවරේද යත්? සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නා ලද බවය, කවර සතරකගේද?

---

## 17 නිරය තිරච්ඡානගති සූත්‍රය

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ නිරයෙන් චුතව දෙවියන් අතර උපදිත්ද එබඳු සත්වයෝ අතිශයින් ස්වල්පවෙත්. යම් සත්වයෝ නිරයෙන් චුතව තිරිසන්යෝනියෙහි උපදිත්ද ඒ සත්වයෝ ඉතා බොහෝ වෙත්. ඊට හේතු කවරේද? මහණෙනි, සතර ආර්‍ය්‍ය සත්‍යයන් ගේ නොදක්නාලද බවය. කවර සතරකගේද?

---

## 18. නිරයපෙතගති සූත්‍රය

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ නිරයෙන් චුතව දෙවියන් අතර උපදිත්ද ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙති. යම් සත්වයෝ නිරයෙන් චුතව ප්‍රේත යෝනියෙහි උපදිත්ද ඒ සත්වයෝ අතිශයින් බොහෝ වෙත්. ඊට හේතු කවරේද යත්, මහණෙනි සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නා ලද බවයි කවර සතරකගේද,

---

## 19. තිරච්ඡාන නිරයගති සූත්‍රය

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ තිරිසන් යෝනියෙන් චුතව මනුෂ්‍යයන් අතර උපදිත්ද ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙති යම් සත්වයෝ තිරිසන් යෝනියෙන් චුතව නිරයෙහි උපදිත්ද, ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්. ඊට හේතු කවරේද යත්, මහණෙනි, සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නා ලද බවය, කවර සතරකගේද යත්

---

## 20. තිරච්ඡාන තිරච්ඡානගති සූත්‍රය

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ තිරිසන් යෝනියෙන් චුතව මිනිසුන් අතරෙහි උපදිත්ද ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙත්. යම් සත්වයෝ තිරිසන් යෝනියෙන් චුතව තිරිසන් යෝනියෙහි උපදිත්ද, ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්. ඊට හේතු කවරේද යත් සතර ආර්‍ය්‍ය සත්‍යයන් ගේ නොදක්නා ලද බවය. කවර සතරකගේද යත්

---

## 21. තිරච්ඡාන පෙත්තිගති සූත්‍රය

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ තිරිසන් යෝනියෙන් චුතව මනුෂ්‍යයන් අතරෙහි උපදිත්ද, ඒ සත්වයෝ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඉතා ස්වල්ප වෙත්, යම් සත්වයෝ තිරිසන් යෝනියෙන් චුතව ප්‍රේත ලෝකයෙහි උපදිත්ද, ඒ සත්වයෝම අතිශයින් බොහෝවෙත්, ඊට හේතුව කවරේද යත් සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නා ලද බවය. කවර සතරකගේද යත්

---

## 22. තිරච්ඡාන නිරයගති සූත්‍රය

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ තිරිසන් යෝනියෙන් චුතව දෙවියන් අතර උපදිත්ද ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙත්, යම් සත්වයෝ තිරිසන් යෝනියෙන් චුතව නිරයෙහි උපදිත්ද ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්. ඊට හේතු කවරේද යත් සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නා ලද බවය. කවර සතරකගේද?

---

## 23. තිරච්ඡාන තිරච්ඡානගති සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ තිරිසන් යොනියෙන් චුතවූවාහු දෙවියන් අතර උපදිත්ද, ඒ සත්වයෝ ඉතා ස්වල්පවෙත්. යම් සත්වයෝ තිරිසන් යොනියෙන් චුතව තිරිසන් යෝනියෙහි උපදිත්ද ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්. ඊට හේතු කවරේද යත්, සතර ආර්‍ය්‍යසත්‍යයන්ගේ නොදක්නාලද බවය, කවර සතරකගේද,

---

## 24. තිරච්ඡාන පෙත්තිගති සූත්‍රය

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ තිරිසන් යෝනියෙන් චුතව දෙවියන් අතර උපදිත්ද, ඒ සත්වයෝ ඉතා ස්වල්පවෙත්. යම් සත්වයෝ තිරිසන් යෝනියෙන් චුතව ප්‍රේත ලෝකයෙහි උපදිත්ද ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඊට හේතු කවරේද, මහණෙනි, සතර ආර්‍යසත්‍යයන්ගේ නොදක්නාලද බවය. කවර නම් සතරකගේද?

---

## 25. පෙත නිරයගති සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම වනාහි යම් සත්වයෝ ප්‍රේත විෂයෙන් චුතව මිනිසුන් අතර උපදිත්ද ඒ සත්වයෝ ඉතා ස්වල්පවෙත්, යම් සත්වයෝ ප්‍රේත විෂයෙන් චුතව නිරයෙහි උපදිත්ද ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්. ඊට හේතු කවරේද යත්, මහණෙනි, සතර ආර්‍ය සත්‍යයන්ගේ නොදක්නාලද බවය, කවර නම් සතරකගේද,

---

## 26. පෙත තිරච්ඡානගති සූත්‍රය

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ ප්‍රේත විෂයෙන් චුතව මිනිසුන් අතර උපදිත්ද ඒ සත්වයෝ ඉතා ස්වල්පවෙති. යම් සත්වයෝ ප්‍රේත විෂයෙන් චුතව තිරිසන් යෝනියෙහි උපදිත්ද, ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්. ඊට හේතු කවරේද, සතර ආර්‍යසත්‍යයන්ගේ නොදක්නා ලද බවය, කවර සතරකගේද යත්?

---

## 27. පෙත පෙත ගති සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ ප්‍රේත විෂයෙන් චුතව මිනිසුන් අතර උපදිත්ද, ඒ සත්වයෝ තුමූ ඉතා ස්වල්පවෙත්. යම් සත්වයෝ ප්‍රේතවිෂයෙන් චුතව ප්‍රේත විෂයෙහි උපදිත්ද ඒ සත්වයෝම අතිශයින් බොහෝ වෙත්. ඊට හේතු කවරේද මහණෙනි, සතර ආර්‍යසත්‍යයන් නොදක්නාලද බැවිනි. කවර සතරකගේද,

---

## 28. පෙත නිරය ගති සූත්‍රය.

3. 'මහණෙනි, එපරිද්දෙන් යම් සත්වයෝ ප්‍රෙත යෝනියෙන් චුතවූවාහු දෙවියන් අතර උපදිත්ද, ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙත්. යම් සත්වයෝ ප්‍රෙත යෝනියෙන් චුතව නිරයෙහි උපදිත්ද, ඒ සත්වයෝම බොහෝ වෙත්. ඊට හේතු කවරේද යත්, සතර ආර්‍ය්‍ය සත්‍යයන්ගේ නොදක්නා ලද බවය. කවර සතරකගේද යත්,

---

## 29. පෙත තිරච්ඡානගති සූත්‍රය.

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ ප්‍රෙතවිෂයෙන් චුතව දෙවියන් අතර උපදිත්ද ඒ සත්වයෝ ඉතා ස්වල්ප වෙත්. යම් සත්වයෝ ප්‍රෙත විෂයෙන් චුතව තිරිසන් යෝනියෙහි උපදිත්ද, ඒ සත්වයෝ ඉතා බොහෝ වෙත්. ඊට හේතු කවරේද යත්, මහණෙනි, සතර ආර්‍ය්‍යසත්‍යයන්ගේ නොදක්නා ලද බවය. කවර සතරකගේද යත්.

---

## 30. පෙත දෙවගති සූත්‍රය

3. "මහණෙනි, එපරිද්දෙන්ම යම් සත්වයෝ ප්‍රෙතලෝකයෙන් චුතව දෙවියන් අතර උපදිත්ද, ඒ සත්වයෝ තුමූ ඉතා ස්වල්පවෙත්. යම් සත්වයෝ ප්‍රෙත ලෝකයෙන් චුතව ප්‍රෙත ලෝකයෙහි උපදිත්ද, ඒ සත්වයෝම අතිශයින් බොහෝවෙත්. ඊට හේතු කවරේද, මහණෙනි, සතර ආර්‍ය්‍යසත්‍යයන්ගේ නොදක්නාලද බවය. කවර සතරකගේද?

**(සංයුත්ත නිකාය නිමි.)**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk